

# ශාමණේර ප්‍රශ්නය.

# සා ම ණේ ර ප්‍ර ශ්න ය

විස්තරසන්නයකින් සමන්විතයි.

අභිධර්මයෙහි නිපුණවූ ආචාර්‍ය්‍යවරයින්වහන්සේ කෙනෙකුන් විසින්
විරචිතයි

බෙන්තර ගලපාත විහාරාධිපතිව වැඩවිසූ සුපෙසල ශික්ෂාකාමී
බෝධිමලුවේ සුමනානන්ද ස්ථවිරපාදයන්වහන්සේගේද
මහනුවර උපෝසථ පුෂ්පාරාමවිහාරයෙහි උපාධ්‍යායභාවොපගත
විද්‍යෝදයපරිවෙණාධිපති
**හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන**
ශ්‍රීපාදස්ථානයෙහිද ගාලුකෝරළයෙහිද ලඞ්කාබටහිරදිශාවෙහිද
ප්‍රධාන නායකස්ථවිරපාදෝත්තමයානන්වහන්සේගේද
ශි ෂ්‍ය වූ
ගලපාතවිහාරාධිවාසී
ශෛලානන්දායතනපරිවෙණාධිපති
**බෙන්තර සරණඞ්කාරස්ථවිරයන්වහන්සේවිසින්**
සං ශෝ ධි ත යි.

පානදුරේ බුලත්කඩේ පදින්චි
ඩී. ඈ ස්. වී ර සිං හ අ ප් පු හා මි
ඈම්. ඩී. යහෝනිස් ජයවර්ධන පාදුක්කපලානේ විවාහරෙජිෂ්ට්‍රාත්
යන අප විසින්
**ග්‍රන්ථප්‍රකාශ මුද්‍රණයන්ත්‍රාලයෙහි**
මු ද්‍රි ත යි.

බුද්ධවර්ෂ: 2442.

1899.

### සංඥාපනය.

## සාමණේර ප්‍රශ්නය.

ලොකජ්‍යෙෂ්ඨතරවූ භාග්‍යවතුන්වහන්සේවිසින් අසනලද ප්‍රශ්නදශයක්ද ශාරීපුත්‍රස්ථවිරයන්වහන්සේගේ අන්තෙවාසික **සොපාක** නම් සාමණේරයන්වහන්සේවිසින් දෙනලද උත්තරදශයක්ද යන ප්‍රශ්නොත්තර දෙකොටස එක්කිරීමෙන් සඞ්ගායනාකොට තබනලද ධම්මකාණ්ඩය **සාමණේරප්‍රශ්න** නාමයෙන් ප්‍රකාශයි. ප්‍රශ්නවිසර්ජ්ජනාවසානයෙහි ඊට දයාදවශයෙන් සර්වඥයන්වහන්සේවිසින් සත් හැවිරිදි සාමණේර නමට උපසම්පදාව දෙනලදී—මේවනාහි **ප්‍රශ්න ව්‍යාකරණ උපසම්පදා**යයි අටවැදෑරුම් උපසම්පදාඅතුරෙහි ගණන්ගත් නාලදී, මේ වූකලී සාමණේරයන්ගෙන් අසනලද ප්‍රශ්නහෙයින්ද= සාමණේරයන් විසින් විසඳනලද ප්‍රශ්නහෙයින්ද=**සාමණේරප්‍රශ්න** නම් විය.

මේ සාමණේරප්‍රශ්නය ප්‍රථම මහාසඞ්ගීතිකාරක මහාකාශ්‍යපස්ථවිරප්‍රමුඛ මහරහතුන්වහන්සේලාවිසින් **ඛුද්දකනිකායෙහි ඛුද්දකපාඨ**යට ඇතුළත්කොට සඞ්ගායනාකරණලදී. සතරබණවරෙහි ශික්‍ෂාපදානන්තරවද වෙනත් තන්හිද ඉන් ගෙණතබනලදී—මෙහි ඇතුළත් ධම්මකොට්ඨාස බැලූකල මෙයින් පිටත් බුද්ධධම්මයක් නොමැති සේ සිතන්ට යුතුවතිබේ.

මීට ලියනලද අර්ථව්‍යාඛ්‍යානය කවරකලෙක කවරආචාර්‍ය්‍යවර්‍ය්‍යයෙකුවිසින් කරණලදදැයි විනිශ්චයකට පැමිණීම ඊට හෙතුවූ කරුණු මෙහි නොමැත්තෙන්ද අත්තැනෙක්හි නුදුටුවිරුහෙයින්ද උගහටයි-එසේත් මෙය ඉතා පූරාණයයි සිතිමට කරුණුනොමැතිහෙයින් මීට ආසන්නකාලයෙහි කරණලදැයි අනුමානවශයෙන් සිතන්ට ඉඩතිබේ-ඒ කෙසේනමුත් සන්නය ලිවීමේදී අභිධම්මාර්ථසඞ්ග්‍රහසන්නය සම්පූර්ණයෙන්ම අඩංගුකරතිබෙන බැව් පෙණෙන්ට තිබේ. ඒද අභිධම්මාර්ථසඞ්ග්‍රහසන්නයෙහි පාලිවචන හැරදමා අර්ථපමණක් එකතුකොට භාවයමෙන් දෙවන ප්‍රශ්නොත්තරයෙහි සම්පූර්ණයෙන් ඇතුළත්කිරීමෙනි. එහිදු ඇතැම්තැන වැඩිවිස්තරයක්ද (විග්‍රහකළ වාක්‍යය හැරදමා එහි අර්ථපමණක් ගෙණ) අඩංගුකොට තිබේ.

“නිබ්බාණං පති සවන්තො උපගමනතො නිබ්බාණමහාසමුද්දනින්නතාය සොතසදිසත්තා වා=සොතොති වුච්චති—අරියො අට්ඨඞ්ගිකො මග්ගො” යනු අභිධම්මත්ථසඞ්ග්‍රහසන්නයෙහි පෙණෙන

විග්‍රහයි-"නිර්වාණය කර පමුණුවනබැවින්ද නිවන්නැමති මහමුහුද කර නැමුනුබැවින්ද ස්‍රොතසක් (දියපහරක්) සමානහුයි=සොත නම් වේ—අයඞ් අෂ්ටාඞ්ගිකමාර්ගයයි" යනාදිය මෙහි ආනයයි-මේ ආදි බොහෝතැන් මෙසේ ඇතිබැව් සැලකියයුතුයි.

අභිධර්මාර්ථසඞ්ග්‍රහසන්නයෙහි තැනින් තැන යොදා තිබෙන සත්‍යසංක්ෂෙපාදියෙන් ගත් ගාථා ශ්ලොකාදි බොහොමයක් මේ සන් නයට ඇතුළත්නොකොට අත්හැරදමාතිබේ.

එනම්-(අ-ස-ස-8 පිටේ.)

"පුබ්බපයොගසම්භූතො විසෙසො චිත්තසම්භවි,
සංඛාරො තංවසෙනෙත්ථ හොත්‍යසංඛාරිකාදිතා"–

(අ-ස-ස-11 පිට)

"සබ්බාකුසලයුත්තම්පි උද්ධච්චං අනත්මානසෙ,
බලවං ඉති තඤ්ඤෙව වුත්තමුද්ධච්චයොගතො.

තෙනෙව හි මුනින්දෙන යෙවාපනකනාමතො,
වත්වා සෙසෙසු එත්ථෙව තං සරූපෙන දෙසිතං"–

"මූළ්හත්තා චෙව සංසප්පවිකෙඛපා චෙකහෙතුකං,
සොපෙක්ඛං සබ්බදා නෙව භින්නං සංඛාරභෙදතො.

න හි තස්ස සභාවෙන තික්ඛත්තුස්සාහනීයතා,
අත්ථි සංසප්පමානස්ස වික්ඛිපන්තස්ස සබ්බදා"–

(අ-ස-ස-15 පිට.)

"වත්ථාලම්බසභාවානං භූතිකානං හි ඝට්ටනං,
දුබ්බලං ඉති චක්ඛාදිචතුචිත්තමුපෙක්ඛකං.

කායනිස්සයඵොට්ඨබ්බභූතානං ඝට්ටනාය තු,
බලවත්තා න විඤ්ඤාණං කායිකං මජ්ඣවෙදනං.

සමානනිස්සයො යස්මා නත්ථානන්තරපච්චයො,
තස්මා දුබ්බලමාලම්බෙ සොපෙක්ඛං සම්පටිච්ඡනං"–

(අ-ස-ස-28 පිටේ.)

"ලොකුත්තරං ක්‍රියාචිත්තං පන කස්මා න විජ්ජති,
එකචිත්තක්ඛණිකත්තා මග්ගස්සාති න විජ්ජති"–

(අ-ස-ස-35 පිට.)

"නාග්නිජ්ජ්වලපසතෙ පාපාදමෙධ්‍යාදිව ශූකරඃ,
ශලභො'ගෙනරිවෙතස්මාන්නාත්‍ර සත්‍යනපත්‍රපඃ"–

(අ-ස-ස-37 පිට.)

"කෙචි ඡිඩ්ඩම්පි රූපන්ති වදන්ති තං න යුජ්ජති,
පහාතබ්බෙසු වුත්තත්තා කාමච්ඡන්දාදයො විය.

පහාතබ්බෙසු අක්ඛාතමෙතං නීවරණෙසු හි,
රූපන්තු න පහාතබ්බමක්ඛාතං දස්සනාදිනා.

"න තුම්හං භික්ඛවෙ රූපං පජහෙථෙතන්ති"පාඨතො,
පහෙය්‍යභාවලෙසොපි යත්ථ රූපස්ස දිස්සති.

තත්ථ තබ්බිසයච්ඡන්දරාගහානි පකාසිතා,
වුත්තං හි තත්ථ යො ඡන්දරාගතෙබ්බොපොති ආදිකං.

රූපාරූපෙසු මිඡෙසු අරූපං තත්ථ දෙසිතං,
ඉති චෙ නත්ථි තං තත්ථ අවිසෙසෙන පාඨතො.

සංඛාරා හි අනුමානෙනුං මිද්ධං රූපන්ති චින්තිතං,
තම්පි නීවරණං මිද්ධභාවතො ඉතරං විය.

සම්පයොගාභිධානා ච න තං රූපන්ති නිච්ඡයො,
අරූපීනං හි ඛන්ධානං සම්පයොගො පවුච්චති.

තථාරූපෙප සමුප්පත්ති පාඨතො නත්ථි රූපතා,
නිද්දා ඛීණාසවානං තු කායගෙලඤ්ඤතො සියා"–

(අ–ස–ස–70. 71 පිටු.)

"සමහර ආචාර්‍ය්‍යකෙනෙක් චිත්තයමකයෙහි "උප්පන්නං උප්පජ්ජමානං" යනාදි පදයන්ගේ විභඞ්ගයෙහි "භඞ්ගක්ඛණෙ උප්පන්නං නො ච උප්පජ්ජමානං උප්පාදක්ඛණෙ උප්පජ්ජමානං නො ච උප්පන්නං" යනාදීන් භඞ්ගොත්පාද දෙකම කියනලද, ස්ථිතික්ෂණය නොකියනලද, යනාදීන් චිත්තයාගේ ස්ථිතික්ෂණය වලකත් නාහ— ඔවුන්ගේ මත නිෂෙධයපිණිස අට්ඨකථාදියෙහි ආචාර්‍ය්‍යවරයන් විසින් ස්ථිතික්ෂණයාගේ අස්තිත්වයම විස්තරකරණලදනුයි අපි මෙහි සඞ්ග්‍රහමාත්‍රයක් දක්වමු".

" උප්පන්නුප්පජ්ජමානන්ති විභඞ්ගෙ හෙව මාදිනං,
භඞ්ගක්ඛණස්මිං උප්පන්නං නො ච උප්පජ්ජමානකං.

උප්පජ්ජමානමුප්පාදෙ න උප්පන්නන්ති ආදිනා,
භඞ්ගුප්පාදාව අක්ඛාතා න චිත්තස්ස ඨිතික්ඛණෙ.

උප්පාදෙව වයො චෙව අඤ්ඤථත්තං ඨිතස්ස ච,
පඤ්ඤායන්ති වුත්තත්තා ඨිති අත්ථි චෙ මතා.

අඤ්ඤථත්තස්ස එකස්මිං ධම්මෙ අනුපලද්ධිතො,
පඤ්ඤාණවචනා චෙව පබන්ධට්ඨිති නට්ඨිති.

වුත්තා තස්මා න චිත්තස්ස ඨිති දිස්සති පාලියං,
අභිධම්මෙ අභාවොපි නිසෙධොයෙව සබ්බථා.

යදා සමුදයො යස්ස නිරුජ්ඣති තදාස්සකිං,
දුක්ඛමුප්පජ්ජතිතෙත්ථ පඤ්හා නොති නිසෙධතො.

රූපුප්පාදෙ න භඞ්ගස්මිං තස්මා සබ්බපි පච්චයා,
උප්පාදෙයෙව චිත්තස්ස රූපහෙතූති කෙචන.

වුච්චතෙ තත්‍ථ එකස්මිං ධම්මස්සෙව යථා මතා,
උප්පාදවත්‍ථතො භින්නා භඞ්ගාවත්‍ථා තථෙව තු.

භඞ්ගස්සාභිමුඛාවත්‍ථා ඉච්ඡිතබ්බා අයං ඨිති,
නයදස්සනතො එසා විභඞ්ගෙ න තු දෙසිතා.

ලක්ඛණං සංඛතස්සෙව චිත්තුප්පාදආදීනං,
දෙසිතත්තා න තත්‍ථාපි පබන්ධස්ස ඨිතීරිතා.

උපසග්ගස්ස ධාතුනමත්‍ථෙයෙව පවත්තිතො,
විඤ්ඤායතිහි චෙතස්ස අත්‍ථො විඤ්ඤායතෙ ඉති.

භඞ්ගෙ රූපස්සනුප්පාදෙ චිත්තජානං වසෙන වා,
ආරුප්පචාභිසන්ධාය භාසිතො යමකස්ස හි.

සභාවො යං යථාලාභයොජනාති තතො න හි,
න චිත්තට්ඨිතිභඞ්ගෙ ච න රූපස්ස අසම්භවො”-

(අ-ස-ස-74 පිට.)

“සුප්තශ්චූතස්‍ය මූලෙ ඵලපතනරවාත්කාශ්චිදුන්මීල්‍ය චක්ෂු
දෘෂ්ට්වා චාදාය චෛතත්ඵලමථ පරිතඃ පීඩයිත්වා කරෙණ,

ඝ්‍රාත්වා පක්වස්වභාවං කිල පරිබුභුජෙ තද්‍රසාස්වාදචෙතාඃ
පශ්චාත්තාල්වාදිලග්නං රසමපි ච සහ ශ්ලෙෂ්මණාස්වාද්‍ය ශිශ්‍යෙ”

(අ-ස-ස-93 පිට.)

“ එකච්චෙ විනිපාතිකා ච නාම චතුඅපායවිනිමුත්තකා උත්තරමාතා යක්ඛිනී පියඞ්කරමාතා පුනබ්බසුමාතා ධම්මගුත්තාති එවමාදිකා; එතෙසං හි කායො නානා හොති මනුස්සානං විය විහෙතුක තිහෙතුකාහෙතුකවසෙන, සඤ්ඤාපි නානා; යෙ පනෙත්‍ථ තිහෙතුකා තෙසම්පි ධම්මාභිසමයො හොති පියඞ්කරමාතාදීනං විය”;

මෙසේ අභිධම්මාර්ථසඞ්ග්‍රහයන්නයෙහි දක්වනලද මේ ගාථා ශ්ලොක පාඨයන් අත්හැර තිබේ-බොහොමයක් ඇතුළත්කොටද තිබේ-එය පොත බැලූකල දැනගත්ම හැකිවෙයි.

මෙහි ඇතුළත්කොට තිබෙන ධර්මකොට්ඨාශ වැඩිකොටසක් ඒ ඒ පොත්වල ලියාතිබෙන ඒවායි, ඇතම්තැන ඒ වාසගම්ද මදක් වෙනස්කොට තිබේ; එබඳුතැන් මුද්‍රණයේදී අපවිසින් [ ] මේ ලකුණින් ඇතුල්කොට යොදාඇත; ඒ (1-පිටේ) “[අපවිසින් මදක් විස්තරකොට ව්‍යාඛ්‍යාන කරණලදහ]” යනාදියයි.

අභිධම්මාර්ථසඞ්ග්‍රහයෙහි ඇති සමහර පාඨද (මූල අග ගාථා හැර) ගාථා සියල්ලමද [ ] මේ ලකුණුවලින් ඇතුල්කොට සියල්ල

තැන යොදා ඇත, එසේ කරන්ට ඕනෑවූයේ සන්නයෙහි ආ නයින් පාඨ ගාථා දෙකොටසෙහිම ආ භාවය යෙදීමෙන් පුනරුක්තාකාරයෙන් පෙණෙනහෙයිනි; මෙසේ මේ පොත 9 වෙනි පිට පටන් 142 වෙනි පිට දක්වා පිළිවෙළින්ම අභිධම්මාර්ත්ථසඞ්ග්‍රහසන්නය දක්වමින් 79 වෙනි පිටේ 6 වෙනි පෙල දක්වා නාමයයිද 92 පිට අවසානය දක්වා රූපයයිද නාමරූපාකාරයෙන් පෙන්වා ඉන්පසු නාම රූපදෙකින් විනිර්ම්මුක්ත නිර්ව්වාණයද මිශ්‍රකසඞ්ග්‍රහයයි ඉන් අනකොටසද පෙන්වා ''නාමඤ්ච රූපඤ්ච''යන මේ දෙවනප්‍රශ්නයෙහි උත්තර ප්‍රකාශ කරණලදී.

මෙහි අඩංගු ධම්මකොට්ඨාස ලියා තිබෙන ආකාරය සිතාබලන විට මේ ආචාර්ය්‍යවරයා බොහෝ පොත්බලා පුරුදුපුහුණුබැව් ඇතිකෙනෙක්වාට සැකනැත, නුමුත් ඇතැම්තැන තීරාකුලනොවනසේ ගළපානැති බැව් පෙණෙන්ට තිබේ-ඒ තැන් අපිදූ එසේම යෙදීමු-ශුද්ධිය සඳහා ලැබුනේ එකම පොත බැවින් ශුද්ධකිරීම අමාරුසේ පෙණුනාපමණක්නොව පොත මුද්‍රණයකරණ කාලයෙහි අපට පැමිණි අනවකාශත්වය නිසාත් පෝර්මකිපයක වාසගම්කැබලි පවා ඉවත්ව ගොස් තිබී එය ශුද්ධිපත්‍රයේ යොදා ඇති.

මෙය ශුද්ධකරණ අපවිසින් ඒ ඒ ධම්මකොට්ඨාස අවබොධකරගැණීමට පහසුවන ආකාරයෙන් පෙලතැඩීමද ඒ ඒ තැන්වලඉලක්කම් යෙදීමද ලකුණුයෙදීමද කරණලදී; මෙය ශුද්ධකිරීමේදී විද්‍යෝදය පරිවෙණාධිපතින්වහන්සේගේම උගත්ශිෂ්‍යයෙක්වූ අප ශෛලාන්තායතනපිරිවෙණේ උපාචාර්ය්‍යතැන්පත් **ගිස්නාවියේ සුමනතිස්ස** උන්නාන්සේ බොහෝසේ ආධාරකළ බැව්ද 97 වෙනි පිට පටන් ශුද්ධකිරීමට මුද්‍රණයකළ අභිධම්මාර්ත්ථසඞ්ග්‍රහසන්නය සහ පෙළත් උපකාරවූබැව්ද මෙහි සඳහන්කිරීමට කැමැත්තෙමු.

මෙහි(ශුද්ධිපත්‍රයටනොගෙණ අත්ඇරී)තව බොහෝතැන් අශුද්ධවද තිබියහැකියි-ඒ තැන් ධම්මවාදීධම්මධරයින් විසින් අපවෙත ලියා එවනු ලැබූනම් ඒ දෙවෙනිවර මුද්‍රණයකරවීමේදී ශුද්ධකරගන්ට උපකාරවනහෙතුවක්බවත් එබඳු අය ශාසනාධාරකාරීබවත් කරුණාපූර්ව්කව සඳහන්කරමි.

*B. Saranankara.*
Principal of
Sailàntàyatana College
Galapàtavihàraya
BENTOTA.

# ශුද්ධි පත්‍රය.

| පිට. | පේළි. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 2 | 7 | * අධ්‍යාත්මික | ආධ්‍යාත්මික |
| " | 11 | ධර්මවිචයසම්බො<br>ධ්‍යඞ්ගය. | ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය,<br>වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය, |
| " | 18 | * සත්ත්වාවාස | සත්වාවාස |
| 3 | 1 | විසින | විසින් |
| " | 4 | * ශ්‍රොත | ශ්‍රොත්‍ර |
| " | 10 | වූයේ | වූවෝ |
| " | 33 | වේ | වෙත් |
| 4 | 17 | * ශබ්ධාදි | ශබ්දාදි |
| 5 | 1 | නොකෙට | නොකොට |
| " | 42 | දසසතර | දසසත |
| 6 | 27 | විපාකවිඥ්ඥාණ | ඒ විපාකවිඥ්ඥාණ |
| " | 29 | පූර්වාඞ්ගම | පූර්වඞ්ගම |
| " | 31 | * නිශ්‍රය | නිශශ්‍රය |
| " | 32 | චක්‍ෂපශියට | චක්ෂුඃස්පර්ශියට |
| 7 | 3 | නොමිදෙනු | මිදෙනු |
| " | 15 | භාවිභාව දත<br>ප්‍රකෙත්සි | භාවිභාව දතයුත්තේයි. |
| " | 20 | * දතයුක්තාහුයි | දතයුත්තාහුයි. |
| " | 25 | අනුත්පන්නාවූ | අනුත්පන්නාවූ ද |
| " | 36 | යන මොහු | යන මොහු ද |
| 8 | 2 | ලක්ෂ,ණ | ලක්ෂණ |
| " | 10 | * නිවෘතතවූ | නිර්වෘතතවූ |
| " | 14 | ජරා-මරණ | ජාති-ජරා-මරණ |
| " | 25 | තෘෂ්ණා-උපාදාන | අවිද්‍යා ද තෘෂ්ණා-උපාදාන |
| " | 34 | අවිද්‍යාදිය | අවිද්‍යා ද |
| 11 | 5 | රූපාදිදර්ශින | රූපදර්ශින |
| " | 17 | වූවාහු | වූවාහු ද |
| " | 19 | නානාත්වායක් | නානාත්වයක් |
| " | 25 | ස්වභාවවූ උත්ත<br>මයන්ගේ | ස්වභාවවූවන් තමන්ගේ |

* මේ ලකුණ මෙබඳු අනික්තැන්ද මෙසේම සැලකිම පිණිසයි.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 13 | 41 | චතුග්ගුණ කර ණලද්දෑහු | චතුග්ගුණ කරණලද්දෑහු නව සියසැටචිත්තකෙනෙක් වන්නාහයි මෙසේ අධිපතිවශයෙන් එක්දහස්සසියඅසූචිත්තකෙනෙක් වන්නාහ, ඔහු කාය–වචී–මනොකම්මසංඛ්‍යාතකම්මක්‍රියාවශයෙන් තුන්ගුණ කරණලද්දෑහු පන්දහස්සතළිස්දෙනෙක් වෙති, ඔහු හීන-මධ්‍යම-ප්‍රණීතභෙදහෙයින් තුන්ගුණ කරණලද්දෑහු |
| 14 | 9 | ඉෂ්ටානිෂ්ට-මධ්‍යස්ථ | ඉෂ්ට–ඉෂ්ටමධ්‍යස්ථ |
| “ | 19 | විශෙෂනයි | විශෙෂණයි. |
| 15 | 1 | කුසලාකුසලයෝ අකුසලයෝ | කුසලාකුසලයෝ (අකුසලයෝ |
| 16 | 28 | * කෞත්‍රත්‍ය | කෞකෘත්‍ය |
| “ | 37 | සංස්කාරභෙදය | කාමාවචරකුසලයෙහි මෙන් සංස්කාරභෙදය |
| 17 | 3 | අසංස්කාරිකයයි කියා ද ව්‍යභිචාරයක් | අසංස්කාරිකයයි කියා ද “කෘත්‍යාධිකාරයක් නැතිව හුදෙක් පරිකම්මාභිසංස්කාරයෙන් ම නොඋපදනාහෙයින් සසංස්කාරිකයයි ද කියන්නට නොපිළිවනි—නොහොත්-පූර්වාභිසංස්කාරවශයෙන් ම උපදනා ධ්‍යානයාගේ කිසිකලෙක්හි අසංස්කාරිකත්වය සම්භව නොවේ නුයි අසංස්කාරිකය යි කියා ද ” ව්‍යභිචාරයක් |
| “ | 7 | සඞ්ඛාරිකාදිකා | සංඛාරිකාදිකා |
| 11 | 15 | දුක්ඛාපටිපදා ද න්ධාභිඤ්ඤා පරිත්තං පරිත්තාරම්මණං, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා පරිත්තං අප්පමාණාරම්මණං, | දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං පරිත්තාරම්මණං, දුක්ඛපටිපදං දන්ධාභිඤ්ඤං පරිත්තං අප්පමාණාරම්මණං, |
| 23 | 6 | රූපාවචරයන් මෙන් | රූපාවචර–ලොකොත්තරයන් මෙන් |
| “ | 39 | විඤ්ඤුතනින් | විඤ්ඤත්තින් |
| 24 | 17 | චිතෙත්තකාග්‍රතා | චිත්තෙකාග්‍රතා |
| 27 | 6 | තත්‍රමජ්ඣත්තාය | තත්‍රමජ්ඣත්තතාය |
| “ | 9 | කරන්නේය | කරන්නීය |
| “ | 39 | වර්ජිතවූ චිත්තයෙහි | වර්ජිතවූ අටසැත්තෑචිත්තයෙහි |

| පිට. | පෙල. | අශුඬ. | ශුඬ. |
|---|---|---|---|
| 28 | 16 | සැවෙක් ද | සසැවෙක් ද |
| 29 | 29 | දක්වනු | දකිනු |
| " | 37 | භාවනාකාලයෙහි පූර්වයෙහි | භාවනාකාලයෙහි අපිණිවිපියෙන් පූර්වයෙහි |
| " | 38 | චිත්තයෙහිදු | චිත්තයෙනුදු |
| 30 | 17 | කාමාවචරචිත්තයෙහි ද | කාමාවචරක්‍රියාචිත්තයෙහි ද |
| " | 23 | ලද්දෑවුන් | කියනලද්දෑවූන් |
| " | 35 | ඇතිකල්හි උපදනේය | ඇතිකල්හි මානය ද උපදනේය. |
| 30 | 39 | සහ ජායති | සහ ච ජායති |
| 31 | 34 | * විතක් ක | විතක්ක |
| 33 | 13 | එකෙක්හි ම | එකෙක්එකෙක්හි ම |
| 36 | 28 | වෙදනාවිභාගහෙයින් ද | වෙදනාවිභාගහෙයින් ද ලොභාදි හෙතුවිභාගහෙයින් ද |
| 37 | 10 | සෞමනස්‍යසහගතයන් | සුඛ-දුඃඛ-සෞමනස්‍යසහගතයන් |
| 38 | 4 | දෙදෙනාගේ | තුන්දෙනාගේ |
| 39 | 6 | අභෙදකල්පනායයි | අභෙදයෙහි ද භෙදකල්පනායයි |
| " | 35 | වූද්ධසං; | වුද්ධස, |
| 40 | 15 | සන්තීරණය | සන්තීරණත්‍රයය |
| " | 19 | ඩූසාලිස් | සසාලිස් |
| " | " | යොනිසොමනසකාර | යොනිසො-අයොනිසොමනසකාර |
| " | 22 | තදාලම්බනාද්‍යවසාන | තදාලම්බනාවසාන |
| 41 | 5 | චෙත්;-යනුභාවයි | චෙත් යනු භාවයි; රූපා'රූපාවචර මහද්ගත විපාකයෝ නවදෙන චක්ෂුරාදි සදෙර නූපදනාහෙයින් ද්වාරවිනිම්මුත්තයෝ මැයි;— |
| 42 | 15 | කම්මනිමිත්තවශයෙන් | කම්ම-කම්මනිමිත්තවශයෙන් |
| " | 18 | රූපාරූපයන්ට ද | රූපාවචරයන්ට ද |
| 43 | 14 | පයඥාපන්නධම්මයන් | පරිත්තධම්මයන් |
| " | 20 | සච්සි | සත්විසි |
| 45 | 18 | නිවරණවසථාවක් | අනිවරණවසථාවක් |
| " | 20 | පූරතොඝොෂ | පරතොඝොෂ |
| " | 27 | ලොකොත්තරසදෙනාය | ලොකොත්තරසත්දෙනාය |

| පිට. | පෙල. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 46 | 26 | විෂය | විෂය |

47 5 පෙලපටන් 10 පෙලදක්වා ඇති වාසගම්කැබිලිඳෙක මාරුවී වැටී තිබේ;—එහි "පරිත්ත" යනු—"අතිපරිත්ත"කියා ද; "අති පරිත්ත" යනු—"පරිත්ත"කියා ද යොදාගතයුතුයි.

| පිට. | පෙල. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 48 | 10 | නිස්සිතකංපන, | නිස්සිතකම්පනං, |
| " | 39 | ශබ්දය මෙන් පිබි ද ගියකල | ශබ්දයෙන් පිබිදගියකල මෙන් |
| 49 | 14 | ආවජ්ජන නම්, | ආවජ්ජන නම්ව, |
| " | " | උපදවී | උපද, |
| 51 | 17 | සතරවනුව හෝ | සතරවනුව හෝ පස්වනුව හෝ |
| " | 18 | රූපාවචර අටය | අරූපාවචර අටය |
| 51 | 31 | ක්ෂිප්‍රාභිඥයන්ට | ක්ෂිප්‍රාභිඥයන්ගේ වශයෙන් |
| 52 | 8-9 | අප්පණාදි සොම්නස් සහගතවූ ප්‍රථමාදිවූ | අප්පණා ද ප්‍රථමාදිවූ |
| " | 12 | නොවන්නේයයි | නොවන්නියයි |
| " | 25 | ලෞකිකකුශලපඤ්චමධ්‍යාන සතරය | ලෞකිකකුශලපඤ්චමධ්‍යානය |
| " | 26 | ලොකොත්තරපඤ්චමධ්‍යානසතරය | ලොකොත්තරපඤ්චමධ්‍යානසතය |
| " | 28 | තත්පාදන්නාක | තත්පාදක |
| 52 | 31 | ලෞකික-ලොකොත්තර-ක්‍රියා පඤ්චමධ්‍යාන රූපා රූපාවචරඅග්‍රඵල චතුෂ්කවශයෙන් | (ලෞකික-ලොකොත්තර) රූපා, රූපාවචරපඤ්චමධ්‍යාන-අග්‍රඵලපඤ්චමධ්‍යානවශයෙන් |
| 52 | 32 | කුශලානන්තරව | එසේ ම කුශලානන්තරව |
| 54 | 6 | නැගෙන්නාවූ අනාගාමි- අග්‍රඵල | නැගෙන්නාවූ අනාගාමි-රහතුන්ට නිරවජ්ජනාවූ අනාගාමි-අග්‍රඵල චිත්තය උපදනා මෙන් |
| " | 21 | කියන්නාහුසි | කියන්නාහුයි. |
| " | 26 | උපදනේයි | නොඋපදනේයි. |
| " | 41 | කාමතෘෂ්ණාව තත්කම්මයා විසින් | කාමතෘෂ්ණායතතකම්මයාවිසින් |
| 55 | 6 | කාමතණ්හා වසෙවනා | හොති තණ්හාවසෙන වා |
| " | 27 | වශිතාවගේ | වශිතාවගේ |

| පිට. | පෙල. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 57 | 15 | ප්‍රාක්‍ෂිපත | ප්‍රක්ෂිප්ත |
| 61 | 27 | මත්‍තුසෙසඤ්ඤ | මත්‍තුසසාඤ්ඤ |
| 63 | 13 | ප්‍රවෘත්තිකාල යෙහිද | ප්‍රවෘත්තිකාලයෙහි ද ච්‍යුතිකාල යෙහි ද |
| 69 | 31 | වෙයාවච්ච | වෙය්‍යාවච්ච |
| 72 | 10 | කුශලකර්මය | අකුශලකර්මය |
| 74 | 29 | නොඋපනාහ | උපදනාහ |
| 76 | 35 | ලබනයක් | ලබනයන් |
| 81 | 11 | පිහිටන | පිහිටියාවූ |
| 101 | 7 | බර්මයෝ | ධර්මයෝ |
| " | 30 | සම්බොධ්‍යය | සම්බොධ්‍යඞ්ගය |
| 115 | 38 | නාමවිකාරයෙන් | නාමවිනානාකාරයෙන් |
| 118 | 37 | සන්ධානසංචාරණීය | සන්ධාවනනිවාරණීය |
| 126 | 30 | නිවරණයෝ | නීවරණයෝ |
| 127 | 39 | ස්මරණීය කොට | ස්මරණීය විෂය කොට |
| 135 | 7 | ලක්‍ෂණ | ක්‍ෂණ |
| 141 | 6 | අග්‍රාර්‍යපුද්ගලවූ | අග්‍රාර්‍යපුද්ගලවූ කෘතකෘත්‍යවූ |
| " | 22 | ක්‍ෂණත්‍රයට | ලක්‍ෂණත්‍රයට |
| 144 | 35 | විගලිම | විගලීම |

මෙහි අශුද්ධස්ථාන තවත් බොහෝ තිබිය හැකියි-එබඳුතැන් ලොකශාසනානුග්‍රහකාරී සුධීන්විසින් ශොධනය කටයුතුයි.

# සාමණේරප්‍රශ්න සන්නය.

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

ඒක නාම කිං? සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා;
ද්වෙ නාම කිං? නාමඤ්ච රූපඤ්ච;
තීනි නාම කිං? තිස්සො වෙදනා;
චත්තාරි නාම කිං? චත්තාරි අරියසච්චානි;
පඤ්ච නාම කිං? පඤ්චුපාදානක්ඛන්ධා;
ඡ නාම කිං? ඡ අජ්ඣත්තිකානි ආයතනානි;
සත්ත නාම කිං? සත්ත බොජ්ඣඞ්ගා;
අට්ඨ නාම කිං? අරියො අට්ඨඞ්ගිකො මග්ගො;
නව නාම කිං? නව සත්තාවාසා;
දස නාම කිං? දසහඞ්ගෙහි සමන්නාගතො අරහා'ති වුච්චතී'ති.

"ඒකනාම කිං" යනාදි සාමණේරප්‍රශ්නයෙහි උත්පත්ති කෙසේදයත්? ඒ භාග්‍යවත්වූ බුදුන්ගේ **සොපාක** නම් ශ්‍රාවකයෙකෙනෙක් වූහ, ඒ **සොපාක** නම් වහන්දෑ උපන් සත්ඇවිරිද්දෙහි ම ප්‍රඥාබහුලද්දය, ඔබලවා ප්‍රශ්න විසඳවා උපසම්පදාවට අවසර දෙනු කැමතිව ඔබගේ ප්‍රඥාමහිමතාව ප්‍රකාශ කාරණුසඳහා "ඒකනාම කිං" යනාදි ප්‍රශ්න ඇසූසේක, ඒ වහන්දෑවිසින් ප්‍රශ්න විසඳා බුදුන් සතුටු කළසේක, ඒ කාරණයෙන් ඔබ උපසම්පදා වූසේක, සරණයෙහි පිහිටා දසසිල් පිරිමෙන් සාමණේරභූමියෙහි සිටි සත්ඇවිරිදි කුමාරයන්ගේ ද සර්වඥතාඥානයට සමීපවූවාක් මෙන් ප්‍රශ්න විසඳීමට සමර්ථතා විය, ශාසනසම්පදාව අහෝ ආශ්චර්යයෙකැයි හඳරණවුන්ගේ ශ්‍රවණය කාරණවුන්ගේ ද සස්නෙහි ප්‍රසාදවර්ධන පිණිස[අපවිසින් මඳක් විස්තර කොට ව්‍යාඛ්‍යාන කරණලදහ,]මේ ප්‍රශ්නව්‍යාකරණයෝ සෙසුතන්හි සෙසු සූත්‍රාන්තයන් අතුරෙහි කුමාරප්‍රශ්නනාමයෙන් කියනලද, සතරබණවරෙහි ශික්ෂාපදගන තුරුව සාමණේරප්‍රශ්නනාමයෙන් කියනලදහ.

ඒකනාම කිං,(මේ ශාසනයෙහි) ඒක නම් කිම; සබ්බෙ සත්තා, හැම සත්හු; ආහාරට්ඨිතිකා, ආහාරපසයෙන් සිටිති; හෙවත්—"ඒක නම් කිමෙක්දැයි" කියා බුදුන්විසින් විචාරණලදුව ඒ වහන්දෑ "හැමිසත්හු ආහාරපසයෙන් සිටිති මේ සස්නෙහි ඒක නම් මේයැයි" විසඳා බුදුන් සතුටු කළසේක; හැම්පදයන්කෙරෙහි ම මෙමලෙසින් දතයුතු.

ද්වෙ නාම කිං, දෙක නම් කිම; නාමඤ්ච රූපඤ්ච, නාමය ද රූපය ද යන මේ දෙකයි.

තීනි නාම කිං, තුනෙක් නම් කිම; තිස්සො වෙදනා, තුන් වෙදනාවය; හෙවත්-සැපවෙදනාවය දුඃඛවෙදනාවය උපෙක්ෂාවෙදනාවය යන ත්‍රිවිධවෙදනාවයි.

චත්තාරි නාම කිං, සතරෙක් නම් කිම; චත්තාරි අරියසච්චානි, සතර ආර්‍ය්‍යසත්‍යයහ; හෙවත්—දුඃඛසත්‍යය සමුදයසත්‍යය නිරොධසත්‍යය මාර්ග සත්‍යය යන සතරයි.

පඤ්ච නාම කිං, පස නම් කිම; පඤ්චුපාදානක්ඛන්ධා, පස් උපාදානස්කන්ධයහ; හෙවත්—රූපස්කන්ධය වෙදනාස්කන්ධය සංඥාස්කන්ධය සංස්කාරස්කන්ධය විඥාන ස්කන්ධය යන පඤ්චස්කන්ධයයි.

ඡ නාම කිං, සයෙක් නම් කිම; ඡ අජ්ඣත්තිකානි ආයතනානි, අධ්‍යාත්මික ආයතන සයහ; හෙවත්—චක්ඛායතනය සොතායතනය ඝාණායතනය ජිව්හා යතනය කායායතනය මනායතනය යන ඇතුලත් ආයතනයෝ සදෙනයි.

සත්ත නාම කිං, සතෙක් නම් කිම; සත්ත බොජ්ඣඞ්ගා, සප්ත බොධ්‍යඞ්ගයහ; හෙවත් —ස්මෘතිසම්බොධ්‍යඞ්ගය ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගය, සමාධිසම්බොධ්‍යඞ්ගය උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය යන බොධ්‍ය ඞ්ග සතයි.

අට්ඨ නාම කිං, අටෙක් නම් කිම; අරියො අට්ඨඞ්ගිකො මග්ගො, අරිඅටඟි මගහ; හෙවත්—සම්‍යග්දෘෂ්ටිය සම්‍යක්සංකල්පනාවය සම්‍යග්වචනය සම්‍යක් කර්මාන්තය සම්‍යගාජීවය සම්‍යග්ව්‍යායාමය සම්‍යක්සිහිය සම්‍යක්සමාධිය යන ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගයයි.

නව නාම කිං, නවයෙක් නම් කිම, නව සත්තාවාසා, සත්ත්වාවාස නවයයි; හෙවත්–නානත්තකායා නානත්තසඤ්ඤී–නානත්තකායා එකත්තසඤ්ඤී–එකත්ත කායා නානත්තසඤ්ඤී–එකත්තකායා එකත්තසඤ්ඤී–අසඤ්ඤී–යන පස ද අරූපාවචර සතර හා නව සත්ත්වාවාසයයි.

දස නාම කිං, දසයෙක් නම් කිම; දසහි අඞ්ගෙහි සමන්නාගතො, දස අඟින් යුක්තවූ මහණතෙම; අරහාති වුච්චති, රහතැයි කියනුලැබේ; හෙවත්–අශෛක්ෂවූ සම්‍යග්දෘෂ්ටියෙන් අශෛක්ෂවූ සම්‍යක්කල්පනාවෙන් අශෛක්ෂවූසම්‍යග්වචනයෙන් අශෛක්ෂවූ සම්‍යක්කර්මාන්තයෙන් අශෛක්ෂවූ සම්‍යගාජීව යෙන් අශෛක්ෂවූ සම්‍යග්ව්‍යායාමයෙන් අශෛක්ෂවූ සම්‍යක්ස්මෘතියෙන් අශෛක්ෂවූ සම්‍යක්සමාධියෙන් අශෛක්ෂවූ සම්‍යග්ඥානයෙන් අශෛක්ෂවූ සම්‍යග්විමුක්ති යෙන් ද යන මේ දස අඞ්ගයෙන් සමන්විතවූයේ රහතැයි කියනුලැබේ යන අර්ථයි; මෙපමණකින් සාමණේරප්‍රශ්නයෙහි සංක්ෂෙපාර්ථ දක්වනලදි.

මෙතැන්පටන් විස්තරාර්ථයන් සර්වප්‍රකාරයෙන් නොව එකදෙශයකින් නිර්දේශවශයෙන් දක්වීම වේ, ඒ කෙසේදයත්? සියලුසත්ත්‍වූ ආහාර පසයෙන් සිටිත්නුයි යන මේ ආහාරනිර්දේශයෙහි සියලුසත්ත්‍වූ නම් කවරහ? අපාද–දිපාද–චතුප්පාද–බහුප්පාද–රූපී–අරූපී–සඤ්ඤී–අසඤ්ඤී—නෙවසඤ්ඤී නාසඤ්ඤී යනාදි කාමභව–රූපභව–අරූපභව යන තුන්භවයෙහි සිටි සත්ත්වයෝයි, රාගාදි කෙලෙසුන්ගෙන් තැවෙන සිත්ඇත්තේ සත්ත්වනම් වේ, මේ සත්ත්වනාමය පරමාර්ථහෙයින් නොවේ සම්මුතිවශයෙන් වේ, වදාළේමය.:—

යථා හි අඞ්ගසම්භාරා හොති සද්දො රථො ඉති,
ඒවං ඛන්ධෙසු සන්තෙසු හොති සත්තො'ති සම්මුති.

යම්සේ දුරුඅවයවයෙන් සදනලද්දේ රථයයි කියා නම්වේද, එපරිද්දෙන් පඤ්ච ස්කන්ධයට සම්මුතිවශයෙන් සත්ත්වනම් වේ, පරමාර්ථහෙයින් පඤ්චස්කන්ධ නම් වේ; මෙහි ආහාර නම් කවරේද? කබලිඞ්කාරාහාරය ඵස්සාහාරය මනොසඤ්චෙ

නාහාරය විඤ්ඤාණාහාරය යන මේ සතරයි, හෙවත්-මනුෂ්‍යයන්විසින්අනුභවකරණ බත්-ව්‍යංජනාදී ආහාරයෝ ද දෙවියන් අනුභවකරණ සුධාභෝජනාදිය ද ජීවිතය රැකීමට ආහාරවූයේ කබලිඞ්කාරාහාර නම් වේ; චක්ෂුස්පර්ශය ශ්‍රොත්‍රස්පර්ශය ඝ්‍රාණස්පර්ශය ජිහ්වාස්පර්ශය කායස්පර්ශය මනඃස්පර්ශය යන ස්පර්ශයෙන් චක්ෂුස්පර්ශවේදනාය ශ්‍රොත්‍රස්පර්ශවේදනාය ඝ්‍රාණස්පර්ශවේදනාය ජිහ්වාස්පර්ශවේදනාය කායස්පර්ශවේදනාය මනඃස්පර්ශවේදනාය යනමොහු වෙත්, මෙසේ ස්පර්ශය වේදනාව ආහාරකොට ඇතිහෙයින් ඵස්සාහාර නම් වේ; මනෝසංචේතනාහාර නම්, කාමාවචර කුසල්සිත් අට ද රූපාවචර කුසල්සිත් පස ද අරූපාවචර කුසල්සිත් සතර ද දොළොස් අකුසලචිත්තයෝ ද යන මොහු තුන්භවයෙහි උත්පත්තිවශයෙන් පැවැත්මට හෙතුවූයේ මනෝසංචේතනාහාර නම් වෙත්; විඤ්ඤාණාහාර නම්, සතරඅපායෙහි පිළිසිඳගන්නාවූ අකුසලවිපාකඅහෙතුකමනොවිඤ්ඤාණය ද මිනිස්ලොව ජාත්‍යන්ධ-බධිර-උම්මතු—ගොළු ආදී සත්ත්වයන්ගේ පිළිසඳ ගන්නාවූ කුසලවිපාකඅහෙතුකමනොවිඤ්ඤාණය ද දෙවියන් හා මිනිස්ලොව පින්වත් සත්ත්වයන්ගේ පිළිසිඳ ගැනීමට හේතුවූ කාමාවචරවිඤ්ඤාණ අට ද රූපීබ්‍රහ්මලොකයෙහි උපදවන රූපාවචරවිඤ්ඤාණ පස ද අරූපීබ්‍රහ්මලොකයෙහි උපදවන අරූපාවචරවිඤ්ඤාණ සතර ද යන මොහු මෙයින් උපන් නාම-රූපයන්ට ආහාර වෙත් නුයි විඤ්ඤාණාහාර නම් වෙත්. මේ සියලු සත්ත්වයන් සිටින සතරආහාරපසය වේ; මේ මෙහි සංක්ෂෙපයි විස්තරහෙයින් මෙසේ දතයුතු.

අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාම-රූපං, නාම-රූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා-ජරාමරණං සොක-පරිදෙව-දුක්ඛ-දොමනස්සුපායාසා සම්භවන්ති; එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

දුඃඛසත්‍යය නොදන්නා මෝහය සමුදයසත්‍යය නොදන්නා මෝහය නිරෝධසත්‍යය නොදන්නා මෝහය මාර්ගසත්‍යය නොදන්නා මෝහය යන සතරතන්හි පැවති මෝහය හෙතුකොට ගෙණ එකුන්තිසක් පමණ කුසලාකුසලසංස්කාරයෝ වෙත්, ඔහු කවරහ? ලොභමූලික අකුසලසිත් අටෙක, ද්වේෂමූලික අකුසලසිත් දෙකෙක, මොහමූලික අකුසලසිත් දෙකෙකැයි අකුසලසිත් දොළසෙක් වෙත්;-කාමාවචර-කුසල්සිත් අටෙක, රූපාවචර කුසල්සිත් පසෙක, අරූපාවචර කුසල්සිත් සතරෙකැයි කුසල්සිත් දහසතෙක්;—මෙසේ කුසලාකුසලසිත් එකුන්තිසෙක් වේ;-මොවුන්ගේ උත්පත්තික්‍රමය පිළිවෙළින් මෙසේ දතයුතු;—"සොමනස්සසහගතං," යනාදින් ඉෂ්ටානුභවය ලක්ෂණකොට ඇති සොම්නස් සහගියාවූ අනිත්‍යාදිධර්මස්වභාව හැර නිත්‍ය-ධ්‍රැව-ශුභාදි වශයෙන්, විපරිතවූ මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තවූ තමාවිසින් හෝ මෙරමාවිසින් හෝ කරණලද පූර්වප්‍රයොගවිරහිතහෙයින් අසංස්කාරිකවූ එක් අකුසලචිත්තයෙක, තමාවිසින් හෝ අන්‍යයන්විසින් හෝ කරණලද පූර්වප්‍රයොගසහිතවූ හෙයින් සසංස්කාරිකවූ එක් අකුසලචිත්තයෙක; සොමනස්සසහගතවූ කාමයෙහිආදීනවයෙක් නැතැයි යනාදින් ගත් මිථ්‍යාදෘෂ්ටිය හා අමිශ්‍රවූ තමාවිසින් හෝ අනික්කෙනෙකුන්විසින් කරණ උත්සාහයක් නැතිව ස්වභාවතීක්ෂණවූ සිතින්ම කාමසෙවනාදිය කරණකල උපදනා අසංස්කාරිකවූ එක් අකුසල චිත්තයෙක;

එසේ ම සොම්නස් සහගියාවූ මිථ්‍යාදෘෂ්ටිය හා අමිශ්‍රවූ අන්‍යොත්සාහසහිතවූ සිතින් කාමසෙවනාදිය හෝ දුෂ්ටමඞ්ගලාදිය හෝ සාරයයි ගන්නාලද හෙ සිත් උපදනා සසංස්කාරිකවූ එක් අකුසලචිත්තයෙක; මධ්‍යස්ථානුභවනලක්ෂණවූ උපෙක්ෂාවේදනාව හා එකොත්පාදාදිභාවයට ගියාවූ විපරීතමිථ්‍යාදෘෂ්ටියෙන් සම්ප්‍රයුක්තවූ එක් අසංස්කාරික අකුසලචිත්තයෙක; එසේම සසංස්කාරිකවූ එක් අකුසලචිත්තයෙක; උපෙක්ෂාසහගතවූ විපරීතමිථ්‍යාදෘෂ්ටිය හා මිශ්‍රනොවූ අසංස්කාරිකවූ එක් අකුසලචිත්තයෙක, උපෙක්ෂාසහගතවූ විපරීතමිථ්‍යාදෘෂ්ටිය හා මිශ්‍රනොවූ සසංස්කාරික එක් අකුසලචිත්තයෙක; යන මේ ලොභසහගතවූ අකුසලචිත්තයෝ අටදෙන ද;—ප්‍රතිඝයෙන් සම්ප්‍රයුක්තවූ ද්වේෂසහගතවූ අසංස්කාරික-සසංස්කාරිකඅකුසලචිත්තයෝ දෙදෙන ද;—උපෙක්ෂාසහගතවූ බුද්ධාදි අටතන්හි ඇද්ද? නැද්දෝ හෝයි? උපදනා සංශය ලක්ෂණවූ විචිකිච්ඡාවෙන් සම්ප්‍රයුක්තවූ එක් අකුසලචිත්තයෙක; රූප ශබ්දාදියෙහි සිත නොසන්හුන්බවයයි කියනලද උද්ධච්චය හා එකොත්පාදාදි ප්‍රකාරයෙන් යුක්තවූ එක් අකුසලචිත්තයෙක, යන මෝමූළචිත්තයෝ දෙදෙන ද, යන මෙකී දොළොස් අකුසලචිත්තයෝ ද;—නිර්මලආනිසංස දක්නාබැවින් හා සඤ්ජාතමානසිකසුඛවේදනාවෙන් යුක්ත හෙයින් සොම්නස් සහගතවූ විශුද්ධශ්‍රද්ධාදි පඤ්චෙන්ද්‍රියයන්ගේ මුහුකිරීමෙන් ඥනසම්ප්‍රයුක්තවූ තමන්ගේ හෝ අන්‍යයන්ගේ උත්සාහයක් නැතිව ස්වකීයස්වභාවවූ සිතින්ම දන සීලාදි පින් කරණකල උපදනා අසංස්කාරිකවූ එක් කුසලචිත්තයෙක, සොම්නස් සහගතවූ ඥනසම්ප්‍රයුක්තවූ දන්දෙව පින්කරව යනාදි අන්‍යොත්සාහසහිතවූ සිතින් දනාදි පින් කරණකල උපදනා සසංස්කාරිකවූ එක් කුසලචිත්තයෙක; දෙමව්පියන්ගේ පුණ්‍යක්‍රියාදර්ශනයෙහි සඤ්ජාතපරිචය ඇති බාලදාරකයෝ සඟුන් දක සොම්නස් උපදවා වහා දිවගොස් අතනිබූ කිසිවක් දන්දෙද්ද වඳිද්ද එකල ඔවුන්ට සොම්නස් සහගතවූ ඥනවිප්‍රයුක්තවූ අසංස්කාරිකවූ එක් කුසලචිත්තයෙක් උපදනේය, විශුද්ධශ්‍රද්ධාබුද්ධිසම්පන්න සත්පුරුෂජනයෝ තමන් දරුවන් ලන් කොට ප්‍රත්‍යක්ෂ අප බුදුන් සඟුන් වඳුව පුදව යනාදින් උත්සාහ සහිතවූවාහු සතුටුව වඳිද්ද පුදද්ද එකල ඔවුන්ට සොම්නස් සහගතවූ ඥනවිප්‍රයුක්ත අසංස්කාරික එක් කුසලචිත්තයෙක් උපදනේය; උපෙක්ෂාසහගතවූ ඥනසම්ප්‍රයුක්තවූ අසංස්කාරික-සසංස්කාරික කුසලචිත්තයෝ දෙදෙනෙක; උපෙක්ෂාසහගතවූ ඥනවිප්‍රයුක්තවූ අසංස්කාරික-සසංස්කාරිකවූ කුසලචිත්තයෝ දෙදෙනෙක; බලවත් ශ්‍රද්ධාව විශුද්ධදෘෂ්ටිය ආනිසංසදර්ශනය ප්‍රත්‍යප්‍රතිග්‍රාහකය යන සොම්නස් උපදවීමට හෙතුවූ මේ සතර අඞ්ගවිකල්පයෙහිම සොම්නස් රහිතවූ සිත් ඇති වෙද්ද එකල මෙකී සිත්සතර උපෙක්ෂාසහගතව උපදනේය; යන මේ කාමාවචර කුසල්සිත් අට ද;—තමා හා සම්ප්‍රයුක්තචිත්ත-චෛතසිකධර්මයන් අරමුණට නගණ විතර්කය ද, තමා හා සම්ප්‍රයුක්තචිත්ත-චෛතසිකධර්මයන් අරමුණෙහි හසුරුවන විචාරය ද, ඉෂ්ටාලම්බනප්‍රතිලාභයෙහි පිණනය කරණ ප්‍රීතිය ද, ප්‍රතිලබ්ධාලම්බනය ග්‍රහණය නොකොට ඒකඅරමුණක් ම උතුම්කොට ඇතිබැවින් සම්ප්‍රයුක්තධර්මයන්ගේ අවික්ෂිප්තභාවසාධකවූ සමාධිය ද, යන පඤ්චාඞ්ගයෙන් සමන්විතවූ පළමුවන ධ්‍යානකුසලචිත්තය ද; තමාහා සම්ප්‍රයුක්තචිත්ත-චෛතසිකධර්මයන් අරමුණෙහි හසුරුවන විචාරය ද, ඉෂ්ටාලම්බනප්‍රතිලාභයෙහි පිණනය කරණ ප්‍රීතිය ද, ප්‍රතිලබ්ධාලම්බනයෙහි රසස්වාද කරණුව උපදනා සුඛය ද, නානාලම්බනග්‍රහණය

නොකොට ඒකාරම්මණයක් ම උතුම්කොට ඇතිබැවින් සම්ප්‍රයුක්තධර්මයන්ගේ අවික්ෂිප්තභාවසාධකවූ සමාධිය ද, යන සතරඅඟින් යුක්තවූ දෙවෙනි ධ්‍යානකුසලචිත්තයද; ඉෂ්ටාලම්බනප්‍රතිලාභයෙහි පිණනය කරණ ප්‍රීතිය ද, ප්‍රතිලබ්ධාලම්බනයෙහි රසාස්වාද කරණුව උපදනා සුඛය ද, නානාලම්බනග්‍රහණය නොකොට ඒකාරම්මණයක් ම උතුම්කොට ඇතිබැවින් සම්ප්‍රයුක්තධර්මයන් ගේ අවික්ෂිප්තභාවසාධකවූ සමාධිය ද, යන අඞ්ගතුනින් සමන්විතවූ තුන්වෙනි ධ්‍යානකුසලචිත්තයද; ප්‍රතිලබ්ධාලම්බනයෙහි රසාස්වාද කරණුව උපදනා සුඛය ද, නානාලම්බනග්‍රහණය නොකොට ඒකාරම්මණයක් ම උතුම්කොට ඇතිබැවින් සම්ප්‍රයුක්තධර්මයන් ගේ අවික්ෂිප්තභාවසාධකවූ සමාධිය ද, යන අඞ්ගදෙකින් සමන්විතවූ සතරවෙනි ධ්‍යානකුසලචිත්තයද; නානාලම්බනග්‍රහණය නොකොට ඒකාරම්මණයක් ම උතුම්කොට ඇතිබැවින් සම්ප්‍රයුක්තධර්මයන් ගේ අවික්ෂිප්තභාවසාධකවූ සමාධියෙන් සමන්විතවූ පස්වන ධ්‍යාන කුසලචිත්තයද; යන රූපාවචර කුසල්සිත් පසද;—රූපසමතික්‍රමනය කොට කියුනු ඉදළු අහස්හි උපදනා ආකාසානඤ්චායතනකුසලචිත්තය ද; ආකාසය සමතික්‍රමනය කොට එහි ප්‍රවෘත්තවිඥානය ගොචරකොට ඇති විඥානඤ්චායතනකුසලචිත්තය ද; පූර්වරූපසමතික්‍රමනය කොට ඔහුගේ නාස්තිභාවය විෂයකොට ඇති ආකිඤ්චඤ්ඤායතනකුසලචිත්තය ද; ඒ පූර්වාරූපයාගේ නාස්තිභාවය සමතික්‍රමනය කොට එහි ප්‍රවෘත්තතෘතියාරූපය අරමුණුකොට ඇති නෙවසඤ්ඤානාසඤ්ඤායතනකුසලචිත්තය ද; යන අරූපාවචර කුසල්සිත් සතර ද;—යන මේ එකුන්තිස් කුසලාකුසලසංස්කාරයෝ අවිද්‍යාහෙතුවෙන් වෙත්.

කුසලාකුසලසංස්කාරය හෙතුකොටගෙණ ප්‍රතිසන්ධිවශයෙන් එකුන්විසි වැදෑරුම්වූ ප්‍රවෘත්තිවශයෙන් දෙතිස්වැදෑරුම්වූ විපාකවිඥානය වෙත්;—ඒ කවරේදයත්? සතරඅපායෙහි පිළිසිඳගන්නාවූ අකුසලවිපාකඅහෙතුක මනොවිඥානධාතුචිත්තය ද, මිනිස්ලොව ජාත්‍යන්ධ-ජාතිබධිර-උන්මත්ත-ජඩ ආදි සත්ත්වයන්ගේ පිළිසඳ ගන්නාවූ කුසලවිපාකඅහෙතුකමනොවිඥානධාතුචිත්තයද, දෙවියන් හා මිනිස්ලොව පින්වත් සත්ත්වයන්ගේ පිළිසිඳගැණීමට හෙතුවූ කාමාවචරවිපාකවිඥාන සිත් අට ද, රූපීබ්‍රහ්මලොකයෙහි උපදවන රූපාවචරවිපාකවිඥාන සිත් පස ද, අරූපීබ්‍රහ්මලොකයෙහි උපදවන අරූපාවචරවිපාකවිඥාන සිත් සතර ද, යන මේ එකුන්විසි ප්‍රතිසන්ධිවිඥානයෝ වෙත්;—ප්‍රවෘත්තිවශයෙන් දෙතිස්වැදෑරුම්වූ විපාකවිඥානයෝ මෙසේ දතයුතු, අකුසල විපාකඅහෙතුකයයි කියන ලද අකුසලකර්මයෙන් ම නරකය-තිර්යන්අපාය-ප්‍රෙතයොනිය-අසුරනිකාය යන සතරඅපායෙහි උපදවන ප්‍රවෘත්තිවිපාකවිඥාන සතර ද, අහෙතුකයයි කියනලද කුසලාකුසල දෙකින් සමවිපාකවශයෙන් අසුරභවනයෙහි අසුරයන්ගේ ද [illegible]-නාගයන්ගේ ද යක්ෂයන්ගේ ද කුම්භාණ්ඩයන්ගේ ද විමානප්‍රෙතයන්ගේ ද වශයෙන් මෙකී පස්ආකාර උපදවන ප්‍රවෘත්තිවිපාකවිඥාන පස ද, යට කියනලද ද්විහෙතුකවශයෙන් මනුෂ්‍යයන්කෙරෙහි ජාත්‍යන්ධ-ජාතිබධිර-ජාතිමූග-ජාතිපීඨ-පණ්ඩක-නපුංසක-උභතොබ්‍යඤ්ජනක වශයෙන් උපදවන ප්‍රවෘත්තිවිපාකවිඥානය ද, ත්‍රිහෙතුකවශයෙන් කුසලකර්මය හෙතුකොටගෙණ ඉන්ද්‍රියවිකලත්වය නැති මනුෂ්‍යයන්ගේ ද සර්වලොකයෙහි දෙවියන්ගේ ද ප්‍රතිසන්ධිය උපදවන ප්‍රවෘත්ති විපාක විඥාන සතහා දසසතර කාමාවචරප්‍රවෘත්තිවිපාකවිඥාන නම් වෙත්;—ප්‍රථමධ්‍යාන තුන්තලයෙහි ද

ද්විතීයධ්‍යාන තුන්තලයෙහි ද තෘතීයධ්‍යාන තුන්තලයෙහි ද චතුර්ථධ්‍යාන අසඥ භවයෙහි ද පඤ්චමධ්‍යාන වෙහප්ඵලයෙහි ද මෙසේ ඒකොළොස්තලයෙහි උපදවන ප්‍රවෘත්තිවිපාකවිඥාන ඒකොළොස රූපාවචර ප්‍රවෘත්තිවිපාකවිඥාන නම් වේ; සතර අරූපාවචරයෙහි උපදවන අරූපාවචරප්‍රවෘත්ති විපාක විඥාන සතර ද; යන මේ දෙතිස්වැදෑරුම්වූ ප්‍රවෘත්තිවිපාකවිඥානයෝ ද සංස්කාරප්‍රත්‍යයෙන් වන්නාහුයි.

විඥානය හෙතුකොටගෙණ වෙදනා-සංඥා-සංස්කාර යන ස්කන්ධ තුන වූ නාමයද, භූතොපාදයභෙදහෙයින් විප්‍රකාරවූ කර්මජරූපය ද වෙයි.

නාම-රූපය හෙතුකොටගෙණ චක්ෂු-සොත-ඝ්‍රාණ-ජිව්හා-කාය-මනො යන මේ ෂඩ්විධ අධ්‍යාත්මිකආයතනය වෙයි.

ෂඩායතනප්‍රත්‍යයෙන් චක්ෂුස්පර්ශය ශ්‍රොත්‍රස්පර්ශය ඝ්‍රාණස්පර්ශය ජිහ්වාස්පර්ශය කායස්පර්ශය මනඃස්පර්ශය යන ෂඩ්විධික ස්පර්ශය වෙයි.

ස්පර්ශප්‍රත්‍යයෙන් සුඛ-දුඃඛ-උපෙක්ෂාවශයෙන් ත්‍රිවිධවූ වෙදනාව වෙයි.

වෙදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාදිවශයෙන් ත්‍රිවිධවූ ෂඩාලම්බනාදිවශයෙන් අෂ්ටොත්තරශතප්‍රභෙද තෘෂ්ණාව වෙයි.

තෘෂ්ණාප්‍රත්‍යයෙන් කාමුපාදනාදි වශයෙන් චතුර්විධවූ උපාදනය වෙයි.

උපාදනප්‍රත්‍යයෙන් නවවිධවූ උත්පත්තිභවය වන්නේය.

කර්මභවප්‍රත්‍යයෙන් ස්කන්ධයන්ගේ පහලවීමවූ ජාතිය වෙයි.

ජාති ප්‍රත්‍යයෙන් ජරා-මරණ-සොක-පරිදෙව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාස යන මොහු වෙත්;—මෙසේ යථොක්තවූ ප්‍රත්‍යයපරම්පරාවශයෙන්ම සුඛාදීන් අමිශ්‍රවූ නොහොත් සියලු මේ වෘත්තදුඃඛසඞ්ඛ්‍යාතවූ දුඃඛයාගේ උත්පත්තිය වෙයි.

මෙහි අවිද්‍යානුශයෙන් යුක්තවූ සන්තානයෙහි කුසලාකුසලයන් විපාකදානසවභාවයෙන් පවත්නාහෙයින් අවිද්‍යාව හෙතුකොටගෙණ සංස්කාරයෝ උපදිති;—ප්‍රතිසන්ධිවිඥානය ද සංස්කාරයන්විසින් උපදවන ලදුව විපාකභවයෙහි පිහිටන්නේය, එසේමැයි ජනකවූ කුසලාකුසලයන් නැතිකල්හි විපාකවිඥානයන්ගේ උත්පත්තිය නොවන්නේය, එසේ හෙයින් සංස්කාරයන් හෙතුකොටගෙණප්‍රතිසන්ධි(ප්‍රවෘත්ති)විඥානය වන්නේය; නාම-රූපය ද පූර්වාඞ්ගමත්වයෙන් පිහිටවූ විඥානයාවිසින් පිටිවහල් ලදින් ප්‍රතිසන්ධි-ප්‍රවෘත්ති දෙක්හි පිහිටානුයි විඥානය හෙතුකොටගෙණ නාම-රූප දෙක වන්නේය.;—ෂඩායතනය ද නාම-රූප දෙක උපනිශ්‍රය කොට ඇත්තේ ම ෂඩ්විධවූ ස්පර්ශයාට වාරඛයෙන් යුදුයුපරිද්දෙන් ම පවතීනුයි නාම-රූපය හෙතුකොටගෙණ ෂඩායතනය වෙයි;—ස්පර්ශය ද ෂඩායතනයන්ගේ සමඟවයක් ඇතිකල්හි ම ආලම්බනස්පර්ශය කරන්නේය චාරයාගේ අසම්භවයෙහි ස්පර්ශයාගේ උත්පත්තිය නැත්නුයි ෂඩායතනය හෙතුකොටගෙණ ස්පර්ශය වන්නේය;—ඉෂ්ටානිෂ්ට-මධ්‍යස්ථාලම්බනය ස්පර්ශකරන්නාහු ම සුඛාදි වෙදනාව අනුභව කෙරෙති අනික්ලෙසක අනුභව නොකෙරෙත්නුයි ස්පර්ශ ප්‍රත්‍යයෙන් ම වෙදනා වෙයි;—අනුභව කටයුතුවූ ධර්මයන්කෙරෙහි ආස්වාදවශයෙන් බලන්නාහට වෙදනාව හෙතුකොටගෙණ ම තෘෂ්ණාව උපදිනුයි වෙදනාප්‍රත්‍යයෙන්ම තෘෂ්ණාව වෙයි;—තෘෂ්ණාව නැමැති සෙනහයෙන් පිපාසිතවූ සත්ත්වයෝ ම උපාදනයන්ට ගිතවූ ධර්මයන්කෙරෙහි උපාදනයන්ගේ දෘඪත්වය පිණිස පවත්නාහුයි, එසේමැයි—තෘෂ්ණාව හෙතුකොටගෙණ රූපාදීන්

ආස්වාද කොට කාමයන් අනුභව කටයුතුබවට දැමිණේනුයි තෘෂ්ණාව කාමූපාදානයට ප්‍රත්‍යයවේ;-එසේ ම රූපාදිප්‍රභෙද ඇත්තාවූ ෂඩාලම්බනයෙහි ගිජුවූ සත්ත්වතෙම "නත්ථිදින්නං" යනාදින් මිථ්‍යාදෘෂ්ටිය ද සංසාරයෙන් නොමිදෙනු කැමැත්තේ නිර්වාණප්‍රාප්ත නොවූ අශුබමාර්ගයෙහි දෘඪග්‍රහණය ද පඤ්චස්කන්ධයෙහි ආත්ම-ආත්මීයග්‍රහණවශයෙන් ප්‍රවෘත්තාවූ ආත්මවාදදර්ශනය ද ගන්නේය, එසේහෙයින් දෘෂ්ටිඋපාදානාදින්ට ප්‍රත්‍යය වේනුයි තෘෂ්ණාප්‍රත්‍යයෙන් ම උපාදානය වේ;—සම්ප්‍රයොග-අනුසයවශයෙන් සුදුසුසුදුසුපරිද්දෙන් උපාදානයන්කෙරෙහි පිහිටියාවූ ම සත්ත්වයෝ කර්මයාගේ රාශිකරණය පිණිස පවතිත්නුයි උපාදානය ම භවයට ප්‍රත්‍යය වෙයි;—උත්පත්තිභවසඞ්ඛ්‍යාත ජාතිතොමෝ බීජයෙන් අඞ්කුරොත්පත්තිය මෙන් කර්මභවය හෙතුකොට ඇත්තිම ඒ ඒ භවයෙහි ලැබේනුයි; භවය ම ජාතියට ප්‍රත්‍යය වේ;—ජාතිය ඇතිකල්හි ජරා-මරණදෙදෙනාගේ සම්භවය වන්නේය, ජාතිරහිතයන්ට ජරායෙක්වත් මරණයෙක්වත් නොවෙත්නුයි ජාතිතොමෝ ජරා-මරණයන් දෙදෙනාට ප්‍රත්‍යය වේයයි; මෙසේ අවිද්‍යාදිප්‍රත්‍යයන්හා ප්‍රත්‍යයසමුත්පන්නයන්ගේ තත්භාවභාවීභාව දතයුතුකොත්යි.

ඒ ප්‍රතීත්‍යසමුත්පාදනයෙහි අතීතාදි කාලහෙයින් තුන්අද්ධයෝ ද, අවිද්‍යාදිවූ ද්වාදශාඞ්ගයෝ ද, එම අඞ්ගයන් සම්බන්ධවූ විංශත්‍යාකාරයෝ ද, හෙතුඵලයන්ගේ සන්ධානවශයෙන් ත්‍රිසන්ධි ද, එම සන්ධීන්ගේ ආද්‍යන්තවශයෙන් ව්‍යවස්ථිතවූ සතර කොට්ඨාසයෝ ද, කෙලශ-කර්ම-විපාකවශයෙන් ත්‍රිවිධවූ වෘත්තයෝ ද, පූර්වාන්ත-අපරාන්ත මූලහෙයින් මූලයෝ දෙදෙන ද, දතයුත්තාහුයි.

ඒ අද්ධාදීන් අතුරෙහි අවිද්‍යා-සංස්කාරයෝ අතීතභවපරියාපන්නහෙතුන්ගේ ම මෙහි සඞ්ග්‍රහණය හෙයින් අතීතඅද්ධ නම් වෙති, මෙහි අද්ධග්‍රහණයෙන් අවිද්‍යාදි කර්මයන්කෙරෙන් විනිර්මුක්තවූ කිසි කාලයක්හු නොලැබෙන හෙයින් අවිද්‍යාදි කර්මයන්ගේ ම ග්‍රහණයයි; ඒ එසේමැයි, නිරුද්ධවූ අනුත්පන්නවූ ධර්මයෝ අතීතානාගතකාලහෙයින් ද උත්පාදදිස්ක්ෂණත්‍රය පරියාපන්නවූ ධර්මයෝ වර්තමානකාලවශයෙන්ද ව්‍යවහාර කරණුලැබෙත්; ජාති-ජරා-මරණය වර්තමානහෙතුයෙන් අනාගතයෙහි උපදනාහෙයින් අනාගතඅද්ධ නම් වේ; අතීතානාගත දෙදෙනාගේ මධ්‍යයෙහි විඥානාදි අෂ්ටාඞ්ගයෝ අතීතහෙතුයෙන් මෙහි උපදනා ඵලස්වභාව ඇතිබැවින් අනාගත ඵලයට මෙහි හෙතුස්වභාව ඇති බැවින් ද ප්‍රත්‍යුත්පන්නඅද්ධ නම් වෙයි කියා අද්ධයෝ තුන්දෙනෙක් වෙත්.

අවිද්‍යා-සංස්කාර-විඥාන-නාමරූප-ෂඩායතන-ස්පර්ශ-වෙදනා-තණ්හා-උපාදාන-භව-ජාති-ජරාමරණයයි කියා අඞ්ගයෝ දොළසෙක් වෙත්; මේ අවිද්‍යාදීන්කෙරෙහි සොක-පරිදෙව ආදි වචනයවනාහි ජාතියගේ අමුඛ්‍යඵල දුක් විමයි, එහෙයින්ම සොකාදිය අඞ්ගයන්කෙරෙහි නොකියනලද්දයි දතයුතු;.

අවිද්‍යා-සංස්කාරග්‍රහණයෙන් තෘෂ්ණා-උපාදාන-භව යන මොහු ගන්නාලද්දාහු වෙත්;—මෙහි අවිද්‍යාග්‍රහණයෙන් කෙලශසාමාන්‍යයෙන් තෘෂ්ණා-උපාදානයන මොහු ගන්නාලදහ;—සංස්කාරග්‍රහණයෙන් කර්මවෘත්තසාමාන්‍යයෙන් කර්මභවය ගන්නාලද්දයි දතයුතු;—තෘෂ්ණා-උපාදාන-භවග්‍රහණයෙන් අවිද්‍යා-සංස්කාර යන මොහු එසේම ගන්නාලදහු;-මෙහි තෘෂ්ණා-උපාදානග්‍රහණයෙන් අවිද්‍යාව ගන්නාලද අවිද්‍යාවගේ අභාවයෙහි තෘෂ්ණා-උපා

දන යන මොවුන්ගේ අසම්භවය වන හෙයිනි;—භවග්‍රහණයෙන් ද සංස්කාරයෝ ගන්නාලද, සංස්කාරයන්ගේ අභාවයෙහි කර්මොපචය ලක්ෂණවූ ම භවයාගේ සම්භවයක් නැති හෙයිනැයි දතයුතු;—ජාති-ජරා-මරණයෙන් ද, විඥාන-නාමරූප-සළායතන-ඵස්ස-වෙදනාවගේ වශයෙන් විඥානාදි ඵලපඤ්චකය ම ගන්නාලදැයි කියායි;—මෙහි විඥාන-නාමරූප-ෂඩායතන-ස්පර්ශ-වෙදනා යන මොවුන්ගේ ජාති-ජරා-භඞ්ගයෝ ම ජාති-ජරා-මරණයයි කියනලද්දහුනුයි ජාති- ජරා-මරණය ම යනාදී කීහු;—ස්වරූප හෙයින් කියනලද්දවූ අවිද්‍යා-සංස්කාර දෙදෙනාගේ ද සංග්‍රහවශයෙන් කියනලද්දවූ තෘෂ්ණා-උපාදාන-භවය යන තුන්දෙනාගේ ද වශයෙන් වර්ත්තමාන ඵලයට ප්‍රත්‍යයහෙයින් අතීතභවයෙහි නිවෘත්තවූ හෙතූහු පස්දෙනය, අතීතහෙතුප්‍රත්‍යයෙන් වර්ත්තමානභවයෙහි නිවෘත්තවූ විඥානාදි ඵලපඤ්චකය, ස්වරූප හෙයින් කියනලද්දවූ තෘෂ්ණාදී තුන්දෙනාගේ ද සංග්‍රහවශයෙන් ගන්නාලද්දවූ අවිද්‍යා-සංස්කාර දෙදෙනාගේ ද වශයෙන් ආයතිඵලයට ප්‍රත්‍යයහෙයින් වර්ත්තමානභවයෙහි නිවෘත්තවූ හෙතූහු පස්දෙනය, ජරා- මරණග්‍රහණයෙන් කියනලද විඥානාදි ඵලපඤ්චකය, වර්ත්තමානහෙතුප්‍රත්‍යයෙන් අනාගතභවයෙහි උපදනාවූ ඵලපඤ්චකයයි, මෙසේ අතීතහෙත්වාදිවූ විංශත් ප්‍රකාරයෝ ද;—හෙතු ඵලාදීන්ගේ අනන්තරවශයෙන් ත්‍රිසන්ධි ද, අතීතහෙත්වාදී සතර කොට්ඨාසයෝ ද, වන්නාහුයි.

මෙහි සන්ධිනම් අතීතහෙතූන්ගේ ද වර්ත්තමානඵලපඤ්චකයාගේ ද අතර එක් සන්ධියෙක, වර්ත්තමානඵලපඤ්චකයාගේ ද වර්ත්තමානහෙතූන්ගේ ද අතර එක් සන්ධියෙක, වර්ත්තමානහෙතූන්ගේ ද ආයතිඵලපඤ්චකයාගේ ද අතර එක් සන්ධියෙකැයි දතයුතුයි.

මෙහි සංක්ෂෙප නම් අතීතහෙතුය වර්ත්තමානවිපාකය වර්ත්තමානහෙතුය ආයතිවිපාකයයි චතුර්විධ වේ.

තෘෂ්ණා-උපාදාන යන මොහු ද ක්ලෙශවෘත්තය කර්මභවයයි කියනලද භවයාගේ එකදෙශය ද සංස්කාරයෝ ද කර්මවෘත්තය උත්පත්තිභවයයි කියනලද භවයාගේ එකදෙශය ද විඥානාදිපඤ්චක-ජාති-ජරාමරණවශයෙන් සප්තප්‍රකාරවූ අවශෙෂයෝද විපාකවෘත්තයයි වෘත්තයෝ තුන්දෙනෙක් වෙත්.

අවිද්‍යා-තෘෂ්ණාවන්ගේ වශයෙන් මූලයෝ දෙදෙනෙක් දතයුත්තාහුයි; මෙහි අවිද්‍යාව පූර්වාන්තයට මූලය තෘෂ්ණාව අපරාන්තයට මූලයයි; එම අවිද්‍යා-තෘෂ්ණාසංඛ්‍යාතවූ වෘත්තමූලයන්ගේ සත්‍යප්‍රතිවෙධයෙන් සිඳිවූ අප්‍රවෘත්තියෙන් වෘත්තය නිරුද්ධවන්නේය, නිරන්තරයෙන් ජරා-මරණසංඛ්‍යාතවූ මූර්ච්ඡාවෙන් සොකාදීන් සමර්පිතවූ සත්ත්වයන්ට කාමාශ්‍රවාදී ආශ්‍රවයන්ගේ උත්පත්තිය හෙතුකොටගෙණ නැවත අවිද්‍යාදිය වඩන්නේයි;—මේ උක්ත ප්‍රකාරයෙන් අවිච්ඡින්නවූ ආදිරහිතවූ ත්‍රෛභූමික වෘත්ත පර්යාපන්නහෙයින් ත්‍රෛභූමිකවූ ක්ලෙශ-කර්ම-විපාකයන්ගේ වශයෙන්ත්‍රිවිධවූ වෘත්තය ප්‍රතීත්‍යසමුත්පාදයයි සම්‍යක් සම්බුද්ධතෙම පැණවී.

**මෙපමණකින් “සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා” “සියලු සත්ත්වයෝ ආහාරප්‍රත්‍යයෙන් සිටින්නයි” යන මේ ප්‍රශ්නය දක්වනලදි.**

ලොව නාම කිං, දෙක නම් කිම; යන මේ ප්‍රශ්නයෙහි නාම-රූප සඳදෙන මෙසේ දතයුතු.

[සොමනස්සසහගතං දිට්ඨිගතසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං; සොමනස්සසහගතං දිට්ඨිගතවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං; උපෙක්ඛාසහගතං දිට්ඨිගතසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං; උපෙක්ඛාසහගතං දිට්ඨිගතවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකන්ති; ඉමානි අට්ඨපි ලොභසහගතචිත්තානි නාම.]

කාමාවචරාදි චතුර්විධචිත්තයන් අතුරෙන් පළමුකොට දැක්වූ කාමාවචර චිත්තය කවරෙක් ද යත්? ඉෂ්ටානුභවනලක්ෂණමානසිකසුඛවෙදනාව හා එකොත්පාදදිභාවයට ගියාවූ අනිත්‍යාදි ධර්මස්වභාව ඉක්ම නිත්‍ය–ශුචි–සුඛාදි වශයෙන් විපරීතාභිනිවෙශස්වභාවවූ මිථ්‍යාදෘෂ්ටිය හා එකොත්පාදදි ප්‍රකාරයෙන් යුක්තවූ තමාවිසින් හෝ මෙරමාවිසින් හෝ කරණලද පූර්වප්‍රයොගරහිතවූ එක් අකුසලචිත්තයෙක, යථොක්තවූ පූර්වප්‍රයොගසහිතවූ එක් අකුසලචිත්තයෙක; තුන්වන–සතරවන චිත්තවිය විපරීතදෘෂ්ටීන් විප්‍රයුක්තවූස යනු වෙනසි; අවශිෂ්ට සතරසිත මධ්‍යස්ථානුභවනලක්ෂණවූ උපෙක්ෂාවෙදනාව හා එකොත්පාදදිභාවයට ගියාවූ යනු වෙනසි;මොහු අටදෙන ලොභසහගතචිත්තයෝ නම්හු; මෙහි කාමාවචරචිත්තය කුශලාකුශල–විපාක–ක්‍රියාවශයෙන් චතුර්විධවුව කුසලයන් හා විපාක–ක්‍රියාවන් නොකියා පළමුකොට අකුසලයන්ම දක්වන්නට හෙතු කිමියත්?—පාපයන් හා අහෙතුකවර්ජිත කොට ඇති එකුන්සැට චිත්තයන්ට ද මධ්‍යමප්‍රවෘත්තියෙන් එකුනානුචිත්තයන්ට ද සොභනනාමයෙන් ව්‍යවහාර කරණුපිණිස "පාපාහෙතුකමුත්තානි සොභනානී'ති වුච්චරෙ" යන මතු කියන ක්‍රමයට ද අනුරූප කොට පාපයන් හා අහෙතුකයන් පළමුකොට දක්වන්නාහු ඔවුන්කෙරෙනුදු භවයෙහි ගන්නාලද ප්‍රතිසන්ධි ඇති සත්ත්වයන්හට ආදිකොට චිච්චිත්තවශයෙන් ලොභසහගතචිත්තයන්ගේ උත්පත්තිය ම සම්භවවනහෙයින් ලොභසහගතචිත්තයන් පළමුකොට දක්වා තදනන්තරව විහෙතුකභාවසාමාන්‍යයෙන් දෙමනස්සසහගතචිත්තයන් ද තදනන්තරව එකහෙතුකචිත්තයන් ද දක්වනුපිණිස "සොමනස්සසහගතං" යනාදීන් ලොභමූලිකචිත්තය වෙදනා–දෘෂ්ටි–සංස්කාරභෙදහෙයින් අෂ්ටප්‍රකාරයකින් විභාග කොට දක්වනලදැයි දතයුතු.

ලොමුමුන් අටදෙනාගේ උත්පත්තික්‍රමය මෙසේ දතයුතු; යම්කලෙක්හි කාමයෙහි ආදීනව නැතැයි යනාදීන් මිථ්‍යාදෘෂ්ටිය පෙරදැරි කොට තුටුපහටුවූයේ අනික්කෙනෙකුන්විසින් උත්සාහයක් නැතිව ස්වභාවතීක්ෂණවූ සිතින්ම පංචකාමය හෝ අනුභව කෙරේ ද දෘෂ්ටමංගලාදීන් හෝ සාරහෙයින් පසස්නේ නම් ද එසමයෙහි ප්‍රථමඅකුශලචිත්තය උපදනේය; යම්කලෙක්හි අනික්කෙනෙකුන්විසින් උත්සාහසහිතවූ සිතින් යට කියනලද පංචකාමසෙවනය හෝ දෘෂ්ටමංගලාදිය හෝ සාරහෙයින් ගණී ද එසමයෙහි දෙවනචිත්තය උපදනේය; යම්කලෙක්හි මිථ්‍යාදෘෂ්ටිය පෙරදැරි නොකොට හුදෙක් තුටුපහටුවූයේ ස්වභාවතීක්ෂණවූම අනුත්සාහිතසිතින් මෛථුනසෙවනය හෝ පරසම්පත්තියෙහි බලවත් ලොභ කෙරේ ද පරභාණ්ඩය හෝ [illegible]ණී ද එසමයෙහි තුන්වනසිත උපදනේය; යම්කලෙක්හි යට කී පරිද්දෙන් මන්දොත්සාහසහිතවූ සිතින් මෛථුනසෙවනාදිය කෙරේ ද එසමයෙහි සතරවනසිත උපදනේය; යම්කලෙක්හි කාමයන්ගේ හෝ අසම්පත්තියට පැමිණ අන්‍යවූ සොම්නසට හෙතු

වක්හුගේ අභාවයෙන් හෝ සතර අඞ්ගවිකල්පයෙහි ම සොමනස්සරහිතවූවාහු ව උපදිද්දද එසමයෙහි අවශෙෂ සතරසිත ම උපෙක්ෂාසහගතව ම උපදනාහුයි; "ඉමානි අට්ඨ'පි"යන්නෙහි 'අපි' ශබ්දය සමුච්චයාර්ථහෙයින් වක්ෂ්‍යමාණක්‍රමයෙන් අකුශලකර්මපථයෙහි ඔවුන්ගේ ලභ්‍යමානකර්මපථානුරූපවශයෙන් ප්‍රවෘත්තිභෙදයද කාල-දෙස-සන්තානාලම්බනාදිභෙදහෙයින් අනෙකප්‍රකාරය ද සඞ්ග්‍රහ කෙරේ; යන මේ ලොභසහගතඅකුසලචිත්තයෝ අටදෙනය.

[දොමනස්සසහගතං පටිඝසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකන්ති; ඉමානි ද්වේ'පි පටිඝචිත්තානි නාම.]

අනිෂ්ටානුභවනලක්ෂණවූ මානසිකදුක්ඛවෙදනාව හා එකොත්පාදදිභාවයෙන් යුක්තවූ චණ්ඩිකස්වභාවවූ අරමුණෙහි ගැටෙමින් උපදනාවූ සංස්කාරස්කන්ධපර්යාපන්නවූ ප්‍රතිඝයා හා සම්ප්‍රයුක්තවූ "අසඞ්ඛාරිකං" යනාදියෙහි අර්ථ යට කීපරිද්දෙන් දතයුතු;—මොහු දෙදෙනා ප්‍රතිඝසම්ප්‍රයුක්තචිත්තයෝ නම් වෙත්; මෙහිදු නිගමනයෙහි "අපි"ශබ්දයාගේ අර්ථ යට කියනලද නයානුසාරයෙන් දතයුතුයි.

[උපෙක්ඛාසහගතං විචිකිච්ඡාසම්පයුත්තමෙකං, උපෙක්ඛාසහගතං උද්ධච්චසම්පයුත්තමෙකන්ති; ඉමානි ද්වේ'පි මොමූහචිත්තානි නාම.]

උපෙක්ෂාසහගියාවූ බුද්ධාදී අටතන්හි උපදනා සංශයලක්ෂණවූ විචිකිච්ඡාව හා එකොත්පාදදි ප්‍රකාරයෙන් යුක්තවූ එක් අකුසලචිත්තයෙක, ආලම්බනයෙහි නොසන්හුන්බවයයි කියනලද ඖද්ධත්‍යයා හා එකොත්පාදදි ප්‍රකාරයෙන් යුක්තවූ එක් අකුසලචිත්තයෙකැයි, මොහු දෙදෙන මොමූහචිත්තයෝ නම් වෙත්; බුදුහු ඇත්තාහ හෝ නැත්තාහ හෝ යනාදින් බුද්ධාදී අටතන්හි උපදනා සංශයලක්ෂණවූ ශඞ්කාව විචිකිච්ඡා නම්; ඖද්ධත්‍යයා සර්වාකුසලසාධාරණවුව ද මෙහි සම්ප්‍රයුක්තධර්මයන්කෙරෙහි ප්‍රධානව පවතීනුයි මේ චිත්තය ම ඖද්ධත්‍යයාවිසින් වෙනස් කොට කියනලදී.

මෙසේ යථොක්තවූ ක්‍රමයෙන් සොමනස්සොපෙක්ෂා-දෘෂ්ටිසම්ප්‍රයොගාදි වශයෙන් ද ප්‍රතිඝසම්ප්‍රයොගාදි වශයෙන් ද විචිකිත්සා-ඖද්ධත්‍යසම්ප්‍රයොගාදි වශයෙන් දැයි මෙසේ සියලු සම්ප්‍රයොගාදිආකාරයෙන් දොළොස් අකුසලචිත්තයෝ සඞ්ග්‍රහකොට ගන්නාලදහු;—ලොභ(යන්ගේ ප්‍රතිපක්ෂ)මූලිකවූ චිත්තයෝ වෙදනාදි ප්‍රභෙදහෙයින් අෂ්ටප්‍රකාර වන්නාහ, ද්වෙෂමූලිකචිත්තයෝ සංස්කාරභෙදහෙයින් ද්විප්‍රකාරවන්නාහ, ශුද්ධමොහය මුල් කොට ඇති චිත්තයෝ ද සම්ප්‍රයොගභෙදහෙයින් දෙදෙනෙක් වෙති යී, අකුසලචිත්තයෝ දොළසෙක් වන්නාහුයි.

**අකුශලසඞ්ග්‍රහයයි.**

මෙසේ මූලභෙදවශයෙන් ත්‍රිවිධවූ අකුසලයන් සම්ප්‍රයොගභෙදහෙයින් දොළොස්පරිද්දෙකින් විභාග කොට දක්වා දූන් අහෙතුකචිත්තයන් දක්වන්නාහු අහෙතුකයන්ගේ ද කුශල-විපාකාදිවශයෙන් ත්‍රිවිධත්වය ඇතිකල්හි දූ අකුසලචිත්තයන්ට ඉක්බිතිකොට අකුසලවිපාකයන් ම චක්ෂුරාදිනිශ්‍රය-සම්ප්‍රත්‍යෂණාදි කෘත්‍යභෙදහෙයින් සත්පරිද්දෙකින් විභාග කරණුපිණිස "උපෙක්ඛාසහගතං චක්ඛුවිඤ්ඤාණං" යනාදී කීහු.

[උපෙක්ඛාසහගතං චක්ඛුවිඤ්ඤාණං තථා සොතවිඤ්ඤාණං ඝාණවිඤ්ඤාණං ජිව්හාවිඤ්ඤාණං දුක්ඛසහගතං කායවිඤ්ඤාණං උපෙක්ඛාසහගතං සම්පටිච්ඡනං උපෙක්ඛාසහගතං සන්තීරණං චේ'ති; ඉමානි සත්ත'පි අකුසලවිපාකචිත්තානි නාම.

උපෙක්ඛාසහගතං චක්ඛුවිඤ්ඤාණං තථා—පෙ—ජිව්හාවිඤ්ඤාණං සුඛසහගතං කායවිඤ්ඤාණං උපෙක්ඛාසහගතං සම්පටිච්ඡනං සොමනස්සසහගතං සන්තීරණං උපෙක්ඛාසහගතං සන්තීරණං චේ'ති; ඉමානි අට්ඨ'පි කුසලවිපාකාහේතුකචිත්තානි නාම.]

උපේක්ෂාවේදනාව හා එකොත්පාදාදිභාවයට ගියාවූ රූපාදි දර්ශනයට හේතුවූ චක්ෂුඃප්‍රසාදය ආශ්‍රය කොට පවත්නාවූ චක්ෂුර්විඥානය ද, එසේ ම උපේක්ෂාසහගතවූ ශබ්දශ්‍රවණයට හේතුවූ ශ්‍රොත්‍රප්‍රසාදය ආශ්‍රය කොට පවත්නාවූ ශ්‍රොත්‍රවිඥානය ද, ගන්ධාඝ්‍රාණයට හේතුවූ ඝ්‍රාණප්‍රසාදය ආශ්‍රය කොට පවත්නාවූ ඝ්‍රාණවිඥානය ද, රසාස්වාදයට හේතුවූ ජිහ්වාප්‍රසාදය ආශ්‍රය කොට පවත්නාවූ ජිහ්වාවිඥානය ද, අනිෂ්ටානුභවනලක්ෂණවූ කායිකදුඃඛවේදනාව හා එකොත්පාදාදිභාවයට ගියාවූ ස්පර්ශයට හේතුවූ කායප්‍රසාදය ආශ්‍රය කොට පවත්නාවූ කායවිඥානය ද, උපේක්ෂාසහගියාවූ රූපාදීන් ප්‍රතිග්‍රහණය කරන්නාවූ සම්ප්‍රත්‍යෙෂණචිත්තය ද, එසේ ම උපේක්ෂාසහගියාවූ රූපාදීන් තීරණය කරමින් උපදනා සන්තීරණචිත්තය ද; යන මොහු සත්දෙන අකුසලවිපාකචිත්තයෝ නම් වෙත්.

කුශලවිපාකචක්ෂුර්විඥානාදීන්ට ද මෙසේ ම සුදුසු සුදුසු ලෙස අර්ථ කියයුතුයි; මොහු අටදෙන කුසලවිපාකවූ අහෙතුකචිත්තයෝ නම් වෙත්;—මොහු නිර්වෘත්තහෙතුවශයෙන් නිෂ්පන්නාවූවාහු සම්ප්‍රයුක්තහෙතු නැතිහෙයින් අහෙතුකව්‍යවහාරය ලබත්; එසේ නොගතහොත් මහාවිපාකයන් හා මොවුන්ගේ නානාත්වයක් නැතිහෙයින්; යම්සේ මේ කුසලවිපාකනිගමනයෙහි අහෙතුකග්‍රහණය කියනලද ද එපරිද්දෙන් අකුසලවිපාකනිගමනයෙහි අහෙතුකග්‍රහණය කුමක්හෙයින් නොකියනලදද? ව්‍යභිචාරයක් නැතිහෙයිනි, ඒ එසේමැයි "සති සම්භවෙ ව්‍යභිචාරෙ ච විසෙසනං සාත්ථකං සියා" යනුහෙයින් සම්භවයක් හෝ ව්‍යභිචාරයක් ඇතිකල්හි විශේෂණය සාර්ථක වන්නේයි, අකුසලවිපාකයන් තමතමන් වනාහි ලොභාදි සාවද්‍යධර්මයන්ගේ විපාකයන් බැවින් තම් රුඹවූ අලොභාදීන් හා සම්ප්‍රයොගයක් නැතිහෙයින් අව්‍යාකෘතස්වභාවවූ උත්තමයන්ගේ ලොභාදිඅකුශලකර්මයන් හා සම්ප්‍රයොගවිරොධහෙයින් ද කිසිකලෙක්හි ද සහෙතුකත්වසම්භවයෙක් නැත්තුයි අහෙතුකභාවයාගේ ව්‍යභිචාරයක් නැතිහෙයින් අකුසලවිපාකයෝ අහෙතුකපදයෙන් වෙනස් නොකරණලදහු.

දැන් අහෙතුකප්‍රස්තාවෙහි අහෙතුකක්‍රියාචිත්තයනුදු කෘත්‍යභෙදහෙයින් තුන්පරිද්දෙකින් දක්වනුපිණිස "උපෙක්ඛාසහගතං" යනාදී කියනලදී.

[උපෙක්ඛාසහගතං පඤ්චද්වාරාවජ්ජනං, තථා මනොද්වාරාවජ්ජනං, සොමනස්සසහගතං හසිතුප්පාදචේ'ති; ඉමානි තීණි'පි අහෙතුකක්‍රියාචිත්තානි නාම.]

උපෙක්ෂාසහගියාවූ පඤ්චද්වාරයෙහි ආපාථගතරූපාදියට චිත්තසන්තතිය යොමු කරණ පඤ්චද්වාරාවර්ජනචිත්තය ද, එසේ ම උපෙක්ෂාසහගියාවූ මනොද්වාරයට හමුවූ රූපාදියට චිත්තසන්තතිය යොමු කරණ මනොද්වාරාවර්ජනචිත්තය ද, සොම්නස්සහගියාවූ අනෞදාරිකආලම්බනයෙහි රහතුන්ට සිනා උපදවන හසිතොත්පාදචිත්තය ද, යන මොහු තුන්දෙනා අහෙතුකක්‍රියාචිත්තයෝ නම් වෙත්;–අකුසලවිපාක–කුසලවිපාක–ක්‍රියාභෙදවසයෙන් ස්වප්‍රකාරයෙන් ම සුප්‍රතිෂ්ඨිතභාවසාධනත්වයෙන් මූලසදෘශවූ ලොභාදි–අලොභාදිහෙතුරහිත හෙයින් අහෙතුකවූ චිත්තයෝ අටළොස්දෙන මේ උක්තක්‍රමයෙන් සඞ්ග්‍රහ කොට කියානිමවන ලදහු.

අකුසලවිපාකයෝ සත්දෙනෙක, කුසලවිපාකයෝ අෂ්ටප්‍රකාර වෙති, විපාක දෙනයක් නැතිහෙයින් හුදු කිරීම මාත්‍රයක්හෙයින් ක්‍රියානයි කියනලද චිත්තයෝ තුන්දෙනෙකැයි, ලොභාදි-අලොභාදිහෙතුවිරහයෙන් අහෙතුකහයි කියනලද චිත්තයෝ අටළොසකි. **අහෙතුකචිත්තානයි.**

මෙසේ ද්වාදසඅකුසලයන් හා අටළොස් අහෙතුකචිත්තයන්ගේ වශයෙන් සමතිස් චිත්තකෙනෙකුන් දක්වා දැන් ඔවුන්කෙරෙන් විනිර්මුක්තචිත්තයන්ට ශොභනව්‍යවහාරය තබනපිණිස "පාපාහෙතුකමුත්තානි" යනාදි කියනලදී.

[පාපාහෙතුකමුත්තානි සොභනානී'ති වුච්චරෙ,
එකූනසට්ඨි චිත්තානි අථෙකනවුතී'පි වා.]

තමන්ට ආශ්‍රයවූවුන් අපායාදි දුඃඛයට පමුණුවනහෙයින් පාපයහයි කියනලද චිත්තයන්කෙරෙන් ද හෙතු-සම්ප්‍රයොගාභාවයෙන් අහෙතුකයහයි කියනලද චිත්තයන්කෙරෙන් ද මුක්තවූ සූවිසි කාමාවචරචිත්තයන් හා පන්තිස් මහග්ගත-ලොකොත්තරචිත්තයන්ගේ වශයෙන් එකුන්සැටක් පමණ චිත්තයෝ හෝ නොහොත් ලොකොත්තරයන් අටදෙන ධ්‍යානාඞ්ගයොගභෙදහෙයින් එකෙකි සිත පසක් පසක් කොට එකානවුතිචිත්තකෙනෙක් හෝ අලොභාදි අනවද්‍යහෙතුසම්ප්‍රයොග හෙයින් සොභනචිත්තයහයි කියනු ලැබෙත්.

දැන් සොභනයන් අතුරෙහි කාමාවචරයන් ම පළමුකොට දක්වනලදහෙයින් ඔවුන්කෙරෙනුදු අව්‍යාකෘතයන් තමන් කුසලයන් පූර්වාඞ්ගව කොට ඇතිබැවින් පළමුකොට කාමාවචරකුසලයන් ද ඉක්බිති කාමාවචරවිපාකයන් ද තදනන්තරව තදෙකභූමිපර්‍යාපන්නවූ ක්‍රියාචිත්තයන් ද වෙනවෙන වෙදනා-ඥාන-සංස්කාරභෙදහෙයින් අෂ්ටප්‍රකාරයකින් දක්වනුපිණිස "සොමනස්සසහගතං" යනාදි කියනලදී.

[සොමනස්සසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං;
සොමනස්සසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං;
උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං;
උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකන්ති; ඉමානි අට්ඨ'පි කාමාවචරකුසලචිත්තානි නාම.

සොමනස්සසහගතං—පෙ—සසඞ්ඛාරිකමෙකන්ති; ඉමානි අට්ඨ'පි සහෙතුක කාමාවචරවිපාකචිත්තානි නාම.

සොමනස්ස—පෙ—ඉමානි අට්ඨ'පි සහෙතුකකාමාවචර-ක්‍රියාචිත්තානි නාම.]

ඉෂ්ටානුභවනලක්ෂණවූ මානසිකසුඛවෙදනාව හා එකොත්පාදදිභාවයෙන් යුක්තවූ යථාස්වභාවප්‍රතිවෙධලක්ෂණවූ ඥාණය හා සම්ප්‍රයුක්තවූ "අසඞ්ඛාරිකං" යනාදිවූ පෙස්ස යටකී ක්‍රමයෙන් දතයුතු;—මෙහිදු බලවත් ශ්‍රද්ධාව ඇතිබැවින් ද විශුද්ධදෘෂ්ටි ඇතිබැවින් ද අනුසස් දක්නාබැවින් ද ප්‍රත්‍යය-ප්‍රතිග්‍රාහකාදි සම්පත්තියෙන් දැයි මේ ආදිකාරණයෙන් සෞමනස්‍යසහගතත්‍වය ද ප්‍රඥවගේ උත්පත්තියට කාරණවූ නිරවද්‍යශිල්ප ඉගැන්මෙන් ද ඉන්ද්‍රියපරිපාකහෙයින් ද ක්ලෙශයන්ගේ දූරිභාවයෙන් ද යනාදිකාරණයෙන් ඥානසහගතත්‍වය ද තද්විපරීතවශයෙන් උපෙක්ෂාසහගතත්‍වය ද ඥානවිප්‍රයුක්තත්‍වය ද ආවාසසප්‍රායාදිවශයෙන් කාය-චිත්තදෙදෙනාගේ මෘදුත්‍වයෙන් ද පූර්වයෙහි දනාදිසුචරිතයෙහි කරනලද පරිචය ඇතිබව ද යනාදි කාරණයෙන් අසංස්කාරත්‍වය ද විප

රිතවශයෙන් සසංස්කාරත්වය ද දතයුත්තේයි;—එහි යමෙක්තෙමේ දෙයධර්ම-ප්‍රතිග්‍රාහකාදී සම්පත්තියකට හෝ සෙසු සොම්නසට කාරණවූ ඉෂ්ටාලම්බනයකට හෝ පැමිණ තුටුපහටුවූයේ, “අත්ථි දින්නං” යනාදීවූ ක්‍රමයෙන් ප්‍රවෘත්තවූ සම්‍යග්දෘෂ්ටිය පෙරදැරි කොට පසු නොබැස අනුන්විසින් උත්සාහයක් නැතිව දනාදී පින්කම් යම්කලෙක්හි කෙරේද එසමයෙහි ඔහුගේ ඒ සිත සෞමනස්‍යසහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික වේ; යම්කලෙක්හි වනාහි යට කියනලද ක්‍රමයෙන් තුටුපහටුවූයේ සම්‍යග්දෘෂ්ටිය පෙරදැරි කොට අමුක්තත්‍යාගාදිවශයෙන් පසුබස්නේ හෝ මෙරමාවිසින් උත්සාහිතවූයේ හෝ පින්කම් කෙරේද එසමයෙහි ඔහුගේ ඒසිත සසංස්කාරික වේ; යම්කලෙක වනාහි ඥාතිජනයාගේ ප්‍රතිපත්තිදර්ශනයෙන් සජාතපරිචය ඇති බාලදරකයෝ භික්ෂූන් දක උපන් සොම්නස් ඇත්තාහු වහා අතනිබූ කිසිවක් දෙන්නාහු වෙද්ද, වඳනාහු වෙද්ද එසමයෙහි තුන්වනසිත උපදනේයි; යම්කලෙක්හි වනාහි ඒ බාලදරකයෝ ඤාතීන්විසින් ‘දෙව වඳුව’ යනාදින් උත්සාහිතවූවාහු දෙද්ද වඳිද්ද එසමයෙහි සතරවනසිත උපදී; යම්කලෙක වනාහි දෙයධර්ම-ප්‍රතිග්‍රාහකාදීන්ගේ අසමෘද්ධියට හෝ සොම්නසට හේතුවූ අනිකක්හුගේ අසත්භාවයට හෝ පැමිණ සතරඅභිවිකල්පයෙහි ම සොම්නස්රහිත වෙද්ද එසමයෙහි අනික් සතරසිත උපෙක්ෂාසහගතව උපදනේයි;—සොම්නසට හෙතුවූ ඉෂ්ටාලම්බනයෙහි ලොභසිත් නොසිපද කුසල්සිත් කෙසෙසින් උපදිද යත්?—

ප්‍රතිරූපෙෂු දෙශෙෂු වාසඃ පණ්ඩිතසඞ්ගතිඃ,
ශ්‍රවණං කෘතපුණ්‍යත්වං චතුශ්චක්‍රකීර්තිතං—යී,

කියනලද ප්‍රතිරූපදෙශවාසාදී චතුශ්චක්‍රසම්පත්තීන් යුක්තබවය යනාදීන් නුවණින් ඉෂ්ටාලම්බනයෙහි ආභොගව පැවතිහෙයින් ද කුසල් මාවිසින් කටයුතෙන්යයි කුසල් කරන්නට සිත නියම කළහෙයින් ද අකුසල් දුරු කොට කුසල් කිරීමෙහි නමසිත් පිහිටුවා පිරිනැමූහෙයින් ද නැවත නැවත කුසල් කිරීමෙහි ම සිත් පවත්වා පරිචය කළහෙයින් ද යන මේ සතරකාරණයෙන් සොම්නසට වස්තුවූ ඉෂ්ටාලම්බනයෙහි දු අකුසල් නොසිපද කුසල් ම උපදී;—කියනලදමැයි —

යොනිසො විසයාභොගා නියාමපරිනාමතො,
පුනඤ්ඤු පරිචිතත්තා ච ඉට්ඨෙ'පි කුසලං සියා—යි.

“අට්ඨ'පි” යන්නෙහි “අපි” ශබ්දය දශපුණ්‍යක්‍රියාදිවශයෙන් අනෙකවිධබව සමුච්චයකෙරේ;—කියේමැයි—

කමෙන පුඤ්ඤවත්ථූහි ගොචරාධිපතීහි ච,
කම්ම-හීනාදිතො චෙව ගණෙය්‍ය නයකොවිදො;—යි.

මේ චිත්තයෝ අටදෙන දශපුණ්‍යක්‍රියාවස්තූන්ගේ වශයෙන් එකි එකි දෙන දස-දසබැවින් අසූචිත්තයෙක් වන්නාහ, ඒ චිත්තයෝ ෂඩාලම්බනයෙහි පවත්නාහෙයින් වෙන වෙන ම ෂඩ්ගුණිතවූවාහු සාරසියඅසූවෙක් වෙති, අධිපතිභෙදයෙහි වනාහි ඥානවිප්‍රයුක්තවූ දෙසියසතළිසක් පමණ චිත්තය විමංසාධිපතිසම්ප්‍රයොගයක් නැතිහෙයින් ඒ චිත්තයෝ තුන්දෙන අධිපතීන්ගේ වශයෙන් තුන්ගුණ කරණලද්දහු සත්සියවිසිදෙනෙක් වෙති, එසේ ම ඥානසම්ප්‍රයුක්තවූ චිත්තයෝ ද සතරඅධිපතීන්ගේ වශයෙන් චතුර්ගුණ කරණලද්දහු පසලොස්දහස්එක්සියවිසිචිත්තයෙක් වන්නාහ, කාල-දෙශාදිභෙදයෙසින් වනාහි ඔවුන්ගේ භෙද පමණ නැතැයි දතයුතුයි.

යම්සේ වේ කුසලචිත්තයෝ කර්මද්වාරවශයෙන් ද කර්මවශයෙන් ද ප්‍රණීතක්‍රියාවසතුවශයෙන් ද ඡන්දාධිපතිආදීන්ගේ වශයෙන් ද පවතිද්ද ඔවුන්ගේ විපාකයෝ එම පරිද්දෙන් පවත්නාහු නොවෙත්; කුමක්හෙයින්දයත්? කාය-වාග්විඥප්තිජනක නොවනහෙයින් ද තමාගේ විපාකදානසම්භවයක් නැතිහෙයින් ද දානාදිවශයෙන් නොපවත්නා හෙයින් ද ඡන්දාදීන් පෙරදැරි කොට තමන්ගේ ප්‍රවෘත්තියක් නැතිහෙයින් ද යන මේ කාරණයෙන් විපාකයෝ කුසලයන් හා සමවූ ප්‍රවෘත්ති ඇත්තාහු නොවෙත්;—එසේහෙයින් කර්මද්වාරාදීන් පිරිහෙලා සුදුසුපරිද්දෙන් ගණනභෙද යෙදියයුත්තේයි;—මෙහි විපාකචිත්තයෝ ඉෂ්ටානිෂ්ට-මධ්‍යස්ථාලම්බනවශයෙන් යථාක්‍රමයෙන් සොමනස්සොපෙක්ෂාසහගතයහ, ප්‍රතිසන්ධ්‍යාදිවශයෙන් ප්‍රවෘත්තියක් ඇතිකල්හි කර්මයාගේ බලවත්-නොබලවත්බවට අනුරූපහෙයින් තදාලම්බනවශයෙන් ප්‍රවෘත්තිකාලයෙහි බොහෝසේ ජවනානුරූපව පවත්නාහෙයින් ද කිසිකලෙක්හි එහිදු කර්මානුරූපවත් පවත්නාහෙයින් ද ඥානසම්ප්‍රයුක්ත-විප්‍රයුක්තයහ, ප්‍රයොගයක් නැතිව උපසේවිතවූ කර්මාදි ප්‍රත්‍යයෙන්ද ඍතු-භොජනාදි සප්පාය-අසප්පායවසයෙන් ද අසංස්කාරික-සසංස්කාරික වෙත්.

ක්‍රියාචිත්තයන්ගේ ද කුසලයන්ට කී ක්‍රමයෙන් සුදුසුලෙස සොමනස්සසහගතත්වය දතයුත්තේයි;—"සහෙතුකකුසල-විපාක-ක්‍රියාචිත්තානි" යන මෙහි කුසලයන් තමන් ඒකාන්තසහෙතුකයන් බැවින් යථාලාභයොජනාවශයෙන් "සහෙතුක"ග්‍රහණය විපාක-ක්‍රියාවන් අපෙක්ෂා කොට ඇති විශෙෂනයි;-යම්සේ "සක්ඛර-කඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි" යනාදියෙහි සක්ඛරා-කඨලයාගේ චරණයක් නැතිහෙයින් මත්ස්‍යසමූහාපෙක්ෂාවෙන් "චරණ" යොදනු ලැබේ ද එපරිද්දෙන් කුසලයන් ඒකාන්තසහෙතුකබැවින් උන් හැර "සහෙතුක"ග්‍රහණය විපාක-ක්‍රියාවන් අපෙක්ෂායෙන් කියනලදැයි දතයුතු;—මෙසේ කාමාවචරකුසලයන් හා සහෙතුකවිපාක-ක්‍රියාචිත්තයෝ වෙදනා-ඥාන-සංස්කාරභෙදහෙයින් සුවිස්සකැයි දන්නාලදහු;—මෙහි කාමාවචරසහෙතුකවිපාක-ක්‍රියාචිත්තයන් වෙන වෙන ම සෞමනස්‍ය-උපෙක්ෂාවෙදනාභෙදහෙයින් ද්විප්‍රකාර වනහෙයින් ඥානසම්ප්‍රයුක්තාදිභෙදයෙන් චතුර්විධ වනහෙයින් සංස්කාරාසංස්කාරභෙදයෙන් අෂ්ටප්‍රකාර වනහෙයින් පුබ්බු කොට කුසල-විපාක-ක්‍රියාවෝ සුවිස්සෙක් දන්නාලදහු;—මෙහි සෞමනස්‍ය-උපෙක්ෂාවශයෙන් වෙදනාභෙදය භින්නවූ සවභාවඇතිහෙයින් වේවයි ඥාන-සංස්කාරදෙදෙනාගේ භෙදය වනාහි කෙසේදයත්? යම්සේ වෘක්ෂයාගේ අස්තිත්වයෙන් හා නාස්තිත්වයෙන් කරණලද සුඛිත-දුඃඛිතභෙදය වෘක්ෂයෙන් කරණලද්ද නම් වේ ද එසේ ම ඥාන-සංස්කාරදෙදෙනාගේ භාවාභාවයෙන් කරණලද භෙදය ද ඥාන-සංස්කාර යන මොවුන්විසින් ම කරණලද්ද නම් වේ, එසේහෙයින් "ඤාණ-සඞ්ඛාරතො භෙදෙ-ඤාණසඞ්ඛාරභෙදෙ-"යි ගත්කල්හි කිසිදොෂයක් නැති.

දන් සියලු කාමාවචරචිත්තයන් එක්කොට දක්වනුපිණිස "කාමෙ තෙවීස පාකානි" යනාදි කීහු

[කාමෙ තෙවීස පාකානි පුඤ්ඤාපුඤ්ඤානි වීසති,
එකාදස ක්‍රියාචේ'ති චතුපඤ්ඤාස සබ්බථා.]

කාමභවයෙහි විපාකචිත්තයෝ (අකුසලවිපාකයෝ සත් දෙනාය සහෙතුකාහෙතුක කුසලවිපාකයෝ සොළොස්දෙනායයි මෙසේ) තෙවිස්සෙක, කුසලාකුසල

යෝ අකුශලයෝ දොළොස්දෙනය කුසලයෝ අටදෙනයයි මෙසේ) විස්සෙක, ක්‍රියාචිත්තයෝ ද (අහේතුකක්‍රියාවෝ තුන්දෙනය සහේතුකක්‍රියාවෝ අටදෙනයයි මෙසේ) එකොළොසකැයි සර්‍වප්‍රකාරයෙන්) කාමාවචරචිත්තයෝ කාල-වාර-සන්තානාදි භෙදහෙයින් අනෙකප්‍රකාරකල්හි ද) සූපණසෙක් ම වෙත්.

**කාමාවචරවර්‍ණනායි.**

දැන් කාමාවචරානන්තර කොට දක්වනලද රූපාවචරයන් ධ්‍යානාඞ්ගයොගභෙදහෙයින් පස්පරිද්දෙකින් විභාග කොට දක්වනුපිණිස "විතක්ක—පෙ—සහිතං" යනාදි කීහු.

[විතක්ක-විචාර-පීති-සුඛෛකග්ගතාසහිතං පඨමජ්ඣානකුසලචිත්තං, විචාර-පීති-සුඛෙකග්ගතාසහිතං දුතියජ්ඣානකුසලචිත්තං, පීති-සුඛෙකග්ගතාසහිතං තතියජ්ඣානකුසලචිත්තං, සුඛෙකග්ගතාසහිතං චතුත්ථජ්ඣානකුසලචිත්තං, උපෙක්ඛෙකග්ගතාසහිතං පඤ්චමජ්ඣානකුසලචිත්තඤ්චෙ'ති; ඉමානි පඤ්ච'පි රූපාවචරකුසලචිත්තානි නාම.

විතක්ක—පෙ—පඤ්චමජ්ඣානවිපාකචිත්තඤ්චෙ'ති; ඉමානි පඤ්ච'පි රූපාවචරවිපාකචිත්තානි නාම.

විතක්ක—පෙ—පඤ්චමජ්ඣානක්‍රියාචිත්තඤ්චෙ'ති; ඉමානි පඤ්ච'පි රූපාවචරක්‍රියාචිත්තානි නාම.]

තමා හා සම්ප්‍රයුක්ත චිත්ත-චෛතසිකධර්‍මයන් අරමුණට නගණ විතර්‍කය ද, තමා හා සම්ප්‍රයුක්ත චිත්ත-චෛතසිකධර්‍මයන් අරමුණෙහි හසුරුවන විචාරය ද, ඉෂ්ටාලම්බනප්‍රතිලාභයෙහි ප්‍රීණනය කරණ ප්‍රීතිය ද, ප්‍රතිලබ්ධාලම්බනයෙහි රසාස්වාද කරණුව උපදනා සුඛය ද, නානාල්ම්බනග්‍රහණය නොකොට එකඅරමුණක් ම උතුම් කොට ඇතිබැවින් සම්ප්‍රයුක්තධර්‍මයන්ගේ අවික්ෂිප්තභාවසාධකවූ සමාධිය ද, යන උපනිධ්‍යානකෘත්‍යයෙහි බලවත් මේ පස්දෙනා හා එකොත්පාදදි ප්‍රකාරයෙන් යුක්තවූ දෙශනානුක්‍රමයෙන් හා උත්පත්තික්‍රමයෙන් පළමුවන ධ්‍යානකුශලචිත්තය ද; මත්තෙහිදු ද්විතීයධ්‍යානාදියට මෙම ලෙසට සුදුසු සුදුසු පරිද්දෙන් අර්ථ කියයුතු.

යම්සේ ගම්වැසි කිසිපුරුෂයෙක් රාජවල්ලභඑකකු හෝ සබඳමිත්‍රයෙකු හෝ නිසා රජගෙට වදිද එපරිද්දෙන් විතර්‍කයා නිසා චිත්තය අරමුණට නැගෙන්නේය; එසේ වීනම් අවිතර්‍කචිත්තයතෙම කෙසේ අරමුණට නැගේ ද යත්? හෙද විතර්‍කබලයෙන් ම අරමුණට නැගෙන්නේයි;—යම්සේ ඒ පුරුෂතෙම පෙරගියවිරූහෙයින් රාජවල්ලභාදි කිසිවෙකු නැතිව ද නිරාශඞ්කව රජගෙට වදී ද එසේම මේ අවිතර්‍කචිත්තය ද පරිචයබලයෙන් ම විතර්‍කයා නැතිව ද අරමුණට නැගේ, මෙහි පරිචය නම් සවිතර්‍කචිත්තයාගේ ද නිරන්තරප්‍රවෘත්තිවශයෙන් සන්තානයෙහි උපන් චිත්තභාවනායි;—තවද මෙහි අනිකෙකුදු ඇති, වස්ත්වාලම්බනසංඝට්ටනබලයෙන් ස්වභාවයෙන් අවිතර්‍ක ද වූ පඤ්චවිඥාණය ද යට ධ්‍යානභාවනාදි බලයෙන් ද්විතීයධ්‍යානාදිවූ අරමුණට නැගෙත්; මේ විතර්‍ක-විචාර දෙදෙනා අතුරෙහි විතර්‍කය විචාරයට වඩා ඖදාරිකහෙයින් ද විතර්‍කයා තමා පූර්‍වඞ්ගමහෙයින් ද ප්‍රථමඝණ්ටාභිඝාතය මෙන් චිත්තයාගේ ප්‍රථමාභිනිපාතය විතර්‍ක නම් වෙයි, ඝණ්ටාභිඝාතයෙන් වූ අනුරාවය මෙන් අනුසඤ්චරණය විචාර නම් වේ; තවද ආකාශයෙහි නැගෙනු කැමති ප

පක්ෂීහුගේ පක්ෂවික්ෂේපයක් මෙන් ද ගන්ධානුබද්ධ සිත් ඇති භෘඞ්ගයාගේ පද්මාභිමුඛපතනයක් මෙන් ද විස්තාරවත්වූ චිත්තාපරිස්පන්දය විතර්ක නම් වේ; ආකාශයෙහි පැනනැංගාවූ පක්ෂීහුගේ පක්ෂප්‍රසාරණය මෙන් ද පද්මාභිමුඛව පතිත භෘඞ්ගයාගේ පද්මයාගේ මතුභාගයෙහි පරිභ්‍රමණය මෙන් ද චිත්තයාගේ නැවතී පරිස්පන්දවූ ශාන්තප්‍රවෘත්තිය විචාර නම් වේ;—මෙහි පීති-සුඛ දෙදෙනාගේ වෙනස මෙසේ දතයුතුයි; කාන්තාරයෙහි ඛින්නවූ පුරුෂයාගේ වනාන්තරයෙහි උදකදර්ශනයෙහි මෙන් ආලම්බනප්‍රතිලාභයෙහි ප්‍රීතියගේ විශේෂය ප්‍රකටය, දක්නාලද උදකයාගේ පානස්නානය මෙන් ප්‍රතිලබ්ධාලම්බනරසානුභවයෙහි සුඛයාගේ විශේෂය ප්‍රසිද්ධයි;—යම්සේ නෙමිආදී අඞ්ගසමුදායෙහි රථව්‍යවහාරය වේද එසේ ම මෙහිදු විතර්කාදී ධ්‍යානාඞ්ගසමුදායෙහි ම ධ්‍යානව්‍යවහාරයයි දතයුතු;—මෙයින් අන්‍යවූ ස්පර්ශාදීහු සම්ප්‍රයුක්තධර්මයන් ඇතියාල්හිදු මේ විතර්කාදිවූ පස්දෙන ම ධ්‍යානාඞ්ගහෙයින් කුමක්පිණිස කීහු ද යත්? මොවුන් පස්දෙනාටම උපනිධ්‍යානකෘත්‍යය ඇතිබැවින් ද කාමච්ඡන්දාදීන්ට ඉදුරා ප්‍රතිපක්ෂ ඇතිබැවින්, එසේමැයි විතර්කයතෙමේ චිත්තයා අරමුණෙහි නගන්නේය, විචාරයතෙම චිත්තයා අරමුණෙහි හසුරුවන්නේය, ප්‍රීතිතොමෝ ඔහුගේ ප්‍රීණනය කරන්නීය, සුඛයා උපබෘංහණය කරන්නේය; ඉක්බිති සම්ප්‍රයුක්තධර්මයන් ඇති ඒ චිත්තයා යථොක්තවූ අභිනිරෝපනානුබන්ධන-පීණන-උපබෘංහණයෙන් අනුග්‍රහ කරණලද්දවූ ඒකාග්‍රතාතොමෝ සමාධානකෘත්‍යයෙන් තමා අනුව පවත්වන්නී අරමුණෙහි ඉන්ද්‍රියසමතාවශයෙන් සම කොට ද ප්‍රතිපක්ෂධර්මයන්ගේ දුරුකළබැවින් ද ලීනෞද්ධත්‍යභාවයක් නැතිහෙයින් මනාකොට ද පිහිටුවානුයි; මෙසේ මොවුන්ට ම උපනිධ්‍යානකෘත්‍යය ආවේණිකයි; කාමච්ඡන්දාදීන්ට ප්‍රතිපක්ෂභාවයෙහි වනාහි රාගප්‍රණිධියට ඉදුරා ප්‍රතිපක්ෂබැවින් සමාධිය කාමච්ඡන්දයට ප්‍රතිපක්ෂය, නානාලම්බනයෙහි හිඳුව ඇවිදිනාවූ චිත්තයාගේ සමාධානය ඒකාග්‍රතාව හෙතුකොටගෙණ වේනුයි කීයායි; ප්‍රීතිතොමෝ ප්‍රමොදස්වභාවයෙන් ව්‍යාපාදයට ප්‍රතිපක්ෂය නුවණින් සංකල්පනාවශයෙන් පැතිර පවත්නාහෙයින් විතර්කය ස්ත්‍යානමිද්ධයට ප්‍රතිපක්ෂය සුඛය ශාන්ත-ශීතලස්වභාවබැවින් අව්‍යුපශමස්වභාවවූ ඖද්ධත්‍යයට ද අනුතාපස්වභාවවූ කෞකෘත්‍යයට ද ප්‍රතිපක්ෂය, විචාරය අරමුණෙහි අනුමාර්ජනවශයෙන් ප්‍රඥප්‍රතිරූපස්වභාවබැවින් විචිකිත්සාවට ප්‍රතිපක්ෂයයි, මෙසේ උපනිධ්‍යානකෘත්‍යවත්බැවින් ද කාමච්ඡන්දාදීන්ට ඉදුරා ප්‍රතිපක්ෂබැවින් ද මොහු පස්දෙන ම ධ්‍යානාඞ්ගයෙන් නිශ්චය කරණලදහුයි—කියනලදමැයි;—

උපනිජ්ඣානකිච්චත්තා කාමාදිපටිපක්ඛතො,
සන්තෙසු 'පි ච අඤ්ඤෙසු පඤ්චෙව ඣානසඤ්ඤිතා-යි.

මෙහි උපේක්ෂාවේදනාව වනාහි ශාන්තප්‍රවෘත්ති ඇතිබැවින් සුඛයෙහි ම අන්තර්ගතයයි දතයුතු—එහෙයින් ම කීහු;—

උපෙක්ඛා පන සන්තත්තා සුඛමිච්චෙව භාසිතා.—යි

මේ රූපාවචරකුසලයෙහි සංස්කාරභේදය කුමක්හෙයින් නොගන්නාලදද? මේ රූපාවචරකුසලචිත්තය ද හුදෙක් ශමථානුයොගවශයෙන් ප්‍රතිලබ්ධවූයේ සසංස්කාරිකය මාර්ගාධිගමවශයෙන් ප්‍රතිලබ්ධවූයේ අසංස්කාරිකයයි කියන්ට පිළිවන්වුව එසේ නොගත්තේ කුමක්පිණිසද? මේ රූපාවචරකුසලචිත්තය කාමාවචරකුසලචිත්තය මෙන් එසේ සංස්කාරිකභෙද ඇත්තේ නොවෙයි; මාර්ගාධිගමවශයෙන් ශක්තිහෙයින් ප්‍රතිලබ්ධවූ රූපාවචරධ්‍යානයාගේ ද

අපරභාගයෙහි පරිකර්මවශයෙන් ම උපදනාහෙයිනි; එසේහෙයින් සියලුධ්‍යානයාගේ ම පරිකර්මසඞ්ඛ්‍යාත පූර්වාභිසංස්කාරයක් නැතිව ශුද්ධක කාතාවිකාරවශයෙන් ම නොඋපදනාහෙයින් අසංස්කාරික යයි කීයාද ව්‍යභිචාරයක් නැතිහෙයින් සසංස්කාරික යයි කීයාද කියන්නට නොපිළිවනි;—කියනලද මැයි;—

කෙවලං පුබ්බයොගෙන උස්සාහෙනෙව වා ඉධ,
අනිප්ඵජ්ජනතො ඣානං නත්ථි සඞ්ඛාරිකාදිතා;—යි

මෙහි "අපි" ශබ්දයෙන් චතුෂ්ක-පඤ්චකනයවශයෙන් ශුද්ධිකනවකය; හෙද, දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා, සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා; යන මේ ප්‍රතිපත්චතුෂ්කයන් හා යොදා දෙසනලද හෙයින් සතරනවකයෝ ද,—

පරිත්තං පරිත්තාරම්මණං, පරිත්තං අප්පමාණාරම්මණං, අප්පමාණං පරිත්තාරම්මණං, අප්පමාණං අප්පමාණාරම්මණං; යනමේ ආලම්බනචතුෂ්කය හා යොදනලද බැවින් මෙසේ සතර නවකයෝ ද,—

දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා පරිත්තං පරිත්තාරම්මණං, දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා පරිත්තං අප්පමාණාරම්මණං; යනාදීන් ආලම්බන-ප්‍රතිපත්-මිශ්‍රකවශයෙන් සොළොස්නවකයෝ දැයි, මෙසේ පස්විසිනවකයෝ ද, යන මේ ආදී භෙද සඞ්ග්‍රහ කෙරේ.

ධ්‍යානවිශෙෂයෙන් නිපදවනලද විපාකයා ද දර්පණතලයෙහි පැණෙන මුඛනිමිත්තයමෙන් පඤ්චාඞ්ගාදිවශයෙන් ස්වකීයකුශලයන් හා සදෘශව ප්‍රථමධ්‍යානභූම්‍යාදියෙහි ප්‍රතිසන්ධ්‍යාදිව උපදනාහෙයින් එකාන්තයෙන් ඒ ධ්‍යානය හා සදෘශවූයි විපාකයන් ධ්‍යානය හා සම කොට විභාග කරණලදී;—මෙම අර්ථය ප්‍රකාශ කරණුපිණිස බුදුන්විසින් විපාකනිර්දේශයෙහිදු කුසල් දක්වදක්වා ම තදනන්තර කොට මහග්ගත-ලොකොත්තරවිපාකයෝ විභාග කරණලදහු;—කුසලයා මෙන් භාවනාවශයෙන් ප්‍රවෘත්තවූයේ ද නිරනුශයසන්තානගතප්‍රවෘත්තිය හෙතුකොටගෙණ සිඳපියනලද මුල්ඇති වෘක්ෂය මල් ගන්ව අස මඤ්ජයා මෙන් විපාකදානයට අහි නොවනහෙයින් ජවනක්‍රියාමාත්‍රවූ ප්‍රථමධ්‍යානයෙන් යුක්තවූ චිත්තය ප්‍රථමධ්‍යානක්‍රියාචිත්ත නම් වේ, සෙස්ස ද මෙසේමැයි.

රූපාවචරචිත්තය ද ප්‍රතිපදාලම්බනාදිභෙදහෙයින් අනෙකප්‍රකාරවුව ද විතර්කාදි ධ්‍යානාඞ්ගසමුදයවූ ප්‍රථමධ්‍යානාදීන් හා සම්ප්‍රයොගභෙදහෙයින් පඤ්චවිධ වන්නේය; ඒ රූපාවචරචිත්තය කුසල-විපාක-ක්‍රියාජාතිභෙදහෙයින් වෙන වෙන පඤ්චප්‍රකාර වනහෙයින් පඤ්චදශප්‍රකාර වේ.

## රූපාවචරවර්ණනායි.

දැන් අරූපාවචරචිත්තය ආලම්බනභෙදහෙයින් සතරපරිච්ඡෙදකින් විභාග කොට දක්වන්නාහු "ආකාසානඤ්චායතන" යනාදීන් කියත්.

[ආකාසානඤ්චායතනකුසලචිත්තං, විඤ්ඤාණඤ්චායතනකුසලචිත්තං, ආකිඤ්චඤ්ඤායතනකුසලචිත්තං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනකුසලචිත්තං චෙ'ති; ඉමානි චත්තාරි'පි අරූපාවචරකුසලචිත්තානි නාම.

ආකාසානඤ්චායතනවිපාකචිත්තං—පෙ—චෙ'ති; ඉමානි චත්තාරි'පි අරූපාවචරවිපාකචිත්තානි නාම.

ආකාසානඤ්චායතනක්‍රියාචිත්තං—පෙ—වේ'ති; ඉමානි චත්තාරිපි අරූපාවචරක්‍රියාචිත්තානි නාම.]

රූපසමතික්‍රමණය කොට කියුනු ඉතුළුවූ අහස්හි උපදනා ආකාසානඤ්චායතනකුසලචිත්තය ද, ආකාශය සමතික්‍රමණය කොට එහි ප්‍රවෘත්තවූ විඤ්ඤාණය ගොචර කොට ඇති විඤ්ඤාණඤ්චායතනකුසලචිත්තය ද, ප්‍රථමාරූප්‍යය සමතික්‍රමණය කොට ඔහුගේ නාස්තිභාවය විෂය කොට ඇති ආකිඤ්චඤ්ඤායතනකුසලචිත්තය ද, ඒ ප්‍රථමාරූප්‍යයාගේ නාස්තිභාවය සමතික්‍රමණය කොට එහි ප්‍රවෘත්ත තෘතීයාරූප්‍යය අරමුණු කොට ඇති නෙවසඤ්ඤානාසඤ්ඤායතනකුසලචිත්තය ද, යන රූපාදීන් ඉක්මවා කෘත්ස්නෝද්ඝාටජ ආකාශාදීන් විෂය කොට ඇති උපෙක්ෂා-ඥාන සම්ප්‍රයුක්තාකුශලානන්තරයෙහි භාවනාමයව උපදනා මොහු සතරදෙනම අරූපාවචරකුසලචිත්තයෝ නම් වෙත්;-මත්තෙහි විපාක-ක්‍රියාවටත් මෙසේ ම දතයුතු;—උත්පාදදී අන්තරහිතබැවින් ද අනන්ත වශයෙන් ස්ඵරණය වනබැවින් ද මෝහට අන්තයෙක් නැත්නුයි අනන්ත නම් වේ;—කියුනු ඉතුළුවූ ආකාශය ම ආකාසානඤ්චායතන නම් වේ;—යම්සේ පඨවිකසිනය අරමුණු කොට උපන් ධ්‍යානය පඨවිකසිනයයි කියනුලැබේ ද, එසේ ම ආකාසානඤ්චායතනයයි කියනලද කියුනු ඉතුළුවූ ආකාසයෙහි ප්‍රවෘත්තවූ අර්පණප්‍රාප්ත ප්‍රථමාරූප්‍යචිත්තය ද ආකාසනඤ්චායතනයයි කියනු ලැබේ;—ඒ ප්‍රථමාරූප්‍යවිඥානය ද උත්පාදදී අන්ත ඇත්තේ ද අනන්තවූ ආකාසයෙහි පවත්නා හෙයින් තමා අරබ්‍යා ප්‍රවෘත්තවූ භාවනාවගේ උත්පාදදිවශයෙන් අන්තයක් නොගෙණ අනන්තස්ඵරණවශයෙන් පවත්නාහෙයින් ද අනන්තයයි කියනුලැබේ, මෙහි සංඥනවශයෙන් ධ්‍යානයට උපලක්ෂණවූ නිදර්ශනක්‍රමය දක්වනලදී;—ඒ ධ්‍යානයෙහි වෙදනාදීහුද "නෙව වෙදනා න වෙදනා" යනාදීහු වෙත්;—මෙහි "අපි" ශබ්දයෙන් ආලම්බන-පටිපදා-මිශ්‍රකනයවශයෙන් ෂොඩශප්‍රකාරඇති දෙශනාව ද මෙයින් අන්‍යවූ පාලියෙහි ආගතනයප්‍රභෙදය ද සඞ්ග්‍රහ කෙරේ;-අරූපාවචරචිත්තය අතික්‍රමණය කටයුතු කෘත්ස්නාකාශවිඥාන-තත්භාවසඞ්ඛ්‍යාතආරම්මණයන්ගේ ද අරමුණු කටයුතුවූ කෘත්ස්නොද්ඝාටජාකාශාදී චතුර්විධආලම්බනයන්ගේ ද ප්‍රභෙදහෙයින් චතුර්විධ වන්නේය, නැවත ඒ අරූපාවචරචිත්තය කුසල-විපාක-ක්‍රියාභෙදහෙයින් දොළොස්පරිද්දෙකින් සිටියේයි;—මෙහි අරූපාවචරයෝ රූපාවචරයන් මෙන් අඞ්ගාතික්‍රමණවශයෙන් උපදනාහු නොවෙති, ආලම්බනාතික්‍රමණවශයෙන් උපදිත්, ඔහු සතරදෙන යථාක්‍රමයෙන් පඤ්චමධ්‍යානයට අරමුණුවූ කසිනනිමිත්තය අතික්‍රමණය කොට ඒ කියුනු ඉතුළුවූ ආකාසය අරමුණු කොට ප්‍රථමාරූප්‍යය උපදනේය, ඒ ආකාසය අතික්‍රමණය කොට එහි ප්‍රවෘත්තවූ විඤ්ඤාණය අරමුණු කොට විඤ්ඤාණඤ්චායතනය උපදනේය, ඒ විඤ්ඤාණය අතික්‍රමණය කොට විඤ්ඤාණයාගේ අභාවයයි කියනලද අකිඤ්චනභාවය අරමුණු කොට ආකිඤ්චඤ්ඤායතනය උපදනේය, ඒ අකිඤ්චනභාවය අතික්‍රමණය කොට එහි ප්‍රවෘත්තවූ තෘතීයාරූප්‍යවිඥානය අරමුණු කොට චතුර්ථාරූප්‍යය උපදනේයි;—කියනලදමැයි;—

ආරම්මණාතික්කමතො චතස්සො 'පි භවන්ති'මා,
අඞ්ගාතික්කමමෙතාසං න ඉච්ඡන්ති විභාවිනො;—ති.

**අරූපාවචරචිත්තනයි.**

දැන් ලෝකෝත්තරකුසලය ප්‍රහාතව්‍යක්ලේශවිභාගහෙයින් චතුර්විධමාර්ගය සම්ප්‍රයොගභෙදහෙයින් ද ඵලය තදනුරූපප්‍රවෘත්තියෙන් ද සතර ප්‍රකාරයෙකින් විභාග කොට දක්වනුපිණිස "සොතාපත්තිමග්ගචිත්තං"යනාදී කියනලදි.

[සොතාපත්තිමග්ගචිත්තං, සකදාගාමිමග්ගචිත්තං, අනාගාමිමග්ගචිත්තං, අරහත්තමග්ගචිත්තං චේ'ති; ඉමානි චත්තාරි'පි ලොකුත්තරකුසලචිත්තානි නාම.

සොතාපත්තිඵලචිත්තං—පෙ—චේ'ති; ඉමානි චත්තාරි 'පි ලොකුත්තරවිපාකචිත්තානි නාම.]

ශ්‍රොතආපත්තිමාර්ගචිත්තය සකෘදාගාමිමාර්ගචිත්තය අනාගාමිමාර්ගචිත්තය අර්හත්මාර්ගචිත්තයයි (ප්‍රහාතව්‍යක්ලේශවිභාගයෙන්) මේ චිත්තයෝ සතරදෙන (උපාදානස්කන්ධසංඛ්‍යාතලෝකයෙන් නැගෙණහෙයින්) ලොකොත්තරකුසලචිත්තයෝ නම් වෙත්;—"සොතාපත්තිඵලචිත්තං" යනාදිය ද මෙසේ දතයුතු.

මෙසේ සර්වප්‍රකාරයෙන් ම මාර්ග-ඵලවශයෙන් ලොකොත්තරචිත්තයෝ අට දෙන කියා නිමවනලදහු.

නිර්වාණයකරා පමුණුවනබැවින් ද නිවන් නැමති මහමුහුදකරා නැමුනුබැවින් ද ශ්‍රොතසක් (දියපහරක්) සමානනුයි "සොත" නම් වේ; ආර්යඅෂ්ටාඞ්ගික මාර්ගයයි;—"ආ" යන උපසර්ගයා ආදික්‍රියායෙහි වැටෙනහෙයින් ශ්‍රොතස්සංඛ්‍යාතමාර්ගයට පළමුකොට පැමිණීමනුයි "සොතස්ස ආපත්ති--සොතාපත්ති" කියා වේ;—නිර්වාණය සොයානුයි හෝ නිවන්කැමති වන්නවුන් විසින් සොයනුලැබේනුයි හෝ කෙලෙසුන් මරමින් යේනුයි හෝ "මග්ග" නම් වේ; ඒ මාර්ගයෙන් යුක්තවූ චිත්තය "මග්ගචිත්ත" නම් වේ; ශ්‍රොතසට ප්‍රථමප්‍රාප්තියෙහි ලබනලද මාර්ගචිත්තය "සොතාපත්ති මග්ගචිත්ත" නම් වේ;—නොහොත්—ආර්යමාර්ගශ්‍රොතසට ප්‍රථමප්‍රාප්තිය මෝහට ඇත්නුයි "සොතාපත්ති" නම්; පුද්ගලතෙමේයි;—ඔහුගේ මාර්ගය "සොතාපත්තිමග්ග" නම් වේ; එයින් සම්ප්‍රයුක්තචිත්තය "සොතාපත්තිමග්ගචිත්ත"නම් වේ.

එකවරක් මේ මිනිස්ලොවට ප්‍රතිසන්ධිවශයෙන් ඒනුයි "සකෘදාගාමී" නම් වේ;—"ඉධ පත්වා ඉධ පරිනිබ්බායී, තත්‍ථ පත්වා තත්‍ථ පරිනිබ්බායී, ඉධ පත්වා තත්‍ථ පරිනිබ්බායී, තත්‍ථ පත්වා ඉධ පරිනිබ්බායී, ඉධ පත්වා තත්‍ථ නිබ්බත්තිත්වා ඉධ පරිනිබ්බායී"—යන මේ සකෘදාගාමීන් පස්දෙනාකෙරෙන් අන්තිමවූ සකෘදාගාමීතෙමේ මෙහි අභිමතය; එසේහෙයින් ඒතෙමේ මෙයින් ගොස් දෙව්ලොව ඉපිද නැවත එකවරෙක මනුෂ්‍යලොකයට ප්‍රතිසන්ධිවශයෙන් එන්නේයි;—සකෘදාගාමීහුගේ මාර්ගය "සකදාගාමි මග්ග"නම් වේ; ඒ මාර්ගයෙන් සම්ප්‍රයුක්තවූ සිත "සකදාගාමිමග්ගචිත්ත"නම් වේ;—කිසිසේත් මාර්ගසමඞ්ගිහුගේ ප්‍රතිසන්ධිවශයෙන් එසේ ආගමනයක් නැතිහෙයින් ඵලස්ථයා ම "සකෘදාගාමී" නම් වේ; ඒ ඵලයට කාරණවූ පළමුකොට උපන්නාවූ මාර්ගය අන්‍යමාර්ගනිවෘත්තිය පිණිස ඵලස්ථයා විසින් වෙසෙසා සකෘදාගාමිමාර්ගයයි කියනුලැබේ.

"අනාගාමිමාර්ග" යනුදු මෙසේමැයි;—ප්‍රතිසන්ධිවශයෙන් මේ කාමධාතුවට නොඒනුයි "අනාගාමී" නම් වේ; ඔහුගේ මාර්ගය "අනාගාමිමග්ග"නම් වේ; එයින් යුක්තවූ චිත්තය "අනාගාමිමග්ගචිත්ත"නම් වේ.

පූජාවිශෙෂයට සුදුසුනුයි "අරහ" නම් වේ;—නොහොත්—ක්ලේශසංඛ්‍යාත සතුරන් නැසූහෙයින් ද සංසාරචක්‍රයාගේ අරනැසූහෙයින් ද පාපකාරණ

යෙහි රහසක් නොමැතිහෙයින් ද "අරහ" නම් වේ; අටවෙනි ආර්‍ය්‍යපුද්ගලතෙමේයි;—ඔහුගේ සවභාවය "අරහත්ත" නම් වේ; මේ සතරවෙනි ඵලයට නමකි;—ඔහුගේ පැමිණීමවූ මාර්ගය "අරහත්තමග්ග" නම්; එයින් යුක්තවූ චිත්තය "අරහත්තමග්ගචිත්ත" නම් වේ;—මෙහි "අපි" ශබ්දයෙන් එකෙකි මාර්ගයාගේ නයසහස්‍රවශයෙන් සතර මාර්ගයාගේ සාරදහසක් නයභෙදය ද සපතාවිභඞ්ගයෙහි ආගත සැටදහසක් පමණ නයභෙදය ද යට කියනලද ක්‍රමයෙන් අනෙකවිධත්වය ද සඞ්ග්‍රහ කෙරේ.

ශ්‍රොතසට පැමිණීමෙන් හෝ ශ්‍රොතආපන්නයාවිසින් හෝ ලබනලද ඵලචිත්තය "සොතාපත්තිඵලචිත්ත" නම් වේ;—සකෘදගාමි-අනාගාමිඵලචිත්තය ද මෙසේමැයි;—අර්හත්වූයේත් එම ඵලසිතවූයේත් "අරහත්තඵලචිත්ත" නම් වේ.

[චතුමග්ගප්පභෙදෙන චතුධා කුසලං තථා,
පාකං හි තස්ස පාකත්තා අට්ඨධානුත්තරං මතං.]

ශ්‍රොතආපත්තිමාර්ගාදි චතුර්විධමාර්ගයන්ගේ ප්‍රභෙදහෙයින්—හෙවත්—ඉන්ද්‍රියයන්ගේ අපාටව-පාටව-පාටවතර-පාටවතමභෙදහෙයින් භින්නවූ සාමර්ථ්‍යය ඇතිබැවින් සත්කායදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාසය යන මොවුන්ගේ නිරවශෙෂප්‍රහාණය ද, කාමරාග-ව්‍යාපාද යන මොවුන්ගේ තුණීබවට පැමිණීම ද, ඒ කාමරාග-ව්‍යාපාද යන මොවුන්ගේ නිරවශෙෂප්‍රහාණය ද, රූපරාග-අරූපරාග-මාන-උද්ධච්ච-අවිජ්ජා යන මොවුන්ගේ නිරවශෙෂප්‍රහාණය ද, මෙසේ සංයොජනප්‍රහාණවශයෙන් චතුර්විධවූ ශ්‍රොතආපත්තිමාර්ගාදිවූ අෂ්ටාඞ්ගිකමාර්ගයන්ගේ සම්ප්‍රයොගභෙදහෙයින් ලොකොත්තරකුශලචිත්තය චතුර්විධ වේ;—විපාකය වනාහි ඒ ලොකොත්තරයාගේ ම විපාකබවක්හෙයින් තදනුරූපහෙයින් එසේ ම චතුර්විධ වෙයි කියා මෙසේ තමහට උත්තරිතරයක්නු නැතිහෙයින් අනුත්තරවූ ලොකොත්තරචිත්තය අෂ්ටප්‍රකාර වෙයි කියාදන්නාලදී.

මෙහි ක්‍රියාඅනුත්තරයකු නැතිහෙයින් ද්වාදශවිධත්වය නොකියනලදී, කුමක් හෙයින් ඒ ලොකොත්තරක්‍රියාචිත්තයාගේ අසම්භවය ද? මාර්ගචිත්තය එකචිත්තක්ෂණිකහෙයින්, ඉදින් මාර්ගචිත්තය නැවත උපදනේවීනම් එසමයෙහි ඔහුගේ උත්පත්තිය රහතන්ට වනහෙයින් ක්‍රියාභාවය කියන්නට පිළිවන ඒ මාර්ගචිත්තය වනාහි කෙලෙසයන්ගේ සමුච්ඡෙදකවශයෙන් ම ලැබියයුතුහෙයින් එකවාරප්‍රවෘත්තවූ ම ඒ මාර්ගචිත්තයාවිසින් වෘක්ෂාදීන්ගේ සමූලවිධ්වංසනයට අශනිසම්පාතයන් මෙන් නිරන්තරයෙන් කෙලෙසයන්ගේ අත්‍යන්තයෙන් අප්‍රවෘත්තිය සිද්ධකරනලදබවහෙයින් ද නැවත උපදීමෙහි කටයුතුබවක් නැතිහෙයින් ද දෘෂ්ටධම්මසුඛවිහාරයපිණිස ද ඵලසමාපත්තිය තමා ම නිර්වාණාලම්බනවශයෙන් පවත්නාහෙයින් ද කිසිකලෙකත් ශෛක්ෂයන්ටත් අශෛක්ෂයන්ටත් උපදනේ නොවෙයි; එසේහෙයින් සර්වප්‍රකාරයෙන් ලොකොත්තරක්‍රියාචිත්තයෙක් නැති.

**ලොකොත්තරවර්ණනායි.**

යථොක්තවූ චාතුර්භූමිකචිත්තයන්ගේ ගණනවශයෙන් සඞ්ග්‍රහ කොට කියන්නාවූ "ද්වාදසාකුසලානෙවං" යනාදීන් කියත්.

[ද්වාදසාකුසලානෙවං කුසලානෙකවීසති,
ඡත්තිංසෙව විපාකානි ක්‍රියාචිත්තානි වීසති.]

මෙසේ උක්තක්‍රමයෙන් අකුසලචිත්තයෝ දොළොස්දෙනෙක් වෙති, කුසලචිත්තයෝ එක්විස්සෙක් ම වෙති, විපාකචිත්තයෝ සතිසෙක් ම වෙති, ක්‍රියාචිත්තයෝ විස්සෙක් ම වෙත්.

මෙසේ ජාතිවශයෙන් සඞ්ග්‍රහය දක්වා නැවත භූමිවශයෙන් විභාග දක්වන්නට "චතුපඤ්ඤාසධා කාමෙ" යනාදි කියනලදී.

[චතුපඤ්ඤාසධා කාමෙ රූපෙ පණ්ණරසීරයෙ,
චිත්තානි ද්වාදසාරුප්පෙ අට්ඨධානුත්තරෙ තථා.]

එකාදසවිධකාමභවයෙහි චිත්තයන් සූපණස්ප්‍රකාරයකින් කියන්නේය, රූපභවයෙහි චිත්තයන් පසළොසක් කියන්නේය, අරූපභවයෙහි චිත්තයන් දොළසක් කියන්නේය, නවවිධලොකොත්තරධර්මසමුදායෙහි චිත්තයන් අෂ්ටප්‍රකාරයකින් එසේ ම කියන්නේයි;—මෙහි යම්සේ මනුෂ්‍යස්ත්‍රියකගේ කුස උපන් තිරශ්චීනසත්ත්වතෙමේ තිරශ්චීනයොනිපර්‍යාපන්නහෙයින් තිරශ්චීනයන් කෙරෙහි ම සඞ්ග්‍රහ කරණුලැබේ ද එපරිද්දෙන් කාමතෘෂ්ණාදි විෂයභාවයෙන් කාමභවාදිපර්‍යාපන්නචිත්තයෝ තමන් තමන්ගේ භූමියෙන් අනික් තැනෙක්හි පවත්නාහු ද කාමභවාදියෙහි චිත්තයෝ යයි කියනලදහු;—කිසි තැනෙක්හි පර්‍යාපන්න නොවූ නවවිධලොකොත්තරධර්මසමූහයෙහි එකදේශවූ චිත්තයෝ "රුකෙඛ සාඛා" යනාදියෙහි මෙන්, "අනුත්තරෙ චිත්තානි"යි කියනලදහුයි;—කාමාවචරචිත්තයන් සිවුපණසක් කියන්නේය, රූපාවචරචිත්තයන් පසළොසක් කියන්නේය, අරූපාවචරචිත්තයන් දොළසක් කියන්නේය, ලොකොත්තරචිත්තයන් අටදෙනෙක් කියන්නේයි.

[ඉත්ථමෙකූනනවුතිප්පභෙදං පන මානසං,
එකවීසසතං වාථ විභජන්ති විචක්ඛණා.]

මෙසේ(යථොක්තකුශලාදිජාතිභෙදයෙන් භින්නවූ චාතුර්භූමිකචිත්තයන්ගේ භෙදවශයෙන්) චිත්තය වනාහි එකූනනවුතිප්‍රභෙද කොට—හෝ—නොහොත් වක්ෂ්‍යමාණක්‍රමයෙන් එක්සියඑක්විස්සක් කොට හෝ විශේෂයෙන් අතිදක්ෂනා සවභාව ඇති ප්‍රාඥයෝ විභාග කොට දක්වත්.

එකූනනවුතිප්‍රභෙද ඇති චිත්තය ම ඒ කෙසේ එක්සියඑක්විස්සෙක් වේද? විතර්කය විචාරය ප්‍රීතිය සුඛය එකාග්‍රතාය යන මොවුන් හා යුක්තවූ විතර්කාදි පඤ්චාඞ්ගිකධ්‍යානයෙන් සම්ප්‍රයුක්තවූ ශ්‍රොතාපත්තිමාර්ගචිත්තයය, ද්විතීයධ්‍යානාදි ශ්‍රොතාපත්තිමාර්ගාදියට ද මෙසේ ම සුදුසුසුදුසුපරිද්දෙන් අඞ්ග කියයුතුයි;—ධ්‍යානාඞ්ගවශයෙන් ප්‍රථමධ්‍යානය හා සදෘශහෙයින් ප්‍රථමධ්‍යානශ්‍රොතාපත්තිමාර්ගචිත්තයයි කියා ද වේ;—මෙහි පාදකධ්‍යාන-සම්මෘෂ්ටධ්‍යාන-පුද්ගලධ්‍යාන යන මොවුන්ගේ අතුරෙහි එක්තරා එකක්හුගේ වශයෙන් ඒ ඒ ධ්‍යානය හා සදෘශවූ සවිතර්කාදි අඞ්ග පහලවීමෙන් සතරමාර්ගයෝ ම ප්‍රථමධ්‍යානාදි ව්‍යවහාර ලබන්නාහු වෙන වෙන පඤ්චප්‍රකාර වෙත්;—එසේහෙයින් ම "ඣානඞ්ගයොගභෙදෙන" යනාදී කීහු;—එහි ප්‍රථමධ්‍යානාදින් අතුරෙහි යම් යම් ධ්‍යානයකට සමවැද එයින් නැගී සංස්කාරධර්මයන් සම්මර්ශණය කරන්නාහට ව්‍යුත්ථානගාමිනී විදර්ශනාතොමෝ ප්‍රවෘත්ත ද ඒ ධ්‍යානයතෙමේ ව්‍යුත්ථානගාමිනී විදර්ශනාවට පදස්ථානබැවින් පාදක නම් වේ;— යම් යම් ධ්‍යානයක් සම්මර්ශණය කරන්නාහට ඒ ව්‍යුත්ථානගාමිනී විදර්ශනා ප්‍රවෘත්ත ද ඒ ධ්‍යානය සම්මෘෂ්ටධ්‍යාන නම් වේ;—එහි යමක්හුවිසින් ප්‍රථමධ්‍යානාදින් අතුරෙන් එක්තරා ධ්‍යානයකට සමවැද එයින් නැගී ප්‍රකීර්ණකසංස්කාරයන් සම්මර්ශණය කොට

මාර්ගය උපදවනලද්දේ වේ ද ඔහුගේ ඒ මාර්ගය ප්‍රථමධ්‍යානාදිවූ ඒ ඒ පාදක ධ්‍යානය හා සදෘශ වේ;—ඉඳින් වනාහි විදර්ශනාපාදකවූ කිසි ධ්‍යානයෙක් නැද්ද හුදෙක් ප්‍රථමධ්‍යානාදීන් අතුරෙන් එක්තරා ධ්‍යානයක් සම්මර්ශනය කොට මාර්ගය උපදවනලද්දේ වේ ද මාර්ගය සම්මර්ශනය කරණලද ධ්‍යානය හා සදෘශ වේ;—යම්කලෙක වනාහි කිසි ධ්‍යානයකට සමවැද එයින් නැගී අනික් ධ්‍යානයක් සම්මර්ශනය කොට මාර්ගය උපදවනලද්දේ වේ ද එසමයෙහි ඒ පුද්ගලයාගේ අධ්‍යාශයවශයෙන් මාර්ගය ධ්‍යානයන් දෙදෙනා අතුරෙන් එක්තරා ධ්‍යානයක් හා සදෘශ වේ ද ඉඳින් පුද්ගලයාගේ එබඳු අධ්‍යාශයෙක් නැත්තේ විනම් යට යට ධ්‍යානයෙන් නැගී මතුමත්තෙහි ධ්‍යානධර්මයන් සම්මර්ශනය කොට උපදවනලද්දවූ මාර්ගය පාදකධ්‍යානය අපේක්ෂා නොකොට සම්මර්ශනය කොට කරණලද ධ්‍යානය හා සදෘශ වේ;—මතුමත්තෙහි ධ්‍යානයට වනාහි සමවැද එයින් නැගී යට යට ධ්‍යානධර්මයන් සම්මර්ශනය කොට උපදවනලද්දවූ මාර්ගයතෙමේ සම්මර්ශනය කරණලද ධ්‍යානය අපේක්ෂා නොකොට පාදකධ්‍යානය හා සදෘශ වේ;—කුමක්හෙයින් ද යත්? යම්හෙයකින් යට යට ධ්‍යානය වැඩීම මතුමත්තෙහි ධ්‍යානවිශේෂයෙන් බලවත්ද එසේ හෙයිනි;-වේදනානියමය වනාහි සැමතන්හි ම ව්‍යුත්ථානගාමිනී විදර්ශනානියමයෙන් ම වේ; එසේ ම ශුෂ්කවිදර්ශකයන්ගේ සියලු ධ්‍යානාඞ්ගනියමය ද ව්‍යුත්ථානගාමිනී විදර්ශනානියමයෙන් ම වේ;-ඕහට වනාහි පාදකධ්‍යානාදීන්ගේ අභාවයෙන් ධ්‍යානයන්ගේ වශයෙන් නියමයක් නැතිහෙයින් විදර්ශනානියමයෙන් ම මාර්ගය පඤ්චාඞ්ගික වේ;-තවද අනිකෙකුදු ඇති, සමාපත්තිලාභිහුගේ ධ්‍යානපාදක නොකොට ප්‍රකීර්ණකසංස්කාරයන් සම්මර්ශනය කොට උපදවනලද්දවූ මාර්ගයතෙමේ විදර්ශනානියමයෙන් පඤ්චාඞ්ගික වේ;-මේ මෙහි අට්ඨකථාදියෙන් වෙන් කරණලද විනිශ්චයසාරය ස්ථවිරවාදදර්ශනාදි වශයෙන් ප්‍රවෘත්තවූ විනිශ්චයප්‍රපඤ්ච වනාහි අට්ඨකථාදියෙහි කියනලද ක්‍රමයෙන් දතයුතුයි.

[ඣානඞ්ගයොගභෙදෙන කත්වෙකෙකන්තු පඤ්චධා,
වුච්චතානුත්තරං චිත්තං චත්තාළීසවිධන්ති ච.
යථා ච රූපාවචරං ගය්හතානුත්තරං තථා,
පඨමාදිජ්ඣානභෙදෙ ආරුප්පඤ්චාපි පඤ්චමෙ.
එකාදසවිධං තස්මා පඨමාදිකමීරිතං,
ඣානමෙකෙකමන්තෙ තු තෙවීසතිවිධං භවෙ.]

එකිඑකි ලොකොත්තරචිත්තය වනාහි විතර්කාදි ධ්‍යානාඞ්ගයන් හා සම්ප්‍රයොගභෙදහෙයින් පඤ්චප්‍රකාර කොට ලොකොත්තරචිත්තය සතළිස්වැදෑරුම් වන්නේයයි කියා ද කියනුලැබේ;—රූපාවචරචිත්තය ප්‍රථමාදිවූ පඤ්චවිධධ්‍යානභෙදයෙහි "පඨමජ්ඣානචිත්තං" යනාදීන් යම්සේ කියනුලැබේ ද ලොකොත්තරචිත්තය ද ප්‍රථමාදි ධ්‍යානභෙදයෙහි එසේ ම "ප්‍රථමධ්‍යානශ්‍රොතආපත්තිමාර්ගචිත්තය" යනාදීන් කියනුලැබේ; අරූපාවචරචිත්තය ද උපේක්ෂාවෙදනා-චිත්තෙකාග්‍රතායොගහෙයින් අඞ්ගසමත්වය හෙතුකොටගෙණ පඤ්චමධ්‍යානයෙහි කියනුලැබේ;—හෙවත්-පඤ්චමධ්‍යානය ම ව්‍යවහාරවේ;—නොහොත්-රූපාවචරචිත්තය ද ලොකොත්තරචිත්තය ද ප්‍රථමාදි ධ්‍යානභෙදයෙහි ලා "පඨමජ්ඣානකුසලචිත්තං" "පඨමජ්ඣානසොතාපත්තිමග්ගචිත්තං" යනා

දින් යම්සේ කියනුලැබේ ද අරූපාවචරචිත්තය ද පඤ්චමධ්‍යානයෙහි ලා එපරිද්දෙන් කියනුලැබේ;—එහෙයින්—හෙවත්-යම්හෙයකින් රූපාවචරයන් මෙන් ලොකොත්තරයෝ ද ප්‍රථමාදිධ්‍යානභෙදයෙහි කියනුලැබෙත්ද අරූපාවචරය ද පඤ්චමධ්‍යානයෙහි ගන්නාලැබේ ද යම්හෙයකින් ධ්‍යානාඞ්ගයොගභෙදහෙයින් එකෙකි ලොකොත්තරචිත්තය පඤ්චප්‍රකාර කොට ලොකොත්තර චිත්තය සතළිස් ප්‍රකාරවූයේ කියනුලැබේ ද ප්‍රථමාදි ධ්‍යානභෙදයෙහි රූපාවචරයන් මෙන් අරූපාවචරචිත්තය පඤ්චමධ්‍යානයෙහි කියනුලැබේ ද එහෙයින් ප්‍රථමධ්‍යානාදිවූ එකිඑකි ධ්‍යානයතෙමේ කුශල-විපාක-ක්‍රියාවශයෙන් ලෞකිකවූ ධ්‍යාන තුනය ලොකොත්තරධ්‍යාන අටයයි මෙසේ එකොළොස්වැද්දරුම් වන්නේය, අන්තයෙහි පඤ්චමධ්‍යානය වනාහි කුශල-විපාක-ක්‍රියාවශයෙන් ලෞකිකධ්‍යානතුනය ද්වාදසවිධ අරූපාවචරය අෂ්ටලොකොත්තරයන්ගේ වශයෙන් ම තෙවිසිවැද්දරුම් වන්නේයි.

[සත්තතිංසවිධං පුඤ්ඤං ද්විපඤ්ඤාසවිධං තථා,
පාකමිච්චාහු චිත්තානි එකවීසසතං බුධා.]

කාමාවචරාදි කුසල්හු (කාමාවචර කුසල් අටය, රූපාවචර කුසල් පසය, අරූපාවචර කුසල් සතරය, ලොකොත්තර කුසල් විස්සයයි මෙසේ) සත්තිස් වැද්දරුම් වේ; එසේ ම විපාකචිත්තය (කාමාවචරවිපාකයෝ තෙවිස්සය, මහග්ගතවිපාක නවය, ලොකොත්තරඵලසිත් විස්සයයි) දෙපණස්වැද්දරුම් වන්නේයයි, මෙසේ ප්‍රාඥයෝ චිත්තයන් දෙළොස් අකුසලයන් හා ක්‍රියාවන් විස්ස බහාලා එක්සියඑක්විස්සෙකැයි කිව්හුයි.

## චිත්තසඞ්ග්‍රහවිභාග නම්වූ ප්‍රථමපරිච්ඡෙදවර්ණනායි.

මෙසේ චිත්තය භූමි-ජාති-සම්ප්‍රයොග-සංස්කාර-ධ්‍යානාලම්බන-මාර්ගභෙදවශයෙන් සුදුසුපරිද්දෙන් විභාග කොට දූන් උද්දෙශක්‍රමයෙන් චෛතසිකවිභාගය අනුප්‍රාප්තහෙයින් පළමුකොට වනාහි චතුර්විධ සම්ප්‍රයොගලක්ෂණයන් දර්ශනවශයෙන් චෛතසිකලක්ෂණය පිහිටුවා තදනන්තරව අන්‍යසමාන-අකුශල-ශොභනවශයෙන් තුන්රැසෙකින් චෛතසිකධර්මයන් උදෙසා එම චෛතසිකධර්මයන්ගේ සොළොස්ආකාරයකින් සම්ප්‍රයොගය ද තෙතිස් ආකාරයකින් සඞ්ග්‍රහය ද දක්වන පිණිස "එකුප්පාදනිරොධා ච" යනාදි කීහු.

[එකුප්පාදනිරොධා ච එකාලම්බන වත්ථුකා,
චෙතොයුත්තා ද්විපඤ්ඤාසධම්මා චෙතසිකා මතා.]

චිත්තය හා සමග එකොත්පාද-එකනිරොධවූ ද එකාලම්බන-එකවස්තුකවූ ද යථොක්තවූ චතුර්විධලක්ෂණයෙන් චිත්තය හා සම්ප්‍රයුක්තවූ ස්වලක්ෂණධාරණාර්ථයෙන් ධර්මනම්වූ දෙපණස්දෙන නියතයොගිවූ ද අනියතයොගිවූ ද චෛතසිකයහයි කියා දත්නාලදහු.

එහි ඉදින් එකොත්පාදමාත්‍රයකින් ම චෙතොයුක්තයහයි අභිමතවූ නම් එසමයෙහි චිත්තය හා සමග උපදනාවූ රූපධර්මයන්ගේ ද චෙතොයුක්තභාවය පැමිණෙන්නේයයි ඒ වලකන පිණිස "එකනිරොධ" ග්‍රහණය කරණලද, එසේ කල්හිදු චිත්තානුපරිවර්ත්තවූ විඥප්තීන් දෙදෙනාගේ ද ප්‍රසඞ්ගය වලකන්නට නොපිළිවන, එසේ ම "එකුප්පාදෙ වා නිරොධෙ වා තෙසන්ති—එකුප්පාදනිරොධා" යි කියා මෙසේ කල්පනා කරන්නාහට

පළමුකොට ඉපද විඥානයාගේ භඞ්ගක්ෂණයෙහි නිරුද්ධ වන්නාවූ රූපධර්මයන්ගේ ප්‍රසඞ්ගය වලක්වන්නට නොපිළිවන්නුයි "ඒකාලම්බන" ග්‍රහණය කරණලදී;—යම්කෙණෙක් මෙකියනලද ත්‍රිවිධලක්ෂණයෙන් යුක්තයෝ ද ඔහු නියමහෙයින් ඒකවත්ථුකයෝ මැයි දක්වනපිණිස "ඒකවත්ථුක" ග්‍රහණය කරණලදැයි දතයුතු.

[කථං?-ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා ඒකග්ගතා ජීවිතින්ද්‍රියං මනසිකාරො වෙති, සත්තිමෙ චෙතසිකා සබ්බචිත්තසාධාරණා නාම.]

කෙසේදැයි? චෛතසිකයන්ගේ ස්වරූප-සම්ප්‍රයොගාකාරය කෘත්‍යතාමය තාවිශයෙන් පාඨාවයි.

නිහනිස්පර්ශය කරණ හිරුරැස් සෙයින් ආලම්බනයෙහි ස්පර්ශාකාරයෙන් උපදනාවූ ස්පර්ශය ද, සුභොජනරසානුභව කරණ රජහු මෙන් ආලම්බන රසානුභව කරණ වේදනාව ද, වඩුකියාදීන්ගේ දැවආදියෙහි සලකුණු කිරීමක් මෙන් නීලපීතාදි භෙදවූ අරමුණු හඳුනන ආකාරයෙන් පවත්නාවූ සංඥාව ද, ස්වකෘත්‍ය-පරකෘත්‍යසාධකවූ ප්‍රධානශිෂ්‍යයා මෙන් තමා හා සම්ප්‍රයුක්තධර්මයන් ස්වකීයකෘත්‍යයෙහි යොදන චෙතනාව ද, නානාලම්බන ග්‍රහණය නොකොට ඒකඅරමුණක් ම උතුම්කොට ඇතිබැවින් සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ අවික්ෂිප්තභාවසාධකවූ චිත්තෛකාග්‍රතාව ද, උත්පලාදීන්ට ජලය මෙන් සහජාතඅරූපධර්මපරිපාලනයෙහි ආධිපත්‍යය කරණ ජීවිතෙන්ද්‍රිය ද, සම්ප්‍රයුක්තධර්මයන් ආලම්බනාභිමුඛ කොට සම්පාදනය කරණ මනසිකාරය ද, යන මේ චෛතසිකයෝ සත්දෙන සියලු ඒකූනනවුතිචිත්තයෙහි නියතව උපදනාහෙයින් සර්වචිත්තසාධාරණ නම් වෙත්. මෙහි විතර්කය චෙතනාය මනසිකාරය යන තුන්දෙනාගේ වෙනස මෙසේ දතයුතු;—විතර්කයා සහජාතධර්මයන් අරමුණට නැගීම ස්වභාවකොට ඇතිබැවින් සහජාතධර්මයන් අරමුණෙහි බහාලන්නාක්හු මෙන් වන්නේය, චෙතනා තොමෝ ආලම්බනග්‍රහණයෙන් යථාරූඪවූ ධර්මයන් අරමුණෙහි ලා තොමෝ යොදන්නී බලනායකයක්හු මෙන් වන්නීය, මනසිකාරයතොම සහජාතධර්මයන් ආලම්බනාභිමුඛ කොට මෙහෙයනහෙයින් අජානිය අශ්වයන් මෙහෙයන්නාවූ සාරථියක්හු මෙන් වන්නේයි.

[විතක්කො විචාරො අධිමොක්ඛො විරියං පීති ඡන්දො චා'ති, ඡ ඉමෙ චෙතසිකා පකිණ්ණකා නාම.]

නගරවාසීහු රජගෙට පමුණුවන අමාත්‍යයා මෙන් සම්ප්‍රයුක්තධර්මයන් අරමුණට පමුණුවන විතර්කය ද, රජහු මුහුණ හැඳින නගරවාසීන් රජගෙසි හැසිරීමක් මෙන් අරමුණු පිරිමදිනා විචාරය ද, ආලම්බනයෙහි නිශ්චයාකාරයෙන් උපදනා අධිමොක්ෂය ද, භාරොවහනයෙහි ධුරවෘෂභයා මෙන් කුශලධර්මයන්ට මනාකොට ප්‍රයොග කිරීමෙහි උත්සාහය ද, ද්‍රව්‍යප්‍රතිලාභයෙහි දුගියක්හු මෙන් ආලම්බනප්‍රතිලාභයෙහි ප්‍රීණනය කරණ ප්‍රීතිය ද, කර්තුකාම්‍යතාලක්ෂණ ඡන්දය ද, යන මේ චෛතසිකයෝ සදෙන ශොභනයන්කෙරෙහි ද අශොභනයන්කෙරෙහි ද ප්‍රකාරයෙන් විප්‍රකීර්ණයෝ නුයි ප්‍රකීර්ණක නම් වෙත්;—මෙසේ මේ සපණිදිවූ තෙලෙස් චෛතසිකයෝ ශොභනචිත්තයෙන් අන්‍යවූ චිත්තයෙහිද උපදනාහෙයින් අන්‍යසමානය හයි කියා දතයුතුතානුයි.

මෙසේ සබ්බචිත්තසාධාරණවශයෙන් ද ප්‍රකීර්ණකවශයෙන් ද ශෝභනෙතරස්වභාවවූ චෛතසිකයන් තෙළෙස්දෙනා දක්වා දැන් සට විත්තාවිභඞ්ගයෙහි නිද්දේශානුක්‍රමයෙන් අකුශලකර්මපථසාධන චෛතසිකයන් පළමුකොට දක්වා ඉක්බිත්තෙන් ශෝභනධර්මසාධන චෛතසිකයන් දක්වනුපිණිස "මොහො" යනාදී දක්වනලදී; අහෙතුකවූ ආවෙනිකධර්මයකොගෙන් නැත්නුයි අහෙතුකයෝ වෙන වෙන නොකියනලද්දුයි.

[මොහො අහිරිකං අනොත්තප්පං උද්ධච්චං ලොභො දිට්ඨි මානො දොසො ඉස්සා මච්ඡරියං කුක්කුච්චං ථිනං මිද්ධං විචිකිච්ඡා චෙ'ති චුද්දසිමෙ චෙතසිකා අකුසලා නාම.]

ආලම්බනස්වභාවප්‍රච්ඡාදනය කරණ **මොහය** ද, අමෙධ්‍යයෙහි ග්‍රාමශූකරයා මෙන් පාපයෙහි අජුගුප්සාකාරයෙන් පවත්නා **අහිරිකය** ද, වහ්නියෙහි අනුත්‍රස්තවූ ශලභයා මෙන් පාපයෙහි අනුත්‍රස්තව පවත්නා **අනොත්තප්පය** ද, පාෂාණාභිඝාතයෙන් සමුද්ධතවූ භස්මයක් මෙන් චිත්තයාගේ අව්‍යූපශමලක්ෂණවූ **ඖද්ධත්‍යය** ද, මක්ඛිකාලෙපයක් මෙන් අරමුණෙහි ලගනස්වභාවවූ **ලොභය** ද, මරීචියෙහි ජලබුද්ධිය මෙන් විපරීතාභිනිවෙශස්වභාවවූ **මිථ්‍යාදෘෂ්ටිය** ද, "සෙය්‍යොහමස්මි" යනාදීන් උන්නතිස්වභාවවූ **මානය** ද, පහටාශීවිෂයෙකු මෙන් චණ්ඩිකස්වභාවවූ **ද්වෙෂය** ද, පරසම්පත්තියෙහි අසහනලක්ෂණවූ **ඊර්ෂ්‍යාව** ද, ස්වසම්පත්ති සැඟවීම ස්වභාව කොට ඇති **මාත්සර්‍ය්‍යය** ද, කෘතාකෘත සුචරිත-දුශ්චරිතානුශෝචනලක්ෂණවූ **කෞකෘත්‍යය** ද, ආලම්බනග්‍රහණයෙහි චිත්තයාගේ ලීනභාවය කරණ **ස්ත්‍යානය** ද, වෙදනාදී ස්කන්ධත්‍රයාගේ අකර්මණ්‍යභාවය කරණ **මිද්ධය** ද, බුද්ධාදිඅටතන්හි සංශයලක්ෂණවූ **විචිකිත්සාව** ද, යන මේ තුදුස් චෛතසිකයෝ ඒකාන්තයෙන් අකුසලසිතෙහි ම උපදනා හෙයින් අකුශලචෛතසිකයෝ නම් වෙත්;—මෙහි චිත්තයාගේ අරමුණෙහි ඇලෙනු කැමැත්ත මාත්‍රය ඡන්ද නම් වෙයි, අතිශයින් ඇලීම ලොභ නම් වෙයි, යනු මේ ඡන්ද-ලොභදෙදෙනාගේ වෙනසයි;—"ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති මිච්ඡාභිනිවෙසලක්ඛණා දිට්ඨි දුග්ගහො" මෙහි ඥානය තෙම අරමුණ යථාස්වභාවහෙයින් දන්නී,—දෘෂ්ටිතොමෝ යථාස්වභාව හැර විපරීතාකාරයෙන් ගන්නීය; යන මේ ඥාන-දෘෂ්ටිදෙදෙනාගේ වෙනසයි.

[සද්ධා සති හිරි ඔත්තප්පං අලොභො අදොසො තත්‍රමජ්ඣත්තතා කායපස්සද්ධි චිත්තපස්සද්ධි කායලහුතා චිත්තලහුතා කායමුදුතා චිත්තමුදුතා කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා චෙති, එකූනවීසතිමෙ චෙතසිකා සොභනසාධාරණා නාම.]

උදකප්පසාදකමාණිකයක් මෙන් සම්ප්‍රයුක්තධර්මයන් ප්‍රසන්න කරණ **ශ්‍රද්ධාව** ද, ප්‍රතුණ්ඨනස්ථයක් මෙන් ආලම්බනස්මරණය කරණ **ස්මෘතිය** ද, පාපධර්මයන්කෙරෙහි ජුගුප්සාකාරයෙන් පවත්නා **හිරිය** ද, පාපධර්මයන්කෙරෙහි භයාකාරයෙන් පවත්නා **ඔත්තප්පය** ද, කමලපත්‍රගත ජලබින්දුවක් මෙන් අරමුණෙහි අලගනස්වභාවවූ **අලොභය** ද, අනුකූලප්‍රවෘත්ති ඇති මිත්‍රයකු මෙන් අවිරොධලක්ෂණවූ **අද්වෙෂය** ද, සම්ප්‍රයුක්තචෛතසිකධර්මයන් ස්වකීය ස්වකීයකෘත්‍යයෙහි සම්ප්‍රවෘත්තියට හෙතුවූ **තත්‍රමධ්‍යස්ථතාව** ද, වෙදනා

දී ස්කන්ධත්‍රයාගේ දරථයයි කියනලද ඖද්ධත්‍යාදී ක්ලේශයන් සන්හිඳුවන **කායප්‍රශ්‍රබ්ධිය** ද, විඥානස්කන්ධයාගේ දරථයයි කියනලද ඖද්ධත්‍යාදි ක්ලේශයන් සංහිඳුවන **චිත්තප්‍රශ්‍රබ්ධිය** ද, වේදනාදි ස්කන්ධත්‍රයාගේ ගරුභාවයයි කියනලද ස්ත්‍යාන-මිද්ධාදීන් සංහිඳුවන **කායලඝුතාව** ද, විඥානස්කන්ධයාගේ ගරුභාවයයි කියනලද ස්ත්‍යාන-මිද්ධාදීන් සංහිඳුවන **චිත්තලඝුතාව** ද, වේදනාදි ස්කන්ධත්‍රයාගේ ස්තබ්ධභාවයයි කියනලද දෘෂ්ටි-මානාදීන් සංහිඳුවන **කායමෘදුතාව** ද, විඥානස්කන්ධයාගේ ස්තබ්ධභාවයයි කියනලද දෘෂ්ටි-මානාදීන් සංහිඳුවන **චිත්තමෘදුතාව** ද, වේදනාදි ස්කන්ධත්‍රයාගේ දාන-ශීලාදි පුණ්‍යකර්මයෙහි අයොග්‍යතාවයි කියනලද කාමච්ඡන්දාදි ක්ලේශයන් සංහිඳුවන **කායකර්මණ්‍යතාව** ද, විඥානස්කන්ධයාගේ දාන-ශීලාදි පුණ්‍යකර්මයෙහි අයොග්‍යතාය යි කියනලද කාමච්ඡන්දාදීන් සංහිඳුවන **චිත්තකර්මණ්‍යතාව** ද, වේදනාදි ස්කන්ධත්‍රයාගේ ගෙලඤ්ඤයයි කියනලද අශ්‍රද්ධාදීන් සංහිඳුවන **කායප්‍රාගුණ්‍යතාව** ද, විඥානස්කන්ධයාගේ ගෙලඤ්ඤයයි කියනලද අශ්‍රද්ධාදීන් සංහිඳුවන **චිත්තප්‍රාගුණ්‍යතාව** ද, වේදනාදි ස්කන්ධත්‍රයාගේ කුටිලභාවයයි කියනලද මායාදීන් සංහිඳුවන **කායයාගේ ඍජුභාවය** ද, විඥානස්කන්ධයාගේ කුටිලභාවයයි කියනලද මායාදීන් සංහිඳුවන **චිත්තයාගේ ඍජුභාවය** ද, යන මේ එකුන්විසි චෛතසිකයෝ සියලුශොභනචිත්තයෙහි නියමයෙන් උපදනාහෙයින් සොභනචිත්තසාධාරණ නම් වෙත්;—"කායො'ති චෙත්ථ වෙදනාදික්ඛන්ධත්තයස්ස ගහණං"-මේ කායප්‍රශ්‍රබ්ධ්‍යාදීහු වනාහි යථාක්‍රමයෙන් කාය-චිත්ත දෙදෙනාගේ ස්තබ්ධභාවාදිය කරණ ධාතුක්ෂොභයට ප්‍රතිපක්ෂප්‍රත්‍යයෙන් උපදනාහුයි;—යම්හෙයකින් මේ ධර්මයෝ දෙදෙන එක්ව තමතමන්ගේ ප්‍රතිපක්ෂධර්මයන් හනනය කෙරෙද්ද එහෙයින් සම්මාදිට්ඨාදියෙහි මෙන් එකෙකී ධර්මයා නොකියා මේ ධර්මයන්කෙරෙහි ම ද්විවිධත්වය කියනලදි;—තවද චිත්තප්‍රශ්‍රබ්ධ්‍යාදීන්විසින් චිත්තයාගේ ම ප්‍රශ්‍රබ්ධභාවය වන්නේය, කායප්‍රශ්‍රබ්ධ්‍යාදීන් විසින් වනාහි චිත්තසමුත්ථානප්‍රණීතරූපයන්ගේ ස්ඵරණවශයෙන් රූපකායයාගේ ප්‍රශ්‍රබ්ධාදිභාවය වේනුයි; ඒ අර්ථය ප්‍රකාශ කරණුපිණිස ද මේ ධර්මයන් කෙරෙහි ම ද්විවිධත්වය කියනලදැයි දතයුතු.

[සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො චෙ'ති, තිස්සො විරතියො නාම.]

මුසාවාදාදි චතුර්විධවාග්දුශ්චරිතයෙන් විරමණයයි කියනලද **සම්‍යග්වචනය** ද, ප්‍රාණාතිපාතාදී ත්‍රිවිධකායදුශ්චරිතයෙන් විරමණයයි කියනලද **සම්‍යක්කර්මාන්තය** ද, මිථ්‍යාආජීවයෙන් විරමණයයි කියනලද **සම්‍යගාජීවය** ද, යන මොහු වෙන වෙන සම්ප්‍රාප්ත-සමාදාන-සමුච්ඡෙදවශයෙන් යථොක්තවූ දුශ්චරිතයෙන් විරමණහෙයින් විරතීහු නම් වෙත්.

[කරුණා මුදිතා පන අප්පමඤ්ඤායො නාම.]

දුඃඛිතසත්ත්වයන්ගේ දුඃඛාපගමය කැමැතිවූ **කරුණාව** ද, සුඛිතසත්ත්වයන්ගේ සුඛයෙහි ප්‍රමුදිතව පවත්නා **මුදිතාව** ද, යන මේදෙදෙනා වනාහි අප්‍රමාණ සත්ත්වයන් විෂය කොට පවත්නාහෙයින් අප්‍රමාණ්‍ය නම් වෙත්;—සර්වප්‍රකාරයෙන් ප්‍රඥෙන්ද්‍රියය හා සමග මේ පස්විසි චෛතසිකයෝ ශොභනචෛතසිකය හයි දතයුත්තාහුයි

මෙහි "චතස්සො අප්පමඤ්ඤා"යි ආචාර්යයන් තමන් මත්තෙහි කියත් මෙතැන්හි අප්‍රමාණ්‍යයෝ දෙදෙනෙක් ම කුමක්පිණිස කියන ලදහුද

යත්? අවෙෂ-තත්‍රමඣ්‍යස්ථතා දෙදෙනාගේ වශයෙන් ම මෛත්‍රීඋපෙක්‍ෂා දෙ දෙනා ගන්නාලදහෙයින්; එසේමැයි—අවෙෂතෙමේ සත්‍ත්‍වයන්කෙරෙහි හිතාධ්‍යාශහෙයින් ප්‍රවෘත්තවූයේ මෛත්‍රී නම් වෙයි; තත්‍රමඣ්‍යස්ථතාතො මෝ සත්‍ත්‍වයන්කෙරෙහි ප්‍රතිඝානුනයක් නැතිව සමව පවත්නී උපෙක්‍ෂා නමු;—කියනලදැමැයි;—

අව්‍යාපාදෙන මෙත්තා හි තත්‍රමජ්ඣත්තතාය ච,
උපෙක්ඛා ගහිතා යස්මා තස්මා න ගහිතා උභො,—යි

සංඥා-විඥාන-පඥා යන මොවුන්ගේ නානත්‍වය කෙසේදයත්?සංඥ ව වනාහි නීලාදිවශයෙන් සජානනමාත්‍රය කරන්නේය, ලක්‍ෂණප්‍රතිවෙධය කරන්නට අසමර්ථවන්නීය, විඥානය ලක්‍ෂණප්‍රතිවෙධය ද නීලාදිවශයෙන් සංඥව ද කරන්නේය, උත්සාහ කොට මත්තෙහි මාර්ගඵලයට පමුණුවාලි ය නොහෙන්නේය, ප්‍රඥව වනාහි නීලාදි සජානන-ලක්‍ෂණප්‍රතිවෙධ-මාර්ග ඵලයට පැමිණවීමය යන මේ තුන ම කරන්නේයි.—(මෙසේ)

[තෙරස'ඤ්ඤසමානා ච චුද්දස'කුසලා තථා,
සොභනා පඤ්චවීසා'ති, ද්විපඤ්ඤාස පවුච්චරෙ.]

අන්‍යසමානවූ චෛතසිකයෝ තෙළෙස්දෙන ද, අකුශලචෛතසිකයෝ ද තුදුස්දෙන ද, එසේම ශොභනචෛතසිකයෝ පස්විස්සදූයි, මෙපණකින් දෙපණස් චෛතසිකයෝ(යි) කියනුලැබෙත්.

චිත්තය හා අවියුක්තවූ හෙවත් චිත්තසම්ප්‍රයුක්තවූ ඒ දෙපණස් චෛත සිකයන්ගේ කුසලාදිභෙදභින්නවූ එකූනනවුතිචිත්තයෙහි වෙන වෙන මේ ධර්මය මෙතෙක් චිත්තයෙහි උපදනේයයි සම්ප්‍රයොගයතෙමේ මෙයින් ම ත්තෙහි සර්වසාධාරණාදිවශයෙන් සම්භවූ පරිච්ඡෙදෙන් කියනුලැබේ;(කෙසේද?)

[සත්ත සබ්බත්ථ යුජ්ජන්ති යථායොගං පකිණ්ණකා,
චුද්දසා'කුසලෙසෙව'ව, සොභනෙසෙව'ව සොභනා.]

ඵස්සාදිවූ චෛතසිකයෝ සත්දෙන කුසලාදිභෙදවූ සියලු චිත්තයෙහි යෙදෙන්නාහ, විතර්කාදි ප්‍රකීර්ණකයෝ(සදෙන)යෙදෙන යෙදෙන පරිච්ඡෙදෙන් වන්නාහ, මොහාදිවූ තුදුස් අකුසලයෝ මාදසඅකුසලචිත්තයෙහි ම යේදෙන්නාහ, ශ්‍රද්ධාදිවූ පස්විසි සොභනයෝ පාපාහෙතුක වර්ජිත සොභනචිත්තයෙහි ම වන්නාහුයි.

කෙසේද?—**සර්වචිත්තසාධාරණවූ ඵස්සාදිවූ** චෛතසිකයෝ සත්දෙනා වනාහි සියලු එකූනනවුතිචිත්තයෙහි ලැබෙන්නාහ.

ප්‍රකීර්ණකයන්කෙරෙහි වනාහි පළමුකොට **විතර්කයතෙම** දෙපස් විඥානවර්ජිත සූසාළිස් කාමාවචරචිත්තයෙහි ද, එකොළොස් ප්‍රථමධ්‍යාන යෙහිද්දයි, මේ පස්පණස් චිත්තයෙහි උපදනේයි.

**විචාරය** වනාහි ඒ සවිතර්කවූ පණස්පස් චිත්තයෙහි ද, එකොළොස් විතීයධ්‍යානචිත්තයෙහි දූයි, මෙසේ සූසැට චිත්තයෙහි උපදනේය.

**අධිමොක්‍ෂය** දෙපස් විඥානය හා විචිකිත්සා යන මේ එකොළොස් දෙනා වර්ජිතකොටඇති නොහොත් එකොළොස්දෙනාවිසින් වර්ජිතවූ චිත්තයෙහි උපදනේයි.

**වීර්‍ය්‍යතෙමේ** පඤ්චද්වාරාවර්ජනයාවිසින් ද දෙපස් විඥානයන්විසින් ද සම්ප්‍ර තිච්ඡනයන් දෙදෙනාවිසින් ද සන්තීරණයන් තුන්දෙනාවිසින් ද යන මේ සොළොස්දෙනාවිසින් වර්ජිතවූ තෙසැත්තෑචිත්තයෙහි උපදනේයි

**ප්‍රීතියතොමෝ** දොම්නස්සහගත චිත්තයන්දෙදෙනා හා උපෙක්ෂාසහගත චිත්තයන් පස්පණස්දෙනාවිසින් ද කායවිඥානයන් දෙදෙනාවිසින් ද එකාදශ චතුර්ථධ්‍යානයන්විසින් ද යන මේ සැත්තෑවිත්තයන්විසින් වර්ජිතවූ එක්පණස් චිත්තයෙහි උපදනීය.

**ඡන්දයතොමේ** අටළොස් අහේතුකයන්විසින් ද මොමූහවිත්තයන්දෙදෙනාවිසින් ද යන මේ චිත්තයන් විසිදෙනාවිසින් වර්ජිතවූ අවශිෂ්ටවූ එකුන්සැත්තෑවිත්තයෙහි ලැබේ—(කියනලදමැයි.)

[ඡසට්ඨි පඤ්චපඤ්ඤාස එකාදස ච සොළස,
සත්තති වීසති චෙව පකිණ්ණකවිවජ්ජිතා.
පඤ්චපඤ්ඤාස ඡසට්ඨ'ඨසත්තති තිසත්තති,
එකපඤ්ඤාස චේ'කූනසත්තති සපකිණ්ණකා.]

ප්‍රකීර්ණකයන් වර්ජිතකොටැති (ඒ චිත්තොත්පාදයෝ වනාහි පිළිවෙළින්) සසැටෙක් ද, පස්පණසෙක් ද, එකොළොසෙක් ද, සොළසෙක් ද, සැත්තෑවෙක් ද, විස්සෙක් ද, වෙත්.

ප්‍රකීර්ණකයන් සහිතවූ (ඒ චිත්තයෝ වනාහි පිළිවෙළින්) පස්පණසෙක් ද, සැටෙක් ද, අටසැත්තෑවෙක් ද, තෙසැත්තෑවෙක් ද, එක්පණසෙක් ද, එකුන්සැත්තෑවෙක් ද, වෙත්;—මෙහි "ඡසට්ඨි පඤ්චපඤ්ඤාස" යනාදි ගණන් එක්සිය එක්විස්සක්පමණ මධ්‍යමප්‍රවෘත්තිවශයෙන් ද එකූනානූවක්පමණ සංක්‍ෂෙපවෘත්තිවශයෙන් ද සුදුසුසුදුසුපරිද්දෙන් යෙදියයුතු.

අකුසලයන්කෙරෙහි වනාහි **මෝහය** ද, **අහිරිකය** ද, **අනොත්තප්පය** ද, **ඖද්ධත්‍යය** ද යන මේ චෛතසිකයෝ සතරදෙන සියලු අකුසල චිත්තයන්ට සාධාරණයෝයි, සියලු දොළොස් අකුසලචිත්තයෙහි ලැබෙත්; යම්හෙයකින් ප්‍රාණවධාදි අකුසල් කරන්නාවූ යම් කිසි සත්ත්වයක්තෙමේ මෝහය හෙතුකොටගෙණ ඒ ප්‍රාණවධාදියෙහි ආදීනව නොදක්නේ අහිරිකය හෙතුකොටගෙණ ඒ පාපයෙන් ජුගුප්සාවක් නැත්තේ අනොත්තප්පය හෙතුකොටගෙණ එහි භයක් නැත්තේ උද්ධච්චය හෙතුකොටගෙණ නොසන්හුන්නේ ම කෙරේ ද, එහෙයින් ඒ මෝහාදි සතරදෙන සියලු අකුසල චිත්තයෙහි ම උපදිත්.

**ලෝභයතොමේ** ලෝභසහගතචිත්තයන් අටදෙනාකෙරෙහි ම ලැබෙන්නේය.

**දෘෂ්ටියතොමෝ** සත්කායාදියෙහි අභිනිවේශය කරන්නාහුගේ එහි මමායනය සම්භව වනහෙයින් දෘෂ්ටිසම්ප්‍රයුක්තලෝභසහගතචිත්තයන් සතරදෙනා කෙරෙහි ම ලැබෙන්නීය.

**මානයතොමේ** දෘෂ්ටිගතවිප්‍රයුක්තවූ ලෝභසහගතචිත්තයන් සතරදෙනාකෙරෙහි ම ලැබේ;—මෙහි මානයා අහම්මානවශයෙන් පවත්නාහෙයින් දෘෂ්ටිය හා සමවූයේ ම පවතීනුයි දෘෂ්ටිය හා එක්ව එකචිත්තයෙහි නොඋපදනේය, යම්සේ කේසරසිංහතෙමේ අන්‍යවූ තමාසේම්වූ එකෙකු හා එකගුහායෙහි නොවෙසේ ද එසේම තමා හා සමවූ දෘෂ්ටිය හා සමග නොඋපදනේය; ආත්මස්නෙහයට නිශ්‍රයබැවින් එකාන්තලොභයට පිහිට හෙයින් ද්වෙෂමූලාදි චිත්තයෙහි නොඋපදනේය; එහෙයින් ඒ මානයතෙමේ දෘෂ්ටිවිප්‍රයුක්තවූ සතරසිතෙහි ම උපදනේයි.

**ද්වේෂය** ද, **ඊර්ෂ්‍යාව** ද, **මාත්සර්ය්‍යය** ද, **කුකුස** ද, යන මොහු ප්‍රතිඝසම්ප්‍රයුක්තවූ චිත්ත

මයෙහි ලැබෙත්;—මෙහි පරසම්පත්තියෙහි ඊර්ෂ්‍යා කරන්නාහට ද ආත්මසම්පත්තියගේ ද මෙරමා හා සාධාරණභාවය නොකැමැත්තාහට ද කෘතාකෘතදුශ්චරිතසුචරිතයෙන් අනුශෝචනය කරන්නාහට ද ඒ ඒ ක්‍රියායෙහි ප්‍රතිහනනවශයෙන් ගැටෙමින් පවත්නාහෙයින් ඊර්ෂ්‍යා-මාත්සර්ය්‍ය-කෞකෘත්‍ය යන මොහු ප්‍රතිඝසම්ප්‍රයුක්තචිත්තද්වයෙහි ම උපදිත්.

ස්ත්‍යානය ද, මිද්ධය ද, යන මොහු අකර්මණ්‍යස්වභාවඇත්තාහුගේ ස්වභාවතීක්ෂ්ණවූ අසංස්කාරිකචිත්තයෙහි ප්‍රවෘත්තියක් නැතිහෙයින් පවිටිවූ සසංස්කාරිකචිත්තයෙහි ලැබෙත්.

**විචිකිත්සාතොමෝ** විචිකිත්සාසහගතචිත්තයෙහි ම ලැබේ. (කියනලදමැයි)

[සබ්බාපුඤ්ඤේසු චත්තාරො ලොභමූලෙ තයො ගතා,
දොසමූලෙසු චත්තාරො සසඞ්ඛාරෙ ද්වයං තථා.
විචිකිච්ඡා විචිකිච්ඡාචිත්තෙ චෙ'ති චතුද්දස,
ද්වාදසාකුසලෙස්වෙ'ව සම්පයුජ්ජන්ති පඤ්චධා.]

ද්වාදශවිධවූ සියලු අකුසලයන්කෙරෙහි මොහාදි චෛතසිකයෝ සතරදෙන කරණලදහ, හෙවත් කියනලදහ; ලොභමූලිකවූ චිත්තයන් අටදෙනාකෙරෙහි ලොභ-දෘෂ්ටි-මාන යන තුන්දෙන කරණලදහ; ද්වේෂමූලිකවූ චිත්තද්වයෙහි ද්වේෂාදිවූ චෛතසිකයෝ සතරදෙන කරණලදහ; එසේ ම සසංස්කාරිකචිත්තයෙහි ස්ත්‍යාන-මිද්ධ දෙක කරණලද්දී; විචිකිත්සාතොමෝ විචිකිත්සාසම්ප්‍රයුක්තචිත්තයෙහි ම කරණලද්දැයි; අකුශලචෛතසිකයෝ තුදුස්දෙන දොළොස් අකුසලචිත්තයෙහි පඤ්චප්‍රකාරයකින් යෙදෙත්;

ශෝභනචෛතසිකයන්කෙරෙහි වනාහි සියලු **ශෝභනචිත්තසා**ධාරණවූ එකුන්විසි චෛතසිකයෝ වනාහි සියලු එකුන්සැට ශෝභනචිත්තයෙහි ම සම්භවෙත්.

**විරතීහු** තුන්දෙන වනාහි සියලු ලොකොත්තරචිත්තයෙහි ඒ ඒ දුශ්චරිතවිධ්වංසනවශයෙන් ප්‍රවෘත්තාව සියලු ආකාරයෙන් ම නියතවූවාහු එක්ව ම ලැබෙත්;—ලෞකිකචිත්තයන්කෙරෙහි වනාහි කාමාවචරකුසලචිත්තයන්කෙරෙහි ම කිසිකලෙක්හි (හෙවත්-මුසාවාදාදිවූ එකෙක් දුශ්චරිතයන්කෙරෙන් විරමණකාලයෙහි) වෙන වෙන ම (හෙවත්—ව්‍යතික්‍රම කටයුතු වස්තුසඞ්ඛ්‍යාතවූ තමතමන්ගේ ආලම්බනසම්භවයක් ඇතිකල්හි) දක්වනුලැබෙත්.

**අප්‍රමාණ්‍යයෝ** වනාහි පඤ්චමධ්‍යානවර්ජිතවූ දොළොස් මහග්ගතචිත්තයන්කෙරෙහි ද කාමාවචරකුසලයෙහි ද සහෙතුකකාමාවචරක්‍රියාචිත්තයෙහි දූයි වේ අටවිසි චිත්තයෙහි ම කිසිකලෙක්හි භින්නාලම්බනහෙයින් තම තමන්ට ආලම්බනවූ දුඃඛිත-සුඛිතසත්ත්වයන්ගේ ආපාථගමනවශයෙන් වෙන්වෙන්ව උපදිත්;—මේ කාමාවචරචිත්තයන් අතුරෙහි උපෙක්ෂාසහගතචිත්තයන්කෙරෙහි වනාහි කරුණා-මුදිතාදෙදෙන නොවන්නාහයි සමහරකෙනෙක් කියත්;—මෙහි කරුණා-මුදිතා භාවනාකාලයෙහි පූර්වයෙහි පරිචයවශයෙන් උපෙක්ෂාසහගතචිත්තයෙහිදු පරිකර්ම වන්නේය;—යම්සේ ප්‍රගුණග්‍රන්ථය පිරිවන්නාවූ කිසිකලෙක්හි අන්‍යවිහිතවූවන්ගේ ද නොපැකිල පිරිවීම ද ප්‍රගුණවිදර්ශනාවෙන් සංස්කාරධර්මයන් සම්මර්ශණය කරන්නහුගේ කිසිකලෙක්හි පරිචයබලයෙන් ඥානවිප්‍රයුක්තචිත්තයෙනුදු සම්මර්ශණය ද එසේම උපෙක්ෂාසහගතචිත්තයෙනුදු පරිචයවශයෙන් පරිකර්මවේ;—එහෙ

සිත් උපෙක්ඛාසහගතකාමාවචරචිත්තයෙහි කරුණා-මුදිතා දෙදෙනාගේ අසම්භවවාදය කෙබිත්වාද කරණලදී;—අජිණවීථියෙහි වනාති ඒ කරුණා-මුදිතා දෙදෙනාගේ සම්භවය එකාන්තයෙන් සොම්නස්සහගතචිත්තයෙහි ම දතයුතු; කුමක්හෙයින්දයත්? භින්නජාතිකවූ චිත්තයාගේ මෙන් භින්නවේදනාවෙන් යුක්තවූ චිත්තයාගේ ද ආසෙවනප්‍රත්‍යයක් නැතිහෙයිනි.

ප්‍රඥාව විනාහි වාදසවිධ ඥානසම්ප්‍රයුක්තකාමාවචරචිත්තයෙහි ද සියලු පන්තිස් මහග්ගත-ලොකොත්තරචිත්තයෙහි දූයි මේ සත්සාළිස් චිත්තයෙහි සම්ප්‍රයොගබවට පැමිණේ. (කියනලදමැයි.)

[එකූනවීසති ධම්මා ජායන්තෙ’ කුනසට්ඨිසු,
තයො සොළසචිත්තෙසු අට්ඨවීසතියං ද්වයං.
පඤ්ඤා පකාසිතා සත්තචත්තාළීසවිධෙසු’පි,
සම්පයුත්තා චතුද්ධෙවං සොභනෙසෙව’ච සොභනා.]

සොභනසාධාරණවූ එකුන්විසි චෛතසිකධර්මයෝ එකුන්සැට සොභනචිත්තයෙහි උපදනාහ; සම්‍යග්වාචාදිවූ විරතිහු තුන්දෙන ලොකොත්තරයන් අටදෙනා හා කාමාවචරකුසලයන් අටදෙනාගේ වශයෙන් මේ සොළොස් චිත්තයෙහි උපදනාහ; කරුණා-මුදිතා දෙක පචමධ්‍යානවර්ජිත දෙළොස් මහගතචිත්තයෙහි ද කාමාවචරකුසලයෙහි ද සහෙතුකකාමාවචරචිත්තයෙහි ද යන මේ අටවීසි චිත්තයෙහි උපදනාහු; ප්‍රඥතොමෝ ඥානසම්ප්‍රයුක්තකාමාවචරචිත්තයන් දොළොස්දෙනාකෙරෙහි ද පන්තිස් මහත්ගත-ලොකොත්තරචිත්තයෙහි ද යන මේ සත්සාළිස්චිත්තයෙහි ම ප්‍රකාශකණලද; මෙසේ එකුන්සැට සොභනචිත්තයෙහි ම පස්විසි ශොභනචෛතසිකයෝ සතරපරිද්දෙකින් යොදනලද්දහු.

මෙසේ නියතානියත-සම්ප්‍රයොගවශයෙන් ලද්දවුන්කෙරෙන් අනියතයිවීමගන් එක් කොට දක්වා සෙස්සවුන්ගේ නියතභාවය ප්‍රකාශ කරණුපිණිස “ඉස්සා-මච්ඡර” යනාදී කියනලදී.

[ඉස්සා–මච්ඡර–කුක්කුච්චා විරතී කරුණාදයො,
නානා කදාචි මානො ච ථීන–මිද්ධං තථා සහ,
යථාවුත්තානුසාරෙන සෙසා’නියතයොගිනො.]

ඊර්ෂ්‍යා-මාත්සර්‍ය්‍ය-කෞකෘත්‍ය යන මොහු ද විරතීහු ද කරුණාදීහු ද (හෙවත්—කරුණා-මුදිතා යන දෙදෙන ද) යන මොහු භින්නවිෂයහෙයින් වෙන වෙන උපදනාහ; අනියතහෙයින් කිසිකලෙක්හි උපදිත්;—මෙහි ඊර්ෂ්‍යා-මාත්සර්‍ය්‍ය-කෞකෘත්‍ය යන මොහු ද ප්‍රතිඝසම්ප්‍රයුක්තචිත්තවයෙහි අනියතහෙයින් කිසිකලෙක්හි උපදනාහ; භින්නවිෂයහෙයින් වෙන වෙන උපදනාහ; විරතීහු තුන්දෙන ද කාමාවචරකුසලයෙහි උපදිත්; කිසිකලෙක්හි “සෙය්‍යොහමස්මි” යනාදිවශයෙන් ප්‍රවෘත්තියක් ඇතිකල්හි උපදනේය; ස්ත්‍යානමිද්ධය ද එසේ ම කිසිකලෙක්හි අකර්මණ්‍යවශයෙන් ප්‍රවෘත්තියක් ඇතිකල්හි අන්‍යොන්‍යඅවිප්‍රයොගිවශයෙන් උපදනේයි; නොහොත්—“මානො ච” යන්නෙහි “ච” ශබ්දය “සහ” යන මෙහි ද යොද “ථිනමිද්ධං තථා කදාචි සහ ජායති” යි සම්බන්ධ කරණු, ස්ත්‍යානමිද්ධය එසේ ම කිසිකලෙක්හි සසංස්කාරප්‍රතිඝචිත්තයෙහි ඊර්ෂ්‍යා-මාත්සර්‍ය්‍ය—කෞකෘත්‍ය යන මොවුන් හා එක්ව ද දෘෂ්ටිවිප්‍රයුක්තසසංස්කාරිකචිත්තයෙහි මානය හා එක්ව ද දෘෂ්ටිසම්ප්‍රයුක්තසසංස්කාරිකචිත්තයෙහි ද මානය සර්වප්‍රකාරයෙන් නො උපදනාහෙයින් හෝ දෘෂ්ටිවිප්‍රයුක්තසසංස්කාරිකචිත්තයෙහිදු “සෙය්‍යොහමස්මි”

යනාදීන් ප්‍රවෘත්තියක් ඇතිකල්හි මුත් මානය හා නොඋපදනාහෙයින් වෙන වෙන ද උපදනේයි;—යථොක්තනයානුසාරයෙන් හෙවත්—යථොක්ත අනියතයන් එකොළොස්දෙනා අනුව දූන්මෙන් එකොළොස් අනියතයන් කෙරෙන් සෙසු එක්සාළිස් චෛතසිකයෝ වියදුතු ඒ ඒ චිත්තයෙහි හැමකල්හිම වනබැවින් නියතයොගිහ.

මෙසේ එස්සාදි ධර්මයන් අතුරෙන් මේ ධර්මයතෙමේ මෙතෙක් චිත්තයෙහි උපදනේයයි චිත්තපරිච්ඡේදහෙයින් සම්ප්‍රයොග දක්වා දූන් මේ චිත්තයෙහි මෙතෙක් චෛතසිකයෝයයි චෛතසිකරාශිපරිච්ඡේදවශයෙන් සඞ්ග්‍රහ දක්වනපිණිස "සඞ්ගහඤ්ච පවක්ඛාමි" යනාදි කියනලදී.

[සඞ්ගහඤ්ච පවක්ඛාමි තෙසංදානි යථාරහං,
ඡත්තිංසා'නුත්තරෙ ධම්මා පඤ්චතිංස මහග්ගතෙ,
අට්ඨතිංසා'පි ලබ්භන්ති කාමාවචරසොභනෙ.
සත්තවීසත්‍ය'පුඤ්ඤම්හි ද්වාදසා'හෙතුකෙ'ති ච,
යථාසම්භවයොගෙන පඤ්චධා තත්ථ සඞ්ගහො.]

දූන් ඒ ඒ සිතට සුදුසුපරිද්දෙන් ඒ ඒ නියතානියතචෛතසිකයන්ගේ මේ චිත්තයෙහි මෙතෙක් චෛතසිකයෝය යන සඞ්ග්‍රහය දක්වයි.

ලොකොත්තරචිත්තයෙහි (උත්කෘෂ්ටපරිච්ඡේදයෙන් අන්‍යසමානයෝ තෙළෙස්දෙනය, අප්‍රාමාණ්‍යවර්ජිත තෙවිසි ශොභනචෛතසිකයෝ ද යන මේ) සතිස් ධර්මයෝ ද ලැබෙත්;–මහග්ගතචිත්තයෙහි (විරතිසම්භවයක් නැති හෙයින් අප්‍රාමාණ්‍යයන් බහාලා) පන්තිස් ධර්මකෙනෙකුන් උඩත්පිරිසෙයින් ලැබෙති;—කාමාවචරශොභනචිත්තයෙහි (අකුශලචෛතසිකවර්ජිතවූ අන්‍යසමානයන් තෙළෙස හා පස්විසි ශොභනචෛතසිකයෝ ද යන) අටතිස් ධර්මයෝ ම උත්කෘෂ්ටපක්ෂයෙන් ලැබෙති;—අකුශලචිත්තයෙහි (තෙළෙස් අන්‍යසමානයන තුදුස් චෛතසිකයහයි මෙසේ) සත්විසි ධර්මකෙනෙක් ලැබෙත්නාහ;—අටලොස් අහෙතුකචිත්තයෙහි (ඡන්දය වර්ජිත සෙසු) දොළොස් අන්‍යසමානයෝ ම ලැබෙත්නාහයි මෙසේ නියත–අනියතචෛතසිකයන් ලැබෙන ලැබෙනසේ යෙදීමෙන් ඒ චෛතසිකසඞ්ග්‍රහයෙහි නොහොත්—ලොකොත්තරාදි පඤ්චප්‍රකාරචිත්තයෙහි ඡත්තිංසාදිසඞ්ග්‍රහය පඤ්චප්‍රකාර වේ.

කෙසේද?—**ලොකොත්තරචිත්තයෙහි** වනාහි අෂ්ටප්‍රකාරප්‍රථමධ්‍යානික චිත්තයෙහි අන්‍යසමාන තෙළෙස් චෛතසිකයෝ ද අප්‍රාමාණ්‍යයන් වර්ජිතකොට ඇති තෙවිසි ශොභනචෛතසිකයෝද්‍යයි මෙසේ සතිස් ධර්මයෝ සඞ්ග්‍රහබවට පැමිණෙත්; එසේ ම අෂ්ටවිධවූ ද්විතීයධ්‍යානිකචිත්තයෙහි විතර්කය වර්ජිතකොට ඇති විචාරාදිවූ එම පන්තිස් ධර්මයෝ ද; එසේ ම අටවැදෑරුම්වූ තෘතීයධ්‍යානිකචිත්තයෙහි විතර්ක–විචාරවර්ජිතකොට ඇති ප්‍රීතිආදිවූ එම සූතිස් ධර්මයෝ ද; චතුර්ථධ්‍යානිකචිත්තයෙහි විතර්ක–විචාර–ප්‍රීතිය යන මොවුන් වර්ජිතකොට ඇති සුඛාදිවූ එම තෙතිස් ධර්මයෝ ද; පඤ්චමධ්‍යානිකචිත්තයෙහි විතර්ක–විචාර–ප්‍රීති–සුඛ යන මොවුන් වර්ජිතකොට ඇති උපෙක්ෂාසහගතවූ එම තෙතිස් ධර්මයෝ ම සඞ්ග්‍රහකරණුලැබෙත්නුයි; සර්වප්‍රකාරයෙන් ම අටලොවුතුරාසිත්හි පඤ්චකධ්‍යානපඤ්චකවශයෙන් සඞ්ග්‍රහය පඤ්චප්‍රකාර වන්නේයි. (කියනලදැයි.)

[ඡත්තිංස පඤ්චතිංසා'ථ චතුත්තිංස යථාක්කමං,
තෙත්තිංසද්වයමිච්චෙවං පඤ්චධා'නුත්තරෙ ඨිතා.]

ලොකොත්තරචිත්තයෙහි පිළිවෙළින් (ප්‍රථමධ්‍යානචිත්තයෙහි) ධර්මයෝ සතිසෙක (ද්විතීයධ්‍යානචිත්තයෙහි) පන්තිසෙක, නැවත (තෘතීයධ්‍යානචිත්තයෙහි) සූතිසෙක; චතුර්ථධ්‍යාන-පඤ්චමධ්‍යානවයෙහි) තෙතිස් දෙනෙකැයි, මෙසේ ලොකොත්තරචිත්තයෙහි සඞ්ග්‍රහයෝ පස්පරිද්දෙකින් සිටියාහුයි.

**මහග්ගතචිත්තයන්කෙරෙහි** වනාහි පළමුකොට කුසල-විපාක-ක්‍රියාවශයෙන් ත්‍රිවිධවූ ලෞකිකප්‍රථමධ්‍යානචිත්තයෙහි අන්‍යසමානවූ තෙළෙස් චෛතසිකයෝ ද, විරතිත්‍රයවර්ජිතවූ දෙවිසි සොභනචෛතසිකයෝදැයි, මේ පන්තිස් ධර්මයෝ සඞ්ග්‍රහබවට යෙත්;—මෙහි ශීලවිශුද්ධිවශයෙන් සුවිශොධිතවූ කාය-වාක්ප්‍රයොග ඇත්තාහුගේ හුදු චිත්තසමාධානමාත්‍රයෙන් ම මහග්ගත ධ්‍යානයෝ පවත්නාහ; කාය-වාක්කර්මයන්ගේ විශොධනවශයෙන් පවත්නාහුත් නොවෙති, දුශ්චරිත-දුරාජීවයන්ගේ සමුච්ඡෙදවශයෙන් ද නොපවතිත්නුයි "විරතිත්‍රයවර්ජිතවූ" යි කියනලද්; මේ මහග්ගතචිත්තයෙහි වනාහි කරුණා-මුදිතා දෙදෙන වෙන වෙන යෙදියයුත්තාහුයි;—එසේ ම කුශලාදිවශයෙන් ත්‍රිවිධවූ ද්විතීයධ්‍යානචිත්තයෙහි විතර්කවර්ජිතවූ සූතිස් ධර්මයෝ සඞ්ග්‍රහබවට යෙත්;—එසේ ම කුශලාදිවශයෙන් ත්‍රිවිධවූ තෘතීයධ්‍යානචිත්තයෙහි විතර්ක-විචාර දෙදෙනා වර්ජිතකොට ඇති තෙතිස් ධර්මයෝ සඞ්ග්‍රහබවට යෙත්;—එසේ ම ත්‍රිවිධවූ චතුර්ථධ්‍යානචිත්තයෙහි විතර්ක-විචාර-ප්‍රීතිය යන මොවුන් වර්ජිතකොට ඇති තෙතිස් ධර්මයෝ සඞ්ග්‍රහබවට යෙත්;—උපෙක්ෂා-චිත්තෙකාග්‍රතාවශයෙන් අභිසමිත්වයෙන් රූපාවචරධ්‍යාන තුන හා අරූපාවචරධ්‍යාන දොළසය යන මේ පසළොස් පඤ්චමධ්‍යානචිත්තයෙහි වනාහි (කරුණා-මුදිතාවන් තමන් සොමනස්සසහගතචිත්තයෙහිම වනහෙයින්) අප්‍රමාණ්‍යයෝ ද නොලැබෙත්නුයි; සර්වප්‍රකාරයෙන් ම රූපාරූපාවචරවූ සත්විසි මහග්ගතචිත්තයෙහි විතර්ක-විචාරදෙදෙනා වෙන වෙන අතික්‍රමණය කොට භාවනා කරන්නාවූ මන්දබුද්ධීහුගේ වශයෙන් දෙසනලද ධ්‍යානපඤ්චකවශයෙන් සඞ්ග්‍රහය පඤ්චප්‍රකාර වේ;—මෙහි විතර්ක-විචාර දෙදෙනා එක්කොට ඉක්මවා භාවනා කරන්නාවූ තීක්ෂණබුද්ධි ඇත්තාහුගේ වශයෙන් දෙසනලද ධ්‍යානචතුෂ්කවශයෙන් විතර්ක-විචාරදෙදෙනාගේ සම්භවයක් නැතිහෙයින් සඞ්ග්‍රහය චතුර්විධ ම වන්නේය; යනු අභිප්‍රායයි.

(කියනලදමැයි.)

[පඤ්චතිංස චතුත්තිංස තෙත්තිංස ච යථාක්කමං,
බාත්තිංස චෙව තිංසෙ'ති පඤ්චධා'ව මහග්ගතෙ.]

මහග්ගතචිත්තයෙහි පිළිවෙළින් ප්‍රථමධ්‍යානත්‍රිකයෙහි පන්තිසෙක් ද, ද්විතීයධ්‍යානත්‍රිකයෙහි සූතිසෙක් ද, තෘතීයධ්‍යානත්‍රිකයෙහි තෙතිසෙක් ද, චතුර්ථධ්‍යානත්‍රිකයෙහි දෙතිසෙක් ද, පසළොස් පඤ්චමධ්‍යානයෙහි තිසෙක්දැයි, සඞ්ග්‍රහය පඤ්චප්‍රකාර ම වේ.

**සූවිසි කාමාවචරසොභනචිත්තයන්කෙරෙහි** වනාහි කුසලයන්කෙරෙහි ප්‍රථමචිත්තද්වයෙහි වනාහි අන්‍යසමානවූ තෙළෙස් චෛතසිකයෝ ද පස්විසි සොභනචෛතසිකයෝදැයි, මේ අටතිස් ධර්මයෝ සඞ්ග්‍රහබවට පැමිණෙත්;—මේකුසලයන්කෙරෙහි වනාහි කරුණා-මුදිතා දෙදෙන ද, විරතිහු තුන්දෙන ද, යන පස්දෙන වෙන වෙන ම යෙදියයුත්තාහුයි; මෙහි අප්‍රමාණ්‍යයන් සත්වාලම්බනිකහෙයින් ද විරතීන් තමන් ව්‍යතික්‍රම කටයුතු වස්තු විෂය කොට ඇතිහෙයින් ද උන්පස්දෙනාගේ සම්භවය එකචිත්තයෙක්හි ද නොවන්නේයි;—ද්විතීයචිත්තවයෙහි ඥානවර්ජිතවූ එම සත්තිස් ධර්මයෝ එසේ ම

සඞ්ග්‍රහබවට පැමිණෙත්;—තෘතීයචිත්තමයෙහි ඥානසම්ප්‍රයුක්තවූ ප්‍රීතිවර්ජිතවූ එම සත්තිස් ධර්මයෝ එසේ ම සඞ්ග්‍රහබවට පැමිණෙත්;—චතුර්ථචිත්තමයෙහි ඥාන-ප්‍රීතිවර්ජිතවූ එම සත්තිස් ධර්මයෝ ම සඞ්ග්‍රහ කරණුලැබෙත්;—ක්‍රියා චිත්තයන්කෙරෙහිදු විරතිවර්ජිතවූ පන්තිස් චෛතසිකයෝ එසේ ම (කාමාව චරකුසලචිත්තයෙහි මෙන්) සතර ස්ථානයෙහි ම සතරපරිද්දෙකින් සඞ්ග්‍රහබවට යෙත්;—මෙහි ලෞකිකවිරතීන්ගේ ඒකාන්තකුශලස්වභාවහෙයින් අව්‍යාකෘ තයන්කෙරෙහි සම්භවයෙක් නැතිනුයි “විරතිවර්ජිතවූ”යි කියනලදී; එහෙයි න් ම බුදුන්විසින් “පච සික්ඛාපදා කුසලා”යි කියා වදාරණලදී;—එසේ ම විපාක යන්කෙරෙහිදු අප්‍රාමාණ්‍යයන් හා විරතීන් වර්ජිතකොට ඇති එම තෙතිස් චෛතසිකයෝ සඞ්ග්‍රහ කරණුලැබෙත්නුයි සර්වප්‍රකාරයෙන් කුශල-විපාක-ක්‍රි යාවශයෙන් සුවිසි කාමාවචරචිත්තයන්කෙරෙහි ම යුගමවශයෙන් සඞ්ග්‍රහය දොළොස්වැදෑරුම් වන්නේයි, හෙවත්—කුශල-විපාක-ක්‍රියාවන් අතුරෙහි එකෙක්හි ම සතර සතර යුගමයක් බැගින් දොළොස් ප්‍රභෙද වෙත්;—මෙහි කාමාවචරවිපාකචිත්තයන්ගේ ඒකාන්තපරීත්තාලම්බනබවහෙයින් විරතීන් ගේ ද අප්‍රාමාණ්‍යයන්ගේ සත්ත්වාලම්බනබව හෙයින් ද ඒකාන්තකුසලබවහෙ යින් ද “අප්‍රාමාණ්‍ය-විරතිවර්ජිත”යයි කියනලදී.—(කියනලදමැයි.)

[අට්ඨතිංස සත්තතිංසද්වයං ඡත්තිංසකං සුභෙ,
පඤ්චතිංස චතුත්තිංසද්වයං තෙත්තිංසකං ක්‍රියෙ
තෙත්තිංස පාකෙ බත්තිංසද්වයේ'කත්තිංසකං භවෙ,
සහෙතුකාමාවචරපුඤ්ඤ-පාක-ක්‍රියාමනෙ.]

සහෙතුකකාමාවචරකුසල-විපාක-ක්‍රියාචිත්තයන්අතුරෙහි කාමාවචරකුශ ලචිත්තයෙහි ප්‍රථමචිත්තමයෙහි චෛතසිකයෝ අටතිසෙක් වෙති; ද්විතීය-තෘතීයචිත්තයුගමදෙක්හි සත්තිස්දෙකෙක් වන්නේය; චතුර්ථචිත්තයුගම යෙහි සතිසෙක් වන්නේයි;—ක්‍රියා චිත්තයෙහි ප්‍රථමචිත්තමයෙහි චෛතසික යෝ පංතිසෙක් වෙති; ද්විතීය-තෘතීයයුගමදෙක්හි සූතිස්දෙකෙක් වන්නේය; චතුර්ථචිත්තයුගමයෙහි චෛතසිකයෝ තෙතිසෙක් වන්නේය;—විපාක චිත්තයෙහි ප්‍රථමචිත්තයුගමයෙහි චෛතසිකයෝ තෙතිසෙක් වෙති; ද්විතීය-තෘතීයචිත්තයුගමමයෙහි දෙතිස්දෙකෙක් වන්නේය; චතුර්ථචිත්ත මයෙහි එක්තිසෙක් වන්නේයි.

[නවිජ්ජන්ත'ත්ථ විරතී ක්‍රියාසු ච මහග්ගතෙ,
අනුත්තරෙ අප්පමඤ්ඤා කාමපාකෙ ද්වයං තථා.
අනුත්තරෙ ඣානධම්මා අප්පමඤ්ඤා ච මජ්ඣිමෙ,
විරතී ඤාණ-පීති ච පරිත්තෙසු විසෙසකා.]

මේ චෛතසිකයන් අතුරෙහි නොහොත්-කාමාවචරාදි සොභනචිත්ත යන් අතුරෙහි ක්‍රියාවන්කෙරෙහි ද ධ්‍යානචිත්තයෙහි ද විරතිහු නොවත් නාහ; හෙවත්-නූපදනාහ;—මෙහි කෙලශයන් උපදත්හොත් උපදනට නිසි ශෛක්ෂපෘථග්ජනයන්ට ම පාපයෙන් විරමණය සම්භව වනහෙයින් ඔවුන්ට උපදනා කුසලචිත්තය විරතියුක්තවත් මුත් කෙලෙස්මුල් සුන් රහත්නට සර් කෙලශයන් සිඳපීහෙයින් විරති නොඋපදනාබැවින් ක්‍රියාචිත්තයෙහි විරති සම්භවය නොවෙයි දතයුතු; මිථ්‍යාකර්මාන්තාදීන්ගේ ව්‍යතික්‍රමාවස්ථාව හා අනුශයාවස්ථාව මුත් පර්‍ය්‍යුත්ථානාවස්ථාව අප්‍රකට හෙයින් මිථ්‍යාකර්මා

න්නාදීන්ට ප්‍රතිපක්‍ෂවූ සම්‍යක්කර්මාන්තාදීහු ව්‍යතික්‍රමාවස්ථාවට ප්‍රතිපක්‍ෂවූ කාමාවචරකුශලයන්කෙරෙහි ද අනුශයාවස්ථාවට ප්‍රතිපක්‍ෂවූ ලොකොත්තරයන්කෙරෙහි ද උපදිති, පර්‍ය්‍යුත්ථානාවස්ථාවක් නැතිහෙයින් මහද්ගතයන්කෙරෙහි නොඋපදිති යි දතයුතු;—ලොකොත්තරචිත්තයෙහි කරුණා-මුදිතාවෝ භින්නාලම්බනහෙයින් නොඋපදිනාහ; කාමාවචරවිපාකයෙහි විරතිය අප්‍රාමාණ්‍යය යන මේ දෙක එසේ ම නොඋපදනේයි.

ලොකොත්තරචිත්තයෙහි විතර්ක්‍ක-විචාරාදිවූ ධ්‍යානධර්‍මයෝ ප්‍රථමධ්‍යානාදිවශයෙන් වෙනස් කරන්නාහ; මහද්ගතචිත්තයෙහි කරුණා-මුදිතාවෝ ද විතර්ක්කාදිවූ ධ්‍යානධර්‍මයෝ ද වෙනස් කරන්නාහ; ("අප්පමඤ්ඤා, ච" යන්නෙහි "ච" ශබ්දය "ඣානධම්මා" යනු සඞ්ග්‍රහ කෙරේ;) මෙහි කරුණා-මුදිතාවෝ ප්‍රථමධ්‍යානාදි ධ්‍යානචතුෂ්කයෙහි වෙනස කෙරෙති, විතර්ක්කාදි ධ්‍යානධර්‍මයෝ ප්‍රථමධ්‍යානාදි ධ්‍යානපඤ්චකයෙහි වෙනස කරන්නාහුයි;—කාමාවචරකුශල-විපාක-ක්‍රියාවන් අතුරෙහි විරතීහු ද ඥාන-ප්‍රීතිය යන මොහු ද "ච" ශබ්දයෙන් අප්‍රාමාණ්‍යයෝ ද වෙනස කරන්නාහුයි;—මෙහි විරතීහු කාමාවචරකුශලයන්කෙරෙන් කාමාවචරවිපාක-ක්‍රියාවන්ගේ වෙනස කෙරෙති, කරුණා-මුදිතාවෝ කුශල-ක්‍රියාවන්කෙරෙන් විපාකයන්ගේ වෙනස කෙරෙති, ඥාන-ප්‍රීතිදෙක වනාහි කුශල-විපාක-ක්‍රියාචිත්තයෙහි ප්‍රථමචිත්තයුගමාදීන්කෙරෙන් ද්විතීයචිත්තයුගලාදීන්ගේ වෙනස කරන්නෝ යයි දතයුතු

**අකුශලචිත්තයෙහි** වනාහි ලොභමූලිකචිත්තයන් අතුරෙහි ප්‍රථම අසංස්කාරිකචිත්තයෙහි වනාහි අන්‍යසමාන තෙළෙස් චෛතසිකයෝ ද මොහාදිවූ අකුශලසාධාරණචෛතසිකයෝ සතරදෙන ද යන සතළොස් දෙන ලොභ-දෘෂ්ටිදෙදෙනා හා සමග මේ එකුන්විසි ධර්‍මයෝ සඞ්ග්‍රහබවට පැමිණෙත්;—දෙවනවූ දෘෂ්ටිප්‍රයුක්ත අසංස්කාරිකචිත්තයෙහි ලොභ-මානය හා සමග එසේ ම එකුන්විසි ධර්‍මයෝ සඞ්ග්‍රහබවට පැමිණෙත්;—තුන්වෙනිවූ උපෙක්‍ෂාසහගතදෘෂ්ටිසම්ප්‍රයුක්ත අසංස්කාරිකචිත්තයෙහි ප්‍රීතිය වර්ජිතකොට ඇති (අන්‍යසමානයෝ දොළොස්දෙනය අකුශලසාධාරණයෝ සතරදෙනය යන සොළොස්දෙන ලොභ-දෘෂ්ටිය හා සමග) මේ චෛතසිකයෝ අටළොස් දෙන එසේ ම සඞ්ග්‍රහබවට පැමිණෙත්;—සතරවන දෘෂ්ටිවිප්‍රයුක්ත අසංස්කාරිකචිත්තයෙහි ලොභ-මානය හා සමග එසේ ම ප්‍රීතිවර්ජිතවූ එම අටළොස් චෛතසිකයෝ සඞ්ග්‍රහබවට පැමිණෙත්;—පස්වනවූ ප්‍රතිඝසම්ප්‍රයුක්තවූ අසංස්කාරිකචිත්තයෙහි වනාහි ද්වේෂය ද, ඊර්ෂ්‍යාව ද, මාත්සර්‍ය්‍යය ද, කෞකෘත්‍යය ද, යන මේ සතරදෙනා හා සමග ප්‍රීතිය වර්ජිතකොට ඇති අන්‍යසමාන දොළසය අකුශලසාධාරණ සතර ද යන එම චෛතසිකධර්‍මයෝ විස්ස සඞ්ග්‍රහ කරණුලැබෙත්;—මේ ප්‍රතිඝසම්ප්‍රයුක්තවූ චිත්තයෙහි ඊර්ෂ්‍යා-මාත්සර්‍ය්‍ය-කෞකෘත්‍ය යන මොහු වනාහි භින්නාලම්බනබවක් හෙයින් වෙන වෙන ම යෙදියයුක්තාහුයි;—සසංස්කාරිකපඤ්චකයෙහි ද එසේ ම (යට කී පරිද්දෙන් ම) ස්ත්‍යාන-මිද්ධය හා වෙසෙසා යෙදියයුත්තේයි;—ඖද්ධත්‍යසහගතචිත්තයෙහි ඡන්ද-ප්‍රීතිවර්ජිතවූ අන්‍යසමානයෝ වනාහි එකොළොස්දෙන ද අකුශලසාධාරණයෝ සතරදෙන දැයි පසළොස් ධර්‍මයෝ සම්ප්‍රයොගබවට පැමිණෙත්;—විචිකිච්ඡාසහගතචිත්තයෙහි ද අධිමොක්‍ෂවිරහිත විචිකිත්සාසහිතවූ යටකීයනලද පසළොස් ධර්‍මයෝ එසේ ම ලැබෙත්;—මෙහි අධිමොක්‍ෂයා

නමා නිශ්චයාකාරයෙන් පවත්නාහෙයින් මෙළහකාවූ ස්වභාව ඇති විචිකිච්ඡාචිත්තයෙහි සම්භවයක් නැත්නුයි “අධිමොක්ෂවිරහිත” යි කියනලදි;—මෙසේ සර්වප්‍රකාරයෙන් ම දොළොස් අකුශලචිත්තොත්පාදයෙහි වෙන වෙන යෙදෙනුලබන්නාවූ චෛතසිකයෝ සංඛ්‍යාවශයෙන් සත්පරිච්ඡෙදකින් ම සඞ්ග්‍රහ කරණලද්දහු වෙත්—(කියනලදමැයි.)

[එකූනවීස'ට්ඨාරස වීසෙ'කවීස වීසති,
වෙවීස පණ්ණරසෙ'ති සත්තධා'කුසලෙ ඨිතා.
සාධාරණා ච චත්තාරො සමානා ච තථා'පරෙ,
චුද්දසෙ'තෙ පවුච්චන්ති සබ්බා'කුසලයොගිනො.]

අකුශලචිත්තයෙහි ප්‍රථම–ද්විතීයඅසංස්කාරිකචිත්තද්වයෙහි චෛතසිකයෝ ප්‍රත්‍යෙකයෙන් එකුන්විස්සෙක, තෘතීය–චතුර්ථඅසංස්කාරිකචිත්තද්වයෙහි වෙන වෙන අටළොසෙක, පස්වන අසංස්කාරිකචිත්තයෙහි විස්සෙක, ප්‍රථම–ද්විතීය සසංස්කාරිකචිත්තද්වයෙහි ප්‍රත්‍යෙකයෙන් එක්විස්සෙක, තෘතීය–චතුර්ථසසංස්කාරිකචිත්තද්වයෙහි ප්‍රත්‍යෙකයෙන් විස්සෙක, පස්වන සසංස්කාරිකචිත්තයෙහි දෙවිස්සෙක, මොමූහචිත්තද්වයෙහි ප්‍රත්‍යෙකයෙන් පසළොසක්‍යැයි, මෙසේ සත්පරිච්ඡෙදකින් සිටියාහුයි.

සර්වාකුශලසාධාරණවූ මොහාදි සතරදෙන ද අන්‍යසමානවූ ඡන්ද–ප්‍රීති–අධිමොක්ෂවර්ජිතවූ අනික් දසදෙන දූයි මේ තුදුස් ධර්මයෝ සර්වාකුශලයොගිහයි කියනුලැබෙත්.

**අටළොස්අහෙතුකයන්කෙරෙහි** වනාහි පළමුකොට හසිතොත්පාදචිත්තයෙහි ඡන්දවර්ජිතවූ අන්‍යසමානවූ දොළොස් ධර්මයෝ සඞ්ග්‍රහයට යෙත්;—ව්‍යවස්ථාපනචිත්තයෙහි ඡන්ද–ප්‍රීතිවර්ජිතවූ එසේ ම අන්‍යසමානවූ එකොළොස් ධර්මයෝ සඞ්ග්‍රහයට පැමිණෙත්;—සොමනස්සසන්තීරණයෙහි ඡන්ද–වීර්‍ය්‍යවර්ජිතවූ එම එකොළොස් ධර්මයෝ ද මනොවිඥානධාතුහුගේ මෙන් විශිෂ්ටවූ මනනකෘත්‍යය හා යොගයක් නැතිහෙයින් හුදු මනනමාත්‍රධාතුවූ මනොධාතුත්‍රිකයෙහි උපෙක්ෂා–සන්තීරණද්වයෙහි ඡන්ද–ප්‍රීති–වීර්‍ය්‍යවර්ජිතවූ එම ධර්මයෝ ද දෙපස් විඥානයෙහි ප්‍රකීර්ණකයන් විවර්ජිතකොට ඇති එව ධර්මයෝ ම සඞ්ග්‍රහ කරණුලැබෙත්;—මෙසේ සර්වප්‍රකාරයෙන් ම අටළොස් අහෙතුකචිත්තයෙහි සංඛ්‍යාවශයෙන් චෛතසිකසඞ්ග්‍රහය චතුර්විධ ම වන්නේයි—(කියනලදමැයි.)

[ද්වාදසෙ'කාදස දස සත්ත චා'ති චතුබ්බිධො,
අට්ඨාරසා'හෙතුකෙසු චිත්තුප්පාදෙසු සඞ්ගහො.]

අටළොස් අහෙතුකචිත්තයෙහි චෛතසිකසඞ්ග්‍රහය හසිතොත්පාදචිත්තයෙහි දොළසෙක, ව්‍යවස්ථාපන–සෞමනස්‍යසන්තීරණචිත්තද්වයෙහි ප්‍රත්‍යෙකයෙන් එකොළොසෙක, මනොධාතුත්‍රිකඅහෙතුකප්‍රතිසන්ධියුගලවශයෙන් පස් සිතෙහි ප්‍රත්‍යෙකයෙන් දසයෙක, දෙපස්විඥානයෙහි ප්‍රත්‍යෙකයෙන් සතෙක්‍යැයි මෙසේ චතුර්විධ වන්නේයි.

[අහෙතුකෙසු සබ්බත්ථ සත්ත සෙසා යථාරහං,
ඉති විත්ථාරතො වුත්තා තෙත්තිංසවිධසඞ්ගහා.]

සියලු අහෙතුකචිත්තයන්කෙරෙහි ස්පර්ශාදි සර්වචිත්තසාධාරණවූ චෛතසිකයෝ සත්දෙන නියතයෙන් ම වෙති, ඔවුන්කෙරෙන් ඊටත් සෙසු ප්‍රකී

ණ්ණකයෝ සුදුසුපරිද්දෙන් වෙති, අනුත්තර-මහග්ගතයන්හි පස පස බැගින් සඞ්ග්‍රහය දසයෙක, කාමාවචරකුශල-විපාක-ක්‍රියාවන් කෙරෙහි වෙන වෙන සඞ්ග්‍රහය සතර සතර බැගින් දොළොසෙක, අකුශලයන් කෙරෙහි සඞ්ග්‍රහය සතෙක, අහේතුකයන් කෙරෙහි සඞ්ග්‍රහය සතරෙකැයි, මෙසේ විස්තර හෙයින් තෙතිස් ප්‍රකාර සඞ්ග්‍රහයෝ කියනලද්දහුයි.

මෙසේ යථොක්තක්‍රමයෙන් චෛතසිකයන්ගේ ස්පර්ශාදීන් අතුරෙහි වේ ධර්මයතෙමේ මෙතෙක් චිත්තයෙහි උපදනේයයි චිත්තපරිච්ඡෙදවශයෙන් කියනලද සම්ප්‍රයොගය ද වේ චිත්තයෙහි මෙතෙක් චෛතසිකයෝ වෙතියි චෛතසිකරාශිපරිච්ඡෙදවශයෙන් ම කියනලද්දවූ සඞ්ග්‍රහය ද දැන සබ්බචිත්තසාධාරණවූ ස්පර්ශාදිවූ චෛතසිකයෝ සත්දෙන සියලු එකුනනවුතිචිත්තයෙහි උපදනාහෙයින් වෙන වෙන එකුනනවතිප්‍රභෙද වෙති, ප්‍රකීර්ණකයන් කෙරෙහි විතර්කය පස්පණස් චිත්තයෙහි උපදනාහෙයින් පස්පණස්වැදෑරුම් වෙයි, යනාදීන් යෙදෙන යෙදෙන පරිද්දෙන් චිත්තය හා සමවූ චෛතසිකප්‍රභෙදය කියන්නේයි.

(චෛතසිකසඞ්ග්‍රහවිභාගනම්වූ ද්විතීයපරිච්ඡෙදය නිමි.)

දැන් යථොක්තවූ චිත්ත-චෛතසිකයන්ගේ වෙදනාදී විභාගහෙයින් ද ඒ ඒ වෙදනාදි වශයෙන් භින්නවූ චිත්තවිභාගවශයෙන් ද ප්‍රකීර්ණකසඞ්ග්‍රහය දක්වනුපිණිස "සම්පයුත්තා යථායොගං" යනාදීන් පටන්ගන්නාලදී.

[සම්පයුත්තා යථායොගං තෙපඤ්ඤාස සභාවතො,
චිත්තචෙතසිකා ධම්මා තෙසං 'දානි යථාරහං.
වෙදනා-හෙතුතො කිච්ච-ද්වාරාලම්බන-වත්ථුතො,
චිත්තුප්පාදවසෙනෙ'ව සඞ්ගහො නාම නීයතෙ.]

(ඒ ඒ චිත්තයෙහි) යෙදෙන යෙදෙන පරිද්දෙන් (එකොත්පාදාදිභාවයෙන්) සම්ප්‍රයුක්තවූ චිත්ත-චෛතසිකධර්මයෝ (එකුනනවුති වැදෑරුම්වූ චිත්තය තෙම ආලම්බනවිජානනස්වභාව සාමාන්‍යයෙන් එකවිධ වෙයි, සබ්බචිත්තසාධාරණවූ ස්පර්ශයතෙම ස්පර්ශනස්වභාවයෙන් එකවිධ වෙයි, යනාදිවූ තමතමන්ගේ) ස්වභාවවශයෙන් තෙපණසෙක් වෙති, දැන් ඒ තෙපණස් ධර්මයන්ගේ සුදුසුපරිද්දෙන් සුඛාදිවූ වෙදනාවිභාගහෙයින් ද, ප්‍රතිසන්ධ්‍යාදි කෘත්‍යවිභාගහෙයින් ද, චක්ෂුර්ද්වාරාදි ද්වාරවිභාගහෙයින් ද, රූපාදි ආලම්බනවිභාගහෙයින් ද, චක්ෂුඃප්‍රසාදාදි වස්තුවිභාගහෙයින් ද, වෙදනාදි හෙයින් නානාප්‍රකාරව පැවැති හෙයින් ප්‍රකීර්ණකසඞ්ග්‍රහනම්වූ සඞ්ග්‍රහය ඒ ඒ වෙදනාදි භෙදභින්න චතුස්කන්ධසඞ්ඛ්‍යාත චිත්තොත්පාදයන්ගේ වශයෙන් ම එලවනුලැබේ; කියනුලැබෙයි සේයි.

ෂඩ්විධවූ සඞ්ග්‍රහයන් අතුරෙන් **වෙදනාසඞ්ග්‍රහයෙහි** වනාහි;—වෙදනා තොමෝ සුඛවෙදනායයි ද, දුඃඛවෙදනායයි ද, උපෙක්ෂාවෙදනායයි කියා ද ත්‍රිවිධ වන්නීය.

ඉෂ්ටස්ප්‍රෂ්ටව්‍යානුභවනලක්ෂණවූ කායිකසුඛවෙදනාව ද, අනිෂ්ටස්ප්‍රෂ්ටව්‍යානුභවනලක්ෂණවූ කායිකදුඃඛවෙදනාව ද, ස්වභාව හෙයින් හෝ පරිකල්පනා හෙයින් හෝ ඉෂ්ටානුභවනලක්ෂණවූ මානසිකසුඛවෙදනාව ද, එසේ ම ස්වභාව හෙයින් හෝ පරිකල්පනා හෙයින් හෝ අනිෂ්ටානුභවනලක්ෂණවූ මානසිකදුඃඛවෙදනාව ද, මධ්‍යස්ථානුභවනලක්ෂණවූ උපෙක්ෂාවෙදනාව දැයි, කියා ප්‍රභෙදහෙයින් පඤ්චප්‍රකාර වේ

ඒ පඤ්චප්‍රකාරවූ වෙදනාවන් අතුරෙහි සුඛසහගතවූ කුසලවිපාකවූ කායවිඤ්ඤාණය එකෙක් මය; දුක්ඛසහගතවූ අකුසලවිපාකවූ කායවිඤ්ඤාණය එසේම එකෙක් මැයි; සොම්නස් වෙදනාසම්ප්‍රයුක්තචිත්තයෝ වනාහි ලොභමූලික චිත්තයෝ සතරදෙනය; කුශල-විපාක-ක්‍රියාවශයෙන් කාමාවචරසොභනචිත්තයෝ දොළොස්දෙනය, සොමනස්සසන්තීරණ-හසනචිත්තය යන මොහු දෙදෙන දැයි, මේ අටළොස් කාමාවචරචිත්තයෝ ද ප්‍රථමධ්‍යාන-ද්විතීයධ්‍යාන-තෘතීයධ්‍යාන-චතුර්ථධ්‍යාන සංඛ්‍යාතවූ ලෞකික-ලොකොත්තරභෙදභෙයින් එකොළොස්ධ්‍යානය ඒකාදසවිධ වනහෙයින් සූසාළිස් මහග්ගත-ලොකොත්තර චිත්තයෝ දැයි දෙසැටවැදෑරුම් වෙත්;—දොම්නස්සහගතවූ චිත්තයෝ ප්‍රතිඝ චිත්තයෝ දෙදෙන මැයි; සොමනස්සසහගතයන් කෙරෙන් අවශිෂ්ටවූ අකුශලයන්කෙරෙන් සදෙනය, අහෙතුකයන්කෙරෙන් තුදුසය, කාමාවචරසොභනයන්කෙරෙන් දොළසය, පඤ්චමධ්‍යාන තෙවිස්සයයි, මේ සියලු පස්පණස් චිත්තයෝ උපෙක්ෂාසහගතචිත්තයෝ මැයි—(කියනලදමැයි.)

[සුඛං දුක්ඛමුපෙක්ඛාති තිවිධා තත්‍ථ වෙදනා,
සොමනස්සං දොමනස්සමිති භෙදෙන පඤ්චධා.]

ඒ වෙදනා සඞ්ග්‍රහයෙහි වෙදනාවෝ සුඛවෙදනාය දුක්ඛවෙදනාය උපෙක්ෂාවෙදනායයි කියා ත්‍රිප්‍රකාර වන්නාහ; නැවත ප්‍රභෙදභෙයින් සොම්නස් වෙදනාය දොම්නස්සවෙදනායයි (මේදෙදෙන සමග) පඤ්චප්‍රකාර වන්නාහුයි දැන් ඒ පඤ්චප්‍රකාරවූ වෙදනාවන් කියා උන් උපදනා චිත්තසංඛ්‍යාව කියන්නාහු "සුඛමෙකත්‍ථ" යනාදි කියත්.

[සුඛමෙකත්‍ථ දුක්ඛං ච දොමනස්සං පටිඝෙ ඨිතං,
ද්වාසට්ඨිසු සොමනස්සං පඤ්චපඤ්ඤාසකෙ'තරා.]

සුඛයතෙම එක කුසලවිපාකකායවිඤ්ඤාණයෙහි ම සිටියේය, හෙවත් උපදනේය;—දුඃඛවෙදනාව ද එක අකුසලවිපාකකායවිඤ්ඤාණයෙහි ම සිටියේය; දොම්නස්තෙම ප්‍රතිඝචිත්තවයෙහි සිටියේය;—සොම්නස්තෙම දෙසැටචිත්තයෙහි සිටියේය;—උපෙක්ෂාවෙදනාතොම පස්පණස් චිත්තයෙහි සිටියාය, හෙවත් වන්නීය.

**හෙතුසඞ්ග්‍රහයෙහි**,—හෙතුහු නම් ලොභය ද, ද්වේෂය ද, මොහය ද, අලොභය ද, අද්වේෂය ද, අමොහය දැයි, ෂට්ප්‍රකාර වෙත්;—මෙහි හෙතුබව නම් ඒ සම්ප්‍රයුක්තධර්මයන්ගේ සුප්‍රතිෂ්ඨිතභාවසාධනසංඛ්‍යාතවූ මූලභාවයයි; ලබ්ධමානහෙතු-ප්‍රත්‍යයඇති ධර්මයෝ හටගත්තාවූ මුල්ඇති පාදපයන් මෙන් ස්ථිර වන්නාහ; ජලතලයෙහි ශෛවාලසදෘශවූ අහෙතුකයන් මෙන් අස්ථිර නොවන්නාහ; එසේහෙයින් ඒ හෙතු මූලසදෘශහෙයින් මූලයයි කියා ද කියනු ලැබෙත්.

ඒ ෂඩ්විධවූ හෙතුන් අතුරෙහි පඤ්චද්වාරාවර්ජනය, දෙපස් විඤ්ඤාණයහ, සම්ප්‍රතීච්ඡනය, සන්තීරණත්‍රයය, ව්‍යවස්ථාපනය, හසිතොත්පාදය; යන මොවුන්ගේ වශයෙන් අටළොස්දෙන අහෙතුකචිත්තයෝ නම් වෙත්;—සෙසු සියලු එක්සැත්තෑ චිත්තයෝ සහෙතුකයෝ මැයි;—ඒ සහෙතුකයන්කෙරෙහි දු මොමූහචිත්තයෝ දෙදෙන එකහෙතුකයහයි, අවශෙෂවූ දශඅකුශලචිත්තයෝ ද ඥානවිප්‍රයුක්තවූ ද්වාදසකාමාවචරසොභනචිත්තයෝ දැයි මේදෙවිසි චිත්තයෝ ද්විහෙතුකචිත්තනම් වෙත්;—කුශල-විපාක-ක්‍රියාවශයෙන් ද්වාද

ශවිධ ඥානසම්ප්‍රයුක්තකාමාවචරශෝභනචිත්තයෝ ද පන්තිස් මහද්ගත-ලොකොත්තරචිත්තයෝ දැයි මේ සත්සාළිස්දෙන තිහෙතුකචිත්තයෝ නම් වෙත්.

දැන් හෙතූන් දෙදෙනාගේ ජාතිභේද දක්වනපිණිස "ලොභො දොසො ච මොහො ච" යනාදි කියනලදි.

[ලොභො දොසො ච මොහො ච හෙතු අකුසලා තයො,
අලො'භා' දොසා'මොහා ච කුසලා 'ව්‍යාකතා තථා.]

ලොභය ද, ද්වේෂය ද, මොහය ද, යන තුන්දෙන අකුසලහෙතූහු; අලොභ-අද්වේෂ-අමොහ යන මොහු තුන්දෙන එසේ ම කුශල-අව්‍යාකෘතහෙතූහුයි.

[අහෙතුකා'ට්ඨාරසෙ' කහෙතුකා වෙ ද්විසති,
ද්විහෙතුකා මතා සත්තචත්තාළීස තිහෙතුකා.]

අහෙතුකචිත්තයෝ අටළොසෙක් දන්නාලදහ; එකහෙතුකචිත්තයෝ දෙදෙනෙක් දන්නාලදහ; ද්විහෙතුකචිත්තයෝ දෙවිස්සෙක් දන්නාලදහ; තිහෙතුකචිත්තයෝ සත්සාළිස්දෙනෙක් දන්නාලදහු.

**කෘත්‍යසඞ්ග්‍රහයෙහි**,—කෘත්‍යයෝ නම් ප්‍රතිසන්ධිකෘත්‍යය, භවාඞ්ගකෘත්‍යය, ආවර්ජනකෘත්‍යය, දර්ශනකෘත්‍යය, ශ්‍රවණකෘත්‍යය, ආඝ්‍රාණකෘත්‍යය, රසාස්වාදකෘත්‍යය, ස්පර්ශනකෘත්‍යය, සම්ප්‍රත්‍යෙෂණකෘත්‍යය, සන්තීරණකෘත්‍යය, ව්‍යවස්ථාපනකෘත්‍යය, ජවනකෘත්‍යය, තදාලම්බනකෘත්‍යය, ච්‍යුතිකෘත්‍යය යන මොවුන්ගේ වශයෙන් තුදුස්ප්‍රකාරවෙත්.;—මෙහි—

1—භවයෙන් භවයාගේ ප්‍රතිසන්ධානය ගැළපීම **ප්‍රතිසන්ධිකෘත්‍ය** නම් වෙයි;

2—භවයාගේ අවිච්ඡේදප්‍රවෘත්තියට හෙතුභාවය **භවාඞ්ගකෘත්‍ය** නම් වෙයි;

3—අරමුණට සිත යොමු කිරීම **ආවර්ජනකෘත්‍ය** නම් වෙයි;

4—රූපදර්ශනය **දර්ශනකෘත්‍ය** නම් වෙයි;

5—ශබ්දශ්‍රවණය **ශ්‍රවණකෘත්‍ය** නම් වෙයි;

6—ගන්ධාඝ්‍රාණය තෙම **ඝ්‍රාණකෘත්‍ය** නම් වෙයි;

7—රසාස්වාදයතෙම **සායනකෘත්‍ය** නම් වෙයි;

8—ස්ප්‍රෂ්ටව්‍යස්පර්ශනය **ස්පර්ශනකෘත්‍ය** නම් වෙයි;

9—රූපාදි ප්‍රතිග්‍රහණය **සම්ප්‍රත්‍යෙෂණකෘත්‍ය** නම් වෙයි;

10—රූපාදීන්ගේ මනාකොට තීරණය **සන්තීරණකෘත්‍ය** නම් වෙයි;

11—සන්තීරණයාගේ නිශ්චය කිරීම **ව්‍යවස්ථාපනකෘත්‍ය** නම් වෙයි;

12—ආලම්බනයෙහි ඒ ඒ කෘත්‍යසාධනවශයෙන් නොයෙක් වාරයෙහි හෝ එකවාරයක හෝ දිවන්නාහුගේ මෙන් ප්‍රවෘත්තිය **ජවනකෘත්‍ය** නම් වෙයි;

13—ඒ ඒ ජවනයන්විසින් ගන්නාලද ආලම්බනය අරමුණු කිරීම **තදාලම්බනකෘත්‍ය** නම් වෙයි;

14—උත්පන්නභවයෙන් ගිළිහීයාම **ච්‍යුතිකෘත්‍යය** නම් වෙයි;

[පටිසන්ධි-භවඞ්ගාවජ්ජන-පඤ්චවිඤ්ඤාණට්ඨානාදිවසෙන පන තෙසං දසධා ඨානභෙදෙ වෙදිතබ්බො.]

ප්‍රතිසන්ධිස්ථානය, භවාඞ්ගස්ථානය, ආවර්ජනස්ථානය, පඤ්චවිඥානස්ථානාදිවශයෙන් වනාහි(හෙවත්-දර්ශනාදි පඤ්චවිඥානස්ථානය-සම්ප්‍රත්‍යෙෂණස්ථාන-

සන්තීරණස්ථාන-ව්‍යවස්ථාපනස්ථාන-ජවනස්ථාන-තදාලම්බනස්ථාන-ච්‍යුතිස්ථාන වශයෙන් වනාහි) ඒ චිත්තයන්ගේ ස්ථානභේදය දශප්‍රකාරයෙන් වූයේ දතයුත්තේයි.

මෙහි ප්‍රතිසන්ධිස්ථානය වනාහි ඒකාන්තයෙන් ප්‍රතිසන්ධිවිනිර්මුක්තවූ ස්ථානයෙක් නම් නැත, සුවසේ දනගැන්මපිණිස වනාහි “සිලාපුත්තකස්ස සරීරං” යනාදියෙහි මෙන් අභේදකල්පනායයි දතයුතු;—සෙසු භවාඞ්ගස්ථානාදියෙහි ද මෙම නයයි;—එහි චුති-භවඞ්ග දෙදෙනාගේ අතුර ප්‍රතිසන්ධිස්ථාන නම් වේ; ප්‍රතිසන්ධි-ආවර්ජන දෙදෙනාගේ අතුර භවාඞ්ගස්ථාන නම් වේ; මෙසේ ම ආවර්ජනය ද දතයුතු.

ඒ කෘත්‍යසඞ්ග්‍රහයෙහි උපෙක්ෂාසහගතසන්තීරණයෝ දෙදෙන ද, මහාවිපාකයෝ අටදෙන ද, රූපාරූපවිපාකයෝ නවදෙන දැයි මේ එකුනවිසති චිත්තයෝ ප්‍රතිසන්ධි-භවාඞ්ග-ච්‍යුතිකෘත්‍ය නම් වෙත්; ආවර්ජනකෘත්‍යයෝ වනාහි පඤ්චද්වාරාවර්ජන-මනොද්වාරවශයෙන් දෙදෙනෙක; දර්ශන-ශ්‍රවණ-ආඝ්‍රාණ-ආස්වාදන-ස්පර්ශන-සම්ප්‍රත්‍යෙෂණකෘත්‍යයෝ ද එසේ ම කුශලාකුශල-විපාකවශයෙන් දෙදෙනෙක් වෙත්; සන්තීරණකෘත්‍යයෝ උපෙක්ෂා-සොමනස්‍යවශයෙන් තුන්දෙනෙක්වෙත්; මනොද්වාරාවර්ජනය ම චක්ෂුර්ද්වාරාදි පඤ්චද්වාරයෙහි ව්‍යවස්ථාපනකෘත්‍යය සිඬකරන්නේයි; ආවර්ජනයන් දෙදෙනා වර්ජිතකොට ඇති ලෞකික-ලොකොත්තරකුශලයෝ එක්විස්සය, අකුශලයෝ දොළසය, ලොකොත්තරඵලසිත් සතරය, ත්‍රෛභූමිකක්‍රියාචිත්තයෝ අටළොසයයි, මේ පස්පණස් චිත්තයෝ ජවනකෘත්‍යයෝ නම් වෙත්; මෙහි එකචිත්තක්ෂණිකවූ ලොකොත්තරමාර්ගාදි චිත්තය ජවනස්වභාව ඇතිබැවහෙයින් ජවනකෘත්‍යනම් වේ; යම් සේ එකෙක්හි ගොචර විෂයකොට ඇත්තාහු ද සර්වඥතාඥනය සකලවිෂයාවබොධසාමර්ථ්‍යයොගයෙන් කිසිකලෙක්හි ඒ නාමය නොහරනේ ද එමෙනැයි සේයි; මහාවිපාකයෝ අටදෙන ද, සන්තීරණත්‍රිකයද්දැයි, මොහු එකොළොස්දෙන තදාලම්බනකෘත්‍යයෝ නම් වෙත්.

ඒ කෘත්‍යයන් අතුරෙහි වනාහි උපෙක්ෂාසහගතසන්තීරණ චිත්තයෝ දෙදෙන ප්‍රතිසන්ධි-භවාඞ්ග-ච්‍යුති-තදාලම්බන-සන්තීරණවශයෙන් පඤ්චකෘත්‍යයක් ඇත්තාහු නම් වෙත්; කාමාවචරමහාවිපාකයෝ අටදෙන ප්‍රතිසන්ධි-භවාඞ්ග-ච්‍යුති-තදාලම්බනවශයෙන් සතරකෘත්‍යයක් ඇත්තාහුයි; මහද්ගතවිපාකයෝ නවදෙන ප්‍රතිසන්ධි-භවාඞ්ග-ච්‍යුතිවශයෙන් ත්‍රිකෘත්‍යයෝයි; සොම්නස්සහිත සන්තීරණය සන්තීරණ-තදාලම්බනවශයෙන් කෘත්‍යද්වයක් ඇත්තේයි; ව්‍යවස්ථාපනචිත්තය ව්‍යවස්ථාපන-ආවර්ජනවශයෙන් එසේ ම කෘත්‍යද්වයක් ඇත්තේයි; අවශෙෂවූ සියලු ජවන-මනොධාතුත්‍රික-පඤ්චවිඥාන-යන මොහු වනාහි සම්භවවූ පරිද්දෙන් එකකෘත්‍යයෝ නම් වෙත්.—(කියනලදමැයි;)

[පටිසන්ධාදයො නාම කිච්චභෙදෙන චුද්දස;
දසධා ඨානභෙදෙන චිත්තුප්පාදා පකාසිතා.
අට්ඨසට්ඨි තථා ද්වෙ ච නව'ට්ඨ ද්වෙ යථාක්කමං,
එක-ද්වි-ති-චතු-පඤ්ච-කිච්චට්ඨානානි නිද්දිසෙ.]

ප්‍රතිසන්ධ්‍යාදිවූ චිත්තොත්පාදයෝ ප්‍රතිසන්ධ්‍යාදිවූ නාමභේදයෙන් හා කෘත්‍යභේදයෙන්,—නොහොත්-ප්‍රතිසන්ධ්‍යාදිවූ චිත්තොත්පාදයෝ තමන්තමන්ගේ කෘත්‍යභේදහෙයින් තුදුසෙක් වන්නාහ; ප්‍රතිසන්ධ්‍යාදිවූ ස්ථානභේදහෙයින් දශප්‍රකාරවූවාහු ප්‍රකාශ කරණලදහු.

එක ස්ථාන-ද්වි ස්ථාන-ත්‍රි ස්ථාන-චතුඃ ස්ථාන-පඤ්ච ස්ථාන ඇති චිත්තයෝ පිළිවෙළින් (පස්පණස් ජවනයෝය, මනොධාතු ත්‍රිකය, දෙපස්විඤ්ඤාණය, යන මොවුන්ගේ වශයෙන්) අටසැටෙක් ද; එසේ ම (සොම්නස් සහගත සන්තීරණ-ව්‍යවස්ථාපනවශයෙන්) දෙදෙනෙක් ද; (මහග්ගත විපාකවශයෙන්) නවයෙක් ද; (කාමාවචර විපාකවශයෙන්) අටෙක් ද; (උපෙක්ෂාසහගතසන්තීරණද්වයවශයෙන්) දෙදෙනෙක් දැයි; මෙසේ කියන්නේයි.

**චක්ෂුර්ද්වාරාදිද්වාරසඞ්ග්‍රහයෙහි,**—ද්වාරයෝ නම් චක්ෂුර්ද්වාරය, ශ්‍රොත්‍රද්වාරය, ඝ්‍රාණද්වාරය, ජිහ්වාද්වාරය, කායද්වාරය, මනොද්වාරය දැයි, ෂඩ්ප්‍රකාර වෙත්;—ඒ ෂඩ්විධවූ ද්වාරයන් අතුරෙහි ප්‍රසාදචක්ෂුස ම චක්ෂුර්ද්වාර නම් වේ; එසේ ම ප්‍රසාදශ්‍රොත්‍රාදීහු ම ශ්‍රොත්‍රද්වාරාදීහු නම් වෙත්; මනොද්වාරය වනාහි ආවර්ජනානන්තර කොට ඇති භවාඞ්ගය කියනුලැබේ;—එසේහෙයින් ම—

“සාවජ්ජනං භවඞ්ගන්තු මනොද්වාරන්ති වුච්චති”—යි කියනලදී.

ඒ චක්ෂුස්ද්වාරාදිවූ ද්වාරයන් අතුරෙහි චක්ෂුර්ද්වාරයෙහි පඤ්චද්වාරාවර්ජනය, කුශලාකුශලවිපාකචක්ෂුර්විඥානයෝය, එසේ ම සම්ප්‍රතීච්ඡනද්වයය, සන්තීරණය, ව්‍යවස්ථාපනය, කුශලාකුශලයන් හා ආවර්ජනද්වයවර්ජිතවූ ක්‍රියාවන්ගේ වශයෙන් කාමාවචරජවනයෝ විසිනවදෙනය, අගෘහීතග්‍රහණයෙන් අවශෙෂයෙන් තදලම්බනවූ මහාවිපාකයෝ අටදෙනය යන මොවුන්ගේ වශයෙන් මේ සූසාළිස් චිත්තයෝ ඉෂ්ටාදි ආලම්බන-යොනිසොමනස්කාර-නිරනුශය-සන්තානාදීන්ට අනුරූපපරිද්දෙන් උපදිත්; එසේ ම ශ්‍රොත්‍රද්වාරාදියෙහි ද පඤ්චද්වාරාවර්ජන-ශ්‍රොත්‍රවිඥානාදීන්ගේ වශයෙන් සසාළිසෙක් ම වෙත්නුයි ආවර්ජනාදි-තදලම්බනාවසානකොට ඇති සර්වප්‍රකාරයෙන් ම චක්ෂුර්ද්වාරාදි පඤ්චද්වාරයෙහි ඒ ඒ ද්වාරයෙහි අගෘහීතග්‍රහණයෙන් සූපණස් චිත්තයෝ කාමාවචරයෝ ම යයි දතයුත්තාහුයි.

මනොද්වාරයෙහි වනාහි මනොද්වාරාවර්ජනය, පස්පණස් ජවනය, එකොළොස් තදලම්බනයන්ගේ වශයෙන් සත්සැට චිත්තකෙනෙක් වෙත්.

ප්‍රතිසන්ධි-භවාඞ්ග-ච්‍යුතිවශයෙන් ප්‍රවෘත්තවූ උපෙක්ෂාසහගතසන්තීරණද්වයය, මහාවිපාකයෝ අටදෙනය, නව රූපාරූපවිපාකයෝ යයි, එකුන්විසි චිත්තයෝ චක්ෂුර්ද්වාරාදි පඤ්චද්වාරයෙහි නූපදනාහෙයින් ද මනොද්වාරසඞ්ඛ්‍යාතවූ භවාඞ්ගයෙන් ආලම්බනානන්තරග්‍රහණවශයෙන් අප්‍රවෘත්ත හෙයින් ද ද්වාරවිනිර්මුක්ත නම් වෙත්;—ඒ ද්වාරිකචිත්තයන් අතුරෙහි උභයවිපාකපඤ්චවිඥානවූ දසදෙන ද, මහග්ගත ජවනයෝ අටළොසද, ලොකොත්තරජවනයෝ අටදෙන ද,යන මේ සතිස් චිත්තයෝ ස්වකීය-ස්වකීයද්වාරානුරූපව ඒකද්වාරික චිත්තයෝ නම් වෙත්;—මෙහි දෙපස් විඥානයෝ චක්ෂුර්ද්වාරාදිවූ තමන්තමන්ගේ ද්වාරයෙහි වෙති, සවිසි මහද්ගත-ලොකොත්තරජවනයෝ මනොද්වාරයෙහි ම වෙත්.

මනොධාතුත්‍රිකය වනාහි පඤ්චද්වාරිකයි.

සොමනස්සසන්තීරණව්‍යවස්ථාපන-කාමාවචරජවන යන මොහු එක්තිස ෂඩ්ද්වාරිකචිත්තයෝ නම් වෙත්.

උපෙක්ෂාසහගතසන්තීරණද්වයය, මහාවිපාකයෝ අටදෙනය යන මොහු දසදෙන ෂඩ්ද්වාරික නමුදු වෙති, ද්වාරවිනිර්මුක්තයෝ ද වෙත්;—මෙහි උපෙක්ෂාසහගතසන්තීරණද්වය පඤ්චද්වාරයෙහි සන්තීරණ-තදලම්බනවශ

යෙන් ද මනොද්වාරයෙහි තදාලම්බනවශයෙන් ද උපදනාහෙයින් ෂඩ්ද්වාරික ද වෙයි, ප්‍රතිසන්‍ධ්‍යාදිවශයෙන් ප්‍රවෘත්තහෙයින් ද්වාරවිනිර්මුක්ත ද වේ; මහාවිපාකයෝ අටදෙන පඤ්චද්වාරයෙහි ද මනොද්වාරයෙහි ද තදාලම්බනවශයෙන් පවත්නාහෙයින් ෂඩ්ද්වාරික වෙති, ප්‍රතිසන්‍ධ්‍යාදිවශයෙන් පවත්නාහෙයින් ද්වාරවිනිර්මුක්ත ද වෙත්;—යනුභාවයි. (කියනලදමැයි.)

[ඒකද්වාරිකචිත්තානි පඤ්ච-ඡද්වාරිකානි ච,
ඡද්වාරිකවිමුත්තානි විමුත්තානි ච සබ්බථා.
ඡත්තිංසති තථා තීණි ඒකතිංස යථාක්කමං,
දසධා නවධා චේ'ති පඤ්චධා පරිදීපයෙ.]

ඒකද්වාරිකචිත්තයෝ ද, පඤ්චද්වාරික-ෂඩ්ද්වාරිකචිත්තයෝ ද, කිසිකලෙක්හි ෂඩ්ද්වාරයෙන් විනිර්මුක්තචිත්තයෝ ද, සර්වප්‍රකාරයෙන් ද්වාරවිනිර්මුක්තයෝ ද, පිළිවෙළින් (ඒකද්වාරිකචිත්තයෝ) සතිසෙක, එසේ ම (පඤ්චද්වාරික චිත්තයෝ) තුන්දෙනෙක, (ෂඩ්ද්වාරිකචිත්තයෝ) එක්තිසෙක, (ෂඩ්ද්වාරිකවූ ද ෂඩ්ද්වාරිකවිනිර්මුක්තවූ ද චිත්තයෝ) දශප්‍රකාරවන්නාහ, (සර්වප්‍රකාරයෙන් ද්වාරවිනිර්මුක්තචිත්තයෝ) නවප්‍රකාරවන්නාහයි, (මෙසේ ද්වාරසඞ්ග්‍රහයෙහි චිත්තයන්) පඤ්චප්‍රකාරයකින් ප්‍රකාශකරන්නේයි.

**ආලම්බනසඞ්ග්‍රහයෙහි**;—ආලම්බනයෝ නම්,—රූපාලම්බනය, ශබ්දාලම්බනය, ගන්‍ධාලම්බනය, රසාලම්බනය, ස්පර්ශාලම්බනය, ධර්මාලම්බනයයි, කියා ද ෂට් ප්‍රකාර වෙත්;—ඒ ෂඩ්විධවූ රූපාදිආලම්බනයන් අතුරෙහි වර්ණායතන සඞ්ඛ්‍යාතවූ රූපය ම රූපාලම්බන නම් වේ;—එසේ ම ශබ්දාදිහු ශබ්දාලම්බනාදිහු නම් වෙත්;—ධර්මාලම්බනය වනාහි මෙකී පඤ්චාලම්බනය හැර චක්ෂුඃප්‍රසාදාදිවූ පඤ්චප්‍රසාදරූපය, සොළොස්සූක්ෂ්මරූපය, චිත්ත-චෛතසිකයෝය, නිර්වාණය, කසිනාදි ප්‍රඥප්තිය, යන මොවුන්ගේ වශයෙන් ෂට්ප්‍රකාරයකින් සඞ්ග්‍රහකරණලැබේ

ඒ ආලම්බනසඞ්ග්‍රහයෙහි චක්ෂුර්ද්වාරයෙහි ප්‍රවෘත්තවූ සියලු චිත්තයන්ට රූපය ම ආලම්බන වන්නේය, හෙද වර්තමානවූයේ ම අරමුණු වන්නේයි; අතීතානාගතවූයේ අරමුණු නොවෙයි සේයි;—එසේ ම ශ්‍රොත්‍රද්වාරිකචිත්තාදීන්ට ද ශබ්දාදිහු වර්තමානවූවාහු ම අරමුණු වන්නාහුයි;—මනොද්වාරයෙහි ප්‍රවෘත්තවූ චිත්තයන්ට වනාහි රූපාදිවශයෙන් ෂට්ප්‍රකාරවූ ම ආලම්බනය වර්තමානවූයේ ද අතීතවූයේ ද අනාගතවූයේ ද නිර්වාණ-ප්‍රඥප්තිසඞ්ඛ්‍යාත කාලවිනිර්මුක්තවූයේ ද කාමාවචරජවන-අභිඥජවන-අවශෙෂ මහද්ගතාදිජවනය යන මොවුන්ට අනුරූපපරිච්ඡෙදෙන් අරමුණු වන්නේයි;-අවිනාශස්වරූපහෙයින් ද අතීතාදිකාලවශයෙන් නොකියයුතුබවහෙයින් ද නිර්වාණයත් ප්‍රඥප්තියත් කාලවිනිර්මුක්ත නම් වේ;-මෙහි හසිතොත්පාදවර්ජිතවූ කාමාවචර ජවනයන්ට ෂඩ්විධවූ රූපාදි ආලම්බනය අතීතාදිකාලයෙන් යුක්තවූයේ ද කාලවිනිර්මුක්තවූයේ ද අරමුණු වෙයි,හසිතොත්පාදචිත්තයා ඒකාන්තපරිත්තාලම්බනහෙයින් ඕහට රූපාදී ආලම්බනය ත්‍රිකාලිකවූයේ ම අරමුණු වෙයි, දිව්‍යචක්ෂුරාදි වශයෙන් ප්‍රවෘත්තවූ අභිඥ ජවනයට වනාහි සුදුසුපරිච්ඡෙදෙන් ෂඩ්විධවූ රූපාදී ආලම්බනය ත්‍රිකාලිකවූයේ ද කාලවිනිර්මුක්තවූයේ ද අරමුණු වේ, අවශෙෂමහද්ගතාදීන්ට වනාහි කාලවිනිර්මුක්තය ද අතීතවූ රූපාදිය ද සුදුසුපරිච්ඡෙදෙන් අරමුණු වේ.

ප්‍රතිසන්ධි-භවාඞ්ග-ච්‍යුති නම්වූ චක්ෂුරාදී සදොර ම නොඋපදනාහෙයින් ද්වාරවිනිර්මුක්තවූ චිත්තයන්ට රූපාදී ෂඩ්විධවූ අරමුණ තත්භූමික ප්‍රතිසන්ධි-භවාඞ්ග-ච්‍යුතීන්ගේ තත්ද්වාරගෘහීතාදිවශයෙන් සඞ්ගවූ පරිද්දෙන් බාහුල්‍යයෙන් අතීතානන්තරභවයෙහි මරණාසන්නකාලයෙහි ප්‍රවෘත්තවූ ෂඩ්ද්වාරිකජවනයන්විසින් ගන්නාලද වර්තමානවූ හෝ අතීතවූ හෝ කසිනාදී ප්‍රඥප්තිවූ හෝ කර්මය කර්මනිමිත්තය ගතිනිමිත්තයයි ආගමව්‍යවහාරප්‍රසිද්ධ එක්තරාඑකෙක් අරමුණු වන්නේයි;—මෙහි "**කර්ම**" නම් ප්‍රතිසන්ධිජනක කුසලාකුසලචේතනායි;-"**කර්මනිමිත්ත**" නම් දූනාදීන්ට ද ප්‍රාණවධාදීන්ට ද උපකාරවූ වස්ත්‍ර-පුෂ්ප-ආයුධාදියයි;-"**ගතිනිමිත්ත**" නම් ඉපැද්දයුතු සුගති-දුර්ගතිභවයෙහි පැණෙන කල්පවෘක්ෂ-මාතෘකුක්ෂි-නරකපාලාගනි ආදීයයි;—මෙහි කාමාවචරප්‍රතිසන්ධි-භවාඞ්ගයන්ට වනාහි ෂඩ්ද්වාරයෙන් ගන්නාලද රූපාදී පඤ්චාලම්බනය සුදුසුපරිද්දෙන් වර්තමානවූයේ ද අතීතවූයේ ද කර්ම-කර්මනිමිත්තවශයෙන් අරමුණු වන්නේය;—එසේ ම ච්‍යුතිචිත්තයට ද අතීතවූ කර්මනිමිත්ත අරමුණුවන්නේය; ධර්මාලම්බනය වනාහි ඒ ප්‍රතිසන්ධ්‍යාදී තුන්දෙනාට ම මනොද්වාරයෙන් ගන්නාලද්දේ ම අතීතව කර්මනිමිත්තවශයෙන් අරමුණුවේ; එක ම රූපාලම්බනය මනොද්වාරයෙන් ගන්නාලද්දේ එකාන්තයෙන් වර්තමානවූ ගතිනිමිත්තවශයෙන් අරමුණු වේ;—මහද්ගත ප්‍රතිසන්ධ්‍යාද්‍යෙහි වනාහි රූපාරූප්‍යයන්ට ද ප්‍රථම-තෘතීයාරූප්‍යයන්ට ද මනොද්වාරයෙන් ගන්නාලද ධර්මාලම්බනය ප්‍රඥප්තිවූයේ කර්මනිමිත්තවශයෙන් අරමුණු වේ;-ද්විතීය-චතුර්ථාරූප්‍යයන්ට එම ධර්මාලම්බනය මනොද්වාරයෙන් ගන්නාලද්දේ අතීතවූයේ ම කර්මනිමිත්තවශයෙන් ම අරමුණු වේ;—එසේ හෙයින් "යථාසම්භවං යෙභුය්‍යෙන භවන්තරෙ ඡද්වාරගහිතං" යනාදී කියනාලදී;—මෙහි "යෙභුය්‍ය" ග්‍රහණයෙන් අසංඥභවයෙන් ච්‍යුතවන්නාවුන්ගේ ප්‍රතිසන්ධිවිඥානයට අනන්තරඅතීතභවයෙහි කිසි ද්වාරයකින් ගන්නාලදදෙයක් නැත්නුයි වලකනලද; හුදෙක් අසංඥභවයෙන් ච්‍යුතවන සත්ත්වයන්ගේ කර්මබලයෙන් කාමභවයෙහි ප්‍රතිසන්ධියට කර්මනිමිත්තාදිවූ එක්තරා අරමුණෙක් උපස්ථිතවන්නේයි;—එසේහෙයින් ම කියනලදී.

භවන්තරකතං කම්මං යමො කාසං ලභෙ තතො,
හොති සා සන්ධි තෙනෙ'ව උපට්ඨාපිතගොචරෙ—යි

ඒ රූපාදී ප්‍රත්‍යුත්පන්නාදී කර්මාදීන් අරමුණුකොට ඇති විඤ්ඤාණයන් අතුරෙහි චක්ෂුර්විඥානාදීහු පිළිවෙළින් රූපාදීන්කෙරෙහි එකක් එකක් ම අරමුණුකොට ඇත්තාහුයි.

මනොධාතුත්‍රිකය වනාහි රූපාදී පසම අරමුණුකොට ඇත්තේයි;—ද්විපඤ්චවිඥාන-සම්ප්‍රතීච්ඡනයන්කෙරෙන් අවශේෂවූ එකොළොස් කාමාවචරවිපාකයෝ ද හසිතොත්පාදචිත්තය ද යන මොහු සර්වප්‍රකාරයෙන් හෙවත් ෂඩ්ද්වාරික-ද්වාරවිනිර්මුක්ත-සර්වාලම්බනවශයෙන් ප්‍රවෘත්ත සියලු ආකාරයෙන් කාමාවචරාලම්බනයෝ මැයි;—මෙහි විපාකයෝ වනාහි සන්තීරණාදිවශයෙන් රූපාදී පඤ්චාලම්බනයෙහි ම ප්‍රතිසන්ධ්‍යාදිවශයෙන් ෂඩාලම්බනසඞ්ඛ්‍යාතවූ කාමාවචරාලම්බනයෙහි ම පවත්නාහුයි;—හසනචිත්තය ද සමාපත්ති සමවදනට සුදුසු රම්‍යස්ථානයක් දැක සතුටුවන්නාහට චක්ෂුර්ද්වාරයෙහි රූපාලම්බනයෙහි ද, පෘථග්ජනයන් ලාභ බෙදනතන්හි මහාශබ්ද අසා මෙබඳු [illegible] අරගල කරණ තෘෂ්ණාව ප්‍රහීණයයි සතුටුවන්නාහට ශ්‍රො

ත්‍රද්වාරයෙහි ශබ්දාලම්බනයෙහි ද, පූජ්‍යවූ සුගන්ධාදීන් චෛත්‍යාදියට පූජා කරණ කාලයෙහි සතුටුවන්නාහට ඝ්‍රාණද්වාරයෙහි ගන්ධාලම්බනයෙහි ද, තමාලද රස සම්පන්න පිණ්ඩපාතය සබ්‍රම්සරුන් හා බෙද අනුභව කරණ කාලයෙහි සතුටුවන්නාහට ජිහ්වාද්වාරයෙහි රසාලම්බනයෙහි ද, කායප්‍රයොගයෙන් සිද්ධවන ආභිසමාචාරික වත් පුරණ කාලයෙහි සතුටුවන්නාහට කායද්වාරයෙහි ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි ද, පූර්වේනිවාසඥානාදීන්විසින් ගන්නාලද කාමාවචරධර්මයකු අරබයා සතුටුවන්නාහට මනොද්වාරයෙහි ධර්මාලම්බනයෙහි දැයි, මෙසේ කාමාවචරධර්මපර්‍ය්‍යාපන්නවූ ෂඩාලම්බනයෙහි පවත්නේයි.

දෙලොස් අකුශලයෝ ද කුශල-ක්‍රියාවශයෙන් ඥානවිප්‍රයුක්ත ජවනයෝ අටදෙන ද යන මේ චිත්තයෝ විසිදෙන තමන් ජඩස්වභාව ඇතිහෙයින් ලොකොත්තරධර්මයන් අරබයා පවත්නට අසමර්ථ හෙයින් නවවිධ ලොකොත්තරධර්මයන් වර්ජිතකොට ඇති සියලු ත්‍රෛභූමිකධර්මයන් හා ප්‍රඥප්ති අරබයා පවත්නාහෙයින් සර්වාලම්බනිකයෝයි;—මෙහි අකුශලයන් කෙරෙහි දෘෂ්ටිසම්ප්‍රයුක්තචිත්තයෝ සතරදෙන පර්‍ය්‍යාපන්නධර්මයන් අරබයා දෘෂ්ටිග්‍රහණාස්වාදනාභිනන්දනකාලයෙහි කාමාවචරාලම්බනයහ, තදාකාරයෙන් ම සත්විසි මහද්ගතධර්මයන් අරබයා ප්‍රවෘත්තියක් ඇතිකල්හි මහග්ගතාලම්බනයහ, සංවෘතිධර්මයන් අරබයා පවත්නාකල්හි ප්‍රඥප්ත්‍යාලම්බනයහ;—දෘෂ්ටිවිප්‍රයුක්තචිත්තයෝ සතරදෙන ද එම කාමාවචරධර්මයන් අරබයා හුදෙක් ආස්වාදනාභිනන්දනවශයෙන් පවත්නාකල්හි කාමාවචරාලම්බනයහ, තදාකාරයෙන් ම සවිසිමහද්ගතධර්මයන් අරබයා පවත්නාකල්හි මහග්ගතාලම්බනයහ, ප්‍රඥප්තිය අරබයා පවත්නාකල්හි ප්‍රඥප්ත්‍යාලම්බනයෝයි;—ප්‍රතිඝසම්ප්‍රයුක්තචිත්තයන් දෙදෙනා දූෂණවිප්‍රතිසාරවශයෙන් කාමාවචරධර්මයන් අරබයා ප්‍රවෘත්තියක් ඇතිකල්හි කාමාවචරාලම්බනයහ, තදාකාරයෙන් ම මහද්ගතධර්මයන් අරබයා පවත්නාකල්හි මහග්ගතාලම්බනයහ, එසේ ම ප්‍රඥප්තිය අරබයා පවත්නාකල්හි ප්‍රඥප්ත්‍යාලම්බනයහ;—විචිකිච්ඡාචිත්තය ද සංශයවශයෙන් කාමාවචරධර්මයන් අරබයා පවත්නාකල්හි කාමාවචරාලම්බනයහ, තදාකාරයෙන් ම මහද්ගතධර්මයන් අරබයා පවත්නාකල්හි මහග්ගතාලම්බනයහ, ප්‍රඥප්තිය අරබයා ප්‍රවෘත්තියක් ඇතිකල්හි ප්‍රඥප්ත්‍යාලම්බනයි;—ඖද්ධත්‍යසහගතචිත්තය ද වික්ෂෙපවශයෙන් ද අව්‍යුපශමවශයෙන් ද කාමාවචරධර්මයන් අරබයා ප්‍රවෘත්තියක් ඇතිකල්හි කාමාවචරාලම්බනය, තදාකාරයෙන් ම මහද්ගතධර්මයන් අරබයා පවත්නාකල්හි මහග්ගතාලම්බනය, ප්‍රඥප්තිය අරබයා පවත්නාකල්හි ප්‍රඥප්ත්‍යාලම්බනය, පරිත්තධර්මයන් අරබයා ප්‍රවෘත්තියක් ඇතිකල්හි කාමාවචරාලම්බනයහ, අභිඥාණධ්‍යානප්‍රත්‍යවෙක්ෂාකාලයෙහි මහග්ගතාලම්බනයහ, කසිණනිමිත්තාදීන්හි පරිකර්මාදිවශයෙන් ප්‍රවෘත්තිකාලයෙහි ප්‍රඥප්ත්‍යාලම්බනයහයි දතයුතු.

ඥානසම්ප්‍රයුක්තකාමාවචරකුශලයෝ ද පඤ්චමධ්‍යාන යයි කියනලද අභිඥකුශලචිත්තය ද යන මොහු පස්දෙන ශෛක්ෂපෘථග්ජනසන්තානයෙහි ම පවත්නාහෙයින් අර්හත්මාර්ග-ඵලවර්ජිත සර්වාලම්බනයෝයි;—මෙහි ශෛක්ෂයෝ ලෞකිකචිත්තයා තබා රහතුන්ගේ අර්හත්මාර්ග-ඵලසංඛ්‍යාත ආවේණිකචිත්තයන් දක්නට අසමර්ථයහ, එසේ ම පෘථග්ජනයෝ ද සෝවාන් ආදීන්ගේ මාර්ග-ඵලසඞ්ඛ්‍යාතවූ චිත්තය දන්නට අසමර්ථයහ, ශෛක්ෂයන්ට වනාහි තමන් තමන්ගේ මාර්ග-ඵල ප්‍රත්‍යවෙක්ෂාකාලයෙහි ද පරසන්තානගතමාර්ග-ඵලාලම්බනිකවූ අභිඥචිත්තයන්ට පරිකර්මකාලයෙහි අභිඥචිත්තයෙහි

ද මාර්ග-ඵල පිරිසිඳිනා කාලයෙහි ද තමන් තමන්ට සමානවූ යට යටවූ ශෛක්ෂයන්ගේ මාර්ග-ඵලධර්මයන් අරබයා කුශලයන් ප්‍රවෘත්තිය ඇත්තුයි අර්හත්මාර්ග-ඵලයාගේ ම ප්‍රතික්ෂෙපය කරණලද්දී;—කාමාවචර-මහද්ගත-ප්‍රඥප්ති-නිර්වාණ යන මොහු වනාහි ශෛක්ෂපෘථග්ජනයන්ගේ සත්කෘත්‍ය-දාන-ප්‍රත්‍යවෙක්ෂා-ධර්මශ්‍රවණ-සංස්කාරසම්මර්ශන-කසිණපරිකර්මාදිකාලයෙහි ද තත්තදාලම්බනිකඅභිඥවන්ගේ පරිකර්මකාලයෙහි ද ගොත්‍රභූව්‍යවදානකාලයෙහි ද දිව්‍යචක්ෂුරභිඥනාදීන් රූපාදි විජානනකාලයෙහි ද කුශලජවනයන්ට ගොචරභාවයට පැමිණෙත්.

ඥානසම්ප්‍රයුක්තකාමාවචරක්‍රියාසිත් සතරදෙන ද ක්‍රියාඅභිඥචිත්තය ද මනොද්වාරාවර්ජනය ද යන මොහු සදෙන කාමාවචර-මහග්ගත-ලොකොත්තර-ප්‍රඥප්තිවශයෙන් සර්වප්‍රකාරයෙන් සියල්ලවුන් ම අරමුණු කරන්නාහුයි, එසේමැයි, ක්‍රියාජවනයන්ට සර්වඥතාඥානාදිවශයෙන් ප්‍රවෘත්තියක් ඇතිකල්හි ද ව්‍යවස්ථාපනයාගේද ඒ ඒ චිත්තයට පූර්වභාගවශයෙන් ප්‍රවෘත්තියක් ඇතිකල්හිදු ගොචර නොවන්නාවූ කිසිවෙක් නම් නැති.

අරූපාවචරයන්කෙරෙහි කුශල-විපාක—ක්‍රියාවශයෙන් විතීය-චතුර්ථාරූප්‍යචිත්තයෝ ප්‍රථම-තෘතීයාරූප්‍යචිත්තයන් අරමුණුකොට ඇතිබවහෙයින් මහග්ගතාලම්බනයෝයි;-අවශිෂ්ටවූ පසළොස් රූපාවචරයෝ ද කුශල-විපාක-ක්‍රියාවශයෙන් ප්‍රථම-තෘතීයාරූප්‍යචිත්තයෝ ද යනමේ එක්විසි චිත්තයෝ කසිණාදි ප්‍රඥප්තිය අරමුණුකොට ඇත්තාහුයි;—ලොකොත්තරචිත්තයෝ නිර්වාණය අරමුණුකොට ඇත්තාහුයී—(කියනලදමැයි.)

[පඤ්චවීස පරිත්තම්හි ඡ චිත්තානි මහග්ගතෙ,
එකවීසති වොහාරෙ අට්ඨ නිබ්බාණගොචරෙ.
වීසානුත්තරමුත්තම්හි අග්ගමග්ගඵලුජ්ඣිතෙ,
පඤ්ච සබ්බත්ථ ඡච්චෙති සත්තධා තත්ථ සඞ්ගහො.]

තෙවිසි කාමාවචරවිපාකචිත්තය හා පඤ්චද්වාරාවර්ජනය හසිතොත්පාදය යන මොවුන්ගේ වශයෙන් මේ පස්විසි චිත්තයෝ කාමාවචරාලම්බනයෙහි වන්නාහ;—(මත්තෙහි "මහග්ගත ම වෙයි" යනාදීන් සැමතන්හි ම සාවධානයොජනා දතයුතු;)—කුශල-විපාක-ක්‍රියාවශයෙන් විඥානඤ්චායතන-නෙවසඤ්ඤානාසඤ්ඤායතනචිත්තයෝ සදෙන මහග්ගතාලම්බනයෙහි ම වෙති; [කුශල-විපාක-ක්‍රියාවශයෙන් ප්‍රථමධ්‍යානාදි පසළොස් රූපාවචරයෝ ද ප්‍රථම-තෘතීයාරූප්‍යයෝ ද යන එක්විසි චිත්තයෝ ප්‍රඥප්ත්‍යාලම්බනයෙහි වෙති;] ලොකුත්තරචිත්තයෝ අටදෙන නිර්වාණාලම්බනයෙහි ම වෙත්.

ද්වාදශ අකුශලය හා ඥානවිප්‍රයුක්ත කාමාවචරකුශල-ක්‍රියාවශයෙන් අටදෙනදැයි මොහු විසිදෙන ලොකොත්තරයන් කෙරෙන් විනිර්මුක්තවූ අවශෙෂ සියලු ආලම්බනයෙහි ම වෙති; ඥානසම්ප්‍රයුක්ත කාමාවචරකුශල-අභිඥකුශලවශයෙන් මේ චිත්තයෝ පස්දෙන අර්හත්මාර්ග-ඵලවර්ජිත අවශෙෂාලම්බනයෙහි ම උපදිති; ඥානසම්ප්‍රයුක්තකාමාවචරක්‍රියා-අභිඥ-මනොද්වාරාවර්ජනය යන මොහු සදෙන සියලු ආලම්බනයෙහි වන්නාහුයි (මෙසේ) ඒ ආලම්බනසඞ්ග්‍රහයෙහි සඞ්ග්‍රහය සප්තප්‍රකාර වේ.

**වස්තුසඞ්ග්‍රහයෙහි** වස්තූහු නම් චක්ෂුර්වස්තුව ද, ශ්‍රොත්‍රවස්තුව ද, ඝ්‍රාණවස්තුව ද, ජිහ්වාවස්තුව ද, කායවස්තුව ද, හෘදයවස්තුවදැයි, ෂට්ප්‍රකාර වෙත්;—ඒ ෂට්ප්‍රකාරවස්තූහු කාමභවයෙහි පරිපූර්ණවූ ඉන්ද්‍රියයන් ඇත්තාහු එහි ම සම්භ

වය වනහෙයින් සියල්ලෝ ද ලැබෙත්;-“සබ්බානි’පි ලබ්භන්ති” යි කී අපිශබ්දය වනාහි ඝ්‍රාණ-බධිරාදිවශයෙන් සමහරකෙනෙකුන්ට අසම්භවය හඟවා;-රූපලොකයෙහි වනාහි ඝ්‍රාණප්‍රසාදදි තුණ නැති;—බ්‍රහ්මයන්ගේ කාමවිරාගභාවනාවශයෙන් ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍යයෙහි විරක්තබැවින තම්ෂයවූ ප්‍රසාදයෙහි විරාගසත්භාව හෙයින් ඝ්‍රාණාදිත්‍රය නැත; බුද්ධදර්ශන-ධර්මශ්‍රවණාදිය පිණිස චක්ෂුස්-ශ්‍රොත්‍රයෙහි අවිරක්ත බැවින් චක්ෂුර්ස්වාද් වස්තුවය එහි ලැබෙන්නේයි;-අරූපගවයෙහි ෂඩ්වස්තූහු ම අරූපීන්ගේ රූපවිරාගභාවනාබලයෙන් ඒ අරූපභවයෙහි සර්වප්‍රකාරයෙන් රූපප්‍රවෘත්තියක් නැතිහෙයින් සම්භවය නොවන්නාහුයි.

ඒ වස්තුසඞ්ග්‍රහයෙහි නිඃසත්ත්ව-නිර්ජීවාර්ථයෙන් ධාතුනම්වූ දෙපස්විඥනයෝ පිළිවෙළින් නියමයෙන් ම චක්ෂුරාදිවූ පචප්‍රසාදවස්තූන් නිසා ම පවතිත්; පචමාරාවර්ජන-සම්ප්‍රතීච්ඡන නම්වූ මනනමාත්‍රවූ ධාතු වනාහි හෘදයවස්තුව නිසා ම පවත්නීයි;—එසේ ම අවශිෂ්ටවූ සන්තීරණත්‍රයය අෂ්ටමහාවිපාකය හා ප්‍රතිඝචිත්තවයය ප්‍රථමමාර්ගය හසිතොත්පාදය පසළොස්රූපාවචරයහ යන මොවුන්ගේ වශයෙන් මනොවිඥනධාතු යයි කියනලද්දවූ මේ තිස් ධර්මයෝ හෘදයවස්තුව නිසා ම පවතිත්;—(සන්තීරණත්‍රය-මහාවිපාක යන මොහු එකොළොස්දෙන අරූපභවයෙහි චාරයක් නැතිහෙයින් කෘත්‍යයක් නැතිහෙයින් ද නොඋපදනාහ; ප්‍රතිඝයාගේ නීවරණාවස්ථාවක් නැතිහෙයින් තත්සහගතචිත්තවය රූපලොකයෙහි නොඋපදනාහෙයින් ම අරූපලොකයෙහි තවා ම නොඋපදනේය, ප්‍රථමමාර්ගය ද පුරතොඝොෂප්‍රත්‍යයක් නැතිව ශ්‍රාවකයන්ට නොඋපදනාහෙයින් ද බුද්ධ-ප්‍රත්‍යෙකබුද්ධයන්ගේ ද මනුෂ්‍යලොකයෙන් පිටත් අනික්තැනෙක්හි අනික් ඉපදීමක් නැතිහෙයින් ද අරූපලොකයෙහි නොඋපදනේය, රූපකායාභාවයෙන් හසනචිත්තය ද අරූපීන් තමන් රූපවිරාගභාවනාවශයෙන් තදලම්භනිකධ්‍යානයෙහි ද විරක්තහෙයින් රූපාවචරයෝ ද අරූපභවයෙහි නොඋපදිත්;)—අවශිෂ්ටවූ කාමාවචර-අරූපාවචරවශයෙන් කුශලයෝ දොළසය, අකුශලප්‍රතිඝචිත්තවයෙන් අවශෙෂ අකුශලයෝ දසදෙනය, ක්‍රියාවෝ තෙළසය, ලොකොත්තර සදෙනය යන මොවුන්ගේ වශයෙන් නැවත කාම-රූපලොකවශයෙන් හෘදයවස්තුව නිසා හෝ අරූපලොකවශයෙන් හෘදයවස්තුව නොනිසා හෝ පවත්නාහ, අරූපාවචර විපාකවශයෙන් හෘදයවස්තුව නොනිසා ම පවතිත්. (කියනලදමැයි)

[ඡ වත්ථු නිස්සිතා කාමෙ සත්ත රූපෙ චතුබ්බිධා,
තිවත්ථු නිස්සිතා’රූපෙප ධාතෙවකා ’නිස්සිතා මතා.]

කාමභවයෙහි චක්ෂුරාදි පචවිඥනධාතුය, මනොධාතු-මනොවිඥනධාතුය යන සප්තවිඥනධාතූහු චක්ෂුර්ස්වාද් ෂඩ්වස්තූන් නිසා පවත්නාහයි දන්නාලදහු;—රූපභවයෙහි ඝ්‍රාණාදිත්‍රයවර්ජිතවූ චක්ෂුඃ-ශ්‍රොත්‍රවිඥන-මනොධාතු-මනොවිඥනධාතුවශයෙන් චතුර්විධවූ ධාතූහු චක්ෂුඃ-ශ්‍රොත්‍ර-හෘදයවස්තුසංඛ්‍යාත වස්තූන් තුන්දෙනා නිසා පවත්නාහුයි දන්නාලදහ;—අරූපභවයෙහි එක ම මනොවිඥනධාතුතොමෝ ෂඩ්වස්තූන් නොනිසා ම පවත්නීයයි දන්නාලදහු.

[තෙචත්තාළීස නිස්සාය ද්වෙචත්තාළීස ජායරෙ,
නිස්සාය ච අනිස්සාය පාකා’රූපපා අනිස්සිතා.]

(කාමාවචරවිපාක තෙවිස්සය පඤ්චද්වාරාවර්ජන-හසනචිත්ත-ප්‍රතිඝචිත්තමය වශයෙන් සත්විසි කාමාවචරචිත්තයෝ ද, පඤ්චදස රූපාවචරචිත්තයෝ ද, ප්‍රථමමාර්ගය ද යන මේ) තෙසාළිස් චිත්තයෝ (ෂඩ්වස්තූන්) නිසා ම උපදනාහ; (ප්‍රතිඝචිත්තද්වයවර්ජිත දශඅකුශලයහ කාමාවචරකුශල-ක්‍රියාවශයෙන් සොළසෙක, අරූපාවචර කුශල-ක්‍රියාවශයෙන් අටදෙනය, මනොද්වාරාවර්ජනය, ප්‍රථමමාර්ගවර්ජිත සප්තලොකොත්තරයෝ ද, යන) දෙසාළිස් චිත්තයෝ (චතුවොකාරභවවශයෙන් හෘදයවස්තුව) නොනිසා ද (පඤ්චවොකාරභවවශයෙන් හෘදයවස්තුව) නිසා ද උපදනාහ; අරූපාවචරවිපාකයෝ (හෘදයවස්තුව) ආශ්‍රය නොකරණලද්දහු ම උපදනාහුයි.

(ප්‍රකීර්ණකසංග්‍රහවිභාග නම්වූ තෘතීයපරිච්ඡේදය නිමි.)

මේ යථොක්තක්‍රමයෙන් වෙදනාදි, චතුස්කන්ධසංඛ්‍යාත චිත්තොත්පාදයන්ගේ වෙදනාසංග්‍රහාදි විභාගහෙයින් උතුම්වූ ප්‍රභෙදසංග්‍රහය කොට නැවත කාමාවචරාදි ත්‍රිවිධභූමීන්ගේ ද ද්විහෙතුකාදි පුද්ගලයන්ගේ ද ප්‍රභෙදයෙන් උපලක්ෂිතවූ (මේ චිත්තය, මෙතෙක් චිත්තයන්කෙරෙන් උපදී මේ චිත්තය හට අනන්තරව මෙතෙක් චිත්තයෝ උපදිතියි, මෙසේ) පූර්වාපරචිත්තයන් විසින් නියම කරණලද චිත්තොත්පාදයන්ගේ ප්‍රවෘත්තාකාර සංග්‍රහ කරණ බැවින් ප්‍රවෘත්තිසංග්‍රහ නම්වූ සංග්‍රහයක් ප්‍රතිසන්ධියෙහි ද භවාඞ්ග-වීථිචිත්ත ප්‍රවෘත්තියෙහි ද ලැබෙන ලැබෙන පරිද්දෙන් සංක්ෂෙපයෙන් කියමි;—කෙසේද?

ෂඩ්වස්තූහ, ෂඩ්ද්වාරයහ, ෂඩාලම්බනයහ, ෂඩ්විඥානයහ, ෂඩ්වීථියහ, ෂඩ්ප්‍රකාරවූ විෂයප්‍රවෘත්තියයි, වීථිචිත්තසංග්‍රහයෙහි ෂට්කයෝ සදෙනෙක් දත යුත්තාහුයි;—මෙහි වස්තු-ද්වාරාලම්බනසංග්‍රහයෝ යට කියනලද්දහු දු සම්පූර්ණ කොට ප්‍රවෘත්තිසංග්‍රහය දක්වනපිණිස නැවත කියනලදහයි දත යුතු.

වීථිනිර්මුක්තවූ ප්‍රතිසන්ධි-භවාඞ්ග-ච්‍යුතිචිත්තය යන මොවුන්ගේ වනෘගි කර්ම-කර්මනිමිත්ත-ගතිනිමිත්ත යන මොවුන්ගේ වශයෙන් විෂයප්‍රවෘත්තිතොමෝ ත්‍රිප්‍රකාර වන්නීයි.

ඒ ෂට්කයන් අතුරෙහි **වස්තු-ද්වාර-ආලම්බන** යන මොහු යට කියනලද ක්‍රම ඇත්තාහුමය.

චක්ෂුර්විඥානය, ශ්‍රොත්‍රවිඥානය, ඝ්‍රාණවිඥානය, ජිහ්වාවිඥානය, කායවිඥානය, මනොවිඥානය ද, යන මොහු **ෂඩ්විඥාන**යෝයි.

**වීථිහු** වනාහි චක්ෂුර්ද්වාරවීථිය යනාදීන් මෙසේ ෂඩ්ද්වාරවශයෙන් හෝ චක්ෂුර්විඥානවීථිය යනාදීන් මෙසේ ෂඩ්විඥානයන්ගේ වශයෙන් හෝ ෂඩ්ද්වාරයෙහි ප්‍රවෘත්තවූ ආවර්ජනාදි වීථිචිත්තයන්ගේ ප්‍රවෘත්තීහු යෙදියයුත්තාහුයි.

අතිමහන්තාලම්බන යයි ද, මහන්තාලම්බන යයි ද, පරිත්තාලම්බන යයි ද, අතිපරිත්තාලම්බනය දැයි පඤ්චද්වාරයෙහි මොහු සතරදෙන ද; මනොද්වාරයෙහි විභූතාලම්බනය ද, අවිභූතාලම්බනය ද, යන මොහු දෙදෙන දැයි; ෂට්ප්‍රකාරයකින් **ආලම්බනප්‍රවෘත්ති**තොමෝ දතයුත්තීයි;—මෙහි-

එක් චිත්තක්ෂණයක් ඉක්ම සොළොස් චිත්තක්ෂණයකට ආයු ඇතිව ආපාථගතවූ අරමුණ **අතිමහන්තනම්** වෙයි.

දෙතුන් චිත්තක්ෂණයක් ඉක්ම පසළොස්-තුදුස් චිත්තක්ෂණයකට ආයු ඇතිව හමුවූ අරමුණ **මහන්ත** නම් වෙයි.

දශචිත්තක්ෂණයෙහි පටන් පසළොස් චිත්තක්ෂණය දක්වා ඉක්ම සත් චිත්තක්ෂණයෙහි පටන් දෙචිත්තක්ෂණය දක්වා හමුවූ අරමුණ **පරිත්ත** නම් වෙයි.

සතර චිත්තක්ෂණයෙහි පටන් නවචිත්තක්ෂණය දක්වා ඉක්ම තෙළෙස් චිත්තක්ෂණයෙහි පටන් අට චිත්තක්ෂණය දක්වා ආයු ඇතිව හමුවූ අරමුණ **අතිපරිත්ත** නම් වෙයි.

ප්‍රකටවූ අරමුණ **විභූත** නම් වේ.

ප්‍රකට නුවූ අරමුණ **අවිභූත** නම් වේ.

අතිමහන්තාදි වශයෙන් විෂයව්‍යවස්ථාව කෙසේද?—උත්පාද-ස්ථිති-භඞ්ග වශයෙන් ක්ෂණත්‍රයෙක් එක්චිත්තක්ෂණයෙක් නම් වේ;—එබඳු සතළොස් චිත්තක්ෂණයන්ගේ ක්ෂණයන් වැනි ක්ෂණයෝ වනාහි හෙවත් එක්පණස් චිත්තක්ෂණයෝ වනාහි නොහොත් ඒ ත්‍රිලක්ෂණයෙන් යුක්තවූ සතළොස් චිත්තක්ෂණකෙනෙක් වනාහි විඥප්තිලක්ෂණරූපවර්ජිතවූ රූපධර්මයන්ගේ ආයුඃප්‍රමාණයි;—මේ විඥප්තිවය එකෙකි චිත්තක්ෂණායුෂ්කවූයේ කියන ලද, ලක්ෂණරූපයන්කෙරෙහි දු ජාතිතොමෝ චිත්තයාගේ උත්පාදක්ෂණය හා සමානායුෂ්කය, අනිත්‍යතාතොම චිත්තයාගේ භඞ්ගක්ෂණය හා සමානවූ ආයු ඇත්තීය, ජරතා වනාහි එකුන්පණස් චිත්තක්ෂණයකට ආයු ඇත්තී යයි දතයුතු;—එක් චිත්තක්ෂණයක් ඉක්මුනාවූ හෝ බොහෝ චිත්තක්ෂණයන් ඉක්මුනාවූ හෝ ස්ථිතිප්‍රාප්තවූ ම රූපාදි පඤ්චාලම්බනයෝ චක්ෂුඃප්‍රසාදාදිවූ පඤ්චද්වාරයෙහි ගෝචර භාවයට පැමිණෙත්;—මෙහි රූප-ශබ්දාලම්බන දෙදෙන තමන් තමන්ගේ ස්ථානයෙහි සිට ම විෂයබවට පැමිණෙති; ගන්ධාදිහු වනාහි ඝ්‍රාණාදිවූ නිශ්‍රයෙහි අල්ලීනවූවාහු ම විඥානොත්පත්තියට කාරණයෝයි; එහෙයින් එක් චිත්තක්ෂණයක් ඉක්මුණාවූ රූපාලම්බනයෙක් චක්ෂුඃප්‍රසාදයට ඉදින් ගොචරබවට පැමිණියේ වේ ද, ඉක්බිත්තෙන් භවාඞ්ගචලන-භවාඞ්ගොපච්ඡේදවශයෙන් දෙවාරයෙක්හි භවාඞ්ගචිත්තය චිත්තාන්තරොත්පාදයට හෙතුභාවයේ චලනාකාරයෙන් ප්‍රවෘත්තකල්හි,—එසේමැයි චක්ෂුඃප්‍රසාදාදි පඤ්චප්‍රසාදයන් යොග්‍යදෙශාවස්ථාවශයෙන් ආලම්බනයෙහි ගැටුනුකල්හි ප්‍රසාදඝට්ටනානුභාවයෙන් භවාඞ්ගසන්තතිතොමෝ සිඳෙනුලබන්නී වහා නොසිඳේ; යම්සේ වේගයෙන් දිවෙමින් සිටිනා කැමැත්තා ද වූ පුරුෂතෙම එක් දෙපදවාරයක් ඉක්ම පියා සිටී ද එපරිද්දෙන් දෙවාරයෙක්හි ඉපිද සිඳෙන්නීයි.

ප්‍රථමචිත්තයා භවාඞ්ගසන්තානය චලනය කරන්නාක්හු මෙන් උපදිනුයි **භවාඞ්ගචලන** නම් වේ.

දෙවන චිත්තය භවාඞ්ගසන්තානය සිඳිනා ආකාරයෙන් උපදිනාහෙයින් **භවාඞ්ගොපච්ඡේද** නම් වේ.

මෙහි වනාහි "දෙවරක් භවාඞ්ගචලනය වූකල" යනුසාමාන්‍යයෙන් කියන ලදී;—මෙහි රූපාදින්විසින් ප්‍රසාදය ඝට්ටනය කරණලදකල්හි තන්නිශ්‍රිතව

ඥනයාගේ ම චලනය යුක්තය, හෘදය වස්තුව සන්නිශ්‍රිතවූ භවාඞ්ගයාගේ චලනය කෙසේ වේද යත්? සන්තතිවශයෙන් එකාබද්ධවහෙයින්; යම්සේ බෙර එක්තලයෙක්හි තුබූ හකුරෙහි මැස්සෙකු හුන්කල්හි අනික්තලය දණ්ඩාදීන් ප්‍රහෘතකල්හි අනුක්‍රමයෙන් භෙරි-චර්ම-වරත්‍රාදීන්ගේ චලනයෙන් ශරීරාව චලිතකල්හි මැස්සාගේ පැණිපියා නැගියාම වේ ද එපරිද්දෙන් රූපාදීන් ප්‍රසාදරූපය සඞ්ඝර්ෂණය කරණකල්හි තන්නිශ්‍රිතවූ මහාභූතයන්ගේ චලනය වූකල්හි අනුක්‍රමයෙන් තත්සම්බන්ධ අවශේෂරූපයන්ගේ ද චලනයෙන් හෘදයවස්තුව චලිතකල්හි තන්නිශ්‍රිතවූ භවාඞ්ගයාගේ චලනාකාරයෙන් ප්‍රවෘත්තිය වේ;—(කියනලදමැයි)

ඝට්ටෙ තෙ අඤ්ඤමඤ්ඤම්හි අඤ්ඤනිස්සිතකං පන,
එකාබද්ධෙන හොතී'ති සක්ඛරෝ'පමයා වදෙ—යි.

භවාඞ්ගප්‍රවාහය සිදගෙණ එම රූපාලම්බනය වේ කිමෙක් නම් දැයි කියන්නාක්හු මෙන් ආභොගකෙරෙමින් පඤ්චද්වාරාවර්ජනචිත්තය ඉපද නිරුද්ධ වන්නේය, ඉක්බිත්තෙන් ඒ පඤ්චද්වාරාවර්ජනචිත්තයාට ඉක්බිතිව එම රූපාලම්බනය ප්‍රත්‍යක්ෂහෙයින් දක්මින් චක්ෂුර්විඥනයය, එමරූපාලම්බනය පිළිගන්නාක්හු මෙන් සම්ප්‍රතීච්ඡනචිත්තය, එම රූපාලම්බනය මනාකොට සලකන්නාක්හු මෙන් සන්තීරණචිත්තය, එම රූපාලම්බනය නියමකෙරෙමින් ව්‍යවස්ථාපනචිත්තය යන මොහු පිළිවෙළින් ඉපද නිරුද්ධ වෙත්; ව්‍යවස්ථාපනචිත්තයෙන් මත්තෙහි කුසල් අකුසල් විස්සය, මහාක්‍රියා අටය, හසිතොත්පාදය, යන එකුන්තිස් කාමාවචරජවනයන් අතුරෙන් ලබ්ධවූ යොනිසොආවර්ජනාදී ප්‍රත්‍යයඇති යම්කිසි ජවනයෙක් බාහුල්‍යවශයෙන් සත්වාරයෙක්හි දිවන්නේයි, පවත්නේයයි සේයි;—මෙහි යොනිසොආවර්ජනා පැවැත්ත කුසලජවන වෙයි, අයොනිසොආවර්ජනා පැවැත්තහොත් අකුසල්ජවන් වෙයි, ක්ෂීණාශ්‍රවසන්තානයෙක් විනම් ක්‍රියාජවනවෙයි සේයි;—මෙහි "බාහුල්‍යවශයෙන්" යනු මූර්ඡාමරණාසන්නකාලයෙහි ජවනයන් ස්දෙනෙකුත් පස්දෙනෙකුත් උපදනාහෙයිනි;—උඩුගං බලා යන නැව අනුව යන්නාවූ ජලප්‍රවාහය මෙන් කිසිකලෙක්හි ජවනයන් අනුව ගියාවූ තදාලම්බන නම්වූ විපාකචිත්තයෝ දෙදෙනෙක් ආලම්බන-ජවනසන්තානානුරූපව පවතිත්;—ඒ තදාලම්බනයන්ට ඉක්බිතිව වීථිචිත්තවශයෙන් නොපැවති චිත්තයාගේ භවාඞ්ගයෙහි ගිමක් මෙන් භවාඞ්ගවශයෙන් උත්පත්තිය වෙයි සේයි;—මෙහි වීථිචිත්තප්‍රවෘත්තිය සුවසේ දැනගන්නාපිණිස අම්බොපමායෙක් කියනුලැබේ;—එක් පුරුෂයෙක් පලගත් අඹගසක් මුල හිස වසා පෙරවගෙණ නිදන්නේ තමා ආසන්නයේ හුණුවාවූ අඹපෙකෙක ශබ්දයෙන් පිබිදි හිසින් පෙරවූත් වස්ත්‍රය පහකොට ඇස දල්වා දැක ඒ අඹපක ගෙණ අතින් මැඩ හිඹපියා විලිකුන්බව දැන අනුභව කොට මුඛගතවූ අවශේෂය ශ්ලෙෂ්මය හා සමග අනුභව කොට නැවත එහි ම එම ලෙසින් ම නිදන්නේයි;—මෙහි උපමාසාම්‍යය මෙසේ දතයුතු;—ඒ පුරුෂයා නිදනකාලය මෙන් චිත්තයා භවාඞ්ගවශයෙන් පවත්නා කාලයය, අඹපක හුණුකල මෙන් ආලම්බනය ප්‍රසාදයෙහි ගැටුනු කාලය, අඹපක හුණුශබ්දය මෙන් පිබිදගියකල ආවර්ජනය උපන්කාලය; ඒ පුරුෂයා ඇස දල්වා බැලූකල මෙන් චක්ෂුර්විඥනයාගේ ප්‍රවෘත්තිකාලය, දැක අඹපක ගත්කල මෙන් සම්ප්‍රතීච්ඡණය උපන්කාලය, දැඩිබව මොලොක්

ත්බව දන්නාවූණිය අනින් මැඩිකල මෙන් සන්තීරණයා උපන්කාලය,
අනින් මැඩ පිළිකුත්බව නියත කරණුවූණිය ගිඹපු කලක් මෙන් ව්‍යවස්ථා
පනචිත්තය උපන්කාලය, අඹපක අනුභව කළ කාලය මෙන් ජවනයන්
උපන්කාලය, මුවගතවූ ශේෂය ශෙලෂ්මය හා සමග අනුභව කළ කාලය
මෙන් තදාලම්බනසිත් උපන් කාලය, නැවත ගිය වයා පෙරවාගෙණ නිදන
කල මෙන් නැවත භවාංගපාතකාලයයි දතයුතු;—මේ උපමායෙන් කුමක්
ප්‍රකාශ කරණලද්දේදයත්?-ආලම්බනයාගේ කෘත්‍යයනම් ප්‍රසාදඝට්ටණය මය,
ආවර්ජනයාගේ කෘත්‍යයනම් විෂයාභොගය මය, චක්ෂුර්විඥානයාගේ කෘත්‍යය
නම් ඒ දර්ශනමාත්‍රය, සම්ප්‍රතිච්ඡණාදීන්ගේ කෘත්‍යය නම් ප්‍රතිග්‍රහණාදි මාත්‍ර
යෙක්මය, ජවනයාගේ වනාහි කෘත්‍යයනම් ආලම්බනරසානුභවනයමය, තදාල
ම්බනයන්ගේ කෘත්‍යය නම් ජවනයන්විසින් අනුභූතවූ ආලම්බනයාගේ අනුභව
නය යි, මෙසේ කෘත්‍යවශයෙන් ධර්මයන්ගේ අන්‍යොන්‍යඅසඞ්කීර්ණතාව
ප්‍රකාශ කරණලද්දේ වේ;—මෙසේ පවත්නාවූ චිත්තය වනාහි තෝ ආවර්ජන
නම්, භවාඞ්ගයට අනතුරුව උපදවිතෝ දර්ශනාදීන් අතුරෙන් එකෙක්ව ආවර්ජ
නනානන්තරව උපද, යනාදීන් නියොග කරණ එක්තරා එකකුවත් කාරකයෙ
කුවත් නැතිකල්හිදු ස්වනුබීජනියමාදීන් සෙයින් චිත්තනියමවශයෙන්
පවත්නේයයි දතයුතු;—ආවර්ජනාදි තුදුස් වීථිචිත්තයෝය, භවාඞ්ගචලන-භ
වාඞ්ගොපච්ඡේදවශයෙන් චිත්තයෝ දෙදෙනය, පූර්වභාගයෙහි ම අතික්‍රාන්ත
වූ එක් චිත්තක්‍ෂණයෙක් දැයි, කියා මෙපමණකින් සතළොස් චිත්තක්‍ෂණයෝ
පිරෙන්නාහුයි; එයින් මත්තෙහි ආලම්බනය නිරුද්ධ වන්නේයි; මේ ආලම්බ
නය "**අතිමහන්තාලම්බන**" නම් වේ;—තදාලම්බනයාගේ උත්පත්තිය දක්වා
වනාහි නොසෑහෙනුව අතික්‍රාන්තවූ චිත්තක්‍ෂණ ඇතිව විෂයබවට පැමිණි
යාවූ අරමුණ "**මහන්තාලම්බන**" නම් වේ;—ඒ මහන්තාලම්බනයෙහි ජවන් ඉපද
අනතුරෙහි වීථිචිත්තවශයෙන් නොපැවත භවාඞ්ගවශයෙන් ම පවත්නේයි;-
පූර්වභාගයෙහි ම දෙතුන් චිත්තක්‍ෂණයක් ඉක්ම ගියහෙයින් තදාලම්බනයන්ගේ
උත්පත්තිය නැති;—මෙහි තුන් චිත්තක්‍ෂණයක් ඉක්ම තුදුස් චිත්තක්‍ෂණය
කට ආයු ඇති අරමුණෙහි ජවන් ඉපද නිරුද්ධවන්නා ම ආලම්බන නිරුද්ධහෙ
යින් තදාලම්බනයන්ගේ උත්පත්තිය නැති; එසේ මැයි එකච්චියෙහි සමහර
කෙනෙකුන් වර්ත්තමානාලම්බනකල්හි සමහරකෙනෙක් අතීතාලම්බන නොව
න්නාහ; එසේ හෙයින්ද චිත්තක්‍ෂණ දෙකක් ඉක්ම පසළොස් චිත්තක්‍ෂණය
කට ආයුඇති අරමුණෙහිදු ජවනයන්ගේ උත්පත්තියෙන් මත්තෙහි එක ම
චිත්තක්‍ෂණයෙක් අවශිෂ්ටනුයි එක් තදාලම්බනයකුදු උපදනාකල් ඇත,
දෙවාරයෙක්හි තදාලම්බනයන්ගේ උත්පත්තියට නොසෑහෙනබව හෙයින්
චිතිය තදාලම්බනයාගේ උත්පත්තියෙක් නැත්තුයි ප්‍රථමතදාලම්බනයාත් නොඋ
පදනේයි; කුමක්හෙයින්දයත්? අභිධර්මපාලියෙහි චිත්තප්‍රවෘත්තිගණන
යෙහි සියලුවාරයෙහි ම තදාලම්බනයන් දෙදෙනෙකුගේ ම උත්පත්තිය නියම
කරණලදබව හෙයිනි;—ජවනයන්ගේ උත්පත්තියදක්වා ද නොසෑහෙනුව
ඉක්මුනාවූ චිත්තක්‍ෂණඇතිව විෂයබවට පැමිණියාවූ අරමුණ "**පරිත්ත**" නම්
වෙයි;—ඒ පරිත්තාලම්බනයෙහි ජවන් නොඉපද හෙවත් ජවනයාගේ
අනුත්පත්තිය හෙතුකොටගෙණ දෙවාරයෙක්හි හෝ තුන්වාරයෙක්හි ව්‍යව
ස්ථාපනචිත්තය ද නැවත නැවත උපදනේයි;—ඒ ව්‍යවස්ථාපනචිත්තයා
කරා නොපැමිණ අතුරෙහි චක්ෂුර්විඥානාදියෙහි සිට චිත්තප්‍රවෘත්තියගේ
නිවෘත්තියෙක් නැති; මෙහි ව්‍යවස්ථාපනයාගේ උත්පත්තියෙන් මත්තෙහි

චිත්තක්ෂණයක් උපදනට ආයු ඇත්තා ද වූ අරමුණු අල්පායුෂ්කබැවින් දුර්වල බව හේතුකොටගෙණ ජවනයන්ගේ උත්පත්තියට ප්‍රත්‍යය නොවෙයි, ජවනයෝ උපදනාහු නියමයෙන් තමන් සත්වාරයෙක් උපදනට ආයුඇති අරමුණෙහි ම උපදනාහ, සම්පූර්ණව උපදනට ආයු මදවූ අරමුණෙහි සර්වප්‍රකාරයෙන් නොඋපදනාහ, යන මෙහි අභිප්‍රායෙන් "ජවන ය ද නොඋපදී" යනාදි කීහ;—එයින් මත්තෙහි චිත්තයා භවාඞ්ගවශයෙන් පවත්නේයි; ව්‍යවස්ථාපනයාගේ උත්පත්තිය දක්වා වන්නාහි නොසෑහෙනුව ඉක්මුනාවූ චිත්තක්ෂණ ඇතිව විෂයබවට පැමිණියාවූ භවාඞ්ගයට ආසන්නවූ ඒ ආලම්බනය "**අතිපරිත්ත**"නම් වේ;—ඒ අතිපරිත්තාලම්බනයෙහි භවාඞ්ගචලනය ම වේ; (උත්කෘෂ්ටපක්ෂයෙන්) චිත්තක්ෂණ සතකට ආයුඇත්තාවූ ආලම්බනයාගේ ද දෙතුන්වරෙක්හි (ව්‍යවස්ථාපනචිත්තයාගේ උත්පත්තියට නොසෑහෙන බවහෙයින්) ආවජ්ජනාදි වීථිචිත්තයන්ගේ උත්පත්තිය නැති; භවාඞ්ගපාත ම වෙයි යනු අභිප්‍රායයි;—මේ උක්තක්‍රමයෙන් චක්ෂුර්වාරයෙහි ද එසේ ම ශ්‍රොත්‍රවාරාදියෙහි දැයි සර්වප්‍රකාරයෙන් ම චක්ෂුර්වාරාදිවූ පඤ්චවාරයෙහි තදාලම්බනවාරය ජවනවාරය ව්‍යවස්ථාපනවාරය සර්වප්‍රකාරයෙන් ම වීථිචිත්තප්‍රවෘත්ති නැතිහෙයින් මොඝවාරය යි කියනලද සතරවාරයන්ට පිළිවෙළින් ප්‍රත්‍යයවූ විෂයප්‍රවෘත්තිතොමෝ සතරප්‍රකාරයකින් දතයුත්තීයි;—මෙහි මොඝවාරය යි සර්වප්‍රකාරයෙන් වීථිචිත්තප්‍රවෘත්තිය නැතිහෙයින් පශ්චිමවාරය ම කියනලද; සෙසුතැන්හි වනාහි විනිශ්චය-තෘතීයවාරයෝ ද තදාලම්බන-ජවනයන් විසින් සිස්හෙයින් "මොඝවාර" යයිකියනලදහ;—(කියනලදමැයි,)

[වීථිචිත්තානි සත්තේ'ව චිත්තුප්පාදා චතුද්දස,
චතුපඤ්ඤාස විත්ථාරා පඤ්චවාරෙ යථාරහං.]

පඤ්චවාරයෙහි (ඒ ඒ වාර ඒ ඒ ප්‍රත්‍යය ඒ ඒ ආලම්බනයට අනුරූපපරිච්ඡෙදෙන් උපදනාවූ) ආවජ්ජනාදී වීථිචිත්තයෝ සද්දෙනෙක් ම වෙති, (චිත්තයන්ගේ වෙන වෙන උත්පත්තිවශයෙන්) චිත්තොත්පාදයෝ (ආවජ්ජනාදී පඤ්චක-සප්තක ජවන-තදාලම්බනවශයවශයෙන්) තුදුසක් ම වෙති, විස්තරහෙයින් වනාහි (සියලු කාමාවචරයන් ම සංග්‍රහවූ පරිච්ඡෙදෙන් පඤ්චවාරයෙහි උපදනාහෙයින්) සූපණසෙක් වෙති.

### මේ විෂයප්‍රවෘත්තිසඞ්ග්‍රහයෙහි මේතෙම පඤ්චවාරයෙහි වීථිචිත්ත ප්‍රවෘත්ති ක්‍රමයයි.

ඉක්බිති මනොවාරිකචිත්තයන්ට අතීතවූ ද අනාගතවූ ද අරමුණ විෂය වේනුයි ඔවුන්ට අතිමහන්තාදිවශයෙන් විෂයව්‍යවස්ථාව නියම කරන්ට නොපිළිවන්නුයි විභූතාවිභූතවශයෙන් ම විෂයව්‍යවස්ථාව නියමකරණපිණිස "මනොවාරයෙහි වනාහි ඉදින් විභූතාලම්බනය" යනාදී කීයනලදී.

මනොවාරයෙහි වනාහි ඉදින් විභූතාලම්බනය විෂයබවට පැමිණියේ වේ ද ඉක්බින්තෙන් භවාඞ්ගචලන-මනොවාරාවජ්ජන-ජවනයන්ගේ අවසානයෙහි තදාලම්බන-විපාකයෝ පවතිත්;—එයින් මත්තෙහි භවාඞ්ගපාත වන්නේයි;—අවිභූතාලම්බනයෙහි වනාහි ජවනුන්ගේ අවසානයෙහි භවාඞ්ගපාතය ම වෙයි, තදාලම්බනයන්ගේ උත්පත්ති නැති;—(කියනලදමැයි.)

[වීථිචිත්තානි තීණේ'ව චිත්තුප්පාදා දසේ'රිතා,
විත්ථාරෙන පනේ'ත්ථේ'කචත්තාළීස විභාවයෙ.]

මේ මනොද්වාරයෙහි (ආවර්ජනාදි) චිත්තයෝ (මනොද්වාරාවර්ජන-ජවන-තදාලම්බනවශයෙන්) තුන්දෙනෙක් ම වෙති, චිත්තයන්ගේ වෙන වෙන උත්පත්තිවශයෙන්) චිත්තොත්පාදයෝ (ආවර්ජන-සප්තජවන-තදාලම්බනද්වයවශයෙන්) දසදෙනෙක් ම කියනලදහ, විස්තරහෙයින් වනාහි (පඤ්චද්වාරයෙහි ම නියමව උපදනාවූ පඤ්චවිඥාන-මනොධාතුත්‍රිකවශයෙන් මේ තෙළෙස් චිත්තයන් හැර අවශෙෂ) එක්සාළිස් කාමාවචරචිත්තයන් ප්‍රකාශ කරන්නේයි.

## මේ මනොද්වාරයෙහි මේතෙම කාමාවචරජවනවාරයයි.

මහද්ගත-ලොකොත්තරඅර්පණාජවනවාරයෙහි වනාහි ආලම්බනයාගේ විභූතයෙහි ම අර්පණා සම්භවනහෙයින් විභූතා'විභූතභෙදයෙක් නැති; එසේ ම තදාලම්බනයන්ගේ උත්පත්තියත් නැති;-ඒ අර්පණාජවනවාරයෙහි ඥානසම්ප්‍රයුක්තකාමාවචරජවනයන් අටදෙනා අතුරෙන් එක්තරා ජවනයක් පරිකර්මය උපචාරය අනුලොමය ගොත්‍රභූය යන මේ නාමයෙන් සතරවාරයෙක්හි හෝ උපචාරා'නුලොම-ගොත්‍රභූනාමයෙන් තුන්වාරයෙක්හි ම හෝ පිළිවෙළින් ඉපද නිරුද්ධවූ කල්හි ඕහට ඉක්බිතිව ම ක්ෂිප්‍රාභිඥ-දන්ධාභිඥ යන මොවුන්ට අනුරූපපරිච්ඡෙදෙන් සතරවනුව හෝ රූපාවචරකුශල-ක්‍රියාවශයෙන් දශය, එසේ ම රූපාවචර අටය, ලොකොත්තර අටයයි, මෙසේ සවිසි මහද්ගත-ලොකොත්තරයන් අතුරෙන් යම් කිසි ජවනයෙක් රූපා'රූප-ලොකොත්තරමාර්ග-ඵලානුරූප සමථ-විදර්ශනාභාවනා-චිත්තප්‍රාර්ථනානුරූපවශයෙන් අර්පණාවීථියට බස්නේයි;—මෙහි—

අර්පණාචිත්තයට පූර්වභාගයෙහි පරිකර්මබවහෙයින් ප්‍රථමචිත්තය "**පරිකර්ම**" නම් වෙයි.

ද්විතියචිත්තය අර්පණාවට සමීපචාරිහෙයින් "**උපචාර**" නම් වෙයි; එසේ මැයි අත්‍යාසන්න නොවූයේ ද අතිදූරවර්ති නොවේනුයි සමීපචාරි නම් වෙයි.

තෘතීයචිත්තය පූර්වභාගයෙහි පරිකර්මචිත්තයන්ට ද මත්තෙහි අර්පණාවට ද අනුකූලබවහෙයින් "**අනුලොම**" නම් වේ.

සතරවන චිත්තය පරිත්තගොත්‍රයාගේ ද පෘථග්ජනගොත්‍රයාගේ ද අභිභවනය කරණහෙයින් මහද්ගතගොත්‍රයාගේ ද ලොකොත්තරගොත්‍රයාගේ ද වැඩීම කරණහෙයින් ද "**ගොත්‍රභූ**" නම් වේ.

මෙහි ක්ෂිප්‍රාභිඥයන්ට උපචාර-අනුලොම-ගොත්‍රභූවශයෙන් තුන්වාරයෙක්හි ප්‍රවෘත්තවූ කාමාවචරජවනයන්ට ඉක්බිතිව සතරවනුව අර්පණාචිත්තය උපදනේය, දන්ධාභිඥයන්ගේ වශයෙන් පරිකර්මොපචාරානුලොම-ගොත්‍රභූනාමවශයෙන් සතරවාරයෙක්හි ප්‍රවෘත්තවූ කාමාවචරජවනයන්ට අනතුරුව පස්වනුව අර්පණාචිත්තය උපදනේය, යම්හෙයකින් වනාහි අලබ්ධවූ ආසෙවනය ඇති අනුලොමචිත්තයතෙම ගොත්‍රභූචිත්තය උපදවන්ට අසමර්ථ ද යම්හෙයකින් ලබ්ධවූ ආසෙවනඇත්තාවූ ද සවන-සත්වන චිත්තයතෙමේ භවාඞ්ගයට ආසන්න බැවින් ප්‍රපාතාසන්නයෙහි පිහිටාගන්නට අසමර්ථ පුරුෂයා මෙන් අර්පණාවශයෙන් පිහිටන්ට අසමර්ථ වේ ද එසේහෙයින් සතරවන්නෙන් යට හෝ පස්වන්නෙන් මත්තෙහි හෝ අර්පණා නුපදනේයි දතයුතු.

එයින් මත්තෙහි සතරවනුව පස්වනුව උපන් අර්පණාවිත්තයාගේ අවසානයෙහි භවාඞ්ගපාතය ම වේ;--එහි "ඉන්මත්තෙහි භවාඞ්ගපාතය ම වෙයි" කීකල්හි ම සතරවනුව පස්වනුව උපන් අර්පණාවිත්තයෙන් ම මත්තෙහි භවාඞ්ගපාත වනබව් හැඟෙතුදු නැවත "අප්පණාවසානෙයති" යනු මාර්ගානන්තර ඵලචිත්තය මෙන්ද සමාපත්තිවීථියෙහි ධ්‍යානඵලචිත්තයන් මෙන්ද නැවත නැවත නොඋපදනාහ යි දන්නාපිණිස කියනලද්;—ඒ ඥානසම්ප්‍රයුක්ත කාමාවචරජවනයන් අටදෙනා අතුරෙන් සොම්නස්සහගියාවූ කුශල-ක්‍රියාවශයෙන් චතුර්විධවූ ජවනයන්ට ඉක්බිතිව මහද්ගත-ලොකොත්තරඅර්පණාදි සොම්නස්සහගතවූ ප්‍රථමාදිවූ ධ්‍යානයන් සතරදෙනාගේ වශයෙන් ද ශුෂ්කවිදර්ශකාදීන්ගේ මාර්ග-ඵලවශයෙන් සොම්නස්සහගත වීම කැමති වියයුතුයි;-භින්නවේදනාවන්ගේ අනන්‍යොන්‍යආසෙවනප්‍රත්‍යයක් නැතිහෙයින් උපෙක්ෂාසහගත නොවන්නේයි යේයි;—උපෙක්ෂාවෙදනාවෙන් යුක්තවූ කුශල-ක්‍රියාවශයෙන් චතුර්විධවූ ජවනයන්ට ඉක්බිතිව උපෙක්ෂාසහගතවූ ම අර්පණාතොමෝ කැමැති වියයුතුයි;—ඒ එකවෙදනාජවනවාරයෙහිදු චතුර්විධවූ ඥානසම්ප්‍රයුක්තවූ කුශලජවයන්ට ඉක්බිතිව කුශලජවනයන් ද සමාපත්තිවීථියෙහි අර්හත්ඵලයෙන් යට සෝවාන්ඵලාදිවූ ඵලත්‍රය ද පිහිටන්නේයි;—චතුර්විධවූ ඥානසම්ප්‍රයුක්තකාමාවචරක්‍රියාජවනයන්ට ඉක්බිතිව ක්‍රියාජවනයන් ද අර්හත්ඵලය ද පිහිටන්නේයි;—(කියනලදමැයි)

[ද්වත්තිංස සුඛපුඤ්ඤම්හා ද්වාදසො'පෙක්ඛකා පරං,
සුඛිතක්‍රියතො අට්ඨ ඡ සම්භොන්ති, උපෙක්ඛකා.]

සොම්නස්සහගියාවූ ත්‍රිහෙතුකවූ කුශලයන් දෙදෙනාකෙරෙන් පරව අග්‍රඵල-විපාක-ක්‍රියාවර්ජිතවූ ලෞකිකධ්‍යානසතරය ලොකොත්තරධ්‍යානඅටවිස්සය යි මෙසේ ලෞකික-ලොකොත්තර ධ්‍යානයන් සතරදෙනාගේ වශයෙන් දෙතිස් අර්පණාවිත්තකෙනෙක් සම්භවන්නාහ; ත්‍රිහෙතුක උපෙක්ෂාසහගතකුශලයන් දෙදෙනාකෙරෙන් පරව ලෞකිකකුශලපඤ්චමධ්‍යානසතරය ලොකොත්තරපඤ්චමධ්‍යාන සතරය, අරූපාවචර කුශල් සතරය යි, මෙසේ දොළොස් අර්පණාවිත්තකෙනෙක් සම්භවන්නාහ; සොම්නස්සහගත ත්‍රිහෙතුකක්‍රියාවිත්තයන් දෙදෙනාකෙරෙන් පරව ලෞකිකක්‍රියාධ්‍යානචතුෂ්කයාගේ ද තත්පාදන්නාකඅග්‍රඵලචතුෂ්කයාගේ ද වශයෙන් අර්පණාවිත්තයෝ අටදෙනෙක් සම්භවන්නාහ; උපෙක්ෂාසහගතවූ ත්‍රිහෙතුකවූ ක්‍රියාජවනයන් දෙදෙනාකෙරෙන් පරව ලෞකික-ලොකොත්තර-ක්‍රියාපඤ්චමධ්‍යානරූපා' රූපාවචරඅග්‍රඵලචතුෂ්කවශයෙන් අර්පණාවිත්තයෝ සදෙනෙක් වන්නාහුයි.

[පුථුජ්ජනාන සෙක්ඛානං කාමපුඤ්ඤා තිහෙතුතො,
තිහෙතුකාමක්‍රියතො වීතරාගානමප්පණා.]

පෘථග්ජනයන්ට ද ශෛක්ෂයන්ට ද ත්‍රිහෙතුකවූ කාමාවචරකුශලචිත්තයන් කෙරෙන් පරව ධ්‍යානය වන්නේය; ක්ෂීණාශ්‍රවයන්ට ත්‍රිහෙතුකකාමාවචරක්‍රියාචිත්තයාකෙරෙන් පරව ධ්‍යානය වන්නේයි.

## මේ අර්පණාජවනවාරයෙහි මෙතෙම මනොද්වාරයෙහි වීථිචිත්තයන්ගේ ප්‍රවෘත්තික්‍රමයයි.

මේ වීථිසඞ්ග්‍රහාධිකාරයෙහි චක්ඛුද්වාරයෙහි ද මනොද්වාරයෙහි ද යන මේ සියල්ලෙහි අනිෂ්ටාලම්බනයෙහි අකුශලවිපාකවූම පඤ්චවිඥාන-සම්පටිච්ඡන-සන්තීරණ-තදාලම්බන යයන මොහු වෙත්;ඉෂ්ටමධ්‍යස්ථාලම්බනයෙහි

කුශලවිපාකවූ චක්ෂුර්විඥානාදීහු වෙත්. අතිඉෂ්ටාලම්බනයෙහි වනාහි සොම්නස්සහගතවූ ම සන්තීරණ-තදාලම්බනයෝ වෙත්;—මෙහි "සොම්නස්සහගතවූ ම" යන්නෙන් ඉෂ්ටමධ්‍යස්ථාලම්බනයෙහි සන්තීරණ-තදාලම්බනයෝ උපෙක්ෂාසහගතයෝ මැයි කිවා නම් වෙත්; එසේ මැයි කර්මානුභාවයෙන් පවත්නාවූ විපාකයාගේ දර්පණතලයෙහි මුඛනිමිත්ත මෙන් නිර්විකාරබැවින් කල්පනාකොට ගැනීමක් නැතිහෙයින් ආලම්බනවූ පරිද්දෙන් ම වෙදනායොගය වේ; අප්‍රහීණ ගවෙකලෂයන් ඇති සන්තානයෙහි කුශලාකුශලයන්ගේ වනාහි ප්‍රවෘත්තිය හෙතුකොටගෙණ අතිඉෂ්ටාලම්බනයෙහිදු ඉෂ්ටමධ්‍යස්ථය අනිෂ්ටාකාරහෙයින් ග්‍රහණය වන්නේය; අනිෂ්ටාලම්බනයෙහිදු ඉෂ්ටාකාරයෙන්ද ඉෂ්ටමධ්‍යස්ථාකාරයෙන්ද ග්‍රහණය වන්නේයි; එසේ මැයි බුඬාදිවූ අතිඉෂ්ටාලම්බනයෙහිදු තීර්ථකාදීන්ට ද දෞර්මනස්ජවන් උපදනේය, ගැඹුරුවූ සවභාව ඇතියන්ට හා උපෙක්ෂාප්‍රතිසන්ධිකයන්ට ද ප්‍රතිකූලවූ අරමුණෙහි උපෙක්ෂාජවන් වන්නේය; ශුනකාදීන්ට ද ඒ ප්‍රතිකූලවූ අරමුණෙහි සොම්නස් ජවන් උපදනේය; පූර්ව-පශ්චිමභාගයෙහි ප්‍රවෘත්තවූ විපාකයෝ වනාහි අශුචිදර්ශනයෙහිදු සුන්දරවූ සිත්ඇති ශුනකාදීන්ට ද යථාවස්තුක්‍රමයෙන් හෙවත් ආලම්බනවූ පරිද්දෙන් ම වෙතියි සේයි.

ඒ තදාලම්බනයන්කෙරෙහිදු සහෙතුකාහෙතුකවූ සොම්නස්සහගතවූ ක්‍රියාජවනයන් පස්සෙදනාගේ අවසන්හි තදාලම්බනයෝ සොම්නස්සහගියාහු ම වෙත්;—මෙහි ක්ෂීණාශ්‍රවයන්ගේ විත්තවිපර්‍ය්‍යාසයක් නැතිහෙයින් ක්‍රියාජවනයෝ ද ආලම්බනවූ පරිද්දෙන් ම පවතිත්නුයි "සොම්නස්සහගත ක්‍රියාජවනාවසානයෙහි" යනාදි කියනලදි;—උපෙක්ෂාසහගතවූ ක්‍රියාජවනයන්ගේ අවසානයෙහි උපෙක්ෂාසහගතවූ තදාලම්බනයෝ වෙත්; දෞර්මනස්සහගතවූ ජවනයන්ගේ අවසානයෙහි දු තදාලම්බනයෝ ද භවාඞ්ගචිත්තයෝ ද උපෙක්ෂාසහගත ම වෙත්; අන්‍යොන්‍යවිරුඬසවභාව ඇතිහෙයින් සොම්නස්සහගත නොවෙති සේයි; "සොම්නස්සසහගත ක්‍රියාජවනාවසානයෙහි" යනාදීන් ජවනයන්ගේ වශයෙන් දක්වනලද තදාලම්බනනියමය අව්‍යභිචාරිය "ඥානසම්ප්‍රයුක්තජවනයන්කෙරෙන් ඥානසම්ප්‍රයුක්තතදාලම්බනය වෙයි" යනාදින් ප්‍රවෘත්තවූයේ අනෙකාන්තිකය, බාහුල්‍යවශයෙන් අකුශලජවනයන්කෙරෙහි පරිචිතයහට කිසිකලෙක්හි කුශලජවනයන් දිවූකල්හි කුශලජවනයන්කෙරෙහි පරිචිතයහට කිසිකලෙක්හි අකුශලජවනයන් දිවූකල්හි ද අකුසලජවනානන්තරව ප්‍රවෘත්තවූ පරිචයබලයෙන් ත්‍රිහෙතුකජවනයන්කෙරෙන් පරව අහෙතුකතදාලම්බනයවේ; කුශලානන්තරව ප්‍රවෘත්තපරිචයබලයෙන් අකුශලජවනයන්කෙරෙන් ත්‍රිහෙතුකතදාලම්බන ද වේ; ප්‍රතිසන්ධිනිවර්තක කර්මයාකෙරෙන් අන්‍යවූ කර්මයෙන් වනාහි තදාලම්බනප්‍රවෘත්තියක් ඇතිකල්හි කියයුතු ම නැති;—එසේ හෙයින් ම ප්‍රස්ථානපාලියෙහි කියනලදි.

"අහෙතුකෙ ඛන්ධෙ අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සති, කුසලෙ නිරුද්ධෙ අහෙතුකො විපාකො තදාරම්මණතො උප්පජ්ජති, කුසලාකුසලෙ නිරුද්ධෙ සහෙතුකො විපාකො තදාරම්මණතො උප්පජ්ජති"යි,

යම්හෙයකින් දෞර්මනස්ජවනාවසානයෙහි උපෙක්ෂාසහගතතදාලම්බනයෝ ම වෙද්ද එසේහෙයින් සෞමනස්‍යප්‍රතිසන්ධිකයාහට දෞමනස්‍යජවනාවසානයෙහි කිසිසේත් තදාලම්බනසම්භවයෙක් නැත.(මෙහි" සෞමනස්‍යප්‍රතිසන්ධිකයහට" යන මේ වචනයෙන් ම දෞර්මනස්ජවනයන්ට ආසන්නව සොම්නස්සවා

භවාඞ්ගයාගේ නොවීම හෙයින් දෞර්මනස්ජවනානන්තරව භවාඞ්ගපාතභාවය ද ප්‍රකාශ කරණලදනුයි ඒ නොකියා තදාලම්බනභාවය ම කල්පනා කරන්නාහුය;) ඉදින් "තදාලම්බනසම්භවය නැතැයි" කීහුද? එසමයෙහි දුර්වීයෙහි පුරුදු කරණලද හෙවත් ඒ ඒ භවයෙහි බාහුල්‍යවශයෙන් ගන්නාලද්දවූ යම්කිසි කාමාවචරාලම්බනයක් අරබයා උපෙක්ෂාසහගියාවූ ආවර්ජනාරහිතවූ ද සන්තීරණචිත්තය නිරොධයෙන් නැගෙන්නාවූ අනාගාමි-අර්හත්ඵලචිත්තය උපදනා මෙන් උපදනේයි;-මෙහි බුද්ධාදී අතිඉෂ්ටාලම්බනයෙහි ද ප්‍රතිහත සිත් ඇති සොම්නස්ප්‍රතිසන්ධිකවූ තිස්සාදීන්ට දෞර්මනස්ජවන් දිවූකල යට කියනලද ක්‍රමයෙන් දෞර්මනස්ජවනයාන්ට ඉක්බිතිව සොම්නස්තදාලම්බනයන්ට අතිඉෂ්ටාලම්බනයෙහි ද උපෙක්ෂාසහගත තදාලම්බනයන්ට අතිඉෂ්ටාලම්බනයෙහි ද උපෙක්ෂාසහගතතදාලම්බනයන් ද නොඋපදනා හෙයින් කිසි අසප්පායෙකින් පිරිහුණාවූ ලෞකිකධ්‍යානය අරබයා මාගේ ප්‍රණීතධර්මය නැසිගියේය යි විප්‍රතිසාර උපදවන්නාවූ යොගාවචරයාහට දෞර්මනස්ජවන් උපන්කල්හි මහග්ගතාලම්බනහෙයින් තදාලම්බනයන් නොඋපදනාහෙයින් හෝ කිසිසේත් තදාලම්බනසම්භවයෙක් නැත, එසමයෙහි වර්තමානභවයෙහි පුරුදු කරණලද කිසිපරිත්තාලම්බනයක් අරබයා යට කීපරිද්දෙන් උපෙක්ෂාසහගතසන්තීරණයෙක් ම උපදනේයයි යනුභාවයි;—(කියනලද්දැයි.)

නිරාවජ්ජං කථං චිත්තං හොති නෙතං හි සම්මතං
නියාමො න විනාවජ්ජං නිරොධා ඵලදස්සනං,—යි.

උපෙක්ෂාසහගිය සන්තීරණයට අනතුරුව භවාඞ්ගපාත ම වන්නේය යි ආචාර්‍ය්‍යවරයෝ කියන්නාහුයි;-එසේ ම කාමාවචරජවනයන්ගේ අවසන්හි කාමාවචරසත්ත්වයන්ට කාමාවචරධර්මයක්හු ම අරමුණුවූකල්හි කාමතෘෂ්ණානිධානකර්මයෙන් නිර්වෘත්තබවහෙයින් තදාලම්බන කැමති වෙත්;—එසේ මැයි, කාමතෘෂ්ණාහෙතුකොට ඇති කර්මයාවිසින් ජනිතවූ ඒ තදාලම්බනය තත්සවභාව නොවන්නාවූ රූපාරූපාවචර-ලොකොත්තරජවනයන්ට අනන්තරව උපදනේයි, එයට කාරණා කිම් ද යත්? ජනකනොවනහෙයින් හා ජනකසමානභාවයක් නැතිහෙයිනි; යම්සේ ගෙන් පිටත නික්මෙනු කැමැත්තාවූ බාලදරකතෙම ජනකයාගේ හෝ තත්සදෘශවූ අනිකෙකුගේ හෝ ඇඟිල්ල අල්ලාගෙණ නික්මේද? අනික් රාජපුරුෂාදී එකක්හු ඇඟිල්ල නොගණී ද? එමෙන් භවාඞ්ගයාහට විෂයවූ තැනින් අනික්තැනක පවත්නාවූ තදාලම්බනතෙමේ ජනකවූ කාමාවචර කුශලාකුශලයකු හෝ තත්සදෘශවූ කාමාවචරක්‍රියාජවනයකු හෝ අනුව පවත්නේය, තත්සදෘශවූ මහද්ගතයන් ලොකොත්තරයන් අනුව යන්නේ නොවෙයි; එසේ ම බ්‍රහ්මයන්ට තදාලම්බනොපනිශ්‍රයවූ කාමාවචරප්‍රතිසන්ධිබීජයක් නැතිහෙයින් කාමාවචරසත්ත්වයන්ට ම තදාලම්බන කැමතිවෙති; එසේ ම කාමාවචරජවනයක්හු ම අරමුණුවූ කල්හි තදාලම්බන කැමතිවෙති, එයට කාරණා කිමෙක් ද යත්? මහද්ගත-ලොකොත්තරධර්මයන් විෂයෙහි පුරුදුබවක් නැතිහෙයින්, යම්සේ ඒ බාලදරකතෙම ජනකයා හෝ තත්සදෘශවූ අනිකක්හු හෝ අනුව යන්නේද? අරණ්‍යාදිවූ අපරිචිතස්ථානයට යන්නාහු අනුව නොගොස් තමාපුරුදුවූ ප්‍රමුඛාඞ්ගනාදිවූ ස්ථානයෙහි අනුවහැසිරේ ද එපරිද්දෙන්ම මේ තදාලම්බන ද අරූපාවචරාදිවූ අපරිචිතආලම්බනය අරබයා පවත්නාවූ ජවනයා අනුව යන්නේ නොවේ;—තවද කාමතෘෂ්ණාව නත්කර්මයාවිසින් ජනිතබවහෙයින් තදාලම්බනතෙම කාමතෘෂ්ණාලම්බනව පරිත්තධර්මයන් විෂයෙහි ම පවත්නේයි.—(කියනලද්දැයි.)

ජනකං තංසම්බානං වා ජවනං අනුබන්ධති,
න තු අඤ්ඤං තදාලම්බං බාලදාරකලීලයා.
බීජස්සාභාවතො නත්ථි බ්‍රහ්මානම්පි ඉමස්ස හි,
පටිසන්ධිජනකබීජං කාමාවචරසඤ්ඤිතං.
ඨානෙ පරිචිතෙයෙව තං ඉදං බාලකො විය,
අනුයාතී'ති නාඤ්ඤත්ථ කාමතණ්හාවසෙන වා—සී.

මෙසේ කාමභවය විෂයවූ ම ජවනසත්ත්වාලම්බනනියමයක් ඇතිකල්හි පඤ්චද්වාරයෙහි අතිමහන්තාලම්බනයෙහි ද මනොද්වාරයෙහි විභූතාලම්බනයෙහි ද තදාලම්බන වන්නේය යි ආචාර්ය්‍යවරයන්විසින් වර්ණිතයාහ යි දක්වන්නාහු "කාමෙ ජවන"යනාදි කීහු.

[කාමෙ ජවනසත්තාලම්බනානං නියමෙ සති,
විභූතෙ'තිමහන්තෙ ච තදාලම්බනමීරිතං.]

කාමභවයෙහි ජවනය සත්ව-ආලම්බනය යන මොවුන්ගේ නියමයක් ඇති කල්හි මනොද්වාරයෙහි විභූතාලම්බනයෙහි ද පඤ්චද්වාරයෙහි අතිමහන්තාලම්බනයෙහි ද තදාලම්බනය කියනලදී.

**මේ විථිසඞ්ග්‍රහාධිකාරයෙහි මේතෙම**
**තදාලම්බනයන්ගේ නියමයයි.**

ජවනයන්කෙරෙහි ද කාමාවචරජවනවීථියෙහි කාමාවචරජවනයෝ සත්වාරයෙක හෝ සවාරයෙක්හි හෝ පවත්නාහුයි;-මරණාසන්නවීථිකාලාදියෙහි වනාහි මරණකාලයෙහි වස්තුදුර්වලභාව හෙතුකොටගෙණ මන්දභූතවූ වේග ඇති බැවින් ජවනයන්ගේ මන්දව ප්‍රවෘත්තියක් ඇතිකල්හි පස්වාරයෙක් ම පවත්නාහ;—සඞ්ඛයන්ට වනාහි යමකප්‍රාතිහාර්ය්‍යකාලාදියෙහි සීඝ්‍රවූ ප්‍රවෘත්තියක් ඇතිකල්හි ප්‍රත්‍යවෙක්ෂාජවනචිත්තයෝ සතරදෙනෙක් හෝ පස්දෙනෙක් හෝ වන්නාහුය යි කියා ද අභිධර්මාචාර්ය්‍යවරයෝ කියත්;—මෙහි යමකප්‍රාතිහාර්ය්‍යකාලාදියෙහි උදකාග්නිස්කන්ධප්‍රවර්තනය පිණිස වෙන වෙන පාදකධ්‍යානයට සමවැද එයින් නැඟී ධ්‍යානධර්මයන් වෙන වෙන ආවර්ජනා කරන්නාහට ආවර්ජනවශිතාවගේ මස්තකප්‍රාප්තිය හෙතුකොටගෙණ ආවර්ජනානන්තරවූ ම විකුර්වණාභිනීහාරය වේනුයි යථාවර්ජිතවූ ධ්‍යානාඞ්ගය ම අරමුණු කොට ඇති ප්‍රත්‍යවෙක්ෂාජවනචිත්තයෝ සතර-පස්දෙනෙක් උපදනාහ, යනු භාවයි;—"සඞ්ඛයන්ට" යන මේ වචනය ද ධම්මසෙනාපතිආදිවූ අන්‍යවූ ස්ථවිරයන්ට ද වෙබදුවූ අත්‍යාසික්තකාලයෙහි අපරිපූර්ණ ජවනප්‍රවෘත්තිය වනනෙයින් නිදර්ශනමාත්‍රයකැයි දතයුතු.

ආදිකර්මිකයහට වනාහි පළමුකොට උපන් අර්පණායෙහි හෙවත් අර්පණාවගේ ප්‍රථමොත්පත්තිකාලයෙහි ම මහද්ගතජවනයෝ ද ප්‍රථමොත්පත්තිකාලයෙහි ද වශිප්‍රාප්තකාලයෙහි ද පඤ්චාභිඥාජවනයෝ ද එකවාරයෙක් ම උපදනාහුයි; එයින් මත්තෙහිත් භවාඞ්ගපාත වන්නේයි; සතරමාර්ගචිත්තයෝ වනාහි එකචිත්තක්ෂණිකයහ, ඒ මාර්ගානන්තරව ඵලචිත්තයෝ පස්වනුව සතරවනුව උපන්මාර්ගයට අනුරූප පරිද්දෙන් දෙ-තුන් ඵලචිත්තකෙනෙක් හෙවත් එකාවර්ජනවීථිය තමා ජවනයන් සතක් උත්කෘෂ්ටකොට ඇති බැවින් සතරවැනිව උපන් මාර්ගචිත්තයට ඉක්බිතිව ඵලචිත්තයෝ තුන්දෙනෙක් ද පස්වැනිව උපන්නාවූ මාර්ගචිත්තයට ඉක්බිතිව ඵලචිත්තදෙකෙක් ද උපදනේයි; එයින් මත්තෙහි භවාඞ්ගපාත වේ.

නිරොධසමාපත්තියට පූර්වභාගකාලයෙහි ද දෙවාරයෙක්හි කුශල-ක්‍රියාජවනයන් අතුරෙන් එක්තරා චතුර්ථාරූප්‍යජවනයෙක් දුවන්නේයි; චතුර්ථාරූප්‍යජවනයන් උපන් ඉක්බිති නිරොධස්පර්ශ කෙරේ, හෙවත් චිත්තනිරොධය වේ; නිරොධසමාපත්තියෙන් නැගෙණ කාලයෙහි ද අනාගාමිඵලය හෝ අර්හත්ඵලය හෝ ඒ ඒ පුද්ගලානුරූපවශයෙන් එකවාරයෙක්හි ඉපද නිරුද්ධවූ කල්හි භවාඞ්ගපාත වේ; සියලු ධ්‍යානසමාපත්ති-ඵලසමාපත්තිවීථියෙහි වනාහි භවාඞ්ගසන්තතියෙහි මෙන් වීථිචිත්තනියමයෙක් නැත්තුයි කියා මහද්ගත-ලොකොත්තරජවනයෝ බොහෝදෙන ද ලැබෙන්නාහයි දතයුතු;—

(කියනලදමායි)

[සත්තක්ඛත්තුං පරිත්තානි මග්ගාභිඤ්ඤා සකිං මතා,
අවසෙසානි ලබ්භන්ති ජවනානි බහූනි'පි.]

කාමාවචරජවනයෝ උත්කෘෂ්ටවශයෙන් සත්වාරයෙක්හි දුන්නාලදහු, මාර්ගා'භිඥ චිත්තයෝ වනාහි එකවාරයෙක්හි දුන්නාලදහු, අභිඥ-මාර්ගවීථින්වූ අවශිෂ්ට මහද්ගත-ලොකොත්තරජවනයෝ අහොරාත්‍රයක්දු පවත්නා හෙයින් බොහෝදෙන ද ලැබෙත්.

මෙහි "අපි" ශබ්දයෙන් අර්පණාවගේ ප්‍රථමොත්පත්තිකාලයෙහි ලෞකික ධ්‍යානයෝ ද නිරොධානන්තරව උපදනාවූ අනාගාමි-අර්හත්ඵලදෙක ද එකවාරයෙක්හි උපදනේය, මාර්ගානන්තරව උපදනා ඵලචිත්තයෝ ද දෙ-තුන් වාරයක් උපදනාහයි, කියා මෙසේ සමුච්චය කෙරේ.

**මේ වීථිචිත්තසංග්‍රහාධිකාරයෙහි මෙතෙම ජවනයන්ගේ නියමයයි.**

දැන් ද්විහෙතුකා'හෙතුක-ආපායිකාහෙතුක-ත්‍රිහෙතුකවශයෙන් චතුර්විධවූ පෘථග්ජනයන්ගේ ද මාර්ගස්ථ-ඵලස්ථවශයෙන් අෂ්ටවිධවූ ආර්යයන්ගේදැයි මේ දොළොස් පුද්ගලයන්ට උපදනාවූ වීථිචිත්තපරිච්ඡේද දක්වනුපිණිස පළමුකොට වනාහි ඔවුන්ගේ දුරුකටයුතුවූ චිත්තයන් දක්වන්නාහු "මේ ජවන නියමයෙහි වනාහි" යනාදී කීහ.

ඒ ජවනනියමයෙහි වනාහි අලොභ-අද්වෙෂවශයෙන් ද්විහෙතුකපුද්ගලයන්ට ද අලොභාදි හෙතුවිරහයෙන් අහෙතුකයන්ට ද ක්‍රියාජවනයෝ ද විපාකාවරණසත්භාවයෙන් අර්පණාජවනයෝ ද නොලැබෙති;—එසේමැයි ද්විහෙතුකාහෙතුකප්‍රතිසන්ධිකතොමෝ විපාකාවරණයයි කියනුලැබේ;—මෙහි අර්පණාජවනයන්ගේ අභාවයෙන් ම අර්හත්වය නැත්තුයි ක්‍රියාජවනයෝ නොලැබෙත්.

"සහෙතුකං භවඞ්ගං අහෙතුකස්ස භවඞ්ගස්ස අනන්තරපච්චයෙන පච්චයො" යන පාලිවචනහෙයින් අහෙතුකයන්ට ද නානාකර්මයෙන් ද්විහෙතුක තදාලම්බනසම්භවය වේ, ද්විහෙතුයන්ට කියනුම නැති.

කාමසුගතියෙහි මූලවූ ප්‍රතිසන්ධියගේ ජඩත්වයෙන් ද්විහෙතුක-අහෙතුකදෙන්නාට ම ත්‍රිහෙතුකතදාලම්බන නැත්තුයි ඥානසම්ප්‍රයුක්තවිපාකයෝද එසේ ම නොලැබෙත්; මෙහි "කාමසුගතියෙහි" යන මේ වචනය අහෙතුකාපෙක්ෂායෙන් කියනලදී; ඒ වනාහි අර්ථහෙයින් අනුඥාත ද්විහෙතුකවිපාකයන්ගේ ඒ සුගතියෙහි ම සම්භවදර්ශනය ම පරම්කොට ඇත්තේයි, එසේහෙයින් "සතරඅපායෙහි වනාහි යනාදී" කීහ.

සතරඅපායෙහි වනාහි ඥානවිප්‍රයුක්තවූ මහාවිපාකයෝ ද නොලැබෙත්; ප්‍රතිසන්ධිවිඥානසහගත අලොභ-අද්වෙෂ-අමොහවශයෙන් ත්‍රිහෙතුකවූ පෘථග්ජනාදි නවවිධපුද්ගලයන් අතුරෙහි දු රහතුන්ට කුශලා'කුශලජවනයෝ නොලැබෙත්; පෘථග්ජනයන්ට ක්‍රියාජවනයෝ ද, ශික්ෂායෙහි ලා අපරිපූරකාරී බැවින් ශික්ෂණශීලත්වයෙන් ශෛක්ෂ්‍ය යී ලබ්ධවූ නම් ඇති ශ්‍රොතාපන්න-සකෘදාගාමිපුද්ගලයන්ට ප්‍රථමමාර්ගයෙන් ම සත්කායදෘෂ්ටි-විචිකිත්සා ප්‍රහීණබව හෙයින් දෘෂ්ටිසම්ප්‍රයුක්තවිචිකිත්සාජවනයෝ ද, "පටිඝජවනානි ච" යන මේ අභිධම්මත්ථසඞ්ග්‍රහපාඨයෙහි "ච" ශබ්දයෙන් ආකර්ෂණය කරණ ලද ක්ෂීණාශ්‍රවයන්ට ආවෙණිකවූ ක්‍රියාජවනයෝ ද, එසේ ම නොලැබෙත්; අනාගාමිපුද්ගලයන්ට වනාහි දෞර්මනස්සජවනයෝ ද, දෘෂ්ටිසම්ප්‍රයුක්ත විචිකිත්සා ජවනයෝ ද, ක්‍රියාජවනයෝ ද, නොලැබෙත්නාහ; අෂ්ටප්‍රකාරවූ ලොකොත්තර ජවනයෝ ද, ස්වකීයමාර්ග-ඵලස්ථවූ ආර්‍ය්‍යපුද්ගලයන්ට ම උපදනාහුයි.

දැන් ඒ ඒ පුද්ගලයන්ගේ යථාප්‍රාප්තවූ ජවනයන් දුරුකොට පාරිශෙෂ්‍යයෙන් ලභ්‍යමානජවනයන් පිඩු කොට දක්වන්නාහු "අසෙක්ඛානං" යනාදිය කීහු.

[අසෙක්ඛානං චතුචත්තාළීස සෙක්ඛානමුද්දිසෙ,
ඡපඤ්ඤාසා'වසෙසානං චතුපඤ්ඤාස සම්භවා.]

ලැබෙනලැබෙනපරිද්දෙන් ත්‍රිවිධශික්ෂායෙහි පරිපූරකාරී බැවින් අශෛක්ෂය යී කියනලද කාමභවයෙහි රහතුන්ට තෙතිස් කුශලා'කුශලයන් හා සෝවාන්ඵලාදිවූ ඵලත්‍රය හා නව මහද්ගතවිපාකචිත්තයන්ගේ වශයෙන් පංසාළිස්චිත්තයන් වර්ජිතවූ අවශිෂ්ටවූ තෙවිසිකාමාවචරවිපාක-විංශතික්‍රියාචිත්ත-අර්හත්ඵලවශයෙන් සූසාළිස් චිත්තයන් කියන්නේයි; ශෛක්ෂයන්ට අටලොස් ක්‍රියාජවනය, දෘෂ්ටි-විචිකිත්සාසහගතචිත්තයෝ පස්දෙනය, අර්හත්ඵලය, නව මහද්ගතවිපාකය, යන මොවුන්ගේ වශයෙන් තෙතිස්චිත්තයන් හැර තෙවිසි කාමාවචරවිපාක-ආවර්ජනද්වය-එක්විසිකුසල්-සත් අකුසල්-ඵලත්‍රයවශයෙන් සපණස් චිත්තකෙනෙක් යථාසම්භව වශයෙන් දක්වන්නේය; විශෙෂයෙන් වනාහි සෝවාන්-සෙදෑගැමියන්ට එක්පණසෙක, අනාගාමීන්ට එකුන්පණසෙක, අවශිෂ්ට චතුර්විධවූ පෘථග්ජනයන්ට අටලොස් ක්‍රියාජවන-සියලු ලොකොත්තර-මහද්ගතවිපාකවශයෙන් පාතිස් චිත්තයන් හැර අවශිෂ්ටවූ කාමාවචරවිපාක-ආවර්ජන-ලෞකික කුශලා'කුශල වශයෙන් සූපණස් චිත්තකෙනෙකුන් සම්භවවශයෙන් කියන්නේයි; විශෙෂයෙන් වනාහි ත්‍රිහෙතුකයන්ට සූපණසෙක් ම ලැබෙන්නේය, ද්විහෙතුකා'හෙතුක සත්වයන්ට ඥානසම්ප්‍රයුක්තවිපාක-අර්පණාජවනයන් වර්ජිතවූ එක්සාළිස් චිත්තකෙනෙක් ලැබෙන්නාහ, අපායිකසත්වයන්ට එම ද්විහෙතුකවිපාකයන් වර්ජිතවූ සත්තිස් චිත්තකෙනෙක් ලැබෙන්නාහ යි දතයුතු.

**මේ වීථිචිත්තසඞ්ග්‍රහයෙහි මෙසේ ත්‍රිහෙතුකාදි පුද්ගල වශයෙන් චිත්තප්‍රවෘත්තිභෙදයයි.**

කාමාවචරභූමියෙහි වනාහි මේ සියලු වීථිචිත්තයෝ ම ඒ ඒභවානුරූපව ද ඒ ඒ පුද්ගලානුරූපව ද ලැබෙත්; හෙවත්-ඒ කාමභූමියෙහි ම ෂඩ්ද්වාරයන්ගේ ද සියලු පුද්ගලයන්ගේ ද සම්භවය වනහෙයින් උපදනාහ යි සේයි;-රූපාවචරභූමියෙහි ප්‍රතිඝසම්ප්‍රයුක්ත ජවන චිත්තයෝ දෙදෙනාය, එකොළොස් තදාලම්බනය, යන මොවුන් විසින් වර්ජිතවූ සියලු වීථිචිත්තයෝ ලැබෙන්නාහ, මෙහි ඝ්‍රාණවිඥානාදීන්ගේ ද ප්‍රතික්ෂෙපය "සියලුතන්හි ම" යනාදින් හැඟෙනහෙයින් ප්‍රතිඝජවන-තදාලම්බනයෝ ම ප්‍රතික්ෂිප්තයෝයි;—අරූපාවචරභූමියෙහි ප්‍රථමමාර්ගය, පසළොස් රූපාවචරයහ, හසිතොත්පාදය, යට යට අරූපාවචරචිත්තය, යන මොවුන් වර්ජිතකොට ඇති චිත්තයෝ ද ලැබෙත්,-කාමභවය රූපභවය යන මේ සියල්ලෙහි ම ඒ ඒ ප්‍රසාද රහිතවූ පුද්ගලයන්ට ඒ ඒ වාරයෙහි ප්‍රවෘත්තවූ වීථිචිත්තයෝ නොලැබෙන්නාහු මය; අසංඥභවයෙහි සත්වයන්ට වනාහි සර්වප්‍රකාරයෙන් ම චිත්තප්‍රවෘත්තිතොමෝ නැත්තේ මැයි.

(කියනලද මැයි)

[අසීති වීථිචිත්තානි කාමේ රූපෙ යථාරහං,
චතුසට්ඨි තථා'රූපෙප චෙචත්තාළීස ලබ්භරෙ.]

කාමභවයෙහි සුදුසුසුදුසුපරිද්දෙන් වීථිනිර්මුක්ත මහද්ගතචිත්තයන් නවදෙනා හැර වීථිචිත්තයෝ අසූදෙනෙක් ලැබෙන්නාහ; රූපභවයෙහි සුදුසුපරිද්දෙන් ප්‍රතිඝවය-අෂ්ටමහාවිපාක-ඝ්‍රාණවිඥානාදිෂට්ක-වීථිවිනිර්මුක්ත නවමහද්ගතවශයෙන් පස්විසි චිත්තයන් හැර අවශෙෂ ආවර්ජනවය-නවඅහෙතුකවිපාක-අවශිෂ්ට තෙපණස් ජවනයන්ගේ වශයෙන් සූසැටචිත්තයෝ ලැබෙන්නාහ, සමහර කෙනෙක් වනාහි රූපභවයෙහි අනිෂ්ටාරම්මණයෙක් නැතිහෙයින් මේ මනුෂ්‍යලොකයට ආවාවූ බ්‍රහ්මයන්ට ම අකුශලවිපාකයන්ගේ සම්භවයනුයි අකුශලවිපාකචක්ඛුවිඥානාදි චිත්තයන් සතරදෙනා හැර පඤ්චපරිත්තවිපාකයන් හා සමග රූපභවයෙහි වීථිචිත්තයන් සැටක් ම උපදිති යී කියත්නාහ; මෙහි වනාහි ඒ බ්‍රහ්මලොකයෙහි සිට ද මේ මනුෂ්‍යලොකය බලන්නාවූ බ්‍රහ්මයන්ට අනිෂ්ටාලම්බනයාගේ සම්භවය වලකන්නට නොපිළිවන්නුයි ඒ අකුශලවිපාකයන් සතරදෙනා හා සමග බ්‍රහ්මලොකයෙහි සූසැටචිත්තයෝ කියනලදහු;-අරූපභවයෙහි එසේ ම තෙවිසි කාමාවචරවිපාක-ප්‍රථමමාර්ග-පසළොස් රූපාවචර-ප්‍රතිඝවය-අරූප්‍යවිපාක-පඤ්චද්වාරාවර්ජන-හසිතොත්පාදවශයෙන් සත්සාළිස් චිත්තයන් හැර අවශෙෂවූ සවිසි පරිත්තජවන-අෂ්ටඅරූපජවන-සප්තලොකොත්තර ජවන-මනොද්වාරාවර්ජනවශයෙන් දෙසාළිස් චිත්තයෝ ලැබෙන්නාහුයි.

**මේ වීථිචිත්තසංග්‍රහයෙහි මෙතෙම භූමිවශයෙන්**
**චිත්තප්‍රවෘත්තිවිභාගයයි.**

මෙසේ ඒ ඒ වාරයෙහි ඒ ඒ භවයෙහි හෝ සම්භවවූ පරිද්දෙන් ෂඩ්ද්වාරිකවූ චිත්තප්‍රවෘත්තිතොමෝ භවාඞ්ගවිසින් ව්‍යවහිතව ප්‍රතිසන්ධියෙන් මත්තෙහි භවනිකාන්තිවශයෙන් ප්‍රවෘත්තවූ මනොද්වාරික වීථිචිත්තයෙහි පටන් ච්‍යුතිචිත්තාවසානව නිරොධසමාපත්තියෙන් පිටත්තන්හි අවිච්ඡින්නව පවත්නීයි.

(වීථිසඞ්ග්‍රහ විභාගනම්වූ සතරවෙනි පරිච්ඡේදය නිමි.)

වීථිචිත්තයන්ගේ ප්‍රවෘත්තිසඞ්ග්‍රහවිභාග දක්වා දැන් වීථිවිනිර්මුක්තසඞ්ග්‍රහය දක්වන්නාහු "වීථිචිත්තවසෙනෙවං"යනාදි කීහ.

[වීථිචිත්තවසෙනෙවං පවත්තියමුදීරිතො,
පවත්තිසඞ්ගහො නාම සන්ධියංදානි වුච්චති.]

මෙසේ යථොක්තක්‍රමයෙන් ප්‍රතිසන්ධියෙන් අපරභාගයෙහි ච්‍යුතිය අවසාන කොට මේ ප්‍රවෘත්තිකාලයෙහි වීථිචිත්තප්‍රවෘත්තිවශයෙන් ප්‍රවෘත්තිසඞ්ග්‍රහ නම්වූ සඞ්ග්‍රහය කියනලද, දැන් තදනන්තරව ප්‍රතිසන්ධිකාලයෙහි තදැසන්නබැවින් ප්‍රතිසන්ධිග්‍රහණයෙන් ම ගන්නාලද ච්‍යුතිකාලයෙහි ද ප්‍රවෘත්තිසඞ්ග්‍රහය කියනුලැබේ.

අපායභූමිආදිවූ භූමීහු සතරදෙන ද, අපායප්‍රතිසන්ධ්‍යාදි චතුර්විධප්‍රතිසන්ධීහු ද, ජනකාදි කර්මයෝ සතරදෙන ද, ආයුඃක්ෂයාදි චතුර්විධමරණොත්පත්තිය දැයි, වීථිනිර්මුක්තසඞ්ග්‍රහයෙහි සතරචතුෂ්කකෙනෙක් දතයුතුකාහුයි.

ඒ සතරචතුෂ්කයන් අතුරෙහි **භූමීහු** නම්,-අපායභූමිය, කාමසුගති භූමිය, රූපාවචරභූමිය, අරූපාවචරභූමිය දැයි, මෙසේ සතරදෙනෙක් වේත්.

ඒ අපායාදිචතුර්විධභූමීන් අතුරෙන් **අපායභූමිතොමෝ**,—නරකය ද, තිරිසන්යොනිය ද, ප්‍රෙතවිෂය ද, අසුරකාය දැයි, මෙසේ චතුර්විධ වන්නීයි; මෙහි වනාහි තිරශ්චීනයොනි ප්‍රෙතවිෂයග්‍රහණයෙන් තිරශ්චීනයන්ට හා ප්‍රෙතයන්ට එබඳුවූ පරිච්ඡින්නවූ අවකාශයක් නැති හෙයින් සත්ත්වයන්ගේ ම ග්‍රහණයයි; නොහොත්—ඔහු අරණ්‍ය-පර්වතාදි යම්තැනෙක්හි නිබද්ධවාසය කෙරෙද්ද, එබඳු වාසස්ථානයාගේ වශයෙන් අවකාශය යී දතයුතු; මෙහි වනාහි "අසුර" ශබ්දයෙන් ප්‍රෙතාසුරයන්ගේ ම ග්‍රහණය, ආචාර්‍ය්‍යයන් තමන්විසින් ම වෙපචිත්තිඅසුරයන් තව්තිසාවැසිදෙවියන්කෙරෙහි අන්තර්ගත කොට කීම කැමතිහෙයිනි.

මනුෂ්‍යභූමිය ද, චාතුර්මහාරාජිකභූමිය ද, තාවතිංසභූමිය ද, යාම භූමිය ද, තුෂිතභූමිය ද, පරනිර්මිතවශවර්ත්තිභූමිය දැයි, මෙසේ කාම

**ස්වර්ගභූමි**තොමෝ සප්තප්‍රකාර වේ; ඒකාදශප්‍රකාරවූ ඒ මේ භූමි වනාහි **කාමාවචරභූමිය** යි කියා ම සඞ්ග්‍රහබවට යේ.

බ්‍රහ්මපාරිෂද්‍යතලය ද, බ්‍රහ්මපුරෝහිතතලය ද, මහාබ්‍රහ්මතලය ද, **ප්‍රථමධ්‍යානභූමි** නම් වේ.

පරිත්තාභතලය ද; අප්පමාණාභතලය ද, ආභස්සරතලය ද, යන මේ **ද්විතීයධ්‍යානභූමි** නම් වේ.

පරිත්තසුභතලය ද, අප්පමාණසුභතලය ද, සුභකෘත්ස්නතලය ද, යන මේ **තෘතීයධ්‍යානභූමි** නම් වේ.

වෘහත්ඵලතලය ද, අසංඥතලය ද, පඤ්චශුද්ධාවාසතලය ද, යන මේ **චතුර්ථධ්‍යානභූමිය** දැයි, මෙසේ **රූපාවචර**භූමිතොමෝ ෂොඩශප්‍රකාර වේ.

අවිහතලය ද, අතප්පතලය ද, සුදස්සතලය ද, සුදස්සීතලය ද, අකනිට්ඨතලය දැයි, **ශුද්ධාවාස** භූමිතොම පඤ්චප්‍රකාර වේ.

ආකාසානඤ්චායතනභූමිය ද, විඤ්ඤාණඤ්චායතනභූමිය ද, ආකිඤ්චඤ්ඤායතනභූමිය ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනභූමිය දැයි **අරූපාවචරභූමි** චතුර්විධ වේ.

(එවුන් අතුරෙන්),—

[පුථුජ්ජනා න ලබ්භන්ති සුද්ධාවාසේසු සබ්බථා,
සොතාපන්නා ච සකදාගාමිනො චාපි පුග්ගලා.
අරියා නො'පලබ්භන්ති අසඤ්ඤ'පායභූමිසු,
සෙසට්ඨානෙසු ලබ්භන්ති අරියා'නරියා'පි ච.]

පෘථග්ජනයෝ ද සෝවාන්හු ද සකෘදාගාමිපුද්ගලයෝ ද, පඤ්චශුද්ධාවාසයෙහි සර්වප්‍රකාරයෙන් නොලැබෙත්; සර්වප්‍රකාරයෙන් නැත්තාහු යි සේයි;—පෘථග්ජනාදීන්ගේ ප්‍රතික්ෂෙපයෙන් ම අනාගාමි-අර්හතුන්ගේ ම එහි සම්භවය කියනලදී; අසංඥ-අපායභූමියෙහි ආර්‍ය්‍යපුද්ගලයෝ නොලැබෙත්; ශුද්ධාවාස-අපාය-අසංඥතලවර්ජිතවූ අවශිෂ්ට ස්ථානයෙහි ආර්‍ය්‍යයෝ ද පෘථග්ජනයෝ ද ලැබෙන්නාහුයි.

**මේ විමුක්තිසඞ්ග්‍රහයෙහි මේ අපායාදි භූමිචතුෂ්කයයි.**

අපායප්‍රතිසන්ධිය ද, කාමස්වර්ගප්‍රතිසන්ධිය ද, රූපාවචරප්‍රතිසන්ධිය ද, අරූපාවචරප්‍රතිසන්ධිය දැයි, **ප්‍රතිසන්ධිය** නම් චතුර්විධ වන්නේයි.

ඒ චතුර්විධවූ ප්‍රතිසන්ධීන් අතුරෙන් අකුශලවිපාකවූ උපෙක්ෂාසහගතසන්තීරණචිත්තයතෙම චතුර්විධවූ අපායභූමියෙහි ප්‍රතිසන්ධික්ෂණයෙහි ප්‍රතිසන්ධිව ද ඒ ප්‍රතිසන්ධියෙන් මත්තෙහි භවාඞ්ගව ද අවසානයෙහි ච්‍යුතිව ද සිදෙන්නේයි;—මෝතොමෝ ඒක ම **අපායප්‍රතිසන්ධි** නම් වේ.

කුශලවිපාකවූ උපෙක්ෂාසහගතවූ සන්තීරණය වනාහි කාමස්වර්ගයෙහි මනුෂ්‍යයන් අතුරෙන් ජාත්‍යන්ධ-ජාතිබධිරාදිවූ ජනාසනවයත්වද.

භූම්‍යස්ථදෙවියන් ආශ්‍රිතවූ විනිපාතිකාසුරයන්ට ද, ගෙවත්-වෛමානිකප්‍රෙතයන්ට ද, ප්‍රතිසන්ධි-භවාඞ්ග-ච්‍යුතිවශයෙන් පවත්නේයි; මෙහි විනිපාතිකාසුරයන්ගේ අහෙතුකප්‍රතිසන්ධිකත්වය බාහුල්‍ය වශයෙන් දක්වනලද, ඔවුන්කෙරෙන් සමහරකෙනෙක් ද්විහෙතුක-ත්‍රිහෙතුකත් වෙත්; මෙහි කිසිසේත් ජාතික්ෂණයෙහි අණ්ඩජ-ජලාබුජවූ සියල්ලෝ ම චක්ෂුස්රහිතයහ, එතකුදුවූවත් චක්ෂුරාදීන් උපදනට සුදුසුවූ කාලයෙහි ද චක්ෂුර්විඥානයාගේ ප්‍රවෘත්තියට බාධකවූ කර්මයා විසින් ප්‍රතිබාහනය කරණලද සාමර්ථ්‍යය ඇතිව දෙනලද ප්‍රතිසන්ධි ඇති කර්මයාවිසින් හෝ ප්‍රතිසන්ධි දුන් කර්මයෙන් අන්‍යවූ කර්මයක්හුවිසින් හෝ නොඋපදවියයුතු ඇස්ඇති සත්වතෙම ජාත්‍යන්ධ නම් වේ; සමහරකෙනෙක් වනාහී ජාත්‍යන්ධයහ යී ප්‍රසූතියෙහි ම අන්ධය, ගෙවත්-මාතෘකුක්ෂියෙහිදී ම අන්ධව නික්මෙත්නේය; එසේ හෙයින් ද්විහෙතුක-ත්‍රිහෙතුකයන්ට ද මාතෘකුක්ෂියෙහි චක්ෂුස්හුගේ විනාශය සිද්ධ යී කියත්,—"ජාත්‍යන්ධාදි" යන "ආදි" ශබ්දයෙන් ජාති බධිර-ජාතිමූග-ජාත්‍යුන්මත්තක-පණ්ඩක-උභතොබ්‍යඤ්ජනක-නපුංසක-මම්මනාදීන්ගේ සඞ්ග්‍රහයයි.

කාමාවචරමහාවිපාකයෝ අටදෙන වනාහි දිව්‍ය-මනුෂ්‍යවශයෙන් සප්තප්‍රකාරවූ සියලු කාමස්වර්ගයෙහි ප්‍රතිසන්ධි-භවාඞ්ග-ච්‍යුතිවශයෙන් පවතිත්; මොහු නවදෙන **කාමසුගතියෙහි** ප්‍රතිසන්ධිහු නම් වෙත්; අහෙතුක-සහෙතුකවශයෙන් දශප්‍රකාරවූ ද ඒ මේ ප්‍රතිසන්ධි වනාහි **කාමාවචරප්‍රතිසන්ධිය** යී කියා ම සඞ්ග්‍රහබවට යේ, ඒ යථොක්තවූ ප්‍රතිසන්ධියෙන් යුක්තවූ පුද්ගලයන් අතුරෙහි,නොහොත්—අපායාදීන් අතුරෙහි සතරආපායිකසත්වයන්ගේ ද මනුෂ්‍යයන්ගේ ද විනිපාතිකාසුරයන්ගේ ද ආයුඃප්‍රමාණගණනායෙහි සමහරකෙනෙකුන් චිරායුෂ්කබව හෙයින් නියම නැති.

(කියනලද මැයි:—

"ආපායිකමනුස්සෙසු පරිවෙජ්ජෙ, න විජ්ජති,
තථා හි කාලො මන්ධාතා යක්ඛා කෙචි චිරායුනො")-යි.

එසේ මැයි, නරකයෙහි වනාහි කර්මය ම ප්‍රමාණය,යම්තාක් කර්ම ක්ෂයට නොයේ ද, ඒතාක් සත්වයෝ සිටිනාහ; සෙසු අපායෙහි ද එසේ මැයි; භූමාටුදෙවියන්ට ද කර්මයම ප්‍රධානය; එසේ මැයි, එහි උපන්නාවූ සමහරදෙවතාකෙනෙක් සප්තාහයකුත් සිටිනාහ, සමහරකෙනෙක් අර්ධමාසයක්, සමහරකෙනෙක් මාසයක්, සමහරකෙනෙක් කල්පයකුත් සිටිනාහු ඇත්තුයි; මෙසේ මින්සුන්ගේ ආයුඃප්‍රමාණ එකදෙශයකින් පිරිසිද බුද්ධොත්පාදයේ ම මනුෂ්‍යයන්ගේ ආයුඃප්‍රමාණමතු ගෙණ වදාලබැව්හුදු ආදිකල්පයෙහි අසංඛ්‍යප්‍රමාණ ආයුස ඇති මිනිසුදු ඇතිබැවින් මෙසේ මනුෂ්‍යයන්ගේ වනාහි ආයු එකදෙශයක් මුත් සියල්ල නොපිරිසුත් බැවින් මේ හැම සිතා "සතරආපායිකසත්වයන්ගේ" යනාදි කීහ.

චාතුර්මහාරාජිකදෙවලොකයෙහි දෙවතාවන්ගේ වනාහී දිව්‍යවූ පඤ්චවර්‍ෂශත(500)කෙනෙක් ආයුෂයෙහි ප්‍රමාණයි,මනුෂ්‍යයින්ගේ ගණනින් අනූලක්‍ෂ (9000000) යක් පමණ හවුරුදු වන්නේයි, මෙහි මනුෂ්‍යයන්ගේ වර්‍ෂගණනායෙන් පණස් අවුරුද්දෙක් මේ චාතුර්මහාරාජිකදිව්‍යලොකයෙහි එක්දවසෙක් වෙයි, එසේවූ දවසින් තිස්දවසෙක් මසෙක් වෙයි, එසේවූ මස්දෙළසෙක් හවුරුද්දෙක් වෙයි, එසේවූ හවුරුද්දෙන් පන්සිය (500) යක් හවුරුදු ඒ දිව්‍යලොකයෙහි පරමායුසය; මනුෂ්‍යවර්‍ෂගණනායෙන් අනූලක්‍ෂ(9000000) යක් පමණ හවුරුදු වෙයි.

(කියනලදමැයි:—

"යානි පඤ්ඤාස වස්සානි මනුස්සානං දිනං තහිං,
තිංස රත්තිඤ්චෙව මාසො මාසා ද්වාදස වච්ඡරං,
තෙන සංවච්ඡරෙනායු දිබ්බං පඤ්චසතං මතං")—යි.

**ඒ චාතුර්මහාරාජික**දෙවතාවන්ගේ ආයුඃප්‍රමාණයෙන් දිවස-සංවත්සරයන්ගේ ද්විගුණවශයෙන් චතුර්ගුණවූ ආයුස තව්තිසාවැසි දෙවියන්ගේ ආයුඃප්‍රමාණය; හේ වනාහි දිව්‍යවර්‍ෂගණනායෙන් දහස (1000) ක් හවුරුදුය; මනුෂ්‍යගණනායෙන් තුන්කෙළසැටලක්‍ෂ (3,6000000)යක් හවුරුදු වන්නේයි.

**ඒ තවුතිසා**වැසි දෙවියන්ගේ ආයුඃප්‍රමාණයෙන් යට කී පරිද්දෙන් චතුර්ගුණවූ ආයුසය යාමදිව්‍යලොකයෙහි දෙවතාවන්ගේ පරමායුසය; හේ වනාහි දිව්‍යවර්‍ෂගණනායෙන් දෙදහස (2000) ක් හවුරුදුය; මනුෂ්‍යගණනායෙන් තුදුස්කෙළසතළිස්ලක්‍ෂ (14,4000000) යක් පමණ හවුරුදු වන්නේයි.

**ඒ යාමදිව්‍යලොකයෙහි** දෙවතාවන්ගේ ආයුඃප්‍රමාණයෙන් චතුර්ගුණවූ ආයුසය තුෂිතපුරයෙහි දෙවතාවන්ගේ ආයුඃප්‍රමාණය, හෙ ද දිව්‍යවර්‍ෂගණනායෙන් සාරදහස (4000) ක් හවුරුදුය, මනුෂ්‍යගණනායෙන් සත්පණස්කෙළසැටලක්‍ෂ (57,6000000) යක් පමණ හවුරුදුයි.

**ඒ තුෂිතපුර**දෙවතාවන්ගේ ආයුඃප්‍රමාණයෙන් චතුර්ගුණවූ ආයුසය නිර්මාණරතිදෙවලොකයෙහි දෙවතාවන්ගේ ආයුඃප්‍රමාණය; හෙ ද දිව්‍යවර්‍ෂගණනින් අටදහස (8000) ක් හවුරුදුය, මනුෂ්‍යගණනායෙන් දෙසියතිස්කෙළසතළිස්ලක්‍ෂ (230,4000000) යක් පමණ හවුරුදුයි.

**ඒ නිර්මාණරති**දෙවතාවන්ගේ ආයුඃප්‍රමාණයෙන් චතුර්ගුණවූ ආයුසය පරනිර්මිතවශවර්තිදිව්‍යලොකයෙහි දෙවතාවන්ගේ ආයුඃප්‍රමාණය, හෙ ද දිව්‍යවර්‍ෂගණනායෙන් සොළොස්දහස (16000) ක් හවුරුදුය, එහි මනුෂ්‍යගණනායෙන් ආයුඃප්‍රමාණය දක්වන්නාහු "නවසතං චෙකවීස වස්සානං කොටියො" යනාදි කීහු.

[නවසතඤ්චෙකවීස වස්සානං කොටියො තථා,
වස්සසතසහස්සානි සට්ඨි ච වසවත්තිසු.]

**පරනිර්මිතවශවර්තිදිව්‍යලොකයෙහි** මනුෂ්‍යලොකයෙහි වර්‍ෂයන් සඹන්ධවූ නවසියයක් කෙළ ද, එක්විසිකෙළක් ද, එසේ ම සැටලක්‍ෂයක් ද, හවුරුදු වන්නේයි; හෙවත්—මනුෂ්‍යගණනායෙන් නවසියඑක්විසිකෙළසැටලක්‍ෂ (921,6000000) යක් හවුරුදුය යි සේයි.

ප්‍රථමධ්‍යානවිපාකය ප්‍රථමධ්‍යානභූමියෙහි ප්‍රතිසන්ධි-භවාඞ්ග-ච්‍යුති වශයෙන් පවත්නේයි;—**ද්විතීයධ්‍යාන**විපාකය ද, තෘතීයධ්‍යානවිපාකය ද, චතුෂ්කනයවශයෙන් ද්විතීයධ්‍යානභූමියෙහි එසේ ම ප්‍රතිසන්ධි-භවාඞ්ග-ච්‍යුතිවශයෙන් පවත්නේයි;—**චතුර්ථධ්‍යාන** විපාකය තෘතීයධ්‍යානභූමියෙහි ප්‍රතිසන්ධි-භවාඞ්ග-ච්‍යුතිවශයෙන් පවත්නේයි;—**පඤ්චමධ්‍යාන**විපාකය ද චතුර්ථධ්‍යානභූමියෙහි එසේ ම ප්‍රතිසන්ධි-භවාඞ්ග-ච්‍යුතිවශයෙන් පවත්නේයි;—අසංඥතලයෙහි සත්ත්වයන්ට වනාහි රූපය ම ප්‍රතිසන්ධි වන්නේයි; ඒ ප්‍රතිසන්ධියෙන් මත්තෙහි ප්‍රවෘත්ති කාලයෙහි ද එසේ ම රූපය ම භවාඞ්ග-ච්‍යුතිවශයෙන් ප්‍රවෘත්තව නිරුද්ධ වන්නේයි;—මොහු සදෙන **රූපාවචරප්‍රතිසන්ධිහු** නම් වෙත්.

ගෘණ්තවූ ප්‍රතිසන්ධි ඇති බ්‍රහ්මයන් අතුරෙහි **බ්‍රහ්මපාරිෂද්‍යතල**වාසීවූ ඒ දෙවතාවන්ට අසංඛ්‍යකල්පයාගේ තෘතීයභාගය (⅓) ආයුඃප්‍රමාණයි; මෙහි "අසංඛ්‍යකල්ප" නම් මහාකල්පයාගේ සතරවන භාගයයි; බ්‍රහ්මපාරිෂද්‍යාදි තලයෙහි ඇත්තවුන්ගේ ආයුඃපරිච්ඡෙද මහාකල්පවශයෙන් සම්භව නොවන්නේ කුමක්හෙයින් ද යත්?—**එක්කපෙකත්** ඔවුන්ගේ අවිනාශයක් නැතිහෙයිනි; එසේ මැයි, ලොව නස්නාකල සත්වාරයෙක ගින්නෙන් නස්නේය; අටවනවාරයෙහි උදකයෙන් නස්නේය; නැවත සත්වාරයෙක්හි ගින්නෙන් ද, අටවනවාරයෙහි උදකයෙනැයි මෙසේ අෂ්ට-අෂ්ට සම්පූර්ණවූ කල්හි පශ්චිමවූ සූසැට වන වාරයෙහි වාතයෙන් නස්නේයි;—මෙහි ආභස්සරතලයෙන් පාත ප්‍රථමධ්‍යානතලතුණ ඇතුළුව ගින්නෙන් නස්නේය; **ශුභකීර්ණ**බ්‍රහ්මලොකයෙන් පාත ජලයෙන් නස්නේය; වෘහත්ඵලතලයෙන් පාත වාතයෙන් නස්නේය.

(කියනලද මැයි:—

"සත්ත සත්ත'ග්ගිනා' වාරා අට්ඨමෙ අට්ඨමො'දකා,
චතුසට්ඨි යදා පුණ්ණා එකො වායුවරො සියා.

අග්ගිනා'භස්සරා හෙට්ඨා ආපෙන සුභකිණ්හතො,
වෙහප්ඵලාතො වාතෙන එවං ලොකො විනස්සති")-යි.

**බ්‍රහ්මපුරොහිත**තලයෙහි දෙවතාවන්ගේ උපාඩ්ඪ (½) කල්පයක් ආයුඃප්‍රමාණයි,-**මහාබ්‍රහ්ම**තලයෙහි දෙවතාවන්ගේ එක (1) අසංඛෙය්‍යකල්පයෙක් ආයුඃප්‍රමාණයි;—**පරිත්තාභ**තලයෙහි දෙවතාවන්ගේ මහාකල්ප දෙක (2) ක් ආයුඃප්‍රමාණයි; මෙහි පරිත්තාභතලයෙහි පටන් මහාකල්පවශයෙන් දතයුතු;—**අප්‍රමාණාභ**තලයෙහි බ්‍රහ්මයන්ගේ කල්පයෝ සතර (4) දෙනෙක්;-**ආභස්සර**තලයෙහි බ්‍රහ්මයන්ගේ අට

(8) කපෙක්;—පරිත්තසුභයන්ගේ සොළොස් (16) කපෙක්;—**අප්‍රමාණසුභයන්**ගේ දෙතිස් (32) කපෙක්,—**ශුභකිර්ණකයන්**ගේ සූසැට (64) කපෙක්;—**වෘහත්ඵල**තලවාසීන්ගේ ද, **අසංඥ**තලවාසීන්ගේ ද පන්සිය (500) යක් කප්,—**අවිහ**තලවාසීන්ගේ කප් දහස (1000) ක්;—**අතප්ප**තලවාසීන්ගේ දෙදහස (2000) ක් කප්;—**සුදර්ශන**තලවාසීන්ගේ සාරදහස(4000)ක් කප්;-**සුදර්ශී**තලවාසීන්ගේ අටදහස(8000)ක් කප්;—**අකනිට්ඨ**තලවාසීන්ගේ සොළොස්දහස (16000) ක් කප්; ආයුඃප්‍රමාණයි.

ප්‍රථමාරූප්‍යාදිවිපාකයෝ ප්‍රථමාරූප්‍යාදිභූමියෙහි පිළිවෙළින් ප්‍රතිසන්ධි-භවාඞ්ග-ච්‍යුතිවශයෙන් පවතිත්; මේ සතරදෙන **අරූපාවචර ප්‍රතිසන්ධිහු** නම් වෙත්.

ඒ ගන්නාලද අරූපාවචරප්‍රතිසන්ධි ඇති බ්‍රහ්මයන් අතුරෙහි **ආකාශානඤ්චායතනූපග**දෙවතාවන්ගේ විසිදහස (20000) ක් කප් ආයුඃප්‍රමාණයි;—**විඤ්ඤාණඤ්චායතනූපග**දෙවතාවන්ගේ සතළිස්දහස(40000)ක් කප් ආයුඃප්‍රමාණයි; **ආකිඤ්චඤ්ඤායතනූපග**දෙවතාවන්ගේ සැටදහස (60000) ක් කප්;-**නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපග**දෙවතාවන්ගේ සුවාසූදහස (84000) ක් කප් ආයුඃප්‍රමාණයි.

(මෙහි වනාහි):—

[පටිසන්ධි භවඞ්ගඤ්ච තථා චවනමානසං,
එකමෙව තථෙවෙකවිසයඤ්චෙකජාතියං.]

**එකභවයෙහි ප්‍රතිසන්ධිචිත්තය ද,** භවාඞ්ගචිත්තය ද, එසේ ම ච්‍යුතිචිත්තය ද, කාමාවචරාදි භූමිහෙයින් ද, ජාතිහෙයින් ද, සම්ප්‍රයොගධර්මහෙයින් ද, සංස්කාරභෙදහෙයින් ද, සමානමය; එසේ ම කර්මනිමිත්තාදිවූ එක ම විෂයක් ද ඇත්තේයි.

**මේ විථිමුක්තසඞ්ග්‍රහයෙහි මේ අපායාදි**
**ප්‍රතිසන්ධිචතුෂ්කයයි.**

දැන් ප්‍රතිසන්ධිචතුෂ්කානන්තරයෙන් **කර්මචතුෂ්කය** සතරප්‍රකාරයකින් දක්වන්නාහු "ජනක" යනාදි කියත්.

ජනකකර්මය, උපස්තම්භකකර්මය, උපපීඩකකර්මය, උපඝාතකකර්මය දැයි, කෘත්‍යවශයෙන් "සතරදෙනෙක් කර්මයෝ නම් වෙත්" යතු හා යොදතු;—ගරුකකර්මය, ආසන්නකර්මය, ආචිණ්ණකර්මය, කටත්තාකර්මය දැයි, විපාකදානානුක්‍රමයෙන් ද;—දෘෂ්ටධර්මවෙද්‍යකර්මය, උපපද්‍යවෙද්‍යකර්මය, අපරාපර්යායවෙද්‍යකර්මය, අහොසිකර්මය දැයි, විපාකකාලවශයෙන් ද සතරදෙනෙක් කර්මයෝ නම් වෙත්;—එසේ ම අකුසලය, කාමාවචරකුසලය, රූපාවචරකුසලය, අරූපාවචරකුසලය දැයි, විපච්චනභූමිවශයෙන් දැයි කර්මයෝ සතරදෙනෙක් වෙත්.

මෙහි ප්‍රතිසන්ධිවිපාක හා ප්‍රවෘත්තිවිපාක උපදවනවූ කුශලාකුශල කර්මය **ජනක** නම් වෙයි.

සුගති-දුර්ගතියෙහි ජනකකර්මයාවිසින් උත්පන්නවිපාකසන්තානයට අනතුරය වැලකීමෙන් උපස්ථම්භකවූ කර්මයතෙම **උපස්ථම්භකකර්ම** නම් වේ.

උත්පන්නවූ සුඛ-දුඃඛය බොහෝකල් පැවැත්ත නොදී බාධකවූ කර්මය **උපපීඩක** නම් වේ.

අන්‍යකර්මයෙන් ජනිතවූ විපාකසන්තානය දෙව්දත්ත-කලාබුරාජාදීන්ට මෙන් උපච්ඡේදකරවූ විරුද්ධවූ කර්මය **උපඝාතක** නම් වේ.

මහාසාවද්‍යවූ ද මහානුභාවවූ ද කුශලාකුශලකර්මයතෙම අන්‍යකර්මයකුදුවිසින් ප්‍රතිබාහනය කරන්නට අසමර්ථව අනන්තරභවයෙහි ම විපාකදෙන සුළුවූයේ **ගරුක** නම් වේ;—හෙතෙම කුශලපක්ෂයෙහි අෂ්ටසමාපත්තිහු ය, අකුශලපක්ෂයෙහි පඤ්චානන්තර්‍යකර්මයි.

මරණාසන්නකාලයෙහි කරණලද සිතනලද කුශලාකුශලකර්මය ද, තම්බදාඨිකචෞරඝාතකාදීන්ට මෙන් ගරුකකර්මයාගේ අභාවයෙහි විපාක දෙනුවූයේ **ආසන්නකර්ම** නම් වේ.

එක්වන් කරණලද්දාවූ ද එක් වාරයෙක්හිදු කොට එක්වන් අසෙවනය කරණලද්දාවූ ද කුශලාකුශලකර්මයතෙම **ආචිණ්ණකර්ම** නම් වේ.

ගරුකාදිභාවයට අසම්ප්‍රාප්තවූ කෘතමාත්‍රවූ ම කර්මයතෙම **කෘතත්වාත්කර්ම** නම් වේ;—මෙහි ආසන්නාදිකර්මයන් ඇතිකල්හිදු පරිත්තඋදකයන් මැඬගෙණ යන්නාවූ මහෞඝයක් මෙන් අෂ්ටසමාපත්ති ආදිවූ ගරුකර්මය පලමුකොට විපාක දෙන්නේය; ඒ ගරුකර්මයාගේ අභාවයෙහි ආසන්නකර්මය පලමුකොට විපාක දෙන්නේය; ආසන්නකර්මයාගේ අභාවයෙහි ආචිණ්ණකර්මය පලමුකොට විපාක දෙන්නේය; මොවුන් තුන්දෙනාගේ අභාවයෙහි ලද්දාවූ අසෙවන ඇති කෘතත්වාත්කර්මයතෙම පලමුකොට විපාක දෙන්නේයි.

දෘෂ්ටධර්මයයි ප්‍රත්‍යක්ෂවූ වර්තමානආත්මභාවය කියනුලැබෙයි, එහි විපාකවශයෙන් අනුභව කටයුතුවූ කර්මය **දෘෂ්ටධර්මවේද්‍ය** නම් වේ.

අනන්තරභවයෙහි ඉපිද අනුභව කටයුතුවූ විපාකඇති කර්මය **උපපද්‍යවේද්‍ය** නම් වේ.

දෘෂ්ටධර්මයෙන් අන්‍යවූ යම්කිසි ආත්මභාවයෙක්හි අනුභව කටයුතුවූ විපාකඇති කර්මය **අපරාපර්‍යායවේද්‍ය** නම් වේ.

තත්තත්කාලාතීත දෘෂ්ටධර්මවේද්‍ය-උපපද්‍යවේද්‍යකර්මවය ද, සංසාරප්‍රවෘත්තිය සුන්කල්හි අපරාපර්‍යායවේද්‍යකර්මය ද, **අහෝසිකර්ම** නම් වේ;—මෙහි කුශලාකුශලජවනවීථියෙහි ජවනයන් සත්දෙනා උපන්කල්හි ප්‍රථමජවනචේතනාතොමෝ එම ආත්මභාවයෙහි විපාක දෙනහෙයින් දෘෂ්ටධර්මවේද්‍ය නම් වෙයි;—සත්වන ජවනචේතනාව වනාහි පරිනිෂ්ඨිතවූ කෘත්‍ය ඇතිබව හෙතුකොටගෙණ අනන්තරභවයෙහි ම විපාක දෙනහෙයින් උපපද්‍යවේද්‍ය නම් වේ; ඒ උපපද්‍යවේද්‍යකර්මය ප්‍රතිසන්ධියෙහිදිම ප්‍රවෘත්තිවිපාක දෙන්නේය; ප්‍රතිසන්ධිය නූදුන්කල්හි වනාහි ප්‍රවෘත්තිවිපාක නොදෙන්නේයි; ප්‍රතිසන්ධිය දුන්කල්හි ජාතිශතයකුදු ප්‍රවෘත්තිවිපාක දෙන්නේ යී ආචාර්‍ය්‍යවරයෝ කියත්;

මධ්‍යයෙහි පස් ජවනචේතනාවෝ සංසාරප්‍රවෘත්තියක් ඇතිකල්හි අපරාපරවූ යම්කිසි ආත්මභාවයෙක්හි අවකාශයක් ලදකල්හි විපාක දෙනහෙයින් අපරාපර්‍යායවේදනීය නම් වෙති;—බහුලකොට කරණලද දෘෂ්ටධර්මවේදනීයාදිකර්මයන් අතුරෙහි අවකාශ නොලැබීමෙන් යම් යම් කර්මයෙක් තමතමාගේ කල ඉක්මෙනලද්දේ තත්තත්කාලාතීතබීජය මෙන් පසුව විපාක නොදෙනහෙයින් **අහෝසිකර්ම** නම් වේ.

දැන් අකුශලාදිකර්මයන්ගේ කායකර්මද්වාරාදිවශයෙන් ප්‍රවෘත්තිය ද, තත්තද්දොෂමූලයෙන් ඔවුන්ගේ ප්‍රාණාතිපාතාදිවශයෙන් දශවිධාදි ප්‍රභෙදය ද, දක්වන්නාහු "ඒ අකුශලාදිවශයෙන් චතුර්විධවූ කර්මයන් අතුරෙහි" යනාදි කියත්.

ඒ අකුශලාදිවශයෙන් චතුර්විධවූ කර්මයන් අතුරෙහි අකුශලකර්මය කායකර්මය වචීකර්මය මනොකර්මය දැයි කායකර්මාදීන්ට ද්වාරවශයෙන් ත්‍රිප්‍රකාර වේ.

ඒ කෙසේ ත්‍රිවිධ වේ ද යත්?—ප්‍රාණාතිපාතය ද, අදත්තාදානය ද, කාමමිථ්‍යාචාරය ද, කයින් අභිප්‍රාය අඟවනහෙයින් ද තමාකයින් විඥෙයබවහෙයින් ද කායවිඥප්තිය යි කියනලද අභික්‍රමාදිජනක චිත්තජවායුධාතුවාදිකරූපකලාපයාගේ විකාරවූ ස්තබ්ධ-චලන-ධාරණකෘත්‍යයට සහකාරිකාරණවූ චොපනාකායභාවයෙන් ද කර්මයන්ගේ ප්‍රවෘත්තිමූලභාවයෙන් ද කායද්වාරසංඛ්‍යාත කර්මද්වාරයෙහි බහුලවශයෙන් පවත්නාහෙයින් **කායකර්ම** නම් වේ;—කිසිසේත් ඒ ඒ කර්මසඞ්ගතවූ චේතනාත්පාදයාවිසින් ම ඒ ඒ විඥප්ති උපදවනුලැබෙයි, එතකුදු උවත් ඒ විඥප්තිය එසේ පවත්නාකල්හි විඥප්ති උපදවන්නාවූ කර්මයාගේ කායකර්මාදි ව්‍යවහාරය වේ නුයි, ඒ විඥප්ති තොම කර්මයාගේ ප්‍රවෘත්තිමූලභාවයෙන් කියන්නට ලැබෙත්;—මෙහි "බහුලවශයෙන් පවත්නාහෙයින්" යනු නොකියා "කායද්වාරයෙහි පවත්නාහෙයින්" යි කියා මෙපමණක් ම කීකල්හි කර්ම-ද්වාර දෙදෙනාගේ නිශ්චය නොවන්නේයි.

එසේ මැයි, කායද්වාරයෙහි ප්‍රවෘත්තවූ කර්මය කායකර්මය යි කියනු ලැබේ, කායකර්මයාගේ ප්‍රවෘත්තියට මූලවූ ද්වාරයතෙම කායද්වාරය යි කියනුලැබේ; ප්‍රාණාතිපාතාදිය වනාහි වචනයෙන් අණවන්නාහට කායකර්මය වාග්ද්වාරයෙහි පවතිනුයි, ද්වාරය හෙතුකොටගෙණ කර්මව්‍යවස්ථාව නොවන්නේය, එසේ ම මෘෂාවාදාදිය කායවිකාරාදිවශයෙන් කරන්නාහට වාක්කර්මය කායද්වාරයෙහිදු පවතිනුයි, කර්මයෙන් ද්වාරව්‍යවස්ථාව නොවන්නේය, යන මේ චොදනාව එලවා බාහුල්‍යවෘත්තින් ව්‍යවස්ථාව දක්වනු පිණිස "බාහුල්‍යවෘත්තිය" කියනලදී;—යම්හෙයකින් කායකර්මයතෙම කායද්වාරයෙහි ම බහුලව පවති ද, වාග්ද්වාරයෙහි ස්වල්පව පවතී ද, එසේ හෙයින් වනචරකාදීන්ගේ වනචරකාදිභාවය මෙන් කායද්වාරයෙහි ම බහුලව පවත්නාහෙයින් කායකර්මද්වාරභාවය සිද්ධය; යම්හෙයකින් කායකර්මය බාහුල්‍යවශයෙන් කායද්වාරයෙහි පවති ද, වාක්කර්මාදිහු එසේ නොපවතිද්

ද, එසේ හෙයින් කායකර්මයාගේ බහුලවශයෙන් කායද්වාරයෙහි ම පවත්නාහෙයින් බ්‍රාහ්මණග්‍රාමාදීන්ගේ බ්‍රාහ්මණග්‍රාමාදිභාවය මෙන් කායකර්මද්වාරභාවය සිද්ධහුයි කර්මද්වාරව්‍යවස්ථායෙහි කිසි විරොධයෙක් නැත යන අභිප්‍රායයි;—රසසංඛ්‍යාතකාමයේ මිථ්‍යාචාරභාවයෙන් සුරාපානය ද කාමමිථ්‍යාචාරයෙහි ම අන්තර්ගතය යි කියත්.

මෘෂාවාදය ද, පිශුනවචනය ද, පරුෂවචනය ද, සම්ප්‍රලාපය ද,වචනයෙන් අභිප්‍රාය හඟවනහෙයින් ද තමා ද වචනයෙන් විශෙෂවහෙයින් ද වාග්විඥප්තිය යී කියනලද වාග්විශෙෂජනකවූ චිත්තජපෘථිවීධාතුවගේ අක්‍ෂරොත්පත්තිස්ථානසංඥිත කර්මජරූපයන්ගේ ඝට්ටනකෘත්‍යයට සහකාරිකාරණවූ පෘථිවීධාත්වධිකචිත්තජමහාභූතයන්ගේ විකාරවූ චොපනවාග්භාවයෙන් කර්මයන්ගේ ප්‍රවෘත්තියට මූලභාවයෙන් වාග්ද්වාරය යී කියනලද කර්මද්වාරයෙහි බහුලවශයෙන් පවත්නාහෙයින් **වචීකර්ම** නම් වේ; එහි;—

අභූතවස්තුව භූතහෙයින් මෙරමාහට හඟවනු කැමැත්තහුගේ එපරිද්දෙන් හඟවන ප්‍රයොගසමුට්ඨාපිකවූ චෙතනාතොමෝ **මෘෂාවාද** නම් වේ;—හෙතෙම මෙරමාගේ අර්ථවිනාශකරවූයේ ම කර්මපථ වෙයි; ඉතරය කර්මමාත්‍රය ම වේ.

මෙරමාගේ භෙදය කැමතිහෙයින් හෝ ආත්මප්‍රියකාම්‍යත්වයෙන් හෝ පරභෙදකරවාක්ප්‍රයොගජනිතවූ චෙතනාතොමෝ **පිශුනවාක්** නම් වේ;—හෝතොමෝ දෙදෙනාගේ භෙදය වූකල්හි ම කර්මපථ වේ.

මෙරමාගේ මර්මච්ඡෙදකරවාක්ප්‍රයොගය උපදවන්නාවූ එකාන්තපරුෂචෙතනාතොමෝ **පරුෂවාක්** නම් වේ.

ශීතාහරණාදි අනර්ථවිඥාපනප්‍රයොග උපදවන්නාවූ සඞ්ක්ලිෂ්ට චෙතනාතොමෝ **සම්ප්‍රලාප** නම් වේ;—ඒ සම්ප්‍රලාපයතෙම මෙරමාවිසින් අනර්ථය ගෘහීතකල්හි ම කර්මපථ වේ.

පරසම්පත්ති අභිමුඛ කොට ලොභවශයෙන් සිතන්නාවූ **අභිධ්‍යාව** ද,හිත-සුඛවිනාශයට හෙතුවූ මනඃප්‍රද්වෙෂසංඛ්‍යාතවූ **ව්‍යාපාදය** ද,"නත්ථි දින්නං"යනාදීන් විපරීතාකාරයෙන් දක්වන්නාවූ කර්මපථප්‍රාප්තවූ නාස්තික-අහෙතුක-අක්‍රියාදෘෂ්ටිසංඛ්‍යාත **මිථ්‍යාදෘෂ්ටිය** ද, කාය-වාග්විඥප්තියක් නැතිව ද ඒ චිත්තයෙහි ම බහුලවශයෙන් පවත්නාහෙයින් **මනඃකර්ම** නම් වේ.

ඒ ප්‍රාණාතිපාතාදිවූ දශප්‍රකාරඅකුශලයන් අතුරෙහි ප්‍රාණාතිපාතය ද,පරුෂවචනය ද,ව්‍යාපාදය ද,යන මොහු සහජාතාදිප්‍රත්‍යයවූ ද්වෙෂසංඛ්‍යාතමූලයෙන් නොහොත් ද්වෙෂමූලිකචිත්තයෙන් උපදනාහ.

කාමමිථ්‍යාචාරය ද,අභිධ්‍යාව ද,මිථ්‍යාදෘෂ්ටිය ද,යන මොහු ලොභමූලිකවූ චිත්තයෙන් උපදනාහ.

අවශිෂ්ටවූ අදින්නාදාන-මෘෂාවාද-පිශුනවාක්-සම්ප්‍රලාපය යන සතරදෙන ලොභ-ද්වෙෂ-මොහ යන මේ තුන්මුල්ඇති සිතින් වෙ

ත්;—චිත්තොත්පාදවශයෙන් වනාහි මේ අකුශලය සර්වප්‍රකාරයෙන් ද්වාදශප්‍රකාර වන්නේයි.

කාමාවචරකුශලය ද කායද්වාරයෙහි ප්‍රවෘත්තවූයේ කායකර්මය යි ද, වාග්ද්වාරයෙහි ප්‍රවෘත්තවූයේ වාක්කර්මයයි ද, මනොද්වාරයෙහි ප්‍රවෘත්තවූයේ මනඃකර්මයයි දැයි, කර්මයාගේ ප්‍රවෘත්තියට ද්වාරවශයෙන් ත්‍රිවිධ වන්නේයි.

මෙසේ ත්‍රිවිධකර්මවශයෙන් ෂඩාලම්බනයෙහි උපදනාවූ මේ චිත්තයතෙම ත්‍රිවිධනියමයෙන් ම උපදීනුයි "දාන-ශීල-භාවනාවශයෙන්" යනු කීහු.

දාන-ශීල-භාවනාවශයෙන් එසේ ම ත්‍රිවිධ වන්නේයි;-චිත්තොත්පාදවශයෙන් වනාහි මේ කාමාවචරකුශලචිත්තය වේදනා-ඥාන-සංස්කාරභෙදහෙයින් අෂ්ටප්‍රකාරවූයේ ද දානය, ශීලය, භාවනාවය, පිදීමය, වතාවත් කිරීමය, පින් දීමය, පින් අනුමෝදන් වීමය, දහම් ඇසීමය, දහම් කිමය, දෘෂ්ටිඍජුකර්මය, යන මොවුන්ගේ වශයෙන් දශප්‍රකාර වන්නේයි; එහි,—

සාධුශ්‍රද්ධාසන්තානඇත්තාහුගේ මෙරමාහට පූජා කැමතිබැවින් හෝ අනුග්‍රහවශයෙන් හෝ තමාගේ විද්‍යමානවස්තුපරිත්‍යාගවශයෙන් ප්‍රවෘත්තවූ චේතනාතොමෝ **දාන** නම් වෙයි;-දානවස්තුපර්යෙෂණවශයෙන් ද දෙනලද දානවස්තු ඇත්තාහුගේ සොම්නස්සහගත සිතින් දිනානුදානානුස්මරණවශයෙන් ද ප්‍රවෘත්තවූ පූර්ව-පශ්චාද්භාග චේතනා මෙහි ම සඞ්ග්‍රහබවට පැමිණේ;—මත්තෙහි ශීලාදීයෙහිදු යෙදෙන යෙදෙන පරිද්දෙන් ත්‍රිවිධචේතනා මෙසේ දතයුතු.

නිත්‍යශීලාදිවශයෙන් පඤ්ච-අෂ්ට-දශශීලයන් සමාදන් වන්නාහට ද සමාදන්ව පුරන්නාහට ද සමාදන් නොව ද සම්ප්‍රාප්තකාය-වාග්දුශ්චරිතයෙන් දුරුවන්නාහට ද පැවිදිවන්නාහට ද උපසම්පදා, මාලකයෙහි සංවර සමාදන් වන්නාහට ද චතුපාරිශුද්ධිශීලය පුරන්නාහට ද ප්‍රවෘත්තචේතනාතොමෝ **ශීලය** නම් වේ.

සතළිස්කර්මස්ථානයෙහි ද ස්කන්ධාදීයෙහි ද පරිකර්ම-කලාපසම්මර්ශනවශයෙන් ප්‍රවෘත්තවූ අර්පණප්‍රාප්ත නොවූ ගොත්‍රභූ අවසාන කොට ඇති චේතනාතොමෝ **භාවනා** නම් වේ;—නිරවද්‍යවිද්‍යාහදාරණ චේතනා ද මෙහි ම සඞ්ග්‍රහයට යේ.

වයසින් ද ගුණයෙන් ද ජ්‍යෙෂ්ඨයන් දැක ද චීවරාදිචතුර්විධප්‍රත්‍යයෙන් ප්‍රත්‍යාශාරහිතව අසඞ්ක්ලිෂ්ටවූ අධ්‍යාශයෙන් හුනස්නෙන් නැගී පෙරමගට ගොස් පාත්‍ර-චීවරප්‍රතිග්‍රහණ-අසනා'භිහාර-අභිවාදනාදිවිසින් බහුමානකරණ චේතනාතොමෝ **අපචායන** නම් වේ.

යට කීලෙසින් වැඩිමහල්ලවුන්ට ද ගිලනුන්ට ද යථොක්තවූ අධ්‍යාශයෙන් ඒ ඒ කෘත්‍යකරණ චේතනාතොමෝ **වෙය්‍යාවච්ච** නම් වේ.

තමා සන්තානයෙහි උපන්නාවූ පුණ්‍යකර්මයාගේ මෙරමා හා සාධාරණභාව කැමතිබැවින් දෙන්නාවූ චේතනාතොමෝ **ප්‍රාප්ති දාන** නම් වේ.

මෙරමාහිසින් දෙනලද්දාවූ ද නොදෙනලද්දාවූ ද පුණ්‍යය විගත මල-මාත්සය්‍යීයෙන් යුක්තවූ සිතින් අනුමෝදනාචෙතනාතොමෝ **ප්‍රාප්ත්‍යනුමෝදනා** නම් වේ.

මෙසේ මේ ධර්මය අසා ඒ ධර්මයෙහි කිපරිද්දෙන් ලෞකික-ලොකොත්තරගුණවිශෙෂයන්ට හිමි වෙමි යි කියා හෝ බහුශ්‍රැතව මෙරමාහට ධර්මදෙශනාදිවශයෙන් අනුග්‍රහ කෙරෙමි යි හෝ මෙසේ තමාට හෝ මෙරමාහට හෝ හිතස්ඵරණවශයෙන් ප්‍රවෘත්තවූ අසඞ්කලිෂ්ටවූ අධ්‍යාශයෙන් හිතොපදෙශශ්‍රවණචෙතනාතොමෝ **ධර්මශ්‍රවණ** නම් වේ;—නිරවද්‍යවිද්‍යාදිශ්‍රවණචෙතනා ද මෙහි ම සඞ්ග්‍රහ කරණුලැබේ.

ලාභසත්කාරාදියෙහි නිරපෙක්ෂබැවින් අසඞ්කලිෂ්ටඅධ්‍යාශයෙන් මෙරමාහට හිතොපදෙශචෙතනාතොමෝ **ධර්මදෙශනා** නම් වේ;—නිරවද්‍යවිද්‍යාදිඋපදෙශචෙතනා ද මෙහි ම සඞ්ග්‍රහයට දේ.

“අත්ථි දින්නං”යනාදික්‍රමයෙන් ප්‍රවෘත්ත සම්‍යග්දර්ශනවශයෙන් දෘෂ්ටිය ඍජු කිරීම **දෘෂ්ට්‍යෘජුකර්ම** නම් වේ,—ඉදින් සම්‍යග්දර්ශනවශයෙන් දෘෂ්ටිඍජු කිරීම දෘෂ්ට්‍යෘජුකර්ම නම් වූව ඥානවිප්‍රයුක්තචිත්තයාගේ දෘෂ්ට්‍යෘජුකර්මසංඛ්‍යාත පුණ්‍යක්‍රියාභාවය නොලැබෙන්නේ ද යත් ? නොලැබෙන්නේ නොවේ; කුමක්හෙයින් ද යත් ? පූර්ව-පශ්චිමචෙතනාවන්ගේ ද ඒ ඒ පුණ්‍යක්‍රියාවස්තුයෙහි සඞ්ග්‍රහවනහෙයින්;—කිසිසේත් දෘෂ්ටිය ඍජු කරණ කාලයෙහි චිත්තය ඥානසම්ප්‍රයුක්ත ම වෙයි;ඒ කාලයට පූර්ව-පශ්චිමවිභාගයෙහි වනාහි ඥානවිප්‍රයුක්තවූ චිත්තය ද සම්භව වේනුයි,ඕහට ද දෘෂ්ට්‍යෘජුකර්මත්වය යුක්ත මැයි.

මේ දශවිධපුණ්‍යක්‍රියාවස්තූන් අතුරෙන් ප්‍රාප්තිදානය ද,අනුමෝදනා ද,යන මොහු දෙදෙන දානස්වභාවයක්හෙයින් දානයෙහි සඞ්ග්‍රහබවට යන්නාහු; යම්හෙයකින් දානය ඊර්ෂ්‍යා-මාත්සය්‍යී යන මොවුන්ට ප්‍රතිපක්ෂ ද පත්තිදාන-අනුමෝදනා දෙදෙන ද ඊර්ෂ්‍යා-මාත්සය්‍යී යන මොවුන්ට ප්‍රතිපක්ෂයෝ යි;එසේ හෙයින් ප්‍රාප්තිදාන-අනුමෝදනා දෙදෙන ද සමානප්‍රතිපක්ෂතායෙන් එකලක්ෂණබවහෙයින් දානමයපුණ්‍යක්‍රියාවස්තුයෙහි සඞ්ග්‍රහ කරණුලැබෙත්; අපචායන-වෛයාවච්ච යන දෙදෙන චාරිත්‍රශීලබැවින් ශීලමය පුණ්‍යක්‍රියාවස්තුයෙහි සඞ්ග්‍රහ කරණුලැබෙත්,-දෙශනා-ශ්‍රවණ-දෘෂ්ට්‍යෘජුකර්මයෝ වනාහි කුශලධර්මයෙහි ආසෙවනයක් හෙයින් භාවනාමය පුණ්‍යක්‍රියාවස්තුයෙහි සඞ්ග්‍රහ කරණුලැබෙත්,-සමහර ආචාය්‍යීවරකෙනෙක් වනාහි“ධර්මදෙශනා කෙරෙමින් ද අසමින් ද දෙශනානුසාරයෙන් ඥානය මෙහෙයා ධර්මයන්ගේ ලක්ෂණප්‍රතිවෙධ කොට ධර්මය දෙසා ද, අසා ද, එසේ හෙයින් ඒ දෙශනා-ශ්‍රවණය යන මොහු දෙදෙන ද ප්‍රතිවෙධය ම එලවත්නුයි, දෙශනා-ශ්‍රවණය යන මොහු භාවනාමයපුණ්‍යක්‍රියාවස්තුයෙහි සඞ්ග්‍රහ බවට යෙති”යි කියත්,—ධර්මදානස්වභාවයක් හෙයින්“දෙශනාව දානමයපුණ්‍යක්‍රියාවස්තුයෙහි සඞ්ග්‍රහ

බවට යන්නේය"යි කියන්නට ද පිළිවනි; වදාරණලදමැයි;-"සබ්බදානං ධම්මදානං ජිනාති"යි.

එසේ ම දෘෂ්ට්‍යර්ජ්ජුකර්මය ද සියලු දානාදිවස්තූන්ට නියම ලක්‍ෂණයක් වනබැවහෙයින් දානාදිවූ සියලුතැන්හි ම සඞ්ග්‍රහබවට යන්නේ යි;එසේ මැයි, දානාදීන් අතුරෙන් යම්කිසිවෙක් "අත්ථි දින්නං" යනාදීනයින් ප්‍රවෘත්තවූ සම්‍යග්දෘෂ්ටියම්සින් ශුද්ධ කරණලද්දේ මහත්ඵල-මහානිසංස වේනුයි කියායි,—එසේ ම දීඝසඟිඅටුවායෙහි,-"දිට්ඨිජ්ජුකම්මං සබ්බෙසං නියමලක්ඛණං"යි කියනලදි.

මෙසේ දාන-ශීල-භාවනාවශයෙන් ත්‍රිවිධවූ පුණ්‍යක්‍රියාවස්තුයෙහි සෙස්සන්ගේ ද සඞ්ග්‍රහය වනහෙයින් සාංක්‍ෂෙපයෙන් පුණ්‍යක්‍රියාවස්තුව ත්‍රිවිධ ම වන්නේය යි දතයුත්තේයි;එසේ හෙයින් ම ආචාර්‍ය්‍යවරයන්විසින් යට"එසේ ම-දාන-ශීල-භාවනාවශයෙන්"යි කියා කියනලදී;—ඒ මේ කුශලා'කුශලවශයෙන් විංශතිප්‍රකාරවූ කර්මය වනාහි **කාමාවචරකර්මය** යි කියා ම සඞ්ග්‍රහබවට යන්නේයි.

**රූපාවචරකුශලය** වනාහි විඥප්තිජනකභාවයෙන් කායද්වාරාදියෙහි නොපවතිනුයි මනඃකර්ම නම්, ඒ රූපාවචරකුශලය ද දානාදිවශයෙන් නොපවත්නාහෙයින් භාවනාමයවූයේ පූර්වභාගයේ ප්‍රවෘත්තවූ චිත්තයන් කාමාවචරබැවින් අර්පණාබවට පැමිණියේ ප්‍රතිපදාදිභෙදයෙන් අනෙකවිධබවක් ඇතිකල්හිදු අඞ්ගාතික්‍රමණවශයෙන් නිර්වෘත්තවූ විතර්කාදිධ්‍යානාඞ්ගප්‍රභෙදයෙන් පඤ්චප්‍රකාර වේ.

එසේ ම **අරූපාවචරකුශල**චිත්තය ද කායාදිද්වාරයෙහි නොපවත්නාහෙයින් මනඃකර්ම මැයි, ඒ අරූපාවචරකුශලචිත්තය ද භාවනායෙන් සඤ්ජාතවූයේ අර්පණාවට පැමිණියේ කෘත්ස්නෝද්ඝාටජආකාශාදි චතුර්විධආලම්බනප්‍රභෙදහෙයින් චතුර්විධ වේ.

(කියනලද මැයි,—

"කසිණුග්ඝාටිමාකාසමාකාසවිසයං මනො,
තදභාවො තදාලම්බවිඤ්ඤාණන්ති චතුබ්බිධං"-යි.)

මේ විපාකස්ථානවශයෙන් චතුර්විධවූ කර්මයන් අතුරෙහි ඖද්ධත්‍ය සහගත චෙතනාරහිතවූ ඒකාදශවිධවූ අකුශලකර්මය චතුර්විධවූ අපායභූමියෙහි ප්‍රතිසන්ධිය උපදවන්නේය; ප්‍රවෘත්තියෙහි වනාහි ඖද්ධත්‍යසහගතචිත්තයා හා සමග සියලු ද්වාදශවිධවූ ම අකුශලචිත්තය විපාක දෙන්නේයි;—මෙහි වනාහි කවරකාරණයෙකින් අධිමොක්‍ෂවිරහයෙන් සර්වදුර්වලවූ විචිකිත්සාසහගත චිත්තය ප්‍රතිසන්ධිය දේ ද ? අධිමොක්‍ෂසම්ප්‍රයොගයෙන් ඕහට ද වඩා බලවත්වූ ඖද්ධත්‍යසහගත චිත්තය හා ප්‍රතිසන්ධි නොදේ ද යත්?-ප්‍රතිසන්ධිදානස්වභාවයක් නැතිහෙයිනි;එසේ මැයි,බලවත්තැනැත්තේ ම ප්‍රතිසන්ධි දෙන්නේය, දුර්වලයෝ නොදෙන්නෝය,යන මේ විචාරණය ප්‍රතිසන්ධිදානස්වභාවයෙක් ම ඇත්තාවූ ධර්මවිෂයෙහි මය; යමක්හුගේ වනාහි ප්‍රතිසන්ධිදානස්වභාවයෙක් නැද්ද, ඔහුගේ බලවත්බව ප්‍රතිසන්ධිදානයට කාර

ණි නොවේ;—ඖබන්‍ධසහගතචිත්තයාගේ ප්‍රතිසන්ධිදානස්වභාවය නැතැයි කෙසේ දන්නාලැබේ ද යත්?—දශීනයෙන් ප්‍රහාතව්‍යධම් යන්කෙරෙහි නොඅහෙසිනි.

(කියනලද මැයි;-

"උද්ධච්චරහිතා සෙසා'කුසලා'පායසාධකා,
සබ්බ සුගතියඤ්චාපි පවත්තිඵලදායකා.
දස්සනෙන පහාතබ්බස්සවුත්තත්තා'ච තාදිනා,
උද්ධච්චං සන්ධිඵලදං න හොතෙවා'ති නිච්ඡයො.
පවත්තිඵලදානම්පි නෙතෙ'කෙ තං න යුජ්ජති,
උද්ධච්චං පාකපක්ඛෙ හි වුත්තත්ථපටිසම්භිදා"—ටී.)

අකුශලවිපාකයෝ සද්දෙන සුගති-දුර්ගතිවශයෙන් සියලු ම කාමභවයෙහි ද රූපභවයෙහි ද චාරාලම්බනානුරූපවශයෙන් විපාක දෙත්;—මෙහි අපායෙහි දු නාග-සුපර්ණාදීන්ට මහාසම්පත්තිවිෂයවූ යම් විපාකවිඥානයෙක් උපදී ද, නිරයවාසීන්ට මහාමෞද්ගල්‍යායන ස්ථවිරදශීනාදි යම් යම් විපාකවිඥානයෙක් උපදී ද, ඒ කුශලකර්මයා ගේ ම විපාකය;යම්හෙයකින් අකුශලවිපාකයාගේ ම ඉෂ්ටවිපාකයෙ ක් සම්භව නොවේ ද,එසේහෙයින් කුශලකර්මය අපායෙහිදු අහෙ තුකවිපාකයන් උපදවන්නේයි; අන්‍යභූමිකකර්මයාගේ ද අන්‍යභූමික විපාකයන් නොවනහෙයිනි;—කාමවිරාගභාවනාවගේ කාමතෘෂ්ණා විෂයවූ විඥානොත්පත්තිය හා යොගයක් නැතිහෙයින් මහද්ගත-ලොකොත්තරකුශලයන්ගේ ඒකාන්තසදෘශවිපාකබවක් හෙයින් ද රූපාවචරකර්මයෙන් අහෙතුකවිපාකොත්පත්තියක් නැතිහෙයින් රූපලොකයෙහි සුඛුසුපරිද්දෙන් රූපාදිවිෂයවූ ම ඒ අකුශලවිපාකයන් උපදවාතුයි"සියලු කාමභවයෙහිදු"යනාදි කියනලදී.

කාමාවචරකුශලය ද සප්තකාමස්වර්ගයෙහි ම ප්‍රතිසන්ධි දෙන් නේය;එසේ ම ප්‍රවෘත්තියෙහි ද මහාවිපාකයන් ද උපදවන්නේයි;—අහෙතුකවිපාකයෝ අටදෙන වනාහි සි..ලු කාමභවයෙහි ද රූපභව යෙහි ද සුඩුසුපරිද්දෙන් විපාක දෙත්;—මෙසේ විපාක දෙන්නාවූ කුශලකර්මය ෂොඩශක-ද්වාදශක-අෂ්ටකවිපාකවශයෙන් තුන්පරිද්දෙ කින් දෙන්නේය යි දක්වනුපිණිස "ඒ කුශලකර්මයන් අතුරෙහි ද" යි කියනලදී.

මෙසේ විපාක දෙන්නාවූ ඒ කුශලකර්මයන් අතුරෙහි ද කුශල පරිවාරලාභයෙන් හෝ පසුව ආසෙවනප්‍රත්‍යයෙන් හෝ විශිෂ්ටවූ අලොභ-අද්වෙෂ-අමොහහෙතුවශයෙන් ත්‍රිහෙතුකවූ කුශලකර්මය එක ම ත්‍රිහෙතුකපිළිසඳ දී ප්‍රවෘත්තියෙහි සහෙතුක-අහෙතුකවශ යෙන් සොළොස්විපාකයන් උපදවන්නේයි;—මෙහි යම් කර්මයක් තමාගේ ප්‍රවෘත්තිකාලයෙහි පූර්ව-පශ්චිමභාගප්‍රවෘත්තවූ කුශලකර් යන්විසින් පිරිවරණලද්දේ හෝ පසුව නැවත නැවත ආසෙවනලා භයෙන් පුරුදු කරණලද්දේ හෝ වේ ද, ඒ කර්මය උත්කෘෂ්ට නම්

වෙයි, එක ම කර්මයෙක් එක ම ප්‍රතිසන්ධියක් දෙත් මුත් නොයෙක් ජාතියෙහි ප්‍රතිසන්ධි නොදෙන්නේය, ප්‍රවෘත්තිවිපාක වනාහි ජාතිශතයෙහිත් ජාතිසහස්‍රයෙහිත් දෙන්නේ මැයි;—කියනලදමැයි,—"තිරච්ඡානගතෙ දානං දත්වා සතගුණා දක්ඛිණා පාටිකංඛිතබ්බා"යි.

මෙහි යම් හෙයකින් ප්‍රඥාව ජාත්‍යන්ධාදිවිපත්තියට නිමිත්තවූ මොහයට හෝ සර්වාකුශලයන්ට හෝ ප්‍රතිපක්ෂ ද, එහෙයින් ඥානසම්ප්‍රයුක්තවූ කුශලකර්මය ජාත්‍යන්ධාදිවිපත්තියට කාරණ නොවේනුයි;- ත්‍රිහෙතුකකුශලකර්මය අතිදුර්වලවූයේ ද ද්විහෙතුකවූ ප්‍රතිසන්ධිය ම ආකර්ෂණය කරන්නේය, අහෙතුකප්‍රතිසන්ධිය නොදෙන්නේය, යම්සේ කුශලකර්මය අලොභසම්ප්‍රයොගාභාවයෙන් අලොභඵලොත්පාදනයෙහි අසමර්ථ ද, එමෙන් ද්විහෙතුකකුශලකර්මය ද අතිඋත්කෘෂ්ටවූයේ ද ඥානසම්ප්‍රයොගාභාවයෙන් ඥානඵලොත්පාදනයෙහි අසමර්ථවූයේ ද්විහෙතුකප්‍රතිසන්ධිය ම දෙන්නේය, ත්‍රිහෙතුකප්‍රතිසන්ධිය නොදෙන්නේය යි දක්වන්නානු"ලාමකවූ ත්‍රිහෙතුකකුශලය ද" යනාදි කීනු.

අකුශලපරිවාරලාභයෙන් හෝ මාවිසින් මේ නපුරුකොට කරණලදැයි පසුව විපිළිසර ඉපදවීම්වශයෙන් හෝ ලාමකවූ ත්‍රිහෙතුක කුශලය ද අලොභ-අද්වෙෂහෙතුවශයෙන් ද්විහෙතුකවූ උත්කෘෂ්ටකුශලය ද ද්විහෙතුකවූ එක ම පිළිසඳක් දී ප්‍රවෘත්තියෙහි ඥානසම්ප්‍රයුක්තත්‍රිහෙතුකවිපාකරහිතවූ ඥානවිප්‍රයුක්තවිපාකයෝ සතරදෙනාය, අහෙතුකවිපාක අටදෙනාය,යි මෙසේ ද්වාදශවිපාකයන් දෙන්නේය; ද්විහෙතුකවූ ලාමකවූ කුශලය වනාහි අහෙතුකවූ ම එක පිළිසඳක් දෙන්නේය; ප්‍රතිසන්ධියෙන් මත්තෙහි ප්‍රවෘත්තියෙහි ද ත්‍රිහෙතුක-ද්විහෙතුකවිවර්ජිතවූ අහෙතුකවිපාකයන් ම දෙන්නේයි;-මෙසේ ත්‍රිහෙතුකාදිකර්මයන් අනුරෙහි එක ම චෙතනාවෙන් ත්‍රිහෙතුකවිපාකයෝ සොළසෙක් ද, ද්විහෙතුකවිපාකයෝ දොළසෙක් ද, අහෙතුක විපාකයෝ අටෙක් ද, වන්නෝය යි ප්‍රවෘත්තවූ ත්‍රිපිටකචූළනාගස්ථවිරවාදවශයෙන් විපාකප්‍රවෘත්තිය දක්වා දූන් ඒ එක ම චෙතනාවෙන් ත්‍රිහෙතුකදොළසෙක් ද, ද්විහෙතුකවිපාකදශයෙක් ද, අහෙතුකවිපාකයෝ අටෙක් ද, වන්නෝය යි මෙසේ ප්‍රවෘත්තවූ මොරවාපිවාසි මහාධර්මරක්ඛිතස්ථවිරවාදවශයෙන් සංස්කාරභෙදය දක්වනුපිණිස "අසඞ්ඛාරං"යනාදි කීහු.

[අසංඛාරං සසංඛාරවිපාකානි න පචචති,
සසංඛාරමසංඛාරවිපාකානි'ති කෙචන.]

අසංස්කාරිකකුශලකර්මය සසංස්කාරිකවිපාකයන් නොදෙන්නේය, සසංස්කාරිකකුශලකර්මය අසංස්කාරිකවිපාකයන් නොදෙන්නේය යි, සමහරආචාර්ය්‍යවරකෙනෙක් කියත්;—යම්සේ දර්පණතලයෙන් මුහුණ බලනකල මුඛය චලිත කළකල්හි දර්පණතලයෙහි මුඛනිමිත්තයත් චලිත වේ ද, එපරිද්දෙන් අසංස්කාරිකකුශලයන්ගේ තත්සදෘශවූ

අසංස්කාරිකවිපාකය ම වෙයි, සසංස්කාරිකවිපාකය නොවන්නේය යි,මෙසේ ආගමනවශයෙන් සංස්කාරිකභෙදය වන්නේය යනු අභිප්‍රායයි..

[තෙසං ද්වාදසපාකානි දසා'ට්ඨ ච යථාක්කමං,
යථාවුත්තානුසාරෙන යථාසම්භවමුද්දිසෙ.]

ඔවුන්ගේ මතයෙහි ත්‍රිහෙතුකොත්කෘෂ්ටාදීන්ගේ අනුක්‍රමයෙන් ත්‍රිහෙතුකොත්කෘෂ්ටඅසංස්කාරිකකර්මයාගේ වශයෙන් ත්‍රිහෙතුකසසංස්කාරිකචතුෂ්කවර්ජිතවූ ද එසේ ම ත්‍රිහෙතුකොත්කෘෂ්ටසසංස්කාරිකකර්මයාගේ වශයෙන් අසංස්කාරිකචතුෂ්කවර්ජිතවූ ද ද්වාදශවිපාකයන් ද, ත්‍රිහෙතුකනිකෘෂ්ට-ද්විහෙතුකොත්කෘෂ්ටඅසංස්කාරිකකර්මයාගේ වශයෙන් ද්විහෙතුකසසංස්කාරිකචතුෂ්කවර්ජිතවූ ද ත්‍රිහෙතුකනිකෘෂ්ට-ද්විහෙතුකොත්කෘෂ්ටසසංස්කාරිකකර්මයාගේ වශයෙන් ද්විහෙතුකඅසංස්කාරිකචතුෂ්කවර්ජිතවූ ද දශවිපාකයන් ද,එසේ ම ද්විහෙතුකනිකෘෂ්ටඅසංස්කාරික-සසංස්කාරිකකර්මයාගේ වශයෙන් ද්විහෙතුකවිපාකචතුෂ්කවර්ජිතවූ අහෙතුකවිපාකයන් අටදෙනා ද,"උත්කෘෂ්ටවූ ත්‍රිහෙතුකකුශලය ත්‍රිහෙතුකප්‍රතිසන්ධිය දී"යනාදියෙන් පූර්වයෙහි කියනලදක්‍රමය අනුව ස්මරණය කිරීමෙන් ඒ ඒ කර්මයට ලැබෙන පරිද්දෙන් කියන්නේයි.

රූපාවචරකුශලය වනාහි උත්පාදිතමාත්‍රව අනාසෙවිතවූ බැවින් පරිත්තවූ ප්‍රථමධ්‍යානය වඩා බ්‍රහ්මපාරිෂද්‍යදෙවතාවන්කෙරෙහි උපදිත්;අතිසුභාවිත නුවූ අපරිපූර්ණවශිභාව ඇතිහෙයින් මධ්‍යමවූ එම ප්‍රථමධ්‍යානය වඩා බ්‍රහ්මපුරොහිතයන්කෙරෙහි උපදිත්; අතිශයින් සුභාවිතවූ සර්වප්‍රකාරයෙන් පරිපූර්ණවූ වශිභාවයෙන් ප්‍රකෘෂ්ටභාවයට පැමිණිහෙයින් ප්‍රණීතවූ එම ප්‍රථමධ්‍යානය වඩා මහාබ්‍රහ්මයන්කෙරෙහි උපදිත්;-එසේ ම යථොක්තක්‍රමයෙන් පරිත්තවූ ද්විතීයධ්‍යානය ද තෘතීයධ්‍යානය ද වඩා පරිත්තාභයන්කෙරෙහි ද, මධ්‍යමවූ එම ධ්‍යානයන් වඩා අප්‍රමාණාභයන්කෙරෙහි ද, උත්තමවූ එම ධ්‍යානයන් වඩා ආභාස්වරයන්කෙරෙහි ද, උපදිත්;—එසේ ම පරිත්තවූ චතුර්ථධ්‍යානය වඩා පරිත්තශුභයන්කෙරෙහි ද, මධ්‍යමවූ එම ධ්‍යානය වඩා අප්‍රමාණශුභයන්කෙරෙහි ද, ප්‍රණීතවූ එම ධ්‍යානය වඩා ශුභකෘත්ස්නයන්කෙරහි ද, උපදිත්;—පරිත්ත-මධ්‍යම-ප්‍රණීතවශයෙන් ත්‍රිවිධවූ අග්‍රභාවයට අසම්ප්‍රාප්තවූ පඤ්චමධ්‍යානය වඩා වෘහත්ඵලයන්කෙරෙහි උපදනාහයි; මෙහි අග්‍රභාවප්‍රාප්තවූ පඤ්චමධ්‍යානය වනාහි අවිපාකස්වභාවයි;—එම පඤ්චමධ්‍යානය සංඥාවිරාගවශයෙන් වඩා හෙවත් "සඤ්ඤා රොගො සඤ්ඤා ගණ්ඩො" යනාදින් හෝ "ධී චිත්තං, ධී වතෙදං චිත්තං" යනාදින් හෝ අරූපප්‍රවෘත්තියෙහි ආදීනවදර්ශනයෙන් ද තදභාවයෙහි ද ප්‍රණීතභාවය සනිටුහන් කිරීමෙන් ද අරූපයාගේ අනුත්පත්තිස්වභාවාපාදනවශයෙන් අරූපවිරාගභාවනා වඩා අසංඥසත්වයන්කෙරෙහි කර්ම-ක්‍රියාවාදීවූ තීර්ථකයෝ උපදිත්;—ඔ

හු යම් ඊර්‍ය්‍යාපථයකින් මෙහිදී මියෙද්ද එම ඉරියව්වෙන් එහි උපදනාහයි දතයුතු.

අනාගාමීහු වනාහි පඤ්චශුද්ධාවාසයෙහි උපදිත්;—මෙහි අනාගාමි ආර්‍ය්‍යයෝ ම පෘථග්ජනාදිකාලයෙහි හෝ පසුව හෝ පඤ්චමධ්‍යානය හීන-මධ්‍යම-ප්‍රණීතවශයෙන් වඩා ශ්‍රද්ධාදි ඉන්ද්‍රියනානාත්වානුක්‍රමයෙන් පඤ්චශුද්ධාවාසයෙහි උපදිත්.

ආකාසානඤ්චායතනාදිවූ අරූපාවචරකුශලය ද අනුක්‍රමයෙන් වඩා ප්‍රථමාරූප්‍යාදියෙහි අනුක්‍රමයෙන් උපදනාහුයි.

(කියනලද මැයි.);—

[ඉත්ථං මහග්ගතං පුඤ්ඤං යථාභූමිවවත්ථිතං,
ජනෙති සදිසං පාකං පටිසන්ධිපවත්තියං.]

මෙකී ප්‍රකාරයෙන් භූමිවූ පරිච්ඡෙදෙන් නියමිතවූ (හෙවත්—ඒ ඒ භූමියට නියමකරණලද) මහද්ගතකුශලයතෙම ප්‍රතිසන්ධියෙහි ද ප්‍රවෘත්තිකාලයෙහි ද ඒ ඒ භූමියෙහි ඒ ඒ ධ්‍යානයට සුදුසුවිපාකය උපදවන්නේයි.

මෙසේ යථොක්තවූ සියල්ල ඒ ඒ ධ්‍යානයාගේ ආවෙනිකභූමිවශයෙන් කියනලද, භවනිකාන්තිය ඇතිකල්හි වනාහි පෘථග්ජනාදීහු යථාලබ්ධධ්‍යානයාගේ භූමිභූතවූ පඤ්චශුද්ධාවාසවර්ජිත යම්කිසි ධ්‍යානතලයෙක්හි උපදනාහ; එසේ කාමභවයෙහි කාමාවචරකර්‍මබලයෙන් උපදිත්, එසේ මැයි,—"ඉජ්ඣති භික්ඛවෙ සීලවතො චෙතොපණිධි විසුද්ධත්තා"යී කියනලදී;-අනාගාමීහු වනාහි කාමරාග සර්‍වප්‍රකාරයෙන් ප්‍රහීණහෙයින් කාමභවයෙහි නිකාන්තිය නොඋපදවත්නුයි කාමලොකවර්ජිතවූ යථාලබ්ධධ්‍යානයට භූමිවූ යම්කිසි ධ්‍යානතලයෙක්හි උපදිත්;-ශුද්ධාවාසයෙහි වනාහි අනාගාමීහු ම උපදනාහ යී නියමය; ඒ අනාගාමීහු වනාහි අනික්තැනක නොඋපනාහ යී නියම නැති.

(එහෙයින් ම කියනලදී;—

"සුද්ධාවාසෙසවනාගාමිපුග්ගලා 'වොපපජ්ජරෙ,
කාමධාතුම්හි ජායන්ති අනාගාමිවිවජ්ජිතා"—යි.)

ශුෂ්කවිදර්ශකවූ ඒ අනාගාමීහු වනාහි මරණකාලයෙහි සමාධියෙහි පරිපූරකාරීබැවින් ඒකාන්තයෙන් ම ධ්‍යාන උපදවා බ්‍රහ්මලොකයෙහි උපදනාහ යී දතයුතු;—අෂ්ටසමාපත්තිලාභීවූ ද ආර්‍ය්‍යවූ හෝ අනාර්‍ය්‍යවූ හෝ සත්හු වනාහි බ්‍රහ්මපාරිෂද්‍යතලයෙහි ම උපදිත්යයි අටුවාහි කියනලදී;—තවද මෙහි වෘහත්ඵල-අකනිෂ්ඨ-චතුර්ථාරූප්‍යභවයන් තමන් ශ්‍රෙෂ්ඨභවයන්හෙයින් එහි උපන් ආර්‍ය්‍යයෝ අනික්තැනක නොඋපදිත්;-එසේම අවශිෂ්ටවූ මතුමත්තෙහි බ්‍රහ්මලොකයෙහි උපන්නාවූ ආර්‍ය්‍යයෝයට යට බ්‍රහ්මලොකයෙහි නොඋපදිත්.

(හෙද කියනලද මැයි;—

"වෙහප්ඵලෙ අකනිට්ඨෙ භවග්ගෙ ච පතිට්ඨිතා,
න පුනඤ්ඤත්ථ ජායන්ති සබ්බෙ අරියපුග්ගලා;
බ්‍රහ්මලොකගතා හෙට්ඨා අරියා නොපපජ්ජරෙ—"යි.)

### මේ වීථිමුක්තසඞ්ග්‍රහයෙහි මේ කර්ම්මචතුෂ්කයයි.

කර්ම්මානුභාවයක් ඇතිකල්හි ද ඒ ඒ ගතියෙහි යථාපරිච්ඡින්නආයුස්සංඛ්‍යාගේ ක්ෂයයින් ද; ඒ ඒ ගතියෙහි පරිච්ඡින්නවූ ආයුඃශෙෂයක් ඇත ද ගති-කාලාදි ප්‍රත්‍යයසාමග්‍රියක් ඇත ද ඒ ඒ භවසාධකකර්ම්මයාගේ පරිනිෂ්ඨිතවූ විපාක ඇතිබැවින් කර්ම්මක්ෂයයින් ද; ආයුඃ-කර්ම්මදෙදෙනා සමව පරික්ෂීණබවහෙයින් උභයක්ෂයයින් ද; ඒ ත්‍රිප්‍රකාරවූ ආයුඃ-කර්ම්මදෙදෙනා ඇතිකල්හි ද පූර්වභවයෙහි සිඬවූ කිසි උපච්ඡෙදකකර්ම්මයක් හුගේ බලයෙන් ද, ශස්ත්‍රාහරණාදිවූ උපක්‍රමයෙන් සිඳුනාලද සන්තාන ඇත්තවුන්ගේ වශයෙන් ද (නොහොත්—ගුණවහතුන්කෙරෙහි කරණලද්දාවූ කිසි උපක්‍රමයකින් එලවනලද්දාවූ උපච්ඡෙදකකර්ම්මයාවිසින් ප්‍රතිබාහනය කරණලද සාමර්ථ්‍යය ඇති කර්ම්මයාගේ, නොහොත්—ප්‍රත්‍යක්ෂආත්මභාවයෙහි ගුණමහතුන්කෙරෙහි කරණලද්දාවූ කිසි උපක්‍රමයෙකින් කලාබුරාජාදින්ට මෙන් එලවනලද්දාවූ උපච්ඡෙදකකර්ම්මවශයෙන් දෑයි; මරණොත්පත්ති නම් චතුර්විධ වේ.

යථොක්තවූ ආයුඃක්ෂයාදින් මියන්නාවුන්ට වනාහි මරණාසන්නකාලයෙහි ඒ ඒ ගතියෙහි උපදනාවූ සත්ත්වයන්ට අනුරූපවශයෙන් ගරුකාදිවශයෙන් මනොද්වාරයෙහි අභිමුඛවූ අනන්තරභවයෙහි ප්‍රතිසන්ධිජනකවූ කාමාවචරකර්ම්මයෙක් හෝ ඒ කර්ම්මය කරණවේලෙහි චෛත්‍යදර්ශනාදිවශයෙන් චක්ෂුර්ද්වාරයෙන් උපලබ්ධපූර්ව්වූ ද, පූජාදිවශයෙන් උපකරණවූ ද, රූපාදිවූ ප්‍රත්‍යුත්පන්නාදි භෙදඇති කර්ම්මනිමිත්තයෙක් හෝ ඉක්බිතිව ඉපැද්දයුතු සුගති-දුර්ගතිභවයෙහි ලැබියයුතුවූ දිව්‍යාඞ්ගනා-කල්පවෘක්ෂ-නරකාග්නිආදිවූ අනුභව කටයුතුවූ ගතිනිමිත්තයෙක් හෝ ප්‍රතිසන්ධිජනකකුශලාකුශලකර්ම්මානුභාවයෙන් මතු වක්ෂ්‍යමාණක්‍රමයෙන් සම්භවවූ පරිද්දෙන් ෂඩ්විධවූ උත්පත්තිද්වාරයන් අතුරෙන් එක්තරා ද්වාරයෙක්හි වැටහෙන්නේයි,—මෙහි දිව්‍යාඞ්ගනා-විමාන-කල්පවෘක්ෂ-මාතෘකුක්ෂිආදිගතවූ රූපායතනය **සුගතිනිමිත්ත** නම් වේ; නරකාග්නි-නිරයපාලාදිගතවූ රූපායතනය **දුර්ගතිනිමිත්ත** නම් වේ; කිසිතැනෙකත් උත්පත්තියක් නැති ක්ෂීණාශ්‍රවයන්ට යථොපස්ථිතවූ නාම-රූපධර්ම්මාදිය ම ච්‍යුතිචිත්තයට විෂය වෙයි, කර්ම්මනිමිත්තාදිහු විෂය වන්නාහු නොවෙත්.

එයින් මත්තෙහි එසේ කර්ම්මනිමිත්තාදිවශයෙන් එළඹ සිටියාවූ එම රූපාදිඅරමුණු අරබයා ප්‍රතිසන්ධිදායක කුශලාකුශලකර්ම්මයට අනුකූලව කුශලජවනප්‍රවෘත්තිවශයෙන් පිරිසිදුවූ හෝ අකුශලජවනප්‍රවෘත්තිවශයෙන් කිළුටුවූ හෝ ඉපැද්දයුතු සුගති-දුර්ගතිභවයට අනතුරුවූ චිත්තසන්තතිය ඒ ඉපැද්දයුතු භවයෙහි නමිත වූවාක්

මෙන්, නොහොත්—ඒ ඉපැද්දයුතු භවයෙහි නම්නව ම බහුලවශයෙන් අනවරතයෙන් පවත්නේයි, නොහොත්—ප්‍රතිසන්ධිජනකවූ එම කර්‍මය වනාහි අභිනවකරණවශයෙන් ඒ ක්‍ෂණයෙහි දත් දෙන්නක්නු මෙන් පූජා කරන්නක්නු මෙන් ද්වාරප්‍රවෘත්තවූයේ වේ.

එකවීථිචිත්තප්‍රමාණවූ ආයුර්වශයෙන් හෝ එයට මදක් අධිකායුර්වශයෙන් හෝ ආසන්නමරණ ඇති ඕහට තදාලම්බනාවසානවූ ද වීථිචිත්තයන්ගේ අවසානයෙහි හෝ එකජවනවීථියෙන් අධිකතරවූ ආයුඃශේෂය ඇති කල්හි භවාඞ්ගක්ෂණයෙහි හෝ ච්‍යුතිවශයෙන් වර්ත්තමානභවයාගේ අවසානවූ ච්‍යුතිචිත්තය ඉපිද නිරුද්ධ වන්නේයි,—එහි කාමභවයෙන් ච්‍යුතව කාමභවයෙහි ම උපදනවුන්ට ච්‍යුතිචිත්තය තදාලම්බනාවසානය, සෙස්සවුන්ට ජවනාවසානය යී කියනලදී.

ඒ ච්‍යුතිචිත්තය නිරුද්ධවූ අනන්තරයෙහි ඒ ච්‍යුතිචිත්තයාට ඉක්බිති ව ම ෂඩ්ද්වාරයන් අතුරෙන් එක්තරා ද්වාරයකින් එසේ ගන්නාලද හෙවත්-කාමාවචරප්‍රතිසන්ධිවීනම් කර්‍ම-කර්‍මනිමිත්ත-ගතිනිමිත්තයන් අතුරෙන් අන්‍යතරවූ ද මහද්ගතවූ ප්‍රතිසන්ධි වීනම් ඒ ඒ කුශලධ්‍යානයට අරමුණුවූ කසිනාදිභෙදවූ කර්‍මනිමිත්ත ම වූද ආලම්බනය විෂය කොට හෘදයවස්තුව හා සමග උපදනාහෙයින් සවස්තුකවූ හෝ අරූපාවචරප්‍රතිසන්ධිවශයෙන් අවස්තුක ම වූ හෝ කර්‍මකරණකාලයට ද විපාක දෙනකාලයටද අනුරූපවශයෙන් නොහොත්—විපච්‍යමානකර්‍මානුරූපවූ අනුශයවශයෙන් හෝ ජවනසභාගවශයෙන් හෝ ප්‍රවෘත්තියට අනුරූපහෙයින් අවිද්‍යානුශය විසින් පිරිවරණලද තෘෂ්ණානුශය ම සහකාරිකාරණ කොට ඇති කුශලා'කුශලකර්‍මයා විසින් උපදවනුලබන්නාවූ තමා හා සම්ප්‍රයුක්තවූ ස්පර්ශාදිධර්‍මයන්විසින් සම්ප්‍රයුක්තප්‍රත්‍යයාදිවශයෙන් පිරිවරාගන්නාලබන්නාවූ තමා හා සහජාතධර්‍මයන්ට පිහිටබැවින් ප්‍රධානවූ පූර්‍වභවාන්තරයාගේ ද පශ්චිමභවාන්තරයාගේ ද ඔවුනොවුන් හා එකාබද්ධයක් මෙන් ගැලපීම්වසයෙන් ප්‍රතිසන්ධියයි කියනලද චිත්තය උපදනේ ම අන්‍යභවයෙහි පිහිටන්නේය, මෙයින් ගොස් පිහිටා නොගන්නේය, යන අභිප්‍රායයි,—පූර්‍වභවපර්‍යාපන්නවූ කිසිධර්‍මයෙක් භවාන්තරයට යන්නේ නොවෙයි, පුරිමභවපරියාපන්නහෙතුවක් නැතිව කිසිධර්‍මයෙක් උපදනේ නොවෙයි.

මෙහි වනාහි මරණාසන්නවීථියෙහි මන්‍දව ප්‍රවෘත්තවූ ජවනයෝ පස්දෙනෙක් ම කැමතිවියයුත්තාහුයි, එහෙයින් මනොද්වාරයෙහි ගතිනිමිත්තවශයෙන් පඤ්චද්වාරයෙහි කර්‍මනිමිත්තවශයෙන් වර්ත්තමානාලම්බනයක් හමුවූ කල්හි ඒ වර්ත්තමානාලම්බනයත් ධරියමානකල්හිම ඉඳින් මරණ වේ ද, එකල්හි ප්‍රතිසන්ධි-භවාඞ්ගයන්ගේ ද වර්ත්තමානාලම්බනත්වය ලැබේනුයි කියා කාමාවචරප්‍රතිසන්ධියට ෂඩ්ද්වාරයෙන් ගන්නාලද කර්‍මනිමිත්තය ද සවන මනොද්වාරයෙන් ගන්නාලද ගතිනිමිත්තය ද වර්ත්තමානාලම්බනවූයේ ද අතීතාලම්බනවූයේ ද ලැ

වේ,—මේසඳහා අභිධම්මාර්ථසඞ්ග්‍රහපාඨයෙහි කියනලද "ඡද්වාරගහිතං"යනු"ඡද්වාරඤ්ච ඡට්ඨද්වාරඤ්ච=ඡද්වාරං"යි එකශෙෂ කොට "ඡද්වාරතො ගහිතං=ඡද්වාරගහිතං" කියා වේ, ඡට්ඨද්වාර නම් මනොද්වාර යයි;—"ඡද්වාරගහිතං කම්මනිමිත්තං ඡට්ඨද්වාරගහිතං ගතිනිමිත්තං" යි යථාලාභවශයෙන් යෙදියයුතු;—සමහර ආචාර්‍ය්‍යවරකෙනෙක් වනාහි සාමාන්‍යයෙන් වර්ණනා කෙරෙති; සත්‍යසංක්ෂෙපයෙහි ද "පඤ්චද්වාරෙ සියා සන්ධි විනා කම්මං විගොචරෙ"යි මෙම අභිප්‍රායෙන් කියනලදී;–අට්ඨකථායෙහි වනාහි "ගතිනිමිත්තං මනොද්වාරෙ ආපාථමාගච්ඡති"යි කියනලදහෙයින් ද තදාලම්බනිකවූ ප්‍රතිසන්ධිය තමා නොදක්වනලද, මූලටීකාදියෙහි ද කර්මබලයෙන් එළවනලද වර්ණායතනය ස්වප්න දක්නාහට මෙන් ද දිව්‍යචක්ෂුසට මෙන් ද මනොද්වාරයෙහි ම ගොචරබවට පැමිණෙන්නේය යි නියම කොට කියලදබවහෙයින් ඔවුන්ගේ වචනය නොගතයුතුකොත්යි;–"පටිසන්ධි භවඞ්ගානම්පි පච්චුප්පන්නාලම්බනතා ලබ්භති"යන මෙහි මනොද්වාරයෙහි ප්‍රතිසන්ධියෙන් මත්තෙහි භවාඞ්ගචිත්තයන් සතරදෙනෙකුට වර්තමානාලම්බනත්වය ලැබෙයි, පඤ්චද්වාරයෙහි වනාහි ප්‍රතිසන්ධියට ම වර්තමානාලම්බනත්වය ලැබේ;එසේ මැයි, කිසිවක්හට මනොද්වාරයෙහි ආපාථගතවූ වර්තමානවූ ගතිනිමිත්තය අරබයා උපන්නාවූ තදාලම්බනාවසානකොට ඇති චිත්තවීථියට ඉක්බිතිව ච්‍යුතිචිත්තය උපන් කල්හි ච්‍යුතිචිත්තයට ඉක්බිතිව පස්සිතකට ආයුඇති අරමුණු විෂය කොට ප්‍රවෘත්තවූ ප්‍රතිසන්ධියෙන් මත්තෙහි භවාඞ්ගචිත්තයන් සතර දෙනෙකුගේ වර්තමානාලම්බනයෙහි ප්‍රවෘත්තිය ලැබෙන්නේයි, පඤ්චද්වාරයෙහි ද ඥාතකාදීන්විසින් එළවනලද්දාවූ වස්ත්‍ර-පුෂ්පාදිවූ දෙයධර්මයෙහි වර්ණාදිය අරබයා සුදුසු පරිද්දෙන් උපන්නාවූ චිත්තවීථියට ද ච්‍යුතිචිත්තයට ද අනතුරුව එකචිත්තක්ෂණායුෂ්කවූ ආලම්බනයෙහි ප්‍රවෘත්තවූ ප්‍රතිසන්ධියගේ වර්තමානාලම්බනයෙහි ප්‍රවෘත්තිය ලැබෙන්නේය යනු භාවයි.

රූපාවචරකර්මය වනාහි අතීතවූයේ ම ලැබෙයි, හෙද මනොද්වාරයෙන් ගන්නාලද්දේ ම අරමුණුවේ;ඒ සියලු ආලම්බනයෝ ම කාමාවචරධර්මවූ ම ආලම්බනයෝ යයි කියා දතයුතුකොත්යි;—රූපාවචරප්‍රතිසන්ධියට වනාහි කසිනාදි ප්‍රඥප්තිවූ කුශලකර්මයට ආලම්බනහෙයින් කර්මනිමිත්තය ම අරමුණු වේ, එසේ ම අරූපාවචරප්‍රතිසන්ධියට ද ද්විතීය-චතුර්ථාරූප්‍ය ප්‍රතිසන්ධීන්ට ප්‍රථම-තෘතීයාරූපධ්‍යාන සංඛ්‍යාත මහද්ගතවූ ද, ප්‍රථම-තෘතීයාරූපප්‍රතිසන්ධීන්ට කසිණොද්ඝාටිමාකාශවිඥානාභාවසංඛ්‍යාත ප්‍රඥප්තිවූ ද, කර්මනිමිත්තය ම ද්විතීය-චතුර්ථ-ප්‍රථම-තෘතීයාරූප්‍ය ප්‍රතිසන්ධීන්ට අනුරූපපරිද්දෙන් අරමුණු වන්නේයි.

අසංඥසත්වයන්ට වනාහි ජීවිතෙන්ද්‍රියප්‍රධානනවකය ම ප්‍රතිසන්ධිභාවයෙන් පිහිටන්නේයි; එහෙයින් ඔහු රූපය ම ප්‍රතිසන්ධි කොට ඇතිබවහෙයින් රූපප්‍රතිසන්ධිකයෝ නම් වෙත්, අරූපාවචරයෝ

අරූපාවචරප්‍රතිසන්ධීහු නම් වෙත්; අවශිෂ්ටයෝ රූපා'රූපදෙකින් පිළිසඳවනහෙයින් රූපාරූපප්‍රතිසන්ධිකයෝයි.

(කියනලද මැයි);—

[ආරුප්පචුතියා හොන්ති හෙට්ඨිමා'රුප්පවජ්ජිතා,
පරමාරුප්පසන්ධී ච තථා කාමෙ තිහෙතුකා.

රූපාවචරචුතියා අහෙතුරහිතා සියුං,
සබ්බා කාමතිහෙතුම්හා කාමෙස්වෙව පනෙ'තරා.]

අරූපාවචරච්‍යුතියෙන් පරව මතුමත්තෙහි අරූපීබ්‍රහ්මයන්ට යට ආරූප්‍යකර්මයාගේ ආයූහනයක් නැතිහෙයින් යට යට ආරූප්‍යවර්ජිතවූ අරූපාවචරප්‍රතිසන්ධීහු ද එසේ ම කාමභවයෙහි උපචාර ධ්‍යානයාගේ බලවභාවයෙන් ත්‍රිහෙතුකප්‍රතිසන්ධීහු ද වෙත්;—රූපාවචරච්‍යුතියෙන් පරව උපචාරධ්‍යානානුභාවයෙන් ම අහෙතුකප්‍රතිසන්ධිරහිතවූ ද්විහෙතුක-ත්‍රිහෙතුකප්‍රතිසන්ධීහු වන්නාහ; කාමාවචර ත්‍රිහෙතුකවූ ච්‍යුතිචිත්තයාකෙරෙන් පරව කාම-රූපා'රූපභවපර්යාපන්නවූ අහෙතුකාදි සියලු ප්‍රතිසන්ධීහු සුදුසුපරිද්දෙන් වන්නාහ; ද්විහෙතුක-අහෙතුකච්‍යුතිචිත්තයෙන් පරව කාමභවයෙහි ම සියලු ත්‍රිහෙතුකාදි ප්‍රතිසන්ධීහු වෙත්.

**මේ වීථිමුක්තසඞ්ග්‍රහයෙහි මෙතෙම**
**ච්‍යුති-ප්‍රතිසන්ධික්‍රමයයි.**

මෙසේ ගන්නාලද ප්‍රතිසන්ධි ඇත්තවුන්ගේ ප්‍රතිසන්ධියගේ නිරෝධානන්තරයෙහි පටන් ප්‍රතිසන්ධිචිත්තයට අරමුණුවූ කර්මාදිභෙදවූ එම අරමුණ අරබයා තත්සදෘශබැවින් තද්ව්‍යවහාරයට පැමිණියාවූ එම අහෙතුකාදිභෙදවූ විපාකචිත්තය ච්‍යුතිචිත්තයාගේ උත්පත්තිය දක්වා අතරතුරෙහි වීථිචිත්තයන්ගේ උත්පත්තියක් නැති කල්හි ඒ ඒ කාමභවාදිභෙදවූ උත්පත්තිභවයාගේ අවිච්ඡින්නප්‍රවෘත්තියට කාරණභාවයෙන් භවාඞ්ගසන්තතිය යී කියනලද්දේ ගඞ්ගා ප්‍රවාහයක් මෙන් අවිච්ඡින්නව පවත්නේයි;—භවාඞ්ගසන්තතියගේ අවසානයෙහි ද ච්‍යුතිවශයෙන් ච්‍යුතිචිත්තව නිරුද්ධ වන්නේයි;—ඒ ච්‍යුතිචිත්තයෙන් මත්තෙහි දු ප්‍රතිසන්ධ්‍යාදිහු රථචක්‍රයක් මෙන් පිළිවෙළින් මෙසේ ම වෘත්තමූලසමුච්ඡෙදය දක්වා පෙරලෙමින් පවත්නාහුයි.

(මෙම කීහ);—

[පටිසන්ධි-භවඞ්ග-වීථියො චුති චෙහ තථා භවන්තරෙ,
පුන සන්ධි-භවඞ්ගමිච්චයං පරිවත්තති චිත්තසන්තති.]

මේ භවයෙහි ප්‍රතිසන්ධිය ද, භවාඞ්ගය ද, වීථීහු ද, ච්‍යුතිචිත්තය ද, යන මොහු යම්සේ ද එසේ ම නැවත අන්‍යභවයෙහි ප්‍රතිසන්ධිය ද, භවාඞ්ගය ද, යනාදිවූ මේ චිත්තසන්තතිතොම පෙරලෙන්නීයි.

[පටිසංඛාය පනෙතමද්ධුවං අධිගන්ත්වා පදමච්චුතං බුධා,
සුසමුච්ඡින්නසිනෙහබන්ධනා සමමෙස්සන්ති චිරාය සුබ්බතා.]

මේ යථොක්තවූ වෘත්තප්‍රවෘත්තිය වනාහි අනිත්‍යය යි හෙවත්—නස්නාසුලුය යි ප්‍රත්‍යවෙක්‍ෂා කොට ප්‍රාඥයෝ චිරාත්කාලයක් සුවසේ අවවාද කට්යුතුබැවින් ද ශොභනවූ ව්‍රතයෙන් සමන්විතබැවින් ද සුව්‍රතව අචවනස්වභාවවූ නිර්වාණපදය මාර්ග-ඵලඥානයෙන් ප්‍රත්‍යක්‍ෂ කොට එහෙයින් ම මොනවට සමුච්ඡින්නවූ ස්නෙහබන්ධනයන් ඇත්තාහු නිරුපධිශෙෂනිර්වාණධාතුවට පැමිණෙන්නාහුයි.

මෙතෙකින් "නාමඤ්ච රූපඤ්ච" යන මෙයින් **නාමය** ප්‍රකාශකරණ ලදී; මින් මතු **රූපය** දක්වනුලැබේ.

**(විථිමුක්තසඞ්ග්‍රහවිභාග නම් වූ පස්වන පරිච්ඡේදවර්ණනාව නිමි.)**

**මෙ**සේ චිත්ත-චෛතසිකවශයෙන් ද්විප්‍රකාරවූ අභිධම්මාර්ථයන් දක්වා දැන් රූපය ද තදනන්තරව නිර්වාණය ද දක්වන්නාහු "එත්තාවතා" යනාදී කීහු;—

[එත්තාවතා විභත්තා හි සප්පභෙදප්පවත්තිකා,
චිත්ත-චෙතසිකා ධම්මා රූපන්දානි පවුච්චති.]

උද්දෙශ-නිර්දෙශ-ප්‍රතිනිර්දෙශවශයෙන් තුන්පරිච්ඡෙදයකින් කියනලද ප්‍රභෙද ඇත්තාවූ ද ප්‍රවෘත්ති-ප්‍රතිසන්ධිවශයෙන් පරිච්ඡෙද දෙකකින් කියනලද්දාවූ ප්‍රවෘත්ති ඇත්තාවූ ද චිත්ත-චෛතසිකධර්මයෝ මෙපමණෙකින් (හෙවත් පස්පරිච්ඡෙදයෙකින්) යම්හෙයකින් විභාග කරණලද්දාහු ද එහෙයින් දැන් යථානුප්‍රාප්තවූ රූපය කියනු ලැබේ.

දැන් යථාප්‍රතිඥාතරූපය විභාග කරණුපිණිස මාතෘකා තබන්නාහු "සමුද්දෙසා" යනාදී කීහු;—

[සමුද්දෙසා විභාගා ච සමුට්ඨානා කලාපතො,
පවත්තික්කමතො චෙති පඤ්චධා තත්‍ථ සඞ්ගහො.]

සංක්‍ෂෙපොද්දෙශහෙයින් ද, එකවිධාදි විභාගහෙයින් ද, කර්මාදිවූ රූපජනකප්‍රත්‍යයහෙයින් ද, චක්‍ෂුර්දශකාදි කලාපහෙයින් ද, භව-කාල-සත්වභෙදහෙයින් රූපයන්ගේ උත්පත්තික්‍රමහෙයින් දැයි, ඒ රූපයෙහි සඞ්ග්‍රහය පඤ්චප්‍රකාර වේ.

පෘථිවීධාත්වාදි මහාභූතරූපයෝ සතරදෙන ද, සතරමහාභූතයන් ම නිසා පවත්නාහෙයින් චක්‍ෂුඃ-ශ්‍රොත්‍රාදිවූ සූවිසි උපාදායරූපය දැයි, ද්විප්‍රකාර වූ ද මේ රූපය වක්‍ෂ්‍යමාණක්‍රමයෙන් එකාදශප්‍රකාරයෙකින් සඞ්ග්‍රහබවට යේ;—මෙහි—"උපාදින්නා'නුපාදින්නසන්තානෙසු සසම්භාරධාතුවසෙන මහන්තා හුත්වා භූතා පාතුභූතා'ති=මහාභූතා," යි,-දිව්‍ය-බ්‍රහ්මාදීන්ගේ ත්‍රිගව්‍යූත්‍යාදිප්‍රමාණආත්මභාවවශයෙන් මහත්ව පහළවූහුයි=මහාභූත නම් වේ;—නොහොත්, අනෙකප්‍රකාර අද්භූතවූ විශෙෂදර්ශනය හෙතු කොට ගෙණ හෝ අනෙකප්‍රකාර අභූතදර්ශනය හෙතු කොට ගෙණ හෝ "මහන්තානි අබ්භූතානි, අභූතානි වා දස්සනානි එතෙසූ'ති=මහාභූතා—මායාකාරාදයො; එත

හි සමානා සයං අනීලාදිසභාවානෙ'ව නීලාදිඋපාදායරූපදස්සනාදිතො'ති=මහාභූතා;"-නොහොත්, මනොඥවූ වර්ණ-සංස්ථානාදිවශයෙන් සත්වයන් වඤ්චා කරන්නාවූ යක්ෂිණී ආදීන් මෙන් මනාපස්ත්‍රී-පුරුෂරූපදර්ශනාදීන් සත්වයන් වඤ්චා කරණහෙයින් "මහන්තානි අභූතානි රූපදස්සනාදීනි එතෙසූ'ති=මහාභූතා"යි ගතයුතු.

(මේ කියනලද මැයි;—

"මහන්තා පාතුභූතා'ති මහාභූතසමා'ති වා,
වඤ්චකත්තා අභූතෙන මහාභූතා'ති සම්මතා"—යි)

නොහොත්—මහත්ව පහළ වනහෙයින් මොවුන්කෙරෙහි උපාදාය-භූතරූපයෝ මහත් වෙත්නුයි="මහාභූත"නම් වේ; මහාභූතයන් නිසා පැවති රූපය "උපාදායරූප"නම් වේ.

(කියනලද මැයි;—

"මහාභූතානි නිස්සාය අමුඤ්චිත්වා පවත්තිතො,
උපාදාරූපමිච්චාහ නිරුපාදානමානසො"—යි.)

ඒකාදශප්‍රකාරයෙන් රූපසඞ්ග්‍රහය කෙසේද යත්?—ඝනබද්ධලක්ෂණවූ පෘථිවීධාතුව ද, ද්‍රවලක්ෂණවූ ආපොධාතුව ද, උෂ්ණත්වලක්ෂණවූ තෙජොධාතුව ද, සමුදීරණ ලක්ෂණවූ වායුධාතුව ද, "**භූතරූප**" නම් වේ.

දෘෂ්ටුකාමතාසඞ්ඛ්‍යාත රූපතෘෂ්ණාව නිදාන කොට ඇති කර්ම්මයෙන් සමුද්භූත භූතප්‍රසාදලක්ෂණවූ චක්ෂුඃප්‍රසාදය ද, ශ්‍රොතුකාමතාසංඛ්‍යාත ශබ්දතෘෂ්ණාව නිදාන කොට ඇති කර්ම්මයෙන් සමුද්භූත භූතප්‍රසාදලක්ෂණවූ ශ්‍රොත්‍රප්‍රසාදයද, ආඝ්‍රාතුකාමතාසංඛ්‍යාත ගන්ධතෘෂ්ණාව නිදාන කොට ඇති කර්ම්මයෙන් සමුද්භූත භූතප්‍රසාදලක්ෂණවූ ඝ්‍රාණප්‍රසාදය ද, රසසායිතුකාමතාසංඛ්‍යාත රසතෘෂ්ණාව නිදාන කොට ඇති කර්ම්මයෙන් සමුද්භූත භූතප්‍රසාදලක්ෂණවූ ජිහ්වාප්‍රසාදය ද, ස්ප්‍රෂ්ටව්‍යකාමතාසංඛ්‍යාත ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණාව නිදාන කොට ඇති කර්ම්මයෙන් සමුද්භූත භූතප්‍රසාදලක්ෂණවූ කායප්‍රසාදය ද, මහාභූතයන්ගේ ප්‍රසන්නභාවයට හෙතුහෙයින් "**ප්‍රසාදරූප**" නම් වේ;—එහි,—

**චක්ෂුඃප්‍රසාදය** සසම්භාරචක්ෂුස්හි ශ්වෙතමණ්ඩලමධ්‍යගත කෘෂ්ණමණ්ඩලමධ්‍යයෙහි යූකාශිරඃප්‍රමාණවූ අභිමුඛයෙහි සිටියවුන්ගේ ශරීරසංස්ථානොත්පත්තිප්‍රදෙශයෙහි සප්තකාර්පාසපටලව්‍යාප්තතෛලයක් මෙන් සප්තාක්ෂිපටලයෙහි අභිව්‍යාප්තව සන්ධාරණ-ස්නාපන-මණ්ඩන-ව්‍යජනකෘත්‍ය ඇති කිරිමවුන් සතරදෙනකුන්විසින් සංරක්ෂිතරාජකුමාරයකු මෙන් සන්ධාරණ-බන්ධන-පරිපාචන-සමුදීරණකෘත්‍ය ඇති චතුර්ධාතුන්විසින් කෘතොපකාරීව සෘතු-චිත්තා'හාරයන්විසින් උපස්ථම්භ්‍යමානව ජීවිතෙන්ද්‍රියයෙන් සංරක්ෂ්‍යමානව වර්ණාදීන්විසින් පරිවෘතව චක්ෂුර්විඥානාදීන්ට වස්තු-ද්වාරභාව සාදමින් පවත්නේයි;—ශ්‍රොත්‍ර-ඝ්‍රාණ-ජිහ්වා-කාය යන මේ සතර තන්හිදු සන්ධාරණ-ස්නාපනයන්හෙහි පවත් වර්ණාදීන් පරිවෘතව

යන තැන් දක්වා මතු කියන අඪ හා එක් කොට සුදුසු පරිද්දෙන් යොදා කියයුතු.

**ශ්‍රොත්‍රප්‍රසාදය** ශ්‍රොත්‍රබිලය ඇතුළත ඝින් තඹවුත්දක් වැනි තුනිවූ තාම්‍රලොමයෙන් ගැවසිතන්හි අභිව්‍යාප්තව ශ්‍රොත්‍රවිඥනාදීන්ට වස්තු-වාරභාව සාදමින් පවත්නේයි.

**ඝ්‍රාණප්‍රසාදය** නාසිකාබ්‍යාභ්‍යන්තරයෙහි අජපදසංස්ථානප්‍රදෙශයෙහි අභිව්‍යාප්තව ඝ්‍රාණවිඥනාදීන්ට වස්තු-වාරභාව සාදමින් පවත්නේයි.

**ජිහ්වාප්‍රසාදය** ජිහ්වාමධ්‍යයෙහි උත්පලදලාග්‍රසංස්ථානප්‍රදෙශයෙහි අභිව්‍යාප්තව ජිහ්වාවිඥනාදීන්ට වස්තු-වාරභාව සාදමින් පවත්නේයි.

**කායප්‍රසාදය** වනාහි කම්මජතෙජොධාතුව පිහිටන ස්ථානය ද කෙශාග්‍ර-ලොමාග්‍ර-නඛාග්‍ර-ශුෂ්කචර්මයන් ද හැර අවශෙෂසකලශරීරයෙහි ව්‍යාප්තව පවත්නේයි.

විඥනොත්පත්තියට හෙතුභාවයෙන් චක්ෂුඃප්‍රතිඝනනස්වභාවවූ වර්ණායතනය ද, විඥනොත්පත්තියට හෙතුභාවයෙන් ශ්‍රොත්‍රප්‍රතිඝනනස්වභාවවූ ශබ්දායතනය ද, විඥනොත්පත්තියට හෙතුභාවයෙන් ඝ්‍රාණප්‍රතිඝනනස්වභාවවූ ගන්ධායතනය ද, විඥනොත්පත්තියට හෙතුභාවයෙන් ජිහ්වාප්‍රතිඝනනස්වභාවවූ රසායතනය ද, සූක්ෂ්මබැවින් අබ්ධාතුව ස්පර්ශයට අසමර්ථබව හෙතු කොට ගෙණ අබ්ධාතුවර්ජිතවූ භූතත්‍රය යී කියනලද ස්ප්‍රෂ්ටව්‍යය ද, පංචවිඥනයන්ට විෂයබැවින් **"ගොචරරූප"** නම් වේ;—"ගොචර" යයි ද අරමුණට නමි.

මෙහි,-අභිධම්මාර්ථසඞ්ග්‍රහ පාඨයෙහි (අභි-27-පිටේ-14-පෙල බලනු.) "ආපොධාතුවජ්ජිතං" යනු අබ්ධාතුව සූක්ෂ්මබැවින් ස්පර්ශයට අසමර්ථහෙයින් කියනලදී;—කිසිසේත් ශීතතාතොමෝ ස්පර්ශ කොට ගන්නාලැබෙයි, හෝතොමෝ වනාහි තෙජොධාතු මැයි; එසේ මැයි, උෂ්ණත්වය මදකල්හි ශීතතාසංඛ්‍යාත කිසිගුණයක් නැති බවහෙයින් ශීතය යන බුද්ධිය වේ, ඒ මේ ශීතබුද්ධිය අනවස්ථිතහෙයින් ඒ තෙජස මය යී දන්නාලැබේ; එසේ මැයි, ඝර්මකාලයෙහි අවුවෙහි සිටලා සෙවනට වන්නවුන්ට ශීතය යන බුද්ධිය වෙයි, එහි ම චිරකාලයක් සිටියවුන්ට උෂ්ණය යන බුද්ධිය වේ, ඉදින් ආපොධාතුව ශීතතා වේනම් උෂ්ණත්වය හා සමග එක් කලාපයෙක්හි ම ලැබුනමැනව, එසේත් නො ම ලැබෙයි, එසේහෙයින් අබ්ධාතු ශීත නොවන්නේයි හැගේ;—ලොකයා වනාහි "ද්‍රවතාය අබ්ධාතුව, ගෙද ස්පර්ශ කොට ගන්නාලැබෙයි" කියති; ඒ ඔවුන්ගේඅභිමානමාත්‍රයෙකැයි දතයුතු.

(පුරාතනයන්විසිනුදු කියනලද මැයි;-

" ද්‍රවතාසහවුත්තීනි තීනි භූතානි සම්ඵුසං,
ද්‍රවතං සම්ඵුසාමී'ති ලොකොයමභිමඤ්ඤති.

භූතෙ ඵුසිත්වා සණ්ඨානං මනසා ගණ්හතො යථා,
පච්චක්ඛතො ඵුසාමී'ති විඤ්ඤෙය්‍යා දච්තා තථා''-ඩී.)

ස්ත්‍රීත්වය ද, පුරුෂත්වය ද, **''භාවරූප''** නම් වේ;—මේ භාවරූපය චනාහි කායප්‍රසාදයක් මෙන් සකලශරීරය ව්‍යාප්ත කොට සිටී; මෙහි,—ස්ත්‍රීලිඞ්ග-නිමිත්ත-කෘත්‍ය'කල්පයන්ට හෙතුත්වය ලක්‍ෂණ කොට ඇත්තේ **ස්ත්‍රීත්ව** නම් වෙයි, පුරුෂලිඞ්ගාදිහෙතුත්වය ලක්‍ෂණ කොට ඇත්තේ **පුරුෂත්ව** නම් වේ;—එහි,—ස්ත්‍රීන්ගේ අඞ්ගජාතය **ස්ත්‍රීලිඞ්ග** නම් වෙයි, ස්වර'ස්ථානය යන මොහු **ස්ත්‍රීනිමිත්ත** නම් වෙති, මෝ ස්ත්‍රී යයි දැන්මට කාරණබැවින් අභිඥවූ ස්ථාන-ගමන-නිෂද්‍යාදිය **ස්ත්‍රීකෘත්‍ය** නම් වෙයි; ස්ත්‍රීසංස්ථානාදිය **ස්ත්‍ර්‍යාකල්ප** නම් වේ; පුරුෂලිඞ්ගාදීහු ද මෙසේම දතයුත්තාහුයි;—අභිධර්මයෙහි චනාහි ස්ත්‍රීලිඞ්ගාදීහු අන්‍ය පරිද්දෙකින් වර්ණනා කරණලදහු.

(යේ මෙසේ සඞ්ග්‍රහ කොට කියත්;—

''ලිඞ්ගං භඤ්ජාදිසණ්ඨානං නිමිත්තං මිහිතාදිකං,
කුත්තං සුප්පාදිනා කීළා ආකප්පො ගමනාදිකං''—ඩී).

හෘදයවස්තුව **''හෘදයරූප''** නම් වේ;-මෙහි,-**හෘදයවස්තුව** හෘදයකොශාභ්‍යන්තරයෙහි අඩපතක් පමණ රුධිරයෙහි සතරමහාභූත යන් ත්සා පැවති චක්‍ෂුර්විඥනාදීන්ට චක්‍ෂුරාදීන් මෙන් මනොධාතු-මනොවිඥනධාතුන් දෙදෙනාට වස්තුභාව සාදමින් පවත්නේයි.

(කියනලද මැයි;—

'' යං නිස්සාය මනොධාතු මනොවිඤ්ඤාණධාතු ච,
වත්තන්ති පචවොකාරෙ තං වත්ථූ'ත් පවුච්චති.

මජ්ඣෙ හදයකොසම්හි අඩ්ඩපසතලොහිතෙ,
භූතරූපමුපාදාය චක්ඛාදී'ව වත්තති''—ඩී).

මෙහි රූපකාණ්ඩයෙහි නොකියනලද්දැවූ හෘදයවස්තුවගේ අස්තිත්වය ආගමහෙයින් ද යුක්තිහෙයින් ද දතයුත්තේයි;-එහි;-(''යං රූපං නිස්සාය මනොධාතු මනොවිඤ්ඤාණධාතු ච පවත්තන්ති, තං රූපං මනොධාතුයා මනොවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සයපච්චයෙන පච්චයො''-ඩී මෙසේ ආවාවූ ප්‍රස්ථානපාලිච්ච නය ''ආගම'' නම් වෙයි.

යුක්ති චනාහි මෙසේ දතයුතු;—

'' නිප්ඵන්නභූතිකාධාරා මෙ ධාතු කාම-රූපිනං,
රූපානුබද්ධවුත්තිත්තා චක්ඛු-ඤාණාදයො විය.

චක්ඛාදිනිස්සිතා නෙතා තස්සඤ්ඤාධාරභාවතො,
නා'පි රූපාදිකෙ තෙසං බහිඩා'පි පවත්තිතො.

න වා'පි ජීවිතං තස්ස කිච්චන්තරනියුත්තිතො,
න ච භාවද්වයං තස්මිං අසන්තෙ'පි පවත්තිතො.

තස්මා තදක්ඛණං වත්ථුනනං භූමිකනානි විජානියං,
වත්ථු'ලබ්ධකානන්තු දෙසනාභෙදතො ඉදං;
ධම්මසඞ්ගණිපාඨස්මිං න අක්ඛාතං මහෙසිනා"—ටී.)

උත්පලාදියට දණ්ඩගතජලයක් මෙන් තමා පිළිමානක්ෂණයෙහි සහජාත කර්මජරූප පරිපාලනයෙහි ආධිපත්‍යය කරණ ජීවිතෙන්ද්‍රිය තෙමේ "**ජීවිතරූප**" නම් වේ.

කබලීකාරාහා[ර]තෙම " **ආහාරරූප** " නමැයි කියා ද වෙයි; ඔදනාදිවස්තුවයි;—මේ වස්තුක කොට ආහාරය දක්වනුපිණිස කියනලද, සෙන්ද්‍රියකායොපස්තම්භනයට හෙතුවූ අඞ්ගප්‍රත්‍යඞ්ගානුසාරී රසසාරසඞ්ඛ්‍යාතවූ අනුභවකටයුතුවූ ආහාරයාගේ ස්නෙහභූතවූ ඕජා තොමෝ මෙහි ආහාරරූප නම් වේ.

(කියනලද මැයි;—

" යාය ඔජාය යාපෙන්ති යාවී යත්ථ ච පාණිනො,
අයන්තු කබලීකාරො ආහාරො'ති පවුච්චති"—ටී).

මෙසේ පෘථිවීධාත්වාදිස්වරූපහෙයින් අෂ්ටාදශප්‍රභෙදවූ මේ රූපය කක්ඛලත්වාදිවූ තමතමන්ගේ ස්වභාවයෙන් ම ලැබෙනබව හෙයින් ස්වභාවරූපය යී කියා ද, උත්පාදාදිවූ ද අනිත්‍යතාදිවූ ද ලක්ෂණයන්හා සහිතනුයි සලක්ෂණරූපය යී කියා ද, පරිච්ඡෙදාදිවූ ස්වභාවයක් නැතිව තමන්ගේ ස්වභාවයෙන් ම කර්මාදිවූ ප්‍රත්‍යයන්විසින් නිෂ්පන්න බවහෙයින් නිෂ්පන්නරූපය යී කියා ද, රූපවිකාර-පරිච්ඡෙද-ලක්ෂණ මාත්‍ර නොව රූපස්වභාව ඇතිහෙයින් ම රූපරූපය යී කියා ද,—මෙහි "රූප" ශබ්දය රූඪිහෙයින් අතත්ස්වභාවයෙහිදු පවතීනුයි අනික් "රූප" ශබ්දයකින් විශෙෂා "රූපරූපය" යී කියනලදී;—පරිච්ඡෙදාදි ස්වභාව නොඉක්ම ස්වභාවයෙන් ම ලැබෙනහෙයින් "භූත්වා අභාවට්ඨෙන අනිච්චා" යනාදීන් ලක්ෂණත්‍රයාරොපනවශයෙන් සම්මශිනයට අර්හහෙයින් සම්මශිනරූපය යී කියා ද, ව්‍යවහාරයට යේ.

කර්මාදි එකිඑකි ප්‍රත්‍යයෙන් සමුත්ථිතවූ චක්ෂුර්දශකාදිකලාපයන් කලාපාන්තරයන් හා සඞ්කර නොවනපරිද්දෙන් පිරිසිඳිනා ස්වභාවවූ ආකාශධාතුතොම "**පරිච්ඡෙදරූප**" නම් වේ.

අභික්‍රම-ප්‍රතික්‍රමාදිජනකචිත්තජවායුධාතුවගේ රූපස්තම්භන-චලන-ධාරණකෘත්‍යයම සහකාරිකාරණවූ වායුධාත්වධිකචිත්තජමහාභූතයන්ගේ ආකාරවිශෙෂය යි කියනලද කායවිඥප්තිය ද, වාග්විශෙෂජනකචිත්තජපෘථිවිධාතුවගේ අක්ෂරොත්පත්තිස්ථානසංඝට්ටනකර්මජරූපයන්ගේ ඝට්ටනකෘත්‍යයට සහකාරිකාරණවූ පෘථිවීධාත්වධික චිත්තජ මහාභූතයන්ගේ විකාරය යි කියනලද වාග්විඥප්තිය ද "**විඥප්තිරූප**" නම් වේ.

(මේ කියනලද මැයි;—

" අභික්කමාදිජනකචිත්තජස්සා'නිලස්ස යො,
විකාරො කායවිඤ්ඤත්ති රූපත්ථම්භාදිකාරණං.

වච්ඡෙදකච්ඡෙතන භූත-භූමිවිකාරතා,
වච්විඤ්ඤත්‍යා'පාදීනාඝට්ටනසෙස'ච කාරණං''—ටී).

සතප්‍රායසෘතු-චිත්තා'හාර ප්‍රත්‍යයප්‍රතිලාභයෙන් ලඝුප්‍රවෘත්තවූ නිෂ්පන්නරූපයාගේ වගහිත් දිවසසන්තාපතාවූ අයඃස්කන්ධයක් මෙන් සැහැල්ලුබවය යි කියනලද ලඝුත්වය ද, සුපරිමද්දිතචර්මයක් මෙන් නොදෘඪබවය යි කියනලද රූපමෘදුත්වය ද, සුතප්තකනකයක් මෙන් ශරීරයෙන් කටයුතු ක්‍රියාවට අනුකූලබවය යි කියනලද රූපකර්මණ්‍යතාව ද, කායවිඥප්ති-වචීවිඥප්තිවය ද, ලඝු-මෘදු-කර්මණ්‍යරූපයන්ගේ ද චිත්තජවායු-පෘථිවීධාතූන්ගේ ද විකාරයක් හෙයින් **"විකාර රූප"** නම් වේ.

රූපයාගේ නදීතීරයෙහි ඛතකූපයාගේ උදකොද්ගමනයෙන් පරිපූර්ණතාව මෙන් උත්පද්‍යමාන අෂ්ටකාදශරූපායතනයන්ගේ මතුමත්තෙහි උත්පත්තිවශයෙන් අභිවෘද්ධිය යි කියනලද උපචය ද' පරිපූර්ණකූපයෙන් ඉතිරි උදකයාගේ බහිර්ගමනයක් මෙන් උක්ත ක්‍රමයෙන් උපචිතරූපයන්ගේ පුනඃපුනරනුත්පබන්ධොත්පත්තිවශයෙන් ප්‍රවෘත්තිය යි කියනලද සන්තතිය ද, රූපයන්ගේ උත්පාදාවස්ථායෙන් මත්තෙහි භඞ්ගාභිමුඛාවස්ථාවය යි කියනලද ජරතාව ද, රූපයන්ගේ පරිභෙදස්වභාවවූ අනිත්‍යත්වය ද, පරිපච්‍යමාන-භිද්‍යමානවූ සංස්කෘතධර්මයන්ගේ සංස්කෘතස්වභාවලක්ෂණය කරණහෙයින් **"ලක්ෂණරූප"** නම් වේ;—මෙහි වනාහි ජාතිරූපය ම උපචයය සන්තතිය යන නමින් කියනුලැබේ.

(කියනලද මැයි;—

" රූපානමාචයො යො හි වුත්තො උපචයො'ති සො,
අනුප්පබන්ධතා තෙසං සන්තති'ති පවුච්චති.
අත්ථතො උභයමෙතං ජාතිරූපන්ති දිපිතං,
වුත්තමාකාරනානත්තා වෙනෙය්‍යානං වසෙන වා.
දුවිධා'යං ජරා නාම පාකටා'පාකටා'ති ච,
පාකටා රූපධම්මෙසු අරූපෙසු අපාකටා ''—ටී).

මෙසේ සභාගසඞ්ග්‍රහවශයෙන් එකාදශප්‍රකාරවූ මේ රූපය ස්වභාවරූපවශයෙන් අටවිසිවැදෑරුම් වේ;—කෙසේද?—

[භූතප්පසාද-විසයා භාවො හදයමිච්ච'පි,
ජීවිතා'හාරරූපෙහි අට්ඨාරසවිධං තථා.
පරිච්ඡෙදො ච විඤ්ඤත්ති විකාරො ලක්ඛණානි ච,
අනිප්ඵන්නා දස චෙ'ති අට්ඨවීසවිධං භවෙ.]

සතරමහාභූතයහ, පඤ්චප්‍රසාදයහ, රූප-ශබ්ද-ගන්ධ-රසසංඛ්‍යාත චතුර්විධ ආලම්බනයහ, යන මොහු ද; ද්විවිධවූ භාවය ද, හෘදයරූපය ද, යන මේ, ජීවිතා'හාරරූපද්වය හා සමග අටලොස්වැදෑරුම් වේ;-එසේ ම පරිච්ඡෙදරූපය ද, ද්විවිධ විඥප්තිය ද, ත්‍රිවිධ විකාරය ද, චතුර්විධ

ලක්ෂණරූපය ද, යන මේ රූපයන්ගේ පරිච්ඡේද-විකාරාදිභාවය විනා වෙන ප්‍රත්‍යයන්විසින් අනිෂ්පන්නහෙයින් අනිෂ්පන්නරූපයෝ දස දෙන දූයි, අටවිසිවැදෑරුම් වේ.

### මේ රූපාධිකාරයෙහි මේ රූපයන්ගේ උද්දෙශයයි.

මේ සියලු රූපය වනාහි අලොභාදිසහජාතහෙතුවිරහයෙන් අහෙතුකය, කර්මාදිප්‍රත්‍යයන් හා සමග පවත්නාහෙයින් සප්‍රත්‍යයය, කාමාශ්‍රවාදි චතුර්විධ ආශ්‍රවයන්ට විෂයබැවින් සාශ්‍රවය, ප්‍රත්‍යයන්විසින් එක්ව කරණලදබවහෙයින් සංස්කෘතය, උපාදානස්කන්ධසංඛ්‍යාත ලොකයෙහි අන්තර්ගතබවහෙයින් ලෞකිකය, කාමතෘෂ්ණාවට විෂයබැවින් හෝ පරිත්තධර්මස්වභාවහෙයින් හෝ කාමාවචරය, අරූපධර්මයන් මෙන් කිසි අරමුණක් නොගන්නාහෙයින් අනාරම්මණය, ක්ලෙශයන් මෙන් ප්‍රහාතව්‍ය නොවනහෙයින් අප්‍රහාතව්‍ය ම යයි, යන මේ ප්‍රකාරයෙන් අහෙතුකාදිවශයෙන් එකවිධ වූයේ ද ආධ්‍යාත්මිකරූප-බාහ්‍යරූපාදිවශයෙන් බහුප්‍රකාරයෙන් භෙදයට යන්නේ ය;-මෙතැන්හි අභිධර්මාර්ථසංග්‍රහපාඨයෙහි "අප්පහාතබ්බමෙවාති" යන මෙහි (අභි—28 පිටේ—2 පෙල බලනු.) "ඉති" ශබ්දය ප්‍රකාරාර්ථයෙහි වැටෙනහෙයින් "අව්‍යාකතං" යනාදී සියලු එකවිධාදිනය සංග්‍රහ කෙරේ.

ඒ බහුප්‍රකාරවූ භෙදය කෙසේද?—ප්‍රසාදසංඛ්‍යාතවූ පඤ්චවිධවූ රූපය **ආධ්‍යාත්මිකරූප** නම් වේ; අවශෙෂවූ තෙවිසි රූපය පඤ්චප්‍රසාදයෙන් ශූන්‍යහෙයින් **බාහිරරූප** නම් වේ.

පඤ්චප්‍රසාද-හෘදයවස්තුසංඛ්‍යාතවූ ෂට්ප්‍රකාර ද වූ රූපය සප්තවිඥානයන්ට නිශ්‍රයහෙයින් **වස්තුරූප** නම් වේ; අවශෙෂ දෙවිසි රූපය **අවස්තුරූප** නම් වේ.

ප්‍රසාද-විඥප්තිසංඛ්‍යාතවූ සප්තප්‍රකාරවූ රූපය පඤ්චවිඥානයන්ගේ ද කාය-වාක්කර්මයන්ගේ ද ප්‍රවෘත්තියට ද්වාරහෙයින් **ද්වාරරූප** නම් වේ; අවශෙෂ එක්විසි රූපය **අද්වාරරූප** නම් වේ.

පඤ්චප්‍රසාදය හා භාවද්වය හා ජීවිතෙන්ද්‍රියසංඛ්‍යාතවූ අෂ්ටප්‍රකාරවූ රූපය දර්ශනාදි විඥානපඤ්චකයෙහි ද ස්ත්‍රී-පුරුෂලිඞ්ගාදිවූ කර්මජරූපයෙහි ද යථාක්‍රමයෙන් ආධිපත්‍යය කරණහෙයින් **ඉන්ද්‍රියරූප** නම් වේ; ඉතරවූ විංශතිරූපය **අනින්ද්‍රියරූප** නම් වේ.

චක්ෂුරාදිපඤ්චප්‍රසාදයන් හා රූප-ශබ්ද-ගන්ධ-රස හා ස්ප්‍රෂ්ටව්‍යය යී කියනලද භූතත්‍රයසංඛ්‍යාතවූ ද්වාදශප්‍රකාරරූපය විෂය-විෂයී භාවප්‍රාප්තිවශයෙන් ස්ථූලහෙයින් **ඖදාරිකරූප** නමුදු වෙයි; ඖදාරිකහෙයින් ම විෂයග්‍රහණය සුවසේ කටයුතුබැවින් **ආසන්නරූප** නමුදු වෙයි; විෂය-විෂයීසංඝට්ටනය යී කියනලද ප්‍රතිහනනය හා සමග පවත්නාහෙයින් **සප්‍රතිඝරූප** නමුදු වේ; අන්‍යවූ ෂොඩශවිධ රූපය

ඖදාරිකත්වාදි ස්වභාවයක් නැතිහෙයින් **සූක්ෂ්මරූප** යයි ද; **දූරරූප** යයි ද, **අප්‍රතිඝරූප** යයි ද කියනුලැබේ.

කර්මයෙන් ජනිතවූ අටළොස්වැදෑරුම්වූ රූපය තෘෂ්ණා-දෘෂ්ටියෙන් උපෙතවූ කර්මයාවිසින් තමාගේ ඵලත්වයෙන් ගත්නාලදබවහෙයින් **උපාදින්නරූප** නම් වේ, ඉතරවූ දශවිධරූපය **අනුපාදින්නරූප** නම් වේ.

විඥානොත්පත්තියට හෙතුභාවයෙන් චක්ෂුඃප්‍රතිඝනනස්වභාවවූ වර්ණය ද්‍රෂ්ටව්‍යභාවසංඛ්‍යාතනිදර්ශනය හා සමග පවත්නාහෙයින් **සනිදර්ශනරූප** නම් වේ; මෙයින් ඉතිරිවූයේ **අනිදර්ශනරූප** නම් වේ.

චක්ෂුරාදිප්‍රසාදද්වය තමහට අසම්ප්‍රාප්තගොචරවශයෙන් ද ඝ්‍රාණාදිත්‍රය තමහට සම්ප්‍රාප්තයාගේ ගොචරවශයෙනැයි පඤ්චප්‍රකාරවූ මේ රූපය තමතමාගේ විඥානය ලවා ගොචරය ගන්වනහෙයින් **ගොචරග්‍රාහිකරූප** නම් වේ.

මෙහි,—චක්ෂුඃ-ශ්‍රොත්‍රදෙදෙන සාන්තරාධිකග්‍රාහීහෙයින් අප්‍රාප්තගොචරග්‍රාහීහයි දතයුතු; සාන්තරාධිකග්‍රාහීහයි කියතුදු චක්ෂුස්නු තමා කෙරෙන් විවර්ජිතාභාදෙශයෙහි තමහට අධිකප්‍රමාණ චන්ද්‍ර-තාරකාදීහුදු ස්ඵටිකාදීන් ව්‍යවහිත ජපාකුසුමාදීහුදු ගන්වනහෙයින් ශ්‍රොත්‍රය ද තමාකෙරෙන් විවර්ජිතාභදෙශස්ථ මේඝශබ්දාදීන් ද උදරචර්මාදීන් ව්‍යවහිත කුක්ෂිශබ්දාදීන් ද ගන්වනහෙයිනි;—සමහර ආචාර්යකෙනෙක් ශ්‍රොත්‍රෙන්ද්‍රිය ද ප්‍රාප්තග්‍රාහිය යී යෙත්, එසේ වීනම් බාහ්‍යයෙහි චිත්තජශබ්දයතුදු උපදනාහෙයින් චිත්තජශබ්දය ශ්‍රොත්‍රවිඥානයට විෂය නොව "න සද්දායතනං සොතවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො" යී සාමාන්‍යයෙන් අරමුණු නොවෙයි යතුදු නැති, අනිකෙකුදු,—ගන්ධය මෙන් ස්වප්‍රදෙශයෙහි උපලභ්‍යමානබැවින් ශබ්දයාගේ දිග්-දෙශ ව්‍යවස්ථා ද නොවියයුතු, ශබ්දය උත්පන්නස්ථානයෙහි ම සිට හමුවෙයි දතයුතු.

(මෙම තීනු,—

"චක්ඛු-සොතං පන නෙසු හොතා'සම්පත්තගාහකං,
විඤ්ඤාණුප්පත්තිහෙතුත්තා සන්තරාධිකගොචරෙ.

තථා හි දූරදෙසට්ඨං ඵළිකාදිතිරොහිතං,
මහන්තම්පි නගාදීනං වණ්ණං චක්ඛු උදික්ඛති.

ආකාසාදිගතො කුච්ඡි-චම්මාදන්තරිතො'පි ච,
මහන්තො ච ඝනාදීනං සද්දො සොතස්ස ගොචරො.

ගන්ත්වා විසයදෙසන්තං ඵරිත්වා ගණ්හති'ති චෙ,
අධිට්ඨානවිධානෙ'පි තස්ස සො ගොචරො සියා.

භූතප්පබන්ධතො සො චෙ යාති ඉන්ද්‍රියසන්තිකං,
කමෙන-විනොනාජයම්භූතො වණ්ණො සද්දො ච චිත්තජො.

න තෙසං ගොචරා හොන්ති න හි සම්භොන්ති තෙ බහි,
වුත්තා ච අප්සෙසෙන පාඨෙ තං විසයා'ව තෙ.

යදි චෙතං මයං අත්තසම්පෙක්ඛුව ගණ්හාති,
අක්ඛිවණ්ණං තථාමූලං පස්සෙය්‍ය භමුකාය ච,

දිසා-දෙසවවත්ථානං සද්දස්ස න භවෙය්‍ය ච,
සියා ච සරවෙධිස්ස සකණ්ණෙ සරපාතනං''—ටී).

අවශිෂ්ටවූ තෙවිසිවැදෑරුම්වූ රූපය ගොචරග්‍රහණභාවයෙන් **අගොචරග්‍රාහිකරූප** නම් වේ.

වර්ණය ද, ගන්ධය ද, රසය ද, ඕජාව ද, පෘථිව්‍යාදි භූතචතුෂ්කය දැයි, අෂ්ටප්‍රකාරවූ රූපය සියලු කම්මාදිවූ චතුසමුට්ඨානරූපකලාපයෙහි ඔවුනොවුන් හා විනා ප්‍රවෘත්තියක් නැතිහෙයින් **අවිනිබ්භොගරූප** නම් වේ;-අන්‍යවූ ඉන්ද්‍රිය-වස්තු-ශබ්දාදිවූ විංශතිරූපය කම්මාදිචතුස්සමුට්ඨානාදිත්වයෙන් කිසිතැනෙක්හි කිසිකලෙක්හි කිසිකෙනෙකුන්ට ම සම්භවවනහෙයින් **විනිබ්භොගරූප** නම් වේ.

[ඉච්චෙවමට්ඨවීසතිවිධම්පි ච විචක්ඛණා,
අජ්ඣත්තිකාදිභෙදෙන විභජන්ති යථාරහං.]

මේ උක්තප්‍රකාරයෙන් අටවිසිවැදෑරුම්වූ මේ රූපය ප්‍රාඥයෝ ආධ්‍යාත්මිකාදිභෙදහෙයින් සුදුසු පරිද්දෙන් විභාග කෙරෙත්.

## මේ රූපාධිකාරයෙහි මේ රූපයන්ගේ විභාගය යි.

අතීත කම්මය ද, ජායමානචිත්තය ද, චතුස්සමුට්ඨානවූ ස්ථිතිප්‍රාප්තවූ ශීතො'ෂ්ණසංඛ්‍යාත ඍතුව ද, කබලිඞ්කාරාහාරනිශ්‍රිත ස්ථිතිප්‍රාප්ත ඔජඃසංඛ්‍යාත ආහාරය දැයි, යන මේ සතරදෙන රූපජනකහෙතූහු නම් වෙත්.

ඒ කම්මාදි චතුසමුට්ඨානයන් අතුරෙහි,—කුශලා'කුශලචෙතනා සංඛ්‍යාතවූ විංශතිවිධ කාමාවචරය, පඤ්චවිධ රූපාවචරකුශලය දැයි, පස්විසිවැදෑරුම්වූ කුශලා'කුශලකම්මය අතීතභාවයෙහි සකස් කොට කරණලද්දේ ඉන්ද්‍රියබද්ධවූ ස්වකීය-ස්වකීයසන්තානයෙහි ඉන්ද්‍රියාෂ්ටක-වස්තුදශකාදි කම්මසමුට්ඨානරූපය කාම-රූපභවයෙහි ලා ප්‍රතිසන්ධියගේ උත්පාදක්ෂණයෙහි පටන් ක්ෂණ-ක්ෂණයෙහි හෙවත්—එකි-එකී චිත්තයාගේ උත්පාද-ස්ථිති-භඞ්ගසංඛ්‍යාතක්ෂණත්‍රයෙහි චුතිය දක්වා නිරන්තරයෙන් ම රූප උපදවන්නේයි.

කම්මජරූපාශ්‍රයක් නැතිහෙයින් රූ නූපදවනහෙයින් අරූපාවචරවිපාකයන් ද, විතර්කාදි අඞ්ගදෞර්බල්‍යය හෙතු කොට ගෙණ රූ නූපදවනහෙයින් දෙපස් විඥානයන් ද, වර්ජිතකොට ඇති කුශලා'කුශලයෝ තෙතිසය, ක්‍රියාචිත්තයෝ විස්සය, දෙපස්විඥානයන්කෙරෙත් අවශිෂ්ට විපාකචිත්තයෝ දෙවිස්සය, යන මේ පන්සැත්තෑ

ප්‍රකාරවූ චිත්තය ශුද්ධාෂ්ටක-ශබ්දනවකාදිභෙදවූ චිත්තසමුට්ඨානරූපය ප්‍රතිසන්ධිචිත්තයට අනන්තරව ප්‍රථමභවාඞ්ගචිත්තයෙහි පටන් චිත්තයාගේ ස්ථිති-භඞ්ගක්ෂණයෙහි රූපජනකත්වයක් නැතිහෙයින් උත්පාදක්ෂණයෙහි ම රූපජනකහෙයින් උපදනේ ම රූප උපදවන්නේයි;-මෙහි පුරෙජාතභෘදයවස්තුප්‍රත්‍යයක් නොලද්දහෙයින් ද උත්පත්තිභවයට අගන්තුකහෙයින් ද කම්මජරූපයන්විසින් වැලදගෙණ සිටිහෙයින් ද ප්‍රතිසන්ධිචිත්තයා රූ නූපදවනහෙයින් ප්‍රතිසන්ධි චිත්තය හරණ්පිණිස "ප්‍රථමභවාඞ්ගචිත්තයෙහි පටන්" යි කීහ;—චිත්තයා තමාගේ උත්පාදක්ෂණයෙහි ම රූපොත්පාදනයෙහි ශක්ති ඇතිබවමුත් ස්ථිති-භඞ්ගක්ෂණයෙහි රූපොත්පාදනයට ශක්ති නැතිවනහෙයින් "රූපජනකහෙයින් උපදනේ ම" යි කීහ;—ඒ පන්සැත්තෑ ඒක චිත්තයන්කෙරෙහි සව්සි මහද්ගත-ලොකොත්තරවූ අප්පණාජවනචිත්තය ස්ථාන-නිෂද්‍යාදිවශයෙන් ප්‍රවෘත්තවූ ඊර්‍ය්‍යාපථය ද පවත්වන්නේයි;—ව්‍යවස්ථාපන, එකුන්තිස් කාමාවචරජවන, කුශල-ක්‍රියාවශයෙන් ප්‍රත්‍යභිඥචිත්තවය ද යන මේ දෙතිස් චිත්තයෝ වනාහි කාය-වාග්විඥප්තිය ද උපදවත්; මේ කාමාවචරජවනයන් අතුරෙහි කුශලා'කුශල-ක්‍රියාවශයෙන් සොම්නස් සහගතජවනයෝ තෙළෙස්දෙනා සිනා ද උපදවත්; මෙහි කුශලයන්කෙරෙන් සතරදෙනෙක, අකුශලයන්කෙරෙන් සතරදෙනෙක, ක්‍රියාවන්කෙරෙන් පස්දෙනෙකැයි, තෙළෙසක් වෙත්; මොවුන්කෙරෙන් පෘථග්ජනයෝ කුසල් අකුසල් අටසිතින් සෙති, ශෛක්ෂයෝ දෘෂ්ටිසහගත සිත්දෙක හැර අනික්සිතින් සෙති, අශෛක්ෂයෝ වනාහි ක්‍රියාසිත්පසින් සෙති ඉතුත් බුදුහු සහෙතුකක්‍රියාසිත් සතරින් ම සිනා පහළ කෙරෙත්.

ශීතසෘතු-උෂ්ණසෘතුය යි කියනලද ඒ ඍතුසමුට්ඨානිකවූ තෙජොධාතුතොමෝ තමාගේ ස්ථිතික්ෂණප්‍රාප්තවී ශුද්ධාෂ්ටක-ශබ්දනවකාදිභෙදවූ ඍතුජරූපය ඉන්ද්‍රියබද්ධසන්තානයෙහි ද අනින්ද්‍රියබද්ධවූ පෘථිවි-පර්වත-විමාන-කල්පවෘක්ෂාදියෙහි ද අනුරූපපරිද්දෙන් උපදවන්නේයි;—මෙහි ඉන්ද්‍රියබද්ධසන්තානයෙහි ශුද්ධාෂ්ටකය ලඝුතාදිත්‍රයය, අනින්ද්‍රියබද්ධසන්තානයෙහි ශබ්දය නවවනු කොට ඇති ශුද්ධාෂ්ටකය උපදීයයි සේයි.

සොභශක්තිවූ ඔජායයි කියනලද ආහාරයතෙමේ ශුද්ධාෂ්ටකාදිභෙද ආහාරජරූපය කාමධාතුයෙහි ම අනුභව කරණලද කාලයෙහි ම කම්මජරූපයන් නිසා ස්ථිතිප්‍රාප්තවූයේ ම උපදවන්නේය.

ඒ චතුසමුට්ඨානිකරූපයන් අතුරෙහි භෘදයරූපය ඉන්ද්‍රියරූපය යන මොහු නවදෙන හුදු කර්මයෙන් ම උපදනාහෙයින් **කම්මජයෝ** මැයි.

කාය-වාග්විඥප්තිදෙක චිත්තජවායු-පෘථිවීත්ගේ විකාරයක්හෙයින් **චිත්තජ** මැයි.

සවිඥානක-අවිඥානක වචනා'ශනිශබ්දාදිභෙදවූ ශබ්දයතෙමේ යථාක්‍රමයෙන් චිත්තයෙන් ද ඍතුයෙන් ද ජාතහෙයින් **චිත්තජ-ඍතුජ** යි.

ලහු-මෘදු-කම්මඤ්ඤම යන රූපයන්ගේ විකාරවූ ලහුතාදිත්‍රය සත්ප්‍රාය ඍතුජ ප්‍රසන්න චිත්තය සත්ප්‍රාය ආහාරය යන මෙයින් වන්නේයි.

ශුද්ධාෂ්ටකසංඛ්‍යාත අවිනිර්භෝගරූපයෝ ද, පරිච්ඡේදරූපය ද, යන මොහු කර්මාදි චතුර්විධප්‍රත්‍යයෙන් වෙත්.

උපචයාදි ලක්ෂණරූපයෝ කර්මාදි කිසි ප්‍රත්‍යයකින් නූපදනාහුයි. (කියනලද මැයි;)—

[අට්ඨාරස පණ්ණරස තෙරස ද්වාදසා'ති ච,
කම්ම-චිත්තොතු'කා'හාරජානි හොන්ති යථාක්කමං.
ජායමානාදිරූපානං සභාවත්තා හි කෙවලං,
ලක්ඛණානි න ජායන්ති කෙහිචී'ති පකාසිතං.]

මෙසේ කර්මජ-චිත්තජ-ඍතුජ-ආහාරජරූපයෝ පිළිවෙළින් හෘදයවස්තු-ඉන්ද්‍රියාෂ්ටක-අවිනිර්භෝගරූප-ආකාශධාතුවශයෙන් අටළොසෙක් ද, විඥප්තිද්වය-ලඝුතාදිත්‍රය-ශබ්දය-චිත්තජශුද්ධාෂ්ටකඅවිනිර්භෝගරූප-ආකාශධාතුවශයෙන් පසළොසෙක් ද, ශබ්ද-ලඝුතාදිත්‍රය-අවිනිර්භෝගරූපා'කාශවශයෙන් තෙළෙසෙක් ද, ලඝුතාදිත්‍රය-අවිනිර්භෝගරූපා'කාශ වශයෙන් දෙළොසෙක් ද, වෙත්;—හුදෙක් ජායමාන-පරිපච්‍යමාන-භිද්‍යමානරූපයන්ගේ ස්වභාවයක්බැවින්හෙවත්-ස්වභාවමාත්‍රය විනා තමන්ගේ ජාත්‍යාදිලක්ෂණයක් නැතිහෙයින් ලක්ෂණරූපයෝ කර්මාදිවූ කිසිප්‍රත්‍යයකින් නූපදනාහයි ප්‍රකාශකරණලදී;—එසේ මැයි, උත්පාදාදීන් යුක්තවූ චක්ෂුරාදීන්ගේ ජාත්‍යාදි ලක්ෂණයෝ පැණෙන්නාහ; ඔවුන්ගේ මෙන් ලක්ෂණරූපයන්ගේ ජාත්‍යාදිලක්ෂණරූපයෙක් නැති; ඉදින් මොවුන්ගේ ද ජාත්‍යාදීහු වෙත් නම් ඔවුන්ගේ "ජාත්‍යාදීහු වෙති"යි මෙසේ අනවස්ථිතිය පැමිණෙන්නේයි.

**මේ රූපවිභාගයෙහි මෙතෙම රූපජනක ප්‍රත්‍යය විභාගයයි.**

යම් හෙයකින් ඒ රූපයෝ කර්මාදිවූ ප්‍රත්‍යයෙන් උපදනාහු එකෙකිදෙන නූපදිද්ද සමූහවශයෙන් ම උපදිද්ද එහෙයින් ඒ ධම්මසමූහයාගේ සංඛ්‍යාව ද පරිච්ඡේදාදි ස්වරූප ද දක්වනුපිණිස "එක්ව උත්පත්ති ඇත්තාවූ ද" යනාදි කියනලදී.

එක්ව උත්පත්ති ඇත්තාවූ ද, එක්ව ම නිරෝධ ඇත්තාවූ ද, පෘථිවි ධාතුසංඛ්‍යාත එකාධිෂ්ඨානත්වයෙන් හෝ ජීවිතෙන්ද්‍රියාදීන් අතුරෙහි එකක් ප්‍රධානකොට ඇතිහෙයින් හෝ, එකනිශ්‍රයවූද, වෙන වෙන කලාපගත රූපවශයෙන් එක්ව පවත්නාවූ එක්විස්ස **රූපකලාපයෝ** නම් වෙත්.

ඒ එක්විසිරූපකලාපයන් අතුරෙහි,—ජීවිතෙන්ද්‍රිය ද, ශුද්ධාෂ්ටකය ද, චක්ෂුඃප්‍රසාදය හා සමග **චක්ෂුර්දශකය** යී කියනු ලැබේ;—එසේ ම ශ්‍රොත්‍රප්‍රසාදාදීන් හා සමග ජීවිත-අවිනිර්භෝගරූපය **ශ්‍රොත්‍රදශකය, ඝ්‍රාණදශකය, ජිහ්වාදශකය, කායදශකය, ස්ත්‍රීභාවදශකය, පුම්භාවද**

**ශකය, වත්ථුදශකය** දැයි; පිළිවෙළින් යෙදියයුතුකොට්ඨි; අවිනිර්භෝගරූපය ම ජීවිතේන්ද්‍රිය හා සමග **ජීවිතනවකය** යි කියනුලැබේ නුයි මේ නවදෙන **කර්මයෙන් උපදනාවූ** රූපකලාපයෝ නම් වෙත්.

අවිනිර්භෝගරූපය වනාහි ශුද්ධාෂ්ටකය, ඒ ශුද්ධාෂ්ටකය ම කායවිඥප්තිය හා සමග කායවිඥප්තිනවකය; වාග්විඥප්ති-ශබ්දයන් හා සමග වාග්විඥප්තිදශකය; ලඝුතාදි තුන්දෙනා හා සමග ලඝුතාදෙකාදශකය; කායවිඥප්ති-ලඝුතාදීන් හා සමග කායවිඥප්ති-ලඝුතාදිද්වාදශකය, වාග්විඥප්ති-ශබ්ද-ලඝුතාදීන් හා සමග වාග්විඥප්ති-ශබ්ද-ලඝුතාදි ත්‍රයෝදශකය දැයි ; මේ කලාපයෝ සදෙන **චිත්තප්‍රත්‍යයෙන් උපදනා** කලාපයෝ නම් වෙත්.

ශුද්ධාෂ්ටකය, ශබ්දනවකය, ලඝුතාදෙකාදශකය, ශබ්ද-ලඝුතාදිද්වාදශකය, යි මේ කලාපයෝ සතරදෙන **ඍතුජ** කලාපයෝ නම් වෙත්.

ශුද්ධාෂ්ටකය ද, ලඝුතාදෙකාදශකය දැයි, මොහු දෙදෙන **ආහාරජ** කලාපයෝ නම් වෙත්.

ඒ චතුජකලාපයන් අතුරෙන් ශුද්ධාෂ්ටකය ද, ශබ්දනවකය දැයි, යන ඍතුජවූ කලාපයෝ දෙදෙන ඉන්ද්‍රියබද්ධසන්තානයෙන් පිටත් තන්හිදු ලැබෙත්, අවශේෂ කලාපයෝ වනාහි සියල්ලෝ ම සෙන්ද්‍රිය සන්තානයෙහි ම වෙත්.

(මෙම කීහ);—

[කම්ම-චිත්තො'තුකා'හාරසමුට්ඨානා යථාක්කමං,
නව ඡ චතුරො ද්වෙ'ති කලාපා එකවීසති.]

කර්මජ-චිත්තජ-ඍතුජ-ආහාරජකලාපයෝ පිළිවෙළින් නව දෙනෙක, සදෙනෙක, සතරදෙනෙක, දෙදෙනෙකැයි, කලාපයෝ එක්විස්සෙක.

[කලාපානං පරිච්ඡෙදලක්ඛණත්තා විචක්ඛණා,
න කලාපඞ්ගමිච්චාහු ආකාසං ලක්ඛණානි ච.]

ශුද්ධාෂ්ටකාදි රූපකලාපයන්ගේ පිරිසිඳිනාහෙයින් ද කලාපයන් ගේ සංස්කෘතත්වයට ලක්ෂණභාවහෙයින් ද පරිච්ඡෙදරූපය ද, ජාත්‍යාදි ලක්ෂණරූපයන් ද, ප්‍රාඥයෝ කලාපයට අඞ්ගයකැයි නොකියත්.

**මේ රූපසඞ්ග්‍රහවිභාගයෙහි මෝතොමෝ**
**රූපකලාපයන්ගේ යෙදීමයි.**

**දැ**න් ඒ රූපකලාපයන්ගේ භවවශයෙන් ද ප්‍රතිසන්ධිවශයෙන් ද යොනිවශයෙන් ද ප්‍රවෘත්තිය දක්වනුපිණිස "උද්දේශ හෙයින්" යනාදි කීහු.

උද්දේශහෙයින් අටවිසිවැදෑරුම්වූ කලාපහෙයින් එක්විසිවැදෑරුම් වූ මෙ සියලු රූපයෝ වනාහි කාමභවයෙහි සභාවකපරිපූර්ණායත

නසත්වයන්ට අනුරූපවශයෙන් පරිපූර්ණවූවාහු ප්‍රවෘත්තිකාලයෙහි ලැබෙති, උපදිති යී සේයි;—ප්‍රතිසන්ධියෙහි වනාහි සංසේදජයන්ට ද උපපාදුකසත්වයන්ට ද චක්ෂුඃ-ශ්‍රොත්‍ර-ඝ්‍රාණ-ජිහ්වා-කාය-භාව-වස්තුදශකසංඛ්‍යාතවූ සප්තදශකයෝ උත්කෘෂ්ටවශයෙන් පහළවෙත්;-අනන්තපරිච්ඡේදවශයෙන් වනාහි චක්ෂුඃ-ශ්‍රොත්‍ර-ඝ්‍රාණ-භාවදශකයෝ ජාත්‍යන්ධ-ජාතිබධිර-ජාත්‍යඝ්‍රාණ- නපුංසකාදිකල්පිකයන්ගේ වශයෙන් කිසිකලෙක්හි නොලබත්තාහු ද වෙත්; එහෙයින් ඔවුන් ගේ වශයෙන් කලාපහානි දතයුත්තීයි;—මෙතැන්හි අභිධම්මාත්ථසඞ්ගහපාඨයෙහි "උපලබ්භන්ති" යන (අභි-30-පිටේ-10-පෙළ) මෙහි "උප" ශබ්ද විශිෂ්ටවාචීහෙයින් උත්කෘෂ්ටගතිපරිච්ඡේදවශයෙන් විශිෂ්ටවූ උපපාතය ගත්තාලදී; "අභිරූපස්ස කඤ්ඤා දාතබ්බා" යනු මෙනි.

ගබ්භශායිකසත්වයන්ට වනාහි කාය-භාව-වස්තුදශකසංඛ්‍යාතවූ තුන්දසකකෙනෙක් පහළවෙත්;—එහි ද භාවදශකය අභාවකසත්වයන්ගේ වශයෙන් කිසිකලෙක්හි නොලැබෙත්තේයි.

ඒ ප්‍රතිසන්ධියෙන් මත්තෙහි වනාහි ප්‍රවෘත්තිකාලයෙහි හෙවත්-සත්වනසතියෙහි (ටීකාකාරමතයෙන් එකොළොස්වන සතියෙහි හෝ) අනුක්‍රමයෙන් හෙවත්—චක්ෂුර්දශකය පහළවූ තැන් පටන් සප්තාහයක් ගියකල්හි ශ්‍රොත්‍රදශකය, එතැන් පටන් සප්තාහයක් ගියකල්හි ඝ්‍රාණදශකය, එයින් සප්තාහයක් ගියකල්හි ජිහ්වාදශකය යි, මෙසේ අනුක්‍රමයෙන් චක්ෂුර්දශකාදීහු ද පහළවෙත්.

මෙසේ ප්‍රතිසන්ධියෙහි පටන් කර්මජවූ ද, දෙවෙනි භවාඞ්ගචිත්තයෙහි පටන් චිත්තජවූ ද, ප්‍රතිසන්ධිචිත්තයාගේ ස්ථිතිකාලයෙහි පටන් ඍතුජවූ ද, රසහරණීඅනුසාරයෙන් ඔජාව ශරීරයෙහි ස්ඵරණකාලයෙහි පටන් ආහාරජවූ ද, යන. චතුස්සමුට්ඨාන රූපකලාපසන්තතිතොමෝ කාමභවයෙහි ප්‍රදීපජ්වාලාවක් මෙන් ද ගඞ්ගාප්‍රවාහයක් මෙන් ද ආයුපමණින් අවිච්ඡින්නව පවත්තීයි;—මෙහි ඔජාවගේ ස්ඵරණයෙන් ගබ්භශායිකසත්වයන්ට මව්විසින් අනුභව කරණලද ආහාරාශ්‍රිතඔජාවගේ රසහරණීඅනුසාරයෙන් ශරීරයෙහි පැතිරීමය; සංසේදජ-ඖපපාතිකයන්ට උන් තමන්ගේ ම මුඛගත ශ්ලේෂ්මාදිආශ්‍රිත ඔජාවගේ රසහරණීඅනුසාරයෙන් ශරීරයෙහි පැතිරීමයි.

මරණකාලයෙහි වනාහි ච්‍යුතිචිත්තයා උපරිම කොට ඇති සව සතළොස්වන චිත්තයාගේ ස්ථිතිකාලයෙහි පටන්ගෙණ කර්මජරූපයෝ නූපදනාහුයි;—සතළොස්වන චිත්තයාගේ ස්ථිතික්ෂණයෙන් පළමූ උත්පාදක්ෂණයෙහි උපන් කර්මජරූපයෝ ද සතළොස්වන චිත්තය ඇතිතාක් පැවත ච්‍යුතිචිත්තය හා සමකාලයෙහි ම නිරුද්ධ වෙත්;—ඒ කර්මජරූපයන්ගේ නිරොධයෙන් මත්තෙහි චිත්තජරූපය ද ආහාරජරූපය ද සිඳෙන්නේයි; ඒ චිත්තජ-ආහාරජරූපයන්ගෙන් මත්තෙහි ඍතුසමුට්ඨානපරම්පරාව ම මෘතකලෙබරය නිසා පවත්තීයි.

(මේ කියනලද මැයි);—

[ඉච්චේවං මතසත්තානං පුනදෙව භවන්තරෙ,
පටිසන්ධිමුපාදාය තථා රූපං පවත්තති.]

මේ උක්තක්‍රමයෙන් මෘතසත්ත්වයන්ගේ නැවත භවාන්තරයෙහි ප්‍රතිසන්ධියෙහි පවත් එපරිද්දෙන් ම රූපය පවත්නේයි.

රූපලොකයෙහි වනාහි ඝ්‍රාණ-ජිහ්වා-කාය-භාවදශකය යන මොහු ද, ආහාරජකලාපයෝ ද, නොලැබෙත්;— එහෙයින් ඒ බ්‍රහ්මයන්ගේ ප්‍රතිසන්ධිකාලයෙහි චක්ෂුඃ-ශ්‍රොත්‍ර-වස්තූන්ගේ වශයෙන් තුන් දශකකෙනෙක් ද, ජීවිතනවකය දැයි, කර්මජවූ කලාපයෝ සතරදෙනා ද, ප්‍රවෘත්තිකාලයෙහි චිත්තජ-ඍතුජකලාපයෝ ද ලැබෙත්.

අසංඥසත්ත්වයන්ට වනාහි චක්ෂුඃ-ශ්‍රොත්‍ර-වස්තු-ශබ්ද යන මොහු ද, එසේ ම සියලු චිත්තජරූපයෝ ද, නොලැබෙත්;—එහෙයින් ඒ අසංඥසත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිකාලයෙහි ජීවිතනවකය ම ලැබෙයි; ප්‍රවෘත්තිකාලයෙහි ද ශබ්දනවකවර්ජිතවූ ඍතුජරූපය ප්‍රතිසන්ධික්ෂණයෙහි උපදනා කර්මජරූපයෙන් ඉතිරිව පවත්නේයි;-අවශෙෂ බ්‍රහ්මයන්ගේ ප්‍රතිසන්ධික්ෂණයෙහි ද ප්‍රවෘත්තිකාලයෙහි ද ලැබියයුතු රූපයන්කෙරෙන් අවශිෂ්ට වන්නේයයි සේයි.

මෙසේ කාමභව-රූපභව-අසංඥභවසංඛ්‍යාතවූ තුන්තන්හි ප්‍රතිසන්ධි-ප්‍රවෘත්තිවශයෙන් රූපයන්ගේ ප්‍රවෘත්තිතොමෝ දෙපරිද්දෙකින් දතයුතුනියි.

(එසේ ම කියනලදී);—

[අට්ඨවීසති කාමෙසු හොන්ති තෙවීස රූපිසු,
සත්තරසේ'වා'සඤ්ඤීනං අරූපෙ නත්ථි කිඤ්චි'පි.]

කාමභවයෙහි අටවිසිරූපයෝ ම වෙති; රූපීබ්‍රහ්මයන්කෙරෙහි ඝ්‍රාණාදිත්‍රය හා භාවද්වය හැර තෙවිසි රූප වෙයි; අසංඥබ්‍රහ්මයන්ගේ ජීවිතනවකය, ලඝුතාදිත්‍රයය, උපචය-සන්තති-ජරතා-අනිච්චතාය, ආකාශධාතුය, යන සතළොස්දෙන ම වෙති; අවශෙෂ පඤ්චප්‍රසාද-භාවද්වය-විඥප්තිද්වය-හෘදයවස්තුව-ශබ්දය යන එකොළොස්දෙන නො උපදිති යි සේයි; අරූපාවචරයෙහි කිසිරූපයෙක් ම නැති.

දැන් සර්වසාධාරණවශයෙන් දක්වන්නාහු "සද්දො විකාරො" යනාදී කීහු,—

[සද්දො විකාරො ජරතා මරණඤ්චො'පපත්තියං,
න ලබ්භන්ති පවත්තෙ තු න කිඤ්චි'පි න ලබ්භති.]

ශබ්දය ද, ලඝුතාදිත්‍රය-විඥප්තිද්වය යන මේ විකාරරූපය ද, ජරත්වය ද, භඞ්ගය ද, යන මොහු උත්පත්තිකාලයෙහි නොලැබෙත්; ප්‍රවෘත්තිසංඛ්‍යාතස්ථිතිකාල-භඞ්ගකාලයෙහි වනාහි කිසිකෙනෙක් නොලැබෙන්නේ නොවේ; හැම රූපයෝ ම සම්භවෙති යි සේයි.

[මෙතෙකින් "නාමඤ්ච රූපඤ්ච" යන මෙහි රූපය දක්වනලදී;— මෙතැන් සිට නාමරූපයන්ගෙන් විනිර්මුක්තවූ නිර්වාණය ද, ඉන් මතු මිශ්‍රකසඞ්ග්‍රහයක් ද, දක්වනු ලැබේ.]

### මේ රූපසඞ්ග්‍රහවිභාගයෙහි මෙතෙම රූපයන්ගේ ප්‍රවෘත්තික්‍රමයයි.

නිර්වාණය වනාහි අනාශ්‍රවභාවයෙන් ත්‍රෛභූමිකවස්තුසංඛ්‍යාත ලෝකය ඉක්මෙනහෙයින් ලෝකෝත්තරයයි කියනලද චතුර්මාර්ගඥානයෙන් ප්‍රතිවේධ කටයුතුවූ මාර්ග-ඵලයන්ට අරමුණුවූ (තණ්හාය) වාණයයි කියනලද තෘෂ්ණාවෙන් විෂයාතික්‍රාන්තවශයෙන් ඉක්මුණු බවහෙයින් **නිර්වාණයයි** කියනු ලැබේ;—මෙහි අභිධර්මාර්ථසඞ්ග්‍රහපාඨයෙහි (අභි—31-පිටේ-17-පෙල) "චතුමග්ගඤාණෙන සච්ඡිකාතබ්බං" යන්නෙන් ඒ ඒ ආර්‍ය්‍යපුද්ගලයන්ගේ මාර්ගසම්ප්‍රයුක්ත ආර්‍ය්‍යඥානචක්ෂුසින් දක්කයුතුහෙයින් නිර්වාණයාගේ ප්‍රත්‍යක්ෂසිද්ධත්වය දර්ශිතයි;— "මග්ගඵලානමාලම්බනභූතං"(අභි—31-පිටේ-18-පෙල) යන්නෙන් කල්‍යාණපෘථග්ජනයන්ට නිර්වාණය අනුමානසිද්ධයයි දර්ශිතයි.

ඒ මේ නිර්වාණය ස්වකීයවූ ශාන්තලක්ෂණයෙන් එකවිධවූයේ ද කාරණව්‍යවහාරයෙන් ක්ලේශවෘත්තමාත්‍රයාගේ පරිනිර්වාණයට කාරණවූ උපාදානස්කන්ධශේෂයා සහිතව පවත්නාහෙයින් **සෝපාදිශේෂ**නිර්වාණධාතුය, ස්කන්ධශේෂය ද නැතිකල උපාදිශේෂ නැතිහෙයින් **අනුපාදිශේෂ** නිර්වාණධාතුයයි කියා ද්විප්‍රකාර වේ.

එසේම ශූන්‍යතාදි ආකාරභේදයෙන් ආරම්මණවශයෙන් ද, සම්ප්‍රයොගවශයෙන් ද, රාග-ද්වේෂ-මෝහයන්ගෙන් ශූන්‍යබැවින් හෝ, සියලු සංස්කාරයන්ගෙන් ශූන්‍යහෙයින් හෝ **ශුඤ්ඤතාය**; රාගාදිනිමිත්තරහිතහෙයින් හෝ, සියලු සංස්කාරනිමිත්තරහිතහෙයින් හෝ **අනිමිත්තාය**; රාගාදි ප්‍රණිධිරහිතහෙයින් හෝ, සංස්කාරප්‍රණිධිරහිත හෙයින් හෝ **අප්පණිහිතායයි** ත්‍රිප්‍රකාරවේ.

(කියනලද මැයි);—

[පදමච්චුතමච්චන්තමසඞ්ඛතමනුත්තරං,
නිබ්බාණමිති භාසන්ති වානමුත්තා මහෙසයො.]

තෘෂ්ණාවෙන් මුක්තවූ බුද්ධාදිවූ මහර්ෂීහු ච්‍යුතිරහිතහෙයින් අච්‍යුතවූ උත්පාදාන්ත-ව්‍යයාන්තාතික්‍රාන්තහෙයින් අත්‍යන්තවූ ප්‍රත්‍යයසමුත්පන්න නොවනහෙයින් අසංස්කෘතවූ තමහට අධිකයක්නු නැතිහෙයින් නිරුත්තරවූ ශාන්තපදය **නිර්වාණයයි** කියති.

[ඉති චිත්තං චෙතසිකං රූපං නිබ්බාණමිච්චපි,
පරමත්ථං පකාසෙන්ති චතුධා'ව තථාගතා.]

මෙසේ චිත්තය, චෛතසිකය, රූපය, නිර්වාණයයි, කියා ද පරමාර්ථය සතරපරිද්දෙකින් ම සර්වඥවරයෝ ප්‍රකාශ කෙරෙත්.

**(රූපසඞ්ග්‍රහවිභාගනම්වූ සවන පරිච්ඡේදය නිමි.)**

(ද්වාසත්තතිවිධා වුත්තා වත්ථුධම්මා සලක්ඛණා,
තෙසං දානි යථායොගං පවක්ඛාමි සමුච්චයං.]

චින්තනාදිලක්ෂණසහිතවූ හෙවත්—සස්වභාවවූ දෙපණස් චෛතසිකයහ, අවලොස් නිෂ්පන්නරූපයහ, චිත්තය, නිර්වාණය, යන ද්වාසප්තතිප්‍රභෙද ඇති වස්තුභූතවූ යම් පරමාර්ථධර්මකෙනෙක් කියන ලදනු ද, ඔවුන්ගේ සභාගාර්ථවශයෙන් කරන්නාවූ අකුශලසඞ්ග්‍රහාදිභෙදවූ සමුච්චය (රාශිය) සෙදෙනා පරිද්දෙන් දැන් කියමි.

කුශලා'ව්‍යාකෘතයන්කෙරෙන් අමිශ්‍රහෙයින් අකුශලයන්ගේ ම සභාගාර්ථවශයෙන් සඞ්ග්‍රහය, කුශලාදීන් හා මිශ්‍රහෙයින් මිශ්‍රකසඞ්ග්‍රහය, සත්‍යානුසම්බොධිසංඛ්‍යාත ආර්‍යමාර්ගයාගේ පක්ෂයෙහි වූ හෙයින් බොධිපාක්ෂික නම්වූ සතිපට්ඨානාදිභෙදවූ ධර්මයන්ගේ සභාගාර්ථවශයෙන් සඞ්ග්‍රහය, ස්කන්ධාදිවශයෙන් කුශලාදීන්ගේ සඞ්ග්‍රහය දැයි, සමුච්චයසඞ්ග්‍රහය සතරපරිද්දෙකින් දතයුත්තේයි.

කෙසේද යත්?—අකුශලසඞ්ග්‍රහයෙහි වනාහි කාමාශ්‍රවය, භවාශ්‍රවය, දෘෂ්ට්‍යාශ්‍රවය, අවිද්‍යාශ්‍රවය දැයි, **ආශ්‍රවයෝ** සතරදෙනෙක;—"ආසව" යන මෙහි "ආ" කාරය අවධි අර්ථයි;—මෙහි අවධිය මර්‍යාදා-අභිවිධිවශයෙන් ද්විප්‍රකාර වේ; "ආපාටලිපුත්තං වට්ඨො දෙවො" යනාදියෙහි මෙන් ක්‍රියාව පිටත් කොට ප්‍රවෘත්තවූයේ **මර්‍යාදා** නම් වේ; "ආභවග්ගං සද්දො අබ්භුග්ගතො" යනාදියෙහි මෙන් ක්‍රියාව ව්‍යාප්ත කොට ප්‍රවෘත්තවූයේ **අභිවිධි** නම් වේ;—මෙහි වනාහි අභිවිධියෙහි වැටෙයි දතයුතු;—යම්හෙයකින් භවාග්‍රය දක්වා ද ගොත්‍රභූව දක්වා ද පවත්නාවූ මානාදිවූ අවශෙෂධර්මයන් විද්‍යමානකල්හිදු ආත්ම-ආත්මීයාදි ග්‍රහණවශයෙන් පැතිර පවත්නාහෙයින් මදකරණාර්ථයෙන් ආශවසදෘශබවහෙයින් ඒ කාමාදීනු ම ආශවභාවනිරූඪයහයි දතයුතු.

කාමෞඝය, භවෞඝය, දෘෂ්ට්‍යෞඝය, අවිද්‍යෞඝයයි සත්ත්වයන් යට කොට හැරගන්නා බැවින් ද, හාත්පසින් පෙළනහෙයින් ද, යට කොට පෙළනබැවින් ද, සසරතුළ ගිල්ලවනබැවින් ද, **ඕඝයෝ** සතර දෙනෙකි.

කාමයොගය, භවයොගය, දෘෂ්ටියොගය, අවිද්‍යායොගයයි, සසරදුකෙහි හෝ භවනමැති මිරිකණ යන්ත්‍රයෙහි හෝ සත්ත්වයන් යොදනහෙයින් හෝ කර්මය විපාකය සමග ද, භවාන්තරයන් භවාන්තරයන් සමග ද, සත්ත්වයා දුක සමග ද, යොදනහෙයින් හෝ **යොගයෝ** සතරදෙනෙකි.

අභිධ්‍යාතොමෝ (නාමකය සමග රූපකාය හෝ, වර්තමානකය සමග අනාගතකය හෝ, නොමිදිය හැකිසේ වෙළනහෙයින්) කායග්‍රන්ථයකි, ව්‍යාපාදයද කායග්‍රන්ථයකි, (ගොශීලාදි ශීලයෙන් ශුද්ධියය, ව්‍රතයෙන් ශුද්ධියය, තදුභයෙන් ශුද්ධියයි, හාත්පසින් ග්‍රහණය කිරීම

හෝ ශුද්ධදෘෂ්ටියෙන් ගැණීම්වූ)සීල-ව්‍රතපරාමර්ශය කායග්‍රන්ථයකි;(මේ ශාශ්වතාදිය ම සත්‍යය, අනිත්‍යාදිය අසත්‍යයයි, දැඩිකොට ගැන්මවූ) ඉදංසත්‍යාභිනිවේශය ද කායග්‍රන්ථයකැයි, මෙසේ **ග්‍රන්ථයෝ** සතර දෙනෙකි.

කාමෝපාදානය, දෘෂ්ට්‍යුපාදානය, ශීල-ව්‍රතෝපාදානය, (පඤ්චස්කන්ධයන් ව්‍යතිරිත්තා'ව්‍යතිරිත්තභාවයෙන් "රූපං අත්තතො සමනුපස්සති" යනාදීන් විසිපරිද්දෙකින් පරිකල්පිතව පවත්නා)ආත්මවාදෝපාදානය දැයි, මැඩියෙකු දැඩියේ අල්වා ගන්නාලද සර්පයෙක් මෙන් ආරම්මණයන්ගේ දෘඪග්‍රහණවශයෙන් පවත්නා **උපාදානයෝ** සතරදෙනෙකි.

(පඤ්චකාමගුණයන්කෙරෙහි අභිමාත්‍රරාගසංඛ්‍යාත කාමයම ඊප්සාකරණාර්ථවශයෙන් ඡන්දයයි ද ගන්නාලද)කාමච්ඡන්දනිවරණය, (චිත්තයෙහි යථාස්වභාව ඉක්මවා විනාශස්වභාවයට පමුණුවන්නාවූ)ව්‍යාපාදනිවරණය, ථීන-මිද්ධනිවරණය, උද්ධච්ච-කුක්කුච්චනිවරණය, විචිකිත්සානිවරණය, අවිද්‍යානිවරණය දැයි, ධ්‍යානාදිවශයෙන් උපදින්නාවූ කුශලචිත්තය උපදින්නට නොදී වලක්වනහෙයින් හෝ, ප්‍රඥාචක්ෂුස අවුරණහෙයින් හෝ **නිවරණ** නම්වූවෝ සදෙනෙකි;—මෙහි ව්‍යාපාදය යී "අනත්ථං මෙ අචරි චරති චරිස්සති" යනාදීන් පවත්නා නවවිධ ආඝාතවස්තුව හෝ, අස්ථානකෝපය සමග දශය ම හෝ ගන්නා ලැබේ.

භින්නධර්මවූ ථීන-මිද්ධ, උද්ධච්ච-කුක්කුච්ච, යන මොවුන් දෙදෙන දෙදෙන එක් කොට එකෙකි නිවරණභාවයෙන් කුමක්පිණිස කීහ යත්?—කෘත්‍යා'හාර-ප්‍රතිපක්ෂයන්ගේ සමානතායෙන් එක් කොට දක්වනලදි;—මෙහි චිත්තයාගේ ලීනබව කිරීම ථීන-මිද්ධ දෙදෙනාගේ කෘත්‍යය; චිත්තයාගේ නොසන්හුන්බව කිරීම උද්ධච්ච-කුක්කුච්ච දෙදෙනාගේ කෘත්‍යය;—එසේ ම තන්ද්‍රී-විජම්භිකාදිය ථීන-මිද්ධ දෙදෙනාගේ ආහාරය, හෙතුයයි සේයි; ඥාතිව්‍යසන-විතර්කාදිය උද්ධච්ච-කුක්කුච්ච දෙදෙනාගේ ආහාරය;—එසේ ම වීර්‍ය්‍යය ථීන-මිද්ධ දෙදෙනාට ප්‍රතිපක්ෂය; සමාධිය උද්ධච්ච-කුක්කුච්ච දෙදෙනාට ප්‍රතිපක්ෂයි.

(කියනලද මැයි,—

"කිච්චා'හාර-විපක්ඛානං එකතා එකමෙත්ථ හි,
කතමුද්ධච්ච-කුක්කුච්චං ථීන-මිද්ධඤ්ච තාදිනා;
ලීනතා-සන්තතා කිච්චං තන්දී-ඤාතිවිතක්කනං,
හෙතූ විරිය-සමථා ඉමෙ තෙසං විරොධිනො"—ටී).

කාමරාගානුශය, භවරාගානුශය, ප්‍රතිඝානුශය, මානානුශය, දෘෂ්ට්‍යනුශය, විචිකිත්සානුශය, අවිද්‍යානුශය දැයි, **අනුශයයෝ** සද්දෙනෙක් වෙත්;—මෙහි අප්‍රහීණාර්ථයෙන් සත්ත්‍ව අනුව සයනය කෙරෙත්නුයි=අනුශය නම්; අනුරූපකාරණයන්ගේ ලාභයෙහි නැවත උප

දීත් යන අර්ථයි; එසේ මැයි, අප්‍රහීණවූ කෙලශයෝ හෙතුලාභය ඇතිකල්හි ඉපදීමට සුදුසුවූවෝ සිතෙහි අනුශයිතයන් මෙන් වෙති යි ඒ අවස්ථාව අනුශය නම් වෙයි; ඔහු වනාහි නිෂ්පර්‍යායහෙයින් අනාගතකෙලශයෝ මය; අතීත-වර්ත්තමානකෙලශයෝ ද තත්ස්වභාවහෙයින් එමෙන් කියනුලැබෙති; එසේ මැයි, කාලභෙදවශයෙන් ධර්මස්වභාවභෙදයක් ඇත්තේ නොවේ;—ඉදින් අප්‍රහීණත්වයෙන් අනුශය වෙත් නම්, අප්‍රහීණවූ සකලකෙලශයෝ අනුශය නොවෙත් ද? කාමරාගාදීන්ට ම අනුශයව්‍යවහාරය කෙසේ ලැබේ ද යත්?— අප්‍රහීණතාමාත්‍රයෙන් අනුශය යයි කියනු නොලැබෙත්; එසේ ද වුවත් අප්‍රහීණත්වයෙන් වීර්‍ය්‍යාධික්‍යයට පැමිණි කෙලශයෝ අනුශය යයි ව්‍යවහාරයට යෙති; වීර්‍ය්‍යාධික්‍යයට පැමිණීම ද කාමරාගාදීන්ට ම ආවෙණිකස්වභාවයෙක, අන්‍යයන්ට සාධාරණ නොවේ;—එසේ ම කියනලදී, අභිධර්මයෙහි,—"ථාමගතෙ කිලෙසෙ පජහති"—යි.

කාමරාගසංයොජනය, රූපරාගසංයොජනය, අරූපරාගසංයොජනය, ප්‍රතිඝසංයොජනය, මානසංයොජනය, දෘෂ්ටිසංයොජනය, ශීල-ව්‍රතපරාමර්ශසංයොජනය, විචිකිත්සාසංයොජනය, ඖද්ධත්‍යසංයොජනය, අවිද්‍යාසංයොජනයයි, සූත්‍රාන්තයෙහි **සංයොජනයෝ** දසදෙනෙකි;—මොහු සසර සත්ත්වයන් යොදවති බඳිති යන අර්ථහෙයින් හෝ, ස්කන්ධයන් සමග ස්කන්ධයන් ද, ඵලය සමග කර්මය ද, දුක සමග සත්ත්වයන් ද, යොදවත්තෙන් හෝ=සංයොජන නම් වෙත්.

කාමරාගසංයොජනය, භවරාගසංයොජනය, ප්‍රතිඝසංයොජනය, මානසංයොජනය, දෘෂ්ටිසංයොජනය, ශීල-ව්‍රතපරාමර්ශසංයොජනය, විචිකිත්සාසංයොජනය, ඊර්ෂ්‍යාසංයොජනය, මාත්සර්‍ය්‍යසංයොජනය, අවිද්‍යාසංයොජනයයි, අභිධර්මයෙහි අන්‍යවූ **සංයොජනයෝ** දසදෙනෙකි.

ලොභය, ද්වෙෂය, මොහය, මානය, දෘෂ්ටිය, විචිකිත්සාය, ස්ත්‍යානය, ඖද්ධත්‍යය, අහ්‍රීකය, අනපත්‍රපායයි, **කෙලශයෝ** දසදෙනෙකි;-මොවුන් කාරණකොට සිත කිලුටුවෙයි, තැවෙයි, පීඩාකරනුලැබෙයි හෝ, තුමූ ම කිලිටු වෙත් නුයි හෝ, සම්ප්‍රයුක්තධර්මයන් කිලිටු කෙරෙත් නුයි හෝ=කෙලශ නම් වෙත්.

මේ පාපසඞ්ග්‍රහයෙහි ආශ්‍රවාදීන්කෙරෙහි වනාහි කාම-භවසංඛ්‍යාතවූ ආලම්බනයන්ගේ නාමයෙන් තවසනුකාවූ තෘෂ්ණාතොමෝ අභිමතය;—සීලබ්බතපරාමාස යයි ද, ඉදංසච්චාභිනිවෙස යයි ද, අත්තවාද යයි කියා ද, එසේ ම ශීල-ව්‍රතයන්ගේ විපරීතග්‍රහණාදිවශයෙන් ප්‍රවෘත්තවූ දෘෂ්ටිය ම කියනුලැබේ.

(පිඩුකොට මෙසේ දක්වනලදී.);—

[ආසවො'ඝා ච යොගා ච තයො ගන්ථා ච වත්ථුතො,
උපාදානා දුවෙ ධම්මා අට්ඨ නීවරණා සියුං.

ජලෙවා'නුසයා හොන්ති නව සංයෝජනා මතා,
කිලෙසා දස වුත්තො'යං නවධා පාපසඞ්ගහො.]

ආශ්‍රව-ඔඝ යන මොහු ද යොගය යන මොහු ද ධර්මහෙයින් කාම-භවාශ්‍රවයන් ලොභස්වභාවබැවින් ලොභ-දෘෂ්ටි-මොහවශයෙන් ධර්මයෝ තුන්දෙනෙක් වෙත්; අභිජ්ඣාකායගන්ථාදි ග්‍රන්ථයෝ ද ධර්මහෙයින් අභිධ්‍යා-ව්‍යාපාද-දෘෂ්ටිවශයෙන් ධර්මයෝ තුන්දෙනෙක් වෙති; උපාදානධර්මයෝ ධර්මහෙයින් ලොභ-දෘෂ්ටිවශයෙන් දෙදෙනෙක් වෙති; කාමච්ඡන්දාදි නීවරණධර්මයෝ ස්ත්‍යාන-මිද්ධ, ඖද්ධත්‍ය-කෞකෘත්‍ය, යන මොවුන්දෙදෙනා වෙන වෙන ගන්නා ලදබවහෙයින් අටදෙනෙක් වෙති.

කාමරාගානුශයාදීහු කාමරාග-භවරාගානුශයයන් තෘෂ්ණාස්වභාවයෙන් එක් කොට ගන්නාලදබවහෙයින් ධර්මහෙයින් සදෙනෙක් ම වෙති; සූත්‍රා'භිධර්මවශයෙන් දෙතැන්හි කියනලද්දාවූ සංයෝජනයෝ තෘෂ්ණාස්වභාව-දෘෂ්ටිස්වභාවයන් එක් කොට සඞ්ග්‍රහකරණලද බව හෙයින් ධර්මහෙයින් ලොභ-ද්වේෂ-මොහ-දෘෂ්ටි-මාන-විචිකිත්සා-ඖද්ධත්‍ය-ඊර්ෂ්‍යා-මාත්සර්‍ය්‍යවශයෙන් නවදෙනෙක් දන්නාලදහ, සූත්‍රා'භිධර්මවශයෙන් කෙලශයෝ දසදෙනෙක් ම වෙති, සී මේ අකුශලසඞ්ග්‍රහයතෙම නවප්‍රකාරයකින් කියනලදී.

කුශලා'කුශලා'ව්‍යාකෘතයන් හා මිශ්‍රහෙයින් **මිශ්‍රක නම්වූ සඞ්ග්‍රහයෙහි,—හෙතූහු** ලොභය, ද්වේෂය, මොහය, අලොභය, අද්වේෂය, අමොහය දැයි, සදෙනෙක් වෙති.

**ධ්‍යානාඞ්ගයෝ** විතර්කය, විචාරය, ප්‍රීතිය, එකාග්‍රතාය, සෞමනස්‍යය, දෞර්මනස්‍යය, උපෙක්ෂායයි, සත්දෙනෙක් වෙත්;—මෙහි-අරමුණු කරා පැමිණ සිතීම් සංඛ්‍යාත උපනිධ්‍යානාර්ථයෙන් ද, යෙදෙන පරිද්දෙන් ප්‍රතිවිරුද්ධධර්මයන් දැවීම කරණ අර්ථයෙන් ද=ධ්‍යාන නම් වෙත්, අවයව භාවයෙන් සංඥානනය කෙරෙත්නුයි=අඞ්ග නම් වෙත්; ධ්‍යාන වූවෝ ද ඔහු මය අඞ්ග වූවෝ ද ඔහු ම නුයි=ධ්‍යානාඞ්ග නම් වෙත්;—අවයවවිනිර්මුක්තවූ ද සමූහයාගේ අඞ්ගභාවය ඇතිකල්හිදු එක්වත් ධ්‍යාන කරණහෙයින් සෙනාඞ්ග-රථාඞ්ගාදිය මෙන් වෙන්-වෙන් වශයෙන් අඞ්ගභාවයෙන් කියනුලැබෙත්;—මෙහි දෞර්මනස්‍යය අකුශලධ්‍යානාඞ්ගය, සෙස්සෝ කුශලා'කුශලා'ව්‍යාකෘත ධ්‍යානාඞ්ගයෝයි.

**මාර්ගාඞ්ගයෝ** සම්‍යග්දෘෂ්ටිය, සම්‍යක්සඞ්කල්පය, සම්‍යග්වචනය, සම්‍යක්කර්මාන්තය, සම්‍යගාජීවය, සම්‍යග්ව්‍යායාමය, සම්‍යක්ස්මෘතිය, සම්‍යක්සමාධිය; මිථ්‍යාදෘෂ්ටිය, මිථ්‍යාසඞ්කල්පය, මිථ්‍යාව්‍යායාමය, මිථ්‍යාසමාධියයි, දොළොසෙක් වෙත්;—මෙහි,—සුගති-දුර්ගතීන්ට ද නිර්වාණයට ද අභිමුඛවැ පමුණුවනහෙයින් ඔවුන්ට මාර්ගවූ අඞ්ගයෝ, මාර්ගාඞ්ග නම් වෙත්; අෂ්ටාඞ්ගිකමාර්ගය සඞ්ඛ්‍යාත අඞ්ගයෝ හෝ මාර්ගාඞ්ග නම් වෙත්;—ඔවුන් අතුරෙන්,—අවිපරීතස්වභාවයෙන්

මොනවට දකී නුයි=සම්‍යග්දෘෂ්ටි නම්, ඕතොමෝ වනාහි "ඇත්ථි දින්නං" යනාදි නයින් දශවිධ වෙයි; පරිශුද්ධි කෘත්‍යවශයෙන් සිව් වැදෑරුම් ද වෙයි,—මෙයින් මොනවට සඞ්කල්ප කෙරේ නුයි=සම්‍යක් සඞ්කල්ප නම්, හේ නෛෂ්ක්‍රම්‍ය-අව්‍යාපාද-අවිහිංසාවශයෙන් තුන් වැදෑරුම් වෙයි,—මුසාවාදාදියෙන් දුරුවීම සම්‍යග්වචන නම්,—ප්‍රාණාතිපාතාදියෙන් දුරුවීම සම්‍යක්කර්මාන්ත නම්;—මිථ්‍යාජීවයෙන් දුරුව දිවිපැවැත්ම සම්‍යගාජීව නම්;—නූපන් අකුශලචිත්තයන් නූපදවන උත්සාහාදිවශයෙන් සම්‍යග්ව්‍යායාමය සිව්වැදෑරුම් වේ;—ස්මෘතිප්‍රස්ථාන සතර සම්‍යක්ස්මෘති නම් වේ;—ප්‍රථමධ්‍යානාදීන් විසින් පවත්නාවූ චිත්තයාගේ එකාග්‍රතාව සම්‍යක්සමාධී නම් වේ;—මිථ්‍යාදෘෂ්ට්‍යාදිය දුර්ගතිගමනයට මාර්ගබැවින් මාර්ගාඞ්ග නම්;—මෙහි මිථ්‍යාසඞ්කල්ප නම් කාමවිතර්ක-ව්‍යාපාදවිතර්ක-විහිංසාවිතර්කයෝ යන මේයි; මිථ්‍යාව්‍යායාම නම් අකුශලචිත්තසම්ප්‍රයුක්තවූ වීර්‍ය්‍යයයි; මිථ්‍යාසමාධි නම් අකුශලචිත්තසම්ප්‍රයුක්තවූ සමාධියයි.

**ඉන්ද්‍රියයෝ** චක්ඛුන්ද්‍රියය, සොතින්ද්‍රියය, ඝාණින්ද්‍රියය, ජිව්හින්ද්‍රියය, කායින්ද්‍රියය, ඉත්ථින්ද්‍රියය, පුරිසින්ද්‍රියය, ජීවිතින්ද්‍රියය, මනින්ද්‍රියය, සුඛින්ද්‍රියය, දුක්ඛින්ද්‍රියය, සොමනස්සින්ද්‍රියය, දොමනස්සින්ද්‍රියය, උපෙක්ඛින්ද්‍රියය, සද්ධින්ද්‍රියය, විරියින්ද්‍රියය, සතින්ද්‍රියය, සමාධින්ද්‍රියය, පඤ්ඤින්ද්‍රියය, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියය, අඤ්ඤින්ද්‍රියය, අඤ්ඤාතාවින්ද්‍රියයයි, දෙවිස්සෙක් වෙත්,—මෙහි—චක්ෂුරාදි පස්දෙන දර්ශනාදිභේදවූ ස්වකීය විඥානයෙහි ආධිපත්‍යය කරණහෙයින් ඉන්ද්‍රිය නම් වෙත්, ස්ත්‍රී-පුරුෂ ලිඞ්ගාදිභේදයෙහි ඓශ්වර්‍ය්‍යය කරණහෙයින් ස්ත්‍රීන්ද්‍රිය-පුරුෂෙන්ද්‍රිය නම් වෙත්; ජීවිතය සහජාතරූපාරූපධර්මානුපාලනයෙහි ආධිපත්‍යය කරණහෙයින් ඉන්ද්‍රිය නම් වේ, මනස සම්ප්‍රයුක්තධර්මයන් කෙරෙහි ඓශ්වර්‍ය්‍යය කරණහෙයින් ඉන්ද්‍රිය නම් වේ; වේදනාපඤ්චකය සම්ප්‍රයුක්තධර්මයන්ගේ උපබෘංහණ-ම්ලානාදිකරණයෙහි ඓශ්වර්‍ය්‍යය කරණහෙයින් ඉන්ද්‍රිය නම් වේ; ශ්‍රද්ධාදිපඤ්චකය සද්දහනාදි කෘත්‍යවශයෙන් සහජාතධර්මයන්කෙරෙහි ඓශ්වර්‍ය්‍යය කරණහෙයින් ඉන්ද්‍රිය නම් වේ; අවශේෂ ඉන්ද්‍රියත්‍රිකය ලෝකෝත්තර ප්‍රඥාකෘත්‍යවශයෙන් කියනලදී,—මොවුන්කෙරෙහි ප්‍රඥෙන්ද්‍රියග්‍රහණය ධර්මස්වරූපවිභාවනයපිණිසය; අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියාදීන්ගේ ග්‍රහණය පුද්ගලාධ්‍යාශය-කෘත්‍යවිශේෂවිභාවනයපිණිසයි;—මෙහි සත්වප්‍රඥප්තියට විශේෂනිශ්‍රයබැවින් ආධ්‍යාත්මික ආයතනයෝ ආදිකොට කියනලදහ; මනින්ද්‍රිය වනාහි ආධ්‍යාත්මිකායතනභාවසාමාන්‍යයෙන් මොවුන්කෙරෙහි ම කියයුත්තේ ද අරූපෙන්ද්‍රියයන් හා (සමග) දක්වනුපිණිස ජීවිතෙන්ද්‍රියයට ඉක්බිති කොට කියනලදී; ඒ මේ ප්‍රඥප්තිතොමෝ ස්ත්‍රීන්ද්‍රිය-පුරුෂෙන්ද්‍රියයන්ගේ වශයෙන් ස්ත්‍රී-පුරුෂයයි යන විභාගයට යන්නීයයි දක්වනුපිණිස ආධ්‍යාත්මිකායතනයන්ට ඉක්බිති කොට භාවද්වය කියනලදද; ඒ මේ උපාදින්නරූපධර්මයෝ මෙසේ ජීවිතෙන්ද්‍රියයාගේ වශයෙන් සිටි

නාග යි දක්වනුපිණිස ඒ භාවයට ඉක්බිතිව ජීවිතෙන්ද්‍රිය දක්වන ලදි, සත්වසංඥතවූ ධම්මපුඤ්ජය ප්‍රබන්ධවශයෙන් පවත්නේ මේ වෙදනාවන් කරණකොට ගෙණ කිලුටු වන්නේයයි දක්වනුපිණිස ඒ මනින්ද්‍රියට ඉක්බිති කොට වෙදනාපඤ්චකය දක්වනලදි, ඒ වෙදනාවන් කරණකොට ගෙණ වනාහි විශුද්ධි කැමැත්තවුන්ගේ ව්‍යවදානයට හෙතු දක්වනුපිණිස ඒ වෙදනාපඤ්චකයට ඉක්බිතිව ශ්‍රද්ධාදි පඤ්චකය කියනලද; සම්භූතවූ ව්‍යවදානසම්භාර ඇත්තාහු ද මොවුන් කරණකොට ගෙණ ශුද්ධ වෙත් නුයි විශුද්ධියට පැමිණියාහු නිෂ්පන්නවූ කෘත්‍ය ඇත්තාහු ම වන්නාහයි දක්වනුපිණිස අන්තයෙහි ලොකොත්තර ඥානයෝ තුන්දෙන කියනලදහුයි;—මෙපමණෙකින් අභිප්‍රෙතවූ අර්ථසිද්ධි නුයි සෙස්සවුන්ගේ නොගැන්මයයි මේ මොවුන්ගේ අනුක්‍රමයෙන් දෙශනාවට කාරණයයි දතයුතු.

**බලයෝ** ශ්‍රද්ධාබලය, වීර්‍ය්‍යබලය, සමෘතිබලය, සමාධිබලය, ප්‍රඥබලය, හිරිබලය, ඔත්තප්පබලය, අහිරිකබලය, අනොත්තප්පබලයයි, නවදෙනෙක් වෙත්,—මෙහි ශ්‍රද්ධාදි සත්දෙන පිළිවෙළින් අශ්‍රද්ධිය, කොසජ්ජය, ප්‍රමාදය, උද්ධච්චය, අවිජ්ජාය, අහිරිකය, අනොත්තප්පය, යන මේ ප්‍රතිපක්‍ෂධම්මයන්විසින් අකම්ප්‍යාර්ථයෙන් ද සම්ප්‍රයුක්තධම්මයන් විෂයෙහි ස්ථිරබවහෙයින් ද බල නම් වෙති; අහිරික-අනොත්තප්පදෙදෙන වනාහි සම්ප්‍රයුක්තධම්මයන්කෙරෙහි ස්ථිරබවහෙයින් ම බල නම් වෙති; සම්ප්‍රයුක්තධම්මයන් විෂයෙහි ස්ථිරබව ම මෙහි බලාර්ථයි.

**අධිපතීහු** ඡන්දාධිපතිය, චිත්තාධිපතිය, වීර්‍ය්‍යාධිපතිය, වීමංසාධිපතියයි, සතරදෙනෙක් වෙත්,—මෙහි—තමන් පිළිබඳ ධම්මයන්ට ආධිපත්‍යය කරණ ධම්මයෝ අධිපති නම් වෙති; යම් කාලෙක ඡන්දාදීන් අතුරෙන් එක්තරා එකෙකු අධිපති කොට සිත උපදී ද එකල්හි ඡන්දාධිපති ආදිහු වෙතැයි දතයුතු.

(මේ කියනලද මැයි;—

"ඡන්දං නතු ජෙට්ඨකං කත්වා ඡන්දං කත්වා ධුරම්පන,
චිත්තස්සුප්පත්තිකාලස්මිං ඡන්දාධිපති නාම සො"–යි.)

අන්‍යවූ අධිපතිධම්මයන්ගේ අධිපතිභාව නිවාරණවශයෙන් පවත්නා ඓශ්වර්‍ය්‍යය අධිපතිතා නම්; ඉන්ද්‍රියාන්තරයන් ඇතිකල්හිදු හුදෙක් දර්ශනාදියෙහි චක්‍ෂුර්විඥානාදීන් අනුව පැවැත්විම්මාත්‍රය ඉන්ද්‍රියතා නම්; මේ අධිපති-ඉන්ද්‍රිය දෙදෙනාගේ විශෙෂයයි;—මෙහි වීමංසා නම් ප්‍රඥයි.

**ආහාරයෝ** කබලිඞ්කාරාහාරය, දෙවනුවූ ඵස්සාහාරය, තුන්වනුවූ මනොසඤ්චෙතනාහාරය, සතරවනුවූ විඤ්ඤාණාහාරය දැයි, සතරදෙනෙක් වෙත්.

මේ මිශ්‍රකසඞ්ග්‍රහයෙහි ඉන්ද්‍රියයන්කෙරෙහි වනාහි ශ්‍රොතාපත්තිමාර්ගඥානය අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියයයි කියනුලැබෙයි; අර්හත්ඵලඥානය අඤ්ඤාතාවින්ද්‍රියයයි කියනුලැබෙයි, සෝවාන්ඵල

ඥානයෙහි පටන් අභිඥානය අවසන්වූ මධ්‍යයෙහි ෂඩ්විධඥානයෝ අඤ්ඤින්ද්‍රියයහයි කියනුලැබෙත්;—ජීවිතෙන්ද්‍රිය ද රූපජීවිතෙන්ද්‍රිය-අරූපජීවිතෙන්ද්‍රියවශයෙන් ද්විප්‍රකාර වේ; දෙපස්විඥානයන්කෙරෙහි විතර්කාදි ධ්‍යානාඞ්ගයෝ නොලැබෙත්,-පඤ්චවිඥාන-මනොධාතුත්‍රික-සන්තීරණත්‍රිකවශයෙන් ෂොඩශප්‍රකාරවූ වීර්‍ය්‍යරහිතචිත්තයෙහි බලයෝ නොලැබෙත්; අටළොස් අහෙතුකයන්කෙරෙහි ද හෙතුවිරහයෙන් මාර්ගාඞ්ගයෝ නොලැබෙත්; එසේ ම විචිකිත්සාසහගතචිත්තයෙහි චිත්තයාගේ ස්ථිතිමාත්‍රවූ එකාග්‍රතාතොමෝ අධිමොක්ෂවිරහයෙන් මිථ්‍යාසමාධි-සමාධීන්ද්‍රිය-සමාධිබල ව්‍යවහාරයට නොයන්නීසි; ද්විහෙතුක-ත්‍රිහෙතුකජවනයන්කෙරෙහි ම සම්භවවූ පරිද්දෙන් එකම අධිපතියෙක් ලැබේ;—මෙහි ද්විහෙතුකජවනයන්කෙරෙහි වීමංසාවගේ අසම්භවයෙන් ඡන්ද-චිත්ත-විරිය යන මොවුන්කෙරෙන් එක්තරා අධිපතියෙක් ලැබේ;—එහෙයින් ම "සම්භවවූ පරිද්දෙන්" යයි කියනලදී.

(කියනලද මැයි;—

"ජවනෙ'ධිපතිනත්ථි යො කොචෙකො තිහෙතුකෙ,
ද්විහෙතුකෙ වා ජවනෙ වීමංසා නොපලබ්භති.
ලොකියෙසු විපාකෙසු මොහමූලෙ අහෙතුකෙ,
යථාසම්භවවුත්තිත්තා නත්ථා'ධිපති කොචි'පි"-යි.)

ද්විහෙතුක-ත්‍රිහෙතුකග්‍රහණයෙන්. වනාහි මොහමූලඅහෙතුකක්‍රියාසංඛ්‍යාතචිත්තයෙහි අධිපතීන්ගේ අසම්භවය දක්වනලදී;—"අධිපති එකො'ව ලබ්භති" යන මේ අභිධර්මාර්ථසඞ්ග්‍රහපාඨයෙහි ( අභි-34-පිටේ-8-පෙළ ) යම්සේ එක ම රාජ්‍යයෙක්හි රාජ්‍යයට අභිවූ රජදරුවන් සතරදෙනෙකු ඇතිකල්හි එකෙක් ම රාජ්‍යය අනුශාසනා කෙරේ ද, සියල්ලෝ ම එකවිට රාජ්‍යය අනුශාසනා නොකෙරෙද්ද, එපරිද්දෙන් ම සතරදෙනා විද්‍යමානකල්හිදු එකෙක් ම අධිපතිභාවයෙන් පවත්නේයයි දතයුතු.

(මෙහි වනාහි;)

[ඡ හෙතු පඤ්ච ඣානඞ්ගා මග්ගඞ්ගා නව වත්ථුතො,
සොළසින්ද්‍රියධම්මා ච බලධම්මා නවෙරිතා.
චත්තාරො'ධිපති වුත්තා තථා'හාරා'ති සත්තධා,
කුසලාදිසමාකිණ්ණො වුත්තො මිස්සකසඞ්ගහො.]

ධර්මහෙයින් ලොභාදිවූ හෙතුධර්මයෝ සදෙනෙක් කියනලදහ; විතර්කාදි ධ්‍යානාඞ්ගයෝ සෞමනස්‍ය-දෞර්මනස්‍ය-උපෙක්ෂාවෙදනාවන් වෙදනාවශයෙන් එක් කොට ගන්නාලදහෙයින් පස්දෙනෙක් කියනලදහ; සම්‍යග්දෘෂ්ට්‍යාදිවූ මාර්ගාඞ්ගයෝ ධර්මහෙයින් මිථ්‍යාසඞ්කල්ප-මිථ්‍යාව්‍යායාම-මිථ්‍යාසමාධිය යන මොවුන් තුන්දෙනා විතර්ක-වීර්‍ය්‍ය-චිත්තෙකාග්‍රතාය යන මොවුන් හා සභාගත්වයෙන් සම්‍යග්දෘෂ්ට්‍යාදීන් හා එක් කොට ගන්නාලදබව හෙයින් නවදෙනෙක් කියනලදහ; චක්ෂුරාදි ඉන්ද්‍රියධර්මයෝ ද ධර්මහෙයින් ෂොඩශ

ඛය-සෞමනස්‍ය-දෞර්මනස්‍ය-උපෙක්ෂෙන්ද්‍රිය යන මොවුන් පස් දෙනා වේදනාසාමාන්‍යයෙන් ගෙණ ලොකොත්තරෙන්ද්‍රියයන් තුන් දෙනා හා ප්‍රඥෙන්ද්‍රියය හා ඥානසාමාන්‍යයෙන් එක් කොට ගෙණ රූපාරූපජීවිතෙන්ද්‍රිය වෙන-වෙන සොළොස්දෙනෙක් කියනලදහ; බලධර්මයෝ නම් යථොක්තක්‍රමයෙන් නවදෙනෙක් කියනලදහ.

අධිපතිධර්මයෝ සතරදෙනෙක් කියනලදහ; ආහාරයෝ මෙසේ ම සතරදෙනෙක් කියනලදහයි; කුසලාදිවූ තුනින් සමාකීර්ණවූ එහෙයින් ම **මිශ්‍රක** නම්වූ සඞ්ග්‍රහය සත්පරිද්දෙකින් කියනලදී.

බෝධිපාක්ෂිකධර්මසඞ්ග්‍රහයෙහි,—**ස්මෘතිප්‍රස්ථානයෝ** කායානුදර්ශනාස්මෘතිප්‍රස්ථානය, වේදනානුදර්ශනාස්මෘතිප්‍රස්ථානය, චිත්තානුදර්ශනාස්මෘතිප්‍රස්ථානය, ධර්මානුදර්ශනාස්මෘතිප්‍රස්ථානය යි, සතර දෙනෙක් වෙත්;—අශුභග්‍රහණාදිවශයෙන් අනුප්‍රවිෂ්ටව කායාදිවූ ආලම්බනයෙහි පවත්නා සති=ප්‍රස්ථාන නම් වේ.

**සම්‍යක්ප්‍රධානයෝ** උපන්නාවූ කාමවිතර්කාදි පාපධර්මයන්ගේ අශුභමනස්කාරාදිවශයෙන් ප්‍රහාණයපිණිස ව්‍යායාමය ද, අනුත්පන්නාවූ කාමවිතර්කාදි පාපධර්මයන්ගේ අශුභමනස්කාරාදිවශයෙන් අනුත්පත්තියපිණිස ව්‍යායාමය ද, අනුත්පන්නාපූර්වවූ ශමථ-විදර්ශනාදි කුශල ධර්මයන්ගේ උත්පාදයපිණිස කර්මස්ථානාදියෙහි යෙදීම්වශයෙන් ව්‍යායාමය ද, උත්පන්නාවූ ශමථ-විදර්ශනාදි කුශලධර්මයන්ගේ අභිවෘද්ධියපිණිස ව්‍යායාමය දැයි, සතරදෙනෙක් වෙත්.

**ඍද්ධිපාදයෝ** ඡන්දිද්ධිපාදය, චිත්තිද්ධිපාදය, විරියිද්ධිපාදය, වීමංසිද්ධිපාදය දැයි, සතරදෙනෙක් වෙත්.

**ඉන්ද්‍රියයෝ** ශ්‍රද්ධෙන්ද්‍රියය, වීර්යෙන්ද්‍රියය, ස්මෘතීන්ද්‍රියය, සමාධීන්ද්‍රියය, ප්‍රඥෙන්ද්‍රියය දැයි, පසෙක් වෙත්.

**බලයෝ** ශ්‍රද්ධාබලය, වීර්යබලය, ස්මෘතිබලය, සමාධිබලය, ප්‍රඥාබලය දැයි, පසෙක් වෙත්.

**බොධ්‍යඞ්ගධර්මයෝ** ස්මෘතිසම්බොධ්‍යඞ්ගය, ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය, වීර්යසම්බොධ්‍යඞ්ගය, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය, සමාධිසම්බොධ්‍යඞ්ගය, උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය දැයි, සත්දෙනෙක් වෙත්.

**මාර්ගාඞ්ගයෝ** සම්‍යග්දෘෂ්ටිය ද, සම්‍යක්සඞ්කල්පය ද, සම්‍යග්වචනය ද, සම්‍යක්කර්මාන්තය ද, සම්‍යගාජීවය ද, සම්‍යග්ව්‍යායාමය ද, සම්‍යක්ස්මෘතිය ද, සම්‍යක්සමාධිය දැයි, අටදෙනෙක් වෙත්.

මේ බෝධිපාක්ෂිකධර්මසඞ්ග්‍රහයෙහි වනාහි සතර ස්මෘතිප්‍රස්ථානය යී එක ම සම්‍යක්ස්මෘතිතොමෝ කියනුලැබේ;—එසේ ම සතර සම්‍යක්ප්‍රධානයහයි සම්‍යග්ව්‍යායාමය කියනුලැබේ.

(මෙම සිහ;)—

[ඡන්දො චිත්තමුපෙක්ඛා ච සද්ධා-පස්සද්ධි-පීතියො,
සම්මාදිට්ඨි ච සඞ්කප්පො වායාමො විරතිත්තයං.
සම්මාසති-සමාධී'ති චුද්දසෙ'තෙ සභාවතො,
සත්තතිංසප්පභෙදෙන සත්තධා තත්ථ සඞ්ගහො.]

ඡන්දය ද, චිත්තය ද උපෙක්ෂාව ද ශ්‍රද්ධා-ප්‍රශ්‍රබ්ධි-ප්‍රීතිය යන මොහු ද, සම්‍යග්දෘෂ්ටිය ද, සම්‍යක්සඞ්කල්පය ද, සම්‍යග්ව්‍යායාමය ද, විරතිහු තුන්දෙන ද, සම්‍යක්ස්මෘතිය ද, සම්‍යක්සමාධිය ද, යන මොහු ස්වභාවධර්මහෙයින් තුදුස්දෙනෙක; සත්තිස්ප්‍රභෙදයකින් ඒ බොධිපාක්ෂිකසඞ්ග්‍රහයෙහි සත්පරිද්දෙකින් සඞ්ග්‍රහයයි.

මෙහි බොධිපාක්ෂිකධර්මයන්ගේ සඞ්ග්‍රහය සත්පරිද්දෙකින් කියා නැවත ඒ ධර්මයන් ස්ථානවශයෙන් දක්වනුපිණිස "සඞ්කප්ප පස්සද්ධි" යනාදි කියනලදී.

[සඞ්කප්ප-පස්සද්ධි ච පීතු'පෙක්ඛා ඡන්දො'ථ චිත්තං විරතිත්තය ච,
නවෙ'කඨානා විරියං නව 'ට්ඨ සති සමාධි චතු පඤ්ච පඤ්ඤා;
සද්ධා දුඨානු'ත්තමසත්තතිංස ධම්මානමෙසො පවරො විභාගො.]

සම්‍යක්සඞ්කල්පය, ප්‍රශ්‍රබ්ධිය, ප්‍රීතිය, උපෙක්ෂාය, ඡන්දය, නැවත චිත්තය ද, විරතිත්‍රය ද, යන නවදෙන එකස්ථානිකයහ; වීර්‍ය්‍යතෙමෙ සම්‍යක්ප්‍රධානචතුෂ්ක-විරියිද්ධිපාද-විරියින්ද්‍රිය-විරියබල-විරියසම්බොජ්ඣඞ්ග-සම්‍යග්ව්‍යායාම වශයෙන් නවකෘත්‍යයක් ඇතිබැවින් නවස්ථානිකය; ස්මෘතිතොමෝ ස්මෘතිප්‍රස්ථානචතුෂ්ක-ස්මෘතීන්ද්‍රිය-ස්මෘතිබල-ස්මෘතිසම්බොධ්‍යඞ්ග-සම්‍යක්ස්මෘති වශයෙන් අෂ්ටකෘත්‍යයක් ඇතිබැවින් අෂ්ටස්ථානිකය, සමාධිතොමෝ සමාධින්ද්‍රිය-සමාධිබල-සමාධිසම්බොජ්ඣඞ්ග-සම්මාසමාධිවශයෙන් සතරකෘත්‍යයක් ඇතිබැවින් චතුඃස්ථානිකය; ප්‍රඥතොමෝ වීමංසිද්ධිපාද-පඤ්ඤින්ද්‍රිය-පඤ්ඤාබල-ධම්මවිචයසම්බොජ්ඣඞ්ග-සම්මාදිට්ඨිවශයෙන් පඤ්චකෘත්‍යයක්ඇතිබැවින් පඤ්චස්ථානිකය; ශ්‍රද්ධාතොමෝ සද්ධින්ද්‍රිය-සද්ධාබලවශයෙන් කෘත්‍යද්වයක් ඇතිබැවින් ස්ථානද්වයක් ඇත්තීයයි, මේ තෙමේ බොධිපාක්ෂිකභාවයෙන් උත්තමවූ සත්තිස්ධර්මයන්ගේ උත්තමවූ විභාගයයි.

[සබ්බෙ ලොකුත්තරෙ හොන්ති න වා සඞ්කප්ප-පීතියො,
ලොකියෙ'පි යථායොගං ඡබ්බිසුද්ධිප්පවත්තියං.]

අෂ්ටවිධලොකොත්තරචිත්තයෙහි සියලු සත්තිස් බොධිපාක්ෂිකධර්මයෝ සම්භව වෙති; සඞ්කල්ප-ප්‍රීතිහු දෙදෙන නොවෙත් හෝයි; ඥානදර්ශනවිශුද්ධියෙන් පිටත් ශීලවිශුද්ධ්‍යාදිවූ ෂඩ්විශුද්ධීන්ගේ ප්‍රවෘත්තිකාලයෙහි ලෞකිකකුශලචිත්තයෙහිදු යෙදෙන යෙදෙන පරිද්දෙන් වෙත්,—ද්විතීයාදිධ්‍යානපාදකලොකොත්තරචිත්තයෙහි විතර්කයා නොඋපදනාහෙයින් චතුර්ථ-පඤ්චමධ්‍යානපාදකලොකොත්තරචිත්තයෙහි ප්‍රීතිය ද නොඋපදනාහෙයින් "න වා සඞ්කප්ප-

පීතියො" යනු කීහ; ලෞකිකකුශලචිත්තයෙහි විරතීන් අනියතව උපදනාහෙයින් "යථායොගං" යනු කීහ.

**සාශ්‍රවා'නාශ්‍රවභෙදභින්න** සියලුධම්මයන්ගේ සඞ්ග්‍රහයෙහි, **ස්කන්ධයෝ** රූපස්කන්ධය, වෙදනාස්කන්ධය, සංඥාස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඥානස්කන්ධය දැයි, පස්දෙනෙක් වෙත්.

**උපාදනස්කන්ධයෝ** රූපොපාදනස්කන්ධය, වෙදනොපාදනස්කන්ධය, සංඥොපාදනස්කන්ධය, සංස්කාරොපාදනස්කන්ධය, විඥානොපාදනස්කන්ධය දැයි, පස්දෙනෙක් වෙත්;—ඒ උපාදනස්කන්ධයන්ට විෂයභාවයෙන් ගන්නාලද්දාහු රූපාදිවූ පස්දෙන ම යයි දක්වන්නාහු "රූපොපාදනස්කන්ධය" යනාදී කීහු;—සියලු සභාගධම්මයන්ගේ සඞ්ග්‍රහයපිණිස සාශ්‍රවවූ ද අනාශ්‍රවවූ ද ධම්මයෝ සාමාන්‍යයෙන් පඤ්චස්කන්ධයහ යි දෙසනලදහ; විදර්ශනාවට භූමි දක්වනපිණිස වනාහි සාශ්‍රවධම්මයෝ ම උපාදනස්කන්ධයහ යි දෙසනලදහු; මෙහි වනාහි යම්සේ වෙදනාදීහු සාශ්‍රවවූවාහු ද අනාශ්‍රවවූවාහු ද වෙද්ද, රූපය එකාන්තකාමාවචරබැවින් ඒ වෙදනාදින් මෙන් නොවේ ද, එහෙයින් ඒ රූපය සභාගරාශිවශයෙන් ස්කන්ධයන්කෙරෙහි දෙසනලද; සාශ්‍රවභාවයෙන් රාශිවශයෙන් උපාදනස්කන්ධයෙහි දෙසනලද වෙදනාදීහු වනාහි අනාශ්‍රවවූවාහු ම ස්කන්ධයන්කෙරෙහි දෙසනලද; සාශ්‍රවවූවාහු ද උපාදනස්කන්ධයන්කෙරෙහි දෙසනලද්දාහු යයි දතයුතු.

**ආයතනධම්මයෝ** චක්ඛායතනය, සොතායතනය, ඝාණායතනය, ජිව්හායතනය, කායායතනය, මනායතනය, රූපායතනය, සද්දායතනය, ගන්ධායතනය, රසායතනය, ඵොට්ඨබ්බායතනය, ධම්මායතනය දැයි, චක්ෂුරාදි ෂඩ්විධවූ ආධ්‍යාත්මිකායතනයන්ගේ ද රූපාදි බාහ්‍යවූ ෂඩාලම්බනයන්ගේ ද වශයෙන් දොළොස්දෙනෙක් වෙත්.

**ධාතූහු** චක්ඛුධාතුය, සොතධාතුය, ඝාණධාතුය, ජිව්හාධාතුය, කායධාතුය,—රූපධාතුය, සද්දධාතුය, ගන්ධධාතුය, රසධාතුය, ඵොට්ඨබ්බධාතුය,—චක්ඛුවිඤ්ඤාණධාතුය, සොතවිඤ්ඤාණධාතුය, ඝාණවිඤ්ඤාණධාතුය, ජිව්හාවිඤ්ඤාණධාතුය, කායවිඤ්ඤාණධාතුය,—මනොධාතුය, ධම්මධාතුය, මනොවිඤ්ඤාණධාතු දැයි, අටළොස්දෙනෙක් වෙත්;—මොහු ස්වභාවධාරණාද්‍යර්ථයෙන් ධාතු නම් වූහු.

(කියනලද මැයි;—

"විදහන්ති විධානව ධීයතෙ ච විධීයතෙ,
එතාය ධීයතෙ එත්ථ ඉති වා ධාතුසම්මුති;
සරීරසෙසා'වා'වයවා ධාතුයො විය ධාතුයො"-යි.)

**ආර්‍ය්‍යසත්‍යයෝ** දුඃඛාර්‍ය්‍යසත්‍යය ද, දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යය ද, දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍යය ද, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය දැයි, සතරදෙනෙක් වෙත්.

(මෙහි සත්‍යාර්ථ මෙසේ දතයුතු;—

"නා'බාධකං යතො දුක්ඛං දුක්ඛා අඤ්ඤං න බාධකං,
බාධකත්තනියාමෙන තතො සච්චමිදං මතං.

තං විනා නා'ඤ්ඤතො දුක්ඛං න හොති න ච තං තතො,
දුක්ඛහෙතුනියාමෙන ඉති සච්චං විසත්තිකා.

නා'ඤ්ඤා නිබ්බාණතො සන්ති සන්තං න ච න තං තතො,
සන්තභාවනියාමෙන තතො සච්චමිදං මතං.

මග්ගා අඤ්ඤං න නිය්‍යානං අනිය්‍යානො න චා'පි සො,
තච්ඡනිය්‍යානභාවත්තා ඉති සො සච්චසම්මතො.

ඉති තච්ඡා'විපල්ලාසභූතභාවං චතූස්වපි,
දුක්ඛාදීස්වවිසෙසෙන සච්චට්ඨං ආහු පණ්ඩිතා"—ටී.)

මේ සර්වසඞ්ග්‍රහයෙහි වනාහි චෛතසිකයන්ගේ ද සොළොස් සූක්ෂ්මරූපයන්ගේ ද නිර්වාණයාගේ ද වශයෙන් එකුන් සැත්තෑධර්මයෝ ධර්මායතනයයි ද, ධර්මධාතුයයි ද, ව්‍යවහාරයට යෙත්;— මනායතනය ම සප්තවිඥානධාතුවශයෙන් භේදයට පැමිණෙන්නේයි.

(මේ කියනලද මැයි;)—

[රූපඤ්ච වෙදනා සඤ්ඤා සෙසා චෙතසිකා තථා,
විඤ්ඤාණමිති පඤ්චෙතෙ පඤ්චක්ඛන්ධා'ති භාසිතා.

පඤ්චුපාදානක්ඛන්ධා 'ති තථා තෙභූමකා මතා,
භෙදා'භාවෙන නිබ්බාණං ඛන්ධසඞ්ගහනිස්සටං.]

රූපය ද, වේදනාව ද, සංඥාව ද, වේදනා-සංඥා දෙකින් අවශේෂවූ පනස් චෛතසිකයෝ ද, එසේ ම විඥානය ද, යන මොහු පස්දෙන පඤ්චස්කන්ධයහයි කියනලදහු;-එසේ ම පඤ්චඋපාදානස්කන්ධයහ යි කියා ත්‍රෛභූමකධර්මයෝ දක්නාලදහ; නිර්වාණය අතීතාදි භේදයක් නැතිහෙයින් ස්කන්ධසඞ්ග්‍රහයෙන් වෙන් කරණලදී.

[ද්වාරා'ලම්බනභෙදෙන භවන්තා'යතනානි ච,
ද්වාරා'ලම්බ-තදුප්පන්නපරියායෙන ධාතුයො.]

ෂඩ්ද්වාරයන්ගේ ද ෂඩාලම්බනයන්ගේ ද භේදහෙයින් ද්වාදශවිධ ආයතනයෝ ද වන්නාහ; ෂඩ්විධ ද්වාරයන්ගේ ද ෂඩාලම්බනයන්ගේ ද ඒ ද්වාරා'ලම්බනදෙදෙනා නිසා උපන් ෂඩ්විධවිඥානයන්ගේ ද ක්‍රමයෙන් අටළොස් ධාතුහු වෙත්.

[දුක්ඛං තෙභූමකං වට්ටං, තණ්හා සමුදයො භවෙ,
නිරොධො නාම නිබ්බාණං, මග්ගො ලොකුත්තරො මතො ]

ත්‍රෛභූමකවෘත්තය දුඃඛසත්‍ය නම් වේයි; අෂ්ටොත්තරශත භේදවූ තෘෂ්ණාතොමෝ සමුදයසත්‍ය නම් වේයි; මාර්ගඵලා'ලම්බනිකවූ අසංස්කෘතධර්මයතෙම නිරොධසත්‍ය නම් වේයි; නිරොධගාමිනීප්‍රතිපදානාමයෙන් කියනලද්දාවූ මාර්ගයතෙම ලොකොත්තර

මාර්ගයයි දන්නාලදී;—දුඃඛයට හෙතුවූ සෙසු ධර්මයන් ඇතිකල් හිඳු තෘෂ්ණාව සමුදයසත්‍යයයි කුමක්පිණිස කියනලද ද යත්?—ඒ ප්‍රධානකාරණහෙයින් කියනලදී; එසේ මැයි, කර්මවිචිත්‍රතාවට හෙතුබැවින් ද කර්මයාගේ සහායභාවොපගමනයෙන් ද දුඃඛවිචිත්‍රයට කාරණබැවින් තෘෂ්ණාව දුඃඛයට විශෙෂකාරණයි.

[මග්ගයුත්තා ඵලචෙව චතුසච්චවිනිස්සටා,
ඉති පඤ්චප්පභෙදෙන පවුත්තො සබ්බසඞ්ගහො.]

මාර්ගසම්ප්‍රයුක්ත ස්පර්ශාදිධර්මයෝ ද සම්ප්‍රයුක්තධර්මයන් සහිතවූ චතුර්විධඵලය ද යන මොහු චතුස්සත්‍යයෙන් වෙන් කරණලද හුයි; මේ උක්තක්‍රමයෙන් පඤ්චස්කන්ධාදිවූ පඤ්චප්‍රකාරයෙන් සර්වධර්මයන්ගේ සඞ්ග්‍රහය කියනලදී.

**(සමුච්චයසඞ්ග්‍රහවිභාග නම්වූ සත්වන පරිච්ඡෙදය නිමි.)**

දැන් යථොක්ත නාම-රූපධර්මයන්ගේ ප්‍රතීත්‍යසමුත්පාදනය-ප්‍රස්ථානනයවශයෙන් ප්‍රත්‍යයන් දක්වනුපිණිස "යෙසං" යනාදී කියනලදී.

[යෙසං සඞ්ඛතධම්මානං යෙ ධම්මා පච්චයා යථා,
තංවිභාගමිහෙ'දානි පවක්ඛාමි යථා'රහං.]

ප්‍රත්‍යයන්විසින් කරණලදහෙයින් සංස්කෘත නම්වූ ප්‍රත්‍යයසමුත්පන්නධර්මකෙනෙක්නට යම් ප්‍රත්‍යයධර්මකෙනෙක් සහජාතො'පනිශ්‍රයාදී යම් ආකාරයෙකින් ස්ථිතියට ද උත්පත්තියට ද ප්‍රත්‍යයවෙද්ද, ඒ ප්‍රත්‍යයධර්මයන්ගේ ප්‍රත්‍යයවන ආකාරවිභාග මේ සමුච්චයසඞ්ග්‍රහා'නන්තරස්ථානයෙහි සුදුසු සුදුසු පරිද්දෙන් දැන් කියමි.

ප්‍රතීත්‍යසමුත්පාදනයය, ප්‍රස්ථානනයයයි, ප්‍රත්‍යයසඞ්ග්‍රහය දෙපරිද්දෙකින් දතයුත්තේයි.

(එහි ප්‍රත්‍යයාර්ථ මෙසේ දතයුතු,)—

"පටිච්ච පන එතස්මා ඵලමෙති'ති පච්චයො,
සම්භවො පභවො හෙතු කාරණං පච්චයො මතො.
යො ධම්මො යස්ස ධම්මස්ස ඨිත්‍යු'ප්පත්තියා'පි ච,
උපකාරකො හි සො තස්ස පච්චයො'ති පවුච්චති"—යි.

ඒ ප්‍රතීත්‍යසමුත්පාදය ප්‍රස්ථානය යන නයවශයෙහි,—ඒ ප්‍රත්‍යයධර්මයාගේ භාවයෙහි වනසුලුවූ ප්‍රත්‍යයසමුත්පන්නයාගේ වීමයයි යන ආකාරමාත්‍රයෙන් උපලක්ෂිතවූයේ **ප්‍රතීත්‍යසමුත්පාදනය** නම් වේ;—**ප්‍රස්ථානනය** වනාහි වෙසෙසා ප්‍රත්‍යයසංඛ්‍යාතකාරණය නිසා කියනුලැබේ;—ප්‍රතීත්‍යසමුත්පාදනය-ප්‍රස්ථානනය යන දෙක වනාහි ප්‍රස්ථානනය ද ප්‍රතීත්‍යසමුත්පාදනයෙහි ම බහා තබාලා තබ්භාවභාවී භාවයෙන් ද හෙත්වාදි ප්‍රත්‍යයවශයෙන් ද මිශ්‍රකොට සඞ්ග්‍රහකාරාදි ආචාර්යවරයෝ විස්තර කෙරෙත්, අපි වනාහි වෙන් වෙන් කොට දක්වම්හ යනු අභිප්‍රායයි.

ඒ ප්‍රත්‍යයාධිකාරයෙහි අවිද්‍යාප්‍රත්‍යයෙන්, හෙවත්—අවිද්‍යාව කරණකොට ගෙණ ලෞකිකකුශලා'කුශලචේතනාවෝ වෙත්;—මෙහි—"අවිජ්ජාපච්චයා සංඛාරා" යනාදි පාඨයෙහි මත්තෙහි "සම්භවන්ති" යන්නු අධ්‍යාහාර කොට යෙදියයුතුයි;—සංස්කාරප්‍රත්‍යයෙන් ප්‍රතිසන්ධිවශයෙන් එකුන්විසිවැදෑරුම්වූ ප්‍රවෘත්තිවශයෙන් දෙතිස්වැදෑරුම්වූ විපාකවිඥානය වේ;—විඥානප්‍රත්‍යයෙන් වේදනාදි ස්කන්ධත්‍රය සංඛ්‍යාත නාමය ද, භූතෝ'පාදායභෙදහෙයින් විප්‍රකාරවූ කර්මජරූපය ද වෙයි;—නාම-රූපප්‍රත්‍යයෙන් චක්ෂුරාදි ෂඩ්විධ ආධ්‍යාත්මිකආයතනය වෙයි;—ෂඩායතනප්‍රත්‍යයෙන් චක්ෂුඃසංස්පර්ශාදිවශයෙන් ෂඩ්වාරිකවූ ස්පර්ශය වෙයි;—ස්පර්ශප්‍රත්‍යයෙන් සුඛ-දුඃඛ-උපෙක්ෂාවශයෙන් ත්‍රිවිධවූ වේදනාව වෙයි;—වේදනාප්‍රත්‍යයෙන් කාමතෘෂ්ණාදිවශයෙන් ත්‍රිවිධවූ ෂඩාලම්බනාදිවශයෙන් අෂ්ටෝත්තරශතප්‍රභෙද තෘෂ්ණා වෙයි;—තෘෂ්ණාප්‍රත්‍යයෙන් කාමූපාදානාදිවශයෙන් චතුර්විධවූ උපාදාන වෙයි;—උපාදානප්‍රත්‍යයෙන් නවවිධවූ උත්පත්තිභව වන්නේය;—කර්මභවප්‍රත්‍යයෙන් ස්කන්ධයන්ගේ පහළවීම වෙයි;—ජාතිප්‍රත්‍යයෙන් ජරා-මරණද, ශෝක-පරිදෙව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාශය යන මොහු වෙත්;—මේ යථෝක්තවූ ප්‍රත්‍යයපරම්පරාවශයෙන් ම සුඛාදීන් අමිශ්‍රවූ, නොහොත්—සියලු මේ වෘත්තදුඃඛසංඛ්‍යාතවූ දුඃඛයාගේ උත්පත්තිය වෙයි;—ඊශ්වරනිර්මාණාදිවශයෙන් උත්පත්තිය නොවෙයි යන්නු අභිප්‍රායයි.

මෙහි,—අවිද්‍යානුශයෙන් යුක්තවූ සන්තානයෙහි කුශලා'කුශලයන් විපාකදානස්වභාවයෙන් පවත්නාහෙයින් **අවිද්‍යාව** හෙතු කොට ගෙණ **සංස්කාරයෝ** උපදිති.

ප්‍රතිසන්ධිවිඥානය ද සංස්කාරයන්විසින් උපදවනලද්දුව විපාකභවයෙහි පිහිටන්නේය; එසේ මැයි, ජනකවූ කුශලා'කුශලයන් නැතිකල්හි ඒ විපාකවිඥානයාගේ උත්පත්තිය නොවන්නේය; එසේහෙයින් සංස්කාරයන් හෙතු කොට ගෙණ **ප්‍රතිසන්ධිවිඥානය** වන්නේය.

නාම-රූපය ද පූර්වඞ්ගමත්වයෙන් පිහිටවූ විඥානයාවිසින් පිටිවහල් ලදින් ප්‍රතිසන්ධි-ප්‍රවෘත්තිදෙක්හි පිහිටානුයි විඥානය හෙතු කොට ගෙණ **නාම-රූප**දෙක වන්නේය.

ෂඩායතනය ද නාම-රූපදෙක උපනිශ්‍රය කොට ඇත්තේ ම ෂඩ්විධවූ චක්ෂුඃස්පර්ශයට වාරත්වයෙන් සුදුසු පරිද්දෙන් ම පවතිනුයි නාම-රූපය හෙතු කොට ගෙණ **ෂඩායතනය** වෙයි.

ස්පර්ශය ද ෂඩායතනයන්ගේ සම්භවයක් ඇතිකල්හි ම ආලම්බනස්පර්ශය කරන්නේය; වාරයාගේ අසම්භවයෙහි ස්පර්ශයාගේ උත්පත්තිය නැත්තුයි ෂඩායතනය හෙතු කොට ගෙණ **ස්පර්ශය** වන්නේය.

ඉෂ්ටා'නිෂ්ට-මධ්‍යස්ථාලම්බනයෝ ස්පර්ශකරන්නාහු ම සුඛාදිවේදනාව අනුභව කෙරෙති; අනික් ලෙසක අනුභව නොකෙරෙත්තුයි ස්පර්ශප්‍රත්‍යයෙන් ම **වේදනාව** වෙයි.

අනුභව කටයුතුවූ ධර්මයන්කෙරෙහි ආස්වාදවශයෙන් බලන්නාහට වෙදනාව හෙතු කොට ගෙණ ම තෘෂ්ණාව උපදිනුයි වෙදනාප්‍රත්‍යයෙන් ම **තෘෂ්ණාව** වෙයි.

තෘෂ්ණානැමති සොනහයෙන් පිපාසිතවූ සත්ත්වයෝ ම උපාදානයන්ට හිතවූ ධර්මයන්කෙරෙහි උපාදානයන්ගේ දෘඪත්වයපිණිස පවත්නාහුයි; එසේ මැයි, තෘෂ්ණාව හෙතු කොට ගෙණ රූපාදීන් ආස්වාද කොට කාමයන් අනුභව කටයුතුබවට පැමිණේනුයි තෘෂ්ණාව කාමොපාදානයට ප්‍රත්‍යය වේ;—එසේ ම රූපාදිප්‍රභෙද ඇත්තාවූ ෂඩාලම්බනයෙහි ගිජුවූ සත්ත්වතෙම "නත්ථි දින්නං" යනාදීන් මිථ්‍යාදශ්නය ද, සංසාරයෙන් මිදෙනු කැමැත්තේ නිර්වාණප්‍රාපක නොවූ අශුද්ධිමාර්ගයෙහි දෘඪග්‍රහණය ද, පඤ්චස්කන්ධයෙන් ආත්ම-ආත්මීය ග්‍රහණවශයෙන් ප්‍රවෘත්තවූ ආත්මවාදදශ්නය ද, ගන්නේය; එසේ හෙයින් දෘෂ්ට්‍යුපාදානාදීන්ට ද ප්‍රත්‍යය වේනුයි තෘෂ්ණාප්‍රත්‍යයෙන් ම **උපාදානය** වේ.

සම්ප්‍රයොග-අනුශයවශයෙන් සුදුසු සුදුසු පරිද්දෙන් උපාදානයන්කෙරෙහි පිහිටියාවූ ම සත්ත්වයෝ කර්මයාගේ රාශිකරණයපිණිස පවතිත්නුයි උපාදානය ම **භවයට** ප්‍රත්‍යය වේ.

උත්පත්තිභවසංඛ්‍යාත ජාතිතොමෝ බීජයෙන් අඞ්කුරොත්පත්තිය මෙන් කර්මභවය හෙතු කොට ඇත්තී ම ඒ ඒ භවයෙහි ලැබේනුයි භවය ම **ජාතියට** ප්‍රත්‍යය වේ.

ජාතිය ඇතිකල්හි ජරා-මරණදෙදෙනාගේ සම්භවය වන්නේය, ජාතිරහිතයන්ට ජරාවෙක් වත් මරණයෙක් වත් නොවෙත්නුයි ජාතිතොම **ජරා-මරණයන්** දෙදෙනාට ප්‍රත්‍යය වේනුයි; මෙසේ අවිද්‍යාදි ප්‍රත්‍යයන් හා ප්‍රත්‍යයසමුත්පන්නයන්ගේ තද්භාවභාවීභාව දතයුත්තේයි;—මෙහි වස්ත්වා'ලම්බනාදී ප්‍රත්‍යයාන්තරයක් ඇතිකල්හිදු අවිද්‍යාදිවූ එකෙකි ප්‍රත්‍යයන්ගේ කිම ප්‍රධානභාවයෙන් ද ප්‍රකටභාවයෙන් දැයි දතයුතු.

**මේ ප්‍රත්‍යයසඞ්ග්‍රහාධිකාරයෙහි මේතෙම**
**ප්‍රතීත්‍යසමුත්පාදනයයි.**

---

ඒ ප්‍රතීත්‍යසමුත්පාදනයෙහි අතීතාදිකාලහෙයින් තුන් අධ්වයෝ ද, අවිද්‍යාදිවූ ද්වාදශාඞ්ගයෝ ද, එම අඞ්ගයන් සම්බන්ධිවූ විංශතිආකාරයෝ ද, හෙතු-ඵලයන්ගේ සන්ධානවශයෙන් ත්‍රිසන්ධිය ද, එම සන්ධීන්ගේ ආද්‍යන්තවශයෙන් ව්‍යවස්ථිතවූ සතරකොට්ඨාසයෝ ද, ක්ලෙශ-කර්ම-විපාකවශයෙන් ත්‍රිවිධවූ වෘත්තයෝ ද, පූර්වාන්ත-අපරාන්තමූලහෙයින් මූලයෝ දෙදෙන ද, දතයුත්තාහුයි.

ඒ අධ්වාදීන්අතුරෙහි අවිද්‍යා-සංස්කාරයෝ අතීතභවපර්යාපන්නාහෙතුන්ගේ ම මෙහි ග්‍රහණයහෙයින් අතීතඅධ්ව නම් වෙති;—මෙහි අධ්වග්‍රහණයෙන් අවිද්‍යාදිකර්මයන්කෙරෙන් විනිර්මුක්තවූ කිසිකාලයන්නු

නොලැබෙනහෙයින් අවිද්‍යාදිකර්මයන්ගේ ම ග්‍රහණයයි, එසේ මැයි, නිරුද්ධවූ අනුත්පන්නවූ ද ධර්මයෝ අතීතා'නාගතකාලහෙයින් ද උත්පාදාදි ක්‍ෂණත්‍රයපර්යාපන්නවූ ධර්මයෝ වර්තමානකාලවශයෙන් ද ව්‍යවහාර කරණුලැබෙත්;—ජාති-ජරා-මරණය වර්තමානහේතුයෙන් අනාගතයෙහි උපදනාහෙයින් අනාගතඅද්ධා නම් වේ;—අතීත-අනාගත දෙදෙනාගේ මධ්‍යයෙහි විඥානාදි අෂ්ටාංගයෝ අතීතහේතුයෙන් මෙහි උපදනා ඵලස්වභාවය ඇතිබැවින් අනාගතඵලයට මෙහි හේතුස්වභාව ඇතිබැවින් ද ප්‍රත්‍යුත්පන්නඅද්ධා නම් වෙයි, කියා **අද්ධායෝ** තුන්දෙනෙක් වෙත්.

| | | |
|---|---|---|
| 1-අවිද්‍යාය, | 5-ෂඩායතනය, | 9-උපාදානය, |
| 2-සංස්කාරය, | 6-ස්පර්ශය, | 10-භවය, |
| 3-විඥානය, | 7-වේදනාය, | 11-ජාතිය, |
| 4-නාම-රූපය, | 8-තෘෂ්ණාය, | 12-ජරා-මරණයයි, |

කියා **අංගයෝ** දොළොසෙක් වෙත්;—මේ අවිද්‍යාදීන්කෙරෙහි ශෝක-පරිදේවාදිවචනය වනාහි ජාතියගේ අමුඛ්‍යඵල දැක්වීමයි, එහෙයින් ම ශෝකාදිය අංගයන්කෙරෙහි නොකියනලද්දැයි දතයුතු.

අවිද්‍යා-සංස්කාරග්‍රහණයෙන් තෘෂ්ණා-උපාදාන-භව යන මොහු ද ගන්නාලද්දාහු වෙත්; මෙහි අවිද්‍යාග්‍රහණයෙන් ක්ලේශසාමාන්‍යයෙන් තෘෂ්ණා-උපාදාන යන මොහු ගන්නාලදහ; සංස්කාරග්‍රහණයෙන් කර්මවෘත්තසාමාන්‍යයෙන් කර්මභවය ගන්නාලදැයි දතයුතු;-තෘෂ්ණා-උපාදාන-භවග්‍රහණයෙන් අවිද්‍යා-සංස්කාර යන මොහු එසේ ම ගන්නාලදහු; මෙහි තෘෂ්ණා-උපාදානග්‍රහණයෙන් අවිද්‍යා ද ගන්නාලද, අවිද්‍යාවගේ අභාවයෙහි තෘෂ්ණා-උපාදාන යන මොවුන්ගේ අසම්භවය වනහෙයිනි; භවග්‍රහණයෙන් ද සංස්කාරයෝ ද ගන්නාලදහ, සංස්කාරයන්ගේ අභාවයෙහි කර්මෝපචයලක්‍ෂණවූ ම භවයාගේ සම්භවයෙක් නැතිහෙයිනැයි දතයුතු;—ජාති-ජරා-මරණයෙන් ද විඥාන-නාමරූප-ෂඩායතන-ස්පර්ශ-වේදනාවන්ගේ වශයෙන් විඥානාදි ඵලපඤ්චකය ම ගන්නාලදැයි කියායි, මෙහි විඥාන-නාමරූප-ෂඩායතන-ස්පර්ශ-වේදනා යන මොවුන්ගේ ජාති-ජරා-භඞ්ගයෝ ම ජාති-ජරා-මරණයයි කියනලදහු තුයි "ජාති-ජරා-මරණයෙන් ද" යනාදි කීහු.

(මෙම කීහ);—

[අතීතෙ හෙතවො පඤ්ච, ඉදානි ඵලපඤ්චකං,
ඉදානි හෙතවො පඤ්ච, ආයතිං ඵලපඤ්චකං.]

ස්වරූපහෙයින් කියනලද්දාවූ අවිද්‍යා-සංස්කාර දෙදෙනාගේ ද සංග්‍රහවශයෙන් කියනලද්දාවූ තෘෂ්ණා-උපාදාන-භව යන තුන්දෙනාගේ ද වශයෙන් වර්තමානඵලයට ප්‍රත්‍යයහෙයින් අතීතභවයෙහි නිර්වෘත්තවූ හේතුහු පස්දෙනය, අතීතහේතුප්‍රත්‍යයෙන් දැන් වර්තමානභවයෙහි නිර්වෘත්තවූ විඥානාදී ඵලපඤ්චකය, ස්වරූපහෙයින් කියන

ලද්දාවූ තෘෂ්ණාදි තුන්දෙනාගේ ද සඞ්ග්‍රහවශයෙන් ගන්නාලද්දාවූ අවිද්‍යා-සංස්කාර දෙදෙනාගේ ද වශයෙන් ආයතිඵලයට ප්‍රත්‍යයහෙයින් වර්තමානභවයෙහි නිර්වෘත්තවූ හෙතුහු පස්දෙනාය, ජාති-ජරා-මරණ ග්‍රහණයෙන් කියනලද විඥානාදිඵලපඤ්චකය, වර්තමානහෙතු ප්‍රත්‍යයෙන් අනාගතභවයෙහි උපදනාවූ ඵලපඤ්චකයයි; මෙසේ අතීත හෙත්වාදිවූ විංශතිප්‍රකාරයෝ ද, හෙතු-ඵලාදීන්ගේ අනන්තරවශයෙන් ත්‍රිසන්ධි ද, අතීතහෙත්වාදි සතරකොට්ඨාසයෝ ද, වන්නාහුයි.

මෙහි **ආකාරයෝ** නම් අතීතයෙහිවූ අවිද්‍යා-සංස්කාර-තෘෂ්ණා-උපාදාන-භව යන මේ හෙතුපස ද, වර්තමානයෙහිවූ විඥාන-නාම රූප-ෂඩායතන-ස්පර්ශ-වෙදනා යන මේ ඵලපස ද, වර්තමානයෙහි වූ තෘෂ්ණා-උපාදාන-භව-අවිද්‍යා-සංස්කාර යන මේ හෙතුපස ද, මතු භවයෙහි උපදනාවූ විඥාන-නාමරූප-ෂඩායතන-ස්පර්ශ-වෙදනා යන මේ ඵලපස ද, යන මේ විස්සයි.

මෙහි **සන්ධි** නම් අතීතහෙතූන්ගේ ද වර්තමානඵලපඤ්චකයාගේ ද අතුර එක් සන්ධියෙක; වර්තමානඵලපඤ්චකයාගේ ද වර්තමානහෙතූන්ගේ ද අතුර එක් සන්ධියෙක; වර්තමානහෙතූන්ගේ ද ආයතිඵලපඤ්චකයාගේ ද අතුර එක් සන්ධියෙකැයි දතයුතු.

මෙහි **සංක්ෂෙප** නම් අතීතහෙතුය, වර්තමානවිපාකය, වර්තමානහෙතුය, ආයතිවිපාකයයි, චතුර්විධ වේ.

අවිද්‍යා ද තෘෂ්ණා-උපාදාන යන මොහු ද ක්ලෙශවෘත්තය; කර්ම්මභවයයි කියනලද භවයාගේ එකදෙශය ද සංස්කාරයෝ ද කර්ම්මවෘත්තය; උත්පත්තිභවයයි කියනලද භවයාගේ එකදෙශය ද විඥානාදි පඤ්චක-ජාති-ජරාමරණවශයෙන් සප්තප්‍රකාරවූ අවශෙෂයෝ ද විපාකවෘත්තයයි; **වෘත්තයෝ** තුන්දෙනෙක් වෙත්.

අවිද්‍යා-තෘෂ්ණාවන්ගේ වශයෙන් **මූලයෝ** දෙදෙනෙක් දතයුත්තාහුයි;—මෙහි—අවිද්‍යාව පූර්වාන්තයට මූලය; තෘෂ්ණාව අපරාන්තයට මූලයි.

(එසේ මැයි)—

[තෙසමෙව ච මූලානං නිරොධෙන නිරුජ්ඣති,
ජරා-මරණමුච්ඡාය පීළිතානමභිණ්හසො;
ආසවානං සමුප්පාදා අවිජ්ජා ච පවත්තති.]

එම අවිද්‍යා-තෘෂ්ණාසංඛ්‍යාතවූ වෘත්තමූලයන්ගේ සත්‍යප්‍රතිවෙධයෙන් සිද්ධවූ අප්‍රවෘත්තියෙන් වෘත්තය නිරුද්ධ වන්නේය; නිරන්තරයෙන් ජරා-මරණසංඛ්‍යාතවූ මූර්ච්ඡාවෙන් ශොකාදීන් පීඩිතවූ සත්වයන්ට කාමාශ්‍රවාදී ආශ්‍රවයන්ගේ උත්පත්තිය හෙතු කොට ගෙණ නැවත අවිද්‍යා ද වඩනීයි.

[වට්ටමාබන්ධමිච්චෙවං තෙභූමකමනාදිකං,
පටිච්චසමුප්පාදො'ති පට්ඨපෙසි මහාමුනි.]

මේ උක්තප්‍රකාරයෙන් අවිච්ඡින්නවූ ආදිරහිතවූ ත්‍රිභූමිකපයඹා-පන්නහෙයින් ත්‍රෛභූමකවූ ක්ලේශ-කර්ම-විපාකවශයෙන් ත්‍රිවිධවූ වෘත්තය ප්‍රතීත්‍යසමුත්පාදයයි සම්‍යක්සම්බුද්ධතෙම පැණවී.

---

මෙසේ ප්‍රතීත්‍යසමුත්පාදනය විභාගවශයෙන් දක්වා දැන් ප්‍රස්ථානනය දක්වනු පිණිස "හෙතුප්‍රත්‍යය" යනාදී කියනලදී.

| | | |
|---|---|---|
| 1-හෙතුප්‍රත්‍යය, | 9-උපනිශ්‍රයප්‍රත්‍යය, | 17-ධ්‍යානප්‍රත්‍යය, |
| 2-ආරම්මණප්‍රත්‍යය, | 10-පුරෙජාතප්‍රත්‍යය, | 18-මාර්ගප්‍රත්‍යය, |
| 3-අධිපතිප්‍රත්‍යය, | 11-පශ්චාජ්ජාතප්‍රත්‍යය, | 19-සම්ප්‍රයුක්තප්‍රත්‍යය, |
| 4-අනන්තරප්‍රත්‍යය, | 12-ආසෙවනප්‍රත්‍යය, | 20-විප්‍රයුක්තප්‍රත්‍යය, |
| 5-සමනන්තරප්‍රත්‍යය, | 13-කර්මප්‍රත්‍යය, | 21-අස්තිප්‍රත්‍යය, |
| 6-සහජාතප්‍රත්‍යය, | 14-විපාකප්‍රත්‍යය, | 22-නාස්තිප්‍රත්‍යය, |
| 7-අන්‍යොන්‍යප්‍රත්‍යය, | 15-ආහාරප්‍රත්‍යය, | 23-විගතප්‍රත්‍යය, |
| 8-නිශ්‍රයප්‍රත්‍යය, | 16-ඉන්ද්‍රියප්‍රත්‍යය, | 24-අවිගතප්‍රත්‍යයයි; |

මේ ප්‍රත්‍යයසඞ්ග්‍රහවිභාගයෙහි මෙතෙම ප්‍රස්ථානපාඨයි.

ඒ ප්‍රස්ථානාධිකාරයෙහි,—

[ඡධා නාමං තු නාමස්ස, පඤ්චධා නාම-රූපිනං,
එකධා පුන රූපස්ස, රූපං නාමස්ස චෙකධා,
පඤ්ඤත්ති නාම-රූපානි නාමස්ස දුවිධා, ද්වයං
ද්වයස්ස නවධා චෙති, ඡබ්බිධා පච්චයා—කථං?]

වෙදනාදි චතුඃස්කන්ධ-නිර්වාණසංඛ්‍යාතනාමය වනාහි එසේම වූ නාමයට ෂට්ප්‍රකාරයකින් ප්‍රත්‍යය වේ; ඒ(නාමය)නාම-රූපයන්ට පස් පරිද්දෙකින් ප්‍රත්‍යය වෙයි; රූපයහට වනාහි එක්පරිද්දෙකින් ප්‍රත්‍යය වෙයි; රූපයතෙම නාමයහට ද එක්පරිද්දෙකින් ප්‍රත්‍යය වේ.

ප්‍රඥප්ති-නාම-රූපයෝ නාමයාහට දෙපරිද්දෙකින් ප්‍රත්‍යය වෙති; නාම-රූපද්වය නාම-රූපද්වයට නවප්‍රකාරයකින් ප්‍රත්‍යය වෙති සී; ප්‍රත්‍යයෝ ෂට්ප්‍රකාරවෙති—හේ කෙසේද?

අනන්තරනිරුද්ධවූ චිත්ත-චෛතසිකධර්මයෝ වර්ත්තමානවූ චිත්ත-චෛතසිකධර්මයන්ට අනන්තර-සමනන්තර-නාස්ති-විගතප්‍රත්‍යයවශයෙන් ද, පූර්වකොට උපන් ජවනයෝ පශ්චිම්වූ ජවනයන්ට ආසෙවනප්‍රත්‍යයවශයෙන් ද, සහජාතවූ චිත්ත-චෛතසිකධර්මයෝ ඔවුනොවුන්ට සම්ප්‍රයුක්තප්‍රත්‍යයවශයෙන් දැයි, ෂට්ප්‍රකාරයෙකින් නාමයතෙම නාමයහට ම ප්‍රත්‍යය වේ.

හෙතු-ධ්‍යාන-මාර්ගාඞ්ග යන මොහු සහජාතවූ නාම-රූපයන්ට හෙත්වාදිවශයෙන් ද, හෙවත්—හෙතුප්‍රත්‍යය-ධ්‍යානප්‍රත්‍යය-මාර්ගප්‍රත්‍යයවශයෙන් ද, සහජාතවූ චෙතනාතොමෝ සහජාතවූ නාම-රූපයන්ට ද අතීතවූ නානාක්ෂණයෙහි සිද්ධවූ කුශලා'කුශලචෙතනාවෝ කර්මයෙන් නිර්වෘත්තවූ නාම-රූපධර්මයන්ට ද කර්මප්‍රත්‍යයවශයෙන් ද, ප්‍රතිසන්ධිවිඥානාදි විපාකස්කන්ධයෝ ඔවුනොවුන්ට ද සහජාතවූ

රූපධර්මයන්ට ද විපාකප්‍රත්‍යයවශයෙන් දැයි, පස්පරිද්දෙකින් නාමය තෙම නාම-රූපයන්ට ප්‍රත්‍යය වේ.

පශ්චාජ්ජාතවූ චිත්ත-චෛතසිකධර්මයෝ ප්‍රත්‍යයධර්මයන්ගෙරෙන් පූර්වකොට උපන්නාවූ මේ රූපකායට පශ්චාජ්ජාතප්‍රත්‍යයවශයෙනැයි, එක්පරිද්දෙකින් නාමයතෙම රූපයට ප්‍රත්‍යය වේ.

ෂඩ්වස්තූහු ප්‍රවෘත්තියෙහි සප්තවිඥානධාතූන්ට ද රූපාදි පඤ්චාලම්බනයෝ පඤ්චවිඥානවීථියට ද පුරෙජාතප්‍රත්‍යයවශයෙනැයි, එක්පරිද්දෙකින් ම රූපයතෙම නාමයහට ප්‍රත්‍යය වේ.

ආලම්බනප්‍රත්‍යයවශයෙන් ද, උපනිශ්‍රයප්‍රත්‍යයවශයෙන් දැයි, දෙපරිද්දෙකින් ප්‍රඥප්ති-නාම-රූප යන මොහු නාමයහට ම ප්‍රත්‍යය වෙත්;—ඒ ආලම්බන-උපනිශ්‍රයප්‍රත්‍යයෙහි රූපාදිවශයෙන් ෂඩ්ප්‍රකාරවූ ආලම්බනය ආලම්බන නම් වේ.

උපනිශ්‍රය වනාහි ආලම්බනොපනිශ්‍රයය අනන්තරොපනිශ්‍රයය, ප්‍රකෘතූපනිශ්‍රයයයි කියා ද, ත්‍රිවිධ වේ; ඒ ත්‍රිවිධවූ උපනිශ්‍රයප්‍රත්‍යයන් අතුරෙහි රූපාදිආලම්බනය ම ගරුකොට හෙවත්—ප්‍රධානකොට සිතනලද්දේ ආලම්බනොපනිශ්‍රය නම් වේ; අනන්තරනිරුද්ධවූ චිත්ත-චෛතසිකධර්මයෝ අනන්තරොපනිශ්‍රය නම් වේ; රාගාදි ධර්මයෝ ද, ("ආදි" ශබ්දයෙන් ද්වේෂ-මෝහ-මාන-දෘෂ්ටි-ප්‍රාර්ථනා යන මෙතෙක්දෙනා සඞ්ග්‍රහකරණලදනු;) මෙකී රාග-ද්වේෂාදින් කරණකොට ගෙණ දන්දීම ද, සිල්සමාදන්වීම ද, පෙහෙවීම ද, ධ්‍යාන-විදර්ශනා ද, මාර්ග ද, අභිඥා ද, සමාපත්ති ද, උපදවනබැවින් ප්‍රාණඝාත-අදත්තාදාන-මෘෂාවාදාදි කොට ඒ ප්‍රාණඝාතාදින් සංසිද්ධවනුසඳහා දානාදි කුශල් කරණබැවිනුදු රාගාදින් උපනිශ්‍රය කොට කුශලාදි ධර්මයෝ උපදිත්; ශ්‍රද්ධාදි ධර්මයෝ ද, ("ආදි" ශබ්දයෙන් ශීල-ශ්‍රුත-ත්‍යාග-ප්‍රඥා යන මොවුන් ගත්හු;) විපාකා'ව්‍යාකෘතවූ කායිකසුඛය ද, එබඳු කායිකදුඃඛය ද, සනමිත්‍රාදි පුද්ගල ද, සත්ප්‍රායාදි භොජන ද, සත්ප්‍රායාදි ඍතු ද, එසේ ම වූ සෙනාසුන් ද, යන මේ සුදුසුපරිද්දෙන් රාගාදි-ශ්‍රද්ධාදි-සුඛ-දුඃඛවශයෙන් ආධ්‍යාත්මික වූයේ ද, පුද්ගල-භොජන-ඍතු-සයනා'සනවශයෙන් බාහ්‍යවූයේ ද, කුශලා'කුශලා'ව්‍යාකෘත ධර්මයන්ට ද, කුශලකර්මයතෙම ඒ විපාකයන්ට දැයි, බහුප්‍රකාරයෙන් ප්‍රකෘතූපනිශ්‍රය වේ.

අධිපතිප්‍රත්‍යය-සහජාතප්‍රත්‍යය-අන්‍යොන්‍යප්‍රත්‍යය-නිශ්‍රයප්‍රත්‍යය-ආහාරප්‍රත්‍යය-ඉන්ද්‍රියප්‍රත්‍යය-විප්‍රයුක්තප්‍රත්‍යය-අස්තිප්‍රත්‍යය-අවිගතප්‍රත්‍යයවශයෙනැයි, සුදුසු සුදුසු පරිද්දෙන් නවපරිද්දෙකින් නාම-රූපධර්මයෝ නාම-රූපධර්මයන්ට ප්‍රත්‍යය වෙත්.

ඒ අධිපතිප්‍රත්‍යයාදින් අතුරෙහි ප්‍රත්‍යවෙක්ෂාදිවශයෙන් ගරුකොට සිතනලද ආලම්බනය ආලම්බනා'ධිපතිප්‍රත්‍යයවශයෙන් නාමයන්ට ඡන්ද-චිත්ත-වීර්‍ය්‍ය-වීමංසාවශයෙන් චතුර්විධවූ සහජාතාධිපතිතෙම සහජාතනාම-රූපයන්ට චිත්තප්‍රවෘත්තියෙහි ම සහජාතා'ධිපතිවශයෙන් ප්‍රත්‍යය වන්නේයයි ද, අධිපතිප්‍රත්‍යයතෙම ද්විප්‍රකාර වේ.

චිත්ත-චෛතසිකධම්මයෝ ඔවුනොවුන්ට ද, සහජාතරූපයන්ට ද, පෘථිව්‍යාදි මහාභූතයෝ ඔවුනොවුන්ට ද, වර්ණාදි උපාදායරූපයන්ට ද, ප්‍රතිසන්ධික්ෂණයෙහි වස්තු-විපාකයෝ හෙවත්—හෘදයවස්තුව හා ප්‍රතිසන්ධිවිඥානාදිය යන ඔවුනොවුන්ට දැයි, සහජාතප්‍රත්‍යයතෙම ත්‍රිවිධ වන්නේයි.

චිත්ත-චෛතසිකධම්මයෝ ඔවුනොවුන්ට ද, මහාභූතයෝ ඔවුනොවුන්ට ද, ප්‍රතිසන්ධික්ෂණයෙහි හෘදයවස්තුව හා ප්‍රතිසන්ධිවිඥානාදිහු ඔවුනොවුන්ට දැයි, අන්‍යොන්‍යප්‍රත්‍යයතෙම ත්‍රිප්‍රකාර වේ.

චිත්ත-චෛතසිකධම්මයෝ ඔවුනොවුන්ට ද, සහජාතරූපයන්ට ද, මහාභූතයෝ ඔවුනොවුන්ට ද, උපාදායරූපයන්ට ද, ෂඩ්වස්තූහු සප්තවිඥානධාතූන්ට දැයි, නිශ්‍රයප්‍රත්‍යයතෙම ත්‍රිවිධ වේ.

කබලිඞ්කාරාහාරයතෙම මේ රූපකායට ද, ස්පර්ශාදි අරූපාහාරයෝ සහජාත නාම-රූපයන්ට දැයි, ආහාරප්‍රත්‍යයතෙම ද්විප්‍රකාර වේ.

ප්‍රසාදරූපයෝ පස්දෙන දෙපස් විඥානයන්ට ද, රූප-ජීවිතෙන්ද්‍රියය කම්මජරූපයන්ට ද, අරූපඉන්ද්‍රියයෝ සහජාතවූ නාම-රූපයන්ට දැයි, ඉන්ද්‍රියප්‍රත්‍යයතෙම ත්‍රිවිධ වේ.

ප්‍රතිසන්ධික්ෂණයෙහි හෘදයවස්තු-ප්‍රතිසන්ධිවිඥානාදීන්ට සහජාතප්‍රත්‍යයවශයෙන් ද චිත්ත-චෛතසිකධම්මයෝ සහජාතරූපයන්ට සහජාතප්‍රත්‍යයවශයෙන් ද, ප්‍රත්‍යයන්කෙරෙන් පූර්වයෙහි උපන්නාවූ මේ රූපකායට පශ්චාජ්ජාතප්‍රත්‍යයවශයෙන් ද, ෂඩ්වස්තූහු ප්‍රවෘත්තික්ෂණයෙහි සප්තවිඥානධාතූන්ට පුරෙජාතප්‍රත්‍යයවශයෙන් දැයි, විප්‍රයුක්තප්‍රත්‍යයතෙම ත්‍රිවිධ වේ.

(මේ කියනලද මැයි);—

[සහජාතං පුරෙජාතං පච්ඡාජාතඤ්ච සබ්බථා,
කබලිඞ්කාරෙ ආහාරෙ රූප-ජීවිතමිච්චයං;
පඤ්චවිධො හොති අත්ථිපච්චයො අවිගතපච්චයො ච.]

සර්වප්‍රකාරයෙන් සහජාතනාමවශයෙන් කියනලද ත්‍රිවිධවූ සහජාතය ද, ද්විවිධවූ පුරෙජාතය ද, එකවිධවූ පශ්චාජ්ජාතය ද, යන ප්‍රත්‍යයජාතය ද, චතුර්විධවූ ආහාරයන් අතුරෙහි කබලිඞ්කාරාහාරය ද, රූපජීවිතෙන්ද්‍රිය ද, යන මේ පඤ්චප්‍රකාරවූ ප්‍රත්‍යයතෙම අස්තිප්‍රත්‍යය ද, වෙයි; අවිගතප්‍රත්‍යයද වේ.

ආලම්බනප්‍රත්‍යය-උපනිශ්‍රයප්‍රත්‍යය-කම්මප්‍රත්‍යය-අස්ති ප්‍රත්‍යය යන මේ ප්‍රත්‍යයන් සතරදෙනාකෙරෙහි වනාහි සියලු ප්‍රත්‍යයෝ ම සඞ්ග්‍රහබවට යෙත්;—ඒ කෙසේ ද යත්?—සූවිසි ප්‍රත්‍යයන් අතුරෙහි අරමුණු නොවන ප්‍රත්‍යයක් නැතිබැවින් ආලම්බනප්‍රත්‍යයෙහි ම ඇතුළත් වෙති; තමතමන් වහලින් උපදනාවූන්ට උපනිශ්‍රය නොවන ප්‍රත්‍යයක් නැතිබැවින් උපනිශ්‍රයප්‍රත්‍යයෙහි ඇතුළත් වෙති; කර්මය ඉෂ්ටානිෂ්ට සියලු ප්‍රත්‍යය උපදවනබැවින් කම්මප්‍රත්‍යයෙහි ඇතුළත් වෙත්;—සියලු ප්‍රත්‍යයෝ ම පරමාර්ථයෙහින් ලොකසම්මුතිවශයෙන්

විද්‍යමානයෝ ම නුයි අස්තිප්‍රත්‍යයෙහි ඇතුළත් වෙත්;—සහජාතරූපය යන මෙහි වනාහි හැමතැන්හි ම ප්‍රවෘත්තික්ෂණයෙහි චිත්තජරූපයන්ගේ වශයෙන් ද ප්‍රතිසන්ධික්ෂණයෙහි කම්මජරූපයන්ගේ වශයෙන් ද ද්විප්‍රකාර වන්නේයයි දතයුත්තේයි.

(මේ කියනලද මැයි);—

[ඉති තෙකාලිකා ධම්මා කාලමුත්තා ච සම්භවා,
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච සඞ්ඛතා'සඞ්ඛතා තථා.

පඤ්ඤත්ති-නාම-රූපානං වසෙන තිවිධා ඨිතා,
පච්චයා නාම පට්ඨානෙ චතුවීසති සබ්බථා.]

මේ උක්තප්‍රකාරයෙන් ලැබෙන ලැබෙන පරිද්දෙන් අතීතා'නාගත වර්තමානවශයෙන් ත්‍රෛකාලිකවූ හෙවත්—අනන්තර-සමනන්තරා'සෙවනා'ස්ති-විගතප්‍රත්‍යයවශයෙන් පඤ්චවිධවූ අතීතකාලිකවූ ප්‍රත්‍යයන්ගේ ද, අතීත-වර්තමානකාලවශයෙන් ද්විකාලිකවූ කර්මප්‍රත්‍යයාගේ ද, ආලම්බනා'ධිපති-උපනිශ්‍රයප්‍රත්‍යයන්ගේ වශයෙන් ත්‍රෛකාලිකප්‍රත්‍යයන්ගේ ද, මෙකී ප්‍රත්‍යයන්කෙරෙන් අවශිෂ්ටවූ වර්තමානකාලිකවූ හේතුප්‍රත්‍යයාදී පසළොස් ප්‍රත්‍යයන්ගේ ද, වශයෙන් කාලත්‍රයක් ඇත්තාවූ ද, නිර්වාණ-ප්‍රඥප්තිවශයෙන් කාලවිනිර්මුක්තවූ ද, චක්ෂුරාදි-රාග-ශ්‍රද්ධාදිවශයෙන් ආධ්‍යාත්මිකවූ ද, පුද්ගල-ඍතු-භෝජනාදිවශයෙන් බාහ්‍යවූ ද, ප්‍රත්‍යයසමුත්පන්නබැවින් සංස්කෘතවූ ද, එසේ ම ප්‍රත්‍යයසමුත්පන්න නොවනබැවින් අසංස්කෘතවූ ද, ධර්මයෝ ප්‍රඥප්ති-නාම-රූප යන මොවුන්ගේ වශයෙන් සංක්ෂේපයෙන් ත්‍රිප්‍රකාරයෙන් සිටියාහු සර්වප්‍රකාරයෙන් අනන්තනය සමන්තපට්ඨානප්‍රකරණයෙහි සූවිස්සෙකැයි කියනලද ප්‍රත්‍යයෝ නම් වෙත්.

ඒ ප්‍රඥප්ති-නාම-රූප යන මොවුන් අතුරෙහි භූතොපාදායභේද සියලු රූපධර්මයෝ රූපස්කන්ධයයි ම කියනුලැබෙති; චිත්ත-චෛතසිකයයි කියනලද සතර අරූපස්කන්ධයෝ ද නිර්වාණය දැයි පඤ්චප්‍රකාරවූ මේ ධර්මය අරූපයයි කියා ද නාමයයි කියා ද කියනුලැබේ; ඒ නාම-රූපයන්ගෙන් අවශිෂ්ටවූ ප්‍රඥප්තිය වනාහි පණවනුලබන බව හෙයින් ප්‍රඥප්තියයි කියා ද පණවනහෙයින් ප්‍රඥප්තියයි කියා ද වාච්‍ය-වාචකභේදහෙයින් ද්විප්‍රකාර වේ.

මෙහි (අභි-40-පිටේ-15-පෙළ.)"පඤ්ඤපියන්තා" යන්නෙන් "ප්‍රඥප්ති" ශබ්දයා කර්මසාධනබව දක්වූහු; "පඤ්ඤපනතො" යන්නෙන් "ප්‍රඥප්ති" ශබ්දය කර්තෘසාධනබව දක්වූහු; මෙහි කර්මසාධන "ප්‍රඥප්ති" ශබ්දයෙන් රූපාදිධර්මයන්ගේ සමූහ-සන්තානාදි අවස්ථාවිශේෂාදිභේද ඇති සංවෘතිසත්‍ය නම්වූ උපාදාප්‍රඥප්තිසංඛ්‍යාත අර්ථප්‍රඥප්ති දර්ශිතය; කර්තෘසාධන "ප්‍රඥප්ති" ශබ්දයෙන් සංවෘති-පරමාර්ථධර්මයන්ගේ අභිධානයයි කියනලද නාමප්‍රඥප්තිය උක්තයයි දතයුතු.

ඒ විප්‍රකාරවූ ප්‍රඥප්තිය කෙසේ ද යත්?—ප්‍රබන්ධවශයෙන් පවත්නා පෘථිව්‍යාදිමහාභූතයන්ගේ පත්ථට-සංඝතාදිභෙද ඇති ඒ ඒ පරිනාමාකාරය නිසා භූමිය පර්වතය වෘක්‍ෂය කොශය ලොමය යනාදීන් ඒ ඒ ප්‍රකාරයෙන් ප්‍රඥප්තවූ භූමි-පර්වතාදිවූ සන්තානප්‍රඥප්තිය ද, (යම් ප්‍රඥප්තියෙක් තීර්ථකයන්විසින් ගුණිද්‍රව්‍යයයි කල්පනා කරණුලැබේ ද ඒ ප්‍රඥප්තියයි සේයි;)—දාරු-මෘත්තිකා-තන්තුආදිවූ සම්භාරයන්ගේ, ගෙවත්-උපකරණයන්ගේ සංනිවෙශාකාරය, ගෙවත්—රචනාදිවිශිෂ්ටවූ සංස්ථානාකාරය නිසා රථ-සකට-ඝට-පටාදිවූ සමූහප්‍රඥප්තිය ද, (යම් ප්‍රඥප්තියෙක් තීර්ථකයන්විසින් සංයොගය අවයවය අවයවියයි කියා කල්පනා කරණුලැබේ ද ඒ ප්‍රඥප්තියයි සේයි;)—හෙතු-ඵල-සන්තානාදිවශයෙන් පවත්නාවූ විඥප්තික්‍රියයන්විසින් උපලක්‍ෂිතවූ රූපාදිස්කන්ධපඤ්චකය නිසා පුරුෂය පුද්ගලය දිව්‍යය මනුෂ්‍යය යනාදිවශයෙන් කියනලද සත්වප්‍රඥප්තිය ද, (යම් ප්‍රඥප්තියෙක් ලොකයාවිසින් ආලාමකයයි කල්පනා කරණුලැබේ ද ඒ ප්‍රඥප්තියයි සේයි;—චන්ද්‍ර-සූර්‍ය-නක්‍ෂත්‍රයන්ගේ මෙරුප්‍රදක්‍ෂිණවශයෙන් උදයාදි ආවර්තනාකාරය නිසා පණවනලද්දාවූ පූර්වදිශාදිභෙදවූ දිශාප්‍රඥප්තිය ද, පූර්වාහ්නාදිවූ කාලප්‍රඥප්ති ද, මාස-ඍතු-සංවත්සරාදිවූ තත්තන්නාම විශිෂ්ටවූ නාමප්‍රඥප්තිය ද, යම් ප්‍රඥප්තියෙක් තීර්ථකයන්විසින් දිශාද්‍රව්‍ය-කාලද්‍රව්‍යයයි කල්පනා කරණුලැබේ ද ඒ ප්‍රඥප්තියයි සේයි;)—ඒ ඒ රූපකලාපයන්විසින් අසංස්පෘෂ්ටවූ ශුෂිරාදිආකාරය නිසා පණවනලද්දාවූ කූප-ගුහා-විවර'කාශාදිවූ ආකාශප්‍රඥප්තිය ද, (යම් ප්‍රඥප්තියක්තොමෝ තීර්ථකයන්විසින් ආකාශද්‍රව්‍යයයි කල්පනා කරණුලැබේ ද ඒ ප්‍රඥප්තියයි සේයි;)—ඒ ඒ කසිණමණ්ඩලස්වභාවාදි භෙද ඇති මහාභූතනිමිත්තවූ ද පරිකර්මාදිභෙද භාවනාවිශෙෂය ද නිසා යොගාවචරයහට උපදනාවූ උද්ග්‍රහ-ප්‍රතිභාගනිමිත්තාදිවූ ශාසනයෙහි නිමිත්තප්‍රඥප්තිය ද, යන මේ ආදිවූ කසිණුග්ඝාටිමාකාස-නිරොධකසිණාදිවූ ප්‍රභෙද ඇති පරමාර්ථනෙයින් අවිද්‍යමානවූ ද පරමාර්ථවස්තූන්ගේ ප්‍රතිබිම්බාකාරයෙන් වෙදනාදි චතුස්කන්ධවූ චිත්තොත්පාදයන්ට ආලම්බනවූ ඒ ඒ පරිණාම-සන්නිවෙශාදි ආකාරය කරණ කොට ගෙණ ඒ ඒ ආකාරයෙන් ලොකයෙහි ද ශාසනයෙහි ද ශරීරය සත්වය නිරොධය යනාදි ක්‍රමයෙන් කල්පනා කරණුලබන්නී කියනුලැබේ නුයි=සංඛා යී කියා ද, දන්නාලැබේ නුයි=සමඤ්ඤා යී කියා ද, ව්‍යවහාර කරනුලැබේ නුයි=ව්‍යවහාර යයි කියා ද, පණවනුලැබේ නුයි=ප්‍රඥප්ති යයි කියනුලැබේ, සංඛාදි චතුර්විධපදයෙන් ප්‍රකාශ කරණලද අර්ථප්‍රඥප්තිසංඛ්‍යාතවූ සමූහසන්තානාද නාමාවස්ථාවිශෙෂාදි-දිශා-කාලා'කාශ-නිමිත්ත-නිරොධාදිවූ මේ උපාදායප්‍රඥප්තිතොමෝ පණවනුලබනහෙයින් ප්‍රඥප්ති නම් වේ.

පණවනහෙයින් ප්‍රඥප්ති වනාහි නාමය නාමකර්මය නාමධෙයය නිරුක්තිය ව්‍යඤ්ජනය අභිලාපය යන මේ ෂඩ්විධවූ නාමයෙන් ප්‍රකාශ කරණලදී; ඒ ප්‍රඥප්තිතොමෝ විද්‍යමානප්‍රඥප්තිය, අවිද්‍යමාන

ප්‍රඥප්තිය, විද්‍යමානයෙන් අවිද්‍යමානප්‍රඥප්තිය, අවිද්‍යමානයෙන් විද්‍යමානප්‍රඥප්තිය, විද්‍යමානයෙන් විද්‍යමානප්‍රඥප්තිය, අවිද්‍යමානයෙන් අවිද්‍යමානප්‍රඥප්තිය දැයි, ෂඩ්ප්‍රකාර වේ.

ඒ ෂඩ්ප්‍රකාරවූ ප්‍රඥප්තීන් අතුරෙහි යම් කලෙක්හි ස්වභාවයෙන් විද්‍යමානවූ රූප-වේදනාදිය මැ කරණ කොට ගෙණ රූපය වේදනාය සංඥාය යනාදීන් ප්‍රකාශ කෙරෙද්ද, එකල්හි මෝතොමෝ විද්‍යමානප්‍රඥප්තියයි කියනුලැබෙයි;—යම් කලෙක්හි එනාහි ස්වභාවයෙන් අවිද්‍යමානවූ භූමි-පර්වතාදිය මැ කරණ කොට ගෙණ භූමිය පර්වතය සත්වය බාලය තරුණය වෘඬය ආකාශය දිශාය කාලය යනාදීන් ප්‍රකාශ කෙරෙද්ද, එකල්හි මෝතොමෝ අවිද්‍යමානප්‍රඥප්තියයි කියනුලැබේ; -පරමාර්ථහෙයින් අවිද්‍යමාන-විද්‍යමානප්‍රඥප්තීන් දෙදෙනාගේ අන්‍යොන්‍යවිශෙෂනවශයෙන් දෙදෙනෙක, ස්වජාතිය විශෙෂනවශයෙන් දෙදෙනෙක් දැයි ව්‍යතිමිශ්‍රවශයෙන් අවශෙෂවූ ප්‍රඥප්තීහු පිළිවෙළින් ෂඩභිඥයයි ද, ස්ත්‍රීශබ්දයයි ද, චක්ෂුර්විඥානයයි ද, රාජපුත්‍රයයි කියා ද, දතයුතුනාහුයි.

ෂඩ්අභිඥා නම් පංචඅභිඥා හා ආශ්‍රවක්ෂයකරඥානයයි; මෙහි අභිඥාවන් විද්‍යමානබවහෙයින් ද තත් ප්‍රතිලාභී පුද්ගලයාගේ අවිද්‍යමානබවහෙයින් ද මෝතොමෝ විද්‍යමානවිශෙෂනයෙන් විශිෂ්ටවූ අවිද්‍යමානප්‍රඥප්ති නම් වෙයි;—ස්ත්‍රියගේ අවිද්‍යමානබවහෙයින් ශබ්දයාගේ විද්‍යමානබවහෙයින් "ඉත්ථිසද්දො" යනු අවිද්‍යමානයෙන් විද්‍යමානප්‍රඥප්ති නම් වෙයි;-ප්‍රසාදචක්ෂුස්හුගේ ද තදාශ්‍රිතවූ විඥානයාගේ ද විද්‍යමානබවහෙයින් "චක්ඛුවිඤ්ඤාණං" යනු විද්‍යමානයෙන් විද්‍යමානප්‍රඥප්ති නම් වෙයි;-රජහුගේ ද පුත්‍රයාගේ ද සංවෘතිසත්‍යබවහෙයින් "රාජපුත්තො" යනු අවිද්‍යමානයෙන් අවිද්‍යමානප්‍රඥප්ති නම් වේ.

(මේ කියනලද මැයි);—

[වචීඝොසානුසාරෙන සොතවිඤ්ඤාණවීථියා,
පවත්තා'නන්තරුප්පන්නමනොද්වාරස්ස ගොචරා.

අත්ථා යස්සා'නුසාරෙන විඤ්ඤායන්ති තතො පරං,
සායං පඤ්ඤත්ති විඤ්ඤෙය්‍යා ලොකසඞ්කෙතනිම්මිතා.]

භූමි-පර්වත-රූප-වේදනාදි වාච්‍යවූ සර්වඥනා'විඥනකශබ්දයාගේ අනුසාරයෙන් හෙවත්—අලම්බනකරණයෙන් ප්‍රවෘත්තවූ ශ්‍රොත්‍රවිඥානවීථියගේ ප්‍රවෘත්තිඅනන්තරයෙහි උත්පන්නවූ නාමවිකාරයෙන් ප්‍රවෘත්තවූ මනොද්වාරිකවිඥානයහට හෙවත්—මෙබඳු අර්ථයාගේ මේ නාම යයි පූර්වයෙහි ම ගන්නාලද සංකෙතොපනිශ්‍රයට යම් නාමප්‍රඥප්තිතොම අරමුණු වූ ද,

ඒ නාමග්‍රහණයෙන් මත්තෙහි යම් නාමප්‍රඥප්තියකගේ අනුව පැවැත්මෙන් සංවෘති-පරමාර්ථභෙදවූ භූමි-පර්වත-රූප-වේදනාදිවූ අර්ථයෝ දන්නාලැබෙද්ද, ඒ මේ අර්ථාදිභෙදවූ නාමප්‍රඥප්තිතො

මෝ ලෝකසඞ්කේතයෙන් ලෝකව්‍යවහාරයෙන් සිද්ධවී මනෝද්වාරිකවිඥානයෙන් ගන්නාලද අක්ෂරාවලිසංඛ්‍යාත නාමප්‍රඥප්තියයි දතයුත්තීයි.

මෙහි--ශ්‍රොත්‍රවිඥානවීථියට අනන්තරව භාවිනීවූ මනෝද්වාරික වීථිය ද ශ්‍රොත්‍රවිඥානග්‍රහණයෙන් ම සඞ්ග්‍රහ කොට "සොතවිඤ්ඤාණ වීථියා"යි කියනලදී; එසේ මැයි, ඝටාදිවූ ශබ්දය අසන්නාහට එකොණ්ඩ් ශබ්දයක් අරබයා ප්‍රත්‍යුත්පන්නාලම්බන-අතීතාලම්බනවශයෙන් ජවනවාරයෝ දෙදෙන බුද්ධියෙන් ගන්නාලද නාමප්‍රඥප්තිවූ අක්ෂරාවලිය නිසා එක් ශබ්දයක්හැයි, මෙසේ ශ්‍රොත්‍රවිඥානවීථියට අනන්තරවූ අතීත ශබ්දය අරමුණු කොට ඇති ජවනවීථියට අනන්තරවූ නාමප්‍රඥප්තියගේ ගැන්මයි, එයින් මත්තෙහි අර්ථාවබොධය වන්නේයයි ආචාර්‍ය්‍යවරයෝ කියත්.

**(ප්‍රත්‍යයසඞ්ග්‍රහවිභාග නම්වූ අටවන පරිච්ඡේදය නිමි.)**

[සමථවිපස්සනානං භාවනානමිතො පරං,
කම්මට්ඨානං පවක්ඛාමි දුවිධම්පි යථාක්කමං.]

මේ ප්‍රත්‍යයනිර්දේශයෙන් මත්තෙහි නීවරණයන්ගේ ශමනාර්ථයෙන් ශමථසංඛ්‍යාතවූ ද අනිත්‍යාදි විවිධාකාරයෙන් දර්ශනාර්ථයෙන් විදර්ශනාසංඛ්‍යාතවූ ද විප්‍රකාරවූ භාවනාවන්ගේ විප්‍රකාර ද වූ විවිධ භාවනාද්වූ කම්මයාගේ ප්‍රවෘත්තියට ස්ථානබැවින් කම්මස්ථාන නම්වූ ආලම්බනය ශමථ-විදර්ශනානුක්‍රමයෙන් කියමි.

විප්‍රකාරවූ භාවනාවන් අතුරෙහි ශමථභාවනාසඞ්ග්‍රහයෙහි පළමුකොට විභාග කියනුලැබේ.

දශකසිණයහ, දශඅශුභයහ, දශානුස්මෘතියහ, සතර අප්‍රමාණ්‍යයහ, එක ම සංඥය, එක ම ව්‍යවස්ථානය, සතර ආරූප්‍යයෝ දැයි, කසිණාදිභේදයෙහයින් සප්තප්‍රකාරයෙකින් කම්මස්ථානසඞ්ග්‍රහය ද.

රාගප්‍රකෘතිය, ද්වේෂප්‍රකෘතිය, මොහප්‍රකෘතිය, ශ්‍රද්ධාප්‍රකෘතිය, බුද්ධිප්‍රකෘතිය, විතර්කප්‍රකෘතිය දැයි, ෂට්ප්‍රකාරයෙකින් මූලචරිතවශයෙන් පුද්ගලසඞ්ග්‍රහය ද, දතයුතුයි; සංසර්ගවශයෙන් වනාහි තෙසැට චර්‍ය්‍යාකෙනෙක් වෙති.

(කියනලද මැයි;—

"රාගාදිකෙ තිකෙ සත්ත සත්ත සද්ධාදිකෙ තිකෙ,
එක-ද්වි-තිකමූලම්හි මිස්සතො සත්තසත්තකං"—යි.)

මෙහි—රාගචරිතා, දෝසචරිතා, මෝහචරිතා; රාගදෝසචරිතා, රාගමෝහචරිතා, දෝසමෝහචරිතා; රාගදෝසමෝහචරිතා;—යි මෙසේ රාගාදිත්‍රිකයෙහි එක්සප්තකයෙක.

එසේ ම—සද්ධාචරිතා, බුද්ධිචරිතා, විතක්කචරිතා; සද්ධාබුද්ධිචරිතා, සද්ධාවිතක්කචරිතා, බුද්ධිවිතක්කචරිතා; සද්ධාබුද්ධිවිතක්කචරිතා;—යි

ශ්‍රද්ධාදිත්‍රිකයෙහි එක්සප්තයෙකැයි මෙසේ ත්‍රිකවශ මිශ්‍ර නොකොට තුදුස් චරියාකෙනෙක් වෙති.

රාගාදිත්‍රිකය වනාහි එකමූලක-ද්විමූලක-ත්‍රිමූලකවශයෙන් ශ්‍රද්ධාදිත්‍රිකය හා එක් කොට—රාගසද්ධාචරිතා, රාගබුද්ධිචරිතා, රාගවිතක්කචරිතා; රාගසද්ධාබුද්ධිචරිතා, රාගසද්ධාවිතක්කචරිතා, රාගබුද්ධිවිතක්කචරිතා; රාගසද්ධාබුද්ධිවිතක්කචරිතා;—යී මෙසේ යොදා, රාගමූලකනයෙහි එක් සප්තකයෙක.

එසේ ම—දොසසද්ධාචරිතා, දොසබුද්ධිචරිතා, දොසවිතක්කචරිතා; දොසසද්ධාබුද්ධිචරිතා, දොසසද්ධාවිතක්කචරිතා, දොසබුද්ධිවිතක්කචරිතා; දොසසද්ධාබුද්ධිවිතක්කචරිතා;—යී මෙසේ ද්වෙෂමූලකනයෙහි එක් සප්තකයෙක.

මොහසද්ධාචරිතා, මොහබුද්ධිචරිතා, මොහවිතක්කචරිතා; මොහසද්ධාබුද්ධිචරිතා, මොහසද්ධාවිතක්කචරිතා, මොහබුද්ධිවිතක්කචරිතා; මොහසද්ධාබුද්ධිවිතක්කචරිතා;—යී මෙසේ මොහමූලකනයෙහිදු එක් සප්තකයෙකැයි මෙසේ එකමූලකනයෙහි සප්තකත්‍රයෙක් වෙති.

ද්විමූලකනයෙහිදු,—රාගදොසසද්ධාචරිතා, රාගදොසබුද්ධිචරිතා, රාගදොසවිතක්කචරිතා; රාගදොසසද්ධාබුද්ධිචරිතා, රාගදොසසද්ධාවිතක්කචරිතා; රාගදොසබුද්ධිවිතක්කචරිතා; රාගදොසසද්ධාබුද්ධිවිතක්කචරිතා;—රාගමොහසද්ධාචරිතා, රාගමොහබුද්ධිචරිතා, රාගමොහවිතක්කචරිතා, රාගමොහසද්ධාබුද්ධිචරිතා, රාගමොහසද්ධාවිතක්කචරිතා, රාගමොහබුද්ධිවිතක්කචරිතා; රාගමොහසද්ධාබුද්ධිවිතක්කචරිතා;—දොසමොහසද්ධාචරිතා, දොසමොහබුද්ධිචරිතා, දොසමොහවිතක්කචරිතා; දොසමොහසද්ධාබුද්ධිචරිතා, දොසමොහසද්ධාවිතක්කචරිතා, දොසමොහබුද්ධිවිතක්කචරිතා; දොසමොහසද්ධාබුද්ධිවිතක්කචරිතා;—යී මෙසේ ද්විමූලකවශයෙන් සප්තකත්‍රයෙක.

ත්‍රිමූලකනයෙහි වනාහි,—රාගදොසමොහසද්ධාචරිතා, රාගදොසමොහබුද්ධිචරිතා, රාගදොසමොහවිතක්කචරිතා, රාගදොසමොහසද්ධාබුද්ධිචරිතා, රාගදොසමොහසද්ධාවිතක්කචරිතා, රාගදොසමොහබුද්ධිවිතක්කචරිතා; රාගදොසමොහසද්ධාබුද්ධිවිතක්කචරිතා,—යී මෙසේ එක්සප්තකයෙකැයි මෙසේ මිශ්‍රකභෙදයෙන් සප්තසප්තකවශයෙන් එකුන්පනස් චරියාකෙනෙක් වෙති, මේ එකුන්පනස් චරියාවන් හා පළමු කී තුදුස්චරියාවන් එක් කොට තෙසැටචරියාවෝ දතයුතු හුයි;—සමහරකෙනෙක් දෘෂ්ටිය හා එක් කොට සූසැටචරියාවක් කියත්.

පරිකම්මභාවනාය, උපචාරභාවනාය, අප්පණාභාවනා දැයි, තුන් භාවනාවෝ ද,—මෙහි—**පරිකම්මභාවනා** නම් භාවනාවට ආදිකම්මවූ පුබ්බභාගභාවනායි, කාමච්ඡන්දාදිනීවරණයන්ගේ විෂ්කම්භනයෙහි පටන් ගොත්‍රභූචිත්තයා අවසන් කොට ඇති අප්පණාවට පුබ්බභාගයෙහි ප්‍රවෘත්තවූ කාමාවචරභාවනාතොමෝ අප්පණාවට සමීපචාරී

හෙයින් ග්‍රාමොපචාරාදීන් මෙන් **උපචාරභාවනා** නම් වේ; මහද්ගතභාවප්‍රාප්තවූ භාවනාතොමෝ **අර්පණාභාවනා** නම් වේ.

පරිකර්ම්මනිමිත්තය, උද්ග්‍රහනිමිත්තය, ප්‍රතිභාගනිමිත්තය දැයි, තුන් නිමිත්තයෝ දතයුත්තාහුයි.

දසකසිණාදිය කෙසේද?—පඨවිකසිණය, ආපොකසිණය, තෙජොකසිණය, වායොකසිණය, නීලකසිණය, පීතකසිණය, ලොහිතකසිණය, ඔදාතකසිණය, ආකාසකසිණය, ආලොකකසිණය දැයි, මොහු **දශකසිණයෝ** නම් වෙත්; එහි පඨවිකසිණාදිවූ සතරදෙන භූතකසිණයහ; නීලාදිවූ සතරදෙන වර්ණකසිණයහ; පරිච්ඡින්නාකාශය ආකාසකසිණය; චන්ද්‍රාලොකාදිවූ ආලොකය ආලොකකසිණයයි, දතයුතු.

උද්ධුමාතකය, විනීලකය, විපුබ්බකය, විච්ඡිද්දකය, වික්ඛායිතකය, වික්ඛිත්තකය, හතවික්ඛිත්තකය, ලොහිතකය, පුලවකය, අට්ඨිකය දැයි, මොහු **දශඅශුභයෝ** නම් වෙත්.

බුද්ධානුස්මෘතිය, ධම්මානුස්මෘතිය, සංඝානුස්මෘතිය, ශීලානුස්මෘතිය, ත්‍යාගානුස්මෘතිය, දෙවතානුස්මෘතිය, උපශමානුස්මෘතිය, මරණානුස්මෘතිය, කායගතාසතිය, ආණාපාණසතිය දැයි, මොහු **දශඅනුස්මෘතීහු** නම් වෙත්.

මෛත්‍රිය, කරුණාය, මුදිතාය, උපෙක්ෂා ද, යන මොහු සතරදෙන **අප්‍රාමාණ්‍යයෝ** නම් වෙත්; **බ්‍රහ්මවිහාරයහ** යි කියා ද කියනු ලැබෙත්.

කබලිඞ්කාරාහාරයෙහි ප්‍රතිකූලසංඥායයි ප්‍රවෘත්තවූ සංඥාතොමෝ **එක ම සංඥා** නම් වේ.

පෘථිවිධාත්වාදි චතුර්විධධාතූන්ගේ ස්වලක්ෂණාදිහෙයින් නිශ්චය කිරීම **එක ම ව්‍යවස්ථාන** නම් වේ.

ආකාසානඤ්චායතනාදිවූ සතරදෙන **අරූප්‍ය** නම්හ යි, සර්වප්‍රකාරයෙන් ශමථභාවනානිර්දේශයෙහි සමසතළිස් කර්ම්මස්ථානයෝ නම් වෙත්.

**දැ**න් ඒ රාගචරිතාදි පුද්ගලයන්ගේ චරිතානුකූලකර්ම්මස්ථාන දක්වනුපිණිස "චරිතාවන්කෙරෙහි" යනාදි දක්වත්.

චරිතාවන්කෙරෙහි වනාහි දශඅශුභයෝ ද, කායගතානුස්මෘති සංඛ්‍යාතවූ කෙශාදි කොට්ඨාසභාවනා ද, යන මොහු රාගබහුලයහට රාගයට අශුභය ඉදුරා ප්‍රතිපක්ෂබැවින් සැපයහ;—සතර අප්‍රාමාණ්‍යයෝ ද, නීලාදිවූ වර්ණකසිණයෝ සතරදෙන ද, යන මොහු ද්වෙෂබහුලයහට සැපයහ,—ආශ්වාස-ප්‍රාශ්වාසනිර්ම්මිතාලම්බනිකවූ ස්මෘතිතොමෝ බුද්ධිවිෂයභාවයෙන් මොහයට ප්‍රතිපක්ෂබැවින් මොහබහුලයහට ද විතර්කසන්ධානසංචාරණය කරණහෙයින් විතර්කබහුලයහට ද සැපයහ,—බුද්ධානුස්මෘතිආදිවූ සදෙන ශ්‍රද්ධාභිවෘද්ධියට හෙතුවූ ස්වභාවයක් බැවින් ශ්‍රද්ධාබහුලයහට සැපයහ,—මරණානුස්මෘති-

උපශමානුස්මෘති-ආහාරයෙහි ප්‍රතිකූලසංඥා-චතුර්ධාතුව්‍යවස්ථානය යන මොහු ගම්භීරභාවයෙන් බුද්ධියට ම විෂයබැවින් ප්‍රඥාබහුලයහට සැපයහ;—අවශෙෂ චතුර්විධ භූතකසිණ-ආකාශා 'ලොකකසිණ-ආරූප්‍යචතුෂ්කාවශයෙන් දශප්‍රකාරවූ සියලු කම්මස්ථානයෝ වනාහි රාගචරිතාදිවූ සියල්ලවුන්ට ම සැපයෝයි.

ඒ භූතකසිණාදි දශප්‍රකාරවූ ද අශුභාදි අවශෙෂවූ ද කම්මස්ථානයන් අතුරෙහි මොහචරිතයහට සම්බාධවූ අවකාශයෙහි චිත්තයාගේ බොහෝසේ මොහනය වනහෙයින් කසිණයෙහි පෘථුලත්වය සැපය;—විතර්කබහුලයහට මහානාලම්බනය විතර්කසන්ධානයට කාරණබවහෙයින් කසිණයෙහි ක්ෂුද්‍රත්වය සැපයයි,

**මෙසේ මේ චරිතයෙහි මේ තෙම සත්ප්‍රායභෙදයයි.**

මෙහි රාගාදීන් විෂ්කම්භනය නොකරන්නාවූ ද ශ්‍රද්ධාදීන්ට අනුපකාරීවූ ද කසිණභාවනා නම් නැත, දශඅශුභාදීහු රාගචරිතාදීන්ට සැපයහ, යනාදීන් කීම රාගාදිවූ ඒ ඒ ධර්මයන්ට ඉදුරා ප්‍රතිපක්ෂබව හෙයින් හා අතිසත්ප්‍රායභාවහෙයින් කියනලද්දයි දතයුතු.

භාවනායෙහි වනාහි සියලු සමසතළිස් කම්මස්ථානයෙහි ම පරිකර්මභාවනා ලැබේ මැයි; බුද්ධානුස්මෘතිආදිවූ අෂ්ටප්‍රකාරවූ අනුස්මෘතියෙහි දු ආහාරයෙහි ප්‍රතිකූලසංඥා-චතුර්ධාතුව්‍යවස්ථාන යන මේ දෙක්හි ද යන මේ දශවිධ කම්මස්ථානයෙහි උපචාරභාවනාතොමෝ සිද්ධ වන්නීය, අර්පණාසමාධි නැති,—මෙහි—බුද්ධගුණාදීන්ගේ පරමාර්ථභාවයෙන් ද ඒ බුද්ධගුණාදීන් තමන් අනෙකවිධහෙයින් ද එකක්හුගේ ද ගම්භීරභාවයෙන් ද බුද්ධානුස්මෘතිආදිවූ දශකම්මස්ථානයෙහි අර්පණාවශයෙන් සමාධීහු පිහිටන්නට අසමර්ථබවහෙයින් අර්පණාභාවයට නොපැමිණි උපචාරභාවයෙන් ම සමාධි පිහිටන්නේයි, මොහු සදෙන කාමාවචරකම්මස්ථාන නම් වෙත්; ලොකොත්තරසමාධි ද ද්විතීය-චතුර්ථාරූප්‍යසමාධි ද යන මොහු ස්වභාවධර්මයෙහි දු භාවනාවිශෙෂවශයෙන් අර්පණාබවට පැමිණෙන්නාහුයි; එසේ මැයි, විශුද්ධිභාවනාක්‍රමබලයෙන් ලොකොත්තරසමාධි අර්පණාබවට පැමිණෙන්නේය; ආලම්බනසමතික්‍රමණභාවනාවශයෙන් අරූපාවචරසමාධි අර්පණාබවට පැමිණේ; යම් හෙයකින් අර්පණාප්‍රාප්තවූ ම චතුර්ථධ්‍යානසමාධීහුගේ ආලම්බනසමතික්‍රමණමාත්‍රය වේ ද, එසේ හෙයිනැයි සේයි.

අවශෙෂවූ අශුභාදිවූ සමතිස් කම්මස්ථානයෙහි වනාහි අර්පණාභාවනා ද සිද්ධවන්නේයි,—ඒ සමතිස් කම්මස්ථානයන් අතුරෙහි දු පෘථ්වීකසිණාදිවූ දසකසිණයෝ ද, ආණපාණස්මෘතිය ද, යන මොහු ප්‍රථමාදිවූ ධ්‍යානපංචකයෙහි නියුක්තයහ, දශඅශුභයෝ ද, කායගතානුස්මෘතිය ද. යන මොහු ප්‍රථමධ්‍යානඇත්තාහ; මෛත්‍රීආදිවූ තුන් දෙන ධ්‍යානචතුෂ්කය ඇත්තාහ, උපෙක්ෂාතොමෝ පංචමධ්‍යානික

යයි, මේ සවිස්ස රූපාවචරධ්‍යාන ඇති කම්මට්ඨානයෝයි;—මෙහි—අශුභභාවනාව තමා ප්‍රතිකූලවූ අරමුණබැවින් ශීඝ්‍රවූ ජලප්‍රවාහ ඇති නදියෙහි අරිත්‍රබලයෙන් රැඳුනාවූ නෞකාව මෙන් විතර්කබලයෙන් ම අශුභයෙහි චිත්තය පවතී නුයි, අශුභකම්මට්ඨානයෙහි අවිතර්කධ්‍යානය සම්භව නොවනහෙයින් ප්‍රථමධ්‍යානිකයහ යී කියනලදී; මෛත්‍රී-කරුණා-මුදිතා යන මොවුන්ගේ දෞර්මනස්සහගත ව්‍යාපාද-විහිංසා-අනභිරති යන මොවුන් ප්‍රහාණය කළහෙයින් දෞර්මනස්‍ය ප්‍රතිපක්‍ෂපයෙන් සෞමනස්‍යසහගතත්වය යුක්ත ම නුයි, මෛත්‍ර්‍යාදිවූ තුන්දෙන චතුෂ්කධ්‍යානිකයහ යී කියනලදහු; "සියලු සත්හු සුව පත් වෙත්වා යී, දුකින් මිදෙත්වා යී, ලද සුව-සම්පතින් නහමන් පහවෙත්වා" යී මෙසේ මෛත්‍ර්‍යාදිවශයෙන් ප්‍රවෘත්ත ව්‍යාපාරත්‍රය හැර කම්මස්සකතාදර්ශනයෙන් සත්වයන්කෙරෙහි ලා මධ්‍යස්ථාකාරයෙන් ප්‍රවෘත්තවූ භාවනායෙන් නිර්වෘත්තවූ තත්‍රමධ්‍යස්ථ'පෙක්‍ෂාවගේ බලවත්බව හෙතු කොට ගෙණ උපෙක්‍ෂාබ්‍රහ්මවිහාරයාගේ සුඛසහගතත්වය සම්භව නොවන හෙයින් උපෙක්‍ෂාතොමෝ පඤ්චමධ්‍යානිකයයි ම කියනලදු.

කසිණොද්ඝාටිමාකාශාදිවූ චතුර්විධ අරූපාවචරාලම්බනයෝ වනාහි අරූපාවචරයහ යී කියනලද පඤ්චමධ්‍යානිකයි.

### මේ ශමථභාවනාධිකාරයෙහි මේ තෙම භාවනාප්‍රභේදයයි.

පරිකම්මාදිනිමිත්තයන් අතුරෙහි වනාහි පරිකම්මනිමිත්තය ද, උද්ග්‍රහනිමිත්තය ද, සියලු සමසතළිස් කම්මට්ඨානයෙහි ම ඒ ඒ ආලම්බනයට අනුරූපපරිද්දෙන් පරියායෙන් ලැබේ මැයි;—මෙහි "පරියායෙන්" යනු සමහර ආලම්බනකෙනෙකුන්ගේ අපරිව්‍යක්තබව හඟවනපිණිස කියනලද, ව්‍යක්තබව වනාහි දශකසිණය, දශඅශුභය, කොට්ඨාසභාවනාය, ආණාපාණසතිය, යන මේ ආලම්බනයෙහි ම ලැබේ.

ප්‍රතිභාගනිමිත්තය වනාහි කසිණය, අශුභය, දෙතිස්කොටසය, ආණාපාණසතිය, යන මෙහි ම ලැබේ;—ඒ කසිණාදියෙහි ප්‍රතිභාගනිමිත්තය අරබයා උපචාරසමාධි ද, අප්පණාසමාධි ද, යන මොහු පවතිත්.

කෙසේ ද යත්?—ආදිකර්මිකයාගේ පඨවිකසිණමණ්ඩලාදියෙහි "පඨවී-පඨවී" යනාදින් ඒ ඒ භාවනානුක්‍රමයෙන් පඨවිකසිණාදිවූ ඒ ඒ ආලම්බනයෙහි නිමිත්තග්‍රහණය කරන්නාහට හෙවත්—ආදියෙහි වනාහි චතුපාරිශුද්ධිසීලය ශුද්ධ කොට ආවාසාදි දශවිධ පළිබොධොපච්ඡේදය කොට ප්‍රිය-ගරු-භාවනීයාදි ගුණයෙන් සමන්විතවූ කල්‍යාණමිත්‍රයෙකු සමීපයට එළඹ තමාගේ චරිතයට අනුකූල කම්මට්ඨානයක් ගෙණ මහාවාසාදි අෂ්ටාදශවිධවූ අනනුරූපවිහාරය දුරු කොට නාතිදූර-නාත්‍යාසන්නාදිවූ පඤ්චාඞ්ගයෙන් සමන්විතවූ අනුරූප

විහාරයෙහි වසමින් කෙශ-නඛහරණාදිවූ ක්‍ෂුද්‍රපළිබොධ දුරු කොට එක්වියත්සතරඟුල් පලල ඇති වටවූ කිසුණුමඬුල්ල අභිමුඛ කොට දෙරියන්වියත් හස්තපාශීවප්‍රමාණස්ථානයෙහි මනා කොට පණවනලද වියත්සතරඟුල්පමණ උස ඇති අස්නෙහි සුවෙන් හිඳ "අප්පස්සාද, කාමා" යනාදීන් කාමයෙහි ආදීනව ප්‍රත්‍යවෙක්‍ෂා කොට සර්වදුඃඛසමතික්‍රමයට කාරණවූ නෛෂ්ක්‍රම්‍යයෙහි සඤ්ජාතාභිලාෂය ඇතිව බුද්ධ-ධර්ම-සංඝගුණානුස්මරණයෙන් ප්‍රීති-ප්‍රමොද උපදවා මේ ප්‍රතිපත්තිතොමෝ සියලු බුද්ධ-ප්‍රත්‍යෙකබුද්ධ-ආර්‍ය්‍යශ්‍රාවකයන්විසින් ප්‍රතිපන්නවූ නෛෂ්ක්‍රම්‍යප්‍රතිපත්තිය යී ප්‍රතිපත්තියෙහි සඤ්ජාත ගෞරව ඇතිව සිත් පිහිටුවා "අද්ධා ඉමාය පටිපත්තියා පවිවෙකසුඛරසස්ස භාගී භවිස්සාමි" යී මෙසේ උත්සාහ උපදවා සමවූ ආකාරයෙන් ඇස දල්වා කිසුණෙහි වර්ණය ප්‍රත්‍යවෙක්‍ෂා නොකොට ලක්‍ෂණය මනස්කාර නොකොට වර්ණය නොහැර ම උත්සදවශයෙන් ප්‍රඥප්ති ධර්මයෙහි සිත් පිහිටුවා එකඟවූ සිතින් "පඨවී-පඨවී" යනාදීන් ඒ ඒ භාවනානුක්‍රමයෙන් පෘථිවීකෘත්ස්නාදිවූ ඒ ඒ අරමුණෙහි නිමිත්ත ග්‍රහණය කරන්නාහට යයි සේයි,)—ඒ ආරම්මණය පරිකර්මනිමිත්ත යයි කියනුලැබේ; ඒ භාවනා ද පරිකර්මභාවනා නම් වේ.

යම් කලෙක්හි වනාහි ඒ පරිකර්මනිමිත්තය සිතින් මනාකොට ගන්නාලද්දේ වේ ද, ඇසින් බලන්නක්හට මෙන් ම මනොවාරික චිත්තයට හමු වූයේ වේ ද, (හෙවත්—ඇස පියාලා හෝ අන්‍යස්ථානයකට ගොසින් හෝ මනස්කාර කරන්නාහට කසිණමණ්ඩලය සදෘශව මනොවාරිකජවනයන්ට විෂය වූයේ ද,) එසමයෙහි එම අරමුණ උද්ග්‍රහනිමිත්ත නම් වෙයි; ඒ භාවනා ද සමව හෝ මනාව හෝ එකාලම්බනයෙහි පිහිටන්නීයි;-(විශෙෂයෙන් චිත්තෛකාග්‍රතාප්‍රාප්තිය හෙතු කොට ගෙණ චිත්තසමාධානවශයෙන් පුද්ගලයා ද සමාහිත වන්නේය යි සේයි.)

එසේ චිත්තසමාධානවශයෙන් සමාහිතවූ ඒ යොගාවචරයහට වනාහි එයින් මත්තෙහි ඒ උද්ග්‍රහනිමිත්තය විෂය කොට පරිකර්මසමාධියෙන් භාවනායෙහි යෙදෙන්නාහට හෙවත්—භාවනා කරන්නාහට යම්කලෙක්හි ඒ උද්ග්‍රහනිමිත්තසදෘශවූ උද්ග්‍රහනිමිත්තයට වඩා පරිශුද්ධවූ පරමාර්ථධර්මයෙන් විමුක්තවූ නොහොත්—කසිණමණ්ඩලගත කසිණදොෂයෙන් විමුක්තවූ ප්‍රඥප්තියයි කියනලද භාවනායෙන් නිවෘත්තවූ අරමුණ චිත්තයෙහි මනාකොට පිහිටුවන ලද්දේ වේ ද, එකල්හි ප්‍රතිභාගනිමිත්තය උපනැයි කියනුලැබේ; ඒ ප්‍රතිභාගනිමිත්තොත්පත්තියෙහි පටන් කාමච්ඡන්දාදිනීවරණසංඛ්‍යාත පරිපන්ථයන්කෙරෙන් විශෙෂයෙන් පරිහීනවූ කාමාවචරසමාධියයි කියනලද උපචාරභාවනාතොමෝ නිෂ්පන්න නම් වේ.

ඒ උපචාරසමාධියෙන් මත්තෙහි එම ප්‍රතිභාගනිමිත්තය උපචාරසමාධියෙන් නැවත නැවත ආසෙවනය කරන්නාහට රූපාවචරප්‍රථමධ්‍යානසංඛ්‍යාත විතර්කාදිපඤ්චාඞ්ගයෙන් සමන්විතවූ ප්‍රථමධ්‍යාන

චිත්තය පිහිටවන්නේයි; මෙහි යට කී පරිද්දෙන් නිමිත්තග්‍රහණය කොට භාවනා කරණ යෝගාවචරයාවිසින් කලෙකින් ඇස දල්වා කලෙකින් ඇස පියාලා ආවර්ජනා කොට උද්ග්‍රහනිමිත්තය ඉපදවියයුතු; උද්ග්‍රහනිමිත්තය යම්තාක්කල් නොඋපදී ද, එතාක්කල් කාලශතයකු දු කාලසහස්‍රයකු දු එයට වඩා ද මෙම ක්‍රමයෙන් භාවනා කටයුත්තේය; එසේ බවන්නාහට යම්කලෙක්හි ඇස පියා ද ආවර්ජනා කරන්නාහට ඇස දල්වූ කල්හි මෙන් අරමුණු ආපාථගත වූයේ වේද, එසමයෙහි උද්ග්‍රහනිමිත්තය උපන්නා නම් වේ; ඒ උද්ග්‍රහනිමිත්තය ලද තැන් පටන් ඒ ස්ථානයෙහි නොහිඳ තමා වසන්නාවූ ස්ථානයට වැද එහි හුන්නහුවිසින් බැවියයුතු; ඉඳින් තරුණවූ සමාධිය කිසි අසත්‍ප්‍රායකින් නටුයේ වීනම් නැවතත් ඒ ස්ථානයට ගොස් ප්‍රතිභාගනිමිත්තය උපදවා නැවත අවුත් සුවසේ උන්නහුවිසින් නැවත නැවත බැවියයුතු; මෙසේ බවන්නාවූ යෝගාවචරයාහට අනුක්‍රමයෙන් කාමච්ඡන්දාදිනිවරණයෝ විෂ්කම්භිත වෙති; කෙලශොත්පත්තිය නොවන්නිය; උපචාරසමාධින් චිත්තය මනාව පිහිටවන්නේය; ප්‍රතිභාගනිමිත්තය ද උපදනේයි.

එහි උද්ග්‍රහනිමිත්ත-ප්‍රතිභාගනිමිත්තයන්ගේ වෙනස මෙසේ දතයුතු;—උද්ග්‍රහනිමිත්තයෙහි කසිණයෙහි ඇති දෝෂය පැණෙන්නේය, ප්‍රතිභාගනිමිත්තය වනාහි ථවිකාවෙන් පිටත් කොට මදනා ලද දර්පණතලයක් මෙන් ද, සුධෞතසංඛයක් මෙන් ද, මෙඝමුඛයෙන් නිෂ්ක්‍රාන්ත පූර්ණචන්ද්‍රමණ්ඩලය මෙන් උද්ග්‍රහනිමිත්තය ප්‍රදාළනය කොට නික්මුනාක් මෙන් ඒ උද්ග්‍රහනිමිත්තයට ශතගුණයෙන් සහස්‍රගුණයෙන් සුපරිශුද්ධව වැටහෙන්නේයි; ඒ ප්‍රතිභාගනිමිත්තය පටන් යෝගාවචරයාහට පඤ්චනීවරණයෝ විෂ්කම්භිත වූවාහු ම වෙති; කෙලශයන්ගේ උත්පත්තිය ද නොම වන්නිය; උපචාරසමාධින් චිත්තය සමාහිත වන්නේයි;—එහි සමාධිතෙමේ උපචාරසමාධිය අර්පණාසමාධියයි ද්විප්‍රකාර වෙයි; ඒ උපචාරසමාධිහුගේ ප්‍රතිලාභයෙන් පඤ්චනීවරණයන්ගේ ප්‍රහාණියෙන් චිත්තය සමාහිත වන්නේය; අර්පණාසමාධිප්‍රතිලාභයෙහි විතර්කාදිඅඩගයන්ගේ පහළවීමෙන් චිත්තය සමාහිත වන්නේය; ඒ සමාධින් දෙදෙනා අතුරෙහි උපචාරසමාධියෙහි අඩගයෝ ස්ථිරව පවත්නානු නොවෙති; අර්පණාචිත්තයෙහි අඩගයෝ ස්ථිරව පවත්නාහු, එසේ හෙයින් අර්පණාචිත්තය දවසක් මුලුල්ලෙහිත් සිටිනේයි; එහි උපචාරසමාධිය හා සමග යම් ඒ ප්‍රතිභාගනිමිත්තයෙක් උපන්නේ වේ ද, ඒ යෝගාවචරතෙම ඡමපයෂ්ඩකයෙන් ඒ ප්‍රතිභාගනිමිත්තය වඩා අර්පණාවට පැමිණෙන්නට ඉඳින් සමර්ථ වීනම් යහපත, ඉඳින් අසමර්ථ වීනම් චක්‍රවර්තිගර්භයක් මෙන් ද දූලීලහරත්නයක් මෙන් ද නිරන්තරයෙන් අප්‍රමත්තයාවිසින් රක්ෂා කටයුතු.

(කියනලද මැයි.);—

"සතතං අප්පමත්තෙන රක්ඛිතබ්බං සතිමතා,
නිමිත්තං රක්ඛතො ලද්ධං පරිහානි න විජ්ජති.

ආරක්ඛණෙ අසන්තස්මිං ලද්ධං තස්ස විනස්සති,
රක්ඛිතබ්බං හි තං තස්මා තත්‍රා'යං රක්ඛණා විධි.

ආවාසො ගොචරං භස්සං පුග්ගලො භොජනං උතු,
ඉරියාපථො'ති සත්තෙ'තෙ අසප්පායෙ විවජ්ජයෙ.

සප්පායෙ සත්ත සෙවෙථ එවං හි පටිපජ්ජතො,
න චිරෙනෙ'ව කාලෙන හොති භික්ඛුස්ස අප්පණා''-යි.

මෙසේ දශවිධ අර්පණාකෞශල්‍යය සම්පාදනය කරන්නාවූ යොගාවචරයහට ප්‍රතිලබ්ධවූ ප්‍රතිභාගනිමිත්තය විෂය කොට අර්පණා පවත්නේය; ඉදින් මෙසේ අර්පණාව නොඋපදනේ වී නම් නුවනැත්තාවූ යොගාවචරතෙමේ තමාගේ චිත්තප්‍රවෘත්තිආකාරය සළකා නැවත නැවත වීර්‍ය්‍යයාගේ සමත්වය යොදන්නේය; අත්‍යර්ථවීර්‍ය්‍යය හැර ලීනොද්ධතභාවයෙන් චිත්තය මුදා සම කොට පවත්වා ප්‍රතිභාගනිමිත්තාභිමුඛ කොට සිත මෙහෙයන්නේය; ප්‍රතිභාගනිමිත්තාභිමුඛ කොට සිත මෙහෙයන්නාහට දැන්ම අර්පණාසමාධි උපදනේයයි කීසමයෙහි භවාඞ්ගචිත්තය සිඳගෙණ එම පෘථිවිකසිණය අරමුණු කොට මනොද්වාරවීථියෙහි මනොද්වාරාවර්ජනචිත්තය උපදනේය; තදනන්තරව එම අරමුණ විෂය කොට ජවනයෝ සතරදෙනෙක් හෝ පස්දෙනෙක් හෝ උපදනාහ.

ජවනයන් සතරදෙනා වාරයෙහි ප්‍රථමජවනය අර්පණාවට පරිකර්මව සිටිහෙයින් **පරිකර්මය**යි කියා ද, සමීපචාරීහෙයින් **උපචාරය**යි කියා ද, කියතුලැබෙයි; දෙවනචිත්තය පූර්වභාගයෙහි පරිකර්මචිත්තයන්ට ද මත්තෙහි අර්පණාවට ද අනුකූලබවහෙයින් **අනුලොම** නම් වේ; තුන්වනචිත්තය පරිත්තගොත්‍රයද පෘථග්ජනගොත්‍රය ද අභිභවනය කරණහෙයින් මහද්ගතගොත්‍රය ද වර්ධනහෙයින් **ගොත්‍රභූ** නම් වෙයි; සතරවැනිව **අර්පණාචිත්තය** උපදනේයි; ජවනයන් පස්දෙනෙකු උපදනා වාරයෙහි ප්‍රථමජවනය යට කී පරිද්දෙන් **පරිකර්ම** නම් වෙයි; දෙවනචිත්තය **උපචාර** නම් වෙයි; 'තුන්වනචිත්තය **අනුලොම** නම් වෙයි, සතරවනචිත්තය **ගොත්‍රභූ** නම් වෙයි; පස්වැනිව අර්පණාව උපදනේයි; මෙසේ අර්පණාචිත්තය සතරවැනිව හෝ පස්වැනිව මුත් සවැනිව හෝ සත්වැනිව හෝ නොඋපදනේයි; කුමක්හෙයින් ද යත්?—යම්සේ අලබ්ධවූ ආසෙවන ඇති අනුලොමචිත්තය ගොත්‍රභූචිත්තය උපදවන්නට අසමර්ථ වූයේ වේ ද, ලබ්ධවූ ආසෙවනප්‍රත්‍යය ඇත්තේ ද, සවැනිව සත්වැනිව භවාඞ්ගයට ආසන්නබැවින් ප්‍රපාතාසන්නපුරුෂයා මෙන් අර්පණාවශයෙන් පිහිටන්නට අසමර්ථ වේ ද, එසේ හෙයින් සතරවන්නෙන්

මෑත හෝ පස්වන්නෙන් මත්තෙහි හෝ අර්පණා නොවන්නේයයි දතයුතු.

(කියේ මැනු);—

"ධාවන්තො හි යථා කොචි නරො ඡින්නතටාවුධො,
ඨාතුකාමොපි පරියන්තෙ ඨාතුං සක්කොති නෙව සො.
එවමෙව පහාවජ්ජෙටෙඨ සන්තමෙ වා'පි මානසෙ,
නසක්කොති'ති අප්පෙතුං වෙදිතබ්බං විභාවිනා"—සී.

එසින් මත්තෙහි එම ප්‍රථමධ්‍යානය ආවර්ජනාවශිතාය, සමාපජ්ජනාවශිතාය, ව්‍යුත්ථානවශිතාය, අධිෂ්ඨානවශිතාය, ප්‍රත්‍යවේක්ෂාවශිතාය, යන මේ පඤ්චවශිතායෙන් වශීභූත කොට (හෙවත්—වශිතාප්‍රාප්ත කොට,—මෙහි විතර්කාදි ධ්‍යානාඞ්ගයන් පස්දෙනාකෙරෙහි එකක් එකක් අරමුණු කොට උපන්නාවූ ආවර්ජනයහට අනතුරුව ජවනයන් සතර-පස්දෙනෙකුකෙරෙන් භවාඞ්ගසිත් තිපයකින් මත්තට නොගොස් නැවත නැවත ධ්‍යානාඞ්ගයන් ආවර්ජනය කරන්නට සමර්ථබව **ආවර්ජනාවශිතා** නම් වේ;—ධ්‍යානයට සමවදිනා කැමති සිතට ඉක්බිතිව තිපභවාඞ්ගයකින් මත්තට නොගොස් උපන් ආවර්ජනයට ඉක්බිතිව ධ්‍යානයට සමවදනට සමර්ථබව **සමාපජ්ජනාවශිතා** නම් වේ;—යථාපරිච්ඡින්නකාලය නොඉක්මවා ධ්‍යානයෙන් නැගෙන්නට සමර්ථබව **ව්‍යුත්ථානවශිතා** නම් වේ; නොහොත්—යථාපරිච්ඡින්නකාලවශයෙන් ම නැගෙන්නට සමර්ථබව **ව්‍යුත්ථානවශිතා** නම්වේ;—ශීඝ්‍රජලප්‍රවාහ ඇති නදියගේ ජලප්‍රවාහය රඳවා සිටි සෙතුබන්ධයක් මෙන් භවාඞ්ගවේගය සිඳ අසුරුසනක් පමණ කලක් හෝ දසඅසුරුසනක් පමණකලක් හෝ ධ්‍යානචිත්තය පිහිටුවන්නට සමර්ථබව හෙවත් - භවාඞ්ගපාතයෙන් රක්ෂණයට යොග්‍යබව **අධිෂ්ඨානවශිතා** නම් වේ; නොහොත්—යථාපරිච්ඡින්නකාලයෙන් මත්තට නොයාදී ධ්‍යානය පිහිටුවන්නට සමර්ථබව **අධිෂ්ඨානවශිතා** නම් වේ;—විතර්කාදි අඞ්ගයන් විෂය කොට ශීඝ්‍රව ඉපදවූ ආවර්ජනානන්තරව ප්‍රත්‍යවේක්ෂාජවනයන් ලඝු කොට පවත්නට සමර්ථබව **ප්‍රත්‍යවේක්ෂාවශිතා** නම් වේ.

විතර්කාදි ඖදාරිකඅඞ්ගයන්ගේ ධ්‍යානක්ෂණයෙහි ප්‍රහාණය පිණිස විචාරාදි සූක්ෂ්මවූ අඞ්ගයන්ගේ උත්පාදය පිණිස ව්‍යායාම කරන්නේ, හෙවත්—මත්තෙහි ධ්‍යානයට පරිකර්ම කරන්නේ පිළිවෙළින් ද්විතීයධ්‍යානාදීන් කරා කසිණ'ශුභාදි තත්තද්ධ්‍යානිකකර්මස්ථානයට සුදුසු සුදුසු පරිද්දෙන් පිහිටන්නේයි, හෙවත්—ද්විතීයධ්‍යානාදීන් කරා පැමිණෙන්නේයයි සේයි.

මෙහි,—ආවර්ජනාදි පඤ්චවශිතාවෙහි වශීභූතයාවිසින් ප්‍රගුණවූ ප්‍රථමධ්‍යානයෙන් නැගී මේ සමාපත්තිතොමෝ ආසන්නනීවරණසංඛ්‍යාත ප්‍රතිපක්ෂයන් ඇත්තීයයි ද, විතර්කයාගේ ඖදාරිකත්වයෙන් අඞ්ගදුර්වලයයි ද, ඒ ප්‍රථමධ්‍යානයෙහි දෝෂ දැක ද්විතීයධ්‍යානය ශාන්ත

හෙයින් මනස්කාර කොට ප්‍රථමධ්‍යානයෙහි නිකාන්ති දුරු කොට ද්විතීයධ්‍යානාධිගමය පිණිස භාවනායොග කටයුතුයේය.

ඉක්බිති ප්‍රථමධ්‍යානයෙන් නැගී ස්මෘතිසම්ප්‍රජන්‍යයෙන් යුක්තවූ ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවේක්ෂා කරන්නාවූ ඒ යොගාවචරයහට යම් කලෙක්හි විතර්කයා ඖදාරිකහෙයින් වැටහේ ද, විචාර-ප්‍රීති-සුඛ ද චිත්තෛකාග්‍රතාව ද යන මොහු ශාන්තහෙයින් වැටහෙද්ද, එසමයෙහි ඕහට ඖදාරිකාඞ්ගප්‍රහාණය පිණිස ශාන්තාඞ්ගප්‍රතිලාභය පිණිස ද එම ප්‍රතිභාගනිමිත්තය "පඨවී-පඨවී"යි නැවත නැවත මනස්කාර කරන්නා ම ද්විතීයධ්‍යානය උපදනේ යයි යන සමයෙහි භවාඞ්ගය සිඳගෙණ එම පෘථිවිකසිණය අරමුණු කොට මනොද්වාරාවර්ජනය උපදනේය.

ඉක්බිති එම අරමුණ නිමිත්ත කොට ගෙණ යට කී පරිද්දෙන් සතර-පස් ජවනකෙනෙක් පරිකර්මාදිනාමයෙන් උපදිති; ඔවුන්ගේ අවසානයෙහි විතර්කවර්ජිතවූ විචාර-ප්‍රීති-සුඛ-චිත්තෛකාග්‍රතායෙන් යුක්තවූ එකම රූපාවචරද්විතීයධ්‍යානය උපදනේය; සෙස්ස යට කී පරිද්දෙන් දතයුතුයි.

යම්සේ ප්‍රථමධ්‍යානයාගේ උපචාරක්ෂණයෙහි නීවරණයෝ ප්‍රහීණ වෙද්ද, එපරිද්දෙන් ද්විතීයධ්‍යානයාගේ උපචාරක්ෂණයෙහි විතර්කයා ප්‍රහීණ වන්නේ නොවෙයි, අර්පණයෙහි ම විතර්කරහිතවූ විචාරාදිචතුරඞ්ගයෙන් යුක්තවූ ද්විතීයධ්‍යානය උපදනේයි.

මෙසේ ද්විතීයධ්‍යානය අධිගතකල්හි යට කී පරිද්දෙන් ම ආවර්ජනාදි පඤ්චවශිතායෙහි කරණලද පරිචය ඇති යොගාවචරයාවිසින් ප්‍රගුණවූ ද්විතීයධ්‍යානයෙන් නැගී මේ සමාපත්තිතොමෝ ආසන්න විතර්කසංඛ්‍යාත ප්‍රත්‍යර්ථියා ඇත්තියයි ද, විචාරයාගේ ඖදාරිකත්වයෙන් අඞ්ගදුර්වලයයි ද ඒ ද්විතීයධ්‍යානයෙහි දොෂ දැක තෘතීයධ්‍යානය ශාන්තහෙයින් සලකා ද්විතීයධ්‍යානයෙහි නිකාන්තිය දුරු කොට තෘතීයධ්‍යානාධිගමය පිණිස භාවනායොග කටයුතුයේය.

එහි යෙදෙන්නාවූ ස්මෘතිසම්ප්‍රජන්‍යයෙන් යුක්තවූ යොගාවචරයහට ද්විතීයධ්‍යානයෙන් නැගී ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවේක්ෂා කරන්නාහට විචාරය ඖදාරිකහෙයින් වැටහෙන්නේය, ප්‍රීති-සුඛ ද චිත්තෛකාග්‍රතාව ද ශාන්තහෙයින් වැටහෙන්නේය, එසමයෙහි ඖදාරිකාඞ්ගප්‍රහාණය පිණිස ද ශාන්තාඞ්ගප්‍රතිලාභය පිණිස ද එම ප්‍රතිභාගනිමිත්තය "පඨවී-පඨවී" කියා නැවත නැවත මනස්කාර කරන්නාහට දැන් තෘතීයධ්‍යානය උපදනේය යනාදීන් යට ප්‍රථමධ්‍යානයෙහි කී පරිද්දෙන් විචාරවර්ජිතවූ ප්‍රීති-සුඛ-චිත්තෛකාග්‍රතාවශයෙන් ත්‍ර්‍යඞ්ගිකවූ තෘතීයධ්‍යානය ද, එසේ ම යට කී පරිද්දෙන් ප්‍රීතිවර්ජිතවූ සුඛ-චිත්තෛකාග්‍රතායෙන් යුක්තවූ චතුර්ථධ්‍යානය ද, සුඛවර්ජිතවූ උපෙක්ෂා-චිත්තෛකාග්‍රතායෙන් යුක්තවූ පඤ්චමධ්‍යානය ද, උපදනේයි;—මෙහි දු ප්‍රීත්‍යාදි ඖදාරිකාඞ්ගයන්ගේ ප්‍රහාණය උපචාරක්ෂණයෙහි නොව අර්පණක්ෂණයෙහි වන්නේයයි දතයුතු.

මෙසේ පෘථිවීකෘත්‍යනාදිවූ දෙවිසි කම්මට්ඨානයෙහි ප්‍රතිභාගනිමිත්ත ලැබෙන්නේයි; අවශේෂවූ බුද්ධානුස්මෘතිආදිවූ කම්මට්ඨානයන් අතුරෙහි වනාහි අප්‍රාමාණ්‍යයෝ සතරදෙන සත්ත්වප්‍රඥප්තිය විෂය කොට පවතිත්; ආකාශකෘත්‍යනාවර්ජිත කසිණයෙහි වනාහි යම්කිසි කසිණයක් මනස්කාර නොකිරීම්වශයෙන් උගුළුවා හෙවත්—දුරු කොට ප්‍රතිලබ්ධවූ කසිණුගුළුවූ ආකාශය අනන්තවශයෙන් හෙවත්—"අනන්තො ආකාසො—අනන්තො ආකාසො"කියා ආකාශය අරබයා භාවනා කරන්නාහට (හෙවත්—කෙවලව "අනන්තො"යි කියා පරිකම්මනොකරන්නාහටයයි සේයි,) එම අරමුණ විෂය කොට ආකාසානඤ්චායතනසංඛ්‍යාතවූ ප්‍රථමාරූප්‍යවිඥානය පිහිටන්නේයි;— ආකාසකසිණය උද්ඝාටනයට අසමර්ථබැවින් "ආකාශකෘත්‍යනාවර්ජිත කසිණයෙහි"යි කියනලදී.

මෙහි,—අරූපාවචරධ්‍යාන උපදවනු කැමති යෝගාවචරතෙම රූපය නිසා දණ්ඩාදාන-ශස්ත්‍රාදාන-කලහ-විග්‍රහ-විවාද යන මොවුන්ගේ ද චක්ෂුඃශ්‍රෝත්‍රරෝගාදිවූ ආබාධසහස්‍රයන්ගේ ද වශයෙන් කරජකායයෙහි ආදීනව දැක මේකී ආදීනව ආරූප්‍යයෙහි සර්වප්‍රකාරයෙන් නැතැයි රූපයාගේ සමතික්‍රමණය පිණිස පරිච්ඡින්නාකාසකසිණය හැර පෘථිවිකසිණාදිවූ නවකසිණයන් අතුරෙන් එක්තරා කසිණයෙක්හි චතුර්ථධ්‍යාන උපදවා ඒ ධ්‍යානයට අරමුණුවූ කසිණරූපයෙහි උමෙග ඇතිව ඒ එයින් දුරුවනු කැමැත්තේ පඤ්චප්‍රකාරයකින් පුරුදු කරණලද වශිතා ඇතිව ප්‍රගුණවූ රූපාවචරචතුර්ථධ්‍යානයෙන් නැඟී මාවිසින් කලකිරෙණලද මේ රූපය අරමුණු කරන්නේයයි කියා ද, ආසන්නසෞමනස්‍යසංඛ්‍යාත ප්‍රතිපක්ෂයා ඇත්තේයයි කියා ද, ශාන්තවිමොක්ෂයෙහින් ඖදාරිකයයි කියා ද, ඒ ධ්‍යානයෙහි ආදීනව දැක එහි නිකාන්තිය දුරු කොට ආකාසානඤ්චායතනය ශාන්තයෙහින් මනස්කාර කොට ඒ කසිණය චක්‍රවාටපර්යන්ත කොට හෝ තමා කැමති යම් කට්ටලයකට හෝ පතුරුවා එයින් ස්පෘෂ්ටවූ ආකාශය අරබයා "ආකාසො—ආකාසො"යි ද, "අනන්තො ආකාසො—අනන්තො ආකාසො"යි ද, නැවත නැවත මනස්කාර කරන්නාහට නීවරණයෝ ප්‍රහීණ වෙති; උපචාරයා සමග චිත්තය මනාකොට පිහිටන්නේය; එම නිමිත්ත නැවත නැවත ආසෙවනය කරන්නාහට පෘථිවිකසිණාදියෙහි රූපාවචරනිමිත්තය මෙන් ආකාශය විෂය කොට ආකාසානඤ්චායතනචිත්තය පිහිටන්නේයි.

මෙහි දු පූර්වභාගයෙහි කාමාවචරචිත්තයෝ පරිකම්මාදිනාමයෙන් තුන්දෙනෙක් හෝ සතරදෙනෙක් හෝ උපෙක්ෂාවෙදනාසම්ප්‍රයුක්තවූවාහු ම වෙති; සතරවැනිව හෝ පස්වැනිව අරූපාවචරචිත්තය උපදනේයි; සෙස්ස පෘථිවිකසිණයෙහි කීපරිද්දෙන් දතයුතුයි, මේ වනාහි වෙනසයි;—මෙසේ අරූපාවචරචිත්තය උපන් කල්හි ඒ යෝගාවචරතෙම පූර්වයෙහි කසිණමණ්ඩලය ධ්‍යානචක්ෂුසින් බලමින් වැස "ආකාසො—ආකාසො"යි පරිකම්මමනස්කාර

යෙන් ඒ නිමිත්තය එහා දුරුකරණලදකල්හි ආකාශය ම බලමින් වසන්නේයි.

එම ප්‍රථමාරූප්‍යවිඥානය අනන්තවශයෙන් පරිකම්ම කරන්නාහට හෙවත්—"අනන්තං විඤ්ඤාණං—අනන්තං විඤ්ඤාණං"යි හා එනා කරන්නාහට විතියාරූප්‍යය පිහිටන්නේයි;—මෙහි දු "අනන්තං"යි නොකියා "ආකාසො—ආකාසො"යි කියා ද, "විඤ්ඤාණං—විඤ්ඤාණං"යි කියා ද, මනස්කාර කරන්නට වටිති යි කියා ආචාර්‍ය්‍යවරයෝ කියත්.

මෙහි,—විඤ්ඤාණඤ්චායතනධ්‍යානය උපදවනු කැමති යොගාවචරතෙම පස්ආකාරයකින් ආකාසානඤ්චායතනසමාපත්තියෙහි පුරුදු කරණලද වශිතා ඇත්තේ මේ සමාපත්තිතොමෝ ආසන්නරූපාවචරධ්‍යානසංඛ්‍යාත ප්‍රතිපක්ෂයන් ඇත්තීයයි ද, විඤ්ඤාණඤ්චායතනය මෙන් නොම ශාන්තයයි කියා ද, ආකාසානඤ්චායතනයෙහි ආදීනව දැක එහි නිකාන්තිය දුරු කොට විඤ්ඤාණඤ්චායතනය ශාන්තහෙයින් මනස්කාර කෙරෙයි, ඒ ආකාශස්ඵරණය කොට සිටියාවූ විඤ්ඤාණය "විඤ්ඤාණං-විඤ්ඤාණං"කියා නැවත නැවත මනස්කාර කරන්නාහට (එම නිමිත්තයෙහි නැවත නැවත චිත්තය හසුරුවන්නාහට) නීවරණයෝ විෂ්කම්භිත වෙති; ස්මෘතිය එහි ම පිහිටන්නේය; උපචාරය හා (සමග) චිත්තය සමාහිත වන්නේය, එම නිමිත්තය නැවත නැවත ආසෙවනවශයෙන් බහුල කරන්නාහට ආකාශය විෂය කොට ආකාසානඤ්චායතනය මෙන් ආකාශයෙහි පතළාවූ විඥානය විෂය කොට විඤ්ඤාණඤ්චායතනචිත්තය පිහිටන්නේයි;—අර්පණාක්‍රමය පෙර කීපරිද්දෙන් දතයුතුයි.

ප්‍රථමාරූප්‍යවිඥානයාගේ අභාවය එනාහි "නත්ථි කිඤ්චි"යි කියා හා එනා කරන්නාහට **තෘතීයාරූප්‍යය** පිහිටන්නේයි.

මෙහි,—තෘතීයාරූප්‍යය උපදවනු කැමැත්තාවූ යොගාවචරතෙමේ යට කීපරිද්දෙන් පඤ්චවශිතාප්‍රාප්තවූයේ මේ සමාපත්තිතොමෝ ආසන්නආකාසානඤ්චායතනසංඛ්‍යාත ප්‍රතිපක්ෂයන් ඇත්තීයයි ද, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය මෙන් ශාන්ත නොවන්නීයයි කියා ද, විඤ්ඤාණඤ්චායතනයෙහි ආදීනව දැක එහි නිකාන්ති දුරු කොට ආකිඤ්චඤ්ඤායතනය ශාන්තහෙයින් මනස්කාර කොට විඤ්ඤාණඤ්චායතනයට අරමුණුවූ ආකාසානඤ්චායතනවිඤ්ඤාණයාගේ අභාවය "නත්ථි-නත්ථි"කියා හෝ "සුඤ්ඤං—සුඤ්ඤං"කියා හෝ "විවිත්තං—විවිත්තං" කියා හෝ නැවත නැවත මනස්කාර කරන්නාහට (ඒ නිමිත්තයෙහි ම චිත්තය හසුරුවන්නාහට) නීවරණයෝ විෂ්කම්භිත වෙති; ස්මෘතිය එහි ම පිහිටන්නීය; උපචාරය හා (සමග) චිත්තය සමාහිත වන්නේය; මෙම නිමිත්ත නැවත නැවත ආසෙවනය කරන්නාහට (බහුල කරන්නාහට) ආකාශයෙහි පතළාවූ මහග්ගතවිඤ්ඤාණයෙහි විඤ්ඤාණඤ්චායතනය මෙන් ආකාශස්ඵරණය කොට ප්‍රවෘත්තවූ මහද්ගතවිඥානයාගේ සුඤ්ඤ-විවිත්ත-නාස්තිභාවය විෂය කොට **ආකිඤ්ච**

**ඤ්ඤායතනචිත්තය** පිහිටන්නේය;—මෙහි දූ අප්පණාක්‍රමය යට කීපරිද්දෙන් දතයුතුයි; එහි අප්පණාචිත්තය උපන්කල්හි ඒ යෝගාවචරතෙමේ විතියාරූප්‍යවිඥානයාගේ අපගමසංඛ්‍යාතවූ අභාවය ම දකිමින් වසන්නේයි.

තෘතියාරූප්‍යය ("සන්තමෙතං—පණීතමෙතං") "මේ ශාන්තය—මේ ප්‍රණීතය"යි භාවනා කරන්නාහට චතුර්ථාරූප්‍යවිඥානය පිහිටන්නේයි.

මෙහි,—චතුර්ථාරූප්‍යවිඥානය බැවියටි යෝගාවචරතෙම ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියෙහි පුරුදු කරණලද පඤ්චවශිතා ඇත්තේ මේ සමාපත්තිතොමෝ ආසන්නවිඤ්ඤාණඤ්චායතනසංඛ්‍යාත ප්‍රතිපක්ෂයන් ඇත්තියයි ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය මෙන් ශාන්ත නොවන්නියයි කියා ද, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආදීනව දැක නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි ආනිසංස දැක ආකිඤ්චඤ්ඤායතනචිත්තයෙහි නිකාන්තිය දුරු කොට නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ශාන්තහෙයින් මනසිකාර කොට තිතියාරූප්‍යවිඥානයාගේ නාස්තිභාවය විෂය කොට ප්‍රවෘත්තවූ ආකිඤ්චඤ්ඤායතනචිත්තය "සන්තමෙතං—පණීතමෙතං" කියා නැවත නැවත ආවර්ජනා කරන්නාහට (එම නිමිත්තයෙහි චිත්තය නැවත නැවත හසුරුවන්නාහට) නිවරණයෝ විෂ්කම්භිත වෙත්; එහි ම සමෘතිය පිහිටන්නිය; උපචාරය හා (සමග) චිත්තය සමාහිත වන්නේයි;—මෙසේ ඒ නිමිත්තය ආසෙවන-බහුලීකරණය කරන් කරන් විඤ්ඤාණාපගමය විෂය කොට උපන් ආකිඤ්චඤ්ඤායතනය මෙන් ආකිඤ්චඤ්ඤායතනසංඛ්‍යාත චතුඃස්කන්ධය විෂය කොට **නෙවසඤ්ඤානාසඤ්ඤායතනචිත්තය** පිහිටන්නේයි; මෙහි දූ අප්පණාක්‍රමය යට කීපරිද්දෙන් දතයුතු.

අප්පණාවහවූ කසිණාදි තිස්කම්ඨස්ථානයන්කෙරෙන් අවශේෂවූ බුද්ධානුස්මෘති ආදිවූ අට හා චතුර්ධාතුව්‍යවස්ථාව හා ආහාරයෙහි ප්‍රතිකූලසංඥාව ද යන මේ දශවිධ කම්ඨස්ථානයෙහි බුද්ධගුණාදිවූ හෙවත්—බුදුන්ගේ අර්හත්වාදිභෙද නවවිධගුණය ද, "ආදි" ශබ්දයෙන් ධම්ම-සංඝ-ශීල-ත්‍යාග-දෙවතා-උපසමය යන මොවුන්ගේ ගුණය ද, ආහාරයෙහි ප්‍රතිකූල-පෘථිවිධාත්වාදි සතරධාතුන්ගේ කක්ඛශත්වාදිගුණය ද, යන අරමුණු අරබයා හෙවත්—අරමුණු කොට "සො භගවා ඉති'පි අරහං, ඉති'පි සම්මාසම්බුද්ධො"යනාදි ක්‍රමයෙන් භාවනා කොට ඒ බුද්ධගුණාදි නිමිත්තය සිහින් මනාකොට ගන්නාලද කල්හි ඒ ම විෂය කොට පරිකර්මය ද සමාහිතව නිෂ්පන්න වන්නේය; නීවරණයන් විෂ්කම්භනය කෙරෙමින් උපචාරසමාධිය ද උපදනේයි.

**මේ සතලිස් කර්මස්ථානයයි.**

භවසම්පත්ත'භිඤ්ඤාණං දිට්ඨධම්මසුඛස්ස ච,
විපස්සනාය ච'ත්ථාය ඣානං භාවෙන්ති යොගිනො.

විශෙෂයෙන් ජානනාර්ථයෙන් "අභිඥා" යයි කියනලද ඍද්ධිවිධාදි පඤ්චලෞකිකාභිඥාවන්ගේ වශයෙන් පවත්නාවූ උපෙක්‍ෂා-චිත්තෛකාග්‍රතාසංයොගයෙන් ද අනාරූප්‍යබවහෙයින් ද රූපාවචර වූ පඤ්චමධ්‍යානය වනාහි අභිඥාවට පිහිටවූ පෘථිවීකෘත්‍ස්නාදිය අලම්බන කොට ඇති පඤ්චමධ්‍යානයෙන් නැගී (හෙවත් අභිඥාවට පිහිටවූ පඤ්චමධ්‍යානයට සමවැද එයින් නැගී) අධිෂ්ඨාතව්‍යාදිය ආවර්ජනා කොට (හෙවත් ඍද්ධිවිධඥානයට පරිකර්මකාලයෙහි අධිෂ්ඨාතව්‍යවූ ද විකුර්වණය කටයුතුවූ ද ශතාදි කෞමාරරූපාදිය ද, දිව්‍යශ්‍රොත්‍රයට පරිකර්මකාලයෙහි ස්ථූල-සූක්‍ෂ්ම භෙදවූ ශබ්දය ද, චෙතොපරියඥානයට පරිකර්මකාලයෙහි මෙරමාගේ හෘදයගත වර්ණදර්ශනයෙන් සරාගාදිභෙදවූ චිත්තය ද, පූර්වේනිවාසානුස්මෘතිඥානයට පරිකර්මකාලයෙහි පූර්වභවයෙහි චුතිනිවිත්තතාදිභෙදවූ පෙරවිසූ කඳපිළිවෙළ ද, දිව්‍යචක්‍ෂුසට පරිකර්මකාලයෙහි ආහාරස්ඵරණය කොට සිටි ස්ථානගතරූපය ද, ආවර්ජනා කොට) "සතං හොමි-සතං හොමි" යනාදීන් භාවනා කරන්නාහට පරිකර්මයට විෂයවූ රූපපාදකධ්‍යාන-ශබ්ද-පරචිත්තාදිභෙදවූ අලම්බනයන් විෂය කොට ඒ ඒ පරිකර්මයට අනුරූපපරිද්දෙන් ගොත්‍රභූචිත්තානන්තරව සතරවැනිව හෝ පස්වැනිව හෝ රූපාවචරපඤ්චමධ්‍යාන සංඛ්‍යාත ජවනචිත්තය එකවාරයෙක ඉපිද පිහිටන්නේයි.

මෙහි,-ලෞකිකපඤ්චාභිඥා උපදවනු කැමැත්තාවූ ආදිකර්මික යොගාවචරයාවිසින් අවදාතකෘත්‍ස්නය කෙළවර කොට ඇති අට කසිණයෙහි අෂ්ටසමාපත්ති උපදවා "කසිණානුලොමතො-කසිණපටිලොමතො" යනාදීන් දක්වනලද තුදුස්ආකාරයෙන් චිත්තය දමා "එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ" යනාදීන් දක්වනලද අෂ්ටාඞ්ගයෙන් සමන්විතවූ චිත්තයෙහි අභිඥා ඉපදවියයුතුය.

මෙහි,-එකදෙශයකින් ඍද්ධිවිධඥානයට මතු භාවනාවිධි දක්වනු ලැබේ;—එහි,-යට කී පරිද්දෙන් පෘථිවීකසිණය විෂය කොට රූපාවචර අෂ්ටසමාපත්ති උපදවා කසිණානුලොමතාදිවූ තුදුස්ආකාරයෙකින් චිත්තය දමා අභිනීහාරක්‍ෂම කොට අභිඥාපාදකපඤ්චමධ්‍යානයට සමවැද එයින් නැගී ඉදින් ශතයක් ම වනු කැමැත්තේ වීනම් "සතං හොමි-සතං හොමි" යි භාවනා කොට නැවත පාදකධ්‍යානයට සමවැද එයින් නැගී අධිෂ්ඨාන කටයුත්තේය,—අධිෂ්ඨාන චිත්තය හා (සමග) ම ශතයෙක් ම වන්නේය, සහස්‍රාදියෙහි දු මෙසේ මැයි.

අභිඥා නම්දු;—

[ඉද්ධිවිධා දිබ්බසොතො පරචිත්තවිජානනා,
පුබ්බෙනිවාසානුස්සති දිබ්බචක්ඛු'ති පඤ්චධා.]

අධිෂ්ඨානාදි ඍද්ධිප්‍රභෙද ඇති ඍද්ධිවිධය, දිව්‍යශ්‍රොත්‍රය, පරචිත්තවිජානනය, පූර්වේනිවාසානුස්මෘතිය, දිව්‍යචක්‍ෂුසයයි පඤ්චප්‍රකාර වේ.

**මේ සමථනිර්දෙශයෙහි මෙතෙම අභිඥාවන්ගේ අලම්බනභෙදයයි.**

**සමාධිකර්මස්ථානය කථා නිමවනලදී.**

විදර්ශනාකර්මස්ථානයෙහි වනාහි,—අනිත්‍යාදිවශයෙන් අනේක ප්‍රකාරයෙන් දක්නුයි=විපස්සනා නම් වේ; අනිච්චානුපස්සනාදිවූ භාවනාප්‍රඥාවයි; විදර්ශනාවගේ කර්මස්ථානය හෝ විදර්ශනා ම වූ කර්මස්ථානයනුයි=විදර්ශනාකර්මස්ථාන නම් වේ.

එහි,—ශීලවිශුද්ධිය, චිත්තවිශුද්ධිය, දෘෂ්ටිවිශුද්ධිය, කාංක්ෂාවිතරණවිශුද්ධිය, මාර්ගාමාර්ගඥානදර්ශනවිශුද්ධිය, ප්‍රතිපද්ඥානදර්ශනවිශුද්ධිය, ඥානදර්ශනවිශුද්ධිය දැයි, සප්තප්‍රකාරයෙකින් **විශුද්ධිසංග්‍රහය** ද;—අනිත්‍යලක්ෂණය, දුඃඛලක්ෂණය, අනාත්මලක්ෂණය, යන **තුන්ලක්ෂණයෝ** ද;-අනිච්චානුපස්සනාය, දුක්ඛානුපස්සනාය, අනත්තානුපස්සනාය, යන **තුන් අනුපස්සනාවෝ** ද;—සම්මර්ශනඥානය, උදයව්‍යයඥානය, භංගඥානය, භයඥානය, ආදීනවඥානය, නිර්වේදඥානය, මුඤ්චිතුකාම්‍යතාඥානය, ප්‍රතිසංඛ්‍යාඥානය, සංස්කාරෝපෙක්ෂාඥානය, අනුලෝමඥානය දැයි **දශවිදර්ශනාඥානයෝ** ද;—ශූන්‍යතාවිමෝක්ෂය, අනිමිත්තවිමෝක්ෂය, අප්‍රණිහිතවිමෝක්ෂය දැයි, **තුන්විමෝක්ෂයෝ** ද;—සුඤ්ඤතානුපස්සනාය, අනිමිත්තානුපස්සනාය, අප්පණිහිතානුපස්සනා දැයි, **තුන්විමෝක්ෂමුඛයෝ** ද; දතයුතුනුයි.

දැන් උද්දේශානුක්‍රමයෙන් විශුද්ධ්‍යාදීන්ගේ නිර්දේශය දක්වනු පිණිස "ශීලවිශුද්ධ්‍යාදී" යනාදි කීහු.

1-ශීලවිශුද්ධ්‍යාදී විමෝක්ෂමුඛය අන්ත කොට ඇති ෂට්ප්‍රකාරවූ අර්ථ විභාගය කෙසේ ද?—ප්‍රාතිමෝක්ෂසංවරශීලය, ඉන්ද්‍රියසංවරශීලය, ආජීවපාරිශුද්ධිශීලය, ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලය දැයි, ප්‍රාතිමෝක්ෂසංවරාදිවශයෙන් චතුර්විධ බැවින්ද දේශනා-සංවර-පර්යේෂණ-ප්‍රත්‍යවේක්ෂා වශයෙන් පරිශුද්ධ බැවින් ද මේ චතුර්විධපාරිශුද්ධිශීලය අකර්තව්‍යවිරති-කර්තව්‍යකරණචේතනාදිභේද ශීලය ම දේශනාවශයෙන් විශෝධිත බැවින් ද, ක්ලේශමලයෙන් විශුද්ධ බැවින් ද, විශුද්ධිනුයි= **ශීලවිශුද්ධි නම් වේ.**

2-නීවරණවිරහිතවූ අර්පණාභාවයට අප්‍රාප්තවූ කාමාවචරසමාධිසංඛ්‍යාතවූ උපචාරසමාධිය ද, රූපාවචරධ්‍යානසංඛ්‍යාත අර්පණාසමාධිය දැයි, ද්විප්‍රකාරවූ සමාධිය ම නීවරණමලවිශෝධනය කරණහෙයින් **චිත්තවිශුද්ධි නම් වේ.**

3-ලක්ෂණ-රස-ප්‍රත්‍යුපස්ථානවශයෙන් නාම-රූපයන්ගේ පිරිසිඳ දැන්ම ( හෙවත් දුඃඛසත්‍යය නිශ්චය කිරීම ) නාම-රූපමාත්‍රයෙන් පිටත් අන්‍යයක්හු නොදැක්මෙන් ආත්මදෘෂ්ටිමලය ශුද්ධ කරණහෙයින් **දෘෂ්ටිවිශුද්ධි නම් වේ.**

4-ඒ ත්‍රෛභූමක නාම-රූපයන්ගේ ම අවිද්‍යා-තෘෂ්ණාදිවූ ප්‍රත්‍යයන්ගේ පරිග්‍රහය (හෙවත් ප්‍රතිසන්ධියෙහි වනාහි නාම-රූපදෙක අවිද්‍යා-තෘෂ්ණා-උපාදාන-කර්මය යන මේ හෙතූන්ගේ වශයෙන් උපදනේය; ප්‍රවෘත්තියෙහි දු රූපය කර්ම-චිත්ත-ඍතු-ආහාරප්‍රත්‍යයවශයෙන් ද නාමය ද චක්ෂුරාදි නිශ්‍රයප්‍රත්‍යයවශයෙන් හා රූපාදි ආල

ධනප්‍රත්‍යයවශයෙන් ද විශේෂයෙන් යෝනිසොමනසිකාරාදි චතුෂ්චක්‍රසම්පත්තියෙන් කුශලය ද, අයෝනිසොමනසිකාරාදි වශයෙන් අකුශලය ද, කුශලා'කුශලවශයෙන් විපාකය ද, භවාඞ්ගාදිවශයෙන් ආවජ්ජනාදිය ද, ක්ෂීණාශ්‍රවසන්තානාදිවශයෙන් ක්‍රියාජවන ද, උපදිනුයි මෙසේ සාධාරණා'සාධාරණවශයෙන් අතීතාදි අධ්වත්‍රයෙහි නාම-රූපප්‍රවෘත්තියට ප්‍රත්‍යක්ෂාදි සිද්ධවූ කර්ම්මාදිප්‍රත්‍යයන්ගේ පරිග්‍රහය,—සමුදයසත්‍යයාගේ නිශ්චය කිරීම) "අහොසිං නු ඛො අහමතීතමද්ධානං" යනාදි ක්‍රමයෙන් (හෙවත් අහොසිං නු ඛො අහමතීතමද්ධානං, නනු ඛො අහොසිං අතීතමද්ධානං, කිංනු ඛො අහොසිං අතීතමද්ධානං, කථංනු ඛො අහොසිං අතීතමද්ධානං, කිං හුත්වා කිං අහොසිං නු ඛො අහං අතීතමද්ධානං; භවිස්සාමි නු ඛො අහං අනාගතමද්ධානං, න නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං, කිංනු ඛො භවිස්සාමි අනාගතමද්ධානං, කථංනු ඛො භවිස්සාමි අනාගතමද්ධානං, කිං හුත්වා කිං භවිස්සාමි නු ඛො අහං අනාගතමද්ධානං; අහංනු ඛො'ස්මි, නො නු ඛො'ස්මි, කිං නු ඛො'ස්මි, කථංනු ඛො'ස්මි, අයං නු ඛො සත්තො කුතො ආගතො, සො කුහිං ගාමී භවිස්සති"යි මෙසේ අතීතාදි කාලත්‍රය විෂය කොට) පවත්නා ෂොඩශවිධ කාඞ්ක්ෂායෙන් ද "සත්ථරි කංඛති" යනාදින් ප්‍රවෘත්තවූ අෂ්ටවිධවූ කාඞ්ක්ෂායෙන් ද එතරව සිටි ඥානයතෙම අහෙතු-විෂමහෙතු දෘෂ්ටිමලවිශෝධනය කරණහෙයින් **කාඞ්ක්ෂාවිතරණවිශුද්ධි** නම් වේ.

5-ඒ කාඞ්ක්ෂාවිතරණවිශුද්ධි ප්‍රතිලාභයෙන් මත්තෙහි වනාහි පෙර කී පරිද්දෙන් වෙන වෙන ලක්ෂණ-රසාදි ව්‍යවස්ථාවශයෙන් ද ප්‍රත්‍යයව්‍යවස්ථාවශයෙන් ද පරිග්‍රහ කරණලද "යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා, යා කාචි වෙදනා අතීතානාගතපච්චුප්පන්නා" යනාදි නයහෙයින් එකාදශප්‍රකාර භෙදයෙන් භින්නවූ අවිද්‍යාදි ප්‍රත්‍යයසහිතවූ ලොකොත්තර වර්ජිතවූ කාමාවචර-රූපාවචර-අරූපාවචරසංඛ්‍යාතවූ ඒ ත්‍රෛභූමකසංස්කාරයන්කෙරෙහි පඤ්චස්කන්ධ-ෂඩ්ද්වාර-ෂඩාලම්බන-ෂඩ්ද්වාර ප්‍රවෘත්තවූ ධර්ම්මාදීන්ගේ වශයෙන් ආවාවූ ස්කන්ධාදීනය අරබයා ස්කන්ධාදිකලාපහෙයින් සංක්ෂෙප කොට (හෙවත් "යම් රූපයෙක් අතීතයෙහි ජාත ද, ඒ අතීතයෙහි ම නිරුද්ධය; යම් රූපයෙක් අනාගතයෙහි වනසුලු ද, හෙද එහි ම නිරුද්ධ වන්නේය; යම් රූපයෙක් වර්ත්තමානයෙහි උපදී ද, ඒ අනාගතයට අප්‍රාප්තව එහි ම නිරුද්ධ වන්නේය, එසේ ම ආධ්‍යාත්මිකවූ ද බාහ්‍යවූ ද සූක්ෂ්මවූ ද ඖදාරිකවූ ද හීනවූ ද ප්‍රණීතවූ ද රූපාදිහු ඒ ඒ කාලයෙහි ඉපද නිරුද්ධ වන්නාහ" යනාදින් රාශිවශයෙන් හකුළුවා "ක්ෂයට පැමිණෙන අර්ථයෙන් අනිත්‍යය, (ආත්මාද්‍යවශයෙන් අභ්‍යුපගන්තව්‍යය;) භයට කාරණහෙයින් දුඃඛය, ආත්මසාරාදීහුගේ අභාවාර්ථයෙන් අනාත්මයයි ද";— එසේ ම "චක්ඛුං අනිච්චං—පෙ—මනො අනිච්චං; රූපං අනිච්චං-පෙ-

ධම්මා අනිච්චා; චක්ඛුවිඤ්ඤාණං අනිච්චා—පෙ—මනොවිඤ්ඤාණං අනිච්චං දුක්ඛං අනත්තා'' යනාදීන් අතීතාදි අධ්වවශයෙන් ද, රූපසන්තති-අරූපසන්තතිවශයෙන් ද, අතීතාදි ක්ෂණවශයෙන් ද, හුත්වා අභාව-උදයව්‍යය-පතිපීළන-අවසවත්තනාකාරසංඛ්‍යාත ලක්ෂණත්‍රය සම්මර්ශනවශයෙන් ප්‍රවෘත්තවූ කලාපසම්මර්ශනඥනයෙන් අනිත්‍යාදි ලක්ෂණත්‍රය පරිමර්දනය කරන්නාහට;—

මෙහි රූපසන්තති-අරූපසන්තතිවශයෙන් කලාපසම්මර්ශනය නම්,

"ආදානනික්ඛෙපනතො වයොවුඩ්ඪත්ථගාමිතො,
ආහාරතො ච උතුතො කම්මතො චා'පි චිත්තතො;
ධම්මතාරූපතො සත්ත විත්ථාරෙන විපස්සති"-සී.

කියනුලබන මේ සත්පරිද්දෙන් කරණ විදර්ශනාසි.

(1)-මෙහි-**ආදානනික්ඛෙප**හෙයින් විදර්ශනා නම්,"ච්‍යුති-ප්‍රතිසන්ධිවශයෙන් පරිච්ඡින්න එකෙකී භවයෙහි රූපයෝ අන්‍යභවයට නොගොස් ඒ ඒ භවයෙහි ම නිරුද්ධ වෙති; ඉතිබැවින් අනිත්‍යය, අනිත්‍ය හෙයින් ම දුඃඛය, දුක්හෙයින් ම අනාත්මය''යි විදර්ශනා කිරීමයි.

(2)-**වයොවුඩ්ඪත්ථගාමි**හෙයින් විදර්ශනා කෙසේ ද යත්?—හවුරුදු සියයක් දවස් ප්‍රථම-මධ්‍යම-පශ්චිම අවස්ථාහෙයින් තුන් කොටසක් කොට "තෙතිස් හවුරුද්දෙකින් පරිච්ඡින්නවූ පළමුවන අවස්ථාවෙහි පැවැති රූපයන් ද්විතීයාවස්ථාවට නොපැමිණ එහි ම නිරුද්ධ වන බැවින් ද සූතිස් හවුරුද්දෙකින් පරිච්ඡින්නවූ ද්විතීයාවස්ථාවෙහි පැවැති රූපයන් තෘතීයාවස්ථාවට නොපැමිණ එහි ම නිරුද්ධ වන බැවිනුදු තෙතිස් හවුරුද්දෙකින් පරිච්ඡින්නවූ පශ්චිම අවස්ථාවෙහි පැවැති රූපයන් මරණින් මත්තට නොගොස් එහි ම නිරුද්ධ වන බැවිනුදු අනිත්‍යය, දුඃඛය, අනාත්මය''යි, වයොවෘද්ධිගාමිහෙයින් විදර්ශනා කෙරෙයි.

නැවත එම වර්ෂශතය;—

"මන්දා ඛිඩ්ඩා ච වණ්ණා ච බලා පඤ්ඤා ච හායනා,
පබ්භාරා ච පවඞ්කා ච මොමූහා සයනා දස''-සී.

කියනලද දශකවශයෙන් දස කොටසක් කොට, නැවත පස්හවුරුදුහෙයින් විසි කොටසක් කොට, නැවත සතරහවුරුදුහෙයින් පස්විසිකොටසක් කොට, තුන්හවුරුදුබැවින් තෙතිස්කොටසක් කොට, දෙහවුරුදුබැවින් පනස්කොටසක් කොට, එකෙකී හවුරුදු බැවින් සියක්කොටසක් කොට, එකෙකී හවුරුද්දේ ගිම්හාන්- හිමන්-වසත්ය යන තුන් සෘතුහෙයින් තුන්කොටසක් කොට, නැවත හිම-ශිශිර-වසන්ත-ග්‍රීෂ්ම-වර්ෂා-ශරත් යන සෘතුහෙයින් සකොටසක් කොට, නැවත එකෙකී මස්බැගින් දෙළොස්කොටසක් කොට, නැවත එකෙකී මස් කෘෂ්ණපක්ෂ-ශුක්ලපක්ෂහෙයින් දෙකොටසක් කොට, නැවත එක්අඩමසක් දවස්හෙයින් පසළොස්කොටසක් කොට, නැවත එක්දවසක් රාත්‍රිදිවහෙයින් දෙකොටසක් කොට, නැවත

යාමවශයෙන් සකොට්ඨාසක් කොට, යට කිපරිද්දෙන් විදර්ශනා කෙරෙයි; නැවත අභික්කම-පටික්කම-ආලොකිත-විලොකිත-සම්මිඤ්ජිත-පසාරිතහෙයින් පිරිසිඳ "අභික්‍රමණයෙහි පැවැති රූපයෝ ප්‍රතික්‍රමණයට නොපැමිණ එහි ම නිරුද්ධ වෙති"යි යනාදීන් වෙන් වෙන් කොට කියූ සෙයින් ම මෙනෙහි කෙරෙයි; නැවත එක්පදවාරයක් උද්ධරණ-අතිහරණ-වීතිහරණ-වොස්සජ්ජන-සන්නික්ඛෙපන-සන්නිරුම්භනවශයෙන් සකොට්ඨාසක් කොට "උද්ධරණයෙහි පැවැති රූපයෝ අතිහරණයට නොගොස් එහි ම නිරුද්ධ වෙති" යනාදීන් වෙන් වෙන් කොට කිහෙයින් ම විදර්ශනා කෙරෙයි; මෙකීතාක් පරිද්දෙන් විදර්ශනා කරන්නේ වයොවුඩ්ඪත්ථගාමිහෙයින් සම්මර්ශනය කරන්නා නම් වේ.

(3)–"සුහිතකාලයෙහි පැවැති රූපයෝ ක්ෂුධාදුඃඛයෙන් පීඩිත අවස්ථාවට නොපැමිණ ඒ ඒ තැන ම නිරුද්ධ වෙති; ක්ෂුධාදුඃඛයෙන් පීඩිතඅවස්ථාවෙහි පැවති රූපයෝ සුහිතකාලයට නොපැමිණ ඒ ඒ තැනම නිරුද්ධ වෙති; ඉති බැවින් අනිත්‍යය දුඃඛය අනාත්මය" යි ආහාරජරූපවශයෙන් මෙනෙහි කරන්නේ **ආහාරහෙයින්** මෙනෙහි කරන්නා නම් වෙයි.

(4)–"ශීතකාලයෙහි පැවති රූපයෝ උෂ්ණකාලයට නොපැමිණ හුණුකල පැවති රූපයෝ සිහිල්කලට නොපැමිණ එකල්හි ම නිරුද්ධ වෙති"යි ඍතුසමුට්ඨානවශයෙන් මෙනෙහි කරන්නේ **ඍතුහෙයින්** මෙනෙහි කරන්නා නම් වේ.

(5)–"චක්ෂුර්ද්වාරයෙහි පැවති කර්මජරූපයෝ අනික්තැනකට නොගොස් එතනම නිරුද්ධ වෙති, ශ්‍රොත්‍ර-ඝ්‍රාණ-ජිහ්වා-කායද්වාර-හෘදයවස්තුයෙහි පැවති කර්මජරූපයෝ ඔබ්බට නොගොස් ඒ ඒ තැනම නිරුද්ධ වෙති, ඉති බැවින් අනිත්‍යය" යනාදීන් අනිත්‍යතාදිවශයෙන් මෙනෙහි කරන්නේ **කර්මහෙයින්** මෙනෙහි කරන්නා නම් වේ.

(6)-සොම්නස්කල්හි පැවති රූපයෝ දොම්නස්කලට නොපැමිණ දොම්නස්කල්හි පැවති රූපයෝ සොම්නස්කලට නොපැමිණ එතන ම නිරුද්ධ වෙති"යි චිත්තජරූපවශයෙන් මෙනෙහි කරන්නේ **චිත්තහෙයින්** මෙනෙහි කරන්නා නම් වේ.

(7)–"ආම්‍රවෘක්ෂාදියෙහි අඞ්කුරාදි නොයෙක් අවස්ථායෙන් වැටෙන අනින්ද්‍රියප්‍රතිබද්ධසන්තානයෙහි වැටෙන රූපයන් අතුරෙන් ඒ ඒ අවස්ථාවෙහි පැවති රූපයෝ අන්‍ය අන්‍ය අවස්ථාවකට නොපැමිණ ඒ ඒ තැන්හි ම නිරුද්ධ වෙති"යි මෙසේ ධර්මතාරූපවශයෙන් මෙනෙහි කරන්නේ **ධර්මතාරූපහෙයින්** සම්මර්ශනය කරන්නා නම් වේ;—මෙසෙයින් රූපසප්තකවශයෙන් විදර්ශනා කෙරෙයි.

අරූපසප්තකවශයෙන් කෙසෙයින් විදර්ශනා කෙරෙයි යත්?—

"කලාපතො යමකතො ඛණිතො පටිපාටිතො,
දිට්ඨිඋග්ඝාටනා මානසමුග්ඝාතනතො'පි ච,
නිකන්තිපරියාදානා සත්තා'රූපප්පසසනා"–යි.

කියනලද මේ සප්තප්‍රකාරයෙන් විදර්ශනා කෙරෙයි.

(1)-මෙහි,-යට රූපසප්තකයෙහි ආදානනික්ඛෙපාදිවශයෙන් සත් තන්හි පැවති විදර්ශනාසිත් එක්කොට අනිත්‍යය දුඃඛය අනාත්මය යි මෙනෙහි කරන්නේ **කලාපවශයෙන්** විදර්ශනා කරන්නා නම් වේ.

(2)-ආදානනික්ෂෙපවශයෙන් රූපයන් අනිත්‍යාදිහෙයින් විදර්ශනා කොට ඒ රූපයන් විදර්ශනා කළ සිතුදු අනිත්‍යාදි හෙයින් විදර්ශනා කොට එයින් වයොවුඩ්ඪත්ථගාමිආදි එකෙකි රූපයන් විදර්ශනා කොට ඒ රූපයන් විදර්ශනා කළ සිතුදු විදර්ශනා කිරීම්වශයෙන් මෙසේ රූපාරූපවිදර්ශනාවන් යුගල කොට පවත්නේ **යුගමහෙයින්** විදර්ශනා කරන්නා නම් වේ.

(3)-ආදානනික්ෂෙපහෙයින් රූපවිදර්ශනා කොට එයින් දෙවන සිත් තුන්වන සිත් සතරවන සිත් පස්වන සිත් විදර්ශනා කොට මෙසෙයින් ම වයොවුඩ්ඪත්ථගාමිආදි එකෙකි රූපවිදර්ශනා කොට ඒ ඒ විදර්ශනා කළසිත් විදර්ශනා කෙරෙමින් සතරවන සිත් දක්වා විදර්ශනා කරන්නේ **ක්ෂණහෙයින්** විදර්ශනා කරන්නා නම් වේ.

(4)-මෙකී පරිද්දෙන් ම ආදානනික්ෂෙපාදි විදර්ශනා කොට පිළිවෙළින් දසවන චිත්තය දක්වා විදර්ශනා කරන්නේ **පටිපාටිහෙයින්** විදර්ශනා කරන්නා නම් වේ.

(5)-අනාත්මානුදර්ශනාවිසින් ආත්මයයි නොදක්නාහෙයින් ආත්මදෘෂ්ටි උගුළුවන විදර්ශනා කරන්නේ **දෘෂ්ටිඋද්ඝාටනහෙයින්** විදර්ශනා කරන්නා නම් වේ.

(6)-අනිත්‍යානුදර්ශනාවිසින් මානයට වස්තුවූ මනාවක් නොදන්නා බැවින් මන් නසනවිසින් විදර්ශනා කරන්නේ **මානසමුද්ඝාතහෙයින්** විදර්ශනා කරන්නා නම් වේ.

(7)-දුඃඛානුදර්ශනාවිසින් පැතියයුතුවක් නොදන්නාබැවින් නිකාන්තික්ෂය කරණිවිසින් විදර්ශනා කරන්නේ **නිකාන්තිපර්‍ය්‍යාදාන හෙයින්** විදර්ශනා කරන්නා නම් වේ.

මෙසේ සම්මර්ශනඥානය උපන්කල්හි නැවත ඒ ත්‍රෛභූමක සංස්කාරයන්කෙරෙහි ම උදය-ව්‍යයදෙක "අවිජ්ජාසමුදයා රූපසමුදයො, තණ්හාසමුදයා රූපසමුදයො, කම්මසමුදයා රූපසමුදයො, ආහාරසමුදයා රූපසමුදයො" යි රූපස්කන්ධයාගේ නිර්වෘත්තිලක්ෂණ දක්නේ ද උදය දක්නේයි;—එසේ ම "අවිජ්ජානිරොධා රූපනිරොධො, තණ්හානිරොධා රූපනිරොධො, කම්මනිරොධා රූපනිරොධො, ආහාරනිරොධා රූපනිරොධො" යි රූපස්කන්ධයාගේ විපරිණාමලක්ෂණ දක්නේ ද ව්‍යය දක්නේයි; මෙසේ රූපස්කන්ධයෙහි දු අවශෙෂ වෙදනා-සංඥා-සංස්කාර යන ස්කන්ධත්‍රයෙහි සතරවන ආහාරප්‍රත්‍යය හැර "ඵස්සසමුදයා වෙදනාසමුදයො, ඵස්සනිරොධා වෙදනානිරොධො" යනාදීන් "ඵස්ස" බහාලා; විඥානස්කන්ධයෙහි දු ස්පර්ශය හැර "නාම-රූපසමුදයා විඤ්ඤාණසමුදයො, නාම-රූපනිරොධා

විඤ්ඤාණනිරොධො''—යනාදීන් ''නාම-රූප'' බහාලා, කියනලද මේ සම්පනස්ලක්ෂණයෙහි ''යථොක්තවූ අවිද්‍යාදිප්‍රත්‍යයන්ගේ සද්භාවයෙහි රූපාදීන් වීමය, අවිද්‍යාදිප්‍රත්‍යයන්ගේ අභාවයෙහි රූපාදීන් නොවීමය''යි කියනලද ප්‍රත්‍යයවශයෙන් ද, ප්‍රත්‍යයපරාමර්ශනය නොකොට එම සම්පනස්ලක්ෂණයෙහි කියනලද නිර්වෘත්තිලක්ෂණමාත්‍ර-විපරිණාමලක්ෂණමාත්‍රහෙයින් දක්නාහෙයින් ලක්ෂණවශයෙන් දැයි, මෙසේ එකෙකි ස්කන්ධයෙහි ප්‍රත්‍යයවශයෙන් සතරෙක ලක්ෂණවශයෙන් එකෙකැයි පඤ්චප්‍රකාරවූ උදය ද පඤ්චවිධවූ ව්‍යය දැයි දශයෙකැයි, මෙසේ දශදශ උදය-ව්‍යයදර්ශනවශයෙන් සම්පනස් ආකාරයකින් උදය-ව්‍යය දන්නා නුවණින් උදය-ව්‍යය අනුවදක්නාවූ ආරබ්ධවිදර්ශකවූ යොගාවචරයහට,—

[ඔභාසෙ පීති පස්සද්ධි අධිමොක්ඛො ච පග්ගහො,
සුඛං ඤාණුපට්ඨානමුපෙක්ඛා ච නිකන්ති ච.]

විදර්ශනාචිත්තයෙන් සඤ්ජාතවූ ශරීරයෙන් නික්මෙන්නාවූ ආලොකසංඛ්‍යාතවූ අවභාසය ද, විදර්ශනාචිත්තසහජාතවූ ඛුද්දිකාදිභෙදවූ පඤ්චවිධවූ ප්‍රීතිය ද, කාය-චිත්තදරථයාගේ ව්‍යුපශමලක්ෂණවූ චිත්තවශයෙන් ද්විප්‍රකාරවූ ප්‍රශ්‍රබ්ධිය ද, බලවත් ශ්‍රද්ධෙන්ද්‍රියසංඛ්‍යාත විදර්ශනාසම්ප්‍රයුක්ත අධිමොක්ෂය ද, සම්‍යක්ප්‍රධානකෘත්‍යසාධකවූ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගසංඛ්‍යාතවූ ප්‍රග්‍රහය ද, අතිප්‍රණීතවූ කායික-චෛතසික සුඛය ද, අතිතීක්ෂ්ණවූ විදර්ශනාඥානය ද, ස්මෘතිප්‍රස්ථානයයි කියනලද චිරකෘතාදි අනුස්මරණසමර්ථවූ ස්මෘතිය ද, සම්ප්‍රවෘත්ත විදර්ශනාසහජාතවූ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයයි කියනලද තත්‍රමධ්‍යස්ථොපෙක්ෂාව ද මනොද්වාරයෙහි ආවර්ජනොපෙක්ෂාව ද යන ද්විවිධවූ උපෙක්ෂාව ද, මේ අවභාසාදිවූ නවදෙනා උපන්කල්හි ''න වත මෙ ඉතො පුබ්බෙ එවරූපො ඔභාසො උප්පන්නපුබ්බො, අද්ධා මග්ගප්පත්තොස්මි, ඵලප්පත්තොස්මි'' යනාදි ක්‍රමයෙන් එහි ආලය කෙරෙමින් උපදනාවූ සූක්ෂ්මවූ තෘෂ්ණාස්වරූපවූ නිකාන්තිය ද යනා:—

අවභාසාදිවූ විදර්ශනොපක්ලෙශයන් තෘෂ්ණා-දෘෂ්ටි-මානයන්ට වස්තුබැවින් මාර්ගයට පරිපන්ථයහයි ඥානයෙන් පරිග්‍රහවශයෙන් මාර්ගාමාර්ගලක්ෂණව්‍යවස්ථාව (හෙවත් ''අවභාසාදිවූ දශඋපක්ලෙශයෝ මාර්ගයෝ නොවෙති, විදර්ශනාවට උපක්ලෙශයෝමය, තද්විනිර්මුක්ත වීථිප්‍රතිපන්නවූ විදර්ශනාඥානය ම මාර්ගයයි'' මෙසේ මාර්ගස්වභාවය නිශ්චය කරන්නාවූ ඥානය මාර්ගාමාර්ගයාගේ ඥානයට හෙතුහෙයින් ද අමාර්ගයෙහි මාර්ගයයි යන සංඥා ශුද්ධ කරණහෙයින් ද **මාර්ගාමාර්ගඥානදර්ශනවිශුද්ධි** නම් වේ.

(6)-ඒ උක්තක්‍රමයෙන් උපක්ලෙශසංඛ්‍යාතවූ පරිපන්ථයෙන් විනිර්මුක්තවූ උදය-ව්‍යයඥානයෙහි පටන් සත්‍යානුලොමඥානය දක්වා ලක්ෂණත්‍රයවිදර්ශනාපරම්පරායෙන් පිළිපදනාවූ ඒ යොගාවචරයහට වනාහි උපදනාවූ උදය-ව්‍යයාදිවූ නවවිධ විදර්ශනාඥානයෝ ඥාන

දර්ශනවිශුද්ධියට ප්‍රතිපත්තිබැවින් ද ත්‍රිලක්ෂණඥානාදීන්ගෙන් ප්‍රතිපක්ෂයන් කෙරෙන් විශුද්ධබැවින් ද **ප්‍රතිපද්ඥානදර්ශනවිශුද්ධි** නම් වේ.

එහි **නවවිදර්ශනා** නම්,—

(7)-ස්කන්ධයන්ගේ උදය-ව්‍යය පිරිසිඳ දන්නාවූ **උදයව්‍යයඥානය** ද,

(2)-ඒ උදයව්‍යයඥානයෙන් උදය-ව්‍යය පරිග්‍රහ කොට අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කරත් කරත් උදය ඉක්ම භඞ්ගය ම වැටහෙයි, මෙසේ භඞ්ගය වැටහුණුකල ප්‍රත්‍යුත්පන්නරූපාදි එකෙකි අරමුණු භඞ්ගය බලා ඒ ඒ ආලම්බනයන්ගේ භඞ්ගය බැලූ සිත්හුගේ ද භඞ්ගය බලා "මෙසෙයින් ම අතීතසංස්කාරයෝ ද බිඳෙත් මය, අනාගතසංස්කාරයෝ ද බිඳෙත් මය" යී ප්‍රත්‍යක්ෂවූවනුදු අප්‍රත්‍යක්ෂවූවනුදු එකෙක් කොට භඞ්ගමාත්‍රය අරමුණු කෙරෙමින් සියලු සංස්කාරයන්ගේ භඞ්ගමාත්‍රය පරිග්‍රහණය කරන්නාවූ **භඞ්ගානුදර්ශනඥානය** ද,

(3)-මෙසෙයින් උපන් භඞ්ගානුදර්ශනායෙන් විදර්ශනා කරත් කරත් හුණුහුණුවන් දවන අඟුරුවළක් සෙයින් තුන්භවයෙහි අනිත්‍යාදි සංස්කාරයෝ භඞ්ගවශයෙන් භය ඇතියාව වැටහෙත්, මෙසෙයින් තුන්භවයෙහි සංස්කාරයන් භයවශයෙන් දක්නාවූ **භයතූපට්ඨානඥානය** ද,

(4)-එසෙයින් උපන් භයතූපට්ඨානඥානය භාවනා කරත් කරත් චණ්ඩසත්වයන් ඇති වනගහණයක් සෙයින් තුන්භවයෙහි සියලු සංස්කාරයෝ තමන් තමන් ගත්තවුන්ට උපද්‍රව එලවනුව ආදීනව වශයෙන් වැටහෙත්, මෙසෙයින් "සියලු සංස්කාරයෝ ආදීනව ඇත්තාහ" යී ආදීනවවශයෙන් දක්නා **ආදීනවානුදර්ශනඥානය** ද,

(5)-එසෙයින් උපන් ආදීනවානුදර්ශනඥානය මෙනෙහි කරත් කරත් චිත්‍රකූටපර්වතයෙහි ගුණ දුටු ස්වර්ණහංසයා දොෂ දුටු ගවර වළෙහි නොඇලෙනාසෙයින් තමාවිසින් අඩුණු දුටු සංස්කාරයන් කෙරෙහි නොඇලී උත්කණ්ඨා වෙයි, මෙසෙයින් නිවන් ශාන්තයෙහි දුටුවාහට සර්වසංස්කාරයන්කෙරෙහි උකටලී වෙමින් උපදනා **නිර්විදානුදර්ශනාඥානය** ද,

(6)-ඒ සංස්කාරයන්කෙරෙහි උකටලීවූ යොගාවචරයා මහාමත්ස්‍යයෙකැයි සලකා ආශිවිෂයා ගත් තැනැත්තනු තුන්සෝවැත්ත දැක ආශිවිෂයෙකැයි දනිමින් ම ග්‍රහණයෙහි විරක්තව හැරපියනු කැමැත්තා සේ විදර්ශනාඥානයෙන් තුන්ලකුණු දැක සියලු සංස්කාරයන්කෙරෙහි ස්වභාව දන්මින් ම සියලු සංස්කාරයන් හැරපියනු කැමති වෙයි, අන්‍යොන්‍යජාලගතමත්ස්‍යයා දැලින් මුක්තවනු කැමැත්තා සේ සියලු සංස්කාරයන්කෙරෙන් මිදෙනු කැමති වෙයි,—මෙසෙයින් සංස්කාරයන්කෙරෙහි නොඇලි ඔවුන් හරනා කැමතිව උපදනා **මුඤ්චිතුකාම්‍යතාඥානය** ද,

7—එසෙයින් සියලු සංස්කාරයන්කෙරෙන් මුක්තවනු කැමතිව මුක්තවන්නට උපායවූ විදර්ශනාඥානය ස්ථිර කරණුපිණිස සියලු සංස්කාරයන් නැවත අගනන්තුක කොට තුන්ලකුණු එලවා අනිත්‍යාදිවශයෙන් විදර්ශනා කෙරෙයි, මෙසෙයින් අනිත්‍යාදිවශයෙන් සියලු සංස්කාරයන් පරීක්‍ෂා කෙරෙමින් උපදනා **පටිසංඛ්‍යානුදර්ශනාඥානය** ද,

8—එසෙයින් සංස්කාරයන් පරිග්‍රහ කෙරෙමින් ම දෙෂ දැක හරණලද භාර්‍ය්‍යාවකෙරෙහි උපෙක්‍ෂා කරණ පුරුෂයා මෙන් දෙස් දුටු සංස්කාරයන්කෙරෙහි මැදහත් වෙයි, ගිනි දුටු කුකුළුපත් සෙයින් සංස්කාරයන්කෙරෙන් හැකිලෙයි, මෙසෙයින් සංස්කාරයන්කෙරෙහි මැදහත් වෙමින් උපදනා **සංස්කාරොපෙක්‍ෂාඥානය** ද,

9—එසෙයින් උපන් සංස්කාරොපෙක්‍ෂාඥානය මෙනෙහි කරත් කරත් මාර්ගොපස්ථානය වියදුතුවාරයෙහි අනිත්‍යයයි කියා වේවයි දුඃඛයයි කියා වේවයි අනාත්මයයි කියා වේවයි සංස්කාරයන් අරමුණු කොට ආවර්ජ්ජනා උපදී, තදනන්තරව පැවතආ විදර්ශනාවට ද මතු ඉපැද්දයුතු ආර්‍ය්‍යමාර්ගයට ද ප්‍රතිපක්‍ෂ නොවනබැවින් අනුලොමයයි නම් ලද ඥානසම්ප්‍රයුක්ත කාමාවචරචිත්තයෝ දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් හෝ උපදීත්, "මඤබුඩිකයනට වනාහි සතරකුදු උපදිති"යි කියත් මැයි, මෙසෙයින් උපදනා **අනුලොමඥානය** ද; යන මොහු නවදෙනයි.

මේ උක්තක්‍රමයෙන් භාවනා කරත්නාවූ ඒ යොගාවචරයාහට වනාහි විදර්ශනාවගේ මිහි කිරීමට පැමිණ දූන් අර්පණාසංඛ්‍යාත ලෝකොත්තරමාර්ගය උපදීයි කියයුතු කල්හි භවාඞ්ගසන්තතිය භවාඞ්ගචලන-භවාඞ්ගොපච්ඡෙදවශයෙන් සිඳගෙණ උපන්නාවූ මනොද්වාරාවජ්ජනයට අනතුරුව දෙ-තුන් විදර්ශනාචිත්තකෙනෙක් සංස්කාරොපෙක්‍ෂාඥානයෙන් ගත්නාලද යම්කිසි අනිත්‍යාදිලක්‍ෂණයක් අරබයා පරිකර්ම්-උපචාර-අනුලොමනාමයෙන් පවත්නාහුයි; යම් විදර්ශනාකෙනෙක් විදර්ශනාවගේ මස්තකප්‍රාප්තියෙන් ශිඛාප්‍රාප්තවිදර්ශනායයි කියා ද, අනුලොමඥාන සහිතබැවින් සානුලොමවිදර්ශනායයි කියා ද, සංස්කාරයන්කෙරෙහි උදාසීනබැවින් සංස්කාරොපෙක්‍ෂායයි කියා ද, ඒ ඒ මාර්ගයට සුදුසුපරිද්දෙන් අපායාදිදුඃඛයෙන් ද සංස්කාරනිමිත්තයෙන් ද නගනහෙයින් ව්‍යුත්ථානසංඛ්‍යාතවූ මාර්ගයට පැමිණේනුයි ව්‍යුත්ථානගාමිනීවිදර්ශනා යයි කියා ද, කියනුලැබෙද්ද, එසේවූ දෙ-තුන් විදර්ශනාචිත්තකෙනෙක් පවතිත්යයි දතයුතු.

ඒ අනුලොමචිත්තයෙන් මත්තෙහි තුන්වැනිව හෝ සතරවැනිව භාවනාබලයෙන් නිර්වාණය අරමුණු කොට මාර්ගසමඞ්ගීහුගේ පෘථග්ජනව්‍යවහාරය ඉක්මවමින් ආර්‍ය්‍යව්‍යවහාරයට ද පමුණුවමින් මාර්ගයට අනන්තරාදිප්‍රත්‍යයවූ ගොත්‍රභූ නම් විදර්ශනාචිත්තය උපදනේයි.

ඒ ගොත්‍රභූචිත්තයට අනතුරුව ම අෂ්ටාඞ්ගිකආර්‍ය්‍යමාර්ගයතෙම

ත්‍රෛභූමකස්කන්ධසංඛ්‍යාත දුඃඛසත්‍යය කෘත්‍යහෙයින් දුඃඛයෙහි සම්මොහයක් නැතිබැවින් අසම්මොහප්‍රතිවෙධවශයෙන් දනිමින් දුඃඛොත්පත්තියට කාරණහෙයින් තෘෂ්ණාසංඛ්‍යාත සමුදයසත්‍යය දුරු කෙරෙමින් නිර්වාණසංඛ්‍යාතවූ නිරොධසත්‍යය අලම්බනකරණවශයෙන් ප්‍රත්‍යක්‍ෂ කෙරෙමින් සම්ප්‍රයුක්තමාර්ගසංඛ්‍යාතවූ සතරවන සත්‍යය තමා හා සහජාතධර්මයන්ට සහජාතාදිප්‍රත්‍යය වැඩීම්වශයෙන් එක ම ඥනයාගේ එකක්‍ෂණයෙහි සතරකෘත්‍යය සිඬ කෙරෙමින් අප්පණාවීථියයි කියනලද සතරවනුවූ හෝ පස්වනුවූ ජවනස්ථානයට බස්නේයි.

ඒ මාර්ගචිත්තයෙන් මත්තෙහි මාර්ගොත්පත්තියට අනුරූපප රිද්දෙන් ඵලචිත්තයෝ දෙදෙනෙක් හෝ තුන්දේනෙක් හෝ අප නීතවශහි ඇත්තාවූ ස්ථානයෙහි උෂ්ණත්වනිර්වාපණය පිණිස ඝටයෙන් නමනුබන ජලය මෙන් සමුච්ඡින්නවූ කෙලෙශයන් ඇති සන්තානයෙහි කෙලශදරථ සන්සිඳිම්වශයෙන් ඉපිද නිරුඬ වෙති; එකාවජ්ජනවීථිය තමා සත්වන ජවනය පරම කොට ඇතිබැවින් ඉන් මතු භවාඞ්ගපාත වන්නේයි.

එහි යමක්හට පස්වැනිව මාර්ගචිත්තය උපදනේ වීනම් ඔහට මාර්ගය හා සදෘශවූ එම නිරොධය අරමුණු කොට ඵලසිත් දෙකෙක් උපදනේයි; යමක්හට සතරවැනිව මාර්ගචිත්තය උපදනේ වීනම් ඔහට ඵලසිත් තුනෙක් උපදනේයි; නැවත භවාඞ්ගසන්තතිය සිඳ ගෙණ මාර්ග-ඵලාදිය විෂය කොට ඇති කාමාවචරඥනයෝ වක්‍ෂ්‍යමාණක්‍රමයෙන් උපදනාහුයි.

දැන් ප්‍රත්‍යවෙක්‍ෂාවට භූමි දක්වනුපිණිස "මග්ගං ඵලඤ්ච" යනාදී කියනලද්.

[මග්ගං ඵලඤ්ච නිබ්බාණං පච්චවෙක්ඛති පණ්ඩිතො,
හීනෙ කිලෙසෙ සෙසෙ ච පච්චවේක්ඛති වා න වා.
ඡබ්බිසුද්ධික්කමෙනෙවං භාවෙතබ්බො චතුබ්බිධො,
ඤාණදස්සනවිසුද්ධි නාම මග්ගො පවුච්චති.]

අධිගත මාර්ග-ඵල ඇතිහෙයින් ප්‍රාඥවූ ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ "මම මෙනම් මාර්ගයකින් ආම්" යී මාර්ගය ද ඉක්බිති "මාවිසින් මෙනම් ආනිසංසයෙක් ලබනලද්දයි" මාර්ගයාගේ ඵලය ද එයට ඉක්බිතිව "මෙනම් ධර්මයෙක් මාවිසින් අලම්බනකරණවශයෙන් ප්‍රත්‍යක්‍ෂ කරණලද්දයි" නිර්වාණය ද ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙයි; ඉක්බිති "මෙනම් කෙලශකෙනෙක් මාවිසින් ප්‍රහීණ කරණලදහ" යී ප්‍රහීණවූ කෙලශයන් ද "මෙනම් කෙලශයෝ අවශිෂ්ටයහ" යී මත්තෙහි මාර්ගයෙන් වධ්‍යවූ කෙලශයන් ද සමහර ශෛක්‍ෂයෙක් ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නේ හෝය, සමහර ශෛක්‍ෂයෙක් නොකරන්නේ හෝයි; එහි කාමාචාරහෙයින යන අභිප්‍රායයි;-එසේ හෙයින් ම **මහානාමශාක්‍යයාතෙමේ** "කො සු නාම මෙ භන්තෙ ධම්මො අජ්ඣත්තං අප්පහීණො" යී අප්‍රහීණකෙල

ශයන් සවිශයන් විචාලේ; රහත්හට වනාහි සියලු කෙලශයන් ප්‍රහීණ කළබැවහෙයින් අවශිෂ්ටකෙලශයන්ගේ ප්‍රත්‍යවෙක්ෂාවෙක් නැත, එසේ හෙයින් ශෛක්ෂයන් තුන්දෙනාකෙරෙන් එකක්හට ප්‍රත්‍යවෙක්ෂා පයක් පසක් බැගින් පසළොසෙක, රහත්හට සතරෙකැයි මෙසේ එකුන්විසි ප්‍රත්‍යවෙක්ෂාඥානයෝ දතයුත්තාහුයි.

මෙසේ ශීලවිශුද්ධි-චිත්තවිශුද්ධිවශයෙන් මූලභූතවූ විශුද්ධීහු දෙදෙනා ද දෘෂ්ටිවිශුද්ධිආදීන්ගේ වශයෙන් ශරීරභූතවූ විශුද්ධීහු සතරදෙනා ද යන මේ ෂඩ්විශුද්ධීන්ගේ අනුක්‍රමයෙන් උත්පාදයිතව්‍යවූ ශ්‍රොතාපත්තිමාර්ගාදිවශයෙන් චතුර්විධවූ අෂ්ටාඞ්ගිකමාර්ගයතෙමේ චතුරාර්‍ය්‍යසත්‍යයන් අවබොධ කරණහෙයින් ද කෙලශමලයෙන් විශුද්ධබැවින් ද **ඥාණදර්ශනවිශුද්ධි** නමැයි කියනුලැබේ.

**මේ විදර්ශනාකර්මස්ථානයෙහි මෙතෙම**

**සප්තවිශුද්ධීන්ගේ නානාත්වයයි.**

ඒ උද්දේශයෙහි ත්‍රෛභූමකසංස්කාරයන්කෙරෙහි අනාත්මයයි ප්‍රවෘත්තවූ අනුපස්සනාතොමෝ "යො අත්තාභිනිවෙසො කම්මස්ස කාරකො ඵලස්ස ච වෙදකො, එසො මෙ අත්තා" යී මෙසේ ප්‍රවෘත්තවූ ආත්මාභිනිවේශය දුර්ග්‍රහණය හරිනි ආත්මශූන්‍යතාකාරය ම අනුව දක්නාහෙයින් **ශූන්‍යතානුපස්සනා** නම්වූ අනුපස්සනාතොමෝ ප්‍රතිපක්ෂයන්කෙරෙන් විමුක්තිවශයෙන් ආර්‍ය්‍යමාර්ගසංඛ්‍යාතවූ විමොක්ෂයට ද ඵලසමාපත්ති කාලයෙහි ඵලවිමොක්ෂයට ද මාර වන්නේයි.

එසේ ම සංස්කාරයන්කෙරෙහි අනිත්‍යයයි ප්‍රවෘත්තවූ අනුපස්සනාතොමෝ අනිත්‍යයෙහි නිත්‍යයයි ප්‍රවෘත්තවූ සංඥා-චිත්ත-දෘෂ්ටිවිපර්‍ය්‍යාසසංඛ්‍යාතවූ විපල්ලාසනිමිත්තය හරිනි විපල්ලාසනිමිත්තරහිතාකාරය ම අනුව දක්නාහෙයින් **අනිමිත්තානුපස්සනා** නම්වූ විමොක්ෂමුඛ නම් වෙයි.

දුඃඛයයි කියා ප්‍රවෘත්තවූ අනුපස්සනාතොමෝ සංස්කාරයන්කෙරෙහි "එතං මම, එතං සුඛං" යනාදි නයින් ප්‍රවෘත්තවූ කාම-භවතෘෂ්ණාසංඛ්‍යාතවූ ප්‍රණිධිය (තෘෂ්ණාප්‍රාර්ථනාව) දුඃඛාකාරදර්ශනයෙන් හරිනි ප්‍රණිධිරහිතාකාරය දක්නාහෙයින් **අප්‍රණිහිතානුදර්ශනා** නම්වූ විමොක්ෂමුඛ නම් වේ.

යම් හෙයකින් මේ අනුපස්සනාවන් තුන්දෙනාට විදර්ශනාවශයෙන් මේ නාමයෝ තුන්දෙන ලැබෙත් ද, එසේ හෙයින් වෘත්තදුඃඛයෙන් නඟනාහෙයින් ව්‍යුත්ථානයයි කියනලද මාර්ගයට පමුණුවනහෙයින් ව්‍යුත්ථානගාමිනීවිදර්ශනා නම්වූ සානුලොම විදර්ශනාතොමෝ ඉදින් අනාත්මහෙයින් විදර්ශනා කෙරේද, මාර්ගයතෙමේ විදර්ශනාගමනවශයෙන් ලද නම්හෙයින් **ශූන්‍යතාවිමොක්ෂ** නම් වේ.

ඉදින් ව්‍යුත්ථානගාමිනිවිදර්ශනාතොමෝ අනිත්‍යහෙයින් විදර්ශනා කෙරේ ද, මාර්ගයතෙමේ විදර්ශනාගමනවශයෙන් **අනිමිත්තවිමොක්ෂ** නම් වේ.

ඉදින් ව්‍යුත්ථානගාමිනිවිදර්ශනාතොමෝ දුඃඛහෙයින් විදර්ශනා කෙරේ ද, එසමයෙහි මාර්ගයතෙම ආගමනවශයෙන් **අප්‍රණිහිතවිමොක්ෂ** නම් වන්නේයයි කියා ද ව්‍යුත්ථානගාමිනිවිදර්ශනාගමනවශයෙන් මේ තුන්නාමයන් ලබයි; මාර්ගවීථියෙහි ඵලය ද මාර්ගාගමනභාවනාවශයෙන් එසේ ම තුන්නාමයන් ලබයි.

ඵලසමාපත්තිවීථියෙහි වනාහි පූර්වයෙහි කියනලද අනත්තානුපස්සනාදි ක්‍රමයෙන් විදර්ශනා කරන්නාවූ ආර්‍ය්‍යපුද්ගලයන්ට තමතමන්ගේ මාර්ග-ඵලය උපදනේ ද ශූන්‍යතානුපස්සනාදි විදර්ශනාගමනවශයෙන් ම ශූන්‍යතාදිවිමොක්ෂයයි කියනුලැබේ,(හෙවත් ශූන්‍යතවිමොක්ෂය අනිමිත්තවිමොක්ෂය අප්‍රණිහිතවිමොක්ෂය යන තුන් නාමය ලැබෙන්නේය යන අභිප්‍රායයි.)

සියලු සංස්කාරයන්කෙරෙන් සිස්හෙයින් ශූන්‍යතයයි කියා ද, සියලු සංස්කාරනිමිත්තරහිතහෙයින් අනිමිත්ත යයි කියා ද, තෘෂ්ණාප්‍රණිධිරහිතහෙයින් අප්‍රණිහිතයයි කියා ද, නම් ලද නිර්වාණය අරමුණු කිරීම්වශයෙන් ද ආත්මග්‍රහණය ද නිත්‍යනිමිත්තයෙක් ඇත සුවයෙක් ඇතැයි සංස්කාරග්‍රහණය ද ගලවන්නාවූ මාර්ගයාගේ කෘත්‍යවශයෙන් ද වනාහි ශූන්‍යතවිමොක්ෂාදිවූ නාමත්‍රය සියලු මාර්ගවීථි-ඵලවීථියෙහි ම ද සියලු මාර්ග-ඵලයන්ට සාධාරණව ම ලැබේ.

**මේ විදර්ශනාකර්මස්ථානයෙහි මේතෙම ශූන්‍යතාදි**

**වි මො ක්‍ෂ භෙ ද ය යි.**

මෙහි වනාහි ෂඩ්විශුද්ධික්‍රමයෙන් ශ්‍රොතආපත්තිමාර්ගය උපදවා ශීල-ව්‍රතපරාමර්ශය ද දෘෂ්ටිවිශෙෂයක් බැවින් දෘෂ්ටි-විචිකිත්සාසම්ප්‍රයුක්තවූ පස්අකුශලචිත්තයන්ගේ සමුච්ඡෙදප්‍රහාණයෙන් ප්‍රහීණවූ චතුර්විධ අපායප්‍රතිසන්ධිගමන් ඇතිබැවින් ප්‍රහීණවූ අපායගමන් ඇති සත්වාරයෙක්හි කාමසුගතියෙහි ප්‍රතිසන්ධිග්‍රහණය පරම කොට ඇති හෙයින් **සත්තක්ඛත්තුපරම** නම් වූ අෂ්ටාඞ්ගමාර්ගසංඛ්‍යාත ධර්මස්‍රොතසට පැමිණිහෙයින් ප්‍රථමමාර්ග-ඵලස්ථවූ ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ **ශ්‍රොතආපන්න** නම් වේ.

සකෘදාගාමිමාර්ගය උපදවා කාමරාගයාගේ ද ව්‍යාපාදයාගේ ද තදෙකස්ථමොහයාගේ ද විතීයමාර්ගයෙන් තුනීබවට පමුණුවනලද බව්හෙයින් මේ මනුෂ්‍යලොකයට ප්‍රතිසන්ධිවශයෙන් එක්වරෙක එනස්වභාව ඇති විතියඵලස්ථවූ ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ **සකෘදාගාමී** න ම් වේ.

අනාගාමිමාර්ගය උපදවා කාමරාග-ව්‍යාපාද යන සංයොජනයන් දෙදෙනාගේ නිරවශෙෂප්‍රහාණය හෙතු කොට ගෙණ මේ මනුෂ්‍ය

තමභාවයට ප්‍රතිසන්ධිවශයෙන් නොඑන්නාවූ ස්වභාව ඇති තෘතීය ඵලස්ථවූ ආර්‍ය්‍යශ්‍රාවකතෙම **අනාගාමී** නම්වේ.

අර්හත්මාර්ගය උපදවා රූපරාගාදිවූ පඤ්චවිධවූ ඌර්ධ්වභාගීයසංයොජනසංඛ්‍යාතවූ සියලු කෙලශයන්ගේ ප්‍රහාණය හෙතු කොට ක්‍ෂීණවූ චතුර්විධආශ්‍රවයන් ඇති සදෙවලොකයෙහි සදෙවලොකයාවිසින් දෙනලද චතුර්විධප්‍රත්‍යයට අර්හවූ අග්‍රාර්‍ය්‍යපුද්ගලවූ උපධික්‍ෂයෙන් අප්‍රතිසන්ධිකවූ ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ **අර්හත්** නම් වේ.

**මේ විදර්ශනාකර්මස්ථානයෙහි මේතෙම**

**ආර්‍ය්‍යපුද්ගලවිභාගයයි.**

මෙහි ඵලසමාපත්ති වනාහි සියලු ආර්‍ය්‍යපුද්ගලයන්ට ම තම තමන්ගේ ඵලවශයෙන් සාධාරණ මය, වෙනසෙක් නැත යනු අභිප්‍රායයි.

දෘෂ්ටධර්මයෙහි ම චිත්ත-චෛතසිකධර්මයන්ගේ අප්‍රවෘත්ති සංඛ්‍යාත නිරොධසමාපත්තිය සම්බන්ධිවූ ඵලසමාපත්ති සමවැදීම වනාහි කාමභව-රූපභවයෙහි ම අෂ්ටසමාපත්තිලාභිවූ අනාගාමීන්ට ද රහතුන්ට ද ලැබෙන්නේය; සෙසු ආර්‍ය්‍යයන්ට නොලැබෙන්නේ යයි සේයි.

ඒ නිරොධසමාපත්තියෙහි ඒ නිරොධසමාපත්ති සමවදනා කැමැති ආර්‍ය්‍යපුද්ගලතෙමේ පිළිවෙළින් වශීභූතවූ ප්‍රථමධ්‍යානාදි රූපා'රූප මහද්ගතසමාපත්තියට සමවැද එයින් නැගී ඒ ඒ ධ්‍යානයෙහි අන්තර්ගතවූ චිත්ත-චෛතසිකසංඛ්‍යාත සංස්කාරධර්මයන් ඒ ඒ ප්‍රථමධ්‍යානාදී සමාපත්තියෙන් නැගිවේලෙහි ම ලක්‍ෂණත්‍රයට ආරොපණය කොට අනිත්‍යාදිවශයෙන් විදර්ශනා කරන්නේ ශමථ-විදර්ශනා දෙදෙනාගේ යුගනද්ධභාවාපාදනවශයෙන් යම්තාක් ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති ද ඒතාක් ගොසින් එයින් නැගී එයින් මත්තෙහි ඉටියයුතු ආදි චතුර්විධවූ පූර්වකෘත්‍ය කොට (හෙවත් මේ සප්තාහාභ්‍යන්තරයෙහි ශරීරප්‍රතිබද්ධදෙය තබා වෙන තුබූ චීවරාදිපරිෂ්කාර හා නිවාසගෙහාදීන්ගේ උපචිකා-වහ්නිආදීන්විසින් නොනස්නා පරිද්දෙන් අධිෂ්ඨාන කිරීම ද, යථාපරිච්ඡින්නකාලය ඇතුළත්හි "සංඝයාගේ වචනයෙන් අවුත් කැඳවීමට පූර්වභාගයෙහි ම සමාපත්තියෙන් නැගෙමි" යී යන ආභොගය ද, එසේ ම "බුදුන්ගේ වචනයෙන් අවුත් කැඳවීමට පූර්වභාගයෙහි නැගෙමි" යී යන ආභොගය ද, "සප්තාහය ඇතුළත්හි ආයුසංස්කාරයෝ පවතිද්දෝ හෝ නොපවතිද්දෝ හෝයි තමාගේ ආයුඃප්‍රමාණ බැලීම ද, යන මේ චතුර්විධවූ අධිෂ්ඨානාදිවූ පූර්වකෘත්‍ය කොට නිමවා) නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානයට සමවැදනේ යි.

මෙසේ සමාපන්නවූ ඒ පුද්ගලයාගේ ප්‍රබන්ධවශයෙන් පවත්නාවූ චිත්තප්‍රවෘත්තිය චතුරාරූප්‍යසංඛ්‍යාතවූ කුශල ජවනයන් දෙදෙ

නාගේ හෝ ක්‍රියාජවනයන් දෙදෙනාගේ හෝ උත්පත්තියෙන් මත්තෙහි නොපවත්නීයි; ඉක්බිත්තෙන් ප්‍රත්‍යක්‍ෂාත්මභාවයෙහි ම චිත්තනිරෝධසංඛ්‍යාතවූ නිර්වාණයට සමවන්නා නම් වේ.

නිරෝධසමාපත්තියෙන් නැගෙනකල්හි වනාහි අනාගාමීහට අනාගාමිඵලචිත්තය ද, රහත්හට අර්හත්ඵලචිත්තය ද, නිර්වාණය අරමුණු කොට එකවරෙක ම පැවැත භවාඞ්ගපාත වන්නේයි.

ඒ භවාඞ්ගපාතයෙන් මත්තෙහි නෛවසංඥානාසංඥායතන චිත්තයෙහි චිත්ත-චෛතසිකධර්මයන් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නේයි.

**මේ විදර්ශනාකර්මස්ථානයෙහි මේතෙමේ ඵලසමාපත්ති-නිරෝධසමාපත්තීන් දෙදෙනාගේ ප්‍රභේදයයි.**

---

විදර්ශනාකර්මස්ථානය ද නිමවනලදී.

---

මෙසේ හෙයින් වනාහි,

[භාවෙතබ්බං පනිච්චෙවං භාවනාද්වයමුත්තමං,
පටිපත්තිරසස්සාදං පත්ථයන්තෙන සාසනෙ.]

සර්වඥශාසනයෙහි ධ්‍යානසුඛ-ඵලසුඛාදිභේද ශමථ-විදර්ශනාසංඛ්‍යාත ප්‍රතිපත්තිරසාස්වාදය ප්‍රාර්ථනා කරන්නහුවිසින් ශමථ-විදර්ශනාසංඛ්‍යාතවූ උතුම් භාවනාද්වය මේ උක්තක්‍රමයෙන් නවපන බුද්ධොත්පාදක්‍ෂණවරය ලද්දහුවිසින් භාවනා කරන්නට සුදුසුයි.

**මෙපමණෙකින්**

## “ඒකං නාම කිං?—නාමඤ්ච රූපඤ්ච”

**යන මේ ප්‍රශ්නයෙහි අර්ථ දක්වනලදි.**

---

මෙතැන්පටන් “තීනි නාම කිං?-තිස්සො වෙදනා” යන මේ ප්‍රශ්නයෙහි අර්ථ මෙසේ දතයුතු.

මෙහි කියනලද ත්‍රිවිධවූ වේදනාව නම්,

(1)-කයින් සිතින් විඳින්නාවූ **සැපවේදනාවය.**

(2)-කයින් සිතින් විඳින්නාවූ **දුඃඛවේදනාවය.**

(3)-සුව-දුක් දෙක්හි මැදහත්වශයෙන් විඳින්නාවූ **උපෙක්‍ෂාවේදනාවය.**

(4)-ගෘහනිශ්‍රිත වූ රූප-ශබ්ද-ගන්ධ-රස-ස්පර්ශ-සිතිවිලි වශයෙන් ෂට්ප්‍රකාරවූ දෞම්නස්වේදනාවය.

(5)-පැවිද්වීම පිළිබඳවූ ගෘහනිශ්‍රිත නොවූ පින් කැමැත්තන් විසින් සෙවියයුතු රූපාදි ෂට්ප්‍රකාර වස්තූන් අරබයා උපදනා සතුටු සොම්නස් වේදනාවය.

(6)-ගිහීන්පිළිබඳවූ ෂඩ්විධ දුක්දෞම්නස්වේදනාවය.

(7)-මහණවීම පිළිබඳආමිසනොවූ කුශලපක්‍ෂගත ෂට්ප්‍රකාරවූ දුක් දොම්නස් වෙදනාවය.

(8)-නෘහවැසියන් ආශ්‍රය කොට සිටි රූපාදි ෂට්ප්‍රකාර උපෙක්‍ෂා වෙදනාවය.

(9)-මහණවීම පිළිබඳ රූපාදිෂඩ්විධ උපෙක්‍ෂාවෙදනාවය.

යන මේ නවප්‍රකාරවෙදනාව ආදි කොට යම් යම් වෙදනාවක් ඇත්නම් ඒ සියලු වෙදනාවෝ ම සැප-දුක්-උපෙක්‍ෂා යන ත්‍රිවිධවෙදනාවෙහි ම ඇතුළත් වෙත්; එහෙයින් "තුන නම් කිම?"—යනු සැප-දුක්-උපෙක්‍ෂා යන ත්‍රිවිධ වෙදනාව වන්නේය.

මෙ ප ම ණෙ කි න්

## "තීනි නාම කිං?—තිස්සො වෙදනා"

**යන මේ ප්‍රශ්නයෙහි අර්ථ කියා නිමවනලදි.**

〰〰〰〰〰〰〰〰〰〰〰〰〰〰

මෙතැන් පටන් "චත්තාරි නාමකිං?—චත්තාරි අරියසච්චානි" යන මේ ප්‍රශ්නයෙහි අර්ථ මෙසේ දතයුතු වේ.

මෙහි **චතුරාර්‍ය්‍යසත්‍ය** නම්,—දුඃඛසත්‍යය, සමුදයසත්‍යය, නිරොධසත්‍යය, මාර්ගසත්‍යය, යන මේ සතරයි.

මෙයින් **දුඃඛසත්‍යය** කවරේ ද?—ඉපදීම ද දුක් වන්නේය, ජරාව ද දුක් වන්නේය, ව්‍යාධිය ද දුක් වන්නේය, මරණය ද දුක් වන්නේය, ශොකය ද දුක් වන්නේය; වැලපීම ද දුක් වන්නේය, කයෙහි උපදනා දුක ද දුක් වන්නේය, සිත්හි උපදනා දොම්නස් ද දුක් වන්නේය, උපායාශය ද දුක් වන්නේය, යම් කැමතිදෙයක් නොලැබීම ද දුක් වන්නේය, සංක්‍ෂෙපයෙන් පඤ්චස්කන්ධයෝ ද දුක් වන්නෝය.

මෙහි, **ජාතිය** නම් කවරේ ද?—සසර මූලාව හැසිරෙණ සත්ත්වයන්ට ජාතිපිළිවෙළ නියම නොවනබැවින් සියලු සත්ත්වලොකයා අතුරෙන් ඒ ඒ නම්ලද යම්කිසි සත්ත්වනිකායෙක්හි ඒ ඒ සත්ත්වයන්ගේ පළමු කොට ම සම්මුතිවචනවශයෙන් යම් ඉපදීමෙක් ඇද්ද, සඤ්ජාත වීමෙක් ඇද්ද, උත්පත්තිස්ථානයට අනුප්‍රවිෂ්ටාකාරයෙන් යම් පැමිණීමෙක් ඇද්ද, අභිනිර්වෘත්තිසංඛ්‍යාත විශෙෂයෙන් සත්ත්වයාගේ යම් ඉපදීමක් ඇද්ද, පරමාර්ථවචනවශයෙන් ස්කන්ධයන්ගේ පහළවීමෙක් ඇද්ද, ආයතනයන්ගේ යම් ප්‍රතිලාභයෙක් ඇද්ද, මෝතොමෝ ජාතියයි කියනුලැබේ.

**ජරාතොමෝ** කවරක් වන්නී ද?-ඒ ඒ සත්ත්වනිකායෙහි උපන් ඒ ඒ සත්ත්වයන්ගේ යම් ජරාවක්තොමෝ වන්නී ද, ඒ ජරාවෙන් සත්ත්වයන් දිරණබව ද සත්ත්වයා තරුණකල දනතයෝ සුදුවෙත්, වයස මුහුකුරා යනකල්හි ක්‍රමයෙන් වර්ණවිකාරයටත් පැමිණී ඒ ඒ තැන දත් වැටීයන්නාහුය, එහෙයින් ප්‍රතිඝිතදනතස්වභාවය හැර

ඛණ්ඩදන්තයන් ඇතිබව ද, අනුක්‍රමයෙන් සුදුවූ කෙශ-ලොමයන් ඇතිබව ද, ජරානැමති වාතප්‍රහාරයෙන් ශරීරයෙහි මස්-ලේ වියලී ගිය බැවින් ඇඟසම්පිට රැලි නැඟීමෙන්වූ වලිතබව ද, යම්සේ ලොකයෙහි උදක-වාත-ගිනිආදින්ගේ වැදී ස්පර්ශවීමෙන් තෘණ-වෘක්‍ෂාදීහු සිඳී බිඳී ද, විනාසපත්වූකල එසේ විනාසවගියතැන් යම්සේ ප්‍රකාශ වන්නේ ද, ඒ තෘණාදීහු ප්‍රකාශව එහි නොපැණේද්ද, එමෙන් ඛණ්ඩදන්තාදිවශයෙන් සත්වයාගේ ශරීරයෙහි පෙණීගිය ජරාව ද, ඔහුගේ ආයුෂයාගේ හානිඃපිණිස ම වන්නේය, එසේවූ ආයුෂයාගේ සංහානිය ද, සත්වතෙම ලදරුකල චක්‍ෂුරාදිඉන්ද්‍රියයන් ප්‍රසන්නබැවින් තමහට විෂයවූ සැපසේ දර්ශනාදි ඒ ඒ ක්‍රියාවෙහි යොදන ඉන්ද්‍රියයෝ ජරාවට පැමිණ මුහුකුරා ගියකල ඇලලී පැහැදීමක් නොව තමාට අවසගබැවින් පෙර විෂයවූ ද මහත් අරමුණු පවා ගන්ට සමර්ථ නොවන්නාහුය, එසේවූ චක්‍ෂුරාදිඉන්ද්‍රියයන්ගේ මුහුකුරාගියබව ද, යන මේ කාරණයතෙම ලොව හැමට ප්‍රකාශව පෙණෙනහෙයින් (ප්‍රකට) ජරායයි කියනු ලැබේ.

**ව්‍යාධියතෙම** කවරේ ද?—වාතසමුත්ථානාදි අටකාරණයෙන් උපදනාවූ චක්‍ෂුරොගාදි රොගයෝ ද, ශීත-උෂ්ණාදි ස්වාභාවික රොගයෝ ද, ශරීරයට පීඩා කරණහෙයින් රිදීම කරණහෙයින් ව්‍යාබාධ කරණහෙයින් ව්‍යාධියයි කියනුලැබේ.

**මරණයතෙම** කවරේ ද?—ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්වනිකායෙන් සම්මුතිවචනවශයෙන්වූ යම් මරණයකට පැමිණ ඒ සත්වයාගේ ච්‍යුතවීමෙක් ඇද්ද, ඒ චුතවීම ම ජීවිතයාගේ තොරවීමය යන බවයි, පරමාර්ථවචනහෙයින්-බ්‍රහ්ම-දිව්‍ය-මනුෂ්‍යාදින්ගේ වශයෙන් එකකදෙක පස්කදෙක යන ස්කන්ධයන්ගේ බිඳීමය, රූපස්කන්ධාදින්ගේ අතුරුදන් වීමය, ක්‍ෂණිකමරණ නොව සම්මුතිමරණීන් මිය යාමය, (මරණ)කාලක්‍රියාවය, කලෙබරය යන නම්ලද ශරීරයාගේ දැමීමය, යන මේ කාරණයතෙම මරණයයි කියනුලැබේ.

**ශොකයතෙම** කවරේ ද?—නෑයන්ට වන ඥාතිව්‍යශනය, කෲරවූ වෙදනා ඇති රොගපැමිණීමෙන් වන රොගව්‍යශනය, යනාදි නොයෙක් ප්‍රභෙද ව්‍යශනයන් අතුරෙන් එක්තරාව්‍යශනයක්හුගේ වැද ගැන්මෙන් සමන්විතවූ සත්වයාගේ ද, සිරගෙයි බැඳ සිටුවාලීම් ආදී නානාප්‍රකාරවූ දුඃඛධම්මයන් අතුරෙන් එක්තරා දුඃඛකාරණයෙක් පැමිණ ඒ දුඃඛකාරණය ස්පර්ශව වැලඳගන්නාහුගේ ද, ශොචනලක්‍ෂණවූ යම් ශොකයෙක් ඇද්ද, ඒ ශොකය වනාහි සත්වයාගේ අභ්‍යන්තරවූ සිත්හි ඉපිද ශරීරය ඇතුළතින් වියලීම ස්වභාවකොට ඇත්තේය, ඒ ශොචිතභාවයතෙම යම්හෙයකින් මුඛ-නාශා-කන්සිදුරු ආදී ශරීරය ඇතුළතින් වියලා උපදනේ ද, එහෙයින් ම අන්තොසොක නම්වූ ඒ සොකය ඇතුළත විශෙෂයෙන් යම් වියලීමෙක් ඇද්ද, මේ කාරණයතෙම ශොක යයි කියනුලැබේ.

**පරිදෙවයතෙම** කවරේ ද?—ඥාතිව්‍යසන-රොගව්‍යසන-භොගව්‍යසනාදි එක්තරා ව්‍යසනයෙකින් සමන්විතවූ සත්ත්වයාගේ හෝ සිරගෙයි ලීම් ආදි එක්තරා දුඃඛකාරණයෙකින් ස්පෘෂ්ටවූ පුද්ගලයාගේ හෝ හඬන කල "මාගේ දියනියෝය, මාගේ පුතනුවෝය" යනාදි ක්‍රමයෙන් ඒ ඒ වස්තුයෙහි නම් පමණ කියා හඬන්නාවූ ආදෙවය, එසේ ම කිසි දුඃඛකාරණයෙකින් හඬනකල "මාගේ දියනිතොමෝ මෙබඳුගුණ ඇත්තිය, මෙබඳු රුවක් ඇත්තිය" යනාදි ක්‍රමයෙන් අරමුණුවූ ඒ ඒ වස්තුවෙහි ගුණවර්ණනා කොට (කියකියා) හඬන්නාවූ පරිදෙවය, කියන ලද ක්‍රමයෙන් ම හඬන්නාවූ ආදෙවස්වභාවය ම ආදෙවිතත්ත්ව නම් විය, එසේ ම පරිදෙවස්වභාවය ම පරිදෙවිතත්ත්ව නම් විය, නාමමාත්‍රය සඳහන් කිරීමෙන් හැඬීම ලක්ෂණවූ ආදෙවනය, ඒ ඒ ගුණවර්ණනා කිරීමෙන් හැඬීම ලක්ෂණවූ පරිදෙවනය, යන මේ කාරණයතෙම "පරිදෙව" යයි කියනුලැබේ.

**දුඃඛය** නම් කවරේ ද?—කායප්‍රසාදයට වස්තුවූ විරුද්ධ-අහිතස්පෘෂ්ටයන්ගේ වැදගැන්මෙන් ඉවසීම දුෂ්කරහෙයින්=දුඃඛ නම්වූ යම් කායිකාදුඃඛයෙක් ඇද්ද, ඒ දුඃඛය වනාහි කායිකවූ අමධුර-අසාධු කාරණයෙක කාය හා එක්ව ස්පෘෂ්ට වීමෙන් උපදනාවූ අතිකර්කශවූ අමධුරාකාරයෙන් ම වින්දයුතුවූ දුකසේ ම ඉවසන අර්ථයෙන්=දුඃඛ නම්වූ කයෙහි උපදනා මේ කායිකදුඃඛය යන කාරණයතෙම "දුඃඛ" යයි කියනුලැබේ.

**දෞර්මනස්‍ය** නම් කවරේ ද?—චිත්තය හා සම්බන්ධව උපදනාබැවින් චෛතසිකවූ යම් දුඃඛයෙක් ඇද්ද, ඒ දුඃඛය වනාහි අමධුර-අමනොඥ-නොසතුටු-විරුද්ධකාරණයන්ගේ චිත්තය හා එක්වීමෙන් ම උපදනේය, එහෙයින් ම චෛතසිකදුඃඛ නම්වූ මිහිරු නොව අමධුර සේ වින්දයුතු මේ දෞර්මනස්‍යයතෙම "දෞර්මනස්ස" යයි කියනුලැබේ.

**උපායාසය** කවරේ ද?—ඥාතිව්‍යසනාදි එක්තරා ව්‍යසනයෙකින් සමන්විතවූ සිරගෙයි පය මසාත්බිම් ආදිකොට ඇති එක්තරා දුඃඛකාරණයෙකින් ස්පෘෂ්ටවූ සත්ත්වයාගේ ඒ දුක් නැමති ඔඝයෙහි සංසීදන-විසීදනාකාරයෙන් පැවති චිත්තයාගේ කලාන්ත වීමෙන් උපදනාවූ බලවත් යම් ආයාසයෙක් ඇද්ද, ඒ ආයාසය ම ආයාසිතත්ත්ව නම් විය, හෙවත් එසේවූ බලවත් ආයාසයෙන් සිත එකඟ කොට ගත නොහී කලාන්ත වීමය යන යමෙක් ඇද්ද, ඒ උපායාසය ම උපායාසිතත්ත්ව නම් විය, ඒ උපායාසබවය යන මේ කාරණයතෙම "උපායාස" යයි කියනුලැබේ.

**යම් කැමතිදෙයක්හුගේ නොලැබීමෙන් වන දුක** කවරේ ද?—සසර නොයෙක්ජාතිවල පිළිසිඳගන්නා ජාතිස්වභාවය ඇත්තාවූ සියලුදුකට කාරණහෙයින්=විෂනම් ලද පංචකාමවිෂයෙහි විශෙෂයෙන් ඇලී පවත්නාහෙයින් සක්ත-විසක්තාර්ථයෙන් සත්ත්ව නම්වූ සියලු සත්ත්වයන්ට මෙසේවූ තෘෂ්ණාචිත්තයෙක් උපදනේය, ඒ කෙසේ ද?—

"අපි සියලු ම දුකට මුල්වූ සිටි ජාතිස්වභාව නැති වීමු නම් ඉතා යෙහෙකා, අපට එකාන්තයෙන් ජාති නොආයේ වීනම් ඉතා යෙහෙකැයි" යන යම් කල්පනාවෙක් ඇද්ද, මේ කාරණය කැමති සේ පැමිණිය යුතු නොවේ, එහෙයින් මේ ද කැමතිදෙයක්හුගේ නොලැබීමෙන් වන දුකෙක් වන්නේය.

ජරායෙන් දිරයන ශරීරස්වභාවය ඇත්තාවූ සත්වයන්ට මෙසේවූ තණ්හාචිත්තයෙක් උපදනේය, ඒ කෙසේ ද?—"අපි යට කියනලද ක්‍රමයෙන් ඛණ්ඩදන්ත-වලිත-පලිතාදි ස්වභාවයෙන් සිටි ජරාස්වභාවයට නොපැමිණියමෝ නම් ඉතා යෙහෙකා, අපට එකාන්තයෙන් එසේවූ ජරා නොආයේ වී නම් ඉතා යෙහෙකැයි" යන මේ කාරණය කැමතිපරිද්දෙන් පැමිණියයුතු නොවේ, එහෙයින් මේ ද කැමති දෙයක්හුගේ නොලැබීමෙන් වන දුකෙක් වන්නේය.

කෲරවූ වේදනා ඇති කායික-චෛතසික දුඃඛයට ම කාරණවූ අනෙකප්‍රකාරව්‍යාධීන්ගෙන් පෙළෙන ස්වභාව ඇත්තාවූ සත්වයන්ට මෙසේවූ තණ්හාචිත්තයෙක් උපදනේය, ඒ කෙසේ ද?—"අපි ජීවිත විනාශාදි නොයෙක්දුකට කාරණවූ ව්‍යාධි නැති වීමු නම් ඉතා යෙහෙකා, අපට එකාන්තයෙන් ව්‍යාධි නොපැමිණියේ වීනම් ඉතා යෙහෙකැයි" යන මේ කාරණය සත්වයන් කැමතිපරිද්දෙන් පැමිණියයුතු නොවේ, එහෙයින් මේ ද කැමතිදෙයක්හුගේ නොලැබීමෙන් වන දුකෙක් වන්නේය.

මරණයට පැමිණෙන ස්වභාව ඇත්තාවූ සකලප්‍රාණීන්ට මෙසේවූ තණ්හාචිත්තයෙක් උපදනේය, ඒ කෙසේ ද?—"අපි මරණයට පැමිණෙන ස්වභාව නැති වීමු නම් ඉතා යෙහෙකා, අපට එකාන්තයෙන් මරණය නොපැමිණියේ වීනම් ඉතා යෙහෙකැයි" යන මේ කාරණය වනාහි කැමතිපරිද්දෙන් පැමිණියයුතු නොවේ, එහෙයින් මේ ද කැමතිදෙයක්හුගේ නොලැබීමෙන් වන දුකෙක් වන්නේය.

ශෝකයට පැමිණෙන ස්වභාව ඇත්තාවූ සත්වයන්ට මෙබඳු තණ්හාචිත්තයෙක් උපදනේය, ඒ කෙසේ ද?—"අපි සත්වසන්තානයෙහි තමා උපන්කල ඔහුගේ කටය දිවය තල්ලය ගලය කන්-නාසාසිදුරුය යනාදි ඇතුළු ශරීරය වියලවනකාරණයෙන්=ශෝක යයි ලද නම් ඇති දුඃඛකාරණවූ ශෝකස්වභාවයට නොපැමිණියමෝ නම් ඉතා යෙහෙකා, අපට එකාන්තයෙන් එසේවූ ශෝකයතෙම නොපැමිණියේ වීනම් ඉතා යෙහෙකැයි" යන මේ කාරණය ද වනාහි කැමතිපරිද්දෙන් පැමිණියයුතු නොවේ, එහෙයින් මේ ද කැමති දෙය නොලැබීමෙන් වන දුකෙක් වන්නේය.

හැඬීම්-වැලපීම ස්වභාව කොට ඇත්තාවූ සත්වයන්ට මෙබඳු තණ්හාචිත්තයෙක් උපදනේය, ඒ කෙසේ ද?—"අපි හැඬීම්-වැලපීම් යන පරිදෙවස්වභාවය නැති වීමු නම් ඉතා යෙහෙකා, අපට හැඬීම්-වැලපීම නොපැමිණියේ වීනම් ඉතා යෙහෙකැයි" යන මේ කාරණ

ය ද වනාහි කැමතිපරිද්දෙන් පැමිණියයුතු නොවේ, මේ ද කැමති දෙය නොලැබීමෙන් වන දුකෙක් වන්නේය.

කායිකදුඃඛස්වභාව ඇත්තාවූ සත්වයන්ට මෙබඳු තණ්හාචිත්ත යෙක් උපදනේය, ඒ කෙසේ ද?—"අපි සත්වයාවිසින් ඉවසීම දුෂ්කර කාරණයෙන්=දුඃඛ නම්වූ දුඃඛස්වභාවය නැති වීවූ නම් ඉතා යෙහෙ ක, අපට එකාන්තයෙන් දුක් නොපැමිණියේ වීනම් ඉතා යෙහෙකැ යි" යන මේ කාරණය ද වනාහි සත්වයා කැමතිපරිද්දෙන් පැමිණිය යුතු නොවේ; එහෙයින් මේ ද කැමතිදෙය නොලැබීමෙන් වන දුකෙක් වන්නේය.

දෞර්මනස්සස්වභාව ඇත්තාවූ සත්වයන්ට මෙබඳු තණ්හාචිත්ත යෙක් උපදනේය, ඒ කෙසේ ද?—"අපි දෞර්මනස් ස්වභාව නැති වීවූ නම් ඉතා යෙහෙක, අපට එකාන්තයෙන් දෞර්මනස් ස්වභාව නොපැ මිණියේ වීනම් ඉතා යෙහෙකැයි" යන මේ කාරණය වනාහි කැම තිපරිද්දෙන් පැමිණිය යුතු නොවේ, එහෙයින් මේ ද කැමතිදෙයක් හුගේ නොලැබීමෙන් වන දුකෙක් වන්නේය.

සිත එකඟ වීය නොහී බලවත් ආයාසවශයෙන් උපදනා උපායා සස්වභාව ඇත්තාවූ සත්වයන්ට මෙබඳු තණ්හාචිත්තයෙක් උපදනේ ය, ඒ කෙසේ ද?—"අපි සිඟිවූලාව දියයට ඔබ්නොබ ගැලී යාමෙන් සිත එකඟ නොව වෙහෙසෙන්නෙකු සේ යම්සේ කිසිදුකකට පැමි ණි චිත්තයාගේ කලාන්ත වීමය යන උපායාසස්වභාව නැති වීවූ නම් ඉතායෙහෙක, අපට එසේවූ උපායාසය එකාන්තයෙන් නොපැමිණි යේ වීනම් ඉතා යෙහෙකැයි" යන මේ කාරණය වනාහි කැමතිපරිද් දෙන් පැමිණිය යුතු නොවේ; එහෙයින් මේද කැමතිදෙය නොලැ බීමෙන් වන දුකෙක් වන්නේය.

කවරනම් **උපාදානස්කන්ධයෝ පස්දෙනෙක්** දුක් වන්නාහු ද?—රූපොපාදානස්කන්ධය, වෙදනොපාදානස්කන්ධය, සංඥොපාදානස්ක න්ධය, සංස්කාරොපාදානස්කන්ධය, විඥානොපාදානස්කන්ධය, යන මොහු පස්දෙනායි.

මේ පඤ්චස්කන්ධයන් අතුරෙන් **රූපස්කන්ධය** නම්:—පඨවිධාතු-ආපොධාතු-තෙජොධාතු-වායොධාතු,—චක්ඛු—සොත-ඝාණ-ජිව්හා-කාය,-රූප-ශබ්ද-ගන්ධ-රස,-ස්ත්‍රීත්ව-පුරුෂත්ව,-හෘදයවස්තු,—ජීවිතෙ න්ද්‍රිය,-ආහාර,-ආකාශධාතු,-කායවිඥප්ති-වච්විඥප්ති,-ලහුතා-මුදුතා-කම්මඤ්ඤතා,-උපචය-සන්තති-ජරතා-අනිච්චතා, යයි කියා විසිඅට විධ වේ.

එයින්,-හිසකේ-ලොම්-නිය-දත්-සම්-මස්-නහර-ඇට-ඇටමිදුලු-වකුගඩු-හෘදයවස්තු-අක්මා-දලබු-බඩදිවු-පපු-බඩවැල්-අතුණුබහන්-උදර-අසූචි-හිස්මුල් යන විසිකොට්ඨාසය **පඨවිධාතු** නම් වේ.

පිත්-සෙම්-සැරව-රුධිර-ඩහදිය-මේදතෙල්-කඳුලු-වුරුණුතෙල්-කෙල-සොටු-සඳමිදුලු-මූත්‍රය යන දොළොස් කොට්ඨාසය **ආපොධාතු** නම් වේ.

මාංසයන් කුණු නොවන සේ ලුණක් මෙන් මේ ශරීරය කුණුවීය නොදී පවත්නා උෂ්ණගතියෙක් ඇද්ද, හෙවත් යම් තෙජෝගුණය කින් මේ ශරීරය සන්තාපන-සොක-පරිදෙවාදිය ඇතිවූකල තැවේ ද, යම් තෙජෝගුණයකින් මේ ශරීරය දවා ද, යම් තෙජෝගුණයකින් ශරීරය ජරාවට පමුණුවා ද, යම් තෙජෝගුණයකින් කෑ බී අනුභව කල රස විඳගත් සියලු ම ආහාරජාතීහු පැසෙද්ද, යන මේ සතරකොට්ඨාසගතවූ උෂ්ණගතියෙක් ඇද්ද, ගේ **තෙජොධාතු** නම් වේ.

මේ ශරීරය දණ්ඩක් මෙන් සිටිය නොදී ඒ ඒ ක්‍රියාවෙහි පවත්වන්නාවූ යම් වායුගුණයෙක් ඇද්ද, හෙවත් දෙපතුල පටන් සිරස දක්වා පවත්නාවූ ඌර්ධ්වගම නම් වාතය ද, සිරස පටන් දෙපතුල දක්වා පවත්නා අධොගම නම් වාතය ද, කුක්ෂිගතව බඩවැල පිටත හැසිරෙණ කුක්ෂිගත නම් වාතය ද, බඩවැලඇතුළත හැසිරෙණ කොට්ඨසය නම් වාතය ද, දෙඅත්-දෙපාආදිවූ අඞ්ගප්‍රත්‍යඞ්ගයන් ඇසුරු කරණ අඞ්ගමඞ්ගානුසාරී නම් වාතය ද, ඉහල-පහල නගණ ආශ්වාස-ප්‍රාශ්වාස නම් වාතය ද, යන මේ ෂඩ්විධවාතය ප්‍රධාන කොට ඇති මේ ශරීරය ගමන-පචන-භොජනාදි සියලු ක්‍රියාවෙහි පවත්වන චිත්තක්‍රියාවායොගුණයෙක් ඇද්ද, ගේ **වායොධාතු** නම් වේ.

නිල-පීතාදි රූපදර්ශනයට කාරණවූ චක්ෂුඃප්‍රසාදය ද, භෙරී-වීණා-මෙඝගර්ජනාදි ශබ්දශ්‍රවණයට කාරණවූ ශ්‍රොත්‍රප්‍රසාදය ද, සුගන්ධ-දුර්ගන්ධාදිය ආඝ්‍රාණයට කාරණවූ ඝ්‍රාණප්‍රසාදය ද, ආහාර-පානාදි රසාස්වාදයට කාරණවූ ජිහ්වාප්‍රසාදය ද, වස්ත්‍රා 'භරණ-ස්ත්‍රී-පුරුෂාදි ස්පර්ශග්‍රහණයට කාරණවූ කායප්‍රසාදය ද, යන මේ **ප්‍රසාදරූප** පස ද.

චක්ෂුසට ගොචරවූ රූපාලම්බනය ද, ශ්‍රොත්‍රයට ගොචරවූ ශබ්දාලම්බනය ද, ඝ්‍රාණයට විෂයවූ ගන්ධාලම්බනය ද, දිවට විෂයවූ රසාලම්බනය ද, කායෙන්ද්‍රියට විෂයවූ ස්පර්ශාලම්බනය ද, යන **විෂයරූප** පස ද.

ස්ත්‍රීභාවය, පුරුෂභාවය, මනොවිඥානධාතූන්ට ආධාරවූ හෘදය වස්තුව හා දෙහස්ථිතියට කාරණවූ රූපජීවිතෙන්ද්‍රිය ද.

දෙකන්සිදුරු-නාසාබිල-මුඛවාර-උගුර-මල-මූත්‍රමාර්ගයෝය යන අටසිදුරු හා කන-බොනදෙය පිහිටන උදරපටලය යන මේ නවය **ආකාශධාතු** නම් වේ.

කයින් අභිප්‍රාය අඟවන්නාවූ කායවිඥප්තිය ද, වචනයෙන් අභිප්‍රාය අඟවන්නාවූ වාග්විඥප්තිය ද,

දවසක් මුලුල්ලෙහි ගින්නෙන් රත්වූ යකඩකදක් මෙන් ශරීරයාගේ සැහැල්ලුබව යයි කියනලද කායලඝුත්වය ද, සුමර්දිතචර්මයක් මෙන් නොදැඩිබව යයි කියනලද කායමෘදුත්වය ද, යහපත් කොට ගින්නෙන් තැවූ ස්වර්ණයක් මෙන් ශරීරයෙන් ඒ ඒ කටයුතුක්‍රියාවට අනුකූලබව යයි කියනලද කායකර්මණ්‍යතාව ද,

ගඟබොඩ කැපූ කූපයාගේ පරිපූර්ණොදකොද්ගමනය මෙන් දූර-සන්තිකාදි එකාදශරූපායතනයන්ගේ මතුමත්තෙහි උත්පත්ති

වශයෙන් අභිවෘඩි යයි කියනලද උපචය ද, පරිපූර්ණවූ කූපයෙන් ඉහිරි උදකයාගේ පිටත ඉහිරී යාමක් මෙන් උක්තක්‍රමයෙන් උපචිත රූපයන්ගේ නැවතනැවතත් ප්‍රබන්ධාත්‍යන්තවශයෙන් ප්‍රවෘත්ති යයි කියනලද සන්තතිය ද, රූපයන්ගේ උත්පාදාවස්ථාවෙන් මත් තෙහි ජීර්ණවන භඩ්ගාභිමුඛාවස්ථාව යයි කියනලද ජරතාව ද, රූප යන්ගේ පරිභෙදස්වභාවවූ අනිත්‍යතාව දැයි, යන මේ අටවිසිරූපයෝ ශීතො'ෂ්ණාදීන් රූප්පනාර්ථයෙන් ඒකාරයට යේනුයි=**රූප** නම් වෙ යි; රාශ්‍යර්ථයෙන්=**රූපස්කන්ධ** නම් වේ.

### වෙදනාස්කන්ධය නම්.

ඉෂ්ටා'නිෂ්ට-මධ්‍යස්ථාලම්බනයෙක් වී නම් සවැදෑරුම්වූ ත්‍රිවිධ වෙ දනාව උපදනේය, (නොහොත්—මනාපවූ රූපයන් දැක සැපවෙද නාව උපදනේය, අමනාපවූ රූපයන් දැක දුඃඛවෙදනාව උපදනේය, ප්‍රියා'ප්‍රියවිරහිත භූමි-පර්වත-කැට-කැබිලිති ආදි මධ්‍යස්ථරූපයන් දැක උපෙක්‍ෂාවෙදනාව උපදනේය, මෙසෙයින් ම මනාපශබ්ද අසා—පෙ—මනාපගන්ධ ආඝ්‍රාණය කොට—මනාපරස වලඳා—සවිඥානක-අවිඥානක ප්‍රියවස්තු ස්පර්ශ කිරීමෙන්—මනාපදෙය සිතිමෙන් සැපවෙ දනාව උපදී, අමනාපවස්තු සිතිමෙන් දුක්වෙදනාව උපදී, මනාප-අමනාපවිරහිතවූ චින්තාවෙන් උපෙක්‍ෂාවෙදනාව උපදී,) මෙසේ නානාප්‍රකාරයෙන් විස්තාරයට ගියාවූ චක්‍ෂුරාදි සදොරින් උපදනා වෙදනාව **වෙදනාස්කන්ධ** නම් වේ.

### සංඥාස්කන්ධය නම්.

ඇසින් දුටු නිල-පීතාදිරූපයන් "මේ අසවල්රූපය" යනාදිවශ යෙන් හැඳිනීමය, එසේ ම කණින් ඇසූ භෙරි-වීණා-මෘදඞ්ගාදි ශබ්ද යන් වෙන් වෙන් කොට හැඳිනීමය, නාසායෙන් ආඝ්‍රාණය කළ සුගඳ-දුගඳ වෙන් වෙන් කොට හැඳිනීමය, දිව්න් විඳි රසයන් ලුණු-ඇඹුල්-පැණි-කිරි-තෙල්රසය යනාදිවශයෙන් වෙන් වෙන් කොට හැඳිනීමය, එසේ ම කයින් ස්පර්ශයන් ස්පර්ශ කොට "මේ සුඛස්පර්ශය" යනාදිවශ යෙන් තේරුම් කොට හැඳිනීමය, මනසින් ධර්මයන් චින්තනය කො ට "මේ අසවල්දෙය මේ අසවල්දෙය" යී යනාදිවශයෙන් වෙන් වෙන් කොට සිහිවිලි හැඳිනීමය, යන මේ ෂඩ්විධවූ සංඥාව **සංඥාස්කන්ධ** නම් වේ.

### සංස්කාරස්කන්ධය නම්.

"සංඛාරා චෙතනා ඵස්සා මනක්කාරා'පු-සණ්ඨිති,
තක්කො විචාරො වායාමො පීති ජන්දො'ධිමොක්ඛකො.

සද්ධා සති හිරො'ත්තප්පං චාගො මෙත්තා මති පුන,
මජ්ඣත්තතා ච පස්සද්ධි කාය-චිත්තවසා දුවෙ.

ලහුතා මුදු-කම්මඤ්ඤ-පාගුඤ්ඤ-උජුතා තථා,
දයා මුදා සම්මවාචා කම්මන්තා'ජීවසංවරො.

ලොභො දොසො ච මොහො ච දිට්ඨි උද්ධච්චමෙවච,
අහිරීකමනොත්තප්පං විචිකිච්ඡිතමෙවච.

මානො ඉස්සා ච මච්ඡරං කුක්කුච්චං ථීන-මිද්ධකං,
ඉති එතානි පඤ්ඤාස සංඛාරක්ඛන්ධසඤ්ඤිතා"ති.

1—ගොවියකු තමන් යහලුවන් පනස්පස්දෙනෙකු සීසෑම්-ගොයම්කැපීම් ආදියකට තමන් කුඹුරට ගියේ සෙසු පනස්පස් දෙනාට වඩා ඕනෑකමින් මහත් උත්සාහයෙන් යෙදී ඒ ඒ කටයුතු කෙරේ ද, එපරිද්දෙන් සෙසු පනස්පස්ධම්මයන්ට වඩා මහත්උත්සාහවත් ලක්ෂණයෙන් යුක්තව ඒ සියලුධම්මයන් ආරම්මණයෙහි අසුරුවන්නාවූ **චේතනාව** ද.

2—උදෑසන්හි භිත්තිආදියෙහි පැතිර වැද ස්පර්ශවන අව්වරශ්මියක් සේ ප්‍රථම කොට චක්ෂුඃ-ශ්‍රොත්‍රාදීන් රූප-ශබ්දාදිය දැක අසා ඒ ඒ අරමුණු ස්පර්ශ කරණ ස්පර්ශය ද.

3—අජානියඅශ්වයන් මෙහෙයන්නාවූ සාරථියක්හු මෙන් සහජාතධම්මයන් ආලම්බනාභිමුඛ කොට මෙහෙයන්නාවූ **මනස්කාරය** ද.

4—උත්පලාදීන්ට ජලය මෙන් සහජාතඅරූපධම්මයන් පරිපාලනයෙහි ආධිපත්‍යය කරණ ආයුසංඛ්‍යාත **ජීවිතෙන්ද්‍රියය** ද.

5—යුධමණ්ඩලයට මහානරේන්ද්‍රයෙකු පිරිවරාගෙණ ගිය සෙනගක් ඒ මහරජ්ජුරුවන් වැඩියතැනට ම යෙද්ද, ඒ සියලු සෙනග එකරැශි කිරීමට ප්‍රධානවූ නරේන්ද්‍රයක් සේ ඵස්සාදි සෙසු සියලුධම්මයන් විසිරයා නොදී එක්ආරම්මණයෙක සම්පිණ්ඩනය කරණ **චිත්තෛකාග්‍රතාව** ද.

6—ඝණ්ටාවෙහි ප්‍රථම වදින පහරක් මෙන් අරමුණට ප්‍රථම කොට චිත්තය නැගීම ලක්ෂණ කොට ඇති **විතර්කය** ද.

7—ඒ පහරින් නැංගාවූ රාවය ඝණ්ටාවෙහි පවත්නා සේ විතර්කයෙන් අරමුණට නැගී චිත්තයාගේ නැවත නැවත පවත්නා ලක්ෂණස්වභාවවූ **විචාරය** ද.

8—සියලු කටයුතු කෘත්‍යයෙහි පසුබට නොවන යොධභටයෙකු සේ හැම ක්‍රියායෙහි උත්සාහවත් ලක්ෂණවූ **වීර්‍ය්‍යය** ද.

9—පැන් නැති ග්‍රීෂ්මකාලයෙහි කාන්තාරමාර්ගයෙහි පිපාසායෙන් මිරිකී යන පුරුෂයෙක්හට පස්පියුමෙන් ගැවසුනු සිහිල්පැන් පොකුණක් දැක උපදනා චිත්තපීනනය සේ ඉෂ්ටාරම්මණයෙහි උපදනා **චිත්තප්‍රීතිය** ද.

10—ආරම්මණග්‍රහණයෙහි සිතින් අත දිගු කරන්නාක් මෙන් කර්තුකාම්‍යතාලක්ෂණ **ඡන්දය** ද.

11—නිශ්චලවූ ඉන්ද්‍රකීලයක් මෙන් අරමුණෙහි සන්නිෂ්ඨාන ලක්ෂණවූ **අධිමොක්ෂය** ද.

12—චක්‍රවර්තිරජුගේ චතුරඞ්ගිණීසෙනාගමනින් කැලඹීගිය මඩජලයක් ප්‍රසන්න කරණ උදකප්‍රසාදමාණික්‍යරත්නයක් මෙන් ලොභාදිචිත්තක්ලෙශයන් පහදවන ලක්ෂණවූ **ශ්‍රද්ධාව** ද.

13—මහරජක්හට කළමනා-නොකළමනා සියලු ම කටයුතු සඳහන් කරවන විශ්වාසඅමාත්‍යයෙකු සේ අකුශලධර්මයන් හරින සේ ද කුශලධර්මයන් කරණ සේ ද සිහි කරවන ලක්‍ෂණවූ **ස්මෘතිය** ද.

14—අකුශලක්‍රියාවෙහි ලජ්ජාස්වභාවවූ **හිරිය** ද.

15—අකුශලක්‍රියාවෙහි භයස්වභාවවූ **ඔත්තප්පය** ද.

16—පියුම්පත්‍රයෙහි පතිත ජලබිඳුවක් සේ දුටු-ඇසූ කිසිඅරමුණෙක ඇලීම නොකරන්නාවූ **අලොභය** ද.

17—අනුකූලමිත්‍රයෙකු සේ අවිරුද්ධස්වභාවවූ **අද්වෙෂය** ද.

18—අන්ධකාරයෙහි රූපයන් ප්‍රකාශකරණ ප්‍රදීපයක් සේ අවිද්‍යාන්ධකාරය විධ්වංසනය කොට සියලු හොඳ-නොහොඳ ප්‍රකාශ කරණ ලක්‍ෂණවූ **ප්‍රඥාව** ද.

19—සම්ප්‍රයුක්ත චෛතසිකධර්මයන් ස්වකීයකෘත්‍යයෙහි සමප්‍රවෘත්තියට හෙතුවූ **තත්‍රමධ්‍යස්ථතාව** ද.

20—වෙදනාදිස්කන්ධත්‍රයාගේ දරථ යයි කියනලද ඖද්ධත්‍යාදි කෙලශයන් සන්සිඳුවන **කායප්‍රශ්‍රබ්ධිය** ද.

21—විඥානස්කන්ධයාගේ දරථ යයි කියනලද ඖද්ධත්‍යාදි කෙලශයන් සන්සිඳුවන **චිත්තප්‍රශ්‍රබ්ධිය** ද.

22—එසේ ම කාමච්ඡන්දාදි කෙලශයන් සන්හිඳුවන **කායලහුතාව** ද.

23—ථිනමිද්ධාදි කෙලශයන් සන්සිඳුවන **චිත්තලහුතාව** ද.

24—දෘෂ්ටි-මානාදින් සන්හිඳුවන **කායමෘදුත්වය** ද.

25—දෘෂ්ටි-මානාදින් ම සන්හිඳුවන **චිත්තමෘදුත්වය** ද.

26—කාමච්ඡන්දාදි කෙලශයන් සන්හිඳුවන **කායකර්මණ්‍යතාව** ද.

27—කාමච්ඡන්දාදින් ම සන්හිඳුවන **චිත්තකර්මණ්‍යතාව** ද.

28—අශ්‍රද්ධාදින් සන්හිඳුවන **කායප්‍රාගුණ්‍යතාව** ද.

29—අශ්‍රද්ධාදින් ම සන්හිඳුවන **චිත්තප්‍රාගුණ්‍යතාව** ද.

30—කායසංඛ්‍යාතවූ වෙදනා-සංඥා-සංස්කාර යන ස්කන්ධත්‍රයාගේ කුටිලභාවකරවූ මායා-ශාඨ්‍යාදි අකුශලයන් සන්හිඳුවන **කායඍජුත්වය** ද.

31—මායා-ශාඨ්‍යාදි අකුශලයන්ම සන්හිඳුවන **චිත්තඍජුත්වය**ද.

32—දුඃඛිතසත්වයන්ගේ දුක් පහකරණු කැමැත්තාවූ **කරුණාව** ද.

33—පරලාභ-සත්කාර-ගරුකාර-ප්‍රශංසායෙහි මොදනලක්‍ෂණවූ **මුදුතාව** ද.

34—බොල් සුලඟෙහි හැර වීයක් රැස් කරණ ගොවියෙකු සේ මුසාවාදාදිය දුරු කොට වාක්සත්‍යාදිය පැවැත්වීම ලක්‍ෂණවූ **සම්‍යග්වචනය** ද.

35—අශුචි-මල-මූත්‍රාදිය අතගාන ළදරුවෙකු සේ නොකොට කළමනා සාරවත් කටයුතු කරණ ප්‍රඥාවන්තයෙකු සේ යහපත් කායකර්මස්වභාවවූ **සම්‍යක්කර්මාන්තය** ද.

36—රත්රන් දවා ශුද්ධ කරණ ස්වර්ණකාරයෙකු සේ ජීවිකාව පිරිසිදු කරණ ලක්‍ෂණවූ **සම්‍යගාජීවය** ද.

37—රූප-ශබ්දාදීයෙහි පංචේන්ද්‍රියයන් ඇලීම ලක්ෂණ කොට ඇති **ලෝභය** ද.

38—දණ්ඩෙන් ගැසූ නයෙක් කිපෙන්නා සේ කිපීම ලක්ෂණ කොට ඇති **ද්වේෂය** ද.

39—චතුස්සත්‍යය නොදන්නා **මෝහය** ද.

40—"මෙලෝ-පරලෝ නැත"යනාදින් ගන්නා **මිථ්‍යාදෘෂ්ටිය** ද.

41—සිත නොසන්සිඳුවනබව ලක්ෂණවූ **උද්ධච්චය** ද.

42—ග්‍රාමශූකරයා අශුචියට කැත නැත්තා සේ පාපයට ලජ්ජා නැති ලක්ෂණවූ **අහිරිකය** ද.

43—ප්‍රදීපයට සලභයා නොබා පනින්නා සේ පාපයට භය නැති ලක්ෂණවූ **අනොත්තප්පය** ද.

44—බුද්ධ-ධම්ම-සංඝ-ශික්ෂා-පූර්වාන්ත-අපරාන්ත--ඉදප්පච්චයතා ප්‍රත්‍යය සමුත්පන්නධර්මය යන අටතැන සැක සිතන්නාවූ **විචිකිච්ඡාව** ද.

45—"මම සියල්ලට වැඩිතරමැයි" සිතන්නාවූ **මානය** ද.

46—අනුන්කෙරෙහි කරණ **ඊර්ෂ්‍යාව** ද.

47—තමාගේ "සියලු ඓශ්වර්ය්‍ය වෙනකෙනෙකුට නොවේවා" යි සිතන්නාවූ **මාත්සර්ය්‍යය** ද.

48—කළ-නොකළදෙයෙහි පශ්චාත්තාපලක්ෂණවූ **කුක්කුච්චය** ද

49—චිත්තය හැකිලීම ලක්ෂණවූ **ථීනය** ද.

50—කායඅකර්මණ්‍ය ලක්ෂණවූ **මිද්ධය** ද.

යන මේ පනස් ධර්මයන්හා වේදනා-සංඥාවන් සමග දෙපනස් ධර්මයෝ **සංස්කාරස්කන්ධ** නම් වේ.

විඥානස්කන්ධය නම්.

ඇසෙහි උකුණුහිසක් ප්‍රමාණ අභිමුඛගත රූපයන් දක්නා චක්ෂුඃප්‍රසාදයෙන් දුටු නීල-පීත-සවර්ණාදි වර්ණයන් දැනගන්නා චක්ෂුර්විඥානය ද, ශ්‍රොත්‍රයෙහි සිඟින්තඹ මුන්දක් ප්‍රමාණවූ රෝමයෙන් නොයෙක් ශබ්ද අසා දැනගන්නා ශ්‍රොත්‍රවිඥානය ද, නාසිකාවෙහි එළුවන්ගේ පියවරසටහන බඳුවූ දුගඳ-සුගඳ ආඝ්‍රාණය කොට දැනගන්නාවූ ඝ්‍රාණවිඥානය ද, දිවෙහි මහනෙල්මල් පෙත්තකට බඳුවූ සටහන් ඇති නොයෙක් රස විඳින්නාවූ ජිහ්වාප්‍රසාදයෙන් රසයන් විඳ දැනගන්නා ජිහ්වාවිඥානය ද, කයින් ලැබූ ස්පර්ශයන් දැනගන්නාවූ කායවිඥානය ද, සිතින් සිතූ සිතිවිලි දැනගන්නාවූ මනොවිඥානය ද; යන මේ ෂඩ්විධවූ **විඥානය** ද.

සතරඅපායේ පිළිසඳ ගන්නාවූ අකුශලවිපාකඅහේතුකමනොවිඥානධාතුචිත්තය ද.

මිනිස්ලොව ජාත්‍යන්ධ-බධිර-උමතු-ගොළුආදි සත්ත්වයන්ගේ පිළිසඳ ගන්නාවූ කුශලවිපාකඅහේතුකමනොවිඥානධාතුචිත්තය ද.

දෙවියන් හා මිනිස්ලොව පින්වත්සත්ත්වයන්ගේ පිළිසිඳගැනීමට හේතුවූ සහේතුකකාමාවචරවිපාකසිත් අට ද.

රූපීබ්‍රහ්මලෝකයෙහි උපදවන රූපාවචරවිපාකසිත් පස ද.

අරූපීබ්‍රහ්මලෝකයෙහි උපදවන අරූපාවචරසිත් සතර ද.

ඉෂ්ටානුභවනලක්ෂණවූ මානසිකසුඛවෙදනාව හා එකොත්පාද
දිභාවයට ගියාවූ අනිත්‍යාදිධර්ම්ස්වභාව ඉක්ම නිත්‍ය-සුඛ-ශුභාදි
වශයෙන් විපරීතාභිනිවෙසස්වභාවවූ මිථ්‍යාදෘෂ්ටිය හා එකොත්පාද
දිප්‍රකාරයෙන් යුක්තවූ තමාවිසින් හෝ මෙරමාවිසින් හෝ කරණිල
ද පූර්වප්‍රයොගවිරහිතහෙයින් අසංස්කාරික එක් අකුශලචිත්තයෙක;
තමාවිසින් හෝ අන්‍යයන්විසින් හෝ කරණිලද පූර්වප්‍රයොගසහිතවූ
හෙයින් සසංස්කාරිකවූ එක් අකුශලචිත්තයෙක; සොම්නස් සහගත
වූ "කාමයෙන් ආදීනවයෙක් නැතැයි" යනාදීන් ගත් මිථ්‍යාදෘෂ්ටිය
හා අමිශ්‍රවූ අනික්කෙනෙකුන්විසින්[කරණිලද] උත්සාහයක් නැතිව
ස්වභාවතීක්ෂණවූ සිතින් ම කාමසෙවනාදිය කරණකල උපදනා අ
සංස්කාරිකවූ එක් අකුශලචිත්තයෙක; එසේ ම සොම්නස් සහ(ගතව)
ගියාවූ මිථ්‍යාදෘෂ්ටිය හා අමිශ්‍රව අනොත්සාහසහිතවූ සිතින් කාම
සෙවනාදිය හෝ [කරණකල]දෘෂ්ටමඞ්ගල්‍යාදිය හෝ "සාර යයි"ගත්
නාකල උපදනා සසංස්කාරිකවූ එක් අකුශලචිත්තයෙක; මධ්‍යස්ථා
නුභවනලක්ෂණවූ උපෙක්ෂාවෙදනාව හා එකොත්පාදාදිභාවයට ගියා
වූ විපරීතමිථ්‍යාදෘෂ්ටියෙන් සම්ප්‍රයුක්තවූ එක් අසංස්කාරිකඅකුශලචි
ත්තයෙක; එසේ ම සසංස්කාරිකවූ එක් අකුශලචිත්තයෙක; උපෙ
ක්ෂාසහගතවූ විපරීතමිථ්‍යාදෘෂ්ටිය හා මිශ්‍ර නොවූ අසංස්කාරිකවූ
එක් අකුශලචිත්තයෙක; උපෙක්ෂාසහගතවූ විපරීතමිථ්‍යාදෘෂ්ටිය හා
මිශ්‍ර නොවූ සසංස්කාරික එක් අකුශලචිත්තයෙක; යන මේ ලොභස
හගතවූ අකුශලචිත්තයෝ අටදෙන ද;—ප්‍රතිඝයෙන් සම්ප්‍රයුක්තවූ
වෙෂසහගතවූ අසංස්කාරික-සසංස්කාරික අකුශලචිත්තයෝ දෙදෙ
න ද;—උපෙක්ෂා සහගියාවූ බුද්ධාදි අටතන්හි "ඇද්දෝ හෝ නැද්දෝ
හෝයි" උපදනා සංශයලක්ෂණවූ විචිකිත්සාවෙන් සම්ප්‍රයුක්ත එක්
අකුශලචිත්තයෙක; රූප-ශබ්දාදියෙහි සිත නොසන්හුන්බවයයි කිය
නලද උද්ධච්චය හා එකොත්පාදාදිප්‍රකාරයෙන් යුක්තවූ එක් අකුශලචි
ත්තයෙක; යන මොමුහචිත්තයෝ දෙදෙන ද; යන මෙකී දොළොස්
අකුශලචිත්තයෝ ද.

උපෙක්ෂාවෙදනාව හා එකොත්පාදාදිභාවයට ගියාවූ රූපදර්ශන
යට කාරණවූ චක්ෂුඃප්‍රසාදය ආශ්‍රය කොට පවත්නාවූ චක්ෂුර්විඥානය ද;
එසේ ම ශ්‍රොත්‍රවිඥානය ද; ඝ්‍රාණවිඥානය ද; ජිහ්වාවිඥානය ද; දුඃඛසහ
ගතවූ කායවිඥානය ද; (උපෙක්ෂාසහගතවූ රූපාදින් තිරණය කෙරෙ
මින් උපදනා සන්තීරණචිත්තය ද); යන මේ අකුශලවිපාකචිත්තයෝ
සත්දෙන ද.

උපෙක්ෂාසහගතවූ රූපදර්ශනයට හෙතුවූ චක්ෂුඃප්‍රසාදය ආශ්‍රය
කොට පවත්නාවූ චක්ෂුර්විඥානය ද; ශ්‍රොත්‍රවිඥානය ද; ඝ්‍රාණවිඥානය ද;
ජිහ්වාවිඥානය ද; සුඛසහගතවූ කායවිඥානය ද; උපෙක්ෂාසහගතවූ
රූපාදි අරමුණු පිළිගන්නා සම්පටිච්ඡනචිත්තය ද; එසේ ම (පිළිගත්
රූප-ශබ්දාදි අරමුණු විමසන්නාවූ සන්තීරණචිත්තයයි කියනලදකුශ
ලවිපාකඅහෙතුකමනොවිඥානධාතුව ද;)සෞමනස්‍යසහගතවූ සැප

වෙදනා ඇති සන්තීරණචිත්තය ද; යන මේ අෂ්ටවිධ කුශලවිපාක අහෙතුකචිත්තයෝ ද.

උපෙක්ෂාසහගතවූ චක්ෂුරාදිපඤ්චද්වාරයෙහි වැදගත් රූපාදිඅරමුණට චිත්තසන්තතිය යොමු කරණ පඤ්චද්වාරාවර්ජනචිත්තය ද; උපෙක්ෂාසහගතවූ මනොද්වාරයට හමුවූ රූපාදිඅරමුණට චිත්තසන්තතිය යොමු කරණ මනොද්වාරාවර්ජනචිත්තය ද; සොම්නස් සහගතවූ අනෞදාරිකආලම්බනයෙහි රහතුන්ට සිනා උපදවන හසිතොත්පාද චිත්තය ද; යන මේ අහෙතුකක්‍රියාසිත් තුන ද;—යන මේ සමතිස් චිත්තයෝ ද.

නිර්මලානිසංස දක්නාබැවින් හා සඤ්ජාතමානසිකසුඛවෙදනාවෙන් යුක්තහෙයින් සොම්නස් සහගතවූ විශුද්ධශ්‍රද්ධාදි පඤ්චෙන්ද්‍රියයන්ගේ මුහු කිරීමෙන් ඥානසම්ප්‍රයුක්තවූ අන්‍යයන්ගේ උත්සාහයක් නැතිව සවකීයස්වභාවවූ සිතින් ම දාන-ශීලාදි පින් කරණකල උපදනා අසංස්කාරිකවූ එක් කුශලචිත්තයෙක; සොම්නස්සහගතවූ ඥානසම්ප්‍රයුක්තවූ "දන් දෙව, පින් කරව" යනාදීන් අන්‍යොත්සාහසහිතවූ සිතින් දානාදි පින් කරණකල උපදනා සසංස්කාරිකවූ එක් කුශලචිත්තයෙක; දෙමවු-පියන්ගේ පුණ්‍යක්‍රියාදර්ශනයෙහි සඤ්ජාතපරිචය ඇති බාලදාරකයෝ සඟුන් දුක සොම්නස් උපදවා වහා දිව ගොස් අත තිබූ කිසිවක් දන්දෙත් ද, වඳිද්ද, එකල ඔවුන්ට සොම්නස්සහගතවූ ඥානවිප්‍රයුක්තවූ අසංස්කාරික එක් කුශලචිත්තයෙක් උපදනේය; විශුද්ධශ්‍රද්ධා-බුද්ධිසම්පන්න සත්පුරුෂයෝ තමන් දරුවන් ලං කොට "පුතඹ අපබුදුන් සඟුන් වඳුව, පුදව" යනාදීන් උත්සාහසහිතවූවානු සතුටුව වඳිද්ද, පුදද්ද, එකල ඔවුන්ට සොම්නස්සහගතවූ ඥානවිප්‍රයුක්තවූ සසංස්කාරිකවූ. එක් කුශලචිත්තයෙක් උපදනේය; උපෙක්ෂාසහගතවූ ඥානසම්ප්‍රයුක්තවූ අසංස්කාරික-සසංස්කාරිකකුශලචිත්තයෝ දෙදෙනෙක; උපෙක්ෂාසහගතවූ ඥානවිප්‍රයුක්තවූ අසංස්කාරික-සසංස්කාරික කුශලචිත්තයෝ දෙදෙනෙක්; (බලවත් ශ්‍රද්ධාවය විශුද්ධදෘෂ්ටිය ආනිසංසදර්ශනය ප්‍රත්‍යයප්‍රතිග්‍රාහකය යන සොම්නස් ඉපදවීමට හෙතුවූ මෙ සතරඅඞ්ගවිකල්පයෙහි ම සොම්නස්රහිතවූ සිත් ඇති වෙද්ද, එකල මේ පසුව කී සතරසිත උපෙක්ෂාසහගතව උපදනේය,)යන මේ කාමාවචර කුසල්සිත් අට ද;—("සොමනස්සසහගතං" යනාදීන් කාමාවචරසහෙතුකකුසලසිත් අටෙක, විපාකසිත් අටෙක;) ක්‍රියාසිත් අටෙකැයි; කියා කාමාවචර කුසලසිත් සූවිස්සෙක.

විතර්කක-විචාර-ප්‍රීති-සුඛ-එකාග්‍රතාසහිතවූ ප්‍රථමධ්‍යානකුශලචිත්තය ද; විචාර-ප්‍රීති-සුඛ-එකාග්‍රතාසහිතවූ ද්විතීයධ්‍යානකුශලචිත්තය ද; ප්‍රීති-සුඛ-එකාග්‍රතාසහිතවූ තෘතීයධ්‍යානකුශලචිත්තය ද; සුඛ-එකාග්‍රතාසහිතවූ චතුර්ථධ්‍යානකුශලචිත්තය ද; උපෙක්ෂා-එකාග්‍රතාසහිතවූ පඤ්චමධ්‍යානකුශලචිත්තය ද; මෙසේ යථොක්තක්‍රමයෙන් ම(විපා

කසිත් පසෙක;) ක්‍රියාසිත් පසෙකැයි කුසලසිත් පස සමග රූපාවචර සිත් පසළොසෙක.

අරූපාවචරකුශලසිත් සතරෙක; (විපාකසිත් සතරෙක;)ක්‍රියාසිත් සතරෙකැයි; දොළොසෙක් වේ. [18-පිටේ-3-පෙළ පටන් බලනු.]

“සොතාපත්තිමග්ගචිත්තං”යනාදීන් දෙශනානුක්‍රමයෙන් මාර්ග සිත් සතරෙක; ඵලසිත් සතරෙකැයි; ලොකොත්තරසිත් අටෙක් වේ. [19-පිටේ-1-පෙළපටන්]

මෙකී එක්අනූවක් පමණ චිත්තයෝ විඥානස්කන්ධ නම් වේ. [21-පිටේ-21-පෙළපටන්]

මේ පඤ්චොපාදානස්කන්ධයෝ දුඃඛයෝයයි කියනු ලැබෙත්.

මේ දුඃඛාර්‍යසත්‍යයයි.

---

**දුඃඛසමුදයාර්‍යසත්‍යය** කවරේ ද? නැවත නැවත භවයෙහි උත්පත්තිස්වභාවයයි කියනලද සත්ත්වයාගේ ඉපදීම ඇති කරන්නාවූ නන්දිරාගය හා එක්ව පැවැත්තාවූ ඒ ඒ භවයෙහි ඇලීම කරන්නාවූ (මෙහෙවත්-උපනුපන්ජාතිවල රූප-ශබ්දාදි නොයෙක්අරමුණු ගැන්මෙන් නිස්සාරවූ ඒ රූපාදියෙන් සතුටු වන්නාවූ) සත්ත්වයාගේ යම් මේ තෘෂ්ණාවෙක් ඇද්ද,ඒ රූපාදීන් විෂයකොට පවත්නාවූ තණ්හාතොමෝ පවත්නිය.

ඒ කවරේද?-රැහැණින් බදනා සේ සත්වයන් බැඳි යන පඤ්චකාමගුණිකරාගවශයෙන් පැවති කාමතණ්හාවය, “භවය ශාශ්වතය නිත්‍යයයි” කියා සිතාගෙණ භවය ප්‍රාර්ථනාවශයෙන් පවත්වන භවතණ්හාවය යන ධ්‍යානනිකාන්තිය, උච්ඡෙදදෘෂ්ටිවශයෙන් “මෙයින් මත්තෙහි භවය නැතැයි” සිතාගෙණ එසේ පවත්නා විභවතණ්හාවය, යන මොහුයි.

උපදනාවූ කාමතණ්හාදිවශයෙන් තුන්වැදෑරුම්වූ ඒ මේ තණ්හාතොමෝ වනාහි කවර නම් තැනෙක්හි උපදනි ද?-ඉපිද සිටීම්වශයෙන් පවත්නාවූ ඒ තණ්හාව කවරනම් තැණෙක්හි නැවත නැවත පැවතිම්වශයෙන් පිහිටා සිටිනී ද?

ලොකයෙහි යම් කිසිවක් ප්‍රියවූ ස්වභාව ඇත්තේ ද, චිත්දපුතු මධුරස්වභාව ඇත්තේ ද, මෙහි උපදනාවූ මේ තණ්හාතොමෝ උපදනිය, නැවත නැවත පැවතිම්වශයෙන් සිටිනාවූ ඒ තණ්හාතොමෝ මෙහි එසේ සිටීමෙන් පවත්නිය.

“ලොකයෙහි ප්‍රියවූ ස්වභාව ඇත්තාවූ මධුරවූ ස්වභාව ඇත්තාවූ කුමක් නම් සඳහා මෙහි උපදනාවූ මේ තණ්හාතොමෝ උපදනිය, මෙහි එසේ පවත්නාවූ ඒ තණ්හාතොමෝ එසේ පැවතිම්වශයෙන් සිටිනීයයි” කියනුලැබේ ද?.

ලොකයෙහි චක්ෂුරාදිආයතනයන්කෙරෙහි “මමය, මාගේය” යන මූලාසිත්හි විශෙෂයෙන් යෙදී සම්පත්තියෙහි පිහිටා වසන සත්වයෝ කැඩපත්ආදියෙන් තමාගේ මුඛාදි රූපලක්ෂණ බලා ගන්නා අනුසා

රයෙන් බලා තමාගේ ඇස සුවර්ණවිමානයෙක්හි නැගූ විප්‍රසන්න පඤ්චප්‍රසාදමාණික්‍යමය සිව්මැදුරු කවුළුවක් මෙන් මාහැඟි කොට සිතන්නාහුය, එසේ අවිද්‍යාමූලිකවිරුද්ධකල්පනායෙන් චක්ෂුරාදීන් ප්‍රිය-මධුරාකාරයෙන් සලකන්නාහුගේ නූපන්තෘෂ්ණාවද උපදනීය, උපන් තෘෂ්ණාව ද; නැවත නැවත පැවතිම්වශයෙන් වැඩී—වැඩී පැවැත් මෙන් සිටිනීය, එහෙයින් සත්ත්වයාගේ චක්ෂුස යන තමා ඉන්ද්‍රියයන්කෙරෙහි ඉතා දූර සිටි අරමුණු ගන්නාහෙයින් ද සත්ත්වයන්ට වැඩිතරම් උපකාර ඇතිබැවින් ද මතුයෙහි පිහිටිහෙයින් ද පළමු කොට දක්වූ ඇස ඒ ඒ සත්ත්වයන්ට එහි ආදීනව(සවභාවලක්ෂණ)නොසැලකීමෙන් ප්‍රියවූ සවභාව ඇත්තේය, දර්ශනාදි මධුරස්වභාව ඇත්තේය; මෙහි උපදනාවූ මේ තෘෂ්ණාතොමෝ උපදනීය, මෙහි පැවතිම්වශයෙන් සිටිනාවූ එම තෘෂ්ණාවනැවත නැවත ඉපද පැවතිම්වශයෙන් සිටිනීය.

ලෝකයෙහි සත්ත්වයාගේ අවිද්‍යාමූලිකවිපරීතකල්පනායෙන් යෙදිබිලනකල චක්ෂුඃ සේ දුරු අරමුණු ගන්නාහෙයින් ඊට දෙවනුකොට දක්වූ ශ්‍රොත්‍රය ඕහට සුවර්ණනාලියක් මෙන් උතුම්ව වැටහෙන්නේය, එහෙයින් එසේවූ ශ්‍රොත්‍රසංඛ්‍යාතකර්ණය ප්‍රියවූ සවභාව ඇත්තේය, මධුරවූ සවභාව ඇත්තේය; මෙහි—පෙ—

ලොකසත්ත්වයන් අතුරෙහි සපර්ශව වැදගත් අරමුණක් ම හඳුනන ජිව්හාවට වඩා මදක්දුර සිට අරමුණු දැනගන්නා සවභාව ඇති උස්වූ නාසය මනාකොට වටා තුබූ සිරියෙල්මැටියක් සේ සාර කොට ලක්ෂණව අවිද්‍යාවෙන් මඩනලද සිත්ඇත්තහුවිසින් සැලකීමෙන් එහි ඇත්තා ම වූ අසාරබව නොදනා වරදවා සලකනලද්දාහට ඝ්‍රාණය යන නාසය ප්‍රියවූ සවභාව ඇත්තිය,මධුරවූ සවභාව ඇත්තිය;මෙහි—

ලොකයෙහි එසේ ම විපරීතකල්පනා ඇත්තහුවිසින් රක්තකම්බලපටලයක් වැනි ජිව්හාවයයි කියා ද,කටහඬ කුරවීකනාදයයි කියා ද, ශුභ-සාරවශයෙන් සලකනලදද, ඕහට ජිව්හාව ප්‍රියවූ සවභාව ඇත්තිය, මධුරවූ සවභාව ඇත්තිය; මෙහි--

සත්ත්වලොකයෙහි එසේ ම මූළාකල්පනා ඇත්තහුවිසින් තමාගේ ශරීරය ප්‍රශස්තශාලයෂ්ටියක් රත්තොරණක් මෙන් ද, වර්ණය රත්රන්-කිණිහිරිමල් බඳු උතුම්පැහැ ඇත්තේයයි කියා ද, කුත්සිතාර්ථයෙන්="කාය"ය යන නම් ලද එහි ඒකාන්තඅසාරභාවය නොදනා ශුභ-සාර-ශුචි (පිරසිදු) ලෙසින් යමෙක් සලකන සවභාව ඇත්තේ ද, ඕහට කුණපයන්ගේ ම රාසිසංඛ්‍යාතශරීරය ප්‍රියවූ සවභාව ඇත්තේය, මධුරවූ සවභාව ඇත්තේය; මෙහි--

ලොකසත්ත්වයන්අතුරෙහි එසේ ම විපරීත (විරුද්ධ) කල්පනා ඇත්තහුවිසින් තමාගේ චිත්තය අනුන්ගේ සිත් හා අසදෘශව උදාරතර කොට සිතාගෙණ නිග්‍රහ කළනොහැකි වහා පෙරලෙන ගිතා'ගිත නොබලා කැමති යම් අරමුණෙක්හි කුළුඅසෙකු මෙන් එන ඉතාදුරට ද යන තමා ශරීරය නොව එකලාව හැසිරෙණ ස්කන්ධගුහායෙහි ම වාසය කරණ විදුලිය-රලපතර සේ චචලවූ තුබූ ම තමහට අහිත

ද කරගන්නා ස්වභාව ඇති නොයෙක්පරිද්දෙන් අසාරවූ චිත්තය යන සිත ප්‍රියවූ ස්වභාව ඇත්තේය, මධුරවූ ස්වභාව ඇත්තේය; මෙහි —පෙ— සිටිනීය.

ලොකයෙහි චක්ෂුසට විෂයවූ විකාරයට පැමිණීම ලක්ෂණවූ රූපය ආදිනව නොසලකන්නාහට ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ආකාරය දුටු මූළාවූ ජනයින්ට එසේ වැටහීම ස්වභාව කොට ඇත්තේය; මෙහි එසේ ම උපදනාවූ මේ තණ්හාතොමෝ යථොක්තප්‍රකාරයෙන් ම උපදනීය, මෙහි පැවතිම්වශයෙන් සිටීම ලබන්නාවූ ඒ තණ්හාව නැවත නැවත ඉපදීම්වශයෙන් සිටිනීය.

ලොකයෙහි ශ්‍රොත්‍රයට විෂයවූ පඤ්චකාමගුණිකවශයෙන් පවත්නා ශබ්දයෝ එහි ආදිනව නොසලකන්නාහට ප්‍රියවූ ස්වරූප ඇත්තෝය; මිහිරුලක්ෂණ ස්වරූපකොට ඇත්තෝය; මේ ශ්‍රොත්‍රවිඥෙයවූ ශබ්දයන් විෂයෙහි—පෙ—

ලොකයෙහි ඝ්‍රාණයට විෂයවූ ගන්ධයෝ ප්‍රියවූ ස්වරූප ඇත්තෝය; මධුරවූ ස්වභාව ඇත්තෝය; මෙහි—

ලොකයෙහි ජිව්හාවට විෂයවූ අනෙකප්‍රකාරරසයෝ ප්‍රියවූ ස්වභාව ඇත්තෝය, මිහිරුලක්ෂණ ස්වරූප කොට ඇත්තෝය; මෙහි—

ලොකයෙහි ශරීරයට විෂයවූ පඤ්චකාමගුණනිශ්‍රිත සියලු ස්පර්ශයෝ ප්‍රියවූ ස්වරූප ඇත්තෝය, මිහිරුලක්ෂණ ස්වරූපකොට ඇත්තෝය; මෙහි—

ලොකසත්ත්වයන්අතුරෙහි මනසට විෂයවූ පඤ්චකාමගුණවශයෙන් පවත්නා ධම්මය යන නම් ඇති කාරණයෝ ප්‍රියවූ ස්වරූප ඇත්තෝය, මිහිරුලක්ෂණ ස්වරූප කොට ඇත්තෝය; මෙහි—පෙ—සිටිනීය.

ලොකයෙහි චක්ෂුස හා එක්ව පැවති විඥානය (හෙවත් චක්ෂුර්ද්වාරයෙන් නික්ම රූපය දැනගන්නා විඥානචිත්තය) ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මිහිරුලක්ෂණ ස්වරූප කොට ඇත්තේය; මෙහි එසේ ම උපදනාවූ මේ තණ්හාතොමෝ උපදනීය, මෙහි පැවතිම්වශයෙන් සිටීම ලබන්නාවූ ඒ තණ්හාව නැවත නැවත ඉපදීම්වශයෙන් සිටිනීය.

ලොකයෙහි ශ්‍රොත්‍රද්වාරය හා පැවති ඒ ඒ ශබ්දාරම්මණයන් වෙන් වෙන් කොට දැනගන්නා ස්වභාව ඇති ශ්‍රොත්‍රවිඥානය ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මිහිරුලක්ෂණ ස්වරූප කොට ඇත්තේය; මෙහි—පෙ—

ලොකයෙහි ඝ්‍රාණද්වාරය හා පැවතීමෙන් ඒ ඒ ගන්ධාරම්මණයන් වෙන් වෙන් කොට දැනගන්නා ස්වභාව ඇති ඝ්‍රාණවිඥානය ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ආකාරය ස්වභාව කොට ඇත්තේය; මෙහි—

ලොකයෙහි ජිහ්වාද්වාරය හා පැවතීමෙන් මධුර-අම්ල-කටුක-තික්තාදි ඒ ඒ රසයන් වෙන් වෙන් කොට දැනගන්නාසුලුවූ ජිහ්වාවිඥානය ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තේය; මෙහි—

ලෝකයෙහි කායද්වාරය හා එක්ව පැවතීමෙන් මෘදු-කර්කශාදි අනේකප්‍රකාර(විශේෂ) ඒ ඒ අරමුණු ඇඳිනීම ස්වභාව කොට ඇත්තාවූ කායවිඥානය ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තේය; මෙහි—

ලෝකයෙහි හෘදයවස්තුව ආශ්‍රය කොට පවත්නා හිතා'හිත-ශුභා'ශුභ-ඉෂ්ටා'නිෂ්ටකාරණයන් වෙන් වෙන්ව තෝරා සලකාගන්නා ස්වභාවය ඇත්තාවූ මනොවිඥානය ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ආකාරය වැටහීම් ස්වභාව කොට ඇත්තේය; මෙහි-පෙ-සිටිනිය.

ලෝකයෙහි චක්ෂුර්ද්වාරයෙහි රූපායතනයාගේ දර්ශනවශයෙන් වැදගන්නාවූ ස්පර්ශය ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තේය; මෙහි එසේ ම උපදනාවූ ඒ තණ්හාතොමෝ උපදනිය, මෙහි පැවතීම්වශයෙන් සිටීම ලබන්නාවූ ඒ තණ්හාව නැවත නැවත ඉපදීම්වශයෙන් සිටිනිය.

ලෝකයෙහි ශ්‍රොත්‍රද්වාරයෙහි ශබ්දායතනයාගේ ඇසීම්වශයෙන් වැදගැන්මෙන් වන්නාවූ ශ්‍රොත්‍රස්පර්ශය ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තේය; මෙහි—පෙ—

ලෝකයෙහි ඝ්‍රාණද්වාරයෙහි ගන්ධායතනයාගේ ආඝ්‍රාණවශයෙන් වැදගැන්මෙන් වන්නාවූ ඝ්‍රාණස්පර්ශය ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තේය; මෙහි—

ලෝකයෙහි ජිහ්වාද්වාරයෙහි රසායතනයාගේ අනුභව කිරීම්වශයෙන් වැදගැන්මෙන් වන්නාවූ ජිහ්වාස්පර්ශය ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තේය; මෙහි—

ලෝකයෙහි කායප්‍රසාදය හා එක්ව පවත්නා කයෙහි ස්පර්ශායතනයාගේ වැදගැන්මෙන් වන කායස්පර්ශය ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තේය; මෙහි—

ලෝකයෙහි දූර-සමීපාදි නොයෙක් විශේෂ අරමුණු සිහි කිරීම්වශයෙන් ගන්නාසුලුවූ මනඃස්පර්ශය ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තේය; මෙහි—පෙ—සිටිනිය.

ලෝකයෙහි සත්වයාට සියලුසසරදුක් ලුහුබු විය නොදී බොහෝ කලක් දික් කොට දෙනහෙයින්=ආයතන නම්වූ චක්ෂුරායතන-රූපායතන යන මේ ආයතනයන් දෙදෙනාගේ එක් වීමෙන් දර්ශනාස්වාදවශයෙන් උපදනා පඤ්චකාමගුණනිශ්‍රිත සැපයාගේ විඳිමය යන වේදනාතොමෝ ප්‍රියවූ ස්වභාව ඇත්තිය, දර්ශනවශයෙන් ම උපදනා මධුරස්වභාව ඇත්තීය; මෙහි උපදනාවූ(චක්ෂුරායතන-රූපායතනයන්ගේ ස්පර්ශයෙන් උපදනා)මේ තණ්හාතොමෝ උපදනීය, මෙහි ඉපද සිටීම්වශයෙන් පවත්නාවූ එම තණ්හාව නැවත නැවත ඉපදීම්වශයෙන් පවත්නීය.

ලෝකයෙහි ශ්‍රොත්‍රායතනය-ශබ්දායතනය යන මේ දෙදෙනාගේ එක් වීමෙන් ශ්‍රවනාස්වාදවශයෙන් උපදනා වේදනාතොමෝ

ප්‍රියවූ ස්වරූප ඇත්තිය, ශ්‍රවනවශයෙන් ම උපදනා මධුරස්වභාව ඇත්තිය; මෙහි—පෙ—

ලොකයෙහි ඝ්‍රාණායතන-ගන්ධායතන යන මේ දෙදෙනාගේ හමු වීමෙන් ආඝ්‍රාණවශයෙන් උපදනා කාමනිශ්‍රිතවෙදනාතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්නිය, ආඝ්‍රාණවශයෙන් ම උපදනා මධුරස්වභාව ඇත්නිය; මෙහි—

ලොකයෙහි ජිහ්වායතන-රසායතන දෙදෙනාගේ හමු වීමෙන් සායනියවශයෙන් උපදනා වෙදනාතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්නිය, සායනවශයෙන් ම උපදනා මධුරවූ ස්වභාව ඇත්නිය; මෙහි—

ලොකයෙහි කායායතන-ස්පර්ශායතනදෙදෙනාගේ එක් වීමෙන් ස්පර්ශවශයෙන් උපදනා වෙදනාතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තිය, කායස්පර්ශවශයෙන් උපදනා මධුරවූ ස්වභාව ඇත්නිය; මෙහි—

ලොකයෙහි මනායතන-ධර්මායතනදෙදෙනාගේ එක් වීමෙන් ස්පර්ශවශයෙන්(අරමුණු නියම කොට දැන සැලකීම්වශයෙන්)උපදනා වෙදනාතොමෝ ප්‍රියවූ ස්වභාව ඇත්තිය, වෙදනාවශයෙන් ම උපදනා මධුරස්වභාව ඇත්තිය; මෙහි—පෙ—පවත්නිය.

ලොකයෙහි මේ නීල-පීතය, හ්‍රස්ව-දීර්ඝ යනාදි ක්‍රමයෙන් විභාග කොට ඒ ඒ රූපයන් දැනගැන්ම ලක්ෂණවූ රූපසංඥතොමෝ එහි ආදීනව නොදන්නාහට ප්‍රියවූ ස්වරූප ඇත්නිය, මධුරවූ ආකාර ඇත්තිය; මෙහි උපදනාවූ මේ තෘෂ්ණාතොමෝ උපදනිය, මෙහි ඉපද පැවතිම්වශයෙන් සිටිනාවූ එම තෘෂ්ණාව නැවත නැවත ඉපදීම්වශයෙන් පවත්නිය.

ලොකයෙහි එසේ ම ඒ ඒ ශබ්දයන් විභාග කොට දැනගන්නා ශබ්දසංඥතොමෝ ප්‍රියවූ ස්වභාව ඇත්තිය, මධුරවූ ආකාර ඇත්තිය; මෙහි—පෙ—

ලොකයෙහි එසේ ම ගන්ධයන්ගේ ස්වභාවපරිද්දෙන් දැනගන්නා ස්වරූපවූ ගන්ධසංඥතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තිය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තිය; මෙහි—

ලොකයෙහි නොයෙක් රසයන්ගේ ස්වරූපය මේ මේ යයි දන්නා රසසංඥතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තිය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තිය; මෙහි—

ලොකයෙහි එසේ ම නොයෙක් ස්පර්ශයන් වෙන් වෙන්ව හඳුනන ස්පර්ශසංඥතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තිය,මධුරවූ ආකාරය වැටහීමස්වභාව කොට ඇත්තිය; මෙහි—

ලොකයෙහි මනොවිඥෙයධර්මසංඛ්‍යාත රූපාරූපකාරණඅතුරෙන් මේ අසවල්කාරණයයි වෙන් වෙන්ව දැනීම ලක්ෂණවූ ධර්මසංඥතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තිය, මධුරවූ ආකාර වැටහීම ස්වභාව කොට ඇත්තිය; මෙහි—පෙ—පවත්නිය.

ලොකයෙහි මේ රූපයයි දැන එහි පවත්වන සිතිවිලිතොමෝ ප්‍රි

යවූ ස්වරූප ඇත්තීය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත් තිය; මෙහි එසේ ම උපදනාවූ මේ තණ්හාතොමෝ උපදනීය, මෙහි පැවතිම්වශයෙන් සිටීම ලබන්නාවූ එම තණ්හාව නැවත නැවත ඉපදීම්වශයෙන් සිටිනීය.

ලොකයෙහි මේ ශබ්දයයි යන සිතිවිලිතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තිය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තිය; මෙහි —පෙ—

ලොකයෙහි ගන්ධයයි යන සිතිවිලිතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත් තිය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තිය; මෙහි—

ලොකයෙහි රසයයි යන සිත්විලිතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්ති ය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තිය; මෙහි—

ලොකයෙහි ස්පර්ශයෙහි පැවති සිතිවිලිතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තිය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තිය; මෙහි—

ලොකයෙහි ධම්මයෙහි පැවති සිතිවිලිතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තිය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තිය; මෙහි —පෙ—සිටිනිය.

ලොකයෙහි එසේ ම සිතිවිලි පැවැත්වීමෙන් රූපයන් විෂය කොට ඉපිද එහි පවත්නා තෘෂ්ණාතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තිය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තිය; මෙහි එසේ ම උ පදනාවූ මේ තණ්හාතොමෝ උපදනීය, මෙහි පැවතිම්වශයෙන් සිටී ම ලබන්නාවූ එමතණ්හාව නැවත නැවත ඉපදීම්වශයෙන් සිටිනීය.

ලොකයෙහි ශබ්දයෙහි පැවති තෘෂ්ණාතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තිය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තිය; මෙහි —පෙ—

ලොකයෙහි ගන්ධයෙහි පැවති තෘෂ්ණාතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තිය; මධුරවූ ආකාර වැටහීම ස්වභාව කොට ඇත්තිය; මෙහි—

ලොකයෙහි රසයෙහි පැවති තෘෂ්ණාතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තිය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තිය; මෙහි—

ලොකයෙහි ස්පර්ශයෙහි පැවති තෘෂ්ණාතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තිය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තිය; මෙහි—

ලොකයෙහි ධම්මයෙහි පැවති තෘෂ්ණාතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තිය, මධුරවූ ආකාරය වැටහීම ස්වභාව කොට ඇත්තිය; මෙහි —පෙ—සිටිනිය.

ලොකයෙහි රූපයෙහි පැවති විතක්කයතෙම ප්‍රියවූ ස්වරූප ඇත් තේය, මධුරවූ ස්වරූප ඇත්තේය; මෙහි උපදනාවූ මේ තණ්හාතො මෝ උපදනීය, මෙහි පැවතිම්වශයෙන් සිටිනාවූ එම තණ්හාව නැව ත නැවත ඉපදීම්වශයෙන් සිටිනිය.

ලොකයෙහි ශබ්දයෙහි පැවති විතක්කයතෙම ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ස්වරූප ඇත්තේය; මෙහි—පෙ—

ලොකයෙහි ගන්ධයෙහි පැවති විතක්කයතෙම ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ස්වරූප ඇත්තේය; මෙහි--

ලොකයෙහි රසයෙහි පැවති විතක්කයතෙම ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ස්වරූප ඇත්තේය; මෙහි--

ලොකයෙහි ස්පර්ශයෙහි පැවති විතක්කයතෙම ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ස්වරූප ඇත්තේය, මෙහි,—

ලොකයෙහි ධර්‍මයෙහි පැවති විතක්කයතෙම ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ස්වරූප ඇත්තේය; මෙහි—පෙ—සිටිනිය.

ලොකයෙහි සිතින් ගත් රූපාදි අරමුණු ගැර එහි නැවත නැවත සිතිම (අනුමර්‍දනවශයෙන් සිත්කරමින් සිත පැවැත්වීම) ස්වභාවවූ රූපයෙහි පැවති විචාරයතෙම ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ස්වරූප ඇත්තේය, මෙහි උපදනාවූ මේ තණ්හාතොමෝ උපදනිය, මෙහි පැවතිම්වශයෙන් සිටිනාවූ එම තණ්හාව නැවත නැවත ඉපදිම්වශයෙන් සිටිනිය.

ලොකයෙහි එසේ ම ශබ්දයෙහි පැවති විචාරයතෙම ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ස්වරූප ඇත්තේය, මෙහි—පෙ—

ලොකයෙහි එසේ ම ගන්ධයෙහි පැවති විචාරයතෙම ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ස්වරූප ඇත්තේය; මෙහි—

ලොකයෙහි එසේ ම රසයෙහි පැවති විචාරයතෙම ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ස්වරූප ඇත්තේය; මෙහි—

ලොකයෙහි එසේ ම ස්පර්ශයෙහි පැවති විචාරයතෙම ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ස්වරූප ඇත්තේය, මෙහි—

ලොකයෙහි එසේ ම ඒ ඒ ධර්‍මයන් සිතින් අනුමර්‍දනය කොට විචාරිම්වශයෙන් පවත්නාවූ විචාරයතෙම ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ස්වරූප ඇත්තේය, මෙහි උපදනාවූ මේ තණ්හාතොමෝ උපදනිය, මෙහි පැවතිම්වශයෙන් සිටිනාවූ ඒ තණ්හාව නැවත නැවත ඉපදිම්වශයෙන් සිටිනිය.

**මේ දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යයයි.**

---

**දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍යය නම්** කවරේද?—කාමතෘෂ්ණාදිවශයෙන් තුන්වැදෑරුම්වූ ඒ තණ්හාවගේ නිඃශෙෂවූ යම් විරාගයෙක් (ඇල්ම නැති වීමෙක්)ඇද්ද, සර්‍වාකාරවූ යම් නිරොධයෙක් ඇද්ද, (යම් අලය හැරිමෙක් ඇද්ද,) සර්‍වාකාරයෙන් නිඃශෙෂ කොට එම අලයාගේ යම් හැරීමෙක් ඇද්ද, එම තණ්හාවගේ යම් මිදිමෙක් (ඉන් ගැලවීමෙක්) ඇද්ද, ආලය නොකොට හැරීමය යන ඒ මේ කාරණයතෙම "දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍ය" නම් වන්නේය.

පහ වන්නාවූ ඒ මේ තෘෂ්ණාතොමෝ කවර නම් තැනෙක්හි පහවන්නි ද, පහවීම්වශයෙන් නිරුද්ධ වන්නාවූ ඒ තණ්හාතොමෝ

කවරනම් තැනෙක්හි නැවත නැවත නොඋපදීම්වශයෙන් නිරුද්ධ වන්නී ද?—

ලොකයෙහි රූපාදි යම් ආරම්මණයක් කාමගුණවශයෙන් ප්‍රියවූ ස්වරූප ඇත්තේ ද, එසේ ම මධුරවූ ස්වරූප ඇත්තේ ද, මෙහි පහවනුලබන්නාවූ මේ තෘෂ්ණාතොමෝ පහවන්නීය, මෙහි කාමයෙන් සිත පහවීම්වශයෙන් නිරුද්ධ වන්නාවූ ඒ තෘෂ්ණාව නැවත නැවත නොඋපදීම්වශයෙන් නිරුද්ධ වන්නීය.

ලොකයෙහි ප්‍රියවූ මධුරවූ ස්වරූප ඇති යම්කිසිවෙක් ඇද්ද, මෙහි පහවන්නාවූ මේ තෘෂ්ණාතොමෝ පහවන්නීය, මෙහි පහවීම් වශයෙන් නිරුද්ධ වන්නාවූ ඒ තෘෂ්ණාව නැවත නැවත නොඋපදීම් වශයෙන් නිරුද්ධ වන්නීය.

ලොකයෙහි යට කියනලද ක්‍රමයෙන් ආදීනව නොසලකා අවිද්‍යාමූලික සිත් ඇත්තාහට චක්ෂුසය යන ඇස ප්‍රියවූ ස්වභාව ඇත්තේය, මධුරවූ ස්වභාව ඇත්තේය; මෙහි පහවනුලබන්නාවූ මේ තෘෂ්ණාතොමෝ පහවන්නීය, මෙහි නැවත නැවත නොඋපදීම්වශයෙන් නිරුද්ධ වන්නාවූ එම අජ්ඣත්තිකචක්ඛායතනයෙහි පැවති තෘෂ්ණාව නැවත නැවත නොඋපදීම්වශයෙන් නිරුද්ධ වන්නීය.

ලොකයෙහි ශ්‍රොත්‍රය ප්‍රියවූ ස්වභාව ඇත්තේය, මධුරවූ ස්වරූප ඇත්තේය; මෙහි—පෙ—

ලොකයෙහි ඝ්‍රාණය ප්‍රියවූ ස්වභාව ඇත්තේය, මධුරවූ ස්වභාව ඇත්තේය; මෙහි—

ලොකයෙහි ජිව්හාව ප්‍රියවූ ස්වභාව ඇත්තීය,මධුරවූ ස්වරූප ඇත්තීය; මෙහි—

ලොකයෙහි ශරීරය ප්‍රියවූ ස්වභාව ඇත්තේය, මධුරවූ ස්වභාව ඇත්තේය, මෙහි—

ලොකයෙහි මනස ප්‍රියවූ ස්වභාව ඇත්තේය, මධුරවූ ස්වභාව ඇත්තේය; මෙහි—පෙ—නිරුද්ධ වන්නීය.

ලොකයෙහි රූපයතෙම—පෙ—ශබ්දයතෙම—ගන්ධයතෙම—රසයතෙම—ස්පර්ශයතෙම—ධර්මය(ධර්මායතනය)තෙම ප්‍රියවූ ස්වභාව ඇත්තේය, මධුරවූ ස්වභාව ඇත්තේය; මෙහි පහවනුලබන්නාවූ මේ තෘෂ්ණාතොමෝ පහවන්නීය, මෙහි නැවත නැවත නොඋපදීම් වශයෙන් නිරුද්ධ වන්නාවූ එම තෘෂ්ණාව නැවත නැවත නොඋපදීම් වශයෙන් නිරුද්ධ වන්නීය.

ලොකයෙහි චක්ෂුර්විඥානයතෙම—පෙ—ශ්‍රොත්‍රවිඥානයතෙම—ඝ්‍රාණවිඥානයතෙම—ජිහ්වාවිඥානයතෙම—කායවිඥානයතෙම—මනොවිඥානයතෙම ප්‍රියවූ ස්වභාව ඇත්තේය, මධුරවූ ස්වභාව ඇත්තේය; මෙහි පහවනුලබන්නාවූ මේ තෘෂ්ණාතොමෝ පහවන්නීය, මෙහි නැවත නැවත නොඋපදීම්වශයෙන් නිරුද්ධ වන්නාවූ එම තෘෂ්ණාව නැවත නැවත නොඋපදීම්වශයෙන් නිරුද්ධ වන්නීය.

ලොකයෙහි චක්‍ෂුස්පර්ශයතෙම—පෙ—ශ්‍රොත්‍රස්පර්ශයතෙම—ඝ්‍රාණස්පර්ශයතෙම — ජිහ්වාස්පර්ශයතෙම — කායස්පර්ශයතෙම— මනඃස්පර්ශයතෙම ප්‍රියවූ ස්වභාව ඇත්තේය, මධුරවූ ස්වභාව ඇත්තේය; මෙහි පහවනුලබන්නාවූ මේ තණ්හාතොමෝ පහවන්නීය, මෙහි නැවත නැවත නොඉපදීම්වශයෙන් නිරුඬ වන්නාවූ ඒ තණ්හාව නැවත නැවත නොඉපදීම්වශයෙන් නිරුඬ වන්නීය.

ලොකයෙහි චක්‍ෂුඃස්පර්ශවෙදනාව—පෙ—ශ්‍රොත්‍රස්පර්ශවෙදනාව—ඝ්‍රාණස්පර්ශවෙදනාව—ජිහ්වාස්පර්ශවෙදනාව—කායස්පර්ශවෙදනාව—මනඃස්පර්ශවෙදනාව ප්‍රියවූ ස්වභාව ඇත්තීය, මධුරවූ ස්වභාව ඇත්තීය; මෙහි පහවනුලබන්නාවූ මේ තණ්හාතොමෝ පහවන්නීය, මෙහි නැවත නැවත නොඉපදීම්වශයෙන් නිරුඬ වන්නාවූ එම තණ්හාව නැවත නැවත නොඉපදීම්වශයෙන් නිරුඬ වන්නීය.

ලොකයෙහි රූපසංඥව—පෙ—ශබ්දසංඥව—ගන්ධසංඥව—රසසංඥව—ස්පර්ශසංඥව—ධර්මසංඥව ප්‍රියවූ ස්වභාව ඇත්තිය, මධුරවූ ස්වභාව ඇත්තීය; මෙහි පහවනුලබන්නාවූ මේ තණ්හාතොමෝ පහවන්නීය, මෙහි නැවත නැවත නොඉපදීම්වශයෙන් නිරුඬ වන්නාවූ එම තණ්හාව නැවත නැවත නොඉපදීම්වශයෙන් නිරුඬ වන්නීය.

ලොකයෙහි රූපසංචෙතනාව—පෙ—ශබ්දසංචෙතනාව—ගන්ධසංචෙතනාව—රසසංචෙතනාව—ස්පර්ශසංචෙතනාව-ධර්මසංචෙතනාව ප්‍රියවූ ස්වභාව ඇත්තීය, මධුරවූ ස්වභාව ඇත්තීය; මෙහි පහවනුලබන්නාවූ මේ තණ්හාතොමෝ පහවන්නීය; මෙහි නැවත නැවත නොඉපදීම්වශයෙන් නිරුඬ වන්නාවූ එම තණ්හාව නැවත නැවත නොඉපදීම්වශයෙන් නිරුඬ වන්නීය.

ලොකයෙහි රූපතෘෂ්ණාව—පෙ—ශබ්දතෘෂ්ණාව—ගන්ධතෘෂ්ණාව—රසතෘෂ්ණාව—ස්පර්ශතෘෂ්ණාව—ධර්මතෘෂ්ණාව ප්‍රියවූ ස්වභාව ඇත්තීය, මධුරවූ ස්වභාව ඇත්තීය; මෙහි පහවනුලබන්නාවූ මේ තණ්හාතොමෝ පහවන්නීය, මෙහි නැවත නැවත නොඉපදීම්වශයෙන් නිරුඬ වන්නාවූ එම තණ්හාව නැවත නැවත නොඉපදීම්වශයෙන් නිරුඬ වන්නීය.

ලොකයෙහි රූපවිතර්කය—පෙ—ශබ්දවිතර්කය—ගන්ධවිතර්කය—රසවිතර්කය—ස්පර්ශවිතර්කය—ධර්මවිතර්කය ප්‍රියවූ ස්වභාව ඇත්තේය, මධුරවූ ස්වභාව ඇත්තේය; මෙහි පහවනුලබන්නාවූ මේ තණ්හාතොමෝ පහවන්නීය, මෙහි නැවත නැවත නොඉපදීම්වශයෙන් නිරුඬ වන්නාවූ එම තණ්හාව නැවත නැවත නොඉපදීම්වශයෙන් නිරුඬ වන්නීය.

ලොකයෙහි රූපවිචාරය—පෙ—ශබ්දවිචාරය—ගන්ධවිචාරය—රසවිචාරය—ස්පර්ශවිචාරය—(විතර්කවශයෙන් ගත් රූපාදීන් අරමුණු කොට එහි සිත නොහැර පිහිටුවා නැවත නැවත අවයව සිහි කිරීම

ස්වභාවවූ) ධර්‍මවිචාරයතෙම ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ස්වරූප ඇත්තේය, මෙහි පහවන්නාවූ මේ (ධර්‍මවිචාරයන් අරමුණුව පවත්නා) තෘෂ්ණාතොමෝ දුරුවීම්වශයෙන් පහවන්නීය, මෙහි දුරුවීම්වශයෙන් නිරුද්ධ වන්නාවූ එම තෘෂ්ණාතොමෝ නැවත නැවත නොඉපදීම්වශයෙන් නිරුද්ධ වන්නීය.

**මේ දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍යයයි.**

---

**දුඃඛනිරොධගාමිනිප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය** කවරේ ද?—මෙම ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්‍ගය වන්නේය; ඒ කවරේ ද?-(මිථ්‍යාදෘෂ්ටියට විරුද්ධවූ චතුඃසත්‍යජානනඥානස්වරූපවූ) **සම්‍යග්දෘෂ්ටිය**, (මිථ්‍යාසඞ්කල්පනාවට විරුද්ධවූ නෛෂ්ක්‍රම්‍යලක්ෂණ) **සම්‍යක්සඞ්කල්පනාවය**, (මිථ්‍යාවචනයට ප්‍රතිපක්ෂවූ වාග්දුශ්චරිතවිරමණලක්ෂණ) **සම්‍යග්වචනය**, (මිථ්‍යාකර්‍මාන්තයට ප්‍රතිපක්ෂවූ කායදුශ්චරිතවිරතිලක්ෂණ) **සම්‍යක්කර්‍මාන්තය**, (මිථ්‍යාජීවිතයට ප්‍රතිපක්ෂවූ සම්‍යග්ජීවිකාලක්ෂණවූ) **සම්‍යගාජීවය**, (මිථ්‍යාව්‍යායාමයට ප්‍රතිපක්ෂවූ වීර්‍ය්‍යාරම්භලක්ෂණවූ) **සම්‍යග්ව්‍යායාමය**, (මිථ්‍යාස්මෘතියට ප්‍රතිපක්ෂවූ ස්මෘතිඅවිප්‍රවාසලක්ෂණ) **සම්‍යක්ස්මෘතිය**, ( මිථ්‍යාසමාධියට ප්‍රතිපක්ෂවූ අවික්ෂෙපලක්ෂණ ඇති ) **සම්‍යක්සමාධිය**, යන මේයි.

1—එහි,—**සම්‍යග්දෘෂ්ටිය** නම් කවරෙක් වන්නී ද?—දුඃඛසත්‍යයෙහි පැවති "දුක" යයි දන්නා ඥානය ද, දුඃඛසමුදයසත්‍යයෙහි පැවති මේ "සමුදය" යී දන්නා ඥානය ද, දුඃඛනිරොධසත්‍යයෙහි පැවති මේ "නිරොධ"යයි දන්නා ඥානය ද, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදායෙහි පැවති මාර්‍ගඥානය, යන යමෙක් ඇද්ද, මෙතෙම "සම්‍යක්දෘෂ්ටි"යයි කියනුලැබේ.

2—**සම්‍යක්සඞ්කල්පනාව** නම් කවරේ ද?—ගිහිගෙයින් නික්ම මහණවීමෙහි පැවති නෛෂ්ක්‍රම්‍යසඞ්කල්පනාවය, "අන්සත්ත්ව නොනසිත්වා"යී යනාදිවිසින් පැවති අව්‍යාපාදසඞ්කල්පනාවය, සත්ත්වහිංසා වැලක්මෙහි පැවති අවිහිංසාසඞ්කල්පනාවය, යන මේ කාරණයතෙම "සම්‍යක්සඞ්කල්පනාව"යයි කියනුලැබේ.

3-**සම්‍යග්වචනය** නම් කවරේ ද?—මුසාවාදයෙන් වැලකීමය, පෛශුන්‍යවචනයෙන් වැලකීමය, පරුෂවචනයෙන් වැලකීමය,සම්ඵප්‍රලාපයෙන් වැලකීමය, යන මේ කාරණයතෙම "සම්‍යග්වචන"යයි කියනුලැබේ.

4—**සම්‍යක්කර්‍මාන්තය** නම් කවරේ ද?—ප්‍රාණඝාතයෙන් වෙන් වීමය, අදත්තාදානයෙන් වෙන් වීමය,කාමමිථ්‍යාචාරයෙන් වැලකීමය, යන මේ කාරණයතෙම "සම්‍යක්කර්‍මාන්ත" යයි කියනුලැබේ.

5—**සම්‍යගාජීවය** නම් කවරේ ද?—ආර්‍ය්‍යශ්‍රාවකවූ සසර භයවිසින් දක්නා භික්ෂුතෙම මිථ්‍යාආජීවය හැර සම්‍යක්ආජීවයෙන් ජීවිකාව කරන්නේය, යන මේ කාරණයතෙම " සම්‍යග්ආජීව " යයි කියනුලැබේ.

**6—සම්‍යග්ව්‍යායාමය** නම් කවරේ ද?—නූපන් අකුශලධර්මයන්ගේ නොඋපදීම්පිණිස (ඒ ඒ පාපකර්මය නූපදනා පිළිවෙත් පිරීමට) අලය උපදවන්නේය, ඊට ම නිසි ව්‍යායාමය කරන්නේය, එබඳු අකුසල් තමා කරා නොපැමිණෙනපිණිස පිළිවෙත්සාධකවීර්‍ය්‍යය පවත්වන්නේය, මූලාපජනයන් සේ සිතට වසඟ නොව වීර්‍ය්‍ය කිරීමෙන් චිත්ත පරිග්‍රහය කරන්නේ වෙසි, "එකාන්තයෙන් සම්-නහර-ඇටපමණක් ඉතිරිව ශරීරයෙහි සෙසු ලේ-මස් වියලී යතුදු මේ වීර්‍ය්‍යය නොහරිත්"යි ඉටාගෙණ කළමනා වීර්‍ය්‍යය පවත්වන්නේය;—සමුදාචාරවශයෙන් තමන්ට උපන්නාවූ අකුශලධර්මයන්ගේ දුරු කිරීම්පිණිස ද ඒ ඒ අකුශලධර්ම දුරු කිරීමට නිසි පිළිවෙත් පිරීමෙහි අලය උපදවන්නේය, එම පිළිවෙත්සාධකව්‍යායාමය කරන්නේය, තමාකෙරෙහි පවත්නා ඒ අකුසල් දුරු වීමට නිසි වීර්‍ය්‍යය පවත්වන්නේය, වීර්‍ය්‍ය කිරීමෙන් චිත්තපරිග්‍රහණය කරන්නේය, "එකාන්තයෙන් සම්-නහර-ඇට අවශෙෂව මස්-ලේ ශුෂ්ක වන්නේ නමුදු මේ වීර්‍ය්‍යය නොහිරිමි"යි දෘඪතරසමාදානයෙන් යෙදී වීර්‍ය්‍ය කරන්නේය,—තමාකෙරෙහි නූපන් ප්‍රථමධ්‍යානාදි කුශලධර්මයන්ගේ ඉපදීම්පිණිස (යම් ප්‍රකාරයෙකින් ප්‍රථමධ්‍යානාදි ඒ නූපන් කුශලධර්මයන්ගේ ප්‍රතිලාභය වේ ද එසේවූ) පිළිවෙත්සාධක අලය කරන්නේය, එබඳු ම ව්‍යායාමය කරන්නේය, එම කුශලධර්මයන් උපදවා ගැන්මට නිසි පිළිවෙත්සාධක වීර්‍ය්‍යය සිත්හි පවත්වන්නේය, වීර්‍ය්‍යකරණයෙන් චිත්තපරිග්‍රහණය කරන්නේය, දෘඪතරවූ වීර්‍ය්‍යසමාදානයෙන් යෙදී එම(කුශලධර්මයන්ගේ ප්‍රතිලාභයට කළමනා වීර්‍ය්‍යය) කරන්නේය,—තමාසතන්හි උපන් ප්‍රථමධ්‍යානාදි කුශලධර්මයන්ගේ නැවත නැවත ඉපදීම්වශයෙන් සිටීමය, (හෙවත්-යම් කුසලයක් එක්වරෙක දෙවරෙක කොටගත් පමණකින් නොනැවති නැවත නැවතත් සතතයෙන් එම කුශලධර්මයන් උපදවාගැන්මෙහි යෙදීමෙන් ස්ථිර කොට තමාකෙරෙහි පිහිටුවාගන්නාපිණිස එම කුශලධර්මයන්ගේ විනාශ නොවීම්පිණිස වඩවඩා වර්ධනවීම්පිණිස විපුලව පතළවීම්පිණිස භාවනාවගේ පරිපූර්ණත්වයපිණිස එම කුශලධර්මයන්ගේ ස්ථිතියට නිසි පිළිවෙත්සාධකවීර්‍ය්‍ය සිත්හි උපදවන්නේය, එසේ ම කුශලධර්මයන්ගේ ස්ථිතියට නිසි ව්‍යායාම කරන්නේය, එසේ ම ඊට කළමනා වීර්‍ය්‍ය පවත්වන්නේය, වීර්‍ය්‍යකරණයෙන් ම චිත්තපරිග්‍රහණය කරන්නේය, දෘඪතරසමාදානයෙන් යෙදී මේ ශරීරයෙහි සම්-නහර-ඇටපමණක් අවශෙෂව මස්-ලේ වියලී යතුදු මේ වීර්‍ය්‍යය නොහරිමි"යි යන කල්පනායෙන් උපන් කුශලධර්මයන්ගේ නැවත නැවතත් ඉපදීම්වශයෙන් සිටීම්පිණිස ම වීර්‍ය්‍ය කරන්නේය; යන මේ "සම්‍යක්ව්‍යායාම" යයි කියනුලැබේ.

**7—සම්‍යක්සිඞ්ඛනොමෝ** කවරේ ද?-"කුච්ජිතානං සාසවධම්මානං අයොනි=කායො"යනු බැවින් කුත්සිතවූ (නින්දිත) සියලු ම පාපධර්ම

යන්ට ද කෙශාදි කුණපයන්ට ද සඨානහෙයින් ඔවුන්ගේ ම විශෙෂ යෙන් එක්වීමෙන් ම ආය තුඩී=කාය නම් ලද ව්‍යමමාත්‍රවූ මේ ශරීර යෙහි එකාන්තඅශුභබව දැන සිත්හි වැඩීම්වශයෙන් පවත්නා දස සතරවිධවූ කායානුස්මෘතිභාවනායෙහි කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇති සම්ප්‍රජඥසංඛ්‍යාතවූ නුවණින් යුක්තව කායපරිග්‍රාහිකසිහියයයි කියනලද ශරීරයාගේ අසාර-අශුභවශයෙන් කය සිහි කරගන්නා සිහියෙන් යුක්තවූයේ ලුජ්ජන-පලුජ්ජනාර්ථයෙන්="ලොක" නම්වූ මේ ශරීරයෙහි "කාමච්ඡන්ද" යයි කියනලද ලොභය ද "ව්‍යාපා ද"යයි කියනලද නොසතුටුබව දැයි කියනලද මේ පාපධර්මයන් අනිත්‍යාදි නොයෙක් ආදීනවකාරණ සිහි කිරීමෙන් පාපයට අව කාශ නොදීමය යන තදඞ්ගවශයෙන් ද ප්‍රථමධ්‍යානාදි සමාධිභාව නාබලයෙන් සිත එකඟ කොට පාපයට අවකාශ නොදීමය යන විෂ්කම්භනවශයෙන් ද යන මේ විප්‍රකාරයෙන් පාපමූලවූ කෙලෙස් සන්හිඳුවාගෙණ මෙසේ කායගතාසතිභාවනාව සිත්හි කරමින් වා සය කරන්නේය,—සුඛ-දුඃඛ-උපෙක්‍ෂාවශයෙන් නොයෙක් ප්‍රකා රවූ වෙදනාවන්කෙරෙහි කෙලෙසුන් තවන වීර්‍ය්‍යඇති සම්ප්‍රජඥ නම් ලද ඥානයෙන් යෙදී වාසය කරන්නාවූ වෙදනා පරිග්‍රාහික සිහිය යයි කියනලද සුව-දුක්ආදී නොයෙක් වෙදනාවන්ගේ ම එකාකාරව නොසිට වහා බිඳියාමෙන් දියබුබුලුයේ අස්ථිරවූ එකා කාරව නොපවත්නා ස්වභාවය සිහි කරගන්නාවූ සිහියෙන් යුක්තව වාසය කරණතැනැත්තේ ලුජ්ජන-පලුජ්ජනාර්ථයෙන් (හෙවත්—වි ශෙෂයෙන් නැතිවන කාරණයෙන්)="ලොක" නම්වූ සුව-දුක්ආදිය විඳීම්වශයෙන් පවත්නාවූ මේ වෙදනාලොකයෙහි "කාමච්ඡන්ද"යයි කියනලද ලොභය ද "ව්‍යාපාද"යයි කියනලද නොසතුටුබව ද යන මේ පාපධර්මයන් යථොක්තප්‍රකාරවූ තදඞ්ග-විෂ්කම්භනවශයෙන් සන්හිඳුවාගෙණ වෙදනාවන්ගේ ස්වභාවා'දිනව සිහි කරණ වෙද නානුපස්සනාභාවනාව සිත්හි කරමින් වාසය කරන්නේය;-රාගසිත- වෙෂසිත-මොහසිතආදි නොයෙක් ප්‍රභෙද ඇති චිත්තයෙහි කෙලෙ සුන් තවන වීර්‍ය්‍ය ඇත්තාවූ සම්ප්‍රජඥසංඛ්‍යාතඥානයෙන් සමන්විතවූ යේ චිත්තපරිග්‍රාහිකසිහියයි කියනලද චිත්තයාගේ ස්වභාවා'දිනව සිහි කරගන්නා සිහියෙන් යුක්තව වාසය කරණතැනැත්තේ ඇතිව නැතිවන විශෙෂයෙන් ම නැතිවන කාරණය හෙතුකොටගෙණ ලුජ්ජන-පලුජ්ජනාර්ථයෙන්="ලොක"යයි නම් ලද චිත්තලොකය කෙරෙහි නුනුවනින් යෙදී පැවතීමෙන් උපදනාවූ "කාමච්ඡන්ද"යයි කියනලද ලොභය ද, නොසතුටුබව ද, යන මේ පාපධර්මයන් තද ඞ්ග-විෂ්කම්භනවශයෙන් සන්හිඳුවාගෙණ චිත්තයාගේ ස්වභාවා'දි නව සිහි කරණ භාවනාව මෙනෙහි කරමින් වාසය කරන්නේය;— පඤ්චනීවරණධර්මයන් ආදිවූ ධර්මයන්කෙරෙහි කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇතිව "සම්පජඤ්ඤ" නම් ලද ඥානයෙන් යුක්තව නීවරණාදි ඒ ඒ ධර්මයන් සිහි කරණ සිහියෙන් සමන්විතවූයේ හෙතෙම යථොක්ත

අර්ථයෙන් "ලොක"යයි ලද නම් ඇති නීවරණාදිධම්මලොකයෙහි
අවිද්‍යාමූලයෙන් උපදනාවූ "කාමච්ඡන්ද"යයි කියනලද ලොභය ද,
"ව්‍යාපාද"යයි කියනලද නොසතුටුබව ද, යන මේ පාපධම්මයන්
උක්තප්‍රකාර තදඞ්ග-වික්ඛම්භනවශයෙන් විප්‍රකාරව පවත්නා ප්‍රහා
ණය කරණ කොට ගෙණ සන්නිඳුවා නිශ්චලව හිඳ නීවරණාදි ඒ ඒ
ධම්මයන්ගේ ස්වභාවාදීනව සිහි කරණ ධම්මානුදර්ශනාභාවනාව සිහි
කරමින් වාසය කරන්නේය; යන මේ කාරණය "සම්‍යක්සිහිය"යී
කියනුලැබේ.

8—**සම්‍යක්සමාධිය** නම් කවරේ ද?—ධ්‍යානකුශලචිත්තයට කාමය
එකාන්තප්‍රතිපක්ෂබැවින් විෂ්කම්භන ප්‍රහාණවශයෙන් කාමච්ඡන්ද
යෙන් වෙන්ව කුශලමාර්ගයට වලකනා කාමච්ඡන්දාදි පංචනීවරණඅකු
ශලධම්මයන්කෙරෙන් වෙන්ව යම්කිසි අරමුණක් කරා සිත එලවා
කල්පනාවශයෙන් සිත පිහිටුවන ස්වභාවවූ විතර්කසහිතවූ සිත එහි
ම හැසිරීම්වශයෙන් පැවැත්වීම් ස්වභාවවූ විචාරසහිතවූ ශුද්ධකලාව
සිත විවෙක වීමෙන් නීවරණයන්කෙරෙන් දුරුවීම හෙතුකොටගෙ
ණ උපන්නාවූ සම්ප්‍රියායනලක්ෂණවූ කාය-චිත්තදෙදෙනාගේ පිණ
වීමෙන්=ප්‍රීතියයි ලද නම් ඇති ප්‍රීතිසැප ඇත්තාවූ ප්‍රථමධ්‍යානකුශල
චිත්තය තමාගේ චිත්තසන්තානයෙහි ඉපදවීම්වශයෙන් පැමිණ (ඒ
ධ්‍යානකුශලචිත්තය රක්ෂා වීමට අනුරූපවූ ඊර්‍ය්‍යාපථාදියෙන් යුක්තව)
වාසය කරන්නේය;—උක්තප්‍රකාරවූ විතර්ක-විචාරදෙදෙනාගේ ව්‍යු
පශමනය වීම හෙතු කොට ගෙණ සිත ඇලලීමක් නැතිහෙයින්
අතිශයින් ම අචල-සුප්‍රසන්නස්වරූප ඇත්තාවූ ආධ්‍යාත්මිකසම්ප්‍රසා
දනය යන පැහැදීම කරන්නාවූ චිත්තයාගේ එකොදිභාවය යන සිත
මනාකොට සන්හිඳ සිටීමෙක් යම් සම්‍යක්සමාධියෙක්(එකාග්‍රබවෙක්)
ඇද්ද, එසේවූ චිත්තයාගේ එකොදිභාවයට පමුණුවන්නාවූ විතර්කය
නැත්තාවූ විචාරය නැත්තාවූ සමාධියෙන් උපන් ප්‍රීති-සුවය ඇති
ද්විතීයධ්‍යානකුශලචිත්තය තමාගේ සතන්හි උපදවාගෙණ යම් ඊර්‍ය්‍යා
පථාදියකින් යෙදී විපුකල ද්විතීයධ්‍යානකුශලචිත්තයෙන් පහ නො
වේ ද, එසේවූ ඊර්‍ය්‍යාපථාදියෙන් යුක්තව වාසය කරන්නේය;—ප්‍රීති
යගේ ද විරාගයෙන් (එහි ඇල්මක් නොව) උපෙක්ෂාඇතිව ද මෙසේ
සිහි ඇත්තේ ද නුවනැත්තේ ද සුවය කයින් විඳි, යම් ධ්‍යානයක් හෙ
තු කොට ගෙණ ඒ තෘතීයධ්‍යානසමන්විතපුද්ගලයා උපෙක්ෂකය
සිහි ඇත්තේය සැපවිහාර ඇත්තේයයි ආර්‍ය්‍යයෝ කියද්ද ඒ තෘතීය
ධ්‍යානකුශලචිත්තය තමාගේ චිත්තසන්තානයෙහි උපදවාගෙණ
තෘතීයධ්‍යානකුශලචිත්තය නොනැසී පවත්නා ක්‍රමයෙන් වාසය ක
රන්නේය;—කායිකසැපයාගේ ද දුරු වීමෙන් කායිකදුඃඛයාගේ ද
දුරු වීමෙන් පූර්වයෙහි ම (තෘතීයධ්‍යානයෙහිම)සොම්නස්-දොම්නස්
දෙදෙනාගේ අස්තඞ්ගමයෙන් දුක් නොවූ සැප නොවූ උපෙක්ෂා-
සමෘතියෙන් පිරිසිදුවූ චතුර්ථධ්‍යානකුශලචිත්තය තමාගේ චිත්තස
න්තානයෙහි උපදවාගෙණ නැවත නොනස්නා සේ ඊට නිසි ඊර්‍ය්‍යා

පඨාදීයෙන් යෙදී වාසය කරන්නේය, යන මේ කාරණයතෙම “සම්‍යක්සමාධි” යයි කියනුලැබේ.

**මේ දුඃඛනිරොධගාමිනිප්‍රතිපදාර්‍ය්‍යසත්‍යයයි**

---

**මෙපමණෙකින්**

## “චත්තාරි නාම කිං?–චත්තාරි අරියසච්චානි”

**යන මේ ප්‍රශ්නයෙහි අර්ථ දක්වනලදී.**

මෙතැන් පටන් “පඤ්ච නාම කිං?—පඤ්චුපාදානක්ඛන්ධා” යන මේ ප්‍රශ්නයෙහි අර්ථ මතු දක්වන ක්‍රමයෙන් දතයුතු.

භූත-භවිෂ්‍යත්-වර්තමාන ස්ථාවර-ජඞ්ගම නිත්‍යා'නිත්‍යාදිවශයෙන් සර්වසංස්කාරප්‍රවෘත්තිධර්මයන් කරතලා'මලකක්‍රමයෙන් ස්වයම්භූඥානයෙන් අවබොධ කරවදාලාවූ සර්වඥරාජෝත්තමයානන්වහන්සේ “සකලසත්වයන් අනාදිමත් සසර පිහිටුවා අනන්තසංසාර දුඃඛයට භාජන කරවාලූවෝ රූපස්කන්ධය, වෙදනාස්කන්ධය, සංඥාස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඥානස්කන්ධය, යන මොහු යයි” කියා දක්වා ඒ මේ පඤ්චස්කන්ධය වදාළසේක;—එහි විස්තර යට දුඃඛාර්‍ය්‍යසත්‍යයෙහි කී නයින් දතයුතු. [147 පිටේ 28 පෙලපටන් බලනු.]

යථොක්ත පඤ්චස්කන්ධධර්මයෝ සංසාරයෙහි ලා අනන්තසංසාර දුකට භාජන කරවාලූබව විශෙෂවූ සර්වඥතාඥානයෙන් දැන ආදිත්‍යගොත්‍රබන්ධුවූ සර්වඥයන්වහන්සේවිසින් රූපස්කන්ධය ක්‍රමයෙන් නැගී නැතිවන පෙනපිඩකට(බඳුවූ)උපමා ඇත්තේය, වෙදනාස්කන්ධය දියබුබුලකට(බඳුවූ)උපමා ඇත්තේය, සංඥාස්කන්ධය ආතපයෙහි පෙනෙන මිරිඟුජලස්කන්ධයකට (බඳුවූ) උපමා ඇත්තේය, සංස්කාරස්කන්ධය කදලිස්කන්ධයකට(බඳු)උපමා ඇත්තේය, විඥානස්කන්ධය මායා රූපයක් වැන්නේය,යි කියා පඤ්චස්කන්ධයාගේ අනිත්‍යතාව දෙශනා කරණලද්දේය.

ගේ මෙසේයි;

“ඵෙනපිණ්ඩුපමං රූපං වෙදනා බුබ්බුලූපමා,
මරීචිකූපමා සඤ්ඤා සංඛාරා කදලූපමා;
මායූපමා ච විඤ්ඤාණං දෙසිතා'දිච්චබන්ධුනා”යි.

---

**මෙපමණෙකින්**

## “පඤ්ච නාම කිං?—පඤ්චුපාදානක්ඛන්ධා”

**යන මේ ප්‍රශ්නයෙහි අර්ථ දක්වනලදී.**

මෙතැන් පටන් “ඡ නාම කිං?—ඡ අජ්ඣත්තිකානි ආයතනානි” යන මේ ප්‍රශ්නයෙහි අර්ථ මතු දක්වන ක්‍රමයෙන් දතයුතු වේ.

මෙතැන් පටන් “සත්ත නාම කිං?—සත්ත බොජ්ඣඞ්ගා”යන මේ ප්‍රශ්නයෙහි අර්ථ මතු දක්වන ක්‍රමයෙන් දතයුතු වේ.

ඒ මෙසේ දතයුතුයි.

1—සත්තයෙන් සිත්හි හැසිරීම්වශයෙන් විද්‍යමානවූ හෝ ප්‍රතිලාභව තමාකෙරෙහි ඇති ආධ්‍යාත්මිකවූ යොනිසොමනස්කාරාදීන් උපදනා සිහියයි කියනලද **ස්මෘතිසම්බොධ්‍යඞ්ගය,** හෙවත් බොහෝ කොට නුවනින් යෙදී සැලකීමෙන් හෝ නොහොත් සිහිනුවනින් යෙදී වසනබවය, සිහිමුළාජනයන්ගෙන් දුරු වනබවය, එලඹසිටි මනාසිහි ඇති පුද්ගලයන් සෙවනය කරණ බවය, මනාසිහිය උතුම් ගුණධර්මයකැයි සිතා එහි නැමී පවත්නා සිත් ඇතිව වසනබවය, යන මේ සතරකාරණයන් හෙතු කොට ගෙණ“**ස්මෘතිසම්බොධ්‍යඞ්ගයාගේ** ඉපදීම වන්නේය.

2—සත්තයෙන් සිත්හි හැසිරීම්වශයෙන් විද්‍යමානවූ හෝ ප්‍රතිලාභව තමාකෙරෙහි ඇති ධර්මානුවිඥානනවිසින් පඤ්චස්කන්ධ-ධාතු-ආයතනාදී ධර්මයන් විමසීම්වශයෙන් සිත්හි පවත්නාවූ **ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය** හෙවත්-බොහෝ කොට නුවනින් යෙදී සැලකීමෙන් නූපන් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීම හා උපන්නාහු ගේ වර්ධනය වීමෙන් පැවතීමය,(නොහොත්—ස්කන්ධ-ධාතු-ආයතන-ඉන්ද්‍රිය-බල-බොධ්‍යඞ්ග-මාර්ගාඞ්ග-ශමථ-විදර්ශනාය යන මේ ධර්මයන්ගේ අර්ථනිශ්‍රිතව බොහෝ කොට ඇසීමය,) ආධ්‍යාත්මික-බාහිරවශයෙන් විප්‍රකාරව සිටි වස්තූන්ගේ ප්‍රසන්නබවය, ශ්‍රද්ධා-වීර්‍ය්‍ය-ස්මෘති-සමාධි-ප්‍රඥාය යන ඉන්ද්‍රියයන්ගේ සමබවය, අඥානජනයන්ගෙන් දුරු වීමය, ඥානවත්ජනසෙවන ඇතිබවය, පඤ්චස්කන්ධාදි ගම්භීරධර්මයන්කෙරෙහි ධර්මානුවිඥානාවශයෙන් සිත පවත්වනබවය, ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය උතුම් ගුණධර්මයකැයි කියා සතරඉරියවුවෙහි ම එහි නැමී පවත්නා සිත් ඇතිබවය, යන මේ සත්ප්‍රකාරවූ හිත කාරණයෙන් “ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය” වන්නේය.

3—**වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය** නම් බොහෝ කොට නුවනින් යෙදී සැලකීමෙන් හෝ නොහොත්—නරකයආදී සියලු අපායභය සැලකීමය, ආනිසංසඵලවිසෙස සැලකීමය, මේ වීර්‍ය්‍යය නම් බුද්ධාදී උතුමන් ගිය මාර්ගයකැයි කියා සැලකීමය, කුසීතපුද්ගලයන්කෙරෙන් දුරු වීමය, වීර්‍ය්‍යවත්පුද්ගලසෙවනය ඇතිබවය, වීර්‍ය්‍යය උතුම් ගුණධර්මයකැයි සිතා එයට නැමී පවත්නා සිත් ඇතිවීමය, යන මෙයින් “වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගය” වන්නේය.

4—**ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය** නම් නුවනින් යෙදී සැලකීමය, බුදුගුණ සිහි කිරීමය, ධම්මගුණ සිහි කිරීමය, සංඝගුණ සිහි කිරීමය, දානානිසංස-සීලානිසංසාදිය සිහි කිරීමය, නොසන්හුන් රූක්‍ෂපුද්ගලයන් කෙරෙන් දුරු වීමය, සන්හුන් කායාදිප්‍රයොග ඇති බුද්ධාදිස්නිග්ධ

පුද්ගලයන් සේවනය කිරීමය, ප්‍රසාදනීයසූත්‍රාන්තදේශනාදීන් සිහි කිරීමය, කුශලපක්ෂගතවූ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය උතුම් ගුණධර්මයකැයි කියා එහි නැමී පවත්නා සිත් ඇතිබවය, යන මෙසින් "ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය" වන්නේය.

5—**ප්‍රශ්‍රබ්ධිසම්බෝධ්‍යඞ්ගය** නම්, කාය-චිත්තදෙදෙනාගේ සන්හුන් ස්වභාවයයි කියනලද ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය නුවණින් යෙදී සැලකීමෙන් හෝ නොහොත් කාය-චිත්තදෙදෙනාගේ සන්හිඳීමෙන් වසනබවය, ප්‍රණීතවූ මධුරආහාර සේවනය කිරීමය, ශීතෝෂ්ණවිසින් සැපපහසු ඍතූන් සේවනය කිරීමය, පහසුලෙස ඉරියව්වූ සේවනය කිරීමය, මධ්‍යස්ථවූ කායාදිප්‍රයෝග ඇතිවනබවය, නොසන්හුන් පුද්ගලයන්ගෙන් දුරුවනබවය, සන්හිඳි වසන පුද්ගලයන්ගේ සේවනය ඇතිබවය, මෙසේ කාය-චිත්තදෙදෙනාගේ සන්හිඳීම් වශයෙන් පවත්නා ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය උතුම් ගුණධර්මයකැයි පවත්නා සිත් ඇති බවය, යන මෙසින් "ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය" වන්නේය.

6—**සමාධිසම්බෝධ්‍යඞ්ගය** නම් භාවනානුරූප යම්කිසි අරමුණක් සිතින් ගෙණ එහි නුවණින් යෙදී බහුලව සැලකීමෙන් සමාධිසම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීම වන්නේය, නොහොත්—ආධ්‍යාත්මික-බාහිර වස්තූන්ගේ ප්‍රසන්නභාවීමය, ශ්‍රද්ධාදීඉන්ද්‍රියයන්ගේ සමභාවය, සන්හිඳීමක් නොව වසන පුද්ගලයන්ගෙන් දුරුවීමය, සන්හිඳී වසන පුද්ගලයන් සේවනය කිරීමය, චිත්තෛකාග්‍රතාවශයෙන් සිටි සමාධිසම්බොධ්‍යඞ්ගය උතුම් ගුණධර්මයකැයි කියා එහි නැමී පවත්නා සිත් ඇතිවීමය, යන මෙසින් "සමාධිසම්බොධ්‍යඞ්ගය" වන්නේය.

7—**උපෙක්ෂාසම්බෝධ්‍යඞ්ගය** නම්, සත්ව-සංස්කාරයන්කෙරෙහි මැදහත්බවයයි කියනලද උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය බොහෝකොට නුවණින් යෙදී සැලකීමෙන් හෝ නොහොත් සියලු සත්වයන්කෙරෙහි හා චීවර-පරිෂ්කාර-වස්ත්‍රාභරණාදිවූ සියලු සංස්කාරයන්කෙරෙහි ලොභ-මොහාදිවශයෙන් සිත නොපවත්වා පරමාර්ථවිසින් සත්ව-සංස්කාරයන්ගේ නිස්සත්ව-නිස්සාරස්වභාව සැලකීමෙන් එහි මැදහත් සිත් පැවැත්වීමය, සත්වයන් හා සංස්කාරවස්තූන් මමය මාගේය යන විපරීතාධ්‍යාශඇති පුද්ගලයන්ගෙන් දුරුවීමය, එබඳු සිත් නැති මධ්‍යස්ථවූ සිත්ඇති ජනසේවනයෙහි යෙදීමය, මැදහත්බව උතුම් ගුණධර්මයකැයි නැමී එහි පවත්නා සිත්ඇතිවීමය, යන මෙසින් **උපෙක්ෂාසම්බෝධ්‍යඞ්ගය** වන්නේය.

**මෙ ප ම ණෙ කි න්**

## "සත්ත නාම කිං?—සත්ත බොජ්ඣඞ්ගා"

**යන මේ ප්‍රශ්නයෙහි අර්ථ දක්වනලදී.**

මෙතැන් පටන් "අට්ඨ නාම කිං?-අරියො අට්ඨඞ්ගිකො මග්ගො" යනමේ ප්‍රශ්නනයෙහි අර්ථ මතුදක්වන ආකාරයෙන් දතයුතු;—

ඒ කෙ සේ ද?

ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය නම් සම්‍යග්දෘෂ්ටිය, සම්‍යක්සඞ්කල්පනාවය, සම්‍යග්වචනය, සම්‍යක්කර්මාන්තය, සම්‍යගාජීවය, සම්‍යග්ව්‍යායාමය, සම්‍යක්ස්මෘතිය, සම්‍යක්සමාධිය, යන මොහුයි;—මෙහි විස්තර යට දුඃඛනිරොධගාමිනිප්‍රතිපදාර්‍ය්‍යසත්‍යයෙහි ආනයින් දතයුතු;— [164 වෙනි පිටේ 19 පෙලපටන් බැලිය යුතුයි.]

මෙ ප ම ණෙ කි න්

## "අට්ඨ නාම කිං?— අරියො අට්ඨඞ්ගිකො මග්ගො"

**යන මේ ප්‍රශ්නනයෙහි අර්ථ දක්වනලදි.**

මෙතැන් පටන් "**නව නාම කිං?—නව සත්තාවාසා**" යන මේ ප්‍රශ්නනයෙහි අර්ථ මතු දක්වනආකාරයෙන් දතයුතු වේ.

ඒ සත්ත්වාවාසය නම් කෙසේ ද?

නානත්තකායා නානත්තසඤ්ඤිය, නානත්තකායා එකත්තසඤ්ඤිය, එකත්තකායා නානත්තසඤ්ඤිය, එකත්තකායා එකත්තසඤ්ඤිය, යන මේ සතරකොට්ඨාසයක සත්වයෝ වත්නාහුය, එයින් සතරඅපායට ඇතුළත් නොවන සමහර විනිපාතිකප්‍රෙතයෝ ද මනුෂ්‍යලොකය ද දිව්‍යලොකසය ද **නානත්තකායානානත්තසඤ්ඤී** නම් වේ; නරක-තිරිසන්-ප්‍රෙත-අසුරනිකාය යන සතරඅපායෙහි සත්වයෝ ද බ්‍රහ්මපාරිෂද්‍යය බ්‍රහ්මපුරොහිතය මහාබ්‍රහ්මය යන තුන් බඹලොවෙහි අයද **නානත්තකායාඑකත්තසඤ්ඤී** නම් වේ; පරිත්තාභාය අප්පමාණාභය ආභස්සරය යන මේ බ්‍රහ්මලොකතුනෙහි බ්‍රහ්මයෝ **එකත්තකායානානත්තසඤ්ඤී** නම් වේ, පරිත්තසුභය අප්පමාණසුභය සුභකිණ්ණය වෙහප්ඵලය යන බ්‍රහ්මලොක සතරෙහි බ්‍රහ්මයෝ **එකත්තකායාඑකත්තසඤ්ඤී** නම් වේ;—ආකාසානඤ්චායතනය විඤ්ඤාණඤ්චායතනය ආකිඤ්චඤ්ඤායතනය යන මේ බ්‍රහ්මලොකතුනත් ඉහතින් දැක්වූ සතරකොට්ඨාසයට එක් කොට සප්තවිඥානස්ථිතියයි කියනලදී; ඒ සප්තවිඥානස්ථිතියට නොගෙණ අත්හැරිය දසවෙනි වෙහප්ඵල නම් බඹලොව එක්ව පිහිටි එකොළොස්වැනි **අසඤ්ඤසත්ත** නම් බඹලොව ද අරූපි බ්‍රහ්මලොකයෙන් ඇරුනු සතරවැනි **නෙවසඤ්ඤානාසඤ්ඤායතන** නම් බඹලොව ද යන මේ දෙක

සප්තවිඤ්ඤාණස්ථිතියට එකතු කොට නවසත්තාවාසයයි කියනලදි,

මෙ ප ම ණේ කි න්

## "නව නාම කිං?-නව සත්තාවාසා"

යන මේ ප්‍රශ්නනයෙහි අර්ථ දක්වනලදි.

මෙතැන් පටන් "දස නාම කිං?-දසහඞ්ගෙහි සමන්නාගතො අරහාති වුච්චති" යන මේ ප්‍රශ්නනයෙහි අර්ථ මතු දක්වනආකාර යෙන් දතයුතු.

මෙහි අඞ්ගදසය නම් සම්‍යග්දෘෂ්ටිය සම්‍යක්සංකල්පනාවය සම්‍යග් වචනය සම්‍යක්කර්මාන්තය සම්‍යගාජීවය සම්‍යග්ව්‍යායාමය සම්‍යක් ස්මෘතිය සම්‍යක්සමාධිය සම්‍යක්ඥානය සම්‍යක්විමුක්තිය යන මේ දසයයි,

මෙහි (1 පටන් 8 දක්වා) චිඝතර යට දුඃඛනිරොධගාමිනිප්‍රතිපදාගැති සත්‍යයෙහි කී නයින් දතයුතු. [164—පිටේ—19—පෙලපටන්.]

9-සම්‍යග්ඥානඅඞ්ගය නම්-මාර්ගඥානය සම්‍යක්ඥානඅඞ්ගය නම් වේ.

10-සම්‍යග්විමුක්තිඅඞ්ගය නම්-අග්‍රඵලය වේ, යන මේ සම්‍යක් විමුක්තිඅඞ්ගය නම් වේ.

මෙ ප ම ණේ කි න්

## "දස නාම කිං ?-දසහඞ්ගෙහි සමන්නාගතො අරහාති වුච්චති"

යන මේ ප්‍රශ්නනයෙහි අර්ථ දක්වනලදි.

මෙසේ මේ ප්‍රශ්නදශය ඒ ලදරු සාමණේරයන්විසින් බුදුරජා නන්වහන්සේගේ අභිප්‍රාය පරිද්දෙන් විසඳුවදාලකල්හි ප්‍රශ්නව්‍යා කරණාවසානයෙහි එයට දායාද දී වදාරණ බුදුරජානන්වහන්සේ සක්විතිරජක්හුගේ ප්‍රාසාදයක රන්කොතක් පලන්දවනපරිද්දෙන් ඒ සොපාකසාමණේරයින්වහන්සේ නැමැති ප්‍රාසාදයෙහි උපසම්ප දාව නමැති රන්කොත පැලඳවීමෙන් සඞ්ග්‍රහ කොට වදාලසේක; නොහොත්,—තෙපි මෙතැන් පටන් මාගේ ශාසනයෙහිද් "උපසම්ප ද"යයි වදාරමින් උපසම්පදාව දී වදාලසේක; ඒ ප්‍රශ්නව්‍යාකරණිඋපස ම්පදාව ලත් ඔබුන්වහන්සේ ද සොපාකමහතෙරහුය යන නමින් ප්‍රසිඬවී සර්වඥශාසන නමැති අහස්හි පුන්සඳ මෙන් ශාසනය බබුළු වා අනුපාදිශෙෂනිර්වාණධාතුවෙන් පිරිනිවී සේක.

සාමණේරප්‍රශ්න අර්ථවර්ණනාව නිමි.

සිඬි ර ස්තු



